# විගණකාධිපතිවරයාගේ ත්‍රෛවාර්ෂික වාර්තාව

## 2018-2020

## රාජ්‍ය සංස්ථා සහ අනෙකුත් ව්‍යවස්ථාපිත ආයතන

# පටුන


| | | | පිටු අංක. |
|---|---|---|---|
| 1. | විධායක සාරාංශය | | 6 |
| 2. | රාජ්‍ය සංස්ථා සහ අනෙකුත් ව්‍යවස්ථාපිත ආයතන වල මතයන් | | 09 |
| 3. | රාජ්‍ය සංස්ථා සහ අනෙකුත් ව්‍යවස්ථාපිත ආයතන වල තනි නිරීක්ෂණ | | |
| | 3.1 | ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ආයතනය | 15 |
| | 3.2 | 1990- සුවසැරිය පදනම | 16 |
| | 3.3 | රත්මලාන විශ්වවිද්‍යාල විද්‍යායතනය | 19 |
| | 3.4 | අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය | 20 |
| | 3.5 | අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය | 22 |
| | 3.6 | ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය | 26 |
| | 3.7 | ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාව | 28 |
| | 3.8 | ආයුර්වේද වෛද්‍ය සභාව | 31 |
| | 3.9 | ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය | 34 |
| | 3.10 | ඉඩම් මැනුම් සභාව | 37 |
| | 3.11 | ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය | 40 |
| | 3.12 | උක් පර්යේෂණ ආයතනය | 51 |
| | 3.13 | කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය | 57 |
| | 3.14 | කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය | 71 |
| | 3.15 | කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ යෝජනා ක්‍රමය | 73 |
| | 3.16 | ජනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය | 80 |
| | 3.17 | ශ්‍රී ජයවර්ධනපුර මහාරෝහලශාලා මණ්ඩලය | 84 |
| | 3.18 | ජල සම්පත් මණ්ඩලය | 96 |
| | 3.19 | ජාතික අධ්‍යාපන ආයතනය | 103 |
| | 3.20 | ජාතික ඖෂධ නියාමන අධිකාරිය | 104 |
| | 3.21 | ජාතික ගමනාගමන කොමිෂන් සභාව | 125 |
| | 3.22 | ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය | 132 |
| | 3.23 | ජාතික තරුණ සේවා සභාව | 134 |
| | 3.24 | ජාතික නිවාස සංවර්ධන අධිකාරිය | 143 |
| | 3.25 | ජාතික ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය | 155 |
| | 3.26 | ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය | 156 |

| | | | |
|---|---|---|---|
| | 3.27 | ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය | 160 |
| | 3.28 | ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව | 164 |
| | 3.29 | ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව | 166 |
| | 3.30 | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 168 |
| | 3.31 | ජාතික සමාජ සංවර්ධන ආයතනය | 171 |
| | 3.32 | ජාතික සමූපකාර සංවර්ධන ආයතනය | 173 |
| | 3.33 | ජාතික ළමා ආරක්ෂක අධිකාරිය | 177 |
| | 3.34 | ජේ.ආර්.ජයවර්ධන මධ්‍යස්ථානය | 179 |
| | 3.35 | තල් සංවර්ධන මණ්ඩලය | 183 |
| | 3.36 | තෘතියීක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව | 186 |
| | 3.37 | තේ පර්යේෂණ මණ්ඩලය | 190 |
| | 3.38 | දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය | 197 |
| | 3.39 | නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය | 201 |
| | 3.40 | පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය | 205 |
| | 3.41 | ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය | 208 |
| | 3.42 | පොල් පර්යේෂණ මණ්ඩලය | 210 |
| | 3.43 | පොල් වගා කිරීමේ මණ්ඩලය | 216 |
| | 3.44 | පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාව | 222 |
| | 3.45 | භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය | 231 |
| | 3.46 | මධ්‍යම පරිසර අධිකාරිය | 246 |
| | 3.47 | මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභාව | 253 |
| | 3.48 | මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය | 255 |
| | 3.49 | යාපනය විශ්ව විද්‍යාල විද්‍යායතනය | 262 |
| | 3.50 | රණවිරු සේවා අධිකාරිය | 264 |
| | 3.51 | ශ්‍රී ලංකා රබර් පර්යේෂණ මණ්ඩලය | 266 |
| | 3.52 | රාජ්‍ය භාෂා කොමිෂන් සභාව | 268 |
| | 3.53 | වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලය | 269 |
| | 3.54 | විජය කුමාරතුංග අනුස්මරණ රෝහල | 273 |
| | 3.55 | විශ්වවිද්‍යාල විද්‍යායතනය | 275 |
| | 3.56 | ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය | 279 |
| | 3.57 | ශ්‍රී ලංකා අනුකූලතා තක්සේරු පිළිබඳ ප්‍රතීතන ආයතනය | 293 |
| | 3.58 | ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව | 295 |

| | | | |
|---|---|---|---|
| | 3.59 | ශ්‍රී ලංකා ජලජීවී වගා සංවර්ධන අධිකාරිය | 300 |
| | 3.60 | ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම | 311 |
| | 3.61 | ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය | 314 |
| | 3.62 | ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය | 317 |
| | 3.63 | ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමණාකරණ ආයතනය | 325 |
| | 3.64 | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 329 |
| | 3.65 | ශ්‍රී ලංකා සම්මේලන කාර්යංශය | 333 |
| | 3.66 | ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය | 335 |
| | 3.67 | සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය | 337 |
| | 3.68 | සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය | 342 |
| | 3.69 | ශ්‍රී ලංකා සාගර විශ්ව විද්‍යාලය | 350 |
| | 3.70 | ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය | 351 |
| | 3.71 | ශ්‍රී ලංකා හදබිම අධිකාරිය | 352 |
| | 3.72 | හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය | 357 |
| | 3.73 | හෝමියෝපති වෛද්‍ය සභාව | 359 |
| | 3.74 | හානි පූර්ණය සඳහා වන කාර්යාලය | 362 |
| | 3.75 | ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය | 365 |
| | 3.76 | ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය | 369 |
| | 3.77 | ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය | 372 |
| | 3.78 | ශ්‍රී ලංකා පදනම | 376 |
| | 3.79 | මාර්ග සංවර්ධන අධිකාරිය | 378 |
| | 3.80 | ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය | 396 |
| | 3.81 | ලක්ෂ්මන් කදිර්ගාමර් ජාත්‍යන්තර සම්බන්ධතා හා ක්‍රමෝපාය අධ්‍යයන ආයතනය | 399 |
| | 3.82 | රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය අර්ථ සාධක සංගමය | 402 |
| | 3.83 | ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය | 409 |
| | 3.84 | සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය | 414 |
| | 3.85 | ජාතික විද්‍යා පදනම | 416 |
| | 3.86 | ජාතික ශිල්ප සභාව | 421 |
| | 3.87 | වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය | 423 |
| | 3.88 | මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව | 426 |
| | 3.89 | පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය | 429 |

| | | | |
|---|---|---|---|
| | 3.90 | ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය | 433 |
| | 3.91 | පොල් සංවර්ධන අධිකාරිය | 438 |
| | 3.92 | නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය | 446 |
| | 3.93 | උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය | 448 |
| | 3.94 | ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව | 449 |
| | 3.95 | ගාලු උරුමය පදනම | 452 |
| | 3.96 | විශ්වවිද්‍යාල විද්‍යායතනය මාතර | 457 |
| | 3.97 | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව | 460 |
| | 3.98 | ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය | 470 |
| | 3.99 | ජාතික මූලික අධ්‍යයන ආයතනය | 473 |
| | 3.100 | කාර්මික  තාක්ෂණ ආයතනය | 477 |
| | 3.101 | ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය | 480 |
| | 3.102 | ජාතික පර්යේෂණ සභාව | 484 |
| | 3.103 | ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව | 488 |
| | 3.104 | ටවර් හෝල් රඟහල පදනම | 498 |
| | 3.105 | ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය | 503 |

# 1. විධායක සාරාංශය

2020 වර්ෂය අවසානයට රාජ්‍ය සංස්ථා සහ අනෙකුත් ව්‍යවස්ථාපිත ආයතන සංඛ්‍යාව 132 ක් විය. මෙම ආයතන වලින් ආයතන 105 ක් සම්බන්ධයෙන් වූ 2018, 2019 සහ 2020 වර්ෂවලට අදාල පාර්ලිමේන්තුවේ අවධානයට ලක්කළ යුතු බවට විගණකාධිපතිවරයා විසින් තීරණය කල ආයතන වල තවදුරටත් නිවැරදි නොකරන ලද නිරීක්ෂණයන් පමනක් මෙම වාර්තාවට අතුලත් කර ඇත.

මෙම ආයතන අතරින් ආයතන 27 ක එනම් වාර්තා කරීමට ප්‍රමාණවත් තරම් නිරීක්ෂණ නොමැතිවීම නිසා ආයතන 4 කද, වර්ෂ 03 ක කාලය ආවරණයවන පරිදි 2022 අප්‍රේල් මාසය දක්වාම මූල්‍ය වාර්තා නියමිත කාලය තුල ඉදිරිපත් කර නොතිබීම නිසා තවත් ආයතන 23 ක විගණන නිරීක්ෂණද මෙම වාර්තාවට ඇතුලත් කර නැත.

වාර්තා කර ඇති ආයතන 105 න් ආයතන 21 ක් හැර අනෙකුත් සියලුම ආයතන මහාභාණ්ඩාගාරය මගින් ලබාදෙන ප්‍රතිපාදනද උපයෝගි කරගෙන මෙහෙයුම් කටයුතු ක්‍රියාත්මක කර තිබුණි. භාන්ඩාගාර ප්‍රතිපාදන ලබාගෙන තිබුණු, ආයතන 84 සඳහා 2020 වර්ෂය තුල පමණක් ලබාදී තිබුණු භාණ්ඩාගාර ප්‍රතිපාදන හා අනෙකුත් ප්‍රදාන පහත පරිදී වේ.

i. ප්‍රාග්ධන වියදම් සඳහා රු. මිලියන 238,889
ii. පුණරාවර්තන වියදම් සඳහා රු. මිලියන 62,646
iii. අනෙකුත් ආධාර ලැබීම් රු. මිලියන 3,641

මෙකී ආයතන 105 අතරින් ආයතන 49 ක අදායමට වැඩි වියදමක්/ ඌනතාවයක් නිරීක්ෂණය වූ අතර එම ඌනතාවයෙහි එකතුව රු. මිලියන 3,800 ක් විය. එසේම ආයතන 43 ක ඉදිරියට ගෙන ආ සමුච්ත ඌනතාවය රු. මිලියන 33,205 ක් විය.

තවද මෙකී වාර්තා කරණ ලද ආයතන 105 අතරින් මාර්ග සංවර්ධන අධිකාරිය හැර ආයතන 55 ක් 2020 වර්ෂයේදී එකතුව රු. මිලියන 5,186 ක්වූ ලාභයක් /අතිරික්තයක් උපයා තිබුණු අතර එම අතිරික්තය ඇතිවීමට එම ආයතන වලට මහාභාණ්ඩාගාරයෙන් ලබාදි තිබුණු රු. මිලියන 12,796 ක පුණරාවර්ථන ප්‍රතිපාදන බලපා තිබුණි. මාර්ග සංවර්ධන අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන අනුව 2020 වර්ෂයේදී උපයා තිබුණු ලාභය රු. මිලියන 180,208 ක් වූ අතර ඉන් රු. මිලියන 36,483 ක් පුණරාවර්ථන ප්‍රතිපාදන ලෙස මහාභාණ්ඩාගාරයෙන් ලබාදී තිබුණි. ඉහත රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත අනුගමනය කරනු ලබන ආයතන 105 අතරින් ආයතන 59 ක් පමණක් 2020 වර්ෂය අවසානයට. එකතුව රු. මිලියන 30,723 ක සමුච්ත අතිරික්ත වාර්තා කර තිබුණි.

මෙම වාර්තාවේ අතුලත් ආයතන 105 අතරින් 2020 වර්ෂය සඳහා ආයතන 04 ක මතය ව්‍යාවනය කර තිබුණු අතර ආයතන 23 කට හිතකර මතයක් ප්‍රකාශ කර තිබුනි. ආයතන 78 කට තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර තිබුණු අතර කිසිදු ආයතනයකට අහිතකර මතයක් ප්‍රකාශ කර නොතිබුණි.

## වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත දී කෙටුම්පත් වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වගන්තිය අනුව රාජ්‍ය සංස්ථාවක් වන හෝ රජය විසින් හෝ රාජ්‍ය සංස්ථාවක් විසින් කොටස් වලින් සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් දරනු ලබන සමාගමක අනුමත වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් අදාළ ලේඛන සහ තොරතුරු විගණකාධිපතිවරයා වෙත ලැබී මාස තුනක් ඇතුළත, සිය වාර්ෂික වාර්තාවේ පළකිරීම සඳහා එම රාජ්‍ය සංස්ථාවේ හෝ සමාගමේ පාලක මණ්ඩලයේ සභාපතිවරයා වෙත විගණකාධිපතිවරයා විසින් වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය.

## මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ මතය

රාජ්‍ය ව්‍යවසායන් විසින් වර්ෂය අවසානයට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත වාර්ෂිකව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ලැබේ. ආයතනවල ක්‍රියාකාරිත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ තත්ත්වයක් මූල්‍ය ප්‍රකාශනවලින් පිළිබිඹු කරන්නේද යන බවට ස්වාධීන සහතිකයක් විගණකාධිපති විසින් ලබාදෙනු ලැබේ. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම මගින් මෙම සහතිකය ලබාදෙනු ලැබේ. රාජ්‍ය ව්‍යවසායන්හි මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනවලින් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු වන්නේද හෝ නොවන්නේද යන්න සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතින්ට හෝ දැනට ජාත්‍යන්තර රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතින්ට අනුකූල වන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට සහ මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතින්ට එම මූල්‍ය ප්‍රකාශන අනුකූල වන්නේද හෝ නොවන්නේද යන්න පිළිබඳ විගණකාධිපතිවරයාගේ නිගමනය විගණන මතයෙන් ප්‍රකාශ කෙරේ.

මූල්‍ය ප්‍රකාශන අනුව ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් හෝ නොඑකඟතාවයන් හා විෂය පථය සීමාවීම් හා කළමණාකරණය හා විගණනය අතර මතුවන නොඑකඟතාවයන් සලකාබැලීමෙන් අනතුරුව සිව් ආකාරයක මතයන් ප්‍රකාශයට පත්කරනු ලබයි. ඒවා නම්.

## තතත්ත්වාගණනය නොකළ මතය

මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් හෝ අනුකූල නොවීම වාර්තා වී නොමැති විට මෙම මතය ප්‍රකාශ කෙරේ.

## තතත්ත්වාගණනය කළ මතය

මූල්‍ය ප්‍රකාශනවල ඇති ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශන හෝ නොගැලපීම වාර්තා කර ඇති නමුත් ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලවලට පැතිරී නොමැති විට මෙම මථය ප්‍රකාශ කෙරේ.

**අහිතකර මතය**

මූල්‍ය ප්‍රකාශන අනුව ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් හෝ කළමණාකරණය හා විගණනය අතර මතුවන නොඑකඟතාවයන්ගේ ව්‍යාප්තිය ඇති විට මෙම මතය ප්‍රකාශ කෙරේ.

**මතය ව්‍යාචනය කිරීම**

මූල්‍ය ප්‍රකාශන අනුව ප්‍රමාණාත්මක විෂය පථය සීමාවීම් හා කළමණාකරණය හා විගණනය අතර මතුවන තෝරාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ ප්‍රමාණාත්මක / පුළුල් එකඟ නොවීම් ඇති විට මෙම මතය ප්‍රකාශ කෙරේ.

විගණන මතයක් ප්‍රකාශ කිරීමේදී සාධාරණ මතයක් ප්‍රකාශ කිරීමේ අරමුණින් පරිගණකගත විගණන මෘදුකාංගයේ සහාය ලබා ගැනේ. ගිණුම් පරීක්ෂා කිරීමෙන් තෝරාගත් විගණන නියැදියට අදාළ සම්පූර්ණ ප්‍රමාණාත්මක මට්ටමේ ප්‍රතිශතයක් ලෙස නිවැරදි නොකළ සම්පූර්ණ වැරදි ප්‍රකාශයන් ගැලපීමෙන් පසු ලැබෙන ප්‍රතිඵල මත විගණන මතය තීරණය වේ.

2018, 2019 සහ 2020 වසර සඳහා ව්‍යවස්ථාපිත ආයතන 105කට අදාළව ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් නිකුත් කරන ලද විගණන මතයන් පිළිබඳ තොරතුරු පහත වගුවේ දැක්වේ.

| | 2018 | 2019 | 2020 |
|---|---|---|---|
| **තතත්ත්වාගණනය නොකල** | 14 | 16 | 23 |
| **තතත්ත්වාගණනය කල** | 79 | 78 | 78 |
| **ව්යාචනය** | 8 | 7 | 4 |
| **අහිතකර** | 4 | 4 | 0 |

## 2. රාජ්‍ය සංස්ථා සහ අනෙකුත් ව්‍යවස්ථාපිත ආයතන වලට අදාල මතයන්

| | ආයතන නාමය | 2018 | 2019 | 2020 |
|---|---|---|---|---|
| 1. | ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ආයතනය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය |
| 2. | 1990- සුවසැරිය පදනම | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය නොකල | තත්ත්වාගණනය නොකල |
| 3. | රත්මලාන විශ්වවිද්‍යාල විද්‍යායතනය | තත්ත්වාගණනය නොකල | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය නොකල |
| 4. | අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය | මතය වියාචනය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය නොකල මතය |
| 5. | අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය නොකල මතය |
| 6. | ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය |
| 7. | ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාව | තත්ත්වාගණනය නොකළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය නොකළ මතය |
| 8. | ආයුර්වේද වෛද්‍ය සභාව | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය |
| 9. | ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය |
| 10. | ඉඩම් මැනුම් සභාව | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය නොකළ මතය | තත්ත්වාගණනය කළ මතය |
| 11. | ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය | මතය වියාචනය කිරීම | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය |
| 12. | උක් පර්යේෂණ ආයතනය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය |
| 13. | කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය |
| 14. | කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය |
| 15. | කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ යෝජනා ක්‍රමය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය |
| 16. | ජනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය |
| 17. | ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලා මණ්ඩලය | වියාචනය කළ මතය | වියාචනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය |

| | | | | |
|---|---|---|---|---|
| **18.** | ජල සම්පත් මණ්ඩලය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය |
| **19.** | ජාතික අධ්‍යාපන ආයතනය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය |
| **20.** | ජාතික ඖෂධ නියාමන අධිකාරිය | තත්ත්වාගණනය කළ මතය | වියාචනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය |
| **21.** | ජාතික ගමනාගමන කොමිෂන් සභාව | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය |
| **22.** | ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය |
| **23.** | ජාතික තරුණ සේවා සභාව | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය |
| **24.** | ජාතික නිවාස සංවර්ධන අධිකාරිය | තත්ත්වාගණනය කළ මතය | වියාචනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය |
| **25.** | ජාතික ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය | තත්ත්වාගණනය නොකළ මතය | තත්ත්වාගණනය නොකළ මතය | තත්ත්වාගණනය නොකළ මතය |
| **26.** | ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය | තත්ත්වාගණනය නොකළ මතය | තත්ත්වාගණනය නොකළ මතය | තත්ත්වාගණනය නොකළ මතය |
| **27.** | ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය |
| **28.** | ජාතික මෝස්තර මධ්‍යස්ථානය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය |
| **29.** | ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව | තත්ත්වාගණනය නොකළ මතය | තත්ත්වාගණනය නොකළ මතය | තත්ත්වාගණනය කළ මතය |
| **30.** | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | වියාචනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය නොකළ මතය |
| **31.** | ජාතික සමාජ සංවර්ධන ආයතනය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය |
| **32.** | ජාතික සමූපකාර සංවර්ධන ආයතනය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය නොකළ මතය |
| **33.** | ජාතික ළමා ආරක්ෂක අධිකාරිය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය |
| **34.** | ජේ.ආර්.ජයවර්ධන මධ්‍යස්ථානය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය |
| **35.** | තල් සංවර්ධන මණ්ඩලය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය |

| | | | | |
|---|---|---|---|---|
| **36.** | තෘතියීක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය |
| **37.** | තේ පර්යේෂණ මණ්ඩලය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය |
| **38.** | දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය |
| **39.** | නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය |
| **40.** | පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය නොකළ මතය |
| **41.** | ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය |
| **42.** | පොල් පර්යේෂණ මණ්ඩලය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය |
| **43.** | පොල් වගා කිරීමේ මණ්ඩලය | තත්ත්වාගණනය කළ මතය | වියාචනය කළ මතය | වියාචනය කළ මතය |
| **44.** | පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාව | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය |
| **45.** | භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය | තත්ත්වාගණනය කළ මතය | අහිතකර මතය | තත්ත්වාගණනය කළ මතය |
| **46.** | මධ්‍යම පරිසර අධිකාරිය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය |
| **47.** | මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභාව | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය |
| **48.** | මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය |
| **49.** | යාපනය විශ්ව විද්‍යාල විද්‍යායතනය | තත්ත්වාගණනය නොකළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය |
| **50.** | රණවිරු සේවා අධිකාරිය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය |
| **51.** | ශ්‍රී ලංකා රබර් පර්යේෂණ මණ්ඩලය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය |
| **52.** | රාජ්‍ය භාෂා කොමිෂන් සභාව | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය |
| **53.** | වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය |

| | | | | |
|---|---|---|---|---|
| **54.** | විජය කුමාරතුංග අනුස්මරණ රෝහල | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය |
| **55.** | විශ්වවිද්‍යාල විද්‍යායතනය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය |
| **56.** | ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය |
| **57.** | ශ්‍රී ලංකා අනුකූලතා තක්සේරු පිළිබඳ ප්‍රතීතන ආයතනය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය |
| **58.** | ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය |
| **59.** | ශ්‍රී ලංකා ජලජීවී වගා සංවර්ධන අධිකාරිය | අහිතකර මතය | අහිතකර මතය | තත්ත්වාගණනය කළ මතය |
| **60.** | ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම | තත්ත්වාගණනය නොකළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය නොකළ මතය |
| **61.** | ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය |
| **62.** | ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය | වියාචනය කළ මතය |
| **63.** | ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමණාකරණ ආයතනය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය |
| **64.** | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය |
| **65.** | ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය |
| **66.** | ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය නොකළ මතය | තත්ත්වාගණනය කළ මතය |
| **67.** | සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය |
| **68.** | සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය |
| **69.** | ශ්‍රී ලංකා සාගර විශ්ව විද්‍යාලය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය |
| **70.** | ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය |
| **71.** | ශ්‍රී ලංකා හදබිම අධිකාරිය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය |

| | | | | |
|---|---|---|---|---|
| **72.** | හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය | තත්ත්වාගණනය නොකළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය |
| **73.** | හෝමියෝපති වෛද්‍ය සභාව | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය නොකළ මතය |
| **74.** | හානි පූර්ණය සඳහා වන කාර්යාලය | අහිතකර මතය | අහිතකර මතය | තත්ත්වාගණනය නොකළ මතය |
| **75.** | ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය | වියාචනය කළ මතය | වියාචනය කළ මතය | තත්ත්වාගණනය නොකළ මතය |
| **76.** | ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය |
| **77.** | ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය නොකළ මතය | තත්ත්වාගණනය කළ මතය |
| **78.** | ශ්‍රී ලංකා පදනම | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය |
| **79.** | මාර්ග සංවර්ධන අධිකාරිය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය |
| **80.** | ජාතික වැවිලි කළමනාකරණ ආයතනය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය |
| **81.** | ලක්ෂ්මන් කදීර්ගාමර් ජාත්‍යන්තර සම්බන්ධතා හා ක්‍රමෝපාය අධ්‍යයන ආයතනය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය නොකළ මතය | තත්ත්වාගණනය නොකළ මතය |
| **82.** | රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය අර්ථ සාධක සංගමය | තත්ත්වාගණනය නොකළ මතය | තත්ත්වාගණනය නොකළ මතය | තත්ත්වාගණනය කළ මතය |
| **83.** | ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය | තත්ත්වාගණනය නොකළ මතය | තත්ත්වාගණනය නොකළ මතය | තත්ත්වාගණනය නොකළ මතය |
| **84.** | සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය නොකළ මතය |
| **85.** | ජාතික විද්‍යා පදනම | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය නොකළ මතය |
| **86.** | ජාතික ශිල්ප සභාව | තත්ත්වාගණනය කළ මතය | වියාචනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය |
| **87.** | වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය | තත්ත්වාගණනය නොකළ මතය | තත්ත්වාගණනය නොකළ මතය | තත්ත්වාගණනය නොකළ මතය |
| **88.** | මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය නොකළ මතය | තත්ත්වාගණනය කළ මතය |
| **89.** | පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය නොකළ මතය | තත්ත්වාගණනය කළ මතය |

| | | | | |
|---|---|---|---|---|
| **90.** | ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය නොකළ මතය |
| **91.** | පොල් සංවර්ධන අධිකාරිය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය |
| **92.** | නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය | තත්ත්වාගණනය නොකළ මතය | තත්ත්වාගණනය නොකළ මතය | තත්ත්වාගණනය නොකළ මතය |
| **93.** | උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය |
| **94.** | ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව | වියාචනය කළ මතය | වියාචනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය |
| **95.** | ගාලු උරුමය පදනම | අහිතකර මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය නොකළ මතය |
| **96.** | විශ්වවිද්‍යාල විද්‍යායතනය මාතර | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය නොකළ මතය |
| **97.** | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව | වියාචනය කළ මතය | වියාචනය කළ මතය | වියාචනය කළ මතය |
| **98.** | ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය | අහිතකර මතය | අහිතකර මතය | තත්ත්වාගණනය කළ මතය |
| **99.** | ජාතික මූලික අධ්‍යයන ආයතනය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය |
| **100.** | කාර්මික තාක්ෂණ ආයතනය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය |
| **101.** | ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය | තත්ත්වාගණනය නොකළ මතය | තත්ත්වාගණනය නොකළ මතය | තත්ත්වාගණනය කළ මතය |
| **102.** | ජාතික පර්යේෂණ සභාව | තත්ත්වාගණනය නොකළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය |
| **103.** | ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව | වියාචනය කළ මතය | වියාචනය කළ මතය | වියාචනය කළ මතය |
| **104.** | ටවර් හෝල් රඟහල පදනම | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය |
| **105.** | ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය නොකළ මතය | තත්ත්වාගණනය කළ මතය |

## 03. රාජ්‍ය සංස්ථා සහ අනෙකුත් ව්‍යවස්ථාපිත ආයතන වල තනි නිරීක්ෂණ

### 01. ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යා පිළිබඳ ආයතනය

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - තතත්ත්වාගණනය කළ මතය

2019 - තතත්ත්වාගණනය කළ මතය

2020 - තතත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2 හා 3 ඡේද ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කර නොතිබුණු අතර එම චක්‍රලේඛයේ 3 ඡේදය ප්‍රකාරව කාර්ය මණ්ඩල නිපුණතා අවශ්‍යතාවයන් හඳුනාගෙන නොතිබුණි. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ප්‍රකාරව මානව සම්පත් කළමනාකරණය සිදුකිරීමට ආයතනය වගබලා ගත යුතු වීම. | මානව සම්පත් සංවර්ධනය උදෙසා කාර්ය මණ්ඩලයට පුහුණු වැඩමුළු සඳහා සේවකයින් සහභාගී කරවා තිබීම | 2020, 2021 වර්ෂයේදී කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් පුහුණු සංවර්ධන කටයුතු සඳහා වියදම් අඩු කිරීමට පුද්ගල ඒකරාශීවීම් අඩු කිරීම හේතුවෙන් ක්‍රියාකාරීත්වය අඩු වී ඇත. |
| (ආ) | 2018 ජූලි 18 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක 03/2018 දරන චක්‍රලේඛයේ I (ආ) සහ II වගන්ති ප්‍රකාරව ආයතනය විසින් පවත්වන පාඨමාලා සඳහා සහභාගී කරගන්නා සම්පත්දායකයින් වෙත දීමනා ගෙවීමේදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර තිබුණු සීමාවන් ඉක්මවා 2019 වර්ෂය තුළදී රු.1,022,750ක් වූ සම්පත්දායක දීමනා ගෙවා තිබුණි. | දීමනා ගෙවීම් සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස් කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතු බව. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති අතර මේ වන තෙක් අනුමැතිය ලැබී නොමැත. | ගෙවීම් අඩු කිරීම තුළින් ප්‍රවීණ හා දක්ෂ දේශකයින් නොමැතිවීම මත පාඨමාලාවන්හි ගුණාත්මකභාවය අඩු විය හැකි බැවින් ගෙවීම් අඛණ්ඩව කරගෙන යනු ලබයි. |

## 02. 1990 - සුවසැරිය පදනම

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 - තතත්ත්වාගණනය කළ මතය

2019 - තතත්ත්වාගණනය නොකළ මතය

2020 - තතත්ත්වාගණනය නොකළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2018 අප්‍රේල් 24 දින සෞඛ්‍ය අමාත්‍යාංශය හා GVK EMRI Lanka (Private) Ltd. ආයතනය සමඟ අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම සහ 2018 අංක 18 දරන 1990 සුවසැරිය පදනම පනතේ 26(ඇ) වගන්තිය ප්‍රකාරව, සුවසැරිය පදනමේ මෙහෙයුම් කටයුතු සඳහා වැය වන පුනරාවර්තන වියදම් රජය විසින් ප්‍රතිපූරණය කළ යුතු වුවද, 2020 දෙසැම්බර් 31 දින වන විට රජය විසින් ප්‍රතිපූරණය කර නොතිබුණු මුළු පුනරාවර්තන වියදම රු.405,224,284ක් වූ අතර එම වියදම ප්‍රාග්ධන වියදම් සඳහා ලැබී තිබුණු අරමුදල්වලින් වැයකර තිබුණි. එසේම 2019 වර්ෂය සඳහා රජය විසින් පදනමට ලබාදුන් මූල්‍ය ප්‍රතිපාදනය 2021, 2022 හා 2023 වර්ෂවලදී පිළිවෙලින් සියයට 25 ක් සියයට 50 ක් හා සියයට 75 ක් දක්වා අඩුකිරීමට 2019 අගෝස්තු 27 දින අමාත්‍ය මණ්ඩලය තීරණය කර තිබුණු අතර මූල්‍ය | මේ සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන් සමඟ සාකච්ඡා කර ආයතනය බදාවකින් තොරව පවත්වාගෙන යෑම සඳහා සුදුසු යාන්ත්‍රනයක් ස්ථාපිත කළ යුතුය. | කළමනාකාරිත්වය වශයෙන් අදාළ සියළුම ලිපි ලේඛන හා හිමිකම් අදාළ අමාත්‍යාංශ වෙත ඉදිරිපත් කර ඇති බව, සම්පූර්ණ වියදම ප්‍රතිපූර්ණය කිරීමකින් තොරව කාර්යක්ෂම මෙහෙයුමක් ක්‍රියාත්මක කිරීමේ දුෂ්කරතා පිළිබඳව අවධාරණය කළ බව, එක් පැමිණීමකට ඩොලර් 2 බැගින් අය කිරීමට සැලසුම් ක්‍රියාත්මක වෙමින් පැවතුන නමුත් ආණ්ඩු වෙනස්වීම් හා අමාත්‍යාංශ වෙනස්වීම් හේතුවෙන් එය ක්‍රියාත්මක නොවූ බව හා 2021 වර්ෂයේදී රාජ්‍ය අමාත්‍යාංශයටද මෙම තත්ත්වය දැනුම්දී ඇති බව. | 2022 ජනවාරි 31 දින වන විටත් තත්ත්වය එසේම විය. |

| | | | | |
|---|---|---|---|---|
| | ප්‍රතිපාදන අඩුකිරීමෙන් පසුව පදනම පවත්වාගෙන යාම සඳහා යෝජනාවක් ඉදිරිපත් කරන ලෙස දන්වා තිබුණි. නමුත් එවැනි යොජනාවක් 2021 නොවැම්බර් 30 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණු අතර මෙම තත්ත්වය පදනමේ අඛණ්ඩ පැවැත්ම කෙරෙහි සෘජුව බලපෑ හැකි බව නිරීක්ෂණය විය. | | | |
| (ආ) | පදනම විසින් 2018 වර්ෂයේදී උණුසුම් කබා (Thermal Blanket) 627 ක් මිලදී ගැනීම සඳහා රු.4,583,511කට සමාන එක්සත් ජනපද ඩොලර් 28,572ක් අදාළ සැපයුම්කරු වෙත ගෙවා තිබුණු නමුත් කබා 225 ක් පමණක් සපයා තිබුණි. ඉතිරි කබා 402 ක වෙනුවෙන් ගෙවා තිබුණු රු.2,545,754 කට සමාන එක්සත් ජනපද ඩොලර් 18,319ක් ආපසු අයකර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | උණුසුම් කබා 402 ක ගෙන්වා ගැනීමට හෝ මුදල් අයකර ගැනීමට හෝ කටයුතු කළ යුතුය. | සැපයුම්කරුවන්ගෙන් රු.2,545,754 අයකර ගැනීමට අවශ්‍ය පියවර ගෙන ඇති නමුත් 2020 වර්ෂයේ ඇති වූ කොවිඩ් වසංගතය හමුවේ එම ක්‍රියාවලිය තාවකාලිකව නැවැත්වූ බව. | 2022 ජනවාරි 31 දින වන විටත් මුදල් අයකර ගැනීමට නොහැකිවී තිබුණි. |
| (ඇ) | පදනම සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනයක් බැවින් වෛද්‍ය සැපයීම් අංශය මඟින් ඖෂධ මිලදී ගැනීමේ හැකියාව පැවතියදී, වෛද්‍ය සැපයීම් අංශය විසින් මිලදී ගෙන තිබුණු මිලට වඩා වැඩි මිලකට ගිලන්රථ 297 ක පාවිච්චිය සඳහා අවශ්‍ය ඖෂධ හා වෛද්‍ය | අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කර මේ සඳහා විධිමත් ක්‍රමවේදයක් පිළියෙල කරගත යුතුය. | වෛද්‍ය සැපයුම් අංශය ඖෂධ සහ පරිභෝජන ද්‍රව්‍ය අලෙවි කරන ආයතනයක් නොවන බැවින් වෛද්‍ය සැපයුම් අංශය වෙතින් ඖෂධ මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රමවේදයන් අනුගමනය කිරීමට නොහැකි වූ බව, 2020 වර්ෂයේදී මාසික | 2022 ජනවාරි 31 දින වන විටත් මේ සම්බන්ධයෙන් විධිමත් ක්‍රමවේදයක් හඳුනාගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | පරිභෝජන ද්‍රව්‍ය වෙනත් බාහිර පාර්ශවයන්ගෙන් 2020 වර්ෂය තුළදී මිලදී ගෙන තිබුණු අතර වැයකර තිබුණු මුළු මුදල රු.8,721,138ක් විය. | | අවශ්‍යතා සඳහා වෛද්‍ය සැපයුම් අංශය වෙත ඉල්ලීම් ඉදිරිපත් කළ අතර ඒ අනුව යම් ප්‍රමාණයක් නොමිලේ ලැබුණු බව, ලැබුණු ප්‍රමාණය අවශ්‍යතා සපුරාලීමට ප්‍රමාණවත් නොවූ බැවින් බාහිර සැපයුම්කරුවන්ගෙන් මිලදී ගැනීමට සිදුවූ බව හා මෙහිදී රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවෙන් මිලදී ගැනීමට ප්‍රමුඛත්වය ලබාදී ඇති බව. | |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 133 සහ 2019 ජනවාරි 12 දිනැති අංක ඩීඑම්ඒ/1-2019 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව, පදනම සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණු අතර අභ්‍යන්තර විගණනයක් සිදුකරද නොතිබුණි. | අභ්‍යන්තර විගණන ඒකකයක් විධිමත් පරිදි ස්ථාපිත කළ යුතුය. | කාර්ය මණ්ඩල අනුමැතිය සඳහා ඉල්ලීමක් රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත යවා ඇති බව හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතිය ලැබුණු පසුව අභ්‍යන්තර විගණන ඒකකය පිහිටුවන බව. | 2022 ජනවාරි 31 දින වන විටත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලැබී නොතිබුණි. |

## 03. රත්මලාන විශ්වවිද්‍යාල විද්‍යායතනය

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය
2018 - තතත්ත්වාගණනය නොකළ මතය
2019 - තතත්ත්වාගණනය කළ මතය
2020 - තතත්ත්වාගණනය නොකළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව නිලධාරින්ට දීමනා හා වෙනත් මූල්‍යාධාර ගෙවීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ හෝ භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගත යුතු වුවද විද්‍යායතනය පාලක මණ්ඩලයේ අනුමැතිය මත පිළිතුරු පත්‍ර ලකුණු කිරීම, සිසුන්ගේ පාඨමාලා වලට අදාල විභාග රාජකාරී සඳහා ගෙවීම් කිරීම හා ප්‍රශ්න පත්‍ර සකස් කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුල රු.1,743,550ක් ගෙවා තිබුණි. | චක්‍රලේඛයට අනුකූලව කටයුතු කල යුතුය. | සිසුන් බඳවා ගැනීම සඳහා පැවති විභාග රාජකාරි සඳහා විද්‍යායතනයේ පාලක මණ්ඩලයේ අනුමැතිය මත ගෙවා ඇත. එසේම පිළිතුරු පත්‍ර ලකුණු කිරීම, සිසුන්ගේ පාඨමාලා වලට අදාලව පැවති විභාග සුපරීක්ෂණය වෙනුවෙන් හා ප්‍රශ්න පත්‍ර සකස් කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීම සඳහා අමාත්‍යාංශ ලේකම්තුමාගේ අනුමැතිය ලබාගෙන ඇත. | විභාග ප්‍රශ්න පත්‍ර සකස් කිරීම විභාග රාජකාරී සඳහා ගෙවීම් කිරීමට අනුමැතිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර තිබේ. |
| (ආ) | විද්‍යායතනය පවත්වාගෙන යනු ලබන රූඩ 03 පර්චස් 3.9 ක් වූ ඉඩමේ නීත්‍යානුකුල හිමිකම සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් විද්‍යායතනය වෙත පවරාගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉඩමේ අයිතිය ලබා ගැනීමට කටයුතු කල යුතුය. | විද්‍යායතනය පවත්වාගෙන යනු ලබන ඉඩමේ නීත්‍යානුකූල හිමිකම විද්‍යායතනයට පවරා ගැනීමට කටයුතු කෙරෙමින් පවතී. | විද්‍යායතන පවත්වාගෙන යනු ලබන ඉඩමේ නිත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට ඉල්ලීම් කර ඇත. |

## 04. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 - මතය වියාචනය

2019 - තතත්ත්වාගණනය කළ මතය

2020 - තතත්ත්වාගණනය නොකළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | එක්සත් ජාතින්ගේ සංවර්ධන වැඩසටහන විසින් දරන ලද පුනරාවර්තන වියදම් රු.2,924,950ක් පුනරාවර්තන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණ ද, අදාල ප්‍රදාන ලැබීම් කාර්යාලයේ ආදායමක් ලෙස හදුනා නොගෙන සංචිතවලට එකතු කර තිබුණි. මෙම නිසා 2019 වර්ෂයේ කාර්යාලයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වුණි. | ප්‍රදානලැබීම් නිවැරිදිව ගිණුම්ගත කළ යුතු බව. | ඉදිරියේදි මෙවැනි අඩුපාඩු ඇති නොවීමට වග බලා ගන්නා ලෙසට නිලධාරින් දැනුවත් කළෙමි. | ගිණුම්වල නිවැරදි කර නොමැත. |
| (ආ) | 2020 වර්ෂයේ වියදම් අයිතම 3කට අදාළව ගෙවිය යුතු වටිනාකම රු.1,436,320ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ගෙවිය යුතු වටිනාකම් නිවැරදිව ගිණුම්ගත කළ යුතු බව. | ඉදිරියේදි මෙවැනි අඩුපාඩු ඇති නොවීමට වග බලා ගන්නා ලෙසට නිලධාරින් දැනුවත් කළෙමි. | -එම- |
| (ඇ) | 2019 වර්ෂයේදී මහා භාණ්ඩාගාර ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ලැබී තිබුණ රු.2,935,713ක් අයභාර වියදම් සඳහා වැය කර එම ප්‍රදාන ලැබීම් කාර්යාලයේ ආදායමක් ලෙස දක්වා තිබුණ ද, මේ සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | භාණ්ඩාගාරයෙන් අනුමැතිය ලබා ගත යුතු බව. | ඉදිරියේදි මෙවැනි අඩුපාඩු ඇති නොවීමට කටයුතු කරන ලෙසට නිලධාරින්ට උපදෙස් දී ඇත. | අනුමැතිය ලබාගෙන නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | ජොෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරු 39න් 30ක් හා තෘතිය මට්ටමේ තනතුරු 114න් 99ක්ම පුරප්පාඩු පැවතීම පරිපාලන කටයුතු කෙරෙහි අහිතකර බලපෑම් ඇති වීමේ හැකියාවක් පැවතිය හැකි බව නිරික්ෂණය විය. | පුරප්පාඩු පිරවීමට කටයුතු කල යුතු බව. | පවතින පුරප්පාඩු ඉදිරියේදි සම්පූර්ණ කිරීමට කටයුතු කරමි. | පුරප්පාඩු එසේම පවතී. |

## 05. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 - තතත්ත්වාගණනය කළ මතය

2019 - තතත්ත්වාගණනය කළ මතය

2020 - තතත්ත්වාගණනය නොකළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2020 දෙසැම්බර් 31 දින වන විට නවදිගන්තය පුනරුථාපන මධ්‍යස්ථානය තුළ දානපතියෙකු විසින් ඉදිකර තිබුණු නව ගොඩනැගිල්ලේ වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | පරිත්‍යාගයන් තක්සේරුකර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කළ යුතුය. | 2021 වර්ෂය සඳහා ගිණුම් පිළියෙල කිරීමේදී මෙම වරද නිවැරදි කරන බව. | 2022 ජනවාරි 31 දින වන විටත් ගොඩනැගිල්ලේ වටිනාකම තක්සේරු කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම පමණක් සිදු කර තිබුණි. |
| (ආ) | 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව මණ්ඩලයේ දේපළ, පිරියත හා උපකරණවල පිරිවැය රු.මිලියන 761.85ක් වුවද, අනුරූපී වාර්තා අනුව එම අගය රු.මිලියන 769.29ක් වූයෙන් වෙනස රු.මිලියන 7.44ක් විය. | වෙනස්කම් වලට හේතු කඩිනමින් සොයා බලා අවශ්‍ය ගැලපීම් සිදුකළ යුතුය. | වෙනස්කම් වලට හේතු කඩිනමින් සොයා බලා ඉදිරියේදී විගණනයට වාර්තා කිරීමට කටයුතු කරන බව. | 2022 ජනවාරි 31 දින වන විටත් වෙනස්කම්වලට හේතු සොයා අංශය ගැලීම් කර නොතිබුණි. |
| (ඇ) | වර්ෂ 20 කට වැඩි කාලයක සිට චලනය නොවී පැවති 2020 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් ගිණුමේ හර ශේෂය රු.1,782,060හි නිරවද්‍යතාව සනාථ කර ගැනීමට ප්‍රමාණවත් තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. | අත්තිකාරම් ගිණුම් ශේෂයෙහි නිරවද්‍යතාව සනාථ කර ගැනීමට ප්‍රමාණවත් තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. | අත්තිකාරම් ගිණුම් ශේෂය ඉතා පැරණි ශේෂයක් වන බැවින් හඳුනා ගත නොහැකි බව හා 2021 මාර්තු 03 දින පැවති විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී ලද උපදෙස් මත එම ශේෂය නිරවුල් කිරීම සඳහා කමිටුවක් පත්කර අදාළ ශේෂ නිරවුල් කරමින් පවතින බව. | 2022 ජනවාරි 31 දින වන විටත් මෙම ශේෂ නිරවුල් කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2016 පෙබරවාරි 5 දින රු.1,594,165ක් වැයකර නවදිගන්තය මධ්‍යස්ථානයේ අකුණු සන්නායක පද්ධතියක් සවිකර තිබුණු නමුත්, වගකීම් කාලය තුළදීම එය අක්‍රියවී තිබුණි. නමුත් එය යථා තත්ත්වයට පත්කර නොතිබුණි. | අවශ්‍යතාවයන් හඳුනාගෙන නිවැරදි පිරිවිතරයන්ට අනුව මිලදී ගැනීම් සිදු කළ යුතුය. | මෙම අකුණු සන්නායක පද්ධතිය නැවත අළුතින් කොටස් දමා නවීකරණය කළ යුතු බවට අදාළ ආයතනය විසින් දන්වා ඇති බව. | 2022 ජනවාරි 31 දින වන විටත් එය අක්‍රිය තත්වයේ පැවති අතර 2022 වර්ෂයේදී නව ප්‍රසම්පදනයක් සිදුකිරීමට සැලසුම්කර තිබුණි. |
| (ඉ) | 2010 මැයි 12 දිනැති අංක 1653/ 19 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයට අනුව, යම් තැනැත්තකු විසින් ඖෂධවලට ඇබ්බැහි වූ තැනැත්තන් රැකබලා ගැනීම හා පුනරුත්තාපනය සඳහා පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථානයක් පවත්වාගෙන යයි නම් ඔහු විසින් අන්තරායක ඖෂධ පාලක ජාතික මණ්ඩලය විසින් නිකුත් කරන බලපත්‍රයක් ලබා ගැනීම අනිවාර්ය වුවද, 2021 ජූලි මාසය වන විට බලපත්‍ර කල් ඉකුත්වී තිබුණු පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන 14 ක් විය. 2019, 2020 හා 2021 ජූලි මාසය දක්වා බලපත්‍ර නිකුත් කිරීමෙන් ලද අදායම පිළිවෙලින් රු.17,000, රු.13,500 හා රු. 2,000 ක් වූ බැවින් බලපත්‍ර අලුත් කිරීම ක්‍රමක්‍රමයෙන් අඩුවී ඇති බව නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් නිසි නියාමනයක් සිදුකර නොතිබුණි. | පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන නියාමනය සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගත යුතුය. | පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන නියාමනය කිරීමේදී ඇති වන ප්‍රායෝගික ගැටළු හඳුනාගෙන සුදුසු පරිදි 2007 අංක 54 දරන ඖෂධවලට ඇබ්බැහිවූ තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථාපනය) පිළිබඳ පනත සංශෝධනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් පිළියෙල කර අධිකරණ අමාත්‍යාංශය වෙත යොමු කර ඇති බව. | 2022 ජනවාරි 31 දින වන විටත් පනත සංශෝධනය කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඊ) | ආයතනයේ ආරක්ෂක වැඩපිළිවෙල ප්‍රමාණවත් නොවීම, උපදේශණයන් මඟින් සේවාලාභීන් රඳවා ගැනීමට ප්‍රමාණවත් උත්සාහයක් නොගැනීම ආදී කරුණු හේතුවෙන් නවදිගන්තය මධ්‍යස්ථානයේ 2018 වර්ෂයේ ප්‍රතිකාර සඳහා ඇතුළත් වූ සේවාලාභීන්ගෙන් 37 ක් දින 1 සිට දින 38 ක් දක්වා කාලයක් ගතකර අනවසරයෙන් බැහැරවී තිබුණු අතර තලංගම මධ්‍යස්ථානයේ 2017 වර්ෂයේ 15 දෙනෙකු පලාගොස් තිබුණි. | ප්‍රමාණවත් ආරක්ෂක වැඩපිළිවෙලක් යෙදිය යුතුය. | සේවාලාභීන් පලායාම වළක්වා ගැනීමට අවශ්‍ය ආරක්ෂිත යකඩ ආවරණ යොදා දොර ජනෙල් ශක්තිමත් කිරීමට අවශ්‍ය පියවර ගැනීමට හා උපදේශනයේ ගුණාත්මකභාවය වර්ධනය කිරීම සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීමට කටයුතු කරන බව. | 2022 ජනවාරි 31 දින වන විටත් මධ්‍යස්ථාන පරිශ්‍රය වටා ආරක්ෂිත වැටක් ස්ථාපිත කර නොතිබුණු බැවින් අනවසර බැහැරවීම් මේ වන විටද වාර්තා වේ. |
| (උ) | 2008 අංක 01 දරන ඖෂධ සහ මනෝ වර්තක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනත ක්‍රියාත්මක කිරීමට සම්මත කළ 2010 අංක 01 දරන පූරෝගාමී පාලන අධිකාරියේ නියෝග III වැනි කොටසේ 13 වන වගන්තිය ප්‍රකාරව අධිකාරියේ සාමාජිකයන් විසින් අවම වශයෙන් මාස තුනකට වතාවක්වත් බලපත්‍රලාභියාගේ ලියාපදිංචි කරනු ලැබූ පරිශ්‍රයට පැමිණ පනතේ නිශ්චිතව දක්වා ඇති ද්‍රව්‍ය භාවිතා කරමින් කරගෙන යන්නා වූ ක්‍රියාකාරකම් පිළිබඳ අධීක්ෂණය කළ යුතු වුවද එම නියෝග ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | නියමිත කාලය තුළ නිසි අධීක්ෂණයක් සිදු කළ යුතුය. | මෙම අධීක්ෂණ කටයුතු වැඩිදියුණු කිරීම පිණිස මණ්ඩලයේ පාර්ශවකරුවන් වන පොලීසිය, සුරාබදු දෙපාර්තමේන්තුව වැනි ආයතන වල සහාය ලබා ගැනීමට ඇති හැකියාව පිළිබඳ සාකච්ඡා පවත්වන බව. | 2022 ජනවාරි 31 දින වන විටත් නියමිත කාලය තුළ නිසි පරිශ්‍ර අධීක්ෂණයක් සිදු නොවන බව නිරීක්ෂණය විය. |

| | | | | |
|---|---|---|---|---|
| (උ) | 2014 අප්‍රේල් 30 දින රු.4,027,518ක් වැයකර තිස් අවුරුදු බදු පදනම මත හෝමාගම පිහිටි පර්චස් 40ක ඉඩම මිලදී ගෙන තිබුණු නමුත්, 2021 සැප්තැම්බර් 01 දින වන විටත් එය ඵලදායි කාර්යයක යොදා ගැනීමකින් තොරව නිෂ්කාර්යව පැවතුණි. | අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම සඳහා කඩිනමින් කටයුතු කළ යුතු බව. | ඉඩම ඵලදායි කාර්යයක් සඳහා කඩිනමින් යෙදවීමට ක්‍රියාමාර්ග ගන්නා බව. | 2022 ජනවාරි 31 දින වන විටත් ඉඩම නිශ්කාර්යව පැවතුණි. |
| (ඌ) | තාක්ෂණික උපදේශක තහවුරුවක් ලබා නොගෙන රු.3,884,160ක් වැය කර ස්ථාපනය කර තිබුණු LED විඩියෝ පැනලය 2020 වර්ෂය අවසානය දක්වාම අක්‍රිය තත්ත්වයේ පැවතුණි. | ක්‍රියාකාරී තත්ත්වයට පත් පත්කළ යුතුය. | විගණන හා කළමනාකරණ කමිටු නිර්දේශයන් අනුව තාක්ෂණික කමිටුවක් පත්කර ඇති බව. | 2022 ජනවාරි 31 දින වන විටත් LED විඩියෝ පැනලය අක්‍රියව පැවතුණි. |
| (ඍ) | අධ්‍යක්ෂ (පරිපාලන) තනතුර 2013 වර්ෂයේ සිටද අධ්‍යක්ෂ ජනරාල් තනතුර 2017 වර්ෂයේ සිටද පුරප්පාඩුවී පැවතුණි. මණ්ඩලයේ ඉහළ කළමණාකරණ තනතුරු දීර්ඝකාලයක සිට පුරප්පාඩුව පැවතීම, මණ්ඩලය පිහිටුවීමේ අරමුණු නිසි ලෙස ඉටුකර ගැනීමට නොහැකිවීම සඳහා ඍජුවම බලපාන බව නිරීක්ෂණය විය. | මෙවැනි අත්‍යවශ්‍ය තනතුරු සඳහා සුදුසුකම් සහිත නිලධාරීන් ස්ථිර පදනමින් බඳවා ගැනීමට හැකි සෑම උත්සාහයක්ම දැරිය යුතුය. | 2020 ඔක්තෝබර් 23 දින පුවත්පත් දැන්වීම් හා ගැසට් පත්‍රයේ දැන්වීම් පළකර අයදුම්පත් කැඳවූ නමුත් අනුමත බඳවා ගැනීමේ පටිපාටිය අනුව මූලික සුදුසුකම් සහිත අයදුම්පත් ලැබී නොමැති බව හා මෙම පුරප්පාඩු තනතුරු සඳහා වැඩ බැලීමේ පදනම මත නිලධාරීන් පත් කර ඇති බව. | 2022 ජනවාරි 31 දින වන විටත් මෙම තනතුරු පුරප්පාඩුව පැවතුණි. |

## 06. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - තතත්ත්වාගණනය කළ මතය

2019 - තතත්ත්වාගණනය කළ මතය

2020 - තතත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනත සංශෝධනය කිරීම 2008 වර්ෂයේ දී ආරම්භ කර තිබුණ ද 2020 දෙසැම්බර් 31 දින වන තෙක් අදාල සංශෝධන පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | පනතෙහි සංශෝධන සිදුකර පාර්ලිමේන්තු අනුමැතිය ලබාගත යුතුය. | අවසාන කෙටුම්පත මේ වන විට අමාත්‍යාශයේ නීති අංශය වෙත බාර දී ඇත. | අවශ්‍ය පරිදි සංශෝධන සහිතව පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම 2021 වර්ෂය අවසානය දක්වාම ප්‍රමාද වී තිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ.104 (I) ප්‍රකාරව 2018 වර්ෂයේ සිට 2020 අගෝස්තු දක්වා වාහන අනතුරු 11 ක් සම්බන්ධයෙන් මූලික පරීක්ෂණ සිදුකර නොතිබුණි. | මුදල් රෙගුලාසිවල සඳහන් විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. | මූලික පරීක්ෂණ පැවැත්වීමට අදාල කටයුතු කඩිනමින් සිදුකිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත. | සමහරක් මූලික පරීක්ෂණ පවත්වා ඇතත් ඉතිරි මූලික පරීක්ෂණ පැවැත්වීමට කටයුතු කර නැත. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ.104 (4) ප්‍රකාරව 2015 සිට 2017 වර්ෂයට අදාල වාහන අනතුරු 33 ක් සම්බන්ධයෙන්ද 2018 සිට 2020 අගෝස්තු දක්වා වාහන අනතුරු 31 ක් සම්බන්ධයෙන්ද පූර්ණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසිවල සඳහන් විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. | පූර්ණ වාර්තා සකස් කිරීමට අදාල කටයුතු සිදු කරමින් පවතී. | පූර්ණ වාර්තා සකස් කර ඉදිරිපත් කිරීමට කටයුතු කර නැත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ.110 ප්‍රකාරව හානි හා පාඩු ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. | මුදල් රෙගුලාසිවල සඳහන් විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. | පරිපාලන අංශයට අදාල තොරතුරු ලබාගැනීම සඳහා එම අවශ්‍යතාවය පිළිබඳ දැනුවත් කර ඇත. | 2021 වර්ෂය අවසානය දක්වාම ලේඛනය යාවත්කාලීන කර නැත. |
| (ඉ) | 2020 පෙබරවාරි 13 දිනැති ආපදා අවදානම් අවම කිරීමේ ව්‍යාපෘති සම්බන්ධ උපදෙස් මාලාවේ (1) ඡේදය පරිදි රාජ්‍ය ආයතනවලට අවදානම අවම කිරීම සඳහා ප්‍රමාණවත් භෞතික හා මූල්‍ය සම්පත් නොමැති බවට එම ආයතන විසින් සහතික කර ඉල්ලීමක් කළ යුතු වුවත්, එවැනි ඉල්ලීම් කිරීමකින් තොරව රු. මිලියන 30 ක් ව්‍යාපෘති 26 ක් සඳහා විවිධ රාජ්‍ය ආයතනවලට ලබාදී තිබුණි. | ව්‍යාපෘති සම්බන්ධ උපදෙස් පරිදි කටයුතු කළ යුතු වේ. | දිස්ත්‍රික් ලේකම් විසින් ඉදිරිපත් කරනු ලබන ව්‍යාපෘති ජාතික මට්ටමින් ප්‍රමුඛතා ගත කර ප්‍රතිපාදන ලබාදීම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මඟින් සිදුකරනු ලබයි. ඒ අනුව එම ව්‍යාපෘති 26 සඳහා ප්‍රතිපාදන ලබා දී ඇත. | ඉල්ලීම් ලබා ගැනීමට ක්‍රියාපිළිවෙතක් සකස් කර නැත. |

**07. ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාව**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 - තතත්ත්වාගණනය නොකළ මතය

2019 - තතත්ත්වාගණනය කළ මතය

2020 - තතත්ත්වාගණනය නොකළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | ආබාධ සහිත තැනැත්තන් පිළිබඳ දත්ත පද්ධතිය සකස් කිරීම සඳහා 2019 වර්ෂයේදී රු.13,500,000ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණි. එහිදී සමස්ථ දිස්ත්‍රික්ක 25 ආවරණය කළයුතු වුවද නියමු ව්‍යාපෘතියක් ලෙස නාරම්මල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ග්‍රාම නිලධාරී වසම් 03ක පමණක් රු.1,900,000ක් වැයකර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. කෙසේ වුවද 2020 වර්ෂය තුලදී මෙම වැඩසටහන ක්‍රියාත්මක කර නොතිබුණි. | ආයතනයට තීරණ ගැනිම සඳහා වැදගත් වන දත්ත පද්ධතියක් කඩිනමින් සකස් කළයුතු වීම. | දත්ත පද්ධතිය සකස් කිරීමේ කටයුතු ආරම්භකර තාවකාලිකව අත්හිටුවා තිබුණි. | කටයුතු ආරම්භ කිරීමට අවධානය යොමු නොකර ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මඟින් සිදුකිරීමට නියමිත සංගණනයේදී ආබාධිත ප්‍රජාවද ඇතුලත් කෙරෙන පරිදි දත්ත සකස් කිරීමට සැලසුම් කර ඇත. |
| (ආ) | 2016 අංක 01 දරන ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ප්‍රවේශ නියෝග යටතේ ආබාධ සහිත තැනැත්තන් සඳහා ප්‍රවේශ පහසුකම් සැපයීම හා නීති ක්‍රියාමාර්ග ගැනීම පිළිබඳව කටයුතු ක්‍රියාත්මක කිරීම , පසුවිපරම් කිරීම හා අධීක්ෂණ කටයුතු යනාදි කාර්යයන්හි වගකීම මහ ලේකම් කාර්යාලය වෙත පැවරී තිබුණද,තාක්ෂණ නිලධාරිවරයෙක් බඳවාගෙන | ආයතනයට අත්‍යවශ්‍ය වූ තාක්ෂණ නිලධාරී තනතුර සඳහා නිලධාරීන් බඳවාගෙන ආබාධිත ප්‍රජාව සඳහා සුභසාධන කටයුතු කාර්යක්ෂමව පවත්වාගත යුතුය. | තාක්ෂණ නිලධාරිවරයෙක් බඳවාගැනීම සඳහා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ වෙත දැන්වීමට කටයුතු කර තිබුණි. | තාක්ෂණ නිලධාරියෙකු බඳවාගැනීමට හා ආබාධිත ප්‍රජාව සඳහා සුභසාධන කටයුතු ඉටුකිරීම කෙරෙහි ප්‍රමාණවත් අවධානය යොමු වී නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | නොමැති බැවින් එම කාර්යය ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි. | | | |
| (ඇ) | 2019 අයවැය යෝජනාව අනුව ආබාධ සහිත ප්‍රජාව සේවා නියුක්ත කිරීමේ අරමුණින් වැටුප් සහනාධාරයක් ලබාදීම සඳහා අමාත්‍යමණ්ඩලයේ අනුමැතිය පරිදි ලංකාවාසි සියලුම ආබාධ සහිත තැනැත්තන්ගේ සුදුසුකම් වලට ගැලපෙන ලෙස රැකියා සැපයීමේ ව්‍යාපෘතියක් සැලසුම්කර තිබුණු අතර ඒ සඳහා 74,500,000ක පරිපූරක ඇස්තමේන්තුවක් අනුමත කර තිබුණි. දිස්ත්‍රික්ක 25 ආබාධ සහිත පුද්ගලයන් 4965ක් සඳහා වැටුප් සහනාධාර තීරණය කර තිබුණු නමුත් ආබාධිත ප්‍රජාවගේ දත්ත පද්ධතියක් නොමැති වීම හේතුවෙන් සහනාධාරය ලබාදීමට නොහැකි වී තිබුණි. මේ හේතුවෙන් මුළු ප්‍රතිපාදනයම උපයෝජනය කර නොතිබුණි. | ආබාධ සහිත පුද්ගලයන් සේවා නියුක්ත කිරීමේ කටයුතු අප්‍රමාදව සිදුකර ජීවනෝපාය මාර්ග උදාකිරීමට කටයුතු කළ යුතුය. | ආබාධිත ප්‍රජාව රැකියාගත කිරීමේ මූලික කටයුතු ඉටුකර වැඩසටහන අතරමඟ අත්හැර දමා ඇත. | වැඩසටහන ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අවධානය යොමු කර නොතිබුණි. |
| (ඇ) | ජාතික සභාවේ තනතුරු 16ක් සඳහා අනුමත කර තිබුණු 40ක කාර්යය මණ්ඩලයෙන් තාක්ෂණ නිලධාරී ,සංඥා භාෂා පරිවර්තක හා සහ බ්‍රේල් උපදේශක යනාදී ප්‍රධාන තනතුරු 14ක පුරප්පාඩු පැවතිණි. | තනතුරු සඳහා බඳවාගැනීමට කටයුතු කර සභාවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම වෙනුවෙන් අවධානය යොමු කල යුතුය. | සංඥා භාෂා පරිවර්තක සහ බ්‍රේල් උපදේශක තනතුරු සඳහා බඳවාගැනීමේ පටිපාටිය සකස් කර අනුමැතියට ඉදිරිපත් කර තිබුණු අතර තාක්ෂණ නිලධාරී හා කලමනාකරණ සේවා නිලධාරීන්ගේ | සභාවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම වෙනුවෙන් වූ අත්‍යවශ්‍ය කාර්යමණ්ඩලයේ පවතින පුරප්පාඩු පිරවීමට 2021 වර්ෂය අවසානය දක්වාම කඩිනම් හා ප්‍රමාණවත් |

පූරප්පාඩු පිරවීම සඳහා පියවර ගෙන
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ නොතිබුණි.
ජනරාල් වෙත දන්වා
තිබුණි.

## 08. ආයුර්වේද වෛද්‍ය සභාව

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 - තතත්ත්වාගණනය කළ මතය

2019 - තතත්ත්වාගණනය කළ මතය

2020 - තතත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 111 වන කොටස 11(1) (ඉ) වගන්තිය ප්‍රකාරව ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරුන් විසින් ඔවුන් අතරින් තෝරාපත් කරගනු ලැබූ සාමාජිකයන් තිදෙනෙකු සභාවේ සාමාජිකයන් ලෙස පත්කළ යුතු නමුත් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම එම සාමාජිකයන් තිදෙනා පත්කිරීමට කටයුතු කර නොතිබුණි. | ආයුර්වේද පනතට අනුව කටයුතු කළ යුතුය. | මෙම සාමාජිකයින් තිදෙනා පත්කිරීම සඳහා ආයුර්වේද කොමසාරිස් විසින් ඡන්ද විමසීමක් පැවැත්විය යුතු නමුත් ඒ සඳහා අධික වියදමක් දැරිය යුතු බැවින් පළාත් කොමසාරිස්වරයාගේ අධීක්ෂණය යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් ඡන්දය පැවැත්වීමට යෝජනා කර ගැසට් නිවේදනය සංශෝධනය සඳහා රාජ්‍ය අමාත්‍යාංශය වෙත යොමු කර ඇති බව | 2022 ජනවාරි 31 දින වන විටත් සාමාජිකයන් තිදෙනා පත්කිරීමට අසමත්වී තිබුණි. |
| (ආ) | 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 18(ඇ) හා (ඈ) වගන්ති අනුව 2020 දෙසැම්බර් 31 දිනට සභාවේ ලියාපදිංචිවී තිබුණු මුළු හෙද නිලධාරීන් සංඛ්‍යාව 39 ක් හා භෛසජ්ජකවරුන් සංඛ්‍යාව 260 ක් වූ අතර ලියාපදිංචිය කාලානුරූපව අලුත් කිරීමේ ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණු බැවින් එම සංඛ්‍යා යාවත්කාලීනවී නොතිබුණි. | ආයුර්වේද පනතට අනුව කටයුතු කළ යුතුය. | ලියාපදිංචි හෙද නිලධාරීන් හා භෛෂජ්‍යයකවරුන්ගේ තොරතුරු යාවත්කාලීන කිරීම සඳහා ආයුර්වේද දෙපාර්තමේන්තුව හා පළාත් කොමසාරිස්වරුන් වෙතින් තොරතුරු කැඳවා ඇති බව හා ඉදිරියේදී එම ලේඛන වාර්ෂිකව යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව. | 2022 ජනවාරි 31 දින වන විටත් මෙම තත්ත්වය එසේම පැවතුනි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2005 ජූලි 05 දිනැති අංක 14/13/08 (03) දරන ආයුර්වේද වෛද්‍ය සභා පත්‍රිකාව අනුව සභාවේ ලියාපදිංචි සියළුම වෛද්‍යවරුන් වර්ෂ 05 කට වරක් ලියාපදිංචිය යාවත්කාලීන කළ යුතු නමුත් ලියාපදිංචිය යාවත්කාලීන කිරීම සඳහා සභාව විසින් විධිමත් ක්‍රමවේදයක් හඳුනාගෙන ක්‍රියාත්මක කර නොතිබීම හේතුවෙන් 2020 වර්ෂය අවසාන වන විට ලියාපදිංචිය වර්ෂ 05 ක් ඉක්ම වූ වෛද්‍යවරු 15,986 ක් සිය ලියාපදිංචිය අලුත් කරගෙන නොතිබුණි. | වෛද්‍යවරුන්ගේ ලියාපදිංචිය යාවත්කාලීන කිරීමට විධිමත් ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතුය. | සභාවේ ලියාපදිංචි සියළුම වෛද්‍යවරුන් සෑම වර්ෂ 05 කට වරක් යාවත්කාලීන කිරීම සම්බන්ධයෙන් පළාත් කොමසාරිස්වරුන් මඟින් දැනුවත් කර ඇති බව හා ලියාපදිංචිය අලුත් නොකළ වෛද්‍යවරුන්ගේ නාමලේඛන දිස්ත්‍රික් මට්ටමින් සකස් කර පළාත් කොමසාරිස්වරුන් මඟින් ලියාපදිංචිය අළුත් කිරීම සඳහා යොමු කිරීමේ වැඩ පිළිවෙලක් ආරම්භ කර ඇති බව. | - එම - |
| (ඈ) | සභාවේ ආයුර්වේද වෛද්‍යවරු, පාරම්පරික ආයුර්වේද වෛද්‍යවරු, ආයුර්වේද හෙද නිලධාරීන් හා භෛසජ්ජකවරු ලියාපදිංචි කිරීම, ඔවුන් වෙනුවෙන් විභාග පැවැත්වීම, විභාග ප්‍රතිඵල නිකුත් කිරීම යනාදී වශයෙන් වූ ක්‍රියාවලීන්හි කාර්යයන් ඇගයීම සඳහා කාර්යසාධන දර්ශක පිහිටුවා කාර්යසාධනය සමාලෝචනය කර නොතිබුණි. | ක්‍රියාවලීන්හි කාර්යයන් ඇගයීමට කාර්යසාධන දර්ශක පිහිටුවා සමාලෝචනය කළ යුතුය. | කාර්යසාධන දර්ශක පිහිටුවීම සඳහා අවශ්‍ය කටයුතු සැළසුම් කිරීම පිළිබඳව ආයුර්වේද වෛද්‍ය සභාවේ අවධානය යොමු කරන බව. | 2022 ජනවාරි 31 දින වන විටත්, අදාළ කාර්යසාධන දර්ශක පිහිටුවා නොතිබුණි. |
| (ඉ) | පාරම්පරික ආයුර්වේද වෛද්‍යවරු වශයෙන් ලියාපදිංචිය අපේක්ෂිත අයදුම්කරුවන් පුහුණු කාලය තුළ ඇගයීම සඳහා සකස් කළ නිර්ණායක පිළිබඳව විවිධ | ඇගයීම් කඩිනමින් පැවැත්වීමට කටයුතු කළ යුතුය. | මේ සඳහා අදාළ නිර්ණායක සකස් කර ඇති බව හා ආයුර්වේද වෛද්‍ය සභා සාමාජිකයින් හා සම්පත් දායකයින්ගේ සහභාගීත්වයෙන් වැඩ | 2022 ජනවාරි 31 දින වන විටත්, නිර්දේශය පරිදි කටයුතු කර නොතිබුණි. |

පාර්ශවයන්ගේ අදහස් ලබා ගැනීමට වැඩි කාලයක් ගැනීම හේතුවෙන් ඒවා මෙතෙක් ක්‍රියාත්මක කිරීමට නොහැකිව පැවතුණි.

මූළුවක් පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇති බැවින් ඉන් පසුව අදාළ කරුණු ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව.

## 9. ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - තතත්ත්වාගණනය කළ මතය

2019 - තතත්ත්වාගණනය කළ මතය

2020 - තතත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | මාණ්ඩලික විද්‍යාලය විසින් 2018 වර්ෂය තුල ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 විධිවිධානයට වලට පටහැනිව ඡායා පිටපත් යන්ත්‍රයක්, කූඩාරම්, ගොඩනැඟිලි ද්‍රව්‍ය යනාදී ප්‍රාග්ධන වත්කම් මිලදී ගැනීම සඳහා රු.6,619,998ක මුදලක් හා මෝටර් රථ අළුත් වැඩියා, විදුලි උපකරණ අළුත් වැඩියා වැනි පුනරාවර්තන වියදම් සඳහා රු.11,617,870ක මුදලක් විද්‍යාල ආයතන සභාපතිගේ ගිණුම මගින් දරා පසුව ප්‍රතිපූරණය කර තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමෙන් ආයතනික ප්‍රසම්පාදන කටයුතු විධිමත්ව සිදුකිරීමට කටයුතු කිරීම අවශ්‍ය වේ | විද්‍යාලයීය ආයතන සභාපති ගිණුම මගින් වැය දරා ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත භාණ්ඩ මිලදී ගෙන ඇත්තේ වඩා උසස් තත්ත්වයෙන් හා ප්‍රමිතයෙන් යුතු භාණ්ඩ මිලදී ගැනීම සඳහා සහ වෙළඳ ප්‍රවර්ධන වැඩසටහන් වෙතින් අඩු මිලට භාණ්ඩ මිලදී ගැනීම සඳහා වේ. තවද, ණය පදනම මත ලබානොදෙන භාණ්ඩ විද්‍යාලයේ සියලුම නිලයන්ගේ සුභසාධන කටයුතු සඳහා විද්‍යාලය වෙතින් ප්‍රතිපූර්ණ කිරීමේ පදනම මත භාණ්ඩ මිලදී ගෙන ඇත. | වර්තමානය වන විටත් මෙම අරමුදලින් භාණ්ඩ මිලදී ගෙන ප්‍රතිපූර්ණය කරන අවස්ථා දක්නට ලැබේ. |
| (ආ) | මාණ්ඩලික විද්‍යාලයේ සේවකයින් වෙනුවෙන් 2009 වර්ෂයේ සිට 2019 වර්ෂය අවසානය දක්වා සේවක භාර අරමුදල් සඳහා ගෙවිය යුතු රු.4,819,548ක් ගිණුම් ගත කර නොතිබුණි. | සේවක භාර අරමුදල් පනත ප්‍රකාරව කටයුතු කල යුතුය. | සේවා නියුක්ත භාර අරමුදලේ දායකත්වය ලබාගෙන දායක මුදල් ගෙවීමට ඉදිරියේදි කටයුතු සිදු කරන බව. | සේවා නියුක්ත භාර අරමුදලේ දායකත්වය 2021 වර්ෂය අවසානය වන විටත් ලබාගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | හෙයියන්තුඩුව තරුණ සේවා සභාවට අයත් අක්කර 11 ක ඉඩම තුල විද්‍යාලය විසින් ගොඩනැගිලි ඉදිකර ඒවා භාවිතයට ගනිමින් පැවතියද එම ඉඩමෙහි නීත්‍යානුකූල අයිතිය 2020 වර්ෂයේ දෙසැම්බර් 31 වන විටත් පවරාගෙන නොතිබුණි. | ඉඩමෙහි අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය. | මේ වන විට එම ඉඩමේ අයිතිය පවරා ගැනිම සඳහා අවශ්‍ය කටයුතු කරමින් පවතින අතර, මේ පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | ඉඩමේ අයිතිය පවරා ගැනීමේ කටයුතු 2021 වර්ෂය අවසානය දක්වාම ආරම්භ කර නැත. |
| (ඈ) | මාණ්ඩලික විද්‍යාලයේ රු.මිලියන 1,352.15ක් වටිනා ඉඩම් සහ ගොඩනැගිලි විද්‍යාලයේ ආරම්භක වර්ෂය වූ 2008 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ප්‍රත්‍යාගණනය කර වත්කම්වල සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. එසේම වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේදී එකම පංතියකට අදාල සියලුම වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම් තුල ගැලපීම් කල යුතු වුවත් ඒ පිළිබඳ නොසලකා පිරිවැය රු.388,277,669ක වත්කම් අයිතම 2060 ක් 2019 දෙසැම්බර් 30 දින ප්‍රත්‍යාගණනය කර තිබුණු නමුත් ක්ෂය වී අවසන් අයිතම 257ක පිරිවැය රු.55,164,837කට අදාල රු.33,477,246ක ප්‍රත්‍යාගණන වටිනාකම පමණක් ගිණුම් තුල ගැලපීම් කර තිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වල නිශ්චිතව දක්වා ඇති මාර්ගෝපදේශ හා උපදෙස් ප්‍රකාරව වත්කම්වල සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කළ යුතුය. | ආයතනයේ වත්කම් තක්සේරු කර තක්සේරු දෙපාර්තුමේන්තුව මගින් 2019 වර්ෂය අවසානයේ තක්සේරු වාර්තාව ලබාදී ඇත. නමුත් මෙහි ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කර නොතිබුණි. ඒ අනුව නැවත තක්සේරු දෙපාර්තුමේන්තුව වෙත දැනුම්දී ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කර වටිනාකම හඳුනාගෙන ගිණුම් ගත කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමි. | ප්‍රත්‍යාගණනය කර සාධාරණ වටිනාකම් හදුනාගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | මාණ්ඩලික විද්‍යාලයේ අධ්‍යයන කටයුතු සඳහා අවශ්‍ය සිව්මහල් විභාග ශාලා සහ පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා 2017 ඔක්තෝබර් 06 දින රු.115,878,415කට කොන්ත්‍රාත් සමාගමක් සමග ගිවිසුමකට එළඹ තිබුණි. 2018 දෙසැම්බර් 31 වන විට ගොඩනැගිල්ලේ වැඩ අවසන් කිරීමට අදාල අවසන් බිල්පත ලබා දී තිබුණි. එසේ වූවද එම ගොඩනැගිල්ලේ ඉහල මහලේ ජල කාන්දු වීමක් නිසා විද්‍යාලය විසින් බිල්පත් ගෙවීම අත්හිටුවා තිබුණි. වර්තමානයේ වන විට බිල්පත් ගෙවීම අත්හිටුවා වසර දෙකක් ගතවී තිබුණද ජල කාන්දු වීම සම්බන්ධයෙන් අලුත්වැඩියා කටයුතු සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සිදුකර නොතිබුණි. | ඉදිකිරීම් කටයුතු වල ප්‍රගතිය පිළිබඳ අවසාන බිල්පත් ගෙවීම් කිරීමට පෙර සමාලෝචිතගත කල යුතු අතර දෝෂ පවතීනම් කඩිනමින් පිළිසකර කරගැනීමට කාර්යක්ෂමව හා විධිමත් වැඩ පිළිවෙලක් ක්‍රියාවේ යෙදවිය යුතු වීම. | හතරවන තට්ටුවෙන් වන ජලය කාන්දුව පිලිසකර කරදෙන ලෙස කීහිප අවස්ථාවකදීම අදාල සමාගම වෙත දැනුවත් කර ඇත. ඉංජිනේරු සේවා අධ්‍යක්ෂක මණ්ඩලය වෙතින් අවශ්‍ය තාක්ෂණික පිරිවිතර ලබාගෙන ඇති අතර, ඉදිරියේදී ටෙන්ඩර් ක්‍රියාපටිපාටියට අනුව ලංසු කැඳවීමට නියමිතව ඇත. තවද මේ සම්බන්ධයෙන් ඉදිකිරීම් ආයතනයටද ලිඛිතව දැනුවත් කොට ඇත. | ගොඩනැගිලි ජල කාන්දු වීම වැලැක්වීම සඳහා අවශ්‍ය කටයුතු 2021 වර්ෂය අවසානය දක්වාම සිදුකර නොමැත. |
| (ඊ) | 2020 වර්ෂය අවසානයේ දී මාණ්ඩලික විද්‍යාලයේ ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 18 ක්ද ද්වීතික මට්ටමේ පුරප්පාඩු 06 ක් හා තෘතීක මට්ටමේ පුරප්පාඩු 02 ක්ද පැවති අතර එම තනතුරු පිරවීමට අවශ්‍ය කටයුතු සිදුවී නොතිබුණි. | පවතින පුරප්පාඩු පිරවීමට කටයුතු කලයුතු වීම. | බඳවා ගැනීමේ පරිපාටිවල නිවැරදි පත්වීමේ ස්වාභාවය කළමනාකරණ සේවා දෙපාර්තුමේන්තුව වෙතින් සනාථකර එවීමෙන් පසු පුරප්පාඩුව පවතින ද්විතීක ශ්‍රේණියේ තනතුරු සඳහා කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ | බඳවා ගැනීම් 2021 වර්ෂය අවසානය දක්වා සිදුකර නැත. |

## 10. ඉඩම් මැනුම් සභාව

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 - තත්ත්වාගණනය කළ මතය

2019 - තත්ත්වාගණනය නොකළ මතය

2020 - තත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2002 අංක 17 දරන මැනුම් පනතේ 38 (ඇ) වගන්තිය ප්‍රකාරව හා 2019 ජනවාරි 03 දිනැති 239 වෙනි සභා රැස්වීමේදී තීරණය කර තිබුණ පරිදි අවශ්‍ය කාර්ය පරිපාටිය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කරවාගෙන සභාවේ කටයුතු කරගෙන යෑම සඳහා ස්ථිර කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීමට අපොහොසත් වී තිබුණි. | සභාවේ කටයුතු පවත්වාගෙන යාම සඳහා නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. | අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම අවසන් අදියරේ පවතී. | 2021 වර්ෂය අවසානය දක්වාම කාර්ය පරිපාටිය අනුමත වී නොමැත. |
| (ආ) | 2002 අංක 17 දරන මැනුම් පනතේ 43 (1) වගන්තිය ප්‍රකාරව සෑම වර්ෂයකම මාර්තු 31 දින හෝ එදිනට පෙර සභාව විසින් සියලු ලියාපදිංචි බලපත්‍ර ලත් මිනින්දෝරුවරුන්ගේ නම් ලැයිස්තුවක් ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු වුවත්, 2020 වර්ෂයේ ලියාපදිංචි බලපත්‍රලත් මිනින්දෝරුවරු 1320 දෙනෙකුගෙන් 2020 ජූනි 26 දිනැති අංක 2182 දරන ගැසට් පත්‍රයේ පළ කර තිබුණේ 925 දෙනෙකුගේ නම් පමණකි. | සියලුම බලපත්‍රලාභී මිනින්දෝරුවරුන්ගේ නාම ලේඛන ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කළ යුතුය. | 2022 වර්ෂය සඳහා වූ නාම ලේඛනය නියමිත දිනට ගැසට් කිරීමට සූදානම් කර ඇත. | 2022.03.31 දින වන විට අදාළ ගැසට් පත්‍රයේ පළ කිරීමට සැලසුම් කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත ප්‍රකාරව තොරතුරු නිලධාරියෙක් පත් කර ඒ බව ප්‍රකාශයට පත්කර නොතිබුණි. | තොරතුරු නිලධාරියකු පත්කර ඒ බව ප්‍රකාශයට පත් කළ යුතුය. | මීළඟ 295 වෙනි රැස්වීමට ඉදිරිපත් කර ඇත. | 2021 වර්ෂය අවසානය දක්වාම තොරතුරු නිලධාරියා පත්කර නොමැත. |
| (ඈ) | 2018 මාර්තු 26 දිනැති 221 වෙනි සභා රැස්වීම් තීරණය ප්‍රකාරව සභාවේ ලියාපදිංචි නොවී මැනුම් කටයුතු සිදුකරන සුදුසුකම් නොලත් පුද්ගලයින් සම්බන්ධයෙන් සොයා බැලීමට පොලිස්පතිවරයා දැනුවත් කිරීමට තීරණය කර තිබුණද එසේ පොලිස්පතිවරයා දැනුවත් කර නොතිබුණි. | මැනුම් කටයුතු කරන සුදුසුකම් නොලත් සහ ලියාපදිංචි නොවූ පුද්ගලයින් එයින් වළක්වාලීම සඳහා නිසි පියවර ගත යුතුය. | පොලිස්පතිවරයා වෙත මෙම දැනුම්දීම සිදු කිරීම අතපසු වී ඇත. මෙය නැවත මීළඟ 295 වෙනි සභා රැස්වීමට ඉදිරිපත් කර ඇත. එහිදී ලබා දෙන තීරණය මත අවශ්‍ය පියවර ගැනීමට නියමිතය. | මේ සඳහා සභාව ලබා දෙන තීරණය මත ඉදිරි කටයුතු සිදු කිරීමට සැලසුම් කර ඇත. |
| (ඉ) | 2017 අංක 24 දරන දේශිය ආදායම් (සංශෝධිත) පනතේ 9 (1) වගන්තියේ තුන්වන උපලේඛනයේ සඳහන් පරිදි ඉඩම් මැනුම් සභාව බදු ගෙවීමෙන් නිදහස් ආයතනයක් ලෙස සඳහන් කර නොතිබුණු අතර, එවැනි නිදහස් කිරීමකට අදාළ ලියවිලිද නොතිබුණු නමුත්, සභාව විසින් ආදායම් බදු ගෙවීමට කටයුතු කර නොතිබුණි. | බදු ගෙවීමෙන් නිදහස් වන්නේ නම් ඊට අදාළ අනුමැතීන් ලබාගත යුතුය. | ඉඩම් මැනුම් සභාව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් OTHER STATE OWNED COMPANIES ලෙස 2015.06.17 අංක PED 03/2015 යටතේ ලැයිස්තුගත කර ප්‍රකාශයට පත් කරන ලද බැවින් 2021 වර්ෂයේ සිට ආදායම් බදු ගෙවීමටත්, 2021 වර්ෂයට පෙර වර්ෂවලට අදාළව ආදායම් බදු ගෙවීමෙන් නිදහස් වීමට ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත ලිපියක් යැවීමට දැනුම්දෙන ලදී. | 2021 ට පෙර වර්ෂ සඳහා බදුවලින් නිදහස් බවට ලිපියක් ලබාගෙන නොතිබුණි. |
| (ඊ) | 2012 ජූලි 05 දිනැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීම් නියෝගය අනුව සභාව | පුරප්පාඩුව පවතින ලේකම් තනතුර පිරවීමට කටයුතු කළ යුතුය. | පවතින බඳවා ගැනීමේ පරිපාටිය යටතේ අවස්ථා දෙකකදී ස්ථිර | ලේකම්වරයෙකු පත් කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | සඳහා ලේකම්වරයෙකු පත් කළ යුතු වුවත් පුරප්පාඩුව පවතින ලේකම් තනතුර පිරවීමට 2021 වර්ෂය දක්වාම සභාව අපොහොසත් වී තිබුණි. | | ලේකම්වරයෙකු පත් කර ගැනීමට කටයුතු කර ඇතත් මෙම තනතුර සඳහා සුදුසු අයෙකු පත් කර ගැනීමට නොහැකි වී ඇත. පවතින බඳවා ගැනීම් පරිපාටිය සංශෝධනය සඳහා අමාත්‍යාංශ ලේකම් වෙත ඉල්ලීමක් යොමු කර ඇත. | |
| (උ) | මිනින්දෝරුවරුන්ගේ වෘත්තීය විෂමාචාර පිළිබඳව මහජනතාවගෙන් 2020 වර්ෂයේ ලැබී තිබූ මුළු පැමිණිලි සංඛ්‍යාව 113 ක් වුවද, වර්ෂය තුළ විසඳා තිබුණ පැමිණිලි සංඛ්‍යාව 33 ක් පමණක් විය. වාර්ෂිකව විසඳීමට පවතින පැමිණිලි සංඛ්‍යාව ක්‍රමයෙන් වැඩිවෙමින් පැවතුණද, එම පැමිණිලි විසඳීමේ කාර්යක්ෂමතාව වැඩි කිරීම සඳහා විශේෂ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කර නොතිබුණි. | පැමිණිලි විසඳීමේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කළ යුතුය. | මෙම තත්ත්වය මීළඟ 295 වැනි සභා රැස්වීම සඳහාද යොමු කර ඇත. | අදාළ විමර්ශණ කඩිනම් කිරීමට වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි. |

## 11. ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 - මතය වියාචනය කිරීම

2019 - තතත්ත්වාගණනය කළ මතය

2020 - තතත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | නාගරික සංවර්ධන අධිකාරියට අයත් ඉඩමක ක්‍රියාත්මක වන අධිකාරියේ, ඉදිකිරීම් උපකරණ පුහුණු මධ්‍යස්ථානය (CETRAC) සඳහා හිමිකම් ඔප්පුව ලබා දීමට අදාළ රු. 54,890,701ක මුළු මුදල පියවන ලෙස නාගරික සංවර්ධන අධිකාරිය (UDA) 2019 වර්ෂය තුළදී ඉල්ලීමක් සිදු කර ඇත. කෙසේ වෙතත්, මෙම මුදල නාගරික සංවර්ධන අධිකාරිය වෙත පියවීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි. | මෙම ගැටළුව විසඳීම සඳහා අධිකාරිය UDA සමඟ විධිමත් බඳු ගිවිසුමකට එළඹිය යුතු අතර අදාළ හෙළිදරව් කිරීම් හා ගැලපීම් අවසාන ගිණුම්වල සිදු කළ යුතුය. | මූල්‍ය ප්‍රකාශන වල අදාළ හෙළිදරව් කිරීම් සිදුකිරීමට පියවර ගනු ලැබේ. | 2021 වර්ෂය අවසානය දක්වාම විධිමත් බදු ගිවිසුමකට එළඹීමට මෙතෙක් ක්‍රියාකර අදාල මුදල පියවීමට කටයුතු කර නැත. |
| (ආ) | 2018 වර්ෂයේදී හා 2019 වර්ෂයේදී ඉදිකිරීම් විශිෂ්ඨතා සම්මාන උත්සවය පැවැත්වීම වැය කර තිබුණු රු.7,246,543 මුදලට අදාල අනුග්‍රාහයකත්වය ලබා ගැනීම සඳහා බාහිර පාර්ශවයන්ට කරන ලද සියළු ඉල්ලීම්, ලිපි එම ඉල්ලීම් මත මුදල් ලැබුණු සත්‍ය මුදල සහ අදාළ ලිපිගොනු ඒ මත දරන ලද වියදම් පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | මෙම ශේෂවල නිරවද්‍යතාවය සහ විශ්වසනීයත්වය තහවුරු කිරීම සඳහා කළමනාකරණය විසින් විගණනය සඳහා අවශ්‍ය සාක්ෂි සැපයිය යුතුය. | අවශ්‍ය තොරතුරු ලබාදීම සඳහා කටයුතු කෙරේ. | අවශ්‍ය තොරතුරු ලබාදීමට 2022 වර්ෂයේදිද හෝ කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | රු.14,173,303ක් වූ මුළු ණයගැති ශේෂයෙන් රු. 1,794,089ක වටිනාකමට ණය ගැතියන් 06 දෙනකුගෙන් පමණක් තහවුරු කිරීම් ලැබී ඇති අතර අනෙකුත් ණය ගැතියන් 2021 ඔක්තෝම්බර් 31 දින වන විටත් තම හිඟ ශේෂයන් තහවුරු කර නොතිබුණි. | අධිකාරිය ණයගැති ශේෂය අයකර ගැනීමට ක්‍රියාමාර්ගයක් ගත යුතු අතර ණයගැතියාගේ සාධාරණ වටිනාකම අවසන් ගිණුම්වල හෙළිදරව් කළ යුතුය. | වසර 03 කට වැඩි කාලයක් පැවති හිඟ ණයගැති ශේෂය අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | 2021 වර්ෂය අවසානය දක්වාම අයකරගත යුතු ශේෂයන් අයකර ගැන නොතිබුණි. |
| (ඈ) | 2014 අංක 33 දරණ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ 7(1) වගන්තිය අනුව අවම වශයෙන් මාස 3 කට වරක්වත් ජාතික උපදේශණ සභා රැස්වීම් පැවැත්විය යුතු වුවද 2019 වර්ෂයට අදාළව උපදේශණ සභා වාර දෙකක් පමණක් පවත්වා තිබුණි. තවද 2020 වර්ෂය සඳහා පැවැත්වූ උපදේශණ සභා රැස්වීම් සම්බන්ධ විස්තර විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි. | පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව ක්‍රියාකළ යුතුය. | අවශ්‍ය තොරතුරු ලබාදීම සඳහා කටයුතු කෙරේ. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ඉ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්ති සහ 2018 නොවැම්බර් 14 දිනැති අංක 02/2018 දරන පොදු ව්‍යවසාය චක්‍රලේඛය පටහැනිව මහා භාණ්ඩාගාරයේ අනුමැතිය සහ මුදල් අමාත්‍යවරයාගේ අනුදැනුම නොමැතිව රු.153,231,432ක මුදලක් කෙටිකාලීන ආයෝජන මූලාශ්‍ර වන ඇමතුම් තැන්පතු, භාණ්ඩාගාර බිල්පත් සහ | අතිරික්ත මුදල් ආයෝජනය කිරීමට පෙර අවශ්‍ය අනුමැතීන් ලබා ගත යුතුය. | එය CIDA සේවකයින් සඳහා පාරිතෝෂිත දීමනා සඳහා වෙන් කර තබා ඇත. | අදාළ රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීමට එකගතාවය පලකර ඇත. |

| | | | |
|---|---|---|---|
| ස්ථාවර තැන්පතු ආදියෙහි ආයෝජනය කර ඇත. ඉහත ආයෝජනවලින් රු.140,707,803ක මුදලක් වසර 04කට වැඩි කාලයක් නොවෙනස්ව පැවතුණි. | | | |
| (ඊ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රජයේ මුදල් රෙගුලාසි | | | |
| (i) මුදල් රෙගුලාසි 571 (2) අනුව වසර 2කට වඩා වැඩි කාලයක සිට පවතින සියලුම තැන්පතු අධිකාරියේ ආදායමට බැර කළ යුතු වුවද , ගෙවිය යුතු රඳවා ගැනීම් සහ ටෙන්ඩර් තැන්පතු ආදී හඳුනා නොගත් සහ කල් ඉකුත් වූ තැන්පතු වන රු.1,947,282ක් සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි. | වසරක කාලසීමාවක් තුළ ජංගම වගකීම් සියල්ල නිරවුල් කිරීමට ඵලදායී ක්‍රියාමාර්ග ගත යුතුය. | අදාළ ජංගම වගකීම් ශේෂ නිරවුල් කිරීමට පියවර ගනු ලැබේ. | වගකීමක් නොමැති තැන්පතු ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 371 සහ අධිකාරිය විසින් නිකුත්කරන ලද අංක 2/2020 දරණ හා 2020 අගෝස්තු 19 දිනැති අභ්‍යන්තර චක්‍රලේඛය අනුව 2020 දෙසැම්බර් 31 දිනට පාර්ශව හතරකට අවස්ථා 5කදී ලබා දුන් රු. 4,092,735ක් 2020 දෙසැම්බර් 31 දිනට පියවා නොතිබුණි. | නිශ්චිත කාල සීමාවක් තුළ සියලුම උප අග්‍රිම නිරවුල් කිරීමටත් නිසි වියදම් ඇස්තමේන්තුවක් සකස් කිරීමෙන් පසු උප අග්‍රිමයන් ලබා දීමටත් කටයුතු කළ යුතුය. | නියමිත වේලාවට උප අග්‍රිම පියවීමටත් නිසි ක්‍රියාකාරම් මත පදනම් වූ පිරිවැය ඇස්තමේන්තු වලට අනුකූලව උප අග්‍රිමයන් නිකුත්කිරීමටත් කටයුතු කරනු ලබයි. | නිවැරදි කිරීම් කිරීමට 2021 වර්ෂය අවසානය දක්වා කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (iii) | මුදල් රෙගුලාසි 756, 757, 758 සහ 759 අනුව අධිකාරියේ ප්‍රධාන කාර්යාලයට අයත් වත්කම් සම්බන්ධයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් 2021 නොවැම්බර් 30 දින වන විටත් සිදු කර නොතිබුණි. | වත්කම්වල භෞතික පැවැත්ම සහතික කිරීම සඳහා වාර්ෂික සමීක්ෂණය සිදු කළ යුතුය. | මේ සඳහා පත්කළ කමිටුව විසින් යථාකාලයේදී සත්‍යාපන වාර්තා ඉදිරිපත් කරනු ඇත. | 2020 ට අදාළ සම්පූර්ණ කරන ලද සමීක්ෂණ මණ්ඩල වාර්ථා මේ දක්වා විගණනය වෙත ලබාදී නොතිබුණි . |
| (උ) | 2015 ජූලි 10 දින අංක 02/2015 දරන රාජ්‍ය මුල්‍ය චක්‍රලේඛය සහ 2018 ජූලි 16 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2018 හි 06 වැනි ඡේදය ප්‍රකාරව නව මෝටර් රථ 3 ක් මිලදී ගැනීම සඳහා භාවිතයෙන් ඉවත්කරන ලද වාහන දෙකක් වෙනුවෙන් ලැබුණු රු.5,773,000ක මුදල වසර දෙකකට වැඩි කාලයක් ගෙවී ගියද භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීමකින් තොරව අධිකාරිය විසින් රඳවා ගෙන තිබුණි. | නව වාහන මිලදී ගැනීමේදී පවතින වාහන ඉවත් කළ යුතු අතර පැරණි වාහන ඉවත් කිරීමෙන් ලැබෙන ආදායම නව වාහන මිලදී ගැනීමෙන් පසු මහා භාණ්ඩාගාරයට ගෙවිය යුතුය. | මෙම මුදල් භාණ්ඩාගාරයට යැවීමට සියලු කටයුතු සූදානම් කර ඇත. | 2021 වර්ෂය අවසානය දක්වා භාණ්ඩාගාරයට මුදල් ප්‍රේෂණය කර නොතිබුණි. |
| (ඌ) | ගල්කුලම මෙහෙයුම් ශිල්පී පුහුණු පාසලේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා 2018 සිට 2020 දක්වා කාලය තුළ රු. මිලියන 135 ක මුදලක් මහා භාණ්ඩාගාරයෙන් ලබාගෙන තිබුණි. එයින් රු. මිලියන 34.6 ක මුදලක් එනම් සියයට 26 ක් අපේක්ෂිත කාර්යය සඳහා යොදා නොගෙන | බැංකුවේ ජංගම ගිණුම්වල නිෂ්ක්‍රීයව තබා නොගෙන එම අරමුදල අපේක්ෂිත කාර්යය සඳහා යෙදවීමට ඵලදායී ක්‍රියාමාර්ග ගත යුතුය. | දැනට ඉතිරිව ඇති මුදල් අපේක්ෂිත කාර්යයන් සඳහා ප්‍රමාණවත් නොවීම හේතුවෙන් එම ප්‍රතිපාදන අනෙකුත් කාර්යයන් සඳහා යෙදවීමට කටයුතු යොදා ඇත. | ලැබුණු අරමුදල් අදාළ කාර්යයන් සඳහා යොදවා නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | අධිකාරියේ බැංකු ජංගම ගිණුමේ නිෂ්ක්‍රීයව තබා තිබුණි. | | | |
| (එ) | 2018, 2019, 2020 වර්ෂවලදී අධිකාරියේ ප්‍රධාන කාර්යාලය මගින් පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුමක පිළිවෙළින් දළ වශයෙන් රු. මිලියන 202, රු. මිලියන 260 ක් සහ රු. මිලියන 357ක පමණ මුදලක් රඳවාගෙන තිබූ අතර, මෙම ශේෂය කිසිදු කටයුත්තක් සඳහා යොදා නොගැනීමෙන් 2021 ඔක්තෝම්බර් 31 දින වනවිට රු. මිලියන 426ක් දක්වා වැඩිවී තිබුණි. මෙම මුදල කිසිදු අරමුණක් සඳහා යොදා නොගැනීමේ ප්‍රතිඵලයක් ලෙස අධිකාරියට දළ වශයෙන් රු. මිලියන 98 ක මූල්‍ය පාඩුවක් සිදුවී තිබුණි. | බැංකුවේ ජංගම ගිණුම්වල නිෂ්ක්‍රීයව තබා නොගෙන එම අරමුදල අපේක්ෂිත කාර්යය සඳහා යෙදවීමට ඵලදායී ක්‍රියාමාර්ග ගත යුතුය. | රු. මිලියන 426ක බැංකු ශේෂයෙන් රුපියල් මිලියන 200ක් ව්‍යාපෘති සහ වැඩසටහන් සඳහා භාණ්ඩාගාරයෙන් ලැබුණු අග්‍රිමයෙන් සමන්විත වේ. ඉතිරි මුදල් අපේක්ෂිත කාර්යය සඳහා යෙදවීමට කටයුතු කරනු ලැබේ. | මේ සම්බන්ධයෙන් 2021 වර්ෂය අවසානය දක්වා විධිමත්ව ක්‍රියාකර නොතිබුණි. |
| (ඒ) | ඉදිකිරීම් ක්ෂේත්‍රයේ යෙදී සිටින දක්ෂ ශිල්පීන් සඳහා ශිල්ප හැඳුනුම්පත ලබාදීම සඳහා 2019 සහ 2020 වසර තුළ මහා භාණ්ඩාගාරයෙන් රු. මිලියන 35.7ක මුදලක් ලැබී තිබුණි. ඉන් රු. මිලියන 11.3ක් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2019 වසරේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආයතනයට (ICTA) අත්තිකාරම් වශයෙන් ලබා දී තිබුණි. මෙම කාර්යය 2020 වර්ෂය තුළ අවසන් කළ යුතු | අධිකාරියට ලැබිය යුතු ඉතිරි මුදල් අයකර ගැනීමටත් අධිකාරියට සිදු වූ පාඩුව වගකිවයුතු පුද්ගලයන්ගෙන් අයකර ගැනීමටත් වහා පියවර ගත යුතුය. | ඒ සඳහා වැඩකටයුතු කරගෙන යමින් පවතී. | අලාභය අයකර ගැනීමටත් ඉතිරි මුදල අයකරගැනීම ටත් කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | වුවද 2021 නොවැම්බර් මාසය අවසන් වනතුරුත් එය අවසන් කර නොතිබුණි. තවද, රු. මිලියන 11.3ක අත්තිකාරම් මුදල වසර දෙකකට වැඩි කාලයක් ICTA ආයතනයෙන් රඳවා ගෙන තිබූ අතර, සිදුවූ මූල්‍ය පාඩුව ගණනය කර වගකිවයුතු පාර්ශවයන්ගෙන් එය අයකර ගැනීමට අධිකාරිය කටයුතු කර නොතිබුණි. තවද ඉහත අත්තිකාරම් මුදලින් රු.1,673,097ක මුදලක් මේ දක්වා ආපසු අයකරගෙන නොතිබුණි. | | | |
| (ඔ) | 2006 ජනවාරි 1 සිට 2011 මැයි 31 දක්වා කාලයට අදාළව රු. 14,977,525ක සේවක අර්ථසාධක අරමුදල් නොගෙවීම හේතුවෙන් සේවක අර්ථසාධක අරමුදල (EPF) විසින් රු. 5,691,460ක අධිභාරයක් පනවා තිබුණි. කෙසේ වෙතත් 2021 නොවැම්බර් 30 දින වන විටද මෙම ගෙවිය යුතු මුදල ප්‍රේෂණය කර නොතාබුණි. | තවදුරටත් අධිභාර පැනවීම වළක්වා ගැනීම සඳහා වහාම ගෙවීම් කළ යුතුය. | හිඟ මුදල් අධිභාරය සමඟ ගෙවීමට පියවර ගනු ලැබේ. | 2021 වර්ෂය අවසානය දක්වාම ගෙවීමට කටයුතු කර නොතිබුණි. |
| (ඕ) | අධිකාරිය පිහිටුවා වසර හයකට වඩා වැඩි කාලයක් ගතවී ඇතත්, 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ දක්වා ඇති පහත සඳහන් ක්‍රියාකාරකම් අධිකාරිය විසින් සිදු කර නොතිබුණි. | ඉදිකිරීම් කර්මාන්තයෙන් රටට ලැබෙන දායකත්වය නඟා සිටුවීමට හා වැඩි කිරීමට අධිකාරිය මෙම කටයුතු කඩිනම් කළ යුතුය. | ඉදිරියේ දී මෙම කාර්යයන් සිදුකිරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ. | 2021 වර්ෂය අවසානය දක්වාම මේ සම්බන්ධ කටයුතු කර නොතිබුණි. |

- ඉදිකිරීම් කර්මාන්තය සඳහා යොදා ගනු ලබන ඉදිකිරීම් ද්‍රව්‍ය සහ ඉදිකිරීම් උපාංග ආනයනකරුවන්, නිෂ්පාදකයන් සහ සැපයුම්කරුවන්ගේ නාමාවලියක්, මේ පනත යටතේ සාදනු ලබන රීති මගින් නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයට පවත්වාගෙන යෑම.
- මේ පනත යටතේ සාදනු ලබන රීති මගින් නිශ්චය කරනු ලැබිය හැකි ඉදිකිරීම් ශිල්පයන්හි නිපුණ ශ්‍රමිකයන් ලියාපදිංචි කිරීමට සහ ඔවුන්ට ශිල්පීය හැඳුනුම්පත් නිකුත් කිරීමට විධිවිධාන සැලසීම.
- ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අරමුදල පිහිටුවීම.
- වෙනත් රටවල ඉදිකිරීම් කටයුතු භාරගනු ලබන දේශීය වශයෙන් ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් ප්‍රවර්ධනය කිරීම සහ සුහසාධනය.
- ඉදිකිරීම් කර්මාන්තයේ යම් ද්‍රව්‍ය,පිරියත සහ යන්ත්‍රෝපකරණ අවශ්‍යතා සමාලෝචනය සහ අධීක්ෂණය කිරීම

| | | | | |
|---|---|---|---|---|
| | සහ ඉදිකිරීම් වැඩ වලදී දේශීය නිෂ්පාදන සංවර්ධනය කිරීම හා භාවිතයට ගැනීම දිරිමත් කිරීම.<br>• ඉදිකිරීම් කර්මාන්තය සම්බන්ධ ජාතික දත්ත සැකසුමක් පවත්වාගෙන යෑම | | | |
| (ක) | වර්තමාන අවශ්‍යතාවන්ට සරිලන පරිදි ඉදිකිරීම් කර්මාන්තය නඟා සිටුවීම සඳහා අධිකාරිය විසින් නිකුත් කරන ලද ප්‍රකාශන සියල්ලම පාහේ වර්ෂ 09 සිට 32 දක්වා කාල පරාසය තුල සංශෝධනය කර හෝ යාවත්කාලීන කර නොමැති බව නිරීක්ෂණය විය. එබැවින්, පනතේ පෙන්වා දී ඇති (අ) ඉදිකිරීම් කර්මාන්තයේ ප්‍රමිතීන් සකස් කිරීම (ආ) ඉදිකිරීම් කර්මාන්තයට අදාළ වන ආචාරධර්ම පද්ධති, පරිචය, ක්‍රියා පටිපාටින් හා වැඩපිළිවෙල සහ ලේඛණ සකස් කර ක්‍රියාත්මක කිරීම සහ (ඇ) ඉදිකිරීම් ක්ෂේත්‍රයේ තිරසාර වර්ධනය ප්‍රබෝධමත් කිරීම, ප්‍රතිසංවිධානය කිරීම සහ වැඩි දියුණු කිරීම සඳහා ඉදිකිරීම් කර්මාන්තයේ පරදු දරන්නන්ට ක්‍රමෝපාය නායකත්වය ලබා දීම යනාදී අරමුණු සාක්ෂාත් කරගැනීමට නොහැකි තත්වයක් උත්ගත වී ඇත. | ඉදිකිරීම් කර්මාන්තය නඟා සිටුවීම සඳහා සහ අධිකාරියේ පනතේ දක්වා ඇති අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා අධිකාරිය විසින් නිකුත් කරන ලද යල්පැනගිය ප්‍රකාශන සංශෝධනය කිරීම හෝ යාවත්කාලීන කිරීම සඳහා අප්‍රමාදව හා ඵලදායී ක්‍රියාමාර්ග ගත යුතුය. | කිසියම් සංශෝධනයන්ගේ අවශ්‍යතාවයන් පවතින්නේද යන බව හඳුනා ගැනීම සඳහා අධිකාරියේ ප්‍රකාශන සෑම අවුරුදු 5 කට වරක් නැවත සලකා බැලීමට පියවර ගෙන ඇති අතර සංශෝධනය කිරීමට අවශ්‍ය ප්‍රකාශනයන් සංශෝධනය කරනු ලැබේ. | මේ සම්බන්ධයෙන් ඵලදායී ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ග) | මහා භාණ්ඩාගාරය විසින් 2016 සිට 2020 දක්වා කාලය තුළ රු. මිලියන 1,077ක මුදලක් රේඛීය අමාත්‍යාංශය හරහා ඉදිකිරීම් කර්මාන්තය සඳහා වන නිපුණතා පුහුණුව රාජ්‍ය හා පෞද්ගලික සහභාගීත්වයෙන් ක්‍රියාත්මක කිරීම සඳහා අධිකාරිය වෙත නිකුත් කර ඇත. එයින් රු. මිලියන 114.2 ක් අපේක්ෂිත කාර්යය සඳහා භාවිතා නොකර 2021 ඔක්තෝබර් 31 දින වන විටද බැංකු ජංගම ගිණුමක් තුළ රඳවා ගෙන තිබුණි. | බැංකුවේ ජංගම ගිණුම්වල නිෂ්ක්‍රීයව තබා නොගෙන එම අරමුදල අපේක්ෂිත කාර්යය සඳහා යෙදවීමට ඵලදායී ක්‍රියාමාර්ග ගත යුතුය. | භාණ්ඩාගාර අග්‍රිම ශේෂය අපේක්ෂිත කාර්යය සඳහා යොදා ගැනීමට පියවර ගනු ලැබේ. | අරමුදල් උපයෝජනය කිරීම සඳහා කටයුතු කර නොතිබුණි. |
| (ඝ) | විගණනය සඳහා සපයා ඇති තොරතුරුවලට අනුව, රු.103,263,865ක් වටිනා පුහුණු මෙවලම් කට්ටල, රු.10,054,498ක් වටිනා පුහුණු ද්‍රව්‍ය (පුහුණුකරුවන් සහ අභ්‍යාසලාභීන්ගේ මාර්ගෝපදේශ හා වාර්තා පොත්) සහ රු.50,146,836ක් වටිනා නිල ඇඳුම් 2016 සිට 2020 දක්වා කාලය තුළ පවත්වන ලද ඉදිකිරීම් කර්මාන්ත සඳහා වූ කුසලතා පුහුණු වැඩසටහන යටතේ මිල දී ගෙන ඇත. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල ඇති මාර්ගෝපදේශ හා ප්‍රසම්පාදන නීතීන් උල්ලංඝනය කිරීම සහ | මූල්‍යමය වශයෙන් වඩාත්ම වාසිදායක සහ ගුණාත්මකව හොඳම සැපයුම් ලබා ගැනීම සඳහා රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුකූල වීමට අධිකාරිය කටයුතු කළ යුතුය. | ඉදිරියේ දී තාක්ෂණික ඇගයීම් කමිටුවේ සේවය කරන නිලධාරීන් ලබාදෙන මිල ගණන් සසඳා නියැදි පරීක්ෂා කර ඒ අනුව අඩුම මිලට සහ දෙවන මිලට ප්‍රමුඛත්වය ලබාදී රජය සතු සමාගමක් වන ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවෙන් උපකරණ කට්ටල ලබා ගැනීමට නිර්දේශ කර ඇත. | වගකිව යුතු නිළධාරින්ගෙන් අදාළ අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | ගුණාත්මකභාවයෙන් අඩු භාණ්ඩ ප්‍රසම්පාදනය කිරීම ආදිය හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට අධිකාරියට රුපියල් මිලියන 52.25ක අලාභයක් සිදුවී ඇත. | | | |
| (ත) | අධිකාරියේ සේවකයකු 2015 පෙබරවාරි 09 දින සිට ක්‍රියාත්මක වන පරිදි රේඛීය අමාත්‍යාංශයට නිදහස් කර / අනුයුක්ත කර ඇත. මෙම නිලධාරියා වෙනුවෙන් 2015 පෙබරවාරි 09 සිට 2020 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ වැටුප් සහ අනෙකුත් දීමනා වශයෙන් රු.4,687,732ක් ගෙවා තිබුණු නමුත් 2021 ඔක්තෝබර් 31 වන විටද රේඛීය අමාත්‍යාංශයෙන් කිසිදු මුදලක් ප්‍රතිපූර්ණය කර ගෙන නොතිබුණි. | රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව අධිකාරියේ සේවකයින් රේඛීය අමාත්‍යාංශයට නිදහස් කිරීම / අනුයුක්ත නොකළ යුතුය. | මේ සම්බන්ධයෙන් ඉදිරියේ දී කටයුතු කිරීමට අපේක්ෂා කෙරේ. | සුදුසු පියවර ගැනීමට අධිකාරිය අපොහොසත් වී ඇත. |
| (ද) | විගණනය සඳහා සපයා ඇති තොරතුරුවලට අනුව 2018, 2019 හා 2020 වර්ෂයේ දී වාහන 27 ක් අවස්ථා 38 කදී අනතුරුවලට ලක්ව තිබුණි. මෙම අනතුරු සඳහා වන අලාභය සහ වාහන අනතුරු සම්බන්ධයෙන් වන මූලික වාර්තා සහ අවසන් වාර්තා විගණන කටයුතු සඳහා ලබා දී නොතිබුණි. | සිදුවූ අලාභය සොයා බැලීම සඳහා වාහන අනතුරු සම්බන්ධයෙන් මූලික වාර්තා සහ අවසන් වාර්තා විගණනය සඳහා ලබා දිය යුතුය. | වාහන හතරෙන් දෙකක් අලුත්වැඩියා කර අවසන් කර ඇත. අනෙක් වාහන දෙක ද ඉතා ඉක්මනින් අළුත්වැඩියා කරනු ලැබේ. | වාහන අනතුරු සම්බන්ධයෙන් විගණනය වෙත වාර්තා ඉදිරිපත්කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (න) | රු. 6,981,250ක පිරිවැය වූ අධිකාරියේ වාහන 6ක් (එක් වාහනයක් හැර) වසර 2 සිට 5 දක්වා කාලය තුළ අධිකාරියට අයත් CETRAC පරිශ්‍රයේ ප්‍රයෝජනයට නොගෙන, අළුත්වැඩියා කිරීමෙන් හෝ බැහැර කිරීමෙන් තොරව දිරාපත් වීමට ඉඩ සලසා තිබුණි. | පොදු දේපළවල ආරක්ෂාව වැඩි කිරීම සඳහා භාවිතයට නොගත් වාහන බැහැර කිරීමට කාලෝචිතව ක්‍රියාමාර්ග ගත යුතුය. | වාහන හතරක් බැහැර කිරීමට කමිටුවක් පත් කර ඇති අතර තවත් වාහන දෙකක් භාවිතය සඳහා අලුත්වැඩියා කරමින් පවතී. | අදාළ කටයුතු සිදුකර නොතිබුණි. |

## 12. උක් පර්යේෂණ ආයතනය

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 - තතත්ත්වාගණනය කළ මතය

2019 - තතත්ත්වාගණනය කළ මතය

2020 - තතත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2017 අංක 24 දරන දේශීය අදායම් පනතේ 84 (i) (අ) (i) හා 85 (i) (ආ) වන වගන්ති ප්‍රකාරව ආයතනය විසින් 2018 හා 2019 වර්ෂයන්හි පුද්ගලයින් හා ආයතන 45 ක් සඳහා අවස්ථා 143 කදී ගෙවනු ලැබූ රු.37,035,020ක කුලී හා කොන්ත්‍රාත් ගෙවීම් සඳහා වූ රු.2,010,893ක රඳවා ගැනීමේ බදු අඩුකර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර නොතිබුණි. | පනත ප්‍රකාරව රැඳවුම් බදු අයකර දේශීය ආදායම් දෙපර්තමේන්තුවට ප්‍රේෂණය කළ යුතුය. | රඳවා තබා ගැනීමේ බදු සඳහා ලියාපදිංචි වූ 2019 ජුලි 29 වන දිනෙන් පසු කාලයට අදාළව නියමිත ආකාරයට බදු ගෙවීමට කටයුතු කර ඇත. | 2019 ජුලි 29 වන දිනට පෙර කාලයට අදාළ රඳවා ගැනීමේ බදු රු.2,010,893ක් අයකර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර නොමැත. |
| (ආ) | දේශීය උක් වගාව සඳහා උසස් වාණිජමය උක් ප්‍රභේද දියුණු කිරීම හා ඒ සඳහා පර්යේෂණ පැවැත්වීම උක් පර්යේෂණ ආයතනයේ ප්‍රධාන අරමුණක් වන අතර මෙහිදී හඳුන්වා දෙන නව උක් ප්‍රභේද වැඩි උක් ඵලදාවක් හා වැඩි සීනි ප්‍රමාණයක් ලබා දිය යුතු වේ. නමුත් 2011 සහ 2012 වර්ෂවල හඳුන්වා දුන් උක් ප්‍රභේදවල සාමාන්‍ය උක් ඵලදාව හෙක්ටයාරයකට මෙ.ටො.142 ත් 160 ත් අතර | උක් වගා කරන ගොඩබිම් ප්‍රදේශවල පවතින පාරිසරික තත්ත්වයට යෝග්‍ය උක් ප්‍රභේද හඳුන්වා දීමට කටයුතු කළ යුතුය. | 2020 වර්ෂයේ සිට එක් එක් ප්‍රදේශවල පාරිසරික හා දේශගුණික තත්ත්වයන්ට යෝග්‍ය උක් ප්‍රභේද ප්‍රවර්ධනය කිරීමට උත්සහ කරනු ලැබුව ද, එම ප්‍රභේද අඩු අස්වැන්නක් සහිත වීම නිසා ප්‍රචලිත කිරීමට නොහැකි වී ඇත. | සාර්ථක උක් ප්‍රභේදයක් හඳුන්වා දීමට නොහැකි වී තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | විය යුතු වුවද, ආයතනය විසින් ලබා දුන් පර්යේෂණ වාර්තා අනුව 2017 වර්ෂයේදී හඳුන්වා දුන් උක් ප්‍රභේද 5 හි උක් ඵලදාව හෙක්ටයාරයකට මෙ.ටො.70 ත් 97 ත් අතර අඩු අගයක් ගෙන තිබුණු බැවින් පර්යේෂණ සඳහා දැරූ වියදම ඵලදායි නොවන බව නිරීක්ෂණය විය. | | | |
| (ඇ) | ආයතනය පිහිටුවා වසර 31 ක කාලය තුළ හඳුන්වා දී තිබූ උක් ප්‍රභේද අතරින් 2011 සහ 2012 වර්ෂවල හඳුන්වා දුන් SL 954443, SL 954430 හා SL 954033 දරන උක් ප්‍රභේද හෙක්ටයාරයකට මෙ.ටො.142 ත් 160 ත් අතර වැඩිම උක් ඵලදාවක් සහ හෙක්ටයාරයකට මෙ.ටො 17ත් 19ත් අතර වැඩිම අන්තර්ගත සීනි ප්‍රමාණය සහිත ප්‍රභේද වුවද, ගොවි මහතුන්ගේ පවතින ආකල්ප, රෝග සහ පළිබෝධවලට ඔරොත්තු දීමේ හැකියාව අඩුවීම, ගොවීන්ට හා කර්මාන්තය තුළට ප්‍රමාණවත් පරිදි ව්‍යාප්ත නොවීම හේතුවෙන් හෙක්ටයාර් 16.5 ක් වැනි කුඩා භූමි ප්‍රමාණයකට සීමා වී තිබුණි. | වැඩි ඵලදාවක් සහ වැඩි සීනි ප්‍රතිගහනයක් ලබා දෙන උක් ප්‍රභේද තවදුරටත් හඳුන්වා දී ඒවා ගොවීන් අතර ව්‍යාප්ත කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | උක් ප්‍රභේද ව්‍යාප්ත කිරීම සඳහා උක් පර්යේෂණ ආයතනය ක්ෂේත්‍ර නිලධාරීන් හා උක් ගොවීන් දැනුවත් කිරීමටත්, නව ප්‍රභේද හඳුනා ගැනීමේදී හා හඳුන්වා දීමේදී ගොවීන් හා ක්ෂේත්‍ර නිලධාරීන්ගේ සහභාගිත්වය ඇතිව තීරණ ගැනීමටත් කටයුතු කරමින් පවතී. | වැඩි ඵලදාවක් සහිත ප්‍රභේද ව්‍යාප්ත කිරීම සිදු වී නොතිබුණි. |
| (ඇ) | මුදල් රෙගුලාසි සංග්‍රහය 103(ඊ) ප්‍රකාරව කැබ්රථයකට සිදුවූ රු.6,109,692ක අනතුර සම්බන්ධයෙන් පරීක්ෂණ | මුදල් රෙගුලාසි ප්‍රකාරව වගකිව යුතු නිලධාරීන් නිශ්චය කොට අදාළ අලාභය අයකර ගැනීමට | රේඛීය රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් පරිදි පත් කළ අභ්‍යන්තර පරීක්ෂණ කමිටුවේ | වගකිවයුතු නිලධාරීන් නිශ්චය කොට අලාභය අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | පවත්වා ඒ සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරින් නිශ්චය කොට අදාළ අලාභය අය කර ගැනීමට කටයුතු නොකර ආයතනය විසින් එම අලුත්වැඩියාව සඳහා රු.2,341,093ක් වැය කර තිබුණි. | කටයුතු කළ යුතුය. | නිර්දේශයන් එම අමාත්‍යාංශ ලේකම් වෙත යැවීමට ක්‍රියා කෙරේ. | |
| (ඉ) | 1984 වර්ෂයේ සිට ආයතනයේ සේවකයින් සඳහා ක්‍රියාත්මක කර තිබූ සංශෝධන වෛද්‍යාධාර යෝජනා ක්‍රමය සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගත යුතු වුවත් එසේ නොකර 2019 වර්ෂයේදී වෛද්‍ය බිල්පත් ප්‍රතිපූරණය කිරීම වෙනුවෙන් රු.15,239,611ක වියදමක් දරා තිබුණි. | වෛද්‍යාධාර යෝජනා ක්‍රමය සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. | මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීම සඳහා කටයුතු කරමින් පවතී. | 2021 වර්ෂයේදීද භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ඊ) | 1981 අංක 75 දරන උක් පර්යේෂණ පනත මගින් වාණිජ වශයෙන් උක් වගා කිරීම, දේශීය සීනි කර්මාන්තයට අදාළ සංවර්ධන කටයුතු සිදු කිරීම, දේශීය සීනි කර්මාන්තය නියාමනය කිරීම සහ හඳුන්වා දෙන උක් ප්‍රභේදවල වාණිජ අනුවර්තිතාවය (Commercial Adoption) තීරණය කිරීම යනාදිය සඳහා ආයතනයට බලතල පවරා නොතිබීම හේතුවෙන් ආයතනය පිහිටුවා අවුරුදු 35 ක කාලයක් ගත වුවද, සීනි කර්මාන්තය රට තුළ නිසි පරිදි ස්ථාපිත වී නොතිබූ | පනත අවශ්‍ය පරිදි සංශෝධනය කරවා ගෙන සීනි කර්මාන්තයට අදාළ සංවර්ධන කටයුතු සිදු කිරීම, නියාමනය කිරීම හා උක් ප්‍රභේද වල වාණිජ අනුවර්තිතාවය මඟින් රටේ සීනි නිෂ්පාදනය වැඩි කර ගැනීමට කටයුතු කළ යුතුය. | උක් පර්යේෂණ ආයතනයට බලතල ලබා ගැනීම සඳහා පනත සංශෝධනය කිරීමට කටයුතු කරමින් පවතී. | අවශ්‍ය බලතල පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | අතර දේශීය සීනී අවශ්‍යතාවයෙන් සියයට අනූ දෙකක්ම ආනයනය කරනු ලබන බව ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවෙන් අනාවරණය කර තිබුණි. | | | |
| (උ) | ආයතනය විසින් රෝගවලට ප්‍රතිරෝධී උක් ප්‍රභේද හඳුන්වාදීම, ජාන ප්ලාස්ම සංචිතයේ පවතින ප්‍රතිරෝධී ප්‍රභේද තෝරා එම ප්‍රභේද ඉදිරි අභිජනන කටයුතු සඳහා යොදා ගැනීම, රෝග වාහක පත්‍ර කීඩෑවා හඳුනා ගැනීම සහ එම කෘමියා මර්ධනයට අවශ්‍ය නිර්දේශ ලබා දීම, උණුදිය ප්‍රතිකාර ඒකක ස්ථාපනය කිරීම, රෝග හා පළිබෝධ පාලනය සම්බන්ධව ගොවීන් දැනුවත් කිරීම, පුහුණු වැඩසටහන් පැවැත්වීම, උපදෙස් පත්‍රිකා බෙදාහැරීම, ප්‍රාථමික තවාන් ස්ථාපනය කිරීම ආදී පියවර රෝග මර්ධනය සඳහා සිදුකර තිබුණ ද, 1972 වර්ෂයේ හඳුනාගෙන තිබූ සුදු පත්‍ර රෝගය 2020 දෙසැම්බර් වන විටද මර්ධනය කිරීමට අසමත්ව තිබෙන බව නිරීක්ෂණය විය. | අවශ්‍ය උපදේශන සේවා සහ මෙම රෝගයට ඔරොත්තු දෙන උක් ප්‍රභේද ව්‍යාප්තිය වැඩි කිරීම මඟින් සුදු පත්‍ර රෝග ඝණත්වය වැඩි මට්ටමක පවතින ප්‍රදේශ වල එම ඝණත්වය අවම කිරීමට කඩිනමින් ක්‍රියා කළ යුතුය. | රෝගය පාලනය කිරීම සඳහා ඔරොත්තු දෙන උක් ප්‍රභේදයක් ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය උපදේශන සේවා සැපයීමට කටයුතු කරන බව වාර්තා කර ඇත. | සම්පූර්ණයෙන් පාලනය වූ බවට තොරතුරු වාර්තා නොවේ. |
| (ඌ) | සීනි නිෂ්පාදන ආයතන 05 කින් මාස 09 ක සිට වසර 5 කට වැඩි කාලයක් දක්වා හිඟහිට ඇති රු.7,150,551ක් අයකර ගැනීමට ආයතනය | අය කර ගැනීමට නිසි ක්‍රියාමාර්ග ගත යුතුය. | ලංකා සීනි සමාගමෙන් අය විය යුතු මුදල් අයකරගෙන ඇත. කන්තලේ සීනි සමාගමෙන් අය කර ගැනීම සඳහා රාජ්‍ය අමාත්‍යාංශය | කන්තලේ සීනි සමාගමෙන් අයවිය යුතු මුදල් තව දුරටත් හිඟහිටව පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | අසමත් වී තිබූ අතර සීනි සමාගම් 2 කින් අයවිය යුතු සෙස් බදු රු.5,020,500ක්, උක් දඩු සැපයීමේ ගාස්තු රු.1,130,051ක් හා කන්තලේ සීනි සමාගමට ලබා දී තිබූ ණය මුදල් රු.1,000,000ක් ඊට ඇතුළත්ව තිබුණි. | | හරහා කටයුතු කරමින් සිටී. | |
| (එ) | 2018 වර්ෂයේ කන්තලේ ව්‍යාපෘතියට අදාළ නලළිං පොම්පාගාරය, උණුදිය ප්‍රතිකාර ඒකකයට විදුලිය ලබා ගැනීම, අලිවැට ඉදිකිරීම යන කාර්යයන් සඳහා රජයේ ප්‍රදාන මත දරා තිබුණු රු.8,080,336ක ප්‍රාග්ධන වියදම් රජයේ ප්‍රදාන හා වත්කම් ලෙස ගිණුම්ගත නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ස්ථාවර වත්කම් හා රජයේ ප්‍රදාන එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | රජයේ ප්‍රදාන හා ඊට අදාළ වත්කම් ප්‍රාග්ධනිත කර ක්‍රමක්ෂය කිරීමට කටයුතු කළ යුතුය. | වත්කම් ප්‍රත්‍යාගණනය කර ප්‍රාග්ධනිත කිරීමට අපේක්ෂිතය. | 2021 වර්ෂය අවසාන වන විටත් අදාළ කටයුතු සිදු කර නොතිබුණි. |
| (ඒ) | උක් පර්යේෂණ ආයතනය වෙත 2004 වර්ෂයේදී භුක්තිය භාරදී පර්යේෂණ වගාවන් පවත්වාගෙන යනු ලබන දෙනියාය එන්සල්වත්ත වතුයායේ හෙක්ටයාර් 5.7ක ඉඩමේ අයිතිය ලබාගෙන නොතිබූ අතර ඒ සම්බන්ධයෙන් අධිකරණයේ නඩුවක් විභාග වෙමින් පැවතුණි. එසේ තිබියදී 2020 | සංවර්ධන කටයුතු කිරීමට පෙර නිරවුල් අයිතිය ලබා ගැනීම නිලධාරීන්ගේ වගකීම වේ. | නඩුවේ තීරණයෙන් අනතුරුව අයිතිය පිළිබඳ ගැටලුව නිරාකරණය වේ. කොටපොළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සමඟ ඒ සඳහා කටයුතු සිදු කරමින් පවතී. | ඉඩම් අයිතිය ලබාගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | වර්ෂයේ දී රු.2,989,955ක වියදමක් දරා එහි පිවිසුම් මාර්ගය, රැඳවුම් බැම්ම, මුරකුටිය සහ ගේට්ටුවක් සවි කර තිබුණි. | | | |
| (ඔ) | ආයතනයට නීත්‍යානුකූල හිමිකම ලබාගෙන නොතිබූ කන්තලේ පිහිටි හෙක්ටයාර් 200 ක පමණ භූමියක 2015, 2017 හා 2020 වර්ෂවලදී මීටර් 4550 ක් දිග විදුලි වැටක් ඉදිකර අලුත්වැඩියා කිරීම සඳහා රු.3,472,135 ක් ද, උක් දඩු සඳහා උණුදිය ප්‍රතිකාර ඒකකයක් ස්ථාපිත කිරීම සඳහා රු.5,404,458 ක් ද වශයෙන් එකතුව රු.8,876,593 ක් වැයකර තිබූ අතර කන්තලේ සීනි කර්මාන්තශාලාව වසර ගණනාවක සිට අක්‍රීයව පැවතීම හේතුවෙන් දරන ලද වියදම් නිෂ්කාර්යය බවට පත්වී තිබුණි. | සංවර්ධන වියදම්වලින් නිසි ප්‍රතිඵල ලබාගත යුතුය. | කන්තලේ සීනි සමාගම ආරම්භ කිරීමට ප්‍රමාද වී ඇති බැවින් උප මධ්‍යස්ථානයේ අවශ්‍යතාව තීරණය කිරීමට කටයුතු කෙරෙමින් පවතී. | දරන ලද වියදම තව දුරටත් නිෂ්කාර්ය වියදමක් වී තිබුණි. |

## 13. කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - තතත්ත්වාගණනය කළ මතය

2019 - තතත්ත්වාගණනය කළ මතය

2020 - තතත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය කාර්යාල හතරක 2018 වර්ෂය අවසන් වනවිට රු.71,856,901ක් වටිනා ගොඩනැගිලි ඉදිකර තිබුණද එම ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය අධිකාරියට පවරා ගෙන නොතිබුණි. | නීත්‍යානුකූල අයිතිය අධිකාරියට පවරා ගෙන නොමැති ඉඩම්වල අයිතිය පවරා ගැනීම. | ආයතනය සතු ඉඩම් 49 ක් පවතින අතර ඉන් ඉඩම් 5 ක් සඳහා පමණක් නීත්‍යානුකූල අයිතිය අධිකාරිය සතුව ඇති අතර මේ සම්බන්ධ පූර්ණ විශ්ලේෂණයක් කර ඉතිරි ඉඩම් 44 හා ගොඩනැගිලි අධිකාරියට නෛතිකව පවරා ගැනීම සඳහා අදාළ ආයතන හා රේඛීය අමාත්‍යාංශය සමඟ සෘජුව සාකච්ඡා පවත්වා කටයුතු සිදු කෙරෙමින් පවතින බව දන්වා තිබුණි. | 2021 වර්ෂය දක්වාම පවරා ගැනීම් කටයුතු අවසන් කර නොතිබුණි. |
| (ආ) | 1998 වර්ෂයේදී පොහොර ණය යෝජනා ක්‍රමය යටතේ පොහොර, දියර ඉසින යන්ත්‍ර හා තරාදි ලබාගැනීම සඳහා කුඩා තේ වතු සමිති වලට ලබා දී තිබූ ණය මුදලින් 2019 වර්ෂය අවසානයට පැවති රු.4,300,942ක ණය ශේෂය වසර විස්සකට වැඩි කාලයක සිට පියවා ගැනීමට හෝ පොත්වලින් ලියා හැරීමට පියවර ගෙන නොතිබුණි. | ලැබිය යුතු මුදල් අයකරගැනීමට හෝ විධිමත් අනුමැතියකින් පොත්වලින් ලියාහැරීමට කටයුතු කළ යුතුය. | 1998 ණය පදනමට ලබා දුන් පොහොර , දියර ඉසින යන්ත්‍ර හා තරාදි යනාදියට තවදුරටත් අයවිය යුතු මුදල ලියාහැරීමට වැවිලි අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියට නැවත ඉදිරිපත් කරන බව දක්වා තිබුණි. | 2021 වර්ෂයේදීද අයකර ගැනීමට හෝ පොත් වලින් ලියාහැරීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඈ) | පොදු කොන්ත්‍රාත් රෙජිස්ටාර්වරයා යටතේ වලංගු ලියාපදිංචි කිරීමේ සහතිකයක් නොමැති ටෙන්ඩර්කරුවන් සමඟ ප්‍රසම්පාදන හා ඇගයීම් කමිටුවල නිලධාරීන් කටයුතු නොකළයුතු නමුත් 2019 වර්ෂයේදී ගිවිසුම්ගත වටිනාකම රු.11,213,888ක් වූ වික්‍රමනායක ජාතික පුහුණු මධ්‍යස්ථානයේ මාර්ගය දෙපස පැති බැම්ම ඉදිකිරීම හා රු.7,682,375ක් වූ ප්‍රධාන කාර්යාලයේ ඇළුමිනියම් දොර ජනෙල් යෙදීමේ කොන්ත්‍රාත්තු සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | පනතේ ප්‍රතිපාදනය අනුව පොදු කොන්ත්‍රාත් රෙජිස්ටාර්වරයා යටතේ ලියාපදිංචි සහතිකයක් නොමැති ටෙන්ඩර්කරුවන් සමඟ කටයුතු නොකළ යුතුය. | යෝජිත පරිදි ටෙන්ඩර් කොන්දේසි වලට ඇතුළත් කරන බව දක්වා තිබුණි. | පොදු කොන්ත්‍රාත් ගිවිසුම් පනත ප්‍රකාරව කටයුතු කිරීම සම්බන්ධ කොන්දේසි ටෙන්ඩර් ලියවිලි වලට ඇතුළත් කර තිබුණි. |
| (ඇ) | තේ නැවත වගා සහනාධාර අදියර 05 කින් ගෙවීමට සැලසුම් කර තිබුණි. 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා මෙකී අදියර 05 න් පළමු අදියර තුන සඳහා රු.918,115,761ක මුදලක් ලබාගෙන තිබුණු ගොවීන් ඉතිරි සහනාධාර මුදල් ලබාගැනීමට හා තේ නැවත වගා කිරීමට කටයුතු කර නොතිබුණි. මේ අනුව 2019 වර්ෂය වන විට පසුගිය වර්ෂ 5 ක කාලය තුළ ලබාදී තිබුණු තේ නැවත වගා කිරීමේ සහනාධාර මුදලින් සියයට 50 ක් පමණ අපේක්ෂිත අරමුණුට යොදවා නොමැති බව නිරීක්ෂණය විය. එසේ වුවත් | සහනාධාර මුදල් ලබාගෙන තේ නැවත වගා කටයුතු නොකරන ලද ගොවීන් වගාවට යොමුකරවීම හෝ නැවත අයකරගැනීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කළ යුතුය. | මෙම කාලසීමාව තුළ ආරම්භ කරන ලද නැවත වගාවේ නියමිත වගා කාල සටහන අනුව පැළ සිටුවීමට නොහැකි වුවත් පසුව එම අවසරපත්‍රවලට අදාළව පැළ සිටුවීමේ කාර්යය අවසන්කර ඇති බවට සහ ඇතැම් නැවත වගා ගොවීන් පැළ සිටුවීමේ වාර්ෂික කන්න දෙකෙහිද පැළ සිටුවීමට නොහැකි වුවහොත් පසුව එම වගා කාර්යය ඉටුකරන බව දක්වා තිබුණි. | ගොවීන් නැවත වගාවට යොමු කිරීමට හෝ සහනාධාර නැවත අයකර ගැනීම සම්බන්ධයෙන් ඵලදායී ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | මෙකී සහනාධාරලාභීන් නැවත තේ වගාවට යොමුකරවා ගැනීමට හෝ එම මුදල් නැවත අයකර ගැනීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි. | | | |
| (ඉ) | කුඩා තේ වතු සංවර්ධන සමිති ලියාපදිංචි කිරීම , පාලනය කිරීම හා සමිතිවල සාමාජිකයන්ට ආධාර ලබාදීම අධිකාරියේ කාර්යභාරය වන අතර 2019 වර්ෂයේ ඒ සඳහා රු. 7,522,098ක් වැය කර තිබුණි. එසේ වුවත් අධිකාරියේ අධීක්ෂණය යටතේ කුඩා තේ වතු සංවර්ධන සමිති 1,475ක් පැවතියද 2019 වර්ෂය අවසානයට සතුටුදායක මට්ටමේ පැවති සමිති සංඛාව 270 ක් පමණක් බව තහවුරු කර තිබුණි. එසේම 2019 වර්ෂයේදි ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදි සාමාජික ගොවීන් සංඛාව 17,462 කින් අඩු වි තිබූ බව නිරීක්ෂණ විය. තවද, ඒ ඒ කොට්ඨාෂවල තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරින් නොමැති වීම හේතුවෙන් අධිකාරිය යටතේ ලියාපදිංචි වු සමිති 61ක කාර්යසාධනය ඇගයීම් කර නොතිබුණි. | කුඩා තේ වතු සංවර්ධන සමිතිවල ක්‍රියාකාරිත්වය සතුටුදායක මට්ටමෙන් පවත්වා ගැනීමට අධිකාරියේ අවධානය යොමු කළ යුතුය. | 2018 වර්ෂයේදී සමිති ව්‍යවස්ථාව කාලානුරූපව සංශෝධනය කර ඇත. | 2021 වර්ෂය අවසානය දක්වාම ක්‍රියාකාරී සංවර්ධන සමිති සංඛ්‍යාව මෙන්ම සාමාජික සංඛ්‍යාවද ක්‍රමයෙන් අඩු වීමේ තත්ත්වයක් නිරීක්ෂණය විය. |
| (ඊ) | භෝග පුනරුත්ථාපන ආධාර ක්‍රමය යටතේ තේ පැළ 2,460,000 ක ප්‍රමාණයක් ලබා ගැනීම සඳහා අධිකාරිය මිල | ආයතනික තේ තවාන්සංවර්ධනය සහනාධාර කර වැඩසටහන් සඳහා | ආයතනික තවාන් වල නිපදවනු ලබන තේ පැළ නියමිත ප්‍රමිතියට වර්ධනය වූ පසු ගොවීන් | ආයතනික තවාන් සංවර්ධනය කිරීම මඟින් මෙම අවශ්‍යතාවය සපුරා ගැනීමට කටයුතු |

| | | | | |
|---|---|---|---|---|
| | ගණන් කැඳවා තිබුණු අතර මිල ගණන් ඉදිරිපත් කර තිබුණු තවාන් හිමි ආයතන 3 ම ව්‍යාජ ආයතන බව තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් තහවුරු කරගැනීම හේතුවෙන් එම මිල ගණන් ප්‍රතික්ෂේප කර පාළු පැළ සැපයීම නවතා දමා තිබුණි. එසේ වුවත් 2019 වර්ෂයේ අධිකාරිය සතු තේ තවාන් 10 ක තේ පැළ 744,881 ක් නොවිකිණී ඉතිරිව පැවතුණද මෙම තවාන් සංවර්ධනය කර ඉහත භෝග පුනරුත්ථාපන වැඩසටහනේ පැළ අවශ්‍යතාවය සපුරා ගැනීමට අවධානය යොමුවී නොතිබුණි. | අවශ්‍ය ප්‍රශස්ත වර්ධනයක් සහිත තේ පැළ සපයා ගැනීමට අවධානය යොමු කළ යුතුය. | වෙත නිකුත් කරනු ලබන අතර, එසේ ප්‍රශස්ත වර්ධනයක් නොපෙන්වන පැළ ගොවීන් වෙත නිකුත් කරනු නොලැබෙන බවත් ඒ අනුව අදාළ වර්ෂය අවසානයේ ආයතනික තවාන් වල පැළ 744,881ක් ඉතිරිව තිබුණද එම පැළ ක්ෂේත්‍රයේ සිටුවීම සඳහා යෝග්‍ය මට්ටමට වර්ධනය වී නොතිබු බැවින් භෝග පුනරුත්ථාපන වැඩසටහන සඳහා යොදා ගැනීමට හැකියාවක් නොතිබූ බව දක්වා තිබුණි. | කර නොතිබුණි. |
| (උ) | තේ නිෂ්පාදනය හා ඵලදායීතාවය වැඩිකිරීම සඳහා කුඩා තේ වතු හිමියන්ට ගුණාත්මක පැළ ලබාගැනීමට අධිකාරියේ ලියාපදිංචි වාණිජ තේ තවාන් 870 ක් පැවතියද, තේ පර්යේෂණ නිළධාරින් විසින් පරික්ෂා කරන ලද තේ තවාන් ප්‍රමාණය 2018/2019 වර්ෂයේදි සියයට 25 ක් පමණක් විය. එමනිසා වාණිජ තේ තවාන් සඳහා පවතින අධීක්ෂණය පහළ මට්ටමක පැවති බව නිරීක්ෂණය විය. | තේ පර්යේෂණ නිලධාරින්ගේ සහභාගීත්වය ලබාගෙන වාණිජ තේ තවාන්හි පරීක්ෂණ පුළුල් කළ යුතුය. | පරීක්ෂණ වැඩිකිරීම සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයන් ගෙන නැත. | තේ තවාන් උපදෙස් මාලාවට අනුව ප්‍රමාණවත් පරිදි තවාන් පරීක්ෂාවන් සිදුකර නොතිබුණි. |
| (ඌ) | 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා තේ ශක්ති සුභසාධන අරමුදලෙහි | සුභසාධන අරමුදලෙහි හිමිකරුවන් වෙත ප්‍රමාදයකින් තොරව | නීති මගින් අදාළ මුදල් අයකර ගැනීම සඳහා අධිකාරියේ පරිපාලන අංශය | ප්‍රතිලාභ ගෙවීමේ නිශ්චිත ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | සාමාජිකයන් සඳහා රක්ෂණාවරණ ඔප්පු ලබා ගැනීමට පෞද්ගලික රක්ෂණ සමාගමකට අධිකාරිය රු.27,358,214 ක් ගෙවීම් කර තිබුණි. එසේ වුවද තේ ශක්ති සුභසාධන අරමුදලෙහි හිමිකරුවන් වෙත ගෙවීම සඳහා 2017 වර්ෂයේ සිට ලද රු. 690,525 ක් වාර්තාවේ දින දක්වා ප්‍රතිලාභීන්ට ගෙවීම් කර නොතිබුණි. තවද අභ්‍යන්තර විගණකගේ 2019 නොවැම්බර් 15 දිනැති වාර්තාව අනුව තේ ශක්ති සුභසාධන ප්‍රතිලාභීන්ට රු.8,502,397 ක් ගෙවිය යුතුව තිබූ බව වාර්තා කර තිබුණි. එසේ වුවත් 2020 සැප්තැම්බර් 15 දින වනවිටත් මෙම මුදල් අධිකාරියට ලැබී නොතිබුණි. | ප්‍රතිලාභ ලබාදීමට හැකි ක්‍රමවේදයක් පවත්වාගෙන යාමට කටයුතු කළයුතුය. | මගින් පියවර ගනිමින් සිටී. | |
| (එ) | අධිකාරිය ව්‍යාප්ති හා උපදෙස් පුහුණු වැඩසටහන් වෙනුවෙන් 2019 වර්ෂයේ රු.17,313,714 ක් වැය කර තිබූ අතර ඉන් රු.7,104,573 ක් එනම් සියයට 41ක් අධිකාරිය විසින් ප්‍රාදේශීය කාර්යාල බල ප්‍රදේශයන්හි පවත්වන ලද ක්‍රීඩා උත්සවවල විද්‍යුත් හා මුද්‍රිත ප්‍රචාරණ කටයුතු සඳහා වැය කර තිබුණි. | ප්‍රතිපාදනය කර ඇති මුදල් අරමුණෙන් බැහැරව වැය නොකළ යුතුය. | කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | විධිමත් අනුමැතියකින් තොරව අරමුණින් බැහැරව වියදම් දරා තිබුණි. |
| (ඒ) | රජය විසින් ක්‍රියාත්මක තේ පොහොර ව්‍යාපෘතිය යටතේ තේ ගොවීන්ට සහනාධාර | ව්‍යාපෘතිය අවසන් වූ පසු ඉතිරි මුදල් භාණ්ඩාගාරයට | සහනාධාරලාභීන්ගේ ගිණුම්වල පැවති දෝෂ හේතුවෙන් ඉතිරි ශේෂය | මෙම මුදල් විධිමත් අනුමැතියක් රහිතව ඉතිරි පොහොර |

| | | | | |
|---|---|---|---|---|
| | ගෙවීම සඳහා 2016 වර්ෂයේ අධිකාරියට ලද මුදලින් රු.32,065,870ක් අපේක්ෂිත කාර්යය සඳහා නොයොදවා 2019 වර්ෂයේ අවසානය දක්වා රඳවා තබා ගෙන තිබුණි. | ප්‍රේෂණය කළයුතුය. | රු.මිලියන 32 අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියෙන් කුඩා තේ වතු හිමියන් වෙත සහනාධාර ලෙස කෘෂි උපකරණ බෙදාදීමට යොදා ගන්නා ලද බව දක්වා තිබුණි. | සහනාධාර මුදල් කෘෂි උපකරණ බෙදාදීම සඳහා 2020 වර්ෂයේදී වියදම් කර තිබුණි. |
| (ඔ) | 2019 වර්ෂය අවසානයට පොහොර හා ගංවතුර සහනාධාර ලෙස තේ ගොවීන් සඳහා සෘජු බැංකු හර කිරීම් රු.10,554,689ක් සහනාධාරලාභි තේ ගොවීන් ඉදිරිපත්කර තිබූ ගිණුම් අක්‍රියවීම, නම හා ගිණුම් අංකය වෙනස්වීම ආදි කරුණු නිසා හිමිකම් නොපෑ චෙක්පත් ගිණුමට මාරුකර තිබූ අතර ඒවායේ කාලය මාස හය සිට අවුරුදු 5 දක්වා පරාසයක විය.මෙම මුදල් අදාළ සහනාධාර ලාභියාට ගෙවීමට හෝ භාණ්ඩාගාරයට යැවීමට කටයුතු කර නොතිබුණි. | සහනාධාර මුදල් අදාළ කාලය තුළදී සහනාධාර හිමි ගොවීන් වෙත ලබාදීමට හා භාවිතා නොකරන ලද මුදල් නැවත භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීමට කටයුතු කළ යුතුය. | හිමිකම් නොපෑ සහනාධාරලාභීන් හඳුනාගත් බව වාර්තා කර නොතිබුණි. | මෙම ගැටලුව එලෙසම පවතී. |
| (ඕ) | කුඩා තේ වතු සංවර්ධන වැඩ කටයුතු වෙනුවෙන් දිවි නැගුම වැඩසටහන යටතේ නව තේ වගාව හා නැවත වගාව, ගම්මිරිස් වගාව, තේ ඉඩම්වල පාළු සිටුවීම යන සංවර්ධන කාර්යයන් සඳහා ලද රු. 3,196,085ක් 2016 වර්ෂයේ සිට අදාළ කාර්යය සඳහා නොයොදවා 2019 වර්ෂය අවසානය දක්වා රඳවාගෙන තිබුණි. | වැඩසටහන අවසන් වූ පසු ඉතිරි මුදල් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කළ යුතුය. | දිවිනැගුම ඉතිරි මුදල් ද කුඩා තේ වතු හිමියන් වෙත සහනාධාර සඳහා ගෙවා ඇති බව දක්වා තිබුණි. | මෙම මුදල් විධිමත් අනුමැතියක් රහිතව සහනාධාර මුදල් වෙනත් කාර්යයන් සඳහා වියදම් කර තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ක) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 49 වන ඡේදය අනුව දේපළ පිරියත හා උපකරණ අයිතමයන් ප්‍රත්‍යාගණනය කරන විටක එම වත්කම අයත් වන මුළු වත්කම් පන්තියම මුළුමනින්ම ප්‍රත්‍යාගණනය කළ යුතු වුවත්, ගාල්ල ප්‍රාදේශීය කාර්යාලයේ ලී බඩු සවිකිරීම් හා කාර්යාල උපකරණ සහ අධිකාරිය සතු වාහන 36 න් 18 ක් පමණක් ප්‍රත්‍යාගණනය කර තිබුණි. එසේම රු.38,815,350ක වටිනාකමකට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අධිකාරියට අයත් ඉඩම් 2005 දෙසැම්බර් 31 දිනෙන් පසුව ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. එම නිසා විශාල මිල වැඩිවීමක් පවතින මෙම ඉඩම් වල සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවලින් නිරූපනය නොවන බවද නිරීක්ෂණය විය. | දේපළ, පිරියත හා උපකරණ පන්තියම ප්‍රමිතිය ප්‍රකාර මුළුමනින්ම ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කළ යුතුය. එසේම සෑම වර්ෂ තුනකට හෝ පහකට වරක් ඉඩම් ප්‍රත්‍යාගණනය කළ යුතුය. | 2020 වර්ෂයේ ප්‍රත්‍යාගණනය සිදුනොකළ වාහන 18 ක් 2021 වර්ෂයේ ඔටෝමොබයිල් සංගමය (Automobile Association of Ceylon) මගින් ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කර ඇති බවත් ඉඩම් පසුගිය වසර 15 දී ප්‍රත්‍යාගණනය කර නොමැති බවත් 2022 දී සියලු ඉඩම් ප්‍රත්‍යාගණනය කරන බව දක්වා තිබුණි. | වාහන 18 ක් සහ අධිකාරියට අයත් ඉඩම් ප්‍රමිතීන් ප්‍රකාර ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. |
| (ග) | අධිකාරිය වෙත මහා භාණ්ඩාගාරයෙන් සහ වෙනත් රජයේ ආයතනවලින් ආධාර හා ප්‍රදාන වාර්ෂිකව ලැබෙන නමුත් එම ආධාර හා ප්‍රදාන ගිණුම්ගත කිරීමට අදාළ ගිණුම් ප්‍රතිපත්තිය එම අධාර හා ප්‍රදාන ලබාදීමේ කොන්දේසිද ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | ආධාර හා ප්‍රදාන ගිණුම්ගත කිරීමට අදාළ ප්‍රතිපත්ති සහ ආධාර ලබාදීමේ කොන්දේසි මූල්‍ය ප්‍රකාශන තුළ අනාවරණය කළ යුතුය. | 2021 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන වලින් අනාවරණය කරනු ලබන බව දන්වා ඇත. | මෙතෙක් නිවැරදි කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | 2020 වර්ෂය තුළ පමණක් අධිකාරියට ලැබී තිබුණු ආධාර හා ප්‍රදානවල අගය රු.මිලියන 1,088 ක් විය. | | | |
| (ඡ) | කුඩා තේ වතු සංවර්ධන සමිති සඳහා 1998 වර්ෂයේදී ණය පදනම යටතේ ලබාදී තිබූ වාහන 102 ක හිඟ ණය වාරික වෙනුවෙන් 2019 වර්ෂය දක්වා ලැබිය යුතු ශේෂය වූ රු.6,664,321ක් භාණ්ඩාගාර අනුමැතියකින් තොරව පොත්වලින් කපාහැර වාහන 23 ක් විකිණීමෙන් ලැබී තිබුණු එහෙත් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කළ යුතු රු.9,207,958ක මුදලට සදොස් ලෙස හිලව් කර ඉතිරි වූ රු.2,491,162 ක් විවිධ ආදායම් ගිණුමට මාරුකර තිබුණි. ඒ අනුව එම ප්‍රමාණයෙන් 2020 වර්ෂයේදී ආදායම වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළින් ගැලපීම් නිවැරදි කළ යුතු අතර වාහන විකිණීමෙන් ලද මුදල් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කළ යුතුය. | 2021 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | භාණ්ඩාගාරයට ප්‍රේෂණය කළ යුතු මුදල් 2021 වර්ෂයේදීද භාණ්ඩාගාරයට ප්‍රේෂණය කර නැත. |
| (ජ) | 2020 වර්ෂයේ රු.5,427,829 ක් වූ පොලී ආදායම මත ගෙවියයුතු රු.1,302,679ක ආදායම් බදු වගකීම මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | පොලී ආදායම මත ගෙවිය යුතු ආදායම් බදු මුදල් ගිණුම්ගත කළ යුතුය. | ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙතින් විමසීම් කර ඉදිරි කටයුතු සිදු කරන බවත් දක්වා ඇත. | පොලී ආදායම මත ගෙවිය යුතු ආදායම් බදු වගකීම ගිණුම්ගත කර නොතිබුණි. |
| (ඣ) | 2017 වර්ෂයේ ඇති වූ ගංවතුර ආපදාව හේතුවෙන් කුඩා තේ ඉඩම්වලට සිදු වූ හානිය වෙනුවෙන් සහනාධාර දීමනාවක් ගෙවීමට ලබාදී | සහනාධාර දීමනා ගෙවීමෙන් පසු ඉතිරි මුදල් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කළ යුතු අතර භාණ්ඩාගාර | නිකුත් කරන ලද සහනාධාර චෙක්පත් තේ වතු හිමියන් විසින් මුදල් කර නොගැනීම හේතුවෙන් බැංකුගත කර ඉතිරි වූ මුදල් අධ්‍යක්ෂ | මෙම මුදල භාණ්ඩාගාර අනුමැතියකින් තොරව වියදම් කර තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | තිබූ මුදලින් ඉතිරි වූ රු.46,991,673ක් සහ තේ පොහොර ව්‍යාපෘතිය යටතේ ගොවීන්ට සහනාධාර ගෙවීම සඳහා 2016 වර්ෂයේ අධිකාරියට ලබාදී තිබූ මුදලින් ඉතිරි රු.21,335,907ක් නැවත භාණ්ඩාගාරයට ප්‍රේෂණය කළයුතුව තිබුණද වගකීමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල නොදක්වා පෙර වර්ෂ ගැලපීම් ලෙස සමුච්චිත අතිරික්තයට ගලපා තිබුණි. මෙම නිසා අධිකාරියේ වගකීම් ඉහත ප්‍රමාණයෙන් අඩුවෙන්ද සමුච්චිත අතිරික්තය වැඩියෙන්ද 2020 වර්ෂයේ ගිණුම් තුළ දක්වා තිබුණි. | අනුමැතියකින් තොරව වියදම් නොකළ යුතුය. | මණ්ඩල අනුමැතිය මත කුඩා තේ වතු හිමියන් හට සහනාධාර ගෙවීම සඳහා යොදා ගන්නා ලදි. | |
| (න) | 1998 වර්ෂයේ තේ කම්හල් සඳහා වර්ණ විභේදන යන්ත්‍ර ලබාදීමේ වැඩසටහන මඟින් පෞද්ගලික කම්හල් හතරකට ලබාදී තිබුණු රු.5,916,589ක ණය මුදල් 2016 වර්ෂයේ සිට 2020 වර්ෂය අවසාන වන තෙක් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | අයවීමේ හැකියාවක් ඇති කම්හල් වලින් අයකරගැනීම සඳහා කඩිනමින් අවශ්‍ය පියවර ගැනීම සහ වසා දමන ලද කම්හල් සම්බන්ධයෙන් විශේෂ කමිටුවක් මඟින් තව දුරටත් පරීක්ෂා කර සුදුසු තීරණයකට එළඹිය යුතුය. | තේ කම්හල් 04 කට ලබා දුන් ණය මුදල් අතරින් රු. 5,916,589 ක මුදලක් අය නොවී පවතින බවත් ඒ අතරින් ඊරියගහ කම්හලට පමණක් විරුද්ධව ණය අයකර ගැනීමට නෛතික ක්‍රියාමාර්ග ගෙන ඇති බවත් ඉතිරි ණය මුදල් අය නොවන තත්ත්වයක ලියාහැරීමට සැලසුම් කර ඇති බවත් දක්වා තිබුණි. | ණය කඩිනමින් අයකර ගැනීම වෙනුවට පොත් වලින් ලියාහැරීම සඳහා කටයුතු කරමින් පවතී. |
| (ප) | 2019 වර්ෂයේ රු.73,907,078ක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබූ ඉඩම් වටිනාකම තුළ, අධිකාරියට අයිතිය පවරා | ඉඩම් අයිතිය කඩිනමින් අධිකාරියට පවරාගැනීමට සහ අයිතිය පවරා නොගෙන භුක්ති විඳින ඉඩම් | අධිකාරියට පවරා නොගෙන භුක්ති විඳින ඉඩම් පිළිබඳ හෙළිදරව් කිරීමක් 2021 අවසාන ගිණුම්හි සටහන් තුළින් | 2021 වර්ෂයේදීද මේ සම්බන්ධව ක්‍රියාත්මක වී නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | නොගත් රජය, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව , මහවැලි අධිකාරිය වැනි ආයතනවලට හිමි රු.35,091,728ක් වූ ඉඩම්ද ඇතුළත් කර තිබුණු නමුත් මෙම ඉඩම් පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | සම්බන්ධයෙන් හෙළිදරව් කළ යුතුය. | ඉදිරිපත් කිරීමට කටයුතු කිරීමට සටහන් කර ඇත. | |
| (බ) | අධිකාරිය විසින් තේ පරීක්ෂක /ව්‍යාප්ති නිලධාරීන් 70 දෙනෙකු වෙත ක්ෂේත්‍ර රාජකාරි කටයුතු සඳහා යතුරුපැදි ලබාදී හිමිකම් කාලය වූ වසර 8 ඉකුත් වීමට පෙර අධිකාරිය විසින් 2014/15 අයවැය යෝජනා යටතේ එම නිලධාරීන් 70 දෙනා වෙත නව යතුරුපැදි ලබා ගැනීම සඳහා සහතිකකර තිබීම නිසා රජයට සිදුවී ඇති අලාභය රු.10,112,300ක් විය. | පෙර ලබා ගන්නා ලද යතුරුපැදිවල හිමිකම් කාලය ඉක්මවා යාමට පෙර නව යතුරුපැදි නිර්දේශ කිරීම නොකළ යුතුය. | කිසිදු වැළැක්වීමේ ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | නිවැරදි කිරීම් කර නොමැත. |
| (ම) | පස සංරක්ෂණය වෙනුවෙන් ප්‍රධාන කාර්යාලය, නුවරඑළිය, රත්නපුර හා කෑගල්ල යන ප්‍රාදේශීය කාර්යාල බල ප්‍රදේශයන්හී ගොවීන්ට සහනාධාර දීමනාවක් ගෙවීමට ලබාදී තිබූ මුදලින් ඉතිරි රු.13,812,613ක් 2020 වර්ෂය අවසානය වන විටත් භාණ්ඩාගාරයට ප්‍රේෂණය නොකර ගිණුම්වල රඳවාගෙන තිබුණි. | පස සංරක්ෂණය සඳහා ලබා දෙන ලද සහනාධාර ඉතිරි මුදල් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කළ යුතු අතර භාණ්ඩාගාර අනුමැතියකින් තොරව වියදම් නොකළ යුතුය. | ගොවීන් වෙත බැංකුගත කිරීමෙන් නිශ්කාශනය නොවූ මුදල කුඩා තේ වතු හිමියන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් යටතේ 2022 දී භාවිත කිරීමට යෝජිත බව දක්වා තිබුණි. | ඉතිරි සහනාධාර මුදල් භාණ්ඩාගාර අනුමැතියකින් තොරව වියදම් කිරීමට කටයුතු කරමින් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| (ය) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයෙහි මු.රෙ. 681 අනුව රූපවාහිනිය මඟින් ප්‍රචාරණය කිරීම අත්‍යාන්තයෙන්ම අවශ්‍යයයි සැලකෙන අවස්ථාවලදී අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ පූර්ව අනුමැතිය ලබා ගැනීමෙන් පසු ප්‍රචාරණ කටයුතු කළ යුතු වුවද එලෙස පූර්ව අනුමැතියකින් තොරව රූපවාහිනිය මඟින් සිදුකරනු ලැබූ ප්‍රචාරණ කටයුතු සඳහා 2020 වර්ෂයේදී රු. 1,741,880ක් වැයකර තිබුණි. | ප්‍රචාරණ කටයුතු සඳහා මුදල් රෙගුලාසි ප්‍රකාරව අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය. | 2021 වර්ෂයේ රූපවාහිනී වැඩසටහන් ප්‍රචාරණය කිරීමට ප්‍රථම මු.රෙ. 681 පරිදි අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් පූර්ව අනුමැතිය ලබාගෙන ඇති බව දක්වා තිබුණි. | මුදල් රෙගුලාසි උල්ලංඝණය කළ නිලධාරීන්ට එරෙහි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ර) | අංක පීඊඞී/12 සහ 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය හා 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තිය අනුව 2020 දෙසැම්බර් 31 දිනට අධිකාරිය විසින් රු.113,013,766ක් ස්ථාවර හා කෙටිකාලීන තැන්පතුවල ආයෝජනය කර තිබූ නමුත් ඒ සඳහා අදාළ අමාත්‍යවරයාගේ හා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබාගෙන නොතිබුණි. | මුදල් ආයෝජනය කිරීමේදී අදාළ අමාත්‍යවරයාගේ හා මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගත යුතුය. | කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | අදාල අනුමැතීන් සහිතව මුදල් ආයොජනයන් සිදු කර නොතිබුණි. |
| (ල) | ජාතික ප්‍රතිපත්තියට අනුව උපරිම ඵලදාවක් ලබමින් තේ වගා භූමි ප්‍රමාණය ස්ථායීව පවත්වාගැනීම සඳහා වසරකට සියයට 02 ක් එනම් හෙක්ටයාර් 2,300 ක් තේ | ජාතික ප්‍රතිපත්තියට අනුව වගා භූමි ප්‍රමාණය ස්ථායීව පවත්වා ගැනීමට වසරකට සියයට 02 ක් එනම් හෙක්ටයාර් 2300 ක් තේ | මුදල් අමාත්‍යාශය මගින් අනුමත කර ඇති ප්‍රතිපාදන හෙක්ටයාර් 300 ට සීමා කර තිබුණි. ඒ අනුව ක්ෂේත්‍ර සංවර්ධන කටයුතු සිදු කර ඇත. | තේ නැවත වගාකිරීමේ ඉලක්ක සපුරා නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | නැවත වගාව සිදුකළ යුතු වුවත් 2020 වර්ෂයේ තේ නැවත වගාව සඳහා ඉලක්ක ගත භූමි ප්‍රමාණය වූ හෙක්ටයාර් 800 න් නැවත වගා මඟින් භූමි ප්‍රමාණය හෙක්ටයාර් 648 ක් පමණක් විය. | නැවත වගාව සිදුකළ යුතු වේ. | | |
| (ච) | වාර්ෂික වාර්තාවට අනුව 2020 වර්ෂයේ මව් වගා මඟින් රිකිලි අතු නිෂ්පාදනය වාර්ෂික ඉලක්කයෙන් සියයට 51 ක ප්‍රතිශතයක් පමණක් අත්පත්කරගෙන තිබුණු අතර ගාල්ල, මාතර, නුවරඑළිය, කළුතර, හන්තාන යන ප්‍රාදේශීය කාර්යාලවල ස්ථාපනය කර ඇති මව් වගාවන්වල ආදායම ඉක්මවා වියදම් දරා තිබුණි. | මව් වගා මඟින් රිකිලි අතු නිෂ්පාදනය වර්ධනයට කටයුතු කළ කළ යුතුය. | වැළැක්වීමේ ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | මව් වගා මඟින් රිකිලි අතු නිෂ්පාදනය පහත වැටී තිබූ අතර මව් වගාවන් වල පිරිවැය හෝ ආවරණය වී නොතිබුණි. |
| (ස) | අධිකාරිය විසින් පවත්වාගෙන යනු ලබන ආයතනික තේ තවාන් වල අවම වශයෙන් නිෂ්පාදනය සඳහා වැයවන වියදම හෝ ආවරණය කරගත යුතු බව තේ තවාන් කළමණාකරන උපදෙස් මාලාවේ අවධාරණය කර තිබුණද මාවරල හා නෙල්ලිගොල්ල තේ තවාන්වල ආදායම, වියදම් පියවා ගැනීමට හෝ ප්‍රමාණවත් වී නොතිබුණි. තවද තේ තවාන්වල තේ පැළ මියයාමේ ප්‍රතිශතය සියයට 05 | තවාන් කළමණාකරන උපදෙස් මාලාවට අනුව සහ විකල්ප සැලසුම් මඟින් පැළ මියයාමේ ප්‍රතිශතය සියයට 5 ක මට්ටමක තබා ගත යුතුය. | මෙම වසරේ සිට ආයතනික තවාන් සම්බන්ධව ප්‍රාදේශීය කලමනාකරුවන් වෙත තවාන ලාභදායිව පවත්වාගැනීම සඳහා උපදෙස් ලබා දී ඇති බවත් 2019/20 මාවරල/නෙල්ලිගොල්ල තවාන් සම්බන්ධව වගකීමෙන් තොරව කටයුතු කරන ලද සියලු නිලධාරීන් වෙතින් කරුණු විමසා අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කරමින් පවතින බවත් දන්වා ඇත. | තවාන් කළමණාකරන උපදෙස් මාලාවට අනුව කටයුතු කර නොමැති අතර තවාන් කටයුතු වල ප්‍රගතියක් අත් කරගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | ක මට්ටමක පවත්වාගත යුතු වුවත්, 2020 දෙසැම්බර් 31 දිනට තේ තවාන්වල පැළ විනාශවීමේ ප්‍රතිශතය සියයට 19 ත් සියයට 70 ත් අතර පැවතුණි. | | | |
| (ණ) | තේ ක්ෂේත්‍රය සඳහා අවශ්‍ය වන වාර්ෂික රිකිලි තේ පැළ අවශ්‍යතාව සපුරාගැනීම සඳහා තේ පැළ මිලියන 25 ක විශේෂ තේ පැළ තවාන් ඇති කිරීමේ තවාන් 500 විශේෂ ව්‍යාපෘතිය 2020 වර්ෂයේදී ආරම්භ කර තිබුණු අතර ඒ සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අරමුදල්වලින් ලැබී තිබුණු රුපියල් මිලියන 75 ක මුදලින් රුපියල් මිලියන 29.75ක් වැය කර පැළ 17,675,000 ක ධාරිතාවයක් සඳහා කුඩා තේ වතුහිමියන්ට ආධාර ලබා දී තිබුණි. එසේ වුවත් ලද අරමුදලින් රුපියල් මිලියන 45 ක් එනම් සියයට 60 ක් 2020 වර්ෂය අවසානයට අධිකාරියේ ඉතිරි වී තිබූ බව නිරීක්ෂණය විය. | ලද මුදල් කඩිනමින් උපයෝජනය කළ යුතුය. | සැපයුම්කරුවන් විසින් යෙදවුම් ද්‍රව්‍ය ලබා දීමෙන් පසු මුදල් ගෙවීම සිදුවන බැවින් අදාළ රු.මිලියන 75 ක මුදල 2020 වර්ෂය තුළ සැපයුම්කරුවන් වෙත ගෙවා අවසන් කිරීමට නොහැකි වී තිබුණි. | 2021 වර්ෂයේදී රු.මිලියන 125 ක් ලැබී තිබුණු අතර වර්ෂය අවසාන වන විට රු.33,470,666 ක් ඉතිරිව පැවතුනි. |
| (ළ) | 2018 වාර්ෂික අයවැය යෝජනා අනුව කුඩා තේ ඉඩම්වල නිවැරදි කෘෂිකාර්මික පිළිවෙත් නියමිත පරිදි සිදුකිරීමට දිරිගැන්වීම සඳහා අවශ්‍ය කෘෂි උපකරණ කුඩා තේ වතු හිමියන්ට බෙදාදීම සඳහා රුපියල් මිලියන 250 ක මුදලක් කැබිනට් අනුමැතිය | නිශ්චිත ක්‍රමවේදයකට අනුව උපකරණ බෙදාදීමට කඩිනමින් පියවර ගත යුතුය. | මේ සඳහා ක්‍රමවේදයක් සකස්කර තිබුනද 2020 වසරේ පැවති මැතිවරණ හා කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් මෙම උපකරණ බෙදා හැරීමට අවස්ථාව නොලැබූ බවත් 2021 වර්ෂයේ ප්‍රධාන කාර්යාල තොගයෙන් වතුර මෝටර් | 2021 වර්ෂය අවසානය දක්වාම උපකරණ බෙදාදීම අවසන් කර නොතිබුණි. |

මත ලැබී තිබුණු අතර අවශ්‍යතාවයට වඩා යන්ත්‍ර මිලට ගැනීම හේතුවෙන් සහ බෙදාහැරීමේ නිශ්චිත ක්‍රමවේදයක් නොතිබීම හේතුවෙන් රු.94,408,739ක් වටිනා මුල්ළු, උදළු, අලවංගු, වතුර මෝටර්, දියර ඉසින යන්ත්‍ර යනාදී කෘෂි උපකරණ ඒකක 13,650ක් උපයෝජනයට නොගෙන 2020 වර්ෂය අවසානයට ප්‍රධාන කාර්යාලයේ සහ ප්‍රාදේශිය කාර්යාල තුළ ගබඩා කර තිබුණි.

2028 හා දියර ඉසින යන්ත්‍ර 334 ක් බෙදා දී ඇති බවත් දක්වා තිබුණි.

## 14. කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 - තතත්ත්වාගණනය කළ මතය

2019 - තතත්ත්වාගණනය කළ මතය

2020 - තතත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | මෙම ආයතනය කොළඹ විශ්වවිද්‍යාලයේ කෘෂි තාක්ෂණික පීඨය ලෙස හඳුන්වා දීමට 2018 වර්ෂයේ කටයුතු කර තිබුණු අතර නව යෝජනාව අනුව අධ්‍යයන අංශ 04ක් පිහිටුවා එමගින් උපාධි පාඨමාලා 02 ක් පැවැත්වීමට සැලසුම් කර තිබුණි. එහෙත් ඒ සඳහා 2020 වර්ෂය අවසානය දක්වාම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අනුමැතිය ලැබී නොතිබුණි. | අනුමැතිය ලබාගැනීමෙන් පසු පාඨමාලා ආරම්භ කිරීමට කටයුතු කල යුතුය. | මේ සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්ව පාලන අංශය වෙත අනුමැතිය ලැබී ඇති අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ Standing Committee හී දී සාකච්ඡා වෙමින් පවතී. | ආයතනය තව දුරටත් පවතින අයුරින්ම පවත්වා ගැනීමට තීරණය කර ඇති අතර එම තීරණය පිළිබඳ කළමණාකරන මණ්ඩලය ද දැනුවත් කර ඇත. |
| (ආ) | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු අක්කර 50 ක භූමි භාගය තුළ ආයතනය පිහිටුවා එහි ඉදිකිරීම් සිදුකර තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම එහි අයිතිය පවරාගෙන නොතිබුණි. | භූමිය නීත්‍යානුකූලව පවරා ගැනීම සඳහා කටයුතු කඩිනමින් අවසන් කරගත යුතුය | අක්කර 50 ක ඉඩමේ නීත්‍යානුකූල අයිතිය ආයතනයට පවරා ගැනීම සඳහා නීත්‍යනුකූල ලියවිලි අත්සන් කල ද මේ වන තෙක් එම ලේඛන අප වෙත ලැබී නොමැත. | ඉඩම් කොමසාරිස් සහ හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් දැනුවත් කල ද මෙතෙක් පවරා දී නොමැති බව. |
| (ඇ) | 2008 ඔක්තෝබර් 16 දිනැති අංක 157 1/15 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ 5 (ii) සහ (iii) වගන්තිය ප්‍රකාරව නියමාවලිය අනුව ශාස්ත්‍රීය මණ්ඩලයක් සහ අධ්‍යයන මණ්ඩලයක් පිහිටුවීමට කටයුතු කර නොතිබුණි. | අති විශේෂ ගැසට් පත්‍රයේ වගන්ති ප්‍රකාරව කටයුතු කළ යුතුය. | අධ්‍යයන මණ්ඩලයක් පිහිටුවීමට කටයුතු කළෙමි. | ශාස්ත්‍රීය මණ්ඩලයක් පිහිටුවීමට කටයුතු කර නැත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ අවසානයට පැවති සේවක පුරප්පාඩු 30 ක් සම්පූර්ණ කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සේවක පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුය. | අධ්‍යයන කාර්යය මණ්ඩල පුරප්පාඩු සඳහා 2021 මාර්තු 01 දින වන විට බඳවා ගත් බවත්, අනධ්‍යයන කාර්යය මණ්ඩල පුරප්පාඩු බඳවා ගැනීමට කටයුතු කරමි. | ප්‍රාථමික ශ්‍රේණියේ පුරප්පාඩු 13 ක් සම්පූර්ණ කර ගැනීමට බහු කාර්යය සංවර්ධන බලකා දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කල බව සහ අනධ්‍යන කාර්යය මණ්ඩල පුරප්පාඩු පිරවීමට උත්සාහ ගත්ත ද මෙතෙක් ඉටු කර නැත. |

## 15. කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ යෝජනා ක්‍රමය

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 - තතත්ත්වාගණනය කළ මතය

2019 - තතත්ත්වාගණනය කළ මතය

2020 - තතත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2015 මැයි 25 දිනැති අංක 1/2015 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 4.2 ඡේදය අනුව නිල වාහන හිමිකම් හා ප්‍රවාහන දීමනාව හිමිකම් නොමැති, අංශ ප්‍රධානියෙකු වෙනුවෙන් මසකට රු.8,000ක් ද විධායක නිලධාරියෙකු වෙනුවෙන් රු.4,000ක් ද බැගින් 2018 වර්ෂය සහ ඉකුත් වර්ෂ 3 තුළ රු.3,083,490ක මුදලක් ගෙවා තිබුණි. | චක්‍රලේඛයට අනුගතව කටයුතු කළ යුතුය. | ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. | අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත 2018 වර්ෂයේ සිට දීමනාව ලබාදීම තවදුරටත් සිදු වේ. |
| (ආ) | අවශ්‍යතාවය හඳුනාගැනීමකින් තොරව රු.1,790,956ක් වැය කර මිල දී ගෙන තිබුණු ආකෘතිපත්‍ර හා වන්දි අයදුම්පත්‍ර භාවිතා කිරීමකින් තොරව ගබඩාවේ අභාවිතව පැවතුණි. | අනවශ්‍ය ආකෘතිපත්‍ර ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. | කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | එක් තොග අයිතමයක් හැර අනෙකුත් තොග අයිතම, භෞතිකව හෝ තොග පොත්වල සටහන් කර හෝ නොතිබුණි. |
| (ඇ) | පශු රක්‍ෂණය යටතේ රක්‍ෂණය කළ ගවයින්ගේ රක්‍ෂණ කාලය ඉකුත් වූ පසුව නැවත එම ගිවිසුම් අලුත් කිරීමට දිස්ත්‍රික් කාර්යාල අවධානය යොමු නොකිරීම පශු රක්‍ෂණ ආදායම අඩුවීමට හේතු වී තිබුණු බව කෑගල්ල හා හම්බන්තොට දිස්ත්‍රික් කාර්යාල පරීක්ෂාවේදී | පශු රක්ෂණ ක්‍රමවේද දියුණු කිරීමට කටයුතු කළ යුතුය. | ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. | පශු රක්‍ෂණ ආදායම අඩු වී තිබුණද එම තත්ත්වය ඉහළ නංවා ගැනීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | අනාවරණය විය. කෑගල්ල දිස්ත්‍රික් කාර්යාලය පරික්ෂාවේදී 2017 හා 2018 වර්ෂයේ ගව රක්‍ෂණ ගිවිසුම් 224 න් 64 ක් 2019 වර්ෂයේදී කල්පිරී තිබුණද ඒවායේ රක්‍ෂණය නැවත අලුත් කරවා ගැනීමට 2020 වර්ෂයේදීද කටයුතු කරගෙන නොතිබුණි. | | | |
| (ඈ) | මහියංගනය හා ඇඹිලිපිටියේ පිහිටි නිල නිවාස අවශ්‍ය අලුත්වැඩියාවන් සිදු කිරීමකින් තොරව වර්ෂ 22 කට අධික කාලයක සිට අභාවිතව පවතී. | නිශ්ක්‍රීය වත්කම් ප්‍රතිසංස්කරණය කර භාවිතා කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. | ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. | 2022 ජනවාරි අවසානය දක්වාම අභාවිතව පවතින බව නිරීක්ෂණය විය. |
| (ඉ) | මහනුවර, අම්පාර, මනම්පිටිය හා මහව යන දිස්ත්‍රික්කයන්හි කෘෂි රක්ෂණ මණ්ඩලයට අයත් දිස්ත්‍රික් කාර්යාල ඉදිකිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් ඉඩම් පවරාගෙන තිබුණද, එම ඉඩම්වල ගොඩනැගිලි ඉදිකිරීමට කටයුතු නොකර කුලියට ගත් ගොඩනැගිලිවල කාර්යාල පවත්වාගෙන යමින් තිබුණි. | දිස්ත්‍රික් කාර්යාල කඩිනමින් ඉදිකර කුලී ගොඩනැගිලි වලින් ඉවත්වීමට කටයුතු කළ යුතුය. | ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. | කුලියට ගත් ගොඩනැගිලිවල කාර්යාල පවත්වාගෙන යමින් තිබුණි. |
| (ඊ) | මණ්ඩලය සතු ධාවනය කළ හැකි සංචිත වාහන 07 ක් සඳහා රියදුරන් 03 දෙනෙකු පමණක් සිටීම හේතුවෙන් එම සංචිත වාහන ඌන උපයෝජිත තත්ත්වයේ පැවතිණි. | ප්‍රමාණවත් රියදුරන් බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. | ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. | තවදුරටත් රියදුරන් 4 දෙනෙකු පමණක් සිටින නිසා සංචිත වාහන නිෂ්කාර්යව තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (උ) | අනාගත මානව සම්පත් අවශ්‍යතා සලකා බලා 2015 ජුලි 30 දිනැති 463/14 අංක දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවෙන් අනුමත කරන ලද සංශෝධිත බඳවා ගැනීමේ පටිපාටිය (SOR) වර්තමානයට ගැළපෙන ලෙස සංශෝධනය කර කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට 2020 වර්ෂය අවසන් වන තෙක් කටයුතු කර නොතිබුණි. | බඳවා ගැනීම් පටිපාටිය යාවත්කාලීන කිරීමට පියවර ගත යුතුය. | ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. | 2022 ජනවාරි දක්වා බඳවා ගැනීම් පටිපාටිය යාවත්කාලීන කර නොතිබුණි. |
| (ඌ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 හි 51 ඡේදය ප්‍රකාරව වත්කමක ප්‍රයෝජනවත් ජීවිත කාලය සෑම මුදල් වර්ෂයක් අවසානයේදීම සමාලෝචනය කළ යුතු වුවද 2020 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණයෙන්ම ක්ෂය කළ එහෙත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවති පිරිවැය රු.25,801,935ක් වූ දේපළ පිරියත උපකරණ සම්බන්ධයෙන් එසේ සිදුකර නොතිබුණි. | ඵලදායී ජීවිත කාලය සමාලෝචනයට භාජනය කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කළ යුතු වීම. | ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. | ඵලදායී ජීවිත කාලය සමාලෝචනයට භාජනය කර නොතිබුණි. |
| (එ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 37 හි 59 වන ඡේදය ප්‍රකාරව සක්‍රීය දායකයන් හඳුනා ගැනීම සහ ගොවි විශ්‍රාමිකයින් සඳහා වන මරණ පාරිතෝෂිකය ආයු ගණක තක්සේරුව මඟින් ගණනය කළ යුතු වුවද 2020 දෙසැම්බර් 31 දිනට රු.1,077,622,157ක් වූ | මරණ පාරිතෝෂික අරමුදල සම්බන්ධ බැරකම් ආයුගණක තක්සේරුව මඟින් කාලානුරූපීව ගණනය කළ යුතු වීම. | ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. | 2021 වර්ෂය අවසානය දක්වාම මේ සඳහා අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | ගොවීන්ගේ මරණ පාරිතෝෂික අරමුදල සම්බන්ධ බැරකම් ආයු ගණක තක්සේරුව මඟින් ගණනය කර කාලානුරූපීව ප්‍රතිපාදනයන් කර නොතිබුණි. | | | |
| (ඒ) | මහියංගනය, ඇඹිලිපිටිය සහ අනුරාධපුරයෙහි පවත්වාගෙන යනු ලබන නිල නිවාස 3 පිහිටි මණ්ඩලයට අයත් පර්චස් 76.6 ක් වූ ඉඩම් සහ ඇඹිලිපිටිය නිල නිවාසයේ ගොඩනැගිලි වටිනාකම, තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. | ගොඩනැගිලි වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වීම. | දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂකවරුන් සමඟ අවශ්‍ය කටයුතු සාකච්ඡා කර අවශ්‍ය කටයුතු ආරම්භ කර ඇත. | 2021 වර්ෂය අවසානය දක්වාම ගොඩනැගිලි වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. |
| (ඔ) | 2020 ජනවාරි මස සිට ඔක්තොම්බර් මාසය දක්වා කාල පරිච්ඡේදයට අදාළව බැංකුව විසින් ආපසු හරවා එවා තිබුණු රු 76,174,434 ක් වටිනා චෙක්පත් 2,147 ක් සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම සඳහා නොගෙවූ වන්දි ලේඛනයක් හෝ පරිගණක සටහනක් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | නොගෙවූ වන්දි චෙක්පත් හඳුනාගැනීමට හැකි වන පරිදි ලේඛනයක් හෝ පරිගණක සටහනක් පවත්වාගෙන යා යුතු වීම. | චෙක්පත්වල විස්තර වෙන වෙනම පරිගණකයේ තබාගැනීම සහ තොරතුරු අදාළ ගොනුවල ඇතුළත් කර ඇත. | නොගෙවූ වන්දි චෙක්පත්වල විස්තර වෙන වෙනම හඳුනාගැනීමට හැකි වන පරිදි ලේඛනයක් හෝ පරිගණක සටහනක් පවත්වාගෙන ගොස් නොමැත. |
| (ඕ) | අවුරුදු 01 සිට අවුරුදු 25 ක් දක්වා පැරණි රු.1,764,637ක් වූ ණය හා අත්තිකාරම් ශේෂ 2020 වර්ෂය තුළදී ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ණය හා අත්තිකාරම් කඩිනමින් පියවා ගැනීමට කටයුතු කළ යුතු වීම. | දීර්ඝ කාලීනව අය නොවන සේවක ණය සහ අත්තිකාරම් පිළිබඳ විස්තර අධ්‍යක්ෂ (පාලන) වෙත ලබාදී ඇත. | 2021 වර්ෂය අවසානය දක්වා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ක) | ප්‍රසිද්ධ දැන්වීම් පළකිරීම මඟින් ඉල්ලුම්පත් කැඳවීමෙන් පසු ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් බාහිර හෝ අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගත යුතු බව සඳහන් වුවද ඊට පටහැනිව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත තනතුරු 7 ක පුරප්පාඩු පිරවීම සඳහා නිලධාරීන් 56 දෙනෙකු සේවා කාලය දීර්ඝ කිරීම, කොන්ත්‍රාත් හා පුහුණු පදනම, හා අනියම් පදනම මත බඳවාගෙන තිබුණි. | බඳවාගැනීමේ පරිපාටිය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. | බඳවාගැනීමේ පරිපාටිය ප්රකාරව කටයුතු කර නොමැත. |
| (ග) | සෑම සේවා කාණ්ඩායමකටම අයත් නිලධාරීන්ට කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ අවම වශයෙන් වර්ෂයට එක් වතාවක් හෝ අවශ්‍ය වන පරිදි පවත්වනු ලැබිය යුතු අතර පත්වීමේ දින සිට අවුරුදු 03 ක් ඇතුළත පළමු වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් විය යුතුය. එසේ වුවත් 2017 ජනවාරි සිට මේ දක්වා කාර්යක්ෂමතා කඩඉම් විභාගය පවත්වා නොතිබුණි. මේ හේතුවෙන් 2016 – 2017 වර්ෂවල දී මණ්ඩලයේ සේවයට බැඳුණු සහකාර අධ්‍යක්ෂකවරු 12 දෙනෙකුට, සංවර්ධන නිලධාරීන් 11 දෙනෙකුට හා කළමනාකරණ සහකාරවරු 15 දෙනෙකුට නියමිත කාල වකවානුවල දී | බඳවාගැනීමේ පරිපාටිය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | කාර්යක්ෂමතා කඩඉම් විභාගය කඩිනමින් පැවැත්වීමට දිනයක් ලබා දෙන ලෙස ඉල්ලා ජාතික ශ්‍රම අධ්‍යන ආයතනය වෙත ඉල්ලීම් කර ඇත. | 2021 වර්ෂය අවසානය දක්වා කාර්යක්ෂමතා කඩඉම් විභාගය පවත්වා නොතිබුණි |

| | | | | |
|---|---|---|---|---|
| | කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් වීමට නොහැකි වී තිබුණි. | | | |
| (ච) | මණ්ඩලය විසින් පවත්වාගෙන ගිය කෙතට අරුණ රක්ෂණ ක්‍රමයට අදාළ ගොවීන් 8,185 කට 2016/2017 මහ කන්නය සඳහා හිමි වන්දි ගෙවීම සඳහා භාණ්ඩාගාරයෙන් ලද රු.70,800,200ක වන්දි මුදල්, ගිණුම් අංක, ගොවීන්ගේ නම් හා හැඳුනුම්පත් අංක නොගැලපීම හේතුවෙන් බැංකු මඟින් ආපසු එවා තිබූ අතර අදාළ ගොවීන් හඳුනාගෙන නිරවුල් කිරීමට තොරතුරු පද්ධතිය අක්‍රියව පැවති අතර අදාළ මුදල ආපසු භාණ්ඩාගාරයට යැවීමට කටයුතු නොකර වර්ෂ 4 ක් පුරා අත රදවාගෙන තිබුණි. | ගොවීන් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. | ගොවීන් විසින් හිමිකම් නොපෑ රු.70,800,200ක වන්දි මුදල් දිගින් දිගටම ගොවියන් විසින් හිමිකම් නොපෑම නිසා කෘෂි රක්ෂණ අරමුදල වෙත මාරු කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම. | 2021 වර්ෂය අවසානය දක්වාම අදාළ මුදල ආපසු භාණ්ඩාගාරයට යැවීමට කටයුතු කර නොතිබුණි. |
| (ඡ) | රක්ෂණ භාර අරමුදල සමඟ ඇතිකරගත් ප්‍රතිරක්ෂණ ගිවිසුම අනුව 2019 යල කන්නයට එක් ගොවියෙකු සඳහා වාර්තාගත විය හැකි මුළු වන්දි වටිනාකමෙන් මුල් රු.10,000 ගෙවීම සඳහා රක්ෂණ භාර අරමුදල වෙතින් තවදුරටත් ලබා ගතයුතු රු.මිලියන 312 ක හිඟ මුදල ලබා ගැනීම වෙනුවට, 2020 වර්ෂයේදී ගිවිසුම් අහෝසි කර රු.148,380,848ක් පමණක් ලබා ගැනීම නිසා මණ්ඩලයට | කාලපරිච්ඡේදයට අදාළ වන්දි මුදල් රක්ෂණභාර අරමුදලින් ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. | ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. | කාලපරිච්ඡේදයට අදාළ වන්දි මුදල් රක්ෂණභාර අරමුදලින් ලබාගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | රු.163,619,152ක අලාභයක් සිදුව තිබුණි. | | | |
| (ට) | ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයට අයත් "ගොවීන්ගේ මරණ පාරිතෝෂික අරමුදල" සඳහා වෙනම බැංකු ගිණුමක් පවත්වාගෙන නොයාම හේතුවෙන්, ශේෂය රු.1,077,622,157ක් වූ ගොවීන්ගේ මරණ පාරිතෝෂික අරමුදලින්, එම යෝජනා ක්‍රමයට ලබා දී ඇති ණය මුදල, එම යෝජනා ක්‍රමයෙන් දායකත්ව මුදල් ලෙස ලැබිය යුතු ප්‍රමාණය සහ අරමුදලින් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබූ වටිනාකම හා ඊට අදාළ පොලිය ද ඇතුළත් එකතුව රු.915,938,172ක් අඩු කළ පසු ඉතිරිවන රු.161,683,984ක ශේෂය, එම අරමුදලට කිසිදු ප්‍රතිලාභයක් නොගෙවා මණ්ඩලයේ වියදම් සඳහා සහ භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය සඳහා භාවිතා කර තිබූ බව නිරීක්ෂණය විය. | ගොවි විශ්‍රාම වැටුප් අරමුදලෙහි අවසාන වගකීම රජය දරන නිසා මෙවන් රක්ෂණ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය නැවත සමාලෝචනයට භාජනය කළ යුතු වීම. | ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. | අවශ්‍යතාවය නැවත සමාලෝචනය කර නොමැත. |

## 16. ජනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - තතත්ත්වාගණනය කළ මතය

2019 - තතත්ත්වාගණනය කළ මතය

2020 - තතත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | විශ්වවිද්‍යාල රෝහල සඳහා සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවෙන් ලබාදෙන ඖෂධ ලැබීම් සහ නිකුත් කිරීම් සම්බන්ධව විධිමත් අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපිත කර නොමැති බව නිරීක්ෂණය . | ඖෂධ මිල කර ගාස්තු අයකිරීමට හා පිරිවැය හඳුනා ගැනීමට හැකිවන පරිදි විධිමත් පාලන වාර්තා නඩත්තු කළ යුතුය. | මෙම සැපයුම් සම්බන්ධයෙන් වෛද්‍ය සැපයුම් කළමණාකරන තොරතුරු පරිගණක පද්ධතිය යම් සීමා කිරීම් සහිතව රෝහල තුළ ස්ථාපිතකර ඇත. එබැවින් අභ්‍යන්තර පාලනයේ යම් යම් දූර්වලතා හඳුනාගෙන ඇත. | විධිමත් පිරිවැය වාර්තා නඩත්තු කිරීමට 2021 වර්ෂය අවසානය දක්වාම කටයුතු කර නැත. |
| (ආ) | විශ්ව විද්‍යාලය සතු භෞතික හා මානව සම්පත් භාවිතා කරමින් විශ්ව විද්‍යාලය තුළ පවත්වාගෙන යනු ලබන සමාජ ශාලාව, බේකරිය, ජන අවන්හල සහ ආපනශාලාව යන ඒකක වල ආදායම වියදම හෝ ලාභය විශ්ව විද්‍යාලයේ ගිණුම් මගින් නිරූපනය නොකෙරුණි. | විශ්ව විද්‍යාලයට අයත් වත්කම් වලින් උපයනු ලබන ආදායම් විශ්ව විද්‍යාලයේ ආදායම් ලෙස සැලකිය යුතුය. අත්හරිනු ලබන ආදායම් සම්බන්ධව භාණ්ඩාගාර අනුමැතිය ලබාගත යුතුය. | මෙම ආදායම විශ්වවිද්‍යාලයේ ආදායමක් ලෙස හඳුනා නොගන්නා අතර එම ඒකක විශ්වවිද්‍යාලයේ සුභසාධනය සඳහා පවත්වාගෙන යනු ලබයි. එහෙත් මෙම ආදායමෙන් 20% ක කොටසක් ස්වයං මූල්‍ය අරමුදලට ලබා දීමට විගණන හා කළමනාකරණ කමිටුව නිර්දේශ කර ඇත. ඒ අනුව 2021 වසරේ ආදායමක් ලෙස ගිණුම් ගත කිරීමට කටයුතු කර ඇත. | මේ සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නැත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | විශ්ව විද්‍යාලයීය ශික්ෂණ රෝහල සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ රෙජිමේන්තු මධ්‍යස්ථාන වෛද්‍ය බලකාය ස්ථාපිත කර ඇති අක්කර 48 රූඩ් 02 පර්චස් 16.2 ක් වූ භූමිය පවරා ගැනීම සඳහා රු. මිලියන 5,054 ක ප්‍රතිපාදන සලසා වර්ෂ 04 කට අධික කාලයක් ගතවී ඇතත් අදාල ඉඩම අත්පත් කර ගැනීමේ ඉදිරි කාර්යයන් අවසන් කර නොතිබුණි. එහෙත් එහි ඉදිකර තිබූ රෝහල් ගොඩනැගිලි පිරිවැය රු. බිලියන 31.1ක් ද භූමි සංවර්ධන පිරිවැය රු. බිලියන 1.2ක් විය. | අමාත්‍යාංශය මගින් ඉඩම පවරා ගැනීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. | මෙම ඉඩම පවරා ගැනීමේ වගකීම පැවරී ඇත්තේ ආරක්ෂක අමාත්‍යශංය වෙතය. එම කටයුතු ආරක්ෂක අමාත්‍යාංශය විසින් සිදු කරමින් පවතී. විශ්ව විද්‍යාලය විසින් අදාල තොරතුරු ආරක්ෂක අමාත්‍යාංශය වෙත ලබා දී ඇත. | ලංකා ගමනාගමන මණ්ඩලය වෙත වන්දි මුදල් ගෙවා ඇත්ද යන්න තහවුරු කර ගැනීම සඳහා 2020 10. 16 දින ජාතික අයවැය දෙපාර්තමේන්තුව විමසා ඇතත් පවරා ගැනීම් කටයුතු 2022 පෙබරවාරි 28 දින දක්වා නිමකර නොතිබුණි. |
| (ඈ) | ශික්ෂණ රෝහල ඉදිකිරීම හා උපකරණ මිලදීගැනීම සඳහා ලබාගත් ණය මුදලේ අවසන් වාරිකය 2017 ජනවාරි 10 දින ලැබී තිබූ අතර ඉන් එක්සත් ජනපද ඩොලර් මිලියන 26.23 ක් සමාලෝචිත කාල පරිච්ඡේදය අවසන්වන විටත් නිශ්චිත කාර්යය සඳහා උපයෝජනය නොකර ස්ථාවර හා ඉතුරුම් තැන්පතුවල රඳවාගෙන තිබුණි . උපයෝජනය නොකල ණය මුදලේ වාර්ෂික පොලී ගෙවීම සඳහා එක්සත් ජනපද ඩොලර් මිලියන 2.23 කට (රු. මිලියන 410.498) ආසන්න අතිරික්ත පොලී මුදලක් භාණ්ඩාගාරයට දැරීමට සිදුව තිබුණි. | විධිමත් ණය කළමනාකරණ ක්‍රමවේදයන්ට අනුව කටයුතු කර ණය ගැනුම් පිරිවැය අවමකර ගැනීමට කටයුතු කල යුතුය | ප්‍රමාණවත් පරිදි වෛද්‍ය කාර්ය මණ්ඩලය නොසිටීම හේතුවෙන් වෛද්‍ය උපකරණ මිලදී ගැනීම ප්‍රමාද වී ඇති අතර ඉදිරියේ දී එම උපකරණ මිලදී ගැනීම සඳහා මෙම මුදල් වෙන් කර ඇත. | 2021 වර්ෂයේදීද මේ සම්බන්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | අනුමත කාර්ය මණ්ඩලයට අතිරේකව ත්‍රිවිධ හමුදා නිළධාරීන් 103 ක් හා සෙසු නිළයන් 864 සේවයේ යොදවා ඇතත් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා නිර්දේශ මත කටයුතු කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ උපදේශ කඩිනමින් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය. | මෙම විශ්වවිද්‍යාලය වෙත ගැලපෙන අයුරින් නව ත්‍රිවිධ හමුදා තනතුරු ලේඛණයක් සැකසීමේ ඉදිරි කටයුතු සිදුකරමින් පවතින අතර කළමණාකරන සේවා දෙපාර්තමේන්තු අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වේ. | මෙම විශ්වවිද්‍යාලීය නව සංස්ථාව අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇති අතර, ඒ සඳහා මෙතෙක් අනුමැතිය ලැබී නැත. විශ්වවිද්‍යාලය වෙත රාජකාරි සඳහා අනුයුක්ත කරන ලද සෙසුනිලයන්ට අයත් 52ක් මුදාහැර ඇත. |
| (ඊ) | විදේශීය සිසුන් බඳවාගැනීමට අදාල ගිවිසුම් ප්‍රකාරව එම සිසුන් ආහාර හා නවාතැන් පහසුකම් සඳහා වන ගෙවීම් සෑම මාසයක් අවසානයේදීම සිදු කළ යුතු වුවද 2014 - 2019 වර්ෂය දක්වා කාලයට අදාලව එක්සත් ජනපද ඩොලර් 7,633.39 මුදලක් තවදුරටත් අයවිය යුතුව පැවතුණි. | ගිවිසුම් ප්‍රකාරව නියමිත කාලය තුළඅයකර ගැනීමට කටයුතුකළ යුතුවේ. | ඉදිරියේදී අදාල වටිනාකම් අය කර ගැනීමට ක්‍රියා කරනු ලැබේ. | මෙම වටිනාකම අය කර ගැනීම සඳහා මණ්ඩලයක් පත් කර ඇතත් හිඟ ශේෂය වූ එක්සත් ජනපද ඩොලර් 7,633.39 ක මුදල අයකරගෙන නැත. |
| (උ) | ගිවිසුම් ප්‍රකාරව කටයුතු නොකල ඖෂධවේදී උපාධි අපේක්ෂකයන්ගේ 20 ක ගේ බැඳුම්කර වටිනාකම මිලියන 21.50 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ගිවිසුම් ප්‍රකාරව අදාල පුද්ගලයන් දැනුවත් කරමින් අය කර ගැනීම් සිදු කිරීමට ක්‍රියා කිරීම සහ ප්‍රතිචාර නොදක්වන අය සම්බන්ධව සුදුසු නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය. | අදාල සිසුන්ට නිතීමය පියවරයන්හි මූලික අදියර වශයෙන් ශිෂ්‍යයින්ට හා ඔවුන්ගේ ඇපකරුවන්ට අදාල බැඳුම්කර ගෙවීමට දැනුම් දීමේ ලිපි යැවීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතියි. | එම ශිෂ්‍යයන්ට එරෙහිව නීතිපති දෙපාර්තමේන්තුව හරහා නඩු පැවරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. |
| (ඌ) | වෛද්‍ය පීඨය, නීති පීඨය, සහ පරිගණක පීඨය යන පීඨයන්හි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ විධිවිධාන පරිදි එක් ආචාර්යවරයෙකු සඳහා | පාඨමාලාවල ගුණාත්මකභාවයන් ඉහල මට්ටමක පවත්වාගත හැකිවන පරිදි ප්‍රමාණවත් ගුරු සිසු | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. | වෛද්‍ය හා පරිගණක පීඨ සඳහා කාර්යය මණ්ඩල අවශ්‍යතාවයෙන් කොටසක් සඳහා |

| | | | | |
|---|---|---|---|---|
| | සිටිය යුතු ශිෂ්‍ය ප්‍රමාණය ඉක්මවූ සිසුන් සංඛ්‍යාවන් පැවතිනි. | අනුපාතයන් පවත්වා ගෙන යාමට ක්‍රියා කළ යුතුය. | | පමණක් 2021.01.12 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී ඇත. |
| (ඔ) | විශ්වවිද්‍යාල වෛද්‍ය පීඨ ගොඩනැගිල්ල ඉදිකිරීම් කටයුතු පිළිවෙලින් 2014 වර්ෂයේදී ආරම්භ කර තිබුණ ද 2020 වර්ෂය අවසානය දක්වාම ඉදිකිරීම් නිම කිරීමට අපොහොසත් වී තිබුණි. | ව්‍යාපෘති සැලසුම් කළ දිනට නිම කරවීමට කළමණාකරණය අවධානය යොමු කළ යුතුය. | 2020 වර්ෂයේදී ස්වයං මූල්‍ය අරමුදල යටතේ වැඩ ආරම්භ කර ඇත. | මෙම ඉදිකිරීම්වල 2021 වර්ෂය අවසානයට තිබුණු භෞතික ප්‍රගතිය 60% ක් පමණක් විය. |
| (ඕ) | 1988 අංක 27 දරන ශ්‍රීමත් ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක අභ්‍යාස ආයතනය (සංශෝධන) පනත අනුව වෛද්‍ය පීඨය සඳහා මුදල් පදනම මත දේශීය ශිෂ්‍යයින් බඳවා ගැනීමට හෝ උපාධි ප්‍රදානය කිරීමට අවසරයක් නොමැති වුවත් වෛද්‍ය පීඨය විසින් විදේශීය පුරවැසිභාවය මත ද්විත්ව පුරවැසිභාවය සහිත ශ්‍රී ලාංකික ශිෂ්‍යයින් 64 දෙනෙකු බඳවාගෙන තිබුණි. | මේ සම්බන්ධයෙන් පැහැදිලි කිරීම් ලබා ගැනීමෙන් අනතුරුව වෛද්‍ය පීඨය සඳහා බඳවා ගැනීම් ක්‍රමවේදය නිවැරදි කිරීමට පියවර ගත යුතුය. | විදේශීය සුදුසුකම් මත බඳවා ගත් සිසුන් බව දක්වා ඇත. | වෛද්‍ය පීඨය වෙත මුදල් ගෙවීමේ පදනම මත විදේශීය සිසුන් බඳවා ගැනීම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙතින් නිකුත්කර ඇති මාර්ගෝපදේශය භාවිත කර සිදු කරන අතර ඒ අනුව නිරීක්ෂණය මඟින් දක්වා ඇති සිසුන්ද එම විදේශීය සුදුසුකම් මත බඳවාගෙන ඇත. |

## 17. ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලා මණ්ඩලය

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 - වියාචනය කළ මතය

2019 - වියාචනය කළ මතය

2020 - තතත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | මහාරෝග්‍යශාලා මණ්ඩලය පිහිටි එම මණ්ඩලය සතු ඉඩමට අදාළ ඔප්පුව ප්‍රකාරව, සර්වෙයර් ජනරාල් (Surveyor General) විසින් 1981 දී හා 1983 දී සහතික කර තිබුණු පිඹුරුපත් 03 ක් යටතේ පවතින ඉඩම් කොටස්හි හෙක්ටයාර් 10.0229 ක මුළු භූමි ප්‍රමාණයක් පවතින බව නිරීක්ෂණය විය. ඉන් එක් පිඹුරුපතක ඇතුළත් හෙක්ටයාර් 9.9469ක භූමි ප්‍රමාණය සර්වෙයර් ජනරාල් වෙතින් 2015 වර්ෂයේදී නැවත මිනුම් කරවා ගෙන තිබුණි. එදින වන විට මණ්ඩලයේ පරිහරණය සඳහා පැවති භූමි ප්‍රමාණය හෙක්ටයාර් 9.8047ක් පමණක් බවත්, ස්ථාන 09 කට අදාළව හෙක්ටයාර් 0.1422 ක භූමි ප්‍රමාණයක් අනවසර පදිංචිකරුවන් විසින් පරිහරණය කරන බවත් සර්වෙයර් ජනරාල් විසින් හඳුනාගෙන වාර්තා කර තිබුණද, ඒ සම්බන්ධයෙන් සුදුසු නෛතික ක්‍රියාමාර්ග | නීතිපති උපදෙස් ප්‍රකාරව කටයුතු කරමින් මහාරෝග්‍යශාලා මණ්ඩලය පිහිටි එම මණ්ඩලය සතු ඉඩම නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. | මේ සම්බන්ධයෙන් ලබාගත් නීතිපති උපදෙස් ප්‍රකාරව, පිඹුර පිළියෙල කිරීමේදී කොටසක් මඟහැරී ඇත්නම් ඒ මන්ද යන්න පිළිබඳව කොළඹ දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිවරයාගෙන් විමසා අවශ්‍ය නම් ඒ වරද නිවැරදි කිරීම සඳහා නැවත මිනුම් කිරීමටත්, අනවසරයෙන් අල්ලාගෙන ඇති ඉඩම් කොටස් ලෙස හඳුනාගෙන ඇති හෙ.0.1422 සඳහා 1979 අංක 7 දරන රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබාගැනීමේ) පනත යටතේ ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමටත් කටයුතු කරන බව. | 2022 ජනවාරි 31 දින වනවිටත් ඉඩම නිරවුල් කර ගැනීමට අපොහොසත්වී තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | ගැනීමට 2015 වර්ෂයේ සිට කටයුතු කර නොතිබුණි. | | | |
| (ආ) | 2019 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂයේ රෝහල් ගාස්තු ආදායම ලෙස රු.මිලියන 2,766ක් හඳුනාගෙන තිබුණද එම රෝහල් ගාස්තු ගණනය කිරීමට අදාළ පිරිවැය හඳුනා ගැනීම, ලාභ ප්‍රතිශතය තීරණය කිරීම, ගාස්තු නිදහස් කිරීම, ගාස්තු සංශෝධනය කිරීමේ අධිකාරී බල මට්ටම් තීරණය කිරීම හා ආදායම ගිණුම්ගත කිරීමට යොදා ගන්නා පරිගණක පද්ධතියේ තිබිය යුතු ආරක්ෂණ විධිවිධාන ඇතුළත් කර සර්ව සම්පූර්ණ ආදායම් එකතු කිරීමේ ප්‍රතිපත්තියක් සකස් කිරීමට රෝහල් මණ්ඩලය ක්‍රියා කර නොතිබුණි. මේ හේතුවෙන් රෝහල් ගාස්තු ගිණුමට 2019 වර්ෂයේදී මෙන්ම 2018 වර්ෂයේදී විවිධ ගැලපීම් අධිකාරී බලයකින් තොරව සිදුකර තිබුණද මේ පිළිබඳව මණ්ඩලයේ අවධානය යොමුකර නොතිබුණි. | විවිධ පරීක්ෂණ, ශල්‍යකර්ම හා රෝගීන් සඳහා රෝහල විසින් සපයනු ලබන වෙනත් සේවාවන් සම්බන්ධ ගාස්තු තීරණය කිරීම සඳහා මිල කමිටුවක් පත්කළ යුතුය. මිල කමිටුව විසින් ගාස්තු තීරණය කිරීම හා සංශෝධනය කිරීම සිදුකළ යුතු අතර ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගත යුතුය.මුළු පිරිවැය ආවරණය වන පරිදි මිල තීරණය කිරීමේ ප්‍රතිපත්තියක් හඳුනාගෙන එය ක්‍රියාත්මක කළ යුතුය. මිල සැකසෙන පදනම පරිගණක මෘදුකාංග පද්ධතියට ඇතුළත් කිරීමටද කටයුතු කළ යුතුය. | නිවැරදි වශයෙන් ක්‍රියාත්මක ස්ථිර මිල ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක නොවන බව, මුළු පිරිවැය පදනම් කොට ගෙන, වඩාත් නිවැරදි වූ මිල ප්‍රතිපත්තියක් ස්ථාපිත කිරීම සඳහා ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය උපදෙස් දී ඇති බව හා පොදු කාර්ය වැනි වක්‍ර වියදම් මිල කිරීමේදී හඳුනා ගැනීමට ඇති ප්‍රායෝගික දුෂ්කරතා නිසා මෙම මිල ප්‍රතිපත්තිය හඳුන්වාදීම ප්‍රමාදවී ඇති බව. | 2022 ජනවාරි 31 දින වන විටත් ස්ථිර මිල ප්‍රතිපත්තියක් හඳුන්වාදීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | විශේෂඥ වෛද්‍යවරුන් සිය රාජකාරී වේලාවෙන් පසු සිදුකරනු ලබන ශල්‍යකර්ම හා පරීක්ෂණ සඳහා මහාරෝග්‍යශාලා මණ්ඩලය විසින් මාසිකව රු.581,418 ක් පමණ පොදුකාර්ය පිරිවැය ලෙස වැය කරන බව | වෘත්තීය ගාස්තුවලින් රෝහල් සේවා ගාස්තු ලෙස අයකරන ප්‍රතිශතය නැවත සමාලෝචනය කරඒ සඳහා විධිමත් අනුමැතියක් ලබාගැනීමට කටයුතු කළ යුතුය. | සාමාන්‍ය වාට්ටුවල රෝගීන්ගෙන් අයකරන ලාභ ප්‍රතිශතය සියයට ක් 10 වන නමුත් ගෙවන වාට්ටුවල රෝගීන්ගෙන් තිශතය අයකරන ලාභ ප්‍ර ක් වන 30 සියයට බැවින් රෝහල් ගාස්තු, ඖෂධ හා | 2022 ජනවාරි 31 දින වන විටත් වෘත්තීය ගාස්තු වෙනුවෙන් අයකරනු ලබන සේවා ගාස්තු සමාලෝචනය කර අවශ්‍ය අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | හඳුනාගෙන තිබුණි. නමුත් එම ශල්‍යකර්ම හා පරීක්ෂණ සඳහා අය කරනු ලබන වෘත්තීය ගාස්තුවලින් සියයට 0.15ක සේවා ගාස්තුවක් පමණක් අයකිරීමේ ක්‍රමවේදය මත සමාලෝචිත වර්ෂය තුළදී ගෙවා තිබුණු මුළු වෘත්තීය ගාස්තු රු.මිලියන 363.17 කින් අයකර තිබුණු මුළු සේවා ගාස්තුව රු.546,035 ක් පමණක් විය. සේවා ගාස්තුව වැඩි කිරීම සම්බන්ධයෙන් 2019 සැප්තැම්බර් 25 දින අධ්‍යක්ෂ මණ්ඩලයට යෝජනා ඉදිරිපත්කර තිබුණද සත්‍ය වශයෙන් වැයකරන පිරිවැයට සාපේක්ෂව අය කරන සේවා ගාස්තුව වැඩිකර ගැනීමට මෙතෙක් අපොහොසත්වී තිබුණි. | | පාරිභෝජන ද්‍රව්‍ය ශල්‍යකර්ම ගාස්තු , පරීක්ෂණ ගාස්තු යනාදිය වෙනුවෙන් රෝහලට ඉහල ,ආදායමක් ලැබෙන බව වෘත්තීය ගාස්තුවලින් සියයට0.15 ක ගාස්තුවක් අයකරනු ලබන්නේ ඊට අමතර වශයෙන් බව හා මෙම ගාස්තුව, වෘත්තීය ගාස්තු සම්බන්ධ පරිපාලන ගාස්තුවක් පමණක් බව. | |
| (ඇ) | මණ්ඩලය සඳහා විද්‍යුත් ලිපි ලේඛන කළමනාකරණ පද්ධතියක් (Electronic Document Management System) සැපයීම, ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීමේ කොන්ත්‍රාත්තුව, මණ්ඩලයේ අධ්‍යක්ෂවරයාගේ භාර්යාව අධ්‍යක්ෂවරියකව සිටි සමාගමක් වෙත 2015 නොවැම්බර් 26 දින ප්‍රදානය කර තිබුණු අතර 2016 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලය තුළදී රු.මිලියන 21.56 ක් වැය කර තිබුණි. නිසි | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශයන්ට පටහැනිව හා ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටියේ විනිවිදභාවය ආරක්ෂා නොවන ලෙස කටයුතු කරමින් සැපයුම්කරු තෝරා ගැනීම සම්බන්ධයෙන් විධිමත් ස්වාධීන පරීක්ෂණයක් සිදුකළ යුතුය. සම්බන්ධිත පාර්ශවයන් සමඟ පවතින ගනුදෙනු | මේ සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් විමර්ශනයක් පවත්වන බව , එම වාර්තාව ලද පසු ඉදිරි ,යාමාර්ග ගන්නා බවක්‍රි දින සිට 01 දෙසැම්බර් 2021 රෝහල් පරිගණක වැඩසටහන යාවත්කාලීන කිරීම ආරම්භකර ඇති බව හා ස්කෑන් කරන ලද ගීන්ගේ ඇඳඉහපත්හි රෝ තොරතුරුද ඒ සඳහා භාවිතයට ගතහැකි අයුරින් පවතින බැවින් ඇඳඉහපත් ස්කෑන් කිරීම සඳහා | 2022 ජනවාරි 31 දින වන විටත් මේ සම්බන්ධයෙන් ස්වාධීන පරීක්ෂණයක් පවත්වා සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර නොතිබුණු අතර, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශයන්ට පටහැනිව හා ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටියේ විනිවිදභාවය ආරක්ෂා නොවන ලෙස කටයුතු කරමින් සැපයුම්කරු තෝරා ගෙන තිබුණි. මණ්ඩලයේ සභාපති විසින් පත්කළ යුතු තාක්ෂණික ඇගයීම් කමිටුව මණ්ඩලයේ අධ්‍යක්ෂවරයා විසින් පත්කර තිබුණු අතර ප්‍රසම්පාදන අරමුණු සාක්ෂාත් කරගැනීමට අවශ්‍ය ආකාරයට පිරිවිතර පිළියෙලකර නොතිබුණි. සැපයුම්කරු සතු විය යුතු සුදුසුකම් හා යෝග්‍යතා පිළිබඳ ඇගයීම සහ තාක්ෂණික ඇගයීම නිසි ලෙස සිදුකර නොතිබුණු අතර ව්‍යාජ ලිපිනයන් හා දුරකථන අංකයන් සහිත ලංසුවක් බව හඳුනාගැනීමටවත් තාක්ෂණික ඇගයීම් කමිටුව අපොහොසත්වී තිබුණි. එසේම 2020 දෙසැම්බර් 31 දින වන විටත් අදාළ අරමුණ ඉටුකර ගැනීම වෙනුවෙන් මෙම පරිගණක පද්ධතිය භාවිතකර නොතිබුණි. | පිළිබඳව ඉදිරි මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. එසේම මෙම පරිගණක පද්ධතිය ස්ථාපිත කරන ලද අරමුණ වෙනුවෙන් එය යොදා ගැනීමට කඩිනමින් ක්‍රියා කළ යුතුය. | වැයකරන ලද රු.මිලියන 21.5නිශ්කාර්ය වියදමක් 6 .නොවන බව | |
| (ඉ) | සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් යොමු කරනු ලබන රෝගීන්ට 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේදී සිදු කර | සෞඛ්‍ය අමාත්‍යාංශය හරහා වෙනත් රජයේ රෝහල්වලින් මෙම රෝහල වෙත එවනු | සිට හෘද වර්ෂයේ 2011 සැත්කම් වෙනුවෙන් ශය වෙතින් අමාත්‍යාං තිපූර්ණය කර ගත යුතු ප්‍ර | 2022 ජනවාරි 31 දින වන විටත් මේ සම්බන්ධයෙන් විධිමත් ක්‍රමවේදයක් පිළියෙල |

| | | | | |
|---|---|---|---|---|
| | තිබුණු හෘද සැත්කම් වෙනුවෙන් අමාත්‍යාංශය වෙතින් ප්‍රතිපූරණය කරගත යුතු මුදල රු.මිලියන 94.381ක් විය. නමුත් රෝගීන්ගේ ශල්‍යකර්ම, රසායනාගාර පරීක්ෂණ හා නේවාසික කාලසීමාව තීරණය කිරීමත්, සිදුකළ යුතු වෙනත් පරීක්ෂණ සඳහා ගාස්තු අය කළ යුතු ආකාරය සම්බන්ධයෙනුත්, දෙපාර්ශවයේම අවධානය යොමු කර නොතිබුණු අතර කිසිදු පූර්ව එකඟතාවයකින් තොරව සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් යොමුකර තිබුණු රෝගීන්ගේ ශල්‍යකර්ම සිදුකර තිබුණි. | ලබන හෘද රෝගීන්ගේ සැත්කම් සිදුකරන ආකාරය හා අයකර ගත යුතු මුදල් සෞඛ්‍ය අමාත්‍යාංශය වෙතින් ප්‍රතිපූරණය කරගන්නා ආකාරය පිළිබඳ සෞඛ්‍ය අමාත්‍යාංශයේද එකඟතාවයකින් යුතුව නිශ්චිත ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතුය. | මුදල පිළිබඳව දෙපාර්ශවයම සැසඳීම් කිරීමෙන් අනතුරුව එකඟතාවයන්ට මේ වන විට එළඹී ඇති බව හා සෞඛ්‍ය අමාත්‍යංශ විගණන කමිටුවේදී සාකච්ඡා වූ පරිදි මේ සඳහා අමාත්‍යංශයට වෙනම වැය ශීර්ෂයක් ලබා ගෙන අදාළ ප්‍රතිපූර්ණය කිරීම් වඩාත් විධිමත්ව සිදුකිරීමට අපේක්ෂා කරන බව. | කර නොතිබුණි. |
| (ඊ) | මහාරෝගාශාලා මණ්ඩලයේ ගිණුම්වලට අනුව, මහාරෝගාශාලා මණ්ඩලය විසින් වෛද්‍ය සැපයුම් අංශය වෙතින් මිලදී ගෙන තිබුණු ඖෂධ හා වෙනත් ශල්‍ය ද්‍රව්‍ය වෙනුවෙන් 2020 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු මුදල රු.මිලියන 472.52ක් වුවද, වෛද්‍ය සැපයුම් අංශය විසින් විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව එදිනට එම ශේෂය රු.මිලියන 631.89ක් විය. ඒ අනුව වූ රු.මිලියන 159.37ක වෙනසට හේතු හඳුනාගෙන අදාල ගැලපීම් සිදුකිරීමට කටයුතු කර නොතිබුණි. | වෛද්‍ය සැපයීම් අංශය වෙතින් මිලදී ගනු ලබන ඖෂධ හා අනෙකුත්ශල්‍යද්‍රව්‍ය සඳහා ගෙවිය යුතු මුදල මහාරෝගාශාලා මණ්ඩලයේ ගිණුම් සමඟ සැසඳීමේ ප්‍රකාශයක් පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. | වෛද්‍ය සැපයුම් අංශයෙන් ලබාගන්නා වකුගඩු රෝගීන් සඳහා පමණක් නිකුත් කරන ඖෂධ මුදල් අයකිරීමකින් තොරව රෝහල වෙත ලබාදීමට අනුමැතිය හිමිවී ඇති බැවින් එම ඖෂධවල වටිනාකම සඳහන් නොකර පරිගණක පද්ධතියට ඇතුළත් කරන බව ඒ අනුව මූල්‍ය , කාශනවල සඳහන් අගය ප්‍ර සැපයුම් වෛද්‍ය ,නිවැරදිබව අංශයෙන් අන්තරායකර ඖෂධ මිලදී ගැනීමේදී ඒ අදාළ ගෙවීම් සඳහා සිදුකිරීමෙන් පසුව පමණක් එම ඖෂධ ලබාදීම සිදුකරනු | 2022 ජනවාරි 31 දින වන විටත් සැසඳුම් ප්‍රකාශයක් පිළියෙල කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | | | ලබන බව හා වෛද්‍ය සැපයීම් අංශයේ ඇති වටිනාකම අපගේ මූල්‍ය කාශනවල ඇති වටිනාකම ප්‍ර සමඟ ගැලපීම උචිත නොවන බව. | |
| (උ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශවලින් බැහැරව හා ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටියේ විනිවිදභාවය තහවුරු නොවන ලෙස තෝරාගෙන තිබුණු සැපයුම්කරුවෙකු වෙතින්, වෙළඳපල මිල සැඳැහුම් ක්‍රමයට භාණ්ඩ මිලදී ගැනීම සඳහා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවක් සතු රු.මිලියන 10 ක් වූ මූල්‍ය සීමාව ඉක්මවමින් 2018 මාර්තු 27 දින රු.16,642,700කට Diagnostic, Surgery and Treatment Nose and Nasal Telescope $0^0$ & $30^0$උපකරණ 05ක් හා අමතර උපාංග මිලදීගෙන තිබුණි. අමතර උපාංග සඳහා ලංසු කැඳවා නොතිබුණු නමුත් රු.13,892,700ක් වූ අමතර උපාංග මිලදීගෙන තිබුණි. තාක්ෂණික පිරිවිතර පිළිබඳ සාමාන්‍ය කොන්දේසි ප්‍රකාරව, ලබාගත යුතු වර්ෂ 2 ක වගකීම් කාලය වෙනුවට වර්ෂයක වගකීම් කාලයක් පමණක් ලබාගෙන තිබුණි. තාක්ෂණික පිරිවිතරයන්හි අනිවාර්ය | ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලින් බැහැරව හා ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටියේ විනිවිදභාවය තහවුරු නොවන ලෙස කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගැනීම හා අනෙකුත් කරුණු සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදුකළ යුතුය. තාක්ෂණික පිරිවිතර පිළිබඳ සාමාන්‍ය කොන්දේසි ප්‍රකාරව, ලබාගත යුතු වර්ෂ 2 ක වගකීම් කාලය ලබා ගැනීමට හෝ ඒ පිළිබඳව නොසලකා මුදල් ගෙවූ වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කළ යුතුය. | වැලැක්වීමේ පියවර ගෙන නොතිබුණි . | 2022 ජනවාරි 31 දින වන විටත් විධිමත් පරීක්ෂණයක් පවත්වා නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | අංගයක් ලෙස දක්වා තිබුණු උපාංගයක් සඳහා මිල ගණන් ඉදිරිපත්කර නැති ලංසුකරු ඇගයීමෙන් ඉවත්කළ යුතු වුවද එසේ ඉවත් නොකර එම ලංසුකරුට කොන්ත්‍රාත්තුව ප්‍රදානයකර තිබුණි. | | | |
| (උ) | කොන්ත්‍රාත්තුව පිරිනැමීමට පෙර අදාළ කොන්ත්‍රාත්කරුගේ පසුගිය වර්ෂ 5 ක මූල්‍ය තත්ත්වය පරීක්ෂාවට භාජනය නොකර, වැඩහළක් හා කාර්යාලයක් ඉදිකිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව රු.87,019,408කට 2016 නොවැම්බර් 09 දින ප්‍රදානයකර තිබුණි. ගිවිසුම ප්‍රකාරව කොන්ත්‍රාත්තුව නිමකළ යුතු දිනය 2018 දෙසැම්බර් 31 දින වන විට මාස 08 කින් ඉකුත්වී තිබුණි. ඒ වන විට කළ වැඩ වටිනාකම කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 26 ක් පමණක් විය. වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් රු.16,675,082ක් ගෙවා තිබුණු අතර 2018 අප්‍රේල් 17 දින වන විට ඉන් රු.5,219,979 ක් පමණක් අයකර තිබුණි. කොන්ත්‍රාත් කොන්දේසි ප්‍රකාරව රු.4,350,969ක ප්‍රමාද ගාස්තු අයකර නොතිබුණි. ඉදිකිරීම් නිම නොකිරීම හේතුවෙන් 2018 වර්ෂයේදී රු.3,015,000 ක් වැයකර කුලියට ලබාගත් | කොන්ත්‍රාත්කරු ලවා කොන්ත්‍රාත්තුව කඩිනමින් අවසන් කරවාගැනීමට පියවර ගත යුතුය. ඉතිරි ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. කොන්ත්‍රාත්තුව පිරිනැමීමට පෙර අදාළ කොන්ත්‍රාත්කරුගේ පසුගිය වර්ෂ 5 ක මූල්‍ය තත්ත්වය පරීක්ෂාවට භාජනය නොකර කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට වගකිව යුතු නිලධාරීන්ගෙන් අතිරේක පිරිවැය අයිභාර කළ යුතුය. | අයකළ යුතු ප්‍රමාද ගාස්තුව රු.4,350,969කින් රු.මිලියන 1 ක් අයකර ගත් බව හා ඉතිරි මුදල් ඉදිරි ගෙවීම්වලදී කපා ගැනීමට කටයුතු කරන බව. | 2022 ජනවාරි 31 දින වන විටත් කොන්ත්‍රාත්තුව අවසන් කරවා ගැනීමට අපොහොසත්වී තිබුණු අතර විධිමත් පරීක්ෂණයක් පවත්වාද නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | Containers 14 ක් තුළ අදාළ වැඩහළ හා කාර්යාලය පවත්වා ගෙන ගොස් තිබුණි. | | | |
| (එ) | 2019 ජූලි 23 දින රු.මිලියන 9.183 ක් වැය කර හෘද උරස් ශල්‍යාගාරය සඳහා Operating Theatre Table එකක් පිළිගත හැකි සාධාරණ හේතුවකින් තොරව වැඩිම ලංසුව ඉදිරිපත් කර තිබුණු ලංසුකරුගෙන් මිලදී ගැනීම නිසා රු.මිලියන 2.31 ක අතිරේක පිරිවැයක් දැරීමට සිදුවී තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව පිරිවිතර හා අනෙකුත් අවශ්‍යතා සඳහා සාරානුකූලව ප්‍රතිචාර දක්වන අවම මිල සහිත ලංසුව තෝරා ගැනීම කළ යුතුය. ඒ අනුව ලංසු ඇගයීම සිදු නොකර රෝහලට රු.2,310,609ක අතිරේක පිරිවැයක් දැරීමට සිදු කිරීම සම්බන්ධයෙන් තාක්ෂණික ඇගයීම් කමිටුව හා ප්‍රසම්පාදන කමිටුව වගකිව යුතු අතර විධිමත් පරීක්ෂණයක් පවත්වා ඉදිරි පියවර ගතයුතුය. | අවසාන භාවිත කරන්නන්ගේ නිර්දේශ සැලකිල්ලට නොගෙන අවම ලංසුව පමණක් සැලකිල්ලට ගෙන අවශ්‍යතාවයට නොගැලපෙන මිලදී ගැනීම මත ඊට වඩා අලාභයක් සිදු විය හැකි බව හා තාක්ෂණික ඇගයීම් කමිටුව වැඩි අවධානයක් යොමුකර ඇත්තේ අවසාන පරිභෝජනය කරන්නන්ගේ නිර්දේශය සඳහා බව. | 2022 ජනවාරි 31 දින වන විටත් විධිමත් පරීක්ෂණයක් පවත්වා සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ඒ) | ටෙන්ඩර් කොන්දේසිවලට අනුව නැවත මිල වැඩි කිරීම් සඳහා අනුමැතිය ලබාදිය නොහැකි වුවද, ඒ බව නොසලකා SUCOD 160 Disposable Examination Gloves (Small) Lalan ඒකක 570,000 ක් හා SUCOD 159 Disposable Examination Gloves (Medium) Lalan ඒකක 730,000 ක් එකක් රු.6 | ටෙන්ඩර් කොන්දේසිවලට පටහැනිව කටයුතු කළ නිලධාරීන්ගෙන් වැඩිපුර ගෙවූ මුදල අයකළ යුතුය. | ටෙන්ඩර් කොන්දේසිවල මිල වැඩිවීමක් අනුමත නොකරන බව දක්වා තිබුණු නමුත් ,COVID -19 වසංගතය හේතුවෙන් Disposable Examination Gloves සඳහා වූ අවශ්‍යතාවය කිහිප ගුණයකින් ඉහළ ගිය බැවින් රෝගී සේවාව පවත්වාගෙන යාම සඳහා ලංකාව තුළ සිටි | 2022 ජනවාරි 31 දින වන විටත් වැඩිපුර ගෙවූ මුදල අයකර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | ක් වැඩියෙන් එනම් රු.11 කට මිලටගැනීම නිසා රු.මිලියන 3.78 ක් වැඩිපුර ගෙවා තිබුණි. | | එකම සැපයුම්කරුගේ ඉල්ලීම සලකා බැලීමට සිදුවූ බව හා මෙම මිල වැඩි කිරීම ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කර ඇති බව. | |
| (ඔ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7හි 65 ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන්, පිරිවැය රු.මිලියන 2,901.52 ක්වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු නමුත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. එසේ වුවත් මෙකී වත්කම් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණු අතර එම වත්කම්වල ඵලදායී ජීව කාලය පිළිබඳ වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | සම්පූර්ණයෙන් ක්ෂය කර ඇති නමුත් දැනටමත් භාවිතා කරනු ලබන වත්කම් සම්බන්ධව ප්‍රමිතිවල සඳහන් නියමයන්ට අනුව කටයුතු කළ යුතුය. | මෙම සියලුම ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කරන බව . | 2022 ජනවාරි 31 දින වන විටත් ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. |
| (ඕ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 2.1 හා 2.2සිට 2.6 දක්වා වූ ඡේද ප්‍රකාරව, කාර්ය මණ්ඩලයේ සෑම සේවයකම හා සෑම ශ්‍රේණියකම තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම්, තනතුරෙහි | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ දක්වා ඇති විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | මේ වන විට පිළියෙල කර අවසන් බඳවා ගැනීමේ පටිපාටිය රේඛීය අමාත්‍යාංශය හරහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත්කර අවශ්‍ය අනුමැතිය ලබාගැනීමට නියමිත බව. | 2022 ජනවාරි 31 දින වන විටත් බඳවා ගැනීමේ පරිපාටිය පිළියෙල කර කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියට යොමුකර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | වැටුප් පරිමාණය, වයස් සීමාව සහ අදාළ අනෙකුත් විස්තර ඇතුළත්කර බඳවා ගැනීමේ පටිපාටි පිළියෙල කර ආයතන සංග්‍රහයේ දක්වා ඇති ක්‍රියා පිළිවෙල අනුගමනය කරමින් එකී පටිපාටි සඳහා අදාළ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළයුතු වුවද, 2020 දෙසැම්බර් 31 දින වන විටත් බඳවා ගැනීම් පටිපාටි පිළියෙල කර අනුමැතිය ලබාගෙන නොතිබුණි. | | | |
| (ක) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව අනුමත තනතුරු සංඛ්‍යාව ඉක්මවා තනතුරු 03ක් සඳහා නිලධාරීන් 251 දෙනෙකු බඳවා ගෙන තිබුණි. එසේම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව, මණ්ඩලයේ අනුමත කාර්ය මණ්ඩලය තුළ නොවූ තනතුරු 05ක් සඳහා නිලධාරීන් 10 දෙනෙකු පත්කර තිබුණි. | මෙම බඳවාගැනීම් සම්බන්ධයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත මෙම බඳවා ගැනීම් සිදුකළ බව හා ඉදිරියේදී යෝජිත බඳවා ගැනීමේ පරිපාටිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගන්නා බව. | 2022 ජනවාරි 31 දින වන විටත් කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ග) | 2014 ඔක්තෝබර් 11 දින රජයේ ගැසට් පත්‍රයේ සඳහන් ශ්‍රී ලංකා සෞඛ්‍ය සේවයේ වෛද්‍ය සේවා ව්‍යවස්ථා සංග්‍රහය ප්‍රකාරව, වැඩ බලන නියෝජ්‍ය අධ්‍යක්ෂ ලෙස කටයුතු කරමින් සිටි නිලධාරිනියක වෛද්‍ය නිලධාරී II වන ශ්‍රේණියේ සිට I | ශ්‍රී ලංකා සෞඛ්‍ය සේවයේ වෛද්‍ය සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන වලට පටහැනිව කටයුතු කළ වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පවත්වා ඉදිරි ක්‍රියාමාර්ග ගත | නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර සඳහා බඳවා ගැනීම අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව සිදුවී ඇති බව. | 2022 ජනවාරි 31 දින වනවිටත් මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | වන ශ්‍රේණියට උසස් වීමේදී වෛද්‍ය සේවා ව්‍යවස්ථා සංග්‍රහය අනුව සපුරා තිබිය යුතු සුදුසුකම් සම්පූර්ණකර නොතිබියදී නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර සඳහා 2017 පෙබරවාරි 01 දින සිට පත්කර තිබුණි. | යුතුය. | | |
| (ට) | මහාරෝග්‍යශාලා මණ්ඩලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ලෙස කටයුතු කළ වෛද්‍ය නිලධාරිනියකට 2018 මැයි 30 දින සිට 2019 ජූලි 11 දක්වා වූ කාලය තුළදී වැටුප් රහිත විදේශගත පුහුණුවක් සඳහා එක්සත් රාජධානියේ Oxford විශ්ව විද්‍යාලයට යාමට ශිෂ්‍යත්වයක් ලැබී තිබුණි. වෛද්‍ය නිලධාරිනියගේ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු වෙනුවෙන් ගෙවනු ලබන දීමනාව මහාරෝග්‍යශාලා මණ්ඩලය විසින් ගෙවීමට අදාළ නීත්‍යානුකූල භාවය පිළිබඳ කරුණු විමසීමෙන් තොරව හා නිලධාරිනිය විසින් ඉදිරිපත් කරන ලද විදේශ ශිෂ්‍යත්ව අයදුම්පත සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ප්‍රතික්ෂේපකර තිබියදී එම නිලධාරිනියට ශිෂ්‍යත්වය සඳහා විදේශගත වීමට වර්ෂ 2 ක් දක්වා වැටුප් සහිත නිවාඩු හා පෞද්ගලික වියදම් දීමනාවක් (Personal Maintenance Allowances) ගෙවීමට අධ්‍යක්ෂ මණ්ඩලය | විදේශ ශිෂ්‍යත්ව අයදුම්පත සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ප්‍රතික්ෂේපකර තිබියදී එම නිලධාරිනියට ශිෂ්‍යත්වය සඳහා විදේශගත වීමට වර්ෂ 2 ක් දක්වා වැටුප් සහිත නිවාඩු හා පෞද්ගලික වියදම් දීමනාවක් ගෙවීමට තීරණය කර තිබුණු වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදුකර ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය. | මෙම නිලධාරිනිය ශිෂ්‍යත්වය නිමවා දිවයිනට පැමිණීමෙන් පසු 2021 ජුනි 17 දින සේවයෙන් ඉල්ලා අස්වීම දක්වා කාලපරිච්ඡේදය මෙම රෝහලට සේවය කර ඇති බව එමෙන්ම ඇය ශ්‍රී , ජයවර්ධනපුර රෝහලෙහි ව ගියද සේවයෙන් ඉවත් ත්වය වෙනුවෙන් මෙම ශිෂ්‍ය අත්සන් කර තිබුණු ඇප පන බැඳුම්කරය උසස් අධ්‍යා ශය වෙත මාරුකර අමාත්‍යාං යවා ඇත බව හා ඒ අනුව එහි සඳහන් කොන්දේසි තවදුරටත් බලපැවැත්වෙන බව. | 2022 ජනවාරි 31 දින වන විටත් මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පවත්වා නොතිබුණි. |

විසින් තීරණය කර තිබුණි. මේ හේතුවෙන් පෞද්ගලික වියදම් දීමනාව ලෙස ගෙවා තිබුණු රු.මිලියන 5.80ක් සෞඛ්‍ය අමාත්‍යංශයෙන් ප්‍රතිපූර්ණය කර ගත නොහැකිවී තිබුණු අතර එම මුදල හා වේතන ලෙස ගෙවූ රු.මිලියන 3,79 ක් රෝහලට වැය බරක්වී තිබුණි.

## 18. ජල සම්පත් මණ්ඩලය

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 - තතත්ත්වාගණනය කළ මතය

2019 - තතත්ත්වාගණනය කළ මතය

2020 - තතත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2020 වර්ෂය අවසානයට තනතුරු 64 ක් සඳහා සේවකයින් 413 දෙනෙකු අනුමත කර තිබුණද ඉන් තනතුරු 46 ක සේවකයින් 140 ක් පුරප්පාඩුව පැවතුණි. මෙම පුරප්පාඩු වර්ෂ කිහිපයක සිට බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | විධිමත් බඳවාගැනීම් පරිපාටි අනුගමනය කරමින් නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව අදාල පුරප්පාඩු තනතුරු පිරවීමට කටයුතු කරන ලදී. | 2021 වර්ෂයේදීද බඳවා ගැනීමේ පටිපාටිය සංශෝධනය කරමින් පැවතුණි. |
| (ආ) | තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය අනුව ජල සම්පත් මණ්ඩලය විසින් ලගා කර ගත යුතු තිරසාර සංවර්ධන අරමුණු හදුනාගෙන තිබුණ ද, ඒ හා සම්බන්ධවන ඉලක්ක, පාදක දත්ත, ඉලක්කය ලඟා විය යුතු සංධිස්ථාන මෙන්ම ප්‍රගතිය මැන බැලීම සඳහා වන දර්ශක ද හදුනාගැනීමට කටයුතු කර නොතිබුණි. | තිරසාර සංවර්ධන අරමුණු හදුනාගෙන ඒ හා සම්බන්ධ ඉලක්ක, දත්ත ඉලක්ක ලගා විය යුතු සංසිද්ධි මැන බලන දර්ශක නිවැරදිව හදුනා ගැනීමට කටයුතු කළ යුතුය. | තිරසාර සංවර්ධන අරමුණු හදුනාගෙන ඒ හා සම්බන්ධ ඉලක්ක, දත්ත ඉලක්ක ලගා වියයුතු සංසිද්ධි මැන බලන දර්ශක නිවැරදිව හදුනාගෙන වර්ෂ 2022 සිට 2025 දක්වා වන කාලය සඳහා මණ්ඩලයේ සංයුක්ත සැලැස්ම (Cooperate Plan) සකස් කර ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදනු ලැබේ. | තිරසර සංවර්ධන හා අරමුණු හදුනාගෙන ඒ හා සම්බන්ධ ඉලක්ක, ලඟා විය යුතු සංසිද්ධි මැන බලන දර්ශක හදුනාගෙන එය සකස් කිරීමට කටයුතු යොදා ඇත. |
| (ඇ) | 2020 වර්ෂය අවසානයට රු.6,683,106ක් වූ ණය ගැති ශේෂයක් වූ අතර ඉන් රු.2,320,606ක ණය ගැති ශේෂ වර්ෂයකට වඩා පැරණි ඒවා විය. | ණය ශේෂ අයකර ගැනීම යාවත්කාලීනව සිදු කළ යුතුය. | කල්ගත වූ ණයගැති ශේෂ අයකර ගැනීමට කටයුතු කරගෙන යනු ලැබේ. | 2022 පෙබරවාරි වනවිටත් අයකර ගතයුතු ශේෂයන් පැවතුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | අංක 2010/23 සහ 2017 මාර්තු 16 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව කෘෂිකාර්මික කටයුතු සඳහා ඉදි කරනු ලබන විශ්කම්භය මීටර් 4 ක් හෝ ඊට වැඩි වගා ළිං, වානිජමය කෘෂිකාර්මික කටයුතු සහ කර්මාන්ත අවශ්‍යතා සඳහා ඉදි කරනු ලබන නළ ළිං සඳහා ජල සම්පත් මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. තවද නළ ළිං ඉදිකරන සියළු ආයතන මණ්ඩලයේ ලියාපදිංචි විය යුතු වුවත් ඇතැම් ආයතන එසේ ලියාපදිංචි වී නොතිබුණි. | නීතිරීති රෙගුලාසි වලට අනුකූලව කටයුතු කළ යුතුය. | භූ ගත ජලය වාණිජමය කටයුතු සඳහා භාවිතා කරනු ලබන ආයතන ජල සම්පත් මණ්ඩලයේ ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍ය දැනුම් දීම් පුවත්පත් මඟින් හා රාජ්‍ය ආයතනවල සහයෝගය ඇතිව සිදු කරමින් පවතී.<br>මෙහි මූලික අදියර ලෙස භූ ගත ජලය විශාල පරිමාණයෙන් භාවිතා කරනු ලබන වාණිජ කර්මාන්ත පළමුව ලියාපදිංචි කිරීමට කටයුතු කරනු ලැබේ. | ලියාපදිංචි කටයුතු සහ අනුමැතිය ලබාදීමේ කටයුතු 2021 වර්ෂය අවසානය දක්වාම නියමිත පරිපාටියකට අනුව සිදුකර නොතිබුණි. |
| (ඉ) | අංක 2010/23 සහ 2017 මාර්තු 16 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව වාණිජමය කෘෂිකර්මාන්තය සඳහා හෝ කර්මාන්ත සඳහා මසකට ලීටර් 30,000 ක භූගත ජලය ලබා ගන්නා සියළුම ව්‍යාපෘති සඳහා අදාළ ජල ප්‍රභවය සම්බන්ධ තත්ත්ව වාර්තා නිකුත් කර නොතිබුණි. | නීතිරීති රෙගුලාසිවලට අනුව කටයුතු කළ යුතුය. | අදාල නියාමන කටයුතු සඳහා දෛනිකව ලබා ගනු ලබන ජලය මැනීම සඳහා හා දෛනිකව දත්ත ගබඩා වන පරිදි ස්වයංක්‍රිය ජල මනු සවි කිරීමේ කටයුතු සිදු කරමින් පවතී. | නියාමන කටයුතු සාර්ථක කර ගැනීම පිණිස අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ඊ) | අංක 2010/23 සහ 2017 මාර්තු 16 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව ගැසට් පත්‍රයේ 3 වගන්තිය ප්‍රකාරව ජල විශ්ලේෂණ වාර්තා අනුමැතිය සඳහා ජල සම්පත් | නීතිරීති රෙගුලාසිවලට අනුව කටයුතු කළ යුතුය. | දිස්ත්‍රික් ලේකම් කාර්යාල මාර්ගයෙන් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් සහය ලබාගෙන භූ ගත ජලය වාණිජමය වශයෙන් භාවිතා කරන සියලුම | ජල සම්පත් මණ්ඩලයේ පවතින මානව හා අනෙකුත් සම්පත් යොදවා පියවරෙන් පියවර භූ ගත ජල සම්පත් |

| | | | | |
|---|---|---|---|---|
| | මණ්ඩලය වෙත ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | | ආයතන වල තොරතුරු ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | කළමනාකරණයට අදාලව රාජ්‍ය වගකීම දීප ව්‍යාප්තව සහ තිරසාරව සිදු කිරීමට කටයුතු සම්පාදනය කර නැත. |
| (උ) | අංක 2010/23 සහ 2017 මාර්තු 16 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව ගැසට් නිවේදනයේ 2 වගන්තිය අනුව දෛනිකව ලබාගන්නා ජල පරිමාණයන් පිළිබඳ දත්තයන් පවත්වාගත යුතු වුවත් ඇතැම් පෞද්ගලික ආයතනයන් එසේ කටයුතු කර නොතිබුණි. ඒ සම්බන්ධයෙන් මණ්ඩලය කිසිදු නීතිමය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | නීතිරීති රෙගුලාසිවලට අනුව කටයුතු කළ යුතුය. | නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට පවත්නා පනතේ විධිවිධාන ප්‍රමාණවත් නොවන හෙයින් පනත සංශෝධනය කිරීමට කටයුතු කරමින් පවතී. | - එම - |
| (ඌ) | අංක 2010/23 සහ 2017 මාර්තු 16 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ නියෝග අංක 2 ප්‍රකාරව නළ ළිං ඉදිකිරීමේ නියැලෙන සියලු ආයතන ජල සම්පත් මණ්ඩලයේ ලියාපදිංචි වියයුතු අතර මණ්ඩලයේ උපදෙස් පරිදි අදාල ආයතන විසින්ම ජල මනු සවිකර ගත යුතු වුවත් එසේ නළ ළිං මගින් භූගත ජලය ලබාගන්නා ආයතන 256 ක් ජල මනු සවිකර නොතිබුණි. | නීතිරීති රෙගුලාසිවලට අනුව කටයුතු කළ යුතුය. | ක්ෂේත්‍ර රාජකාරි හා නිරීක්ෂණ කටයුතු සඳහා අවශ්‍ය තාක්ෂණික කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට කටයුතු සිදු කරමින් පවතින අතර එමඟින් නියාමන කටයුතු සඳහා වන ක්ෂේත්‍ර පරික්ෂා කිරීම් නිසි ක්‍රමවේදයන් අනුව සිදු කරීමට කටයුතු කරනු ලැබේ. | -එම - |

| | | | | |
|---|---|---|---|---|
| (එ) | අංක 2010/23 සහ 2017 මාර්තු 16 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ නියෝග අංක 3 ප්‍රකාරව ජලය බෝතල්කිරීමේ කර්මාන්තයෙහි හා බීම නිෂ්පාදනයෙහි නියැලෙන මොනයම් හෝ රාජ්‍ය හෝ පලාත් පාලන ආයතනයක් හෝ රාජ්‍ය නොවන සංවිධානයක් හෝ අයතනයක් හෝ පුද්ගලයෙකු ස්වභාවික ජල උල්පතක් හෝ භූගත ජලය සිය නිෂ්පාදන කටයුතු සඳහා උපයෝගී කරගනු ලබන්නේනම් එකී ජල මූලාශ්‍රයේ ජල නියැදියන් සෑම මාස 6 කට වරක් රජයේ පිළිගත් රසායනාගාරයකින් පරීක්ෂාවක් සිදුකර අදාළ විශ්ලේෂණ වාර්තාව අනුමැතිය සඳහා ජල සම්පත් මණ්ඩලය වෙත ඉදිරිපත් කලයුතු වුවත් එසේ සිදුකර නොතිබුණි. | නීතිරීති රෙගුලාසිවලට අනුව කටයුතු කළ යුතුය. | වාණිජ අරමුණු සඳහා ඉදි කරනු ලබන නළ ළිං වල පරිසර ඇගයීම් වාර්තා ලබා දීම් හා අනෙකුත් අවශ්‍ය අවසර ලබා දීමට පෙර ජල සම්පත් මණ්ඩලය මඟින් ජල ධාරිතා පරීක්ෂණයක් සිදු කර භූ ගත ජලය ලබා ගැනීම සඳහා වන නිර්දේශ සහිත වාර්තාවක් ලබා දීමට කටයුතු සිදු කර ඇත. | -එම - |
| (ඒ) | ක්‍රියාකාරී සැලැස්ම අනුව මණ්ඩලය විසින් 2020 වර්ෂයේදී කෘෂි ළිං සමීක්ෂණ **500** ක් සිදු කිරීමට සැලසුම් කර තිබුණ ද වර්ෂය අවසානය වන විටත් කිසිදු කාර්යයන් ඉටු කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්ම ප්‍රකාරව කාර්යයන් ඉටු කිරීමට කටයුතු තළ යුතුය. | 2020 වර්ෂය තුල ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය මගින් මෙම ව්‍යාපෘතියට අදාල ප්‍රතිපාදන ජල සම්පත් මණ්ඩලය වෙත යොමු නොකල බැවින් සැලසුම්කල පරිදි මෙම ව්‍යාපෘතිය සිදුකිරීමට නොහැකි විය. | 2022 වනවිටත් අදාළ ප්‍රතිපාදන ලබාගෙන නොතිබුණි. |
| (ඔ) | නෙදර්ලන්තයේ විශේෂ ණය ආධාරයන් යටතේ ක්‍රියාත්මක භූගත ජල සමීක්ෂණ ව්‍යාපෘතිය යටතේ මධ්‍යම දත්ත | ගිවිසුම් ප්‍රකාරව කටයුතු තර මණ්ඩලයට උපරිම ප්‍රතිලාභයන් ලැබෙන | බත්තරමුල්ල පිහිටි ඉඩමේ ගොඩනැගිල්ල ඉදිකිරීමට කැබිනට් අනුමැතිය ලබා ගැනීමටද කාලයක් ගතවිය. | අපේක්ෂිත දත්ත මධ්‍යස්ථාන ගොඩනැගිල්ල (බත්තරමුල්ලෙහි )සඳහා |

| | | | | |
|---|---|---|---|---|
| | මධ්‍යස්ථානයක් ඉදි කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් 2016 වර්ෂයේදී ප්‍රතිපත්තිමය තීරණය ලබා දී තිබුණි. ඒ අනුව නාගරික සංවර්ධන අධිකාරියට අයත් බන්තරමුල්ලේ පිහිටි ඉඩමක, ගොඩනැගිලි ඉදිකිරීම සඳහා ඉඩම බදු ගැනිමට අදාල බදු ගිවිසුමකට එළඹීම ප්‍රමාද වීම හේතුවෙන්, ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් ගිවිසුම අනුව අදාළ ගොඩනැගල්ල ඉදිකිරීමේ කටයුතු 2021 වර්ෂයේදී නිමකිරීමට නොහැකි වී තිබුණි. එසේ වුවත් ගොඩනැගිල්ල ඉදි නොකර ගිවිසුමෙන් දක්වා ඇති (Trunkey contract ) පරිදි ගෙවීම් කිරීමට සිදුවීම හේතුවෙන් රසායනාගාරය ඉදිකිරීම් පිරිවැය ලෙස එකඟ වී ඇති රු.මිලියන 95 ක මුදල ද ගොඩනැගිල්ල ඉදිකිරීමකින් තොරව ගෙවීම් කිරීමට සිදුවීමේ අවදානමක් පැනනැගී ඇත. | සේ කටයුතු කළ යුතුය. | දැනට මෙම මූලික වැඩ කටයුතු අවසන් වී ඇති බැවින් කැබිනට් අනු කමිටු අනුමැතිය අධ්‍යාක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර ඇත. | ඉදි කිරීම් කටයුතු ආරම්භ කිරීමට නාගරික සංවර්ධන අධිකාරිහි අනුමැතිය සඳහා අවශ්‍ය කරනු ලබන සියළු ලිපි ලේඛණ යොමු කොට ඇත. නාගරික සංවර්ධන අධිකාරියෙහි අනුමැතිය ලැබෙන තුරු ගොඩනැගිල්ල සඳහා වූ මූලික වියදම් ප්‍රමාණ බිල්පතෙහි (BOQ) ප්‍රථමික කටයුතු සහ ව්‍යුහාත්මක සැලසුම්කරණය කරමින් පවතී. |
| (ඕ) | මණ්ඩලය සතුව බැරලෝහ විශ්ලේෂණයට හා භූගත ජලයේ කෘෂිරසායන පරීක්ෂාවට උපකරණ නොමැතිවීම සහ උතුරුමැද කලාපයේ පැවති හඳුනානොගත් දිගුකාලීන වකුගඩු ගැටළු සඳහා ජලයේ විස්තරාත්මක විශ්ලේෂණ | වත්කම් කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය කළ යුතුය. | පවතින අඩුපාඩු මඟ හැරවීමට කටයුතු කර ඇත. | වේලි ආරක්ෂණ ව්‍යාපෘතිය මඟින් ඉටු කරන ලද රු.මිලි.13.2ක මුදල 2021 වර්ෂයේ ගිණුම් පොත් වලට ගෙන ඇත.මීට අමතරව GC-MS උපකරණය ජල සම්පාදන අමාත්‍යාංශය යටතේ |

| | | | | |
|---|---|---|---|---|
| | කටයුතු සිදුකිරීම සඳහා 2018 වර්ෂයේදී වේලි ආරක්ෂණ හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය විසින් රු.13,261,884 ක් වැය කර රසායනාගාරයක් ඉදිකර ඊට රු.95,095,235ක උපකරණ ලබා දී තිබුණි. එම උපකරණ වලින් භූගත ජලයේ කෘෂි රසායනයන් අඩංගු වීම විශ්ලේෂණය කිරීම සඳහා රු.මිලියන 32,555,430ක් වැය කර මිලදී ගෙන තිබූ GC- MS/ms උපකරණය සැපයූ දින සිට අක්‍රීය තත්ත්වයේ තිබුණි. වගකීම් කාලය තුළ සැපයුම්කාර සමාගම වෙත ඒ පිළිබඳ දැනුවත් කර පිළිසකර කිරීමට කටයුතු කර නොතිබුණි. ඊට වගකිව යුතු පාර්ශවයන් හඳුනා ගැනීම සඳහා කිසිදු පරීක්ෂණයක් සිදු කර නොතිබුණි. | | | පවතින් චීන ශ්‍රී ලංකා පර්යේෂණ ප්‍රධාන ව්‍යාපෘතිය වෙත 2021.12.15 දින භාරදී ඇත. |
| (ක) | මණ්ඩලයට අයත් වාහන 30 ක් සඳහා වාහන පවතින ස්ථාන හඳුනාගැනීමේ යන්ත්‍ර සපයා සවිකිරීම (Supplying & Installation of vehicle tracking Solution) සඳහා රු.1,419,000ක වටිනාකමකට 2019 සැප්තැම්බර් 18 දින ගිවිසුමකට එළඹ තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානය වනවිට ගිවිසුම ප්‍රකාරව කටයුතු නොකිරීම | කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව අවශ්‍ය කාර්යයන් කොන්ත්‍රාත්කරු ලවාම ඉටු කරවා ගත යුතුය. | උපාංග සම්බන්ධව එම උපකරණ සවිකරන ලද ආයතනය සමඟ නැවත සාකච්ඡා කිරීමට සභාපතිතුමා දැනුම් දුන් අතර අධ්‍යක්ෂක මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනෙක්ද ඊට සහභාගී කරවා ගැනීමට තීරණය විය. ඒ අනුව ගන්නා ලද තීරණ මත කටයුතු කරමින් සිටි. | තාක්ෂණික ඇගයීම් කමිටුවේ උපදෙස් මත ජල සම්පත් මණ්ඩලයේ කැබ් රථ 12ක් සඳහා පමණක් ලුහුබැඳීම් උපකරණ සවි කිරීමේ කටයුතු නිම කර ඇත. |

සම්බන්ධයෙන්
කොන්ත්‍රාත්කරුට එරෙහිව
ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 19. ජාතික අධ්‍යාපන ආයතනය

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 - තත්ත්වාගණනය කළ මතය

2019 - තත්ත්වාගණනය කළ මතය

2020 - තත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 1985 අංක 28 දරන ජාතික අධ්‍යාපන පනතේ 4 (ක) සහ 28 වගන්තිය ප්‍රකාරව ආයතනයේ පරිපාලන හා මූල්‍ය රෙගුලාසි සංග්‍රහය පනතේ විධිවිධාන ප්‍රකාරව අනුමත කරගෙන නොතිබුණි. | විධිමත් පරිදි අනුමත කර ගැනීමට කටයුතු කළ යුතුය. | ඉදිරියේදී අනුමත කර ගැනීමට කටයුතු කරනු ලැබේ. | 2021 දෙසැම්බර් 31 දක්වාම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට යොමු කර අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ආ) | 2006 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලයට අදාළව සේවක අර්ථසාධක අරමුදල් දායකය ගණනය කිරීමේදී ජීවන වියදම් දීමනා සැලකිල්ලට නොගැනීම හේතුවෙන් තවදුරටත් ගෙවිය යුතුව ඇති රු. මිලියන 45.8 ක් වූ අර්ථසාධක අරමුදල් දායකය හා ගෙවිය යුතු රු. 22.9 ක් වූ අධිභාර මුදල 2020 වර්ෂය අවසන් වනවිට ද නිරවුල් කර නොතිබුණි. | අර්ථසාධක අරමුදලේ පවතින හිඟ මුදල නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | කම්කරු කොමසාරිස් සමඟ පැවති එකඟතාවයට අනුකූලව වාරික වශයෙන් ඉතා කඩිනමින් ගෙවීමට කටයුතු කරනු ලැබේ. | 2021 දෙසැම්බර් 31 දක්වාම නිරවුල් කර නොතිබුණි. |

**20.** **ජාතික ඖෂධ නියාමන අධිකාරිය**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 - තතත්ත්වාගණනය කළ මතය

2019 - වියාචනය කළ මතය

2020 - තතත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2019 වර්ෂය තුළදී ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් අධිකාරිය සම්බන්ධයෙන් සිදුකර තිබුණු Benchmarking වැඩසටහන සම්බන්ධයෙන් එම සංවිධානය විසින් නිකුත් කර තිබුණු වාර්තාවේ සඳහන් ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරයේ රසායනාගාර පරීක්ෂණ සම්බන්ධයෙන් ක්‍රියාත්මක කිරීමට නිර්දේශ කර තිබුණු නිර්දේශයන් 37 හි වර්තමාන ප්‍රගතිය විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. | ලෝක සෞඛ්‍ය සංවිධානයේ නිර්දේශයන්හි වර්තමාන ප්‍රගතිය විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය. | WHO Benchmark Assessment CAPA මඟින් අවශ්‍ය ලියකියවිලි සමාලෝචනය Zoom තාක්ෂණය ඔස්සේ 2021 ඔක්තොම්බර් 06 වන දින පැවැත්විය. එහි අවසාන වාර්තාව WHO හි ප්‍රධාන කාර්යාලය මඟින් ඉදිරියේදී ලැබීමට නියමිතය. | 2021 ජනවාරි 31 දින වන විටත් ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරයේ රසායනාගාර පරීක්ෂණ සම්බන්ධයෙන් ක්‍රියාත්මක කිරීමට නිර්දේශ කර තිබුණු නිර්දේශයන් 37 ක්‍රියාත්මක කර නොතිබුණි. |
| (ආ) | 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 41 (2), 66 (2) හා 87 (2) වගන්ති ප්‍රකාරව, වෛද්‍ය විද්‍යාව, ඖෂධ වෛද්‍ය විද්‍යාව හා ඖෂධවේදය හෝ වෙනත් අදාළ විෂයයන් පිළිබඳ උපාධියක් සහිත නිලධාරියෙකු, ඖෂධ නියාමන අංශයේ (Medicine Regulatory Division), වෛද්‍ය උපකරණ නියාමන අංශයේ (Medicine Device Regulatory Division) | පනතේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කිරීමට අවශ්‍ය තත්ත්වයන් සම්පූර්ණ කළ යුතුය. | එම අංශයන්හි ප්‍රධානින් ලෙස ඉහළ පළපුරුද්දක් සහිත සෞඛ්‍ය සේවයේ නියුතු ඖෂධවේදීන් කටයුතු කරන බව හා සුදුසුකම් මත අන්තර්ග්‍රහණය කර අවසන් වූ වහාම අධිකාරියේ ස්ථිර කාර්ය මණ්ඩලයට බඳවා ගන්නා නිලධාරීන් අතරින් සුදුසුකම් ලත් නිලධාරීන් නියාමන කටයුතු සම්බන්ධ අංශයන්හි ප්‍රධානින් ලෙස පත් කිරීමට හැකි වන බව. | 2022 ජනවාරි 31 දින වන විටත් එම ප්‍රධානීන් පත්කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | හා සීමාස්ථ නිෂ්පාදන නියාමන අංශයේ (Border Line Production Regulatory Division) ප්‍රධානීන් ලෙස පත්කර නොතිබුණි. | | | |
| (ඇ) | 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 51 වගන්තිය ප්‍රකාරව, 2019 වර්ෂයේදී ඇගයීම ආරම්භකර නොතිබුණු විදේශීය නිෂ්පාදනගාර 04 කට අදාළ ඖෂධ වර්ග 04 ක් සඳහාද, නිෂ්පාදනාගාර සඳහා අනුමැතිය ලබාදීමට ප්‍රථමයෙන් විදේශීය නිෂ්පාදනාගාර 22 ක ඖෂධ වර්ග 34 ක් සඳහාද ලියාපදිංචි සහතික නිකුත් කර තිබුණි. තවද, වර්ෂයක් තුළදී යහපත් නිෂ්පාදන පරිචය පිළිබඳ පරීක්ෂාවක් පැවැත්විය යුතුව තිබුණු විදේශීය නිෂ්පාදනාගාරයක් සඳහා වර්ෂ 05 ක් ඉක්මවන තෙක් එම පරීක්ෂාව පවත්වා නොතිබුණු නමුත් එහි නිපදවන ඖෂධ සඳහා අවස්ථා 06 කදී ලියාපදිංචි සහතික නිකුත් කර තිබුණි. | පනත ප්‍රකාරව කටයුතු කරමින් ලියාපදිංචි සහතික නිකුත් කළ යුතුය. | මෙහි සඳහන් ඖෂධ සඳහා, එම ඖෂධ නිෂ්පාදනය කරන පරිශ්‍ර හා නිෂ්පාදන කිරීමේ ක්‍රියාවලිය අනුමත නොකර ලියාපදිංචි සහතික නිකුත් කිරීම පිළිබඳව පුළුල්ව සොයා බලා ඒ ඒ ඖෂධ පිළිබඳව වෙන වෙනම විස්තරාත්මක් වාර්තාවක් සකස් කර විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | 2022 ජනවාරි 31 දින වන විටත් අදාළ පරීක්ෂාවන් සිදුකර නොතිබුණි. |
| (ඈ) | 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 59(4)(ආ) වගන්තිය ප්‍රකාරව, ඖෂධ ලියාපදිංචි කිරීමට පෙර ඖෂධයේ තත්ත්වය පරීක්ෂා කිරීම සඳහා | පනතේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | සියලු ඖෂධවල තත්ත්වය පරීක්ෂා කිරීම ප්‍රායෝගිකව සිදුකළ නොහැකි බව, ඖෂධ ලියාපදිංචි කිරීමේ හා තත්ත්ව පරීක්ෂණ අංශය වෙත සාම්පල ලබාදීමේ | 2022 ජනවාරි 31 දින වන විටත් මෙම තත්ත්වය නිවැරදි කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | ජාතික ඖෂධ තත්ත්ව පරීක්ෂණ රසායනාගාරය (NMQAL) වෙත ඉදිරිපත් කළ යුතු වුවද, එපරිදි ඖෂධයේ තත්ත්වය පරීක්ෂා කිරීමට කටයුතු නොකර ඒ වෙනුවට ඖෂධවේදියෙකු විසින් ඖෂධය පිළිබඳ ලේඛනගත තොරතුරු පමණක් ඇගයීමට කටයුතු කර සමාලෝචිත වර්ෂය තුළදී ඖෂධ තාවකාලික ලියාපදිංචි සහතික 1,035 ක් සහ වර්ෂ 05 ක් සඳහා නිකුත් කරන සම්පූර්ණ ලියාපදිංචි සහතික 20 ක් වශයෙන් ලියාපදිංචි සහතික 1,055 ක් නිකුත් කර තිබුණි. ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ රසායනාගාරයේ දත්ත අනුව සමාලෝචිත වර්ෂය තුළදී ඖෂධ ලියාපදිංචි සහතික ලබාදීම සඳහා පරීක්ෂා කර තිබුණු ඖෂධ මුළු සාම්පල් ගණන 33 ක් පමණක් විය. | | මාර්ගෝපදේශ අනුව තෝරාගත් ඖෂධ පමණක් පරීක්ෂා කරන බව. | |
| (ඉ) | 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 60 (2), 61, 84 (2), 85, 103(2) හා 104 වගන්ති ප්‍රකාරව, අධිකාරිය විසින් ඖෂධ, වෛද්‍ය උපකරණ හා සීමාස්ථ නිෂ්පාදන ලියාපදිංචි කිරීම හා ලියාපදිංචිය ප්‍රතික්ෂේප කිරීම ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයන් මගින් මහජනතාව වෙත දැනුම් දිය යුතු වුවද, | පනතේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | එම ක්‍රියාවලිය නිතිපතා සිදු නොවූ බව හා මින් ඉදිරියට නිතිපතා එය සිදුකරන බව. | 2022 ජනවාරි 31 දින වන විටත් මෙම තත්ත්වය නිවැරදි කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | එපරිදි කටයුතු කර නොතිබුණි. | | | |
| (ඊ) | 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 72(1) හා 93(1) වගන්ති ප්‍රකාරව, ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කරන වෛද්‍ය උපකරණ හා සීමාස්ථ නිෂ්පාදන ඇගයීම සඳහා පොදු මාර්ගෝපදේශ අධිකාරිය විසින් පිළියෙල කර වෛද්‍ය උපකරණ හා සීමාස්ථ නිෂ්පාදන ඇගයීම් කමිටු වෙත ලබාදිය යුතු අතර, 142 වගන්තිය ප්‍රකාරව වෛද්‍ය උපකරණ හා සීමාස්ථ නිෂ්පාදන ලියාපදිංචි කිරීමේ හා බලපත්‍ර ලබාදීමේ නියෝග පිළියෙල කළ යුතුය. එසේ වුවද, එම මාර්ගෝපදේශ පිළියෙල කර ගැසට් පත්‍රයේ පළ කර නොතිබුණු අතර ලියාපදිංචි කිරීමේ හා බලපත්‍ර ලබාදීමේ නියෝග පිළියෙල කරද නොතිබුණි. | වෛද්‍ය උපකරණ හා සීමාස්ථ නිෂ්පාදන ඇගයීම සඳහා පොදු මාර්ගෝපදේශ හා නිෂ්පාදන ලියාපදිංචි කිරීමේ හා බලපත්‍ර ලබාදීමේ නියෝග පිළියෙල කළ යුතුය. | ඖෂධ වෛද්‍ය උපකරණ හා සීමාස්ථ නිෂ්පාදන සහ වෙනත් අදාළ අයිතම ඇගයීම සඳහා පොදු මාර්ගෝපදේශ සියල්ල (එක් එක් අංශ මගින්) පිළියෙල කර, එම මාර්ගෝපදේශ අධිකාරියේ වෙබ් පිටුව හරහා දැනුවත් කර ඇති බව, ලෝක සෞඛ්‍ය සංවිධානය මගින් වරින් වර ලබාදෙන උපදෙස් මෙන්ම ඇගයීම් කමිටුව හරහා සිදු කරන ඇගයීම් කටයුතුද මෙම නියාමන ක්‍රියාවලියටම අයත් බව හා වෙන් වෙන් වශයෙන් මාර්ගෝපදේශ ඒ සඳහා නිකුත් කළ යුතුදැයි සලකා බලා එය නිවැරදි කර ගැනීමට ඉදිරියේදී පියවර ගන්නා බව. | 2022 ජනවාරි 31 දින වන විටත් වෛද්‍ය උපකරණ හා සීමාස්ථ නිෂ්පාදන ඇගයීම සඳහා පොදු මාර්ගෝපදේශ අධිකාරිය විසින් පිළියෙල කර නොතිබුණි. |
| (උ) | 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 74 (1) වගන්තිය ප්‍රකාරව, පනතේ කාර්ය සඳහා අවසර දෙනු ලබන වෛද්‍ය උපකරණ අමාත්‍යවරයා විසින් කලින් කළ ලැයිස්තුගත කර නොතිබුණි. | පනතේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | එසේ ලැයිස්තු ගත කර ගැසට් කිරීම ප්‍රයෝගිකව අපහසු කරුණක් වන බව හා පනත සංශෝධනය කිරීමේදී ඒ බව සලකා බලන බව. | 2022 ජනවාරි 31 දින වන විටත් අවසර දෙනු ලබන වෛද්‍ය උපකරණ ලැයිස්තුගත කිරීමට හෝ පනත සංශෝධනය කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. |
| (ඌ) | 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 119 (4) වගන්තිය | අයදුම්පත් ඉදිරිපත් කළ දින සිට සහතික හා බලපත්‍ර නිකුත් කිරීම | බලපත්‍ර නිකුත් කිරීමේ ප්‍රමාදය අවම කර ගැනීම සඳහා කාර්ය මණ්ඩලය | 2022 ජනවාරි 31 දින වන විටත් ප්‍රමාදය අවම කිරීම සඳහා කාර්ය |

| | | | | |
|---|---|---|---|---|
| | ප්‍රකාරව, ඔසුසල් ලියාපදිංචියට හා බලපත්‍ර නිකුත් කිරීමට ගත කළ යුතු නිශ්චිත කාලසීමාවක් නිර්ණය කර නොතිබුණි. 2020 වර්ෂය තුළදී ඔසුසල් 119 ක බලපත්‍ර නිකුත් කිරීම සඳහා මුදල් අය කළ දින සිට බලපත්‍ර නිකුත් කිරීමට මාස 04 සිට වර්ෂ 01 දක්වා වූ විවිධ කාලපරාසයන් ගත කර තිබුණු අතර ඔසුසල් බලපත්‍ර මුද්‍රණය කිරීමෙන් පසු අදාළ බලධාරියාගේ අත්සනින් යුතුව බලපත්‍රය නිකුත් කිරීම සඳහා මාස 01 සිට මාස 10 දක්වා වන කාලයක් ගතකර තිබුණු අවස්ථා 117 ක් විය. බලපත්‍ර මුද්‍රණය කළ දින සිට නිකුත් කිරීම දක්වා මෙතරම් කාලයක් ගතකර තිබීමට පිළිගත හැකි හේතු ඉදිරිපත් නොකෙරුණි. | සඳහා ගත කළ යුතු සම්මත කාලයක් හඳුනාගත යුතුය. ඒ අනුව පිළියෙල කරන ලද සැලැස්මකට අනුව කටයුතු කරමින් ලියාපදිංචි සහතික සහ බලපත්‍ර නිකුත් කිරීමේ ප්‍රමාදය අවම කරගත යුතුය. | බඳවා ගැනීමට ඉල්ලීම් කර ඇති බව. | මණ්ඩලය බඳවා ගැනීමට අපොහොසත්වී තිබුණු අතර ඒ වෙනුවට පැවති බලපත්‍රවල වලංගු කාලය 2022 දෙසැම්බර් 31 දින දක්වා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කර තිබුණි. |
| (එ) | 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 109 වගන්තිය ප්‍රකාරව, ජීවිතයක් බේරාගැනීමට, බෝවන රෝග හෝ වසංගත රෝගයක් පැතිරීම වැළැක්වීමට, ජාතික අවශ්‍යතාවයක් හා ජාතික ආරක්ෂාව වැනි විශේෂිත අවස්ථා ගණයට නොවැටෙන, ලියාපදිංචිය අවලංගුවීම, ලියාපදිංචි සැපයුම්කරුවන් නොසිටීම, ලියාපදිංචි සැපයුම්කරුවන් ලංසු ඉදිරිපත් නොකිරීම වැනි හේතු මත | පනතේ සඳහන් විශේෂිත අවස්ථාවලදී පමණක් ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි නිකුත් කළ යුතුය. | පනතේ 109 වගන්තිය ප්‍රකාරව හා සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ ප්‍රකාරව, ඉදිරිපත් කරන අයදුම්පත් අධිකාරිය විසින් ස්ථාපිත විශේෂඥ අනු කමිටුවකට යොමු කොට එහි නිර්දේශ මත අදාළ ඖෂධ තොගයට පමණක් ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ නිකුත් කරන බව. | 2022 ජනවාරි 31 දින වන විටත් ප්‍රමිතියෙන් බාල ඖෂධ රට තුළට ඒම වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |

2020 වර්ෂය තුළදී ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි 81 ක් නිකුත් කර තිබුණි. ඒ අතරින් එක් ලිපියක්, හෘද, අක්මා, වකුගඩු රෝග හා අධි රුධිර පීඩන වැනි රෝගී තත්ත්වයන්වලදී භාවිතා කරන පිරිවැය රු.2,563,080 ක් වූ Furosemide syrup ඖෂධයේ බෝතල් 6,000 ක තොගය ශ්‍රී ලංකා රේගුවෙන් නිදහස් කර ගැනීම සඳහා පෞද්ගලික සමාගමක් වෙත නිකුත් කර තිබුණි. එම ඖෂධ තොගයෙන් සියයට 98 ක් රිජ්වේ ආර්යා ළමා රෝහල ඇතුළු රෝහල්වලදී භාවිතා කර අවසන් වූ පසු සිදුකළ රසායනාගාර පරීක්ෂණයකදී ඖෂධය තත්ත්වයෙන් අසමත් බව තහවුරුවී තිබුණි. අදාළ ඖෂධයේ තත්ත්වය පිළිබඳ ලේඛන ඇගයීමක් හෝ සාම්පල් ඇගයීමක් හෝ සිදුනොකර ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි ලබාදීම හේතුවෙන් මෙවැනි තත්ත්වයෙන් අසමත් ඖෂධ රට තුළට ලැබී තිබුණු බවත්, ඒ අනුව තත්ත්වය පිළිබඳ තහවුරුවක් නොමැති ඖෂධ රෝගීන්ට ලබා දෙන බවත්, එමගින් රෝගීන්ට සිදුවන හානිය මැනිය නොහැකි බවත් නිරීක්ෂණය විය.

| | | | | |
|---|---|---|---|---|
| (ඒ) | 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 123 වගන්තිය ප්‍රකාරව, අධිකාරිය වෙත ඉදිරිපත් කරන අභියාචනා අසා තීරණය කිරීම සඳහා අභියාචනා කමිටුවක් පිහිටුවා නොතිබුණි. | පනතේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | අභියාචන කමිටුව ගරු අමාත්‍යතුමා විසින් පත්කළ යුතු බැවින් ඒ පිළිබඳව අමාත්‍යතුමාව දැනුවත් කර ඇති බව. | 2022 ජනවාරි 31 දින වන විටත් අභියාචන කමිටුව පිහිටුවා නොතිබුණි. |
| (ඔ) | 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරි පනතේ 142 වගන්තිය ප්‍රකාරව නිකුත් කර තිබුණු ඖෂධ ලියාපදිංචි කිරීමේ හා බලපත්‍ර ලබාදීමේ නියෝග අංක 133 (5) ප්‍රකාරව, අධිකාරියට ලැබුණු, අනුමත කරන ලද, ප්‍රතික්ෂේපිත හා අත්හිටුවන ලද හෝ ඉවත් කර ගන්නා ලද අයදුම් පත්‍ර සම්බන්ධයෙන් අදාළ අත්‍යාවශ්‍ය තොරතුරුද සමඟ දත්ත සමුදායක් පවත්වා ගත යුතු වුවද, අධිකාරිය තුළ එවැනි තොරතුරු පද්ධතියක් පවත්වා නොතිබුණි. | නියෝගය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ඉදිරියේදී තොරතුරු පද්ධතියක් පවත්වා ගැනීමට කටයුතු කරන බව. | 2022 ජනවාරි 31 දින වන විටත් තොරතුරු පද්ධතියක් පවත්වා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඕ) | 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරි පනතේ 142 වගන්තිය ප්‍රකාරව නිකුත් කර තිබුණු ඖෂධ ලියාපදිංචි කිරීමේ හා බලපත්‍ර ලබාදීමේ නියෝග අංක 134 හි XXIII වන උපලේඛනයේ 08 ඡේදයේ සඳහන් ඉලක්කගත සැකසුම් කාලසීමාව තුළ ලියාපදිංචි සහතික නිකුත් කරන බව තහවුරු කර ගැනීම | නියෝගය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ඉදිරියේදී තොරතුරු පද්ධතියක් පවත්වා ගැනීමට කටයුතු කරන බව. | 2022 ජනවාරි 31 දින වන විටත් තොරතුරු පද්ධතියක් පවත්වා ගැනීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | හා ඒ බව පරීක්ෂා කිරීම සඳහා තොරතුරු පද්ධතියක් පවත්වා නොතිබුණි. | | | |
| (ක) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය ප්‍රකාරව අධිකාරිය වෙනුවෙන් අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර නොතිබුණි. | පනතේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | අභ්‍යන්තර විගණක තනතුරට අදාළ බඳවා ගැනීමේ කටයුතු සිදුකරමින් පවතින බව හා එම කටයුතු අවසන් වූ පසු අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවන බව. | 2022 ජනවාරි 31 දින වන විටත් අභ්‍යන්තර විගණකවරයෙකු බඳවා ගෙන නොතිබුණු අතර අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කරද නොතිබුණි. |
| (ග) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128(1)(ඉ), 507,756, 757,758, 770 හා 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.1.6 ඡේදය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී විසින් සෑම මුදල් වර්ෂයකම දෙසැම්බර් 15 දිනට ප්‍රථම සමීක්ෂණ මණ්ඩල පත්කිරීමට හා එහි වාර්තා ඊලඟ වර්ෂයේ මාර්තු 17 දිනට පෙර ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත පිටපතක් සහිතව විගණකාධිපති වෙත යොමු කිරීමට කටයුතු කළ යුතු වුවද, අධිකාරිය පිහිටවූ 2015 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වාම මුළු පිරිවැය රු.55,492,978ක්වූ ජංගම නොවන වත්කම් සමීක්ෂණය කර එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | 2021 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණය පැවැත්වීමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කරමින් පවතින බව හා 2022 වර්ෂය තුළදී සමීක්ෂණ වාර්තා හැකි ඉක්මනින් විගණකාධිපති වෙත ඉදිරිපත් කරන බව. | 2022 ජනවාරි 31 දින වන විටත් 2021 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණය සිදුකර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඡ) | 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව කාර්ය මණ්ඩලය සඳහා කෝවිඩ් 19 දිරිදීමනා යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කර තිබුණු අතර සාමාන්‍ය රාජකාරි දින හා නිවාඩු දිනයන් ලෙස නොසලකා රාජකාරියට වාර්තා කරන දිනකට දින 1 ½ බැගින් දීමනා ගණනය කර 2020 වර්ෂයේදී අධිකාරියේ කාර්යමණ්ඩලය වෙත රු.17,843,781ක දීමනා ගෙවා තිබුණි. | ගෙවූ දීමනා සම්බන්ධයෙන් භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීමට හෝ ඊට වගකිව යුතු නිලධාරීන්ගෙන් එම මුදල අයකර ගැනීමට හෝ කටයුතු කළ යුතුය. | එම ගෙවීම හා සම්බන්ධ සියලු කරුණු සැලකිල්ලට ගනිමින් 2021 නොවැම්බර් මස සිට මෙම ගෙවීම් අත්හිටවූ බව. | 2022 ජනවාරි 31 දින වන විටත් භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ට) | ඖෂධ ලියාපදිංචි කිරීමේ හා බලපත්‍ර ලබාදීමේ නියෝගවලට අනුව, ලියාපදිංචි ඩොසියරයක් ඇගයීමට වැඩ කරන දින 300 ක් හා ප්‍රමුඛතා පදනම මත ලියාපදිංචි ඩොසියරයක් ඇගයීමට වැඩකරන දින 180 ක්ද, ලියාපදිංචි ඩොසියරයක සම්පූර්ණත්වය පිළිබඳ මූලික පරීක්ෂණය සඳහා වැඩකරන දින 15 ක්ද වශයෙන් ගත වන බව තීරණය කර තිබුණි. එසේ වුවත් අවිධිමත් ලෙස හා සැකයට තුඩුදෙන අයුරින් එකම ලිපිනයෙහි හා එකම අධ්‍යක්ෂවරු යටතේ ලියාපදිංචි කර තිබුණු සමාගම් 03 ක ඩොසියර දින 01 ත් 02 ත් අතර කාලයක් තුළ ඇගයීම් කර | මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පැවැත්විය යුතුය. | සෞඛ්‍ය ලේකම් වෙත දන්වා යවා ඇති බව. | 2022 ජනවාරි 31 දින වන විටත් මේ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගක් ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | බලපත්‍ර නිකුත් කිරීම හා සමාගම් ලියාපදිංචිය අවිධිමත් ආකාරයට සිදු කිරීම සම්බන්ධව සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් වෙත දැනුම්දී වර්ෂයකට අධික කාලයක් ගතවී තිබුණද කිසිදු විමර්ශනයක් සිදුකළ බවට හෝ එවැනි ක්‍රියාවන් නැවත සිදු නොවන ක්‍රමවේදයන් හඳුන්වා දුන් බවට තොරතුරු අනාවරණය නොකෙරුණු අතර කිසිදු විනය ක්‍රියාමාර්ගයක් නොගෙන අදාළ ඖෂධවේදීන් සිව්දෙනෙකු 2020 අගෝස්තු 12 දින සිට ක්‍රියාත්මක වන පරිදි සෞඛ්‍ය අමාත්‍යාංශයට පරිපාලන හේතු මත යැයි සඳහන් කරමින් මුදාහැර තිබුණි. | | | |
| (ත) | අධිකාරියේ දත්ත පද්ධතිය ස්වයංක්‍රීයකරණය කිරීමේ කොන්ත්‍රාත්තුව මුළු කොන්ත්‍රාත් වටිනාකම රු.මිලියන 29 කට වර්ෂ 05 ක කාලයක් සඳහා පෞද්ගලික සමාගමක් වෙත 2018 මැයි 03 දින ප්‍රදානය කර තිබුණි. මෙම ලේඛන සහ කාර්ය ප්‍රවාහ කළමනාකරණ පද්ධතිය සේවාවක් ලෙස ක්‍රියාත්මක කිරීම Operational Expenditure Financing මොඩලය අනුව ලබා ගෙන ක්‍රියාත්මක කිරීමට | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය, උපදේශනය යන සියලුම කටයුතු විනිවිදභාවයකින්, කාර්යක්ෂමව හා ඵලදායී ලෙස නිවැරදි ක්‍රමවේදයකට අනුව සිදු කළ යුතු අතර එළඹ තිබුණු ගිවිසුම සෑම වර්ෂයක් අවසානයේදීම දීර්ඝ කිරීමට හා ගිවිසුම ප්‍රකාරව කටයුතු කිරීමට පියවර ගත යුතුය. | ඉදිරියේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබාදෙන උපදෙස් අනුව මෙම ව්‍යාපෘතිය නිවැරදි ක්‍රමවේදයකට අනුව වඩාත් විධිමත්ව කිරීමට කටයුතු කරන බව. | 2022 ජනවාරි 31 දින වන විටත් මේ පිළිබඳව සිදුකරන පරීක්ෂණ අවසන් කර නොතිබුණු අතර දත්ත පද්ධතිය යථාතත්ත්වයට පත්කරද නොතිබුණි. |

ගිවිසුම්ගතවී තිබුණු අතර 2019 ජුනි මාසයේ සිට 2021 මැයි මාසය දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී කොන්ත්‍රාත් සමාගම වෙත රු.12,253,328ක් ගෙවා තිබුණි. නමුත් අදාළ පෞද්ගලික සමාගමේ නොසැලකිල්ලෙන් හෝ හිතාමතා හෝ මෙම දත්ත පද්ධතියට ඇතුළත් කර තිබුණු සමහර තොරතුරු මකා දමා තිබුණු අතර ඒ සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදුකරන විමර්ශන කටයුතු අවසන් වන තෙක් හා 2021 නොවැම්බර් 30 දින වන විටත් සේවාව අක්‍රීය තත්වයට පත්වී තිබුණි. එසේම මෙම පද්ධතිය ක්‍රියාත්මක කිරීමේදී අවශ්‍ය උපදේශනය, කළමනාකාරීත්වය හා තාක්ෂණික උපදෙස් ලබාගැනීමට ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය සමඟ 2018 ජුනි 25 දින වර්ෂයක කාලයක් සඳහා අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණද වර්ෂ 05 ක් වූ කොන්ත්‍රාත් කාලයට සමාන්තරව එම ගිවිසුම දීර්ඝ කිරීමට කටයුතු කර නොතිබුණි. තවද කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව, තොරතුරුවල රහස්‍යභාවය පිළිබඳ

සැලකිලිමත් වීමට, මුරපද වෙනස් කිරීමට හෝ තොරතුරු අවභාවිතා කිරීම වැළැක්වීමට කටයුතු කර නොතිබුණු අතර පද්ධතිය ස්වයංක්‍රීයකරණය කිරීමෙන් පසු manual හා automation පද්ධති දෙක සමාන්තරව ක්‍රියාත්මක කර අධිකාරියේ අභ්‍යන්තර වැඩප්‍රවාහය (workflow) පිළිබඳ විගණන පරීක්ෂණයක් (Audit trial) සිදුකර නොතිබුණි. එමෙන්ම ලිපිගොනු කළමනාකරණය, සංරක්ෂණය හා ලේඛන පිටපත් ආරක්ෂිතව වර්ෂ 5ක් දක්වා අදාළ දත්ත සමඟ ගබඩා කිරීමේ හැකියාව, දිනපතා, සතිපතා හා මාසිකව ස්වයංක්‍රීය පිටපත් ලබා ගැනීම හා වෘත්තීමය වගකීම් රක්ෂණාවරණ ලබාගැනීම පිළිබඳව තහවුරුවක් ලබා ගැනීම යන කරුණු කෙරෙහි කළමනාකරණය සැලකිලිමත්වී නොතිබුණු අතර අදාළ දත්ත හා ඇමුණුම් තොරතුරුවල ආරක්ෂිත පිටපත් ලබානොගෙන සමාගම වෙත ගෙවීම් සිදුකර තිබුණි. ගිවිසුම් කොන්දේසි ප්‍රකාරව, පිරිවැය රු.7,558,128ක් වූ මෙම පද්ධතිය තුළ වූ වත්කම් ප්‍රාග්ධනගත කළ යුතු වුවද, ඒ වෙනුවට එම මුදල ලාභයට එරෙහිව කපාහැර තිබුණි.

| | | | | |
|---|---|---|---|---|
| (ද) | අධිකාරිය විසින් වැඩ නිමකළ ලිපිගොනු ප්‍රවාහනය කර ආරක්ෂිතව ගබඩා කර පවත්වාගෙන යාමේ කොන්ත්‍රාත්තුව 2015 දෙසැම්බර් 01 දින පෞද්ගලික සමාගමක් වෙත ප්‍රදානය කර තිබුණි. කොන්ත්‍රාත්තුව ආරම්භයේ සිට 2020 දෙසැම්බර් 31 දින දක්වා වූ වර්ෂ 05 ක කාලපරිච්ඡේදය තුළදී කොන්ත්‍රාත්කරු වෙත රු.4,503,080ක් ගෙවා තිබුණු නමුත් කොන්ත්‍රාත් ගිවිසුමේ 3.3 හා 3.4 ඡේදවල දක්වා තිබුණු පිළිවෙලින් පැවතිය යුතු ගබඩා පහසුකම් පවතින බව හා ගින්නෙන් සිදුවන උවදුරු වැළැක්වීම සඳහා අනුගමනය කළ යුතු සම්මත කොන්දේසි අනුගමනය කරන බව තහවුරු කර ගැනීමෙන් අනතුරුව මුදල් ගෙවා තිබුණු බව ලිපි ගොනු අනුව තහවුරු නොවීය. 2021 ඔක්තෝබර් 23 දින වන විටත් ලිපිගොනු ගබඩා කර ඇති ස්ථාන පිළිබඳව, ගබඩා කර ඇති ලේඛනවල ආරක්ෂාව පිළිබඳව හා ඒවා අසුරා තැබීමේ පිළිවෙල පිළිබඳ තොරතුරු කිසිවක් අධිකාරිය සතුව නොතිබුණි. 2016 වර්ෂයේදී එවකට කොන්ත්‍රාත්කරු භාරයේ පැවති ලිපිගොනු කොටසක් ගංවතුරෙන් හානිවී තිබුණු බව සඳහන් කරමින් 2016 මැයි | අධිකාරිය සඳහා ලිපිගොනු ගබඩාවක් ඉදිකිරීම පිළිබඳ අවදානය යොමු කළ යුතු අතර කුලී පදනම මත ලබා ගෙන ඇති ගබඩාවල පහසුකම් පිළිබඳව හා ගිනි උවදුරු හා සම්මත කොන්දේසි අනුගමනය කරන බව තහවුරු කර ගත යුතුය. | 2016 වර්ෂයේ ගංවතුර හානියෙන් පසු එම ලිපිගොනු වෙනත් ගබඩා 02 ක් වෙත ගෙන ගිය බව, විනාශ වූ ලිපිගොනුවල අනුපිටපත් ලබාගැනීමට කටයුතු කර ඇති බව, ස්ථානීය පරීක්ෂාව මෙම වසරේදී හැකි ඉක්මනින් සිදුකර ලිපිගොනුවල ආරක්ෂාව තහවුරු කිරීමට අවශ්‍ය පියවර ගන්නා බව හා අධිකාරිය විසින් ලිපිගොනු ගබඩාවක් පවත්වාගෙන යාම පිළිබඳව අවධානය යොමු කර ඇති බව. | 2022 ජනවාරි 31 දින වන විටත් අධිකාරිය සඳහා ලිපිගොනු ගබඩාවක් ඉදිකිරීම පිළිබඳ අවදානය යොමු කර නොතිබුණු අතර පවතින ගබඩාවේ ස්ථානීය පරීක්ෂාවන් සිදුකරද නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | මාසයේ සිට 2017 අප්‍රේල් මාසය දක්වා වූ වර්ෂය වෙනුවෙන් කොන්ත්‍රාත්කරු වෙත මුදල් ගෙවීම් නවතා තිබුණු නමුත් ගංවතුරෙන් හානිවී තිබුණු ලිපිගොනු සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදුකර නොතිබුණි. තවද, 2021 ඔක්තෝබර් 23 දින වන විටත් 2021 වර්ෂය සඳහා කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුමකට එළඹ නොතිබුණු නමුත් 2021 වර්ෂය අවසානය වන විටත් කොන්ත්‍රාත්කරුගේ සේවය ලබා ගනිමින් පැවති අතර වර්ෂ 6 ක් තිස්සේ මේ සඳහා වැයවන පිරිවැය විශ්ලේෂණය කර අධිකාරිය විසින්ම ලේඛණාගාරයක් ස්ථාපිත කිරීම පිළිබඳව අවධානය යොමු කර නොතිබුණි. | | | |
| (න) | 2020 වර්ෂයේදී වෛද්‍ය උපකරණ වෙනුවෙන් ලියාපදිංචි සහතික නිකුත් කර තිබුණු ඩොසියර් 19 ක නියැදියක් පරීක්ෂා කිරීමේදී එම ඩොසියර්වලින් කිහිපයක් අදාළ සමාගම් විසින් 2016 හා 2017 වර්ෂයන්හිදී භාරදුන් ඒවා බවත්, එම ඩොසියර් ඇගයීම් කටයුතු සිදු කර සහතික නිකුත් කිරීමට දින 150 ත් දින 1,395 ත් අතර කාලයක් ගත කර තිබුණු බවත් නිරීක්ෂණය විය. | මේ සම්බන්ධයෙන් විධිමත් විමර්ශනයක් පැවැත්විය යුතුය. | අවශ්‍ය පියවර ගන්නා බව හා මේ පිළිබඳව අවධානය යොමු කර ඇති බව. | 2022 ජනවාරි 31 දින වන විටත් කිසිදු විමර්ශනයක් සිදුකර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | එහිදී ප්‍රධාන විධායක නිලධාරී විසින් ඩොසියර් 451 ක් ඇගයීමට ලබාදීම සඳහා දින 15 ත් දින 181 ත් අතර කාලයක් ගත කර තිබුණු බවත්, වසරකට පමණ පසු බාහිර ඇගයුම්කරුවන්ට ඇගයීම සඳහා ලබාදී තිබුණු බවත්, යම් නිශ්චිත කාලයකින් පසුව එම ඇගයීම් වාර්තා ලබා ගැනීමට හෝ පසුවිපරම් කිරීමට කටයුතු කර නොතිබුණු බවත් නිරීක්ෂණය විය. | | | |
| (ප) | 2020 වර්ෂය තුළදී වෛද්‍ය උපකරණ 583ක් නව ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කර තිබුණු නමුත් 2021 අප්‍රේල් 01 දින වන විටත් ඉන් වෛද්‍ය උපකරණ 149ක් සඳහා පමණක් ලියාපදිංචි සහතික නිකුත් කර තිබුණු අතර 04ක් ප්‍රතික්ෂේප කර 02ක් වෙනුවෙන් තීරණයක් ගෙන නොතිබුණි. ඉතිරි වෛද්‍ය උපකරණ 428ක් සඳහා නිරීක්ෂණයන් ලබාදීමට අපොහොසත්වී තිබුණි. | මේ සම්බන්ධයෙන් විධිමත් විමර්ශනයක් පැවැත්විය යුතුය. | අවශ්‍ය පියවර ගන්නා බව හා මේ පිළිබඳව අවධානය යොමු කර ඇති බව. | 2022 ජනවාරි 31 දින වන විටත් පවත්නා ක්‍රමය අධ්‍යනය කර නිවැරදි පාලනයකින් කාර්ය ඉටුවන ආකාරයට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (බ) | 2019 සැප්තැම්බර් 01 දින සිට මාර්ගගත පරිගණක ස්වයංක්‍රීයකරණ පද්ධතිය (Online Automation System) මගින් පියවර 03 ක් යටතේ ඖෂධ බලපත්‍ර (සිල්ලර හා තොග) නිකුත් කිරීම සඳහා | ස්වයංක්‍රීයකරණ පද්ධතිය නිර්මාණය කිරීමේ ගිවිසුමට අනුව අදාළ නිවැරදි කිරීම් එම ආයතනය ලවා ඉටු කරවා ගත යුතුය. | මේ සම්බන්ධයෙන් සොයා බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර ඇති බව, මෙම පද්ධතිය ඉතා සංකීර්ණ පද්ධතියක් බැවින් යම් ප්‍රමදවීම් පැවතියද මේ වන විට හැකිතාක් නිවැරදි | ඉල්ලුම්කරුගේ හා ආයතනයේ අවශ්‍යතාවයට ගැලපෙන ආකාරයට පද්ධතිය යාවත්කාලීන කර ක්‍රියාත්මක කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | අධිකාරිය විසින් කටයුතු කර තිබුණි. නමුත් ඔසුසල් හිමියන්ට මෙම ක්‍රමය පිළිබඳ අවබෝධයක් නොමැති වීම, තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම ප්‍රමාණවත් නොවීම, කාර්යක්ෂම පරිගණක අයිතම නොමැති වීම හා අන්තර්ජාල පහසුකම් පිළිබඳ ගැටළු ආදී වූ කරුණු හේතුවෙන් මෙම පද්ධතිය User Friendly නොවීම සම්බන්ධයෙන් ඔසුසල් හිමියන් විසින් අදහස් ප්‍රකාශකළ අතර ඒ හේතුවෙන් ඔසුසල් බලපත්‍ර ලබා ගැනීමේ උනන්දුව තවදුරටත් හීනවී තිබුණි. 2019 වර්ෂය හා සැසඳීමේදී 2020 අගෝස්තු 31 දින වන විට අධිකාරිය වෙත ලද ඔසුසල් බලපත්‍ර ආදායම රු.30,842,902කින් පහළ ගොස් තිබුණු අතර මෙයට මාර්ගගත පරිගණක ස්වයංක්‍රීයකරණ පද්ධතියේ ක්‍රියාකාරිත්වය යථාවත් නොවීමද බලපා තිබුණි. | | කිරීම් සිදු කිරීමට පියවර ගෙන ඇති බව. | |
| (ම) | ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ රසායනාගාරය විසින් රසායනාගාරයේ ප්‍රමිතිය සම්බන්ධයෙන් අනුකූලතා තක්සේරු පිළිබඳ සහතිකය ලබාගැනීම සඳහා ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය වෙත 2020 පෙබරවාරි 06 දින අයදුම්පතක් ඉදිරිපත් කර තිබුණු නමුත් විගණිත දිනය වූ 2021 | රසායනාගාර ප්‍රමිතිය සම්බන්ධ අනුකූලතා තක්සේරු පිළිබඳ සහතිකය ලබාගැනීමට කටයුතු කළ යුතුය. | ශ්‍රී ලංකා ප්‍රතිතන මණ්ඩලය විසින් ලබා දුන් උපදෙස් අනුව ඉදිරියේදී පරීක්ෂණාගාරයේ සිදු කළ යුතු පරිවර්තන දැනට සිදු කරමින් පවතින අතර එම අඩුපාඩු සම්පූර්ණ කළ පසු නැවත ශ්‍රී ලංකා ප්‍රතිතන මණ්ඩලය විසින් පරීක්ෂණාගාරය | 2022 ජනවාරි 31 දින වන විටත් අනුකූලතා තක්සේරු පිළිබඳ සහතිකය ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | දෙසැම්බර් 31 දින වන විටත් එම ප්‍රමිති සහතිකය ලබාගැනීමට අපොහොසත්වී තිබුණි. තවද අධිකාරිය විසින් වෙනත් ප්‍රමිති සහතික හෝ ලබාගෙන ඇති බව තහවුරු නොකෙරුණි. | | ඇඟයීමකට ලක් කරන බව. | |
| (ය) | අධිකාරිය විසින් බාහිර ආයතනවලින් එකතුකළ අගය මත බදු ප්‍රතිශතය වැඩියෙන් අයකර තිබීම, නිලධාරීන්ගේ වැරදි හා අතපසුවීම් මත එක ගෙවීමක් දෙවරක් සිදුකර තිබීම, නියමිත ගාස්තුව ඉක්මවා ආදායම් රැස්කර තිබීම, ලියාපදිංචිය ඉකුත්වීම නිසා ආනයන බලපත්‍ර නිකුත්කර නොතිබීම, නම් වෙනස්වීම් හා තොග බලපත්‍ර වලංගු කාලය අවසන්වීම නිසා ප්‍රවාහන බලපත්‍රය නිකුත් කළ නොහැකිවීම ආදී වූ කරුණු පදනම් කර ගෙන 2019 හා 2020 වර්ෂවල අවස්ථා 107 කදී රු.6,464,208ක ආදායම් ආපසු ගෙවා තිබුණි. නමුත් ආදායම් ආපසු ගෙවීමට පදනම් කරගෙන තිබුණු එම කරුණු අතරින් නිලධාරීන්ගේ වැරදි හෝ නොසැලකිල්ල හෝ හේතුවෙන් සිදුවී තිබුණු කරුණු හඳුනාගැනීමට, ඒ හේතුවෙන් ආදායම් බදු හා භාණ්ඩාගාර බදු වැඩිපුර ගෙවීම් හඳුනාගෙන ආපසු අයකර ගැනීමට හෝ වගකිවයුතු නිලධාරීන්ගෙන් | ආදායම් ආපසු ගෙවීම් කිරීමට හේතු වූ සාධාරණ නොවන කරුණු හඳුනාගැනීමත්, ඒ හේතුවෙන් ආදායම් බදු හා භාණ්ඩාගාර බදු වැඩිපුර ගෙවීම් හඳුනාගෙන ආපසු අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය. | රැස්කළ ආදායම් විවිධ හේතූන් මත නැවත එම පාර්ශව වෙත ආපසු ගෙවන බව, 2019 හා 2020 වර්ෂයන් තුළදී පමණක් ආපසු ගෙවීම් අවස්ථා 107 ක් තිබුණු බව, 2021 වර්ෂයේදී මෙම තත්ත්වය වලක්වා ගැනීමට බාහිර පාර්ශව මෙන්ම අභ්‍යන්තර නිලධාරින්ද වරින් වර දැනුවත් කළ බව හා එහි ප්‍රතිපලයක් ලෙස 2021 වර්ෂය තුළදී මෙම ආපසු ගෙවීම් අවස්ථා 18 ක් දක්වා අඩුකර ගත හැකි වූ බව. | 2022 ජනවාරි 31 දින වන විට ආදායම් ආපසු ගෙවීමට පෙර නිර්දේශ ලබාගැනීමට කමිටුවක් පත්කර තිබුණු නමුත් ආදායම් ආපසු ගෙවීම් කිරීමට හේතු වූ සාධාරණ නොවන කරුණු හඳුනාගැනීමත්, ඒ හේතුවෙන් ආදායම් බදු හා භාණ්ඩාගාර බදු වැඩිපුර ගෙවීම් හඳුනාගෙන ආපසු අයකර ගැනීමටත් කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | අධිභාර කිරීමට හා ආදායම් ආපසු ගෙවීම් අවම කරගැනීම සඳහා පිළියම් යෙදීමට සහ මේ පිළිබඳ සියළු තොරතුරු ඇතුළත් වන පරිදි ලේඛනයක් පවත්වා ගැනීමට කටයුතු කර නොතිබුණි. | | | |
| (ර) | 2020 දෙසැම්බර් 31 දින වන විට ලියාපදංචිවී තිබුණු ඔසුසැල් සංඛ්‍යාව විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණු අතර 2020 වර්ෂය තුළදී ඔසුසැල් 48ක් පමණක් අධිකාරිය විසින්ද, ඔසුසැල් 23 ක් පමණක් පළාත් සෞඛ්‍ය නිලධාරී කාර්යාල විසින්ද පරීක්ෂාවට ලක්කර තිබුණි. | ඔසුසල් පරීක්ෂාවට හා අවශ්‍ය අවස්ථාවලදී නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට සුදුසු වැඩ පිළිවෙළක් හඳුන්වා දිය යුතුය. | පරීක්ෂා කර නඩු පැවරූ ඔසුසල් සංඛ්‍යාව 48ක් බව, පරීක්ෂා කරන ලද ඔසුසල් සංඛ්‍යාව මීට වඩා ඉහල සංඛ්‍යාවක් වන බව, 2020 වසර තුළ ඇඳිරි නීතිය පැනවීම, වසා තැබීම, රජයේ උපදෙස් පරිදි කුමන ආකාරයකට හෝ ඔසුසල් විවෘත කොට තබා ඖෂධ හිඟයක් ඇතිවීම වැලැක්වීමට පියවර ගැනීම තුළ නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් අවධානය යොමු නොකිරීම, නඩු පැවරීම් සංඛ්‍යාව අඩුවීමට හේතුවක් වූ බව හා 2022 වර්ෂය තුළදී විධිමත් සැලැස්මක් හා ඉලක්ක ඇතිව ඔසුසල් පරීක්ෂා කිරීමට කටයුතු කරන බව. | 2022 ජනවාරි 31 දින වන විටත් විධිමත් සැලැස්මකට අනුව ඔසුසැල් පරීක්ෂා නොකරන අතර ලැබෙන පැමිණිලි අනුව පමණක් පරීක්ෂණයන් සිදුකරන බව නිරීක්ෂණය විය. |
| (ල) | පවත්නා කෝවිඩ් 19 වසංගතය හේතුවෙන් කාර්යාල කාර්ය මණ්ඩලය ප්‍රවාහනයට දිනකට වාහන 03 ක් කුලියට ගැනීමට හා වාහන 03 සඳහා දිනකට රු.20,000ක් ගෙවීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාදී | වැඩිපුර ගෙවූ මුදල් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට හෝ ඊට වගකිව යුතු නිලධාරීන්ගෙන් එම මුදල අයකර ගැනීමට | කොවිඩ් වසංගත තත්වය මත කාර්ය මණ්ඩල ප්‍රවාහනයට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා මූලිකව බස් රථ 2 ක්ද පසුව නිලධාරීන් සේවයට කැඳවීමේ අවශ්‍යතාවය මත | 2022 ජනවාරි 31 දින වන විටත් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිව ලබාගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | තිබුණද, ඊට පටහැනිව දිනකට වාහන 06 ක් ලබාගෙන දිනකට රු.49,500ක් දක්වා ගෙවීම් කර තිබුණි. ඒ අනුව 2020 මාර්තු මාසයේ සිට 2020 දෙසැම්බර් මාසය දක්වා වූ මාස 10 ක් වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට පටහැනිව රු.4,344,280ක් වැඩියෙන් ගෙවා තිබුණි. | හෝ කටයුතු කළ යුතුය. | බස් රථ 3ක් සහ වෑන් රථ 2ක් දක්වාද පහසුකම් වැඩි කළ බව. | |
| (ච) | 2020 දෙසැම්බර් 31 දිනට අධිකාරිය සඳහා අනුමත මුළු සේවක සංඛ්‍යාව 257 ක් වූ අතර ඉන් ස්ථිර සේවක සංඛ්‍යාව 235 ක් හා කොන්ත්‍රාත් පදනම මත සේවක සංඛ්‍යාව 22 ක් විය. අධිකාරියේ ප්‍රධාන කාර්යය යටතට ගැනෙන ඔසුසල් අධීක්ෂණය, බලපත්‍ර නිකුත් කිරීම, ඖෂධ හා වෛද්‍ය උපකරණ ලියාපදිංචිය, ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කරන ඖෂධවල ගුණත්වය පරීක්ෂා කිරීම, යහපත් නිෂ්පාදන පරිචයන් (GMP) පරීක්ෂාව හා අනුමත කිරීම ඇතුළු අධිකාරියේ මෙහෙයුම් කටයුතුවල කාර්යසාධනය කෙරෙහි සෘජුවම බලපෑ හැකි බව නිරීක්ෂණය විය. | බඳවා ගැනීම් සහ අන්තර්ග්‍රහණ ක්‍රියාවලිය කඩිනමින් සිදුකළ යුතුය. | 2022 ජනවාරි 07 දිනට අධිකාරියේ ස්ථිර කාර්ය මණ්ඩලය සඳහා තනතුරු 235ක් අනුමතවී ඇති අතර, තත්‍ය කාර්යමණ්ඩලය 161 දෙනෙකු වන බව, ඉන් ස්ථිර කාර්ය මණ්ඩලය 111 ක් වන හා සහකාර ඖෂධ ඇගයීම් නිලධාරීන් 29 දෙනෙකු බඳවා ගෙන අවසන් කර ඇති බව. | 2022 ජනවාරි 31 දින වන විටත් බඳවා ගැනීම් සහ අන්තර්ග්‍රහණ ක්‍රියාවලිය මන්දගාමීව පැවතුණි. |
| (ඡ) | 2020 වර්ෂය සඳහා අධිකාරියේ සංයුක්ත සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රසම්පාදන සැලැස්ම හා වාර්ෂික අයවැය | සංයුක්ත සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රසම්පාදන සැලැස්ම හා වාර්ෂික අයවැය | මෙම සැලැසුම් විධිමත්ව පිළියෙල කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව. | 2022 ජනවාරි 31 දින වන විටත් මෙම තත්ත්වය නිවැරදි කිරීමට අවශ්‍ය |

| | | | | |
|---|---|---|---|---|
| | ලේඛනය එකිනෙකට සමගාමීව පිළියෙල කළ යුතු වුවද, එපරිදි කටයුතු කර නොතිබුණි. | ලේඛනය එකිනෙකට සමගාමීව පිළියෙල කළ යුතුය. | | ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (හ) | භාණ්ඩාගාර ලේකම් විසින් නිකුත් කර තිබුණු 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදය ප්‍රකාරව, ව්‍යවස්ථාපිත ආයතන විසින් දිගුකාලීන දැක්මක් සහිතව අදාළ පනතේ සඳහන් අරමුණු සාක්ෂාත් කරගැනීම ඉලක්ක කරගත්, ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර, අදාළ වර්ෂය සඳහා අයවැය ලේඛනය හා අභ්‍යන්තර විගණන සැලැස්ම ඇතුළත් වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කළ යුතු වුවද, 2020 වර්ෂය සඳහා අධිකාරිය විසින් ක්‍රියාකාරි සැලැස්මේ කෙටුම්පතක් පමණක් පිළියෙල කර තිබුණු අතර ඒ තුළ එම කරුණු ඇතුළත්ව නොතිබුණි. | රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ දැක්වෙන විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | මෙම සැලැස්ම විධිමත්ව පිළියෙල කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව. | 2021 වර්ෂය හා 2022 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර තිබුණු නමුත්, චක්‍රලේඛයේ සඳහන් තොරතුරු සැලැසුම්වලට ඇතුළත් කර නොතිබුණි. |
| (ළ) | තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 “න්‍යාය පත්‍රය”හා 2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් | තිරසාර සංවර්ධනය අරමුණු සඳහා ආයතනය විසින් සපුරාගත යුතු ඉලක්කයන් සඳහා සුදුසු දර්ශක හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය. | තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම පිණිස ආයතනය විසින් සපුරාගත යුතු ඉලක්කයන් පිළිබඳව විධිමත් අවධානය යොමු කරමින් කටයුතු කරන බව. | 2022 ජනවාරි 31 දින වන විටත් කිසිදු ක්‍රියාමාර්ගක් ගෙන නොතිබුණි. |

විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව, තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම පිණිස ආයතනය විසින් සපුරාගත යුතු ඉලක්කයන් හා එම ඉලක්කයන් සපුරා ගැනීම සඳහා පවතින පරතරයන් මෙන්ම ප්‍රගතිය මැන බැලීම සඳහා සුදුසු දර්ශක හඳුනාගත යුතු වුවද, අධිකාරිය විසින් එවැනි දර්ශකයන් හඳුනාගෙන අරමුණුවලින් ළඟාකරගත් ප්‍රමාණය හා බැහැරවීම් මෙන්ම අවධානය යොමු කළයුතු විවිධ ක්ෂේත්‍රයන් හඳුනාගෙන නොතිබුණි.

## 21. ජාතික ගමනාගමන කොමිෂන් සභාව

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 - තතත්ත්වාගණනය කළ මතය

2019 - තතත්ත්වාගණනය කළ මතය

2020 - තතත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 24 වන වගන්තිය අනුව මගී සේවා අවසර පත්‍ර ප්‍රදානය කිරීමට සහ අවසර පත්‍ර නිකුත් කිරීමට කොමිෂන් සභාවට බලතල ලබාදී තිබුණු අතර, 2005 ඔක්තෝම්බර් 06 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ටෙන්ඩර් කැඳවීම් සිදු කර නිත්‍ය මගී සේවා අවසර පත්‍ර නිකුත් කිරීමට අනුමැතිය ලබාදී තිබුණ ද කොමිෂන් සභාව මගී සේවා අවසර පත්‍ර නිකුත් කිරීමේ නියමිත ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණි. එසේ වුවද ටෙන්ඩර් කැඳවීම මගින් මගී සේවා අවසර පත්‍ර නිකුත් කිරීම පිළිබඳ ඇතුළත් කර පනත සංශෝධනය කිරීමට ද කොමිෂන් සභාව විසින් කටයුතු කර නොතිබුණි. | මගී සේවා බලපත්‍ර නිකුත් කිරිමට අදාළ නිසි ක්‍රමවේදයක් හඳුන්වා දී ඒ අනුව කටයුතු කළ යුතු වේ. | ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මගී සේවා අවසර පත්‍ර නිකුත් කිරීමේ නියමිත ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණි. |
| (ආ) | පනත සංශෝධනය කිරීමෙන් තොරව කොමිෂන් සභාව විසින් 2019 දෙසැම්බර් 31 දින වන විට මගී සේවා අවසර පත්‍ර 3103ක් නිකුත් කර තිබුණු | මගී සේවා අවසර පත්‍ර සම්බන්ධ නිසි ක්‍රමවේදයක් අනුව කටයුතු කළ යුතු වේ. | ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 2021 වර්ෂයේදීද පනත සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | අතර, ඉන් අවසර පත්‍ර 223 ක් ටෙන්ඩර් කැඳවීම් කර නිකුත් කර තිබුණි. බලපත්‍ර 2880ක් ටෙන්ඩර් කැඳවීම් ක්‍රමවේදයට පෙර නිකුත් කර ඇති බලපත්‍ර වන අතර ඒවා වාර්ෂිකව රු.3,000ක හා රු.15,000ක ගෙවීමක් මත අළුත් කළ යුතු බලපත්‍ර විය. මේ අනුව කොමිෂන් සභාව අනුමත ක්‍රියාපටිපාටියකින් තොරව බලපත්‍ර නිකුත් කිරීම විවිධ ක්‍රම යටතේ සිදු කර තිබුණු බව නිරීක්ෂණය විය. එසේම අධිවේගී මාර්ගයේ දිනකට අවම තාක්ෂණික අගය මත මගී සේවා අවසර පත්‍ර 61 ක් ද රු.2,500 ගාස්තු මත මගී සේවා අවසර පත්‍ර 16 ක් ද නිකුත් කර තිබුණි. | | | |
| (ඇ) | පනතේ 25 වන වගන්තිය අනුව වසරකට වැඩි කාලයක් සඳහා මාර්ග සේවා අවසර පත්‍ර ලබා දිය හැකි වුවද කොමිෂන් සභාව විසින් විශාල මගී ඉල්ලුම් සහිත අවස්ථාවල නිසි අනුමැතියකින් තොරව දෛනික ගාස්තු අය කිරීම යටතේ අධිවේගී මාර්ගය හා සාමාන්‍ය මාර්ග සඳහා බලපත්‍ර ලබා දී තිබුණි. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි | 2021 වර්ෂය අවසානය දක්වාම තාවකාලීක බලපත්‍ර නිකුත් කරමින් පැවතුණි. |
| (ඈ) | අංක පීඊඩී 12 හා 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රෙල්ඛයේ 9.12 වගන්තිය ප්‍රකාර භාණ්ඩාගාර රාජ්‍ය | භාණ්ඩාගාර අනුමැතිය මේ සඳහා ලබා ගත යුතු වේ. | මේ සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ඇත. | 2021 වර්ෂයේදීද භාණ්ඩාගාර අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව සේවක රක්ෂණ හා අනෙකුත් සුභසාධන කටයුතු සඳහා රු.6,744,070ක් වැයකර තිබුණි. | | | |
| (ඉ) | කොරෝනා වසංගතයෙන් අඩපන වූ අන්තර පළාත් බස්රථ ධාවන කටයුතු යථා තත්වයට පත් කිරීම සඳහා සහන ලබා දීමේ දී මාර්ග බලපත්‍ර ආදායම් මුළුමුනින්ම අය නොකිරීම නිසා රු.186,850,808ක ආදායමක් කොමිෂන් සභාවට අහිමි වී තිබුණි. | අදාළ කාර්යයන් ක්‍රියාත්මක කිරීමට පෙර අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ලබා ගත යුතු අතර නිසි පරිදි කැබිනට් අනුමැතියද ලබා ගත යුතු වේ. | 2020 මාර්තු, අප්‍රේල් හා මැයි මාස වලදී මගී සේවා අවසර පත්‍ර යාවත්කාලීන කිරීමේ ගාස්තු, ලොග් පත්‍ර ගාස්තු හා ප්‍රමාද ගාස්තු නිදහස් කිරීමට 49/2020 දරණ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව මගින් අනුමැතිය ලැබී ඇත. | අදාළ කාර්යයන් ක්‍රියාත්මක කිරීමට පෙර අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ලබා ගත යුතු අතර නිසි පරිදි කැබිනට් අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |
| (ඊ) | කොමිෂන් සභාව විසින් 2020 වසර තුළ ටෙන්ඩර් මඟින් නව බලපත්‍ර නිකුත් කිරීම වෙනුවට දෛනික පදනමින් බලපත්‍ර නිකුත් කිරීම නිසා ලැබිය යුතු ආදායමක් අහිමි වී තිබුණි. තවද මෙම හේතුව නිසා වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතව තිබූ බස්රථ 3040 ක සංඛ්‍යාවකින් GPS පද්ධති සවි කිරීමට බස් රථ 1,159ක් හෙවත් සියයට 38 ක සංඛ්‍යාවට පමණක් සිදුකර තිබුණි. | අදාළ නියමයන්ට අනුව බස් රථ වල GPS සවිකළ යුතු වේ. | ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අදාළ නියමයන්ට අනුව බස් රථ වල GPS සවි කර නොතිබුණි. |
| (උ) | කොමිෂන් සභාව විසින් 2019 දෙසැම්බර් 31 දිනට ගිණුම් වල ගලපා තිබූ මුළු වටිනාකම රු. 40,698,427ක් වූ වත්කම් වගකීම්, ආදායම් හා වියදම් | අදාළ උපලේඛන හා සවිස්තරාත්මක තොරතුරු නිවැරදි ලෙස ඉදිරිපත් කළ යුතු වේ. | හැකි සෑම අවස්ථාවකම උපලේඛන ජර්නලයට අමුණා ඇති අතර ඇමිණීමට නොහැකි සවිස්තරාත්මක උපලේඛන වෙනම | 2021 වර්ෂයේදීද අදාළ උපලේඛන හා සවිස්තරාත්මක තොරතුරු නිවැරදි ලෙස ඉදිරිපත් කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | වලට අදාළ ජර්නල් වවුචර් පත් විගණනයට ඉදිරිපත් නොකෙරුණු අතර 2019 දෙසැම්බර් 31 දිනට ආපසු ගෙවිය යුතු රු.59,703,404කට අදාල ටෙන්ඩර් තැනපතු ලේඛනයද විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | | ලිපිගොනුවල පවත්වාගෙන යනු ලබන අතර එම ලේඛන විගණනය වෙත ඉදිරිපත් කරන ලදී. කෙසේ වෙතත් හැකි සෑම අවස්ථාවකම උපලේඛන ජර්නලයට ඇතුලත් කිරීමට සටහන් කරගන්නා ලදී. | |
| (ඌ) | 1971 අංක 38 දරණ මුදල් පනතේ 10 (5) වගන්තිය ප්‍රකාර කොමිෂන් සභාවේ සෑම වර්ෂයක් අවසානයේදීම ඇති වන ශුද්ධ අතිරික්තය ආදායමෙන් ඉතිරි සියලුම මුදල් ඒකාබද්ධ අරමුදල වෙත බැර කළ යුතු වුවද, 2019 වර්ෂයේ රු.178,379,348ක අතිරික්තයක් තිබුණද, රු.50,000,000ක් පමණක් ඒකාද්ධ අරමුදලට බැරකර තිබුණි. | අදාල මුදල් පනතේ වගන්ති අනුව අතිරික්ත මුදල් භාණ්ඩාගාරය වෙත යැවිය යුතු වේ. | අත්‍යාවශ්‍ය අවස්ථාවන්හිදී ප්‍රයෝජනයට ගත හැකි පරිදි කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා ප්‍රතිපාදන ඉතිරි කර ගනිමින් උපරිම අරමුදල් ප්‍රමාණයක් භාණ්ඩාගාරය වෙත යැවීමට සටහන් කර ගන්නා ලදී. | අදාල මුදල් පනතේ වගන්ති අනුව අතිරික්ත මුදල් භාණ්ඩාගාරය වෙත යැවීම සිදු කර නොතිබුණි. |
| (එ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 371(2) වගන්තිය ප්‍රකාර විශේෂ කාර්යයන් සඳහා අත්තිකාරම් ලබා දිමේදී මාණ්ඩලික තත්වයේ නිලධාරීන්ට පමණක් අත්තිකාරම් ලබා දිය යුතු වුවද, ඉන් පරිභාහිර වෙනත් නිලධාරීන්ට අත්තිකාරම් ලබා දී තිබුණු බව නිරීක්ෂණය වූ අතර තත්කාර්ය අතුරු අග්‍රිම ලබාදීම එක් අවස්ථාවකදී | අදාළ මුදල් රෙගුලාසි අනුගමනය කළ යුතු වේ. | ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය අනුව අත්තිකාරම් මුදල් නිදහස් කරනු ලබන බව කාරුණිකව දන්වා සිටිමි. | මේ සම්බන්ධව වෙනම ප්‍රතිපත්තියක් සකස් කරගෙන ඒ සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | රු.100,000ක උපරිමයකට සීමා විය යුතු වුවද, එම සීමාව ඉක්මවමින් 2019 වර්ෂය තුළ අවස්ථා 22කදී, එකතුව රු.4,827,137 ක අත්තිකාරම් ලබා දී තිබුණි. | | | |
| (ඒ) | සභාව විසින් පවත්වාගෙන යනු ලබන ස්ථාවර වත්කම් ලේඛනයේ වත්කම් මිලදී ගැනීම් පමණක් සටහන් කරන අතර, එම ලේඛනයේ වත්කම් ඉවත් කිරීම් පිළිබඳ තොරතුරු ඇතුළත් කර නොතිබුණු අතර වර්ෂය තුළදී මිලදී ගෙන ඇති මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති රු.4,507,651ක් වූ වත්කම් ලේඛණයට ඇතුළත් කර නොතිබුණි. එමෙන්ම වත්කම් අයිතම 45 ක් ස්ථාවර වත්කම් ලේඛනයේ සටහන් තැබීමේදී වත්කම් සඳහා හඳුනාගැනීමේ අංකගත ක්‍රමයක් සඳහන් කර නොතිබුනු අවස්ථා නිරීක්ෂණය වූ අතර, 2019 වර්ෂය තුළදී රු.1,248,178ක් වටිනාකමින් යුත් වත්කම් අපහරණය කර තිබුණ ද, ස්ථාවර වත්කම් ලේඛනයක් නොමැති වීම හේතුවෙන් එම වත්කම්වල වටිනාකම හා ක්ෂය වෙන්කිරීම් පිළිබඳ තොරතුරු විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය. තවද මූල්‍ය ප්‍රකාශවල දැක්වෙන රු.1,269,973ක් වටිනා පුස්තකාල පොත් | නිවැරදි ලෙස වත්කම් ලේඛනය පවත්වාගත යුතු අතර නිවැරදි ලෙස යාවත්කාලීන කළ යුතු වේ. | ඉදිරියේදී එවැනි අඩුපාඩු සම්පූර්ණ කර ගැනීමට පියවර ගන්නා ලදි. | 2021 වර්ෂය අවසානය දක්වාම අදාළ කාර්යය නිසිපරිදි සිදු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | ලේඛනයක සටහන් කර නොතිබුණි. | | | |
| (ඔ) | කිලිනොච්චි බස් නැවතුම්පොල ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව මාස 12 ක කොන්ත්‍රාත් කාල සීමාවක් තුළ රු.48,773,045ක පිරිවැයකට ඉදිකිරීම සඳහා ගිවිසුමකට එළඹ තිබුණු නමුත් කොන්ත්‍රාත්කරුගේ ලියාපදිංචිය ගිවිසුම්ගත දිනය වූ 2016 දෙසැම්බර් 29 දිනට කල් ඉකුත් වී තිබුණි. එසේම මෙම කොන්ත්‍රාත්කරු විසින් ඉදිකිරීම් කටයුතු පැහැර හැර තිබුණද 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.11.4 සහ 5 වගන්තිය ප්‍රකාරව පැහැර හැර ඇති කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට එම කොන්ත්‍රාත්කරුගේ නම ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණු අතර නිම කරනලද වැඩ වෙනුවෙන් කොන්ත්‍රාත්කරුට රු.16,469,363ක් ගෙවීම්ද කර තිබුණි. මේ හේතුවෙන් නියමිත ලෙස අදාළ වැඩ නිම නොකිරීම නිසා මහජනතාවට බස් නැවතුම පරිහරණය කිරීමට තිබූ අවස්ථාව මගහැරී ඇති අතර කොන්ත්‍රාත්කරුට ගෙවා තිබූ ඉහත සඳහන් මුදල අනාර්ථික වියදමක් බව නිරීක්ෂණය විය. එසේම මෙම ඉදිකිරීම උතුරු පළාත් සභාවට | කොන්ත්‍රාත් පිරිනැමීමේ දී ICTAD ආයතනය මගින් නිකුත් කළ මාර්ගෝපදේශ අනුව ගිවිසුම්ගත විය යුතු අතර එම කොන්දේසි අනුව ක්‍රියාකළ යුතුය. | අධ්‍යක්ෂ මණ්ඩල තීරණයන්ට අනුව කිලිනොච්චි බස් නැවතුම්පොල උතුරු පළාත් සභාවට භාර දීමට අදාල සියලු ලියකියවිලි, කමිටු වාර්තා, භාරදීමේ ලිපිය ජාගකොස පාර්ශවයෙන් අත්සන් තබා ඉදිරි කටයුතු සඳහා උතුරු පළාත් සභාව වෙත යොමු කර ඇත. | 2021 වර්ෂය අවසානය දක්වාම අදාළ කාර්යය නිසිපරිදි උතුරු පළාත් සභාවට භාරදී නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | තවදුරටත් ඉදිකිරීම් කිරීම සඳහා භාරදීමට සැලසුම් කළද, 2020 ජුනි 30 තෙක් උතුරු පළාත් සභාව විසින් භාරගෙන නොතිබුණි. | | | |
| (ඕ) | 2019 සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව බස්රථ ගාස්තු සඳහා පෙර ගෙවුම් කාඩ් ක්‍රමයක් හඳුන්වාදීමට සැලසුම් කර තිබුණද එය ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි. | ක්‍රියාකාරී සැලැස්ම අනුව වර්ෂය තුළ ක්‍රියාත්මක විය හැකි ප්‍රමාණයද දැක්විය යුතු අතර, දක්වා ඇති සැලැස්මේ කටයුතු වර්ෂය තුළ ක්‍රියාත්මක කළ යුතු වේ. | ඒ අනුව 2019 වර්ෂය තුළ මෙම ව්‍යාපෘතිය සිදුකරන ආකාරය සම්බන්ධව සියළු පාර්ශවකාර ආයතන අතර සාකච්ඡා 12ක් පවත්වා ඇති අතර මේ වන විට මෙම ව්‍යාපෘතිය කඩිනමින් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | 2021 වර්ෂය අවසානය දක්වාම අදාළ කාර්යය නිසිපරිදි සිදු කර නොතිබුණි. |

## 22. ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 - තතත්ත්වාගණනය කළ මතය

2019 - තතත්ත්වාගණනය කළ මතය

2020 - තතත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනත සංශෝධනය කිරීම 2008 වර්ෂයේ දී ආරම්භ කර තිබුණ ද 2020 දෙසැම්බර් 31 දින වන තෙක් අදාල සංශෝධන පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | පනතෙහි සංශෝධන සිදුකර පාර්ලිමේන්තු අනුමැතිය ලබාගත යුතුය. | අවසාන කෙටුම්පත මේ වන විට අමාත්‍යාශයේ නීති අංශය වෙත බාර දී ඇත. | අවශ්‍ය පරිදි සංශෝධන සහිතව පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම 2021 වර්ෂය අවසානය දක්වාම ප්‍රමාද වී තිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ.104 (I) ප්‍රකාරව 2018 වර්ෂයේ සිට 2020 අගෝස්තු දක්වා වාහන අනතුරු 11 ක් සම්බන්ධයෙන් මූලික පරීක්ෂණ සිදුකර නොතිබුණි. | මුදල් රෙගුලාසිවල සඳහන් විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. | මූලික පරීක්ෂණ පැවැත්වීමට අදාල කටයුතු කඩිනමින් සිදුකිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත. | සමහරක් මූලික පරීක්ෂණ පවත්වා ඇතත් ඉතිරි මූලික පරීක්ෂණ පැවැත්වීමට කටයුතු කර නැත. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ.104 (4) ප්‍රකාරව 2015 සිට 2017 වර්ෂයට අදාල වාහන අනතුරු 33 ක් සම්බන්ධයෙන්ද 2018 සිට 2020 අගෝස්තු දක්වා වාහන අනතුරු 31 ක් සම්බන්ධයෙන්ද පූර්ණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසිවල සඳහන් විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. | පූර්ණ වාර්තා සකස් කිරීමට අදාල කටයුතු සිදු කරමින් පවතී. | පූර්ණ වාර්තා සකස් කර ඉදිරිපත් කිරීමට කටයුතු කර නැත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ.110 ප්‍රකාරව හානි හා පාඩු ලේඛනය යාවත්කාලින කර නොතිබුණි. | මුදල් රෙගුලාසිවල සඳහන් විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. | පරිපාලන අංශයට අදාල තොරතුරු ලබාගැනීම සඳහා එම අවශ්‍යතාවය පිළිබඳ දැනුවත් කර ඇත. | 2021 වර්ෂය අවසානය දක්වාම ලේඛනය යාවත්කාලීන කර නැත. |
| (ඉ) | 2020 පෙබරවාරි 13 දිනැති ආපදා අවදානම් අවම කිරීමේ ව්‍යාපෘති සම්බන්ධ උපදෙස් මාලාවේ (1) ඡේදය පරිදි රාජ්‍ය ආයතනවලට අවදානම අවම කිරීම සඳහා ප්‍රමාණවත් භෞතික හා මූල්‍ය සම්පත් නොමැති බවට එම ආයතන විසින් සහතික කර ඉල්ලීමක් කළ යුතු වුවත්, එවැනි ඉල්ලීම් කිරීමකින් තොරව රු. මිලියන 30 ක් ව්‍යාපෘති 26 ක් සඳහා විවිධ රාජ්‍ය ආයතනවලට ලබාදී තිබුණි. | ව්‍යාපෘති සම්බන්ධ උපදෙස් පරිදි කටයුතු කළ යුතු වේ. | දිස්ත්‍රික් ලේකම් විසින් ඉදිරිපත් කරනු ලබන ව්‍යාපෘති ජාතික මට්ටමින් ප්‍රමුඛතා ගත කර ප්‍රතිපාදන ලබාදීම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මඟින් සිදුකරනු ලබයි. ඒ අනුව එම ව්‍යාපෘති 26 සඳහා ප්‍රතිපාදන ලබා දී ඇත. | ඉල්ලීම් ලබා ගැනීමට ක්‍රියාපිළිවෙතක් සකස් කර නැත. |

## 23. ජාතික තරුණ සේවා සභාව

| | |
|---|---|
| මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය | 2018 - තතත්ත්වාගණනය කළ මතය |
| | 2019 - තතත්ත්වාගණනය කළ මතය |
| | 2020 - තතත්ත්වාගණනය කළ මතය |

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | ජාතික තරුණ සේවා සභාවේ සියයට 98 ක කොටස් හිමිකාරත්වයක් ඇතිව, සී/ස ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම 1981 වර්ෂයේදී ආරම්භ කර තිබුණද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබූ අතර සමාගම විසින් 2017 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශන සකස් කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන දිනට සී/ස ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගමේ මූල්‍ය තොරතුරු සමග ඒකාබද්ධ කර ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතුය. | ඉදිරියේදී ගිණුම් ඒකාබද්ධ කිරීමට හැකි වන පරිදි තරුණ සේවා සමාගමේ ගිණුම් යාවත්කාලීන වන පරිදි අවශ්‍ය ගිණුම් සකස් කරන ලෙස දැනටමත් කළමණාකරණය වෙත දැනුම් දී ඇත. | වර්තමානය වන විටත් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොමැති අතර සමාගම විසින් 2018 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශන සකස් කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් 2020 වර්ෂය අවසානයට සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු පිරිවැය රු.1,433,003,346ක් වූ වත්කම් වර්ග 03 ක් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව, ඇතිවූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කළ යුතුය. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 අනුව වත්කම් ප්‍රත්‍යාගණනය කර ඉදිරියේදී දළ ධාරණ අගය හෙළිදරව් කිරීමට කටයුතු කරමින් පවතී. | 2021 වර්ෂය අවසානය වන විටත් ප්‍රත්‍යාගණනය කර ගිණුම්වලට ගැනීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | | | |
| (ඇ) | 2018 වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ස්කන්ධය යටතේ රජයේ ප්‍රදාන හා විදේශ රාජ්‍ය වලින් ලැබී තිබූ ප්‍රදාන වශයෙන් රු. 5,298,332,712ක ප්‍රාග්ධන ප්‍රදාන දක්වා තිබුණ ද ඒවා ක්‍රමානුකූල පදනමක් යටතේ ආදායම් ලෙස හඳුනාගැනීම සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුනාගෙන නොතිබුණි. | රජයේ ප්‍රදාන ක්‍රමානුකූල පදනමක් යටතේ විලම්භිත ආදායම් ලෙස හඳුනාගැනීමට කටයුතු කළ යුතුය. | ක්‍රමක්ෂය පදනමක් මත අදාල වත්කම් ක්‍රමක්ෂය කිරීමට කටයුතු කර නැත. | 2021 වර්ෂය අවසානය වන විටත් රජයේ ප්‍රදාන හා පරිත්‍යාග ක්‍රමානුකූල පදනමක් යටතේ ආදායම් ලෙස හඳුනාගැනීම සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුනාගෙන නොතිබුණි. |
| (ඇ) | ගිවිසුම්ගත වටිනාකම පිළිවෙලින් රු. 73,007,519ක් හා රු. 68,903,239 ක් වූ ත්‍රිකුණාමලය ලව්ලේන් පුහුණු මධ්‍යස්ථානය හා දඹුල්ල ස්විස් පුහුණු මධ්‍යස්ථානය නවීකරණය හා වැඩිදියුණු කිරීමේ කර්මාන්තවලට අදාල ප්‍රගතිය පහත් මට්ටමක පැවතීම හේතුවෙන් 2018 වර්ෂයේදී කොන්ත්‍රාත් ගිවිසුම් අවලංගු කර තිබුණද කොන්ත්‍රාත්කරු අසාධු ලේඛනගත කිරීම සම්බන්ධයෙන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ලැබී ඇති ප්‍රතිපාදන භාවිත කර ව්‍යාපෘති කටයුතු ආරම්භ කිරීම කළ යුතු අතර ප්‍රමාදයන් වළක්වා පුහුණු මධ්‍යස්ථානවල පුහුණු වැඩසටහන් නියමිත පරිදි පැවැත්වීමට කටයුතු කල යුතුය. | අයවැයෙන් ජාතික තරුණ සේවා සභාවට ලැබෙන ප්‍රතිපාදනද පරීක්ෂා කර බලා ව්‍යාපෘති දෙක ක්‍රියාත්මක කරන බව දක්වා තිබුණි. අසාධු ලේඛනගත කිරීම සම්බන්ධයෙන් රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ඉදිරියේදී දැනුම්දෙනු ලැබේ. | 2021 වර්ෂය අවසානය වන විටත් මෙම කොන්ත්‍රාත් 2 ඉදිකිරීම සඳහා වෙනත් කොන්ත්‍රාත්කරුවෙකුට ප්‍රදානය කරනොතිබූ අතර කොන්ත්‍රාත්කරු අසාදු ලේඛනගත කිරීමටද කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | ජාතික තරුණ සේවා සභාවේ 2016 පෙබරවාරි 11 දිනැති අංක 02/2016 දරන චක්‍රලේඛයට පටහැනිව බෙල්වුඩ් සෞන්දර්ය නිකේතනය නවීකරණය හා නව ඉදිකිරීම පිළිගත හැකි පදනමකින් තොරව අදියර I සහ අදියර II වශයෙන් පිළිවෙලින් රු. මිලියන 99.66 ක් හා රු. මිලියන 97.79 ක් වශයෙන් කොටස් දෙකකට ඛණ්ඩනය කර 2017 වර්ෂයේ අවස්ථා දෙකකදී දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන මණ්ඩල අනුමැතිය යටතේ එකම කොන්ත්‍රාත්කරුවකු වෙත ප්‍රදානය කර තිබුණි. මෙම නිසා කොන්ත්‍රාත් කටයුතුවල කාර්යසාධනය පහළ මට්ටමක පැවතුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතු අතර නියමිත කාලය තුළදී කොන්ත්‍රාත් නිමකරවා ගැනීමට නිසි අධීක්ෂණයකින් යුතුව කටයුතු කළ යුතුය. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ “රජයේ ප්‍රසම්පාදන කාර්යයන් වේගවත් කිරීම” පදනම් කොට ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කර බෙල්වුඩ් අදියර 11 කොන්ත්‍රාත්තුව 2017 දෙසැම්බර් 30 දින ප්‍රදානය කර ඇත.<br>අදියර I ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීමේ කටයුතු 2017 සැප්තැම්බර් මස ආරම්භ කර ඇති අතර 2018 ජනවාරි මස අදියර II ට අදාල මූලික වැඩ ආරම්භ කර ඇත. | 2021 වර්ෂයේදීද වන විටත් ප්‍රසම්පාදන නීතිවලට පටහැනිව ක්‍රියා කිරීම සම්බන්ධයෙන් කිසිදු පියවරක් ගෙන නොතිබුණි. කොන්ත්‍රාත්තුව මන්දගාමීව සිදුවීම හේතුවෙන් අසාදුගත කිරීමට කටයුතු කර නොතිබුණු අතර කොන්ත්‍රාත් ආයතනය බැංකු ඇපකර අයකරගැනීම වලක්වමින් බස්නාහිර දිසාඅධිකරණයේ නඩු පවරා ඇත. |
| (ඊ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ IV වන පරිච්ඡේදයේ 3.3 ඡේදය අනුව, අනුමත බඳවා ගැනීමේ පරිපාටිය අනුව ස්ථිර නිලධාරීන් පත් කිරීමට පියවර ගත යුතු වුවද මාස 09 සිට වසර 04 කට අධික කාලයක සිට සහකාර තරුණ සේවා නිලධාරීන් 14 දෙනෙකු හා කළමනාකාර සහකාර (තාක්ෂණික නොවන) නිලධාරියෙකු අනියම් පදනම යටතේ පත් කර තිබුණි. ඉන් 11 දෙනෙකුට බඳවා ගැනීමේ | බඳවා ගැනීමේ පරිපාටියේ සුදුසුකම් අනුව නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. | සභාවේ අවශ්‍යතාව මත 2014 වර්ෂයේදී අනියම් පදනමින් බඳවාගෙන ඇත. සුදුසුකම් සම්පූර්ණ කර නොමැති නිලධාරීන් සම්බන්ධයෙන් අමාත්‍යාංශයෙන් උපදෙස් ඉල්ලා ඇති නමුත් උපදෙස් ලැබී නැත. | සුදුසුකම් නොසලකා හැර වර්තමානය වන විට පත්වීම් ස්ථිර කර තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | පරිපාටියේ සඳහන් මූලික සුදුසුකම් හෝ නොතිබුණි. | | | |
| (උ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 5.2.1 වගන්තිය ප්‍රකාරව, මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරුවල පුරප්පාඩු නොපමාව පිරවීමට දෙපාර්තමේන්තු ප්‍රධානියා පත්වීම් බලධාරියාට දැනුම්දීමක් කළ යුතු වුවද, එසේ කර නොතිබුණු අතර 2011 වර්ෂයේ සිට සභාවේ පුරප්පාඩුව පැවති සහකාර අධ්‍යක්ෂ තනතුරු 28 ක් සඳහා දිස්ත්‍රික් තරුණ සේවා නිලධාරීන් 21 දෙනෙකු හා මූල්‍ය නිලධාරී එම තනතුරු වල රාජකාරී ඉටු කිරීමේ පදනම මත 2017 වර්ෂයේ සිට පත් කර තිබුණි. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ උපදෙස් පරිදි පුරප්පාඩු පවතින තනතුරු සඳහා සුදුසු නිලධාරීන් බඳවාගැනීමට කටයුතු කළ යුතුය. | පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාගැනීමට ලිපියක් ඉදිරිපත් කර ඇත. අනුමැතිය ලද වහාම අදාළ පුරප්පාඩු සම්පූර්ණ කිරීමට බලාපොරොත්තු වේ. | 2021 වර්ෂය අවසානය වන විටත් මෙම පුරප්පාඩු තනතුරු ස්ථිර ලෙස බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඌ) | ශ්‍රී ලංකා තාරුණ්‍යයේ කාලීන අවශ්‍යතාවය හා වුවමනාවන් අවස්ථානුකූලව කළමනාකරණය ඇතුළු ප්‍රධාන අරමුණු 05 ක් යටතේ ජාතික තරුණ සේවා සභාව විසින් 2019 මාර්තු 26 දින දෙබරවැව මහජන ක්‍රීඩාංගණයේ දී යොවුන්පුර වැඩසටහන පැවැත්වීමට සැලසුම් කර තිබුණි. එහෙත් ඊට පටහැනිව ප්‍රදර්ශනාත්මක හා විනෝදකාමී අංගයන්ට | සභාව විසින් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී ආර්ථික බව හා ඵලදායී බව පිළිබඳ අවධානය යොමු කර වියදම් දැරීම් සිදුකළ යුතුය. | මෙම වියදම් දැරීමට හේතුවූයේ අක්කර 110 ක භූමි ප්‍රදේශයක් තුළ වැඩ සටහන පැවැත්වීම, ජාත්‍යන්තර වැඩසටහන් වලදී සිහිවටන ලබාදීම, තරුණ තරුණියන්ගේ උද්යෝගය වැඩි කිරීම, අග්‍රාමාත්‍යවරයාගේ සහභාගීත්වය හා විශාල මහජන නියෝජිතයින් හා ඉහළ මට්ටමේ රාජ්‍ය නිලධාරීන් සහභාගී වීම | ඵලදායී හා ආර්ථික තත්ත්වය පිළිබඳ සැලකිල්ලක් නොදැක්වීම සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | ප්‍රමුඛතාවය ලබා දෙමින් තොරණ් 03 ක් ඉදිකිරීම, දින 05 ක් පුරා රාත්‍රී සංගීත ප්‍රසංග පැවැත්වීම, තාවකාලික සිනමා ශාලා ඉදිකිරීම යනාදී යොවුන්පුර වැඩසටහනේ අරමුණු සමග ඍජු සම්බන්ධතාවයක් නොමැති කාර්යයන් වෙනුවෙන් එකතුව රු.40,593,305ක් වැයකර තිබුණි. | | විදේශීය තරුණයින් සහභාගී වීම නිසාත් ඔවුන්ට අවශ්‍ය පහසුකම් සැලසීම ලෙසත්ය. | |
| (එ) | 2018 හා 2019 වර්ෂයේ පවත්වන ලද යොවුන්පුර වැඩසටහන සඳහා අනුමත ඇස්තමේන්තු ගත පිරිවැය රු. මිලියන 350 ක් වුවද, එය ඉක්මවා රු.80,560,914ක් වැය කර තිබුණි. මෙම වැඩසටහනට අවශ්‍ය ගබඩා ඩෝම්ස් දෙකක් කුලී පදනම මත ලබා ගැනීම සඳහා වූ ප්‍රසම්පාදන ක්‍රියාවලියට පරිබාහිරව, ලබා ගැනීම සඳහා අනුමැතිය ලබා දී තිබුණි. එම ඩෝම්ස් සඳහා ඇණවුම් කළ දින ප්‍රමාණය ඉක්මවා දින 8 සිට දින 10 දක්වා කාලයක් භාවිතා කළ බව සඳහන් කරමින් එකතුව රු.2,227,400ක් වැඩිපුර ගෙවා තිබුණි. | මෙම කටයුත්තේදී සභාවට යම් අලාභයක් සිදුවී තිබේද යන්න සහ එසේ අලාභ සිදුවී තිබේනම් එම අලාභ අයකරගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | විගණන විමසුමට ලක්වී ඇති කරුණු පිළිබඳ විධිමත් පරීක්ෂණයක් සිදුකර අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව දැනුම් දී ඇත. | 2021 වර්ෂය අවසානය වන විටත් විධිමත් පරීක්ෂණයක් සිදුකර නොතිබුණි. |
| (ඒ) | සභාවේ නිල නිවාස භාවිතා කරන නිලධාරීන් 90 දෙනෙකුගෙන් ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 5.4, 5.4.1, 5.5, 5.7 හා 5.8 | සභාවට අයත් නිල නිවාසවල පදිංචිව සිටින නිලධාරීන්ගෙන් ආයතන සංග්‍රහයට අනුව අයවිය යුතු මුදල් | මුදල් අයවීම් සම්බන්ධයෙන් ප්‍රගතිය සාර්ථක තත්ත්වයක නොමැති හෙයින්, ඒ පිළිබඳව විවිධ ගැටළු, ප්‍රශ්න නිලධාරීන් විසින් යොමුකරමින් සිටින | 2021 වර්ෂය අවසානය වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | උප වගන්ති හා 2016 අගෝස්තු 26 දිනැති අංක 04/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පරිදි අදාල නිලධාරියාගේ වැටුපෙන් නිවාස කුලී හා ජලය හා විදුලිය භාවිතා කිරීම වෙනුවෙන් ගාස්තු අයකිරීම සිදු කර නොතිබුණි. 2020 වර්ෂය තුළ දී පමණක් නිළධාරීන් 46 දෙනෙකුගෙන් රු.1,878,238ක පමණ නිවාස කුලියක් අයවිය යුතුව තිබුණි. | අයකරගැනීම සහ ඊට අදාල අනෙකුත් ගැටළු සම්බන්ධයෙන් කඩිනම් ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. | අතර, ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට අනුව අදාළ නිල නිවාසවල පවතින පහසුකම් හා තත්ත්වයන් පිළිබඳව පැහැදිලි කර ගැනීමක්ද කළයුතු දැයි විශ්වාස කරන අතර, එයද අදාළ කමිටුව වෙත යොමුකර වඩාත් සාධාරණවූ තීරණයක් ගත යුතුව ඇති බැව් නිරීක්ෂණය කරමි. | |
| (ඔ) | ජාතික තරුණ සේවා සභාවේ සභාපතිගේ සභාපතිත්වයෙන් හා සභාවේ ස්ථිර වැටුප් ලබන නිලධාරීයකු පූර්ණකාලීනව සේවයේ යොදවමින් සභාව තුළ ක්‍රීඩා සමාජයක් පවත්වාගෙන යනු ලබන අතර එහි පුහුණුවීම් කටයුතු සඳහා කිසිදු ගාස්තුවක් ගෙවීමකින් තොරව සභාවේ සම්පත් උපයෝගී කර ගෙන තිබුණි. ක්‍රීඩා සමාජයේ කටයුතු වෙනුවෙන් ක්‍රීඩා උපදේශකවරුන් සහ සභාවේ නිලධාරියකු වෙත 2019 වර්ෂය තුළ එකතුව රු.2,621,130ක් සභාවේ අරමුදලින් වැයකර තිබුණි. එහෙත් 2019 වර්ෂය නිම වන විට වර්ෂයට අදාළ සාමාජික ගාස්තු ලෙස රු.5,518,150ක් ක්‍රීඩා සමාජය අය කර තිබූ අතර එකතුව රු. | ක්‍රීඩා සමාජයේ පරිපාලන කටයුතු විධිමත් කිරීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. | ජාතික තරුණ සේවා සභාව පරිශ්‍රයේ පවත්වාගෙන යන ක්‍රීඩා සමාජයේ පරිපාලන හා මූල්‍ය කටයුතු විධිමත්ව සිදුනොවන බැවින්, ක්‍රීඩා සමාජයේ කටයුතු ප්‍රතිව්‍යුහගත කිරීමට කටයුතු කරමින් පවතී. | 2021 වර්ෂය අවසානය වන විටත් ක්‍රීඩා සමාජයේ මූල්‍ය පාලන කටයුතු විධිමත් කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | 10,157,722 ක ස්ථාවර තැන්පතු හා රු.7,104,863ක ඉතිරිකිරීම් පැවතියද එහි මූල්‍ය කටයුතු සභාවේ පාලනයකින් තොරව පවත්වා ගෙන යනු ලබන බව නිරීක්ෂණය විය. | | | |
| (ඕ) | ජාතික තරුණ සේවා සභාවේ විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මට අනුව පාඨමාලා ගාස්තු සම්බන්ධ ප්‍රතිපත්තියක් සංවර්ධනය කිරීම අරමුණු කර තිබුණද 2019 වර්ෂය අවසන් වන විටත් පාඨමාලා ගාස්තු සම්බන්ධයෙන් නිශ්චිත ප්‍රතිපත්තියක් හඳුන්වා දී නොතිබූ අතර සභාව යටතේ වූ පුහුණු මධ්‍යස්ථානවල ක්‍රියාත්මක වන එකම පාඨමාලාව සඳහා විවිධ ගාස්තු අයකරමින් පාඨමාලා ආරම්භකර ක්‍රියාත්මක කර තිබුණි. | පාඨමාලා ගාස්තු අයකිරීමට අදාලව විධිමත් ක්‍රමවේදයක් ක්‍රියාත්මක විය යුතුය. | ජාතික තරුණ සේවා සභාව මගින් ක්‍රියාත්මක කරනු ලබන පූර්ණ කාලීන පාඨමාලා, අර්ධ කාලීණ පාඨමාලා සහ කෙටි කාලීණ පාඨමාලා 2020 දෙවන අධ්‍යයන වාරයේ සිට ස්වාධීනකරණය කර නිශ්චිත පාඨමාලා ප්‍රමාණයක් නිශ්චිත ගාස්තුවක් යටතේ ක්‍රියාත්මක කිරීමට මේ වන විට කෙටුම්පත් කර ඇති අතර 2020 දෙවන අධ්‍යයන වාරයේ සිට ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමින් පවතී. | 2021 වර්ෂයේදීද ගාස්තු අය කිරීම සම්බන්ධව ප්‍රතිපත්තියක් හඳුන්වා දී නොතිබුණි. |
| (ක) | සභාව විසින් 2018 වර්ෂයේදී තුරුණු ශ්‍රම ශක්ති ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති 1,100 ක් ආරම්භ කර 2018 නොවැම්බර් 15 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. 2018 හා 2019 වර්ෂ වලදී මෙම ව්‍යාපෘති සඳහා රු.206,477,640ක් වැයකර තිබුණ ද 2019 ජූලි 31 වන විට එම ව්‍යාපෘතිවලින්, ව්‍යාපෘති 185ක් ක්‍රියාත්මක කර නොතිබූ අතර ව්‍යාපෘති 471ක වැඩ නිම කර නොතිබුණි. | සභාව විසින් ක්‍රියාත්මක කරන විශේෂ ව්‍යාපෘති විධිමත් පරිදි සැලසුම්කර මනා අධීක්ෂණයක් යටතේ ක්‍රියාත්මක කිරීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු විය යුතුය. | 2018 වර්ෂයේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාද වී ලැබීම හේතුවෙන් 2018 අගෝස්තු 31 දින නිදහස් කර ඇත්තේ මිලියන 50 ක් පමණි. එම හේතුවෙන් ඇතැම් තෝරාගත් ව්‍යාපෘති ආරම්භ කිරීමේ ප්‍රමාදයක් සිදුවී ඇත. | 2021 වර්ෂය අවසානය වන විටද ව්‍යාපෘති 185 ක් ආරම්භ කර නොතිබූ අතර ව්‍යාපෘති 286 ක වැඩ නිමකර නොතිබුණි. මෙම ව්‍යාපෘති සම්බන්ධයෙන් අධීක්ෂණ කටයුතු වර්තමානයේ සිදු නොවන බව නිරීක්ෂණය විය. |

| | | | | |
|---|---|---|---|---|
| (ග) | සභාවේ විශේෂ ව්‍යාපෘති අංශය විසින් ඉදිරිපත් කර තිබූ 2019 ජුනි 6 දිනැති ප්‍රගති වාර්තාව අනුව 2017 වර්ෂයේදී රු.406,843,820ක් වැයකර තුරුණු ශ්‍රම ශක්ති ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති 3000 ක් ක්‍රියාත්මක කර තිබුණි. ඉන් ව්‍යාපෘති 66 ක් ක්‍රියාත්මක කර නොතිබුණු අතර වැඩ අවසන් කර නොතිබූ ව්‍යාපෘති 206 න් ව්‍යාපෘති 47ක භෞතික ප්‍රගතිය සියයට 75ක් හෝ ඊට අඩු අගයක් ගෙන තිබුණි. | විශේෂ ව්‍යාපෘති ආරම්භ කිරීමේ අරමුණ ඉටුවන පරිදි සැලසුම් පිළියෙල කර නිසි අධීක්ෂණයක් යටතේ ක්‍රියාත්මක විය යුතුය. | ප්‍රජා දායකත්වය යෞවන සමාජය වෙත නිසි පරිදි නොලැබීම, භෞතික හා මූල්‍ය සම්පත් ලැබීම ප්‍රමාද වීම. ස්වාභාවික ආපදා තත්ත්වයක් යන කරුණු නිසා නතර වී ඇති බව නිරීක්ෂණය විය. නිලධාරීන්ගේ අකාර්යක්ෂම හෝ වංචනික කටයුතු හේතුවෙන් ක්‍රියාත්මක නොවී ඇති බව වාර්තාවන නිලධාරීන් සම්බන්ධව විනය ක්‍රියාමාර්ග ගැනීමට අදාල අංශ වෙත යොමු කරමින් සිටී. | 2021 වර්ෂය අවසානය වන විට මෙම ව්‍යාපෘති සම්බන්ධයෙන් අධීක්ෂණයක් සිදු නොවේ. |
| (ඝ) | 2017 අප්‍රේල් 19 දිනැති අංක 03/2017 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි 04 වන ජේදයේ සඳහන් අවශ්‍යතාවය ඉටුවන පරිදි සභාවේ පුහුණු මධ්‍යස්ථාන හා කාර්යාල 28 ක වේලා සටහන් යන්ත්‍ර සවිකර නොතිබූ අතර 2013 වර්ෂයේ දී රු.2,467,298ක් වැයකර පුහුණු මධ්‍යස්ථාන වල සවි කර තිබූ යන්ත්‍ර 56 කින් යන්ත්‍ර 53 ක් ක්‍රියා විරහිතව තිබීම හේතුවෙන් අදාළ වියදම නිෂ්කාර්යය වියදමක් බවට පත් වී තිබුණි. | අදාළ චක්‍රලේඛ විධිවිධාන වලට අනුගතව කටයුතු කළ යුතු අතර සවිකර තිබූ යන්ත්‍ර ක්‍රියාවිරහිත වීම සම්බන්ධයෙන් කළමනාකරණයේ අවධානය යොමු කළ යුතුය. | ක්‍රියා විරහිත තත්ත්වයේ පවත්නා යන්ත්‍ර අළුත්වැඩියා කිරීමටත් මෘදුකාංග ඇතුළත් කිරීමටත්, මෘදුකාංග සම්බන්ධයෙන් පවත්නා තාක්ෂණික දෝෂ නිරවුල් කිරීමටත්, සවි නොකර ඇති යන්ත්‍ර සවිකිරීමට අදාළ සැපයුම්කරු වෙත දැනුම් දී ඇති අතර පළාත් මට්ටමින් එම කටයුතු සිදුකරවා ගැනීමට සැලසුම් කර ඇත. තවද, මෙම ප්‍රසම්පාදනයේ ඉටුකරවා ගැනීමට ඇති කාර්යය වටිනාකම වෙනුවෙන් කාර්යසාධන ඇපකරයක් ලබාගැනීම සඳහා කටයුතු කරමින් පවතී. | 2021 වර්ෂය අවසානය වන විටත් පුහුණු මධ්‍යස්ථාන 28 හි මධ්‍යස්තාන ඇඟිලි සලකුණු සටහන් යන්ත්‍ර සවිකර නොමැති බවත් සැපයුම්කරුවන්ගේ කාර්ය සාධන ඇපකරය ලබා ගැනීමට කටයුතු කර නොමැති බවත් නිරීක්ෂණය විය. |
| (ප) | ජාතික තරුණ සේවා සභාව මගින් ක්‍රියාත්මක කරන ලද ඉදිකිරීම් කොන්ත්‍රාත් 16 කට | ප්‍රමාණ පත්‍රිකාවේ ගෙවීම් කිරීමේ ක්‍රමවේදය අනුව ගෙවීම් කළ යුතුය. | සෑම ඉදිකිරීම් ව්‍යාපෘතියකටම අදාලව කොන්ත්‍රාත් ගිවිසුම් මගින් දෙපාර්ශවය ගිවිසගත් | ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ නියෝජ්‍ය |

| | | | | |
|---|---|---|---|---|
| | අදාලව ප්‍රමාණ පත්‍රිකාවේ ගෙවීම් කිරීමේ ක්‍රමවේදය අනුව "අදාල ලේඛන භාරදීමෙන් පසුව එම රක්ෂණාවරණ සහ සුරක්ෂණ හා බැඳුම්කර ලබාගැනීමට දරන ලද සත්‍ය පිරිවැය මත සියයට 5 ක වට්නාකමක් එකතු කර ගෙවීම් කිරීම" ලෙස සඳහන් කර ඇතත් එය නොසලකා හරිමින් කොන්ත්‍රාත්කරුවාගේ ශ්‍රමිකයන් සඳහා වන වන්දි රක්ෂණාවරණය සඳහා එකතුව රු.1,147,245ක් වැඩිපුර ගෙවා තිබූ අතර කොන්ත්‍රාත්කරුගේ ලංසු වටිනාකම මත එකතුව රු.4,253,750ක් ගෙවා තිබුණි. | | අයිතමයට අදාළ මිල වටිනාකම පමණක් ගෙවීම් කර ඇත. ගෙවීම් ක්‍රමවේදයේ නිවැරදිතාවය වැඩිදුරටත් තහවුරු කර ගැනීම සඳහා 2021/03/29 දින ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ වෙත ලිපියක් යොමු කරන ලදි. | අධ්‍යක්ෂකගෙන් ලද ලිපිය ප්‍රකාරව ප්‍රමාණ පත්‍රිකාවේ ගෙවීම් කිරීමේ ක්‍රමවේදය අනුව ගෙවීම් කළ යුතු බව සඳහන් කර ඇත. අදාල වැඩිපුර ගෙවීම් මෙතෙක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (බ) | 2020 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව 1449 ක් වුවද, එදිනට පුරප්පාඩු තනතුරු 294 ක් වූ අතර ඉන් මාණ්ඩලික තනතුරු 35 ක් වසර 03 කට අධික කාලයක සිට පුරප්පාඩුවී පැවතුණි. | අනුමත තනතුරු සඳහා සුදුසු නිලධාරින් බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. | කළමනාකරණය විසින් පවතින තත්ත්වය සැලකිල්ලට ගෙන කටයුතු කර නැත. | 2021 වර්ෂය අවසානය වන විටත් එම මාණ්ඩලික තනතුරු සඳහා බඳවා ගැනීමට විධිමත් පියවර ගෙන නොතිබුණි. |

## 24. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 - තතත්ත්වාගණනය කළ මතය

2019 - මතය වියාචනය කිරීම

2020 - තතත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | කුරුණෑගල දිස්ත්‍රික්කයේ ජන උදාන ඉඩම් විකුණුම් යටතේ රු.මිලියන 4.36ක් අයවීමට ඇති අතර රත්නපුර ගල්කඩුවවත්ත ඉඩම වෙනුවෙන් නාගරික සංවර්ධන අධිකාරියෙන් අයවිය යුතු මුදල රු.මිලියන 8.69 ක් විය. එසේම අධිකාරිය සතු රු. මිලියන 11.28ක් වටිනා වාහන 05 ක් ගිවිසුමකින් තොරව 1991 වර්ෂයේ සිට රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත ලබාදී තිබූ අතර, එම වාහන වෙනුවෙන් 2014 දෙසැම්බර් මාසයෙන් පසු අයවිය යුතු රු.854,056 ක් අධිකාරිය වෙත ලැබී නොතිබුණි. | ලැබිය යුතු ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කල යුතුය. | රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවෙන් ලැබිය යුතු මුදල් එම සංස්ථාවට ගෙවිය යුතු මුදල් වලින් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. | එම ශේෂ 2021/12/31 දින දක්වා අයකරගෙන නොතිබුණි. |
| (ආ) | 80/90 දශකය තුළ අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගම්මාන 12 කට අදාල බදු පදනම යටතේ ලබාදුන්, හෙක්ටයාර් 60.59 ක්වූ ජන උදාන ඉඩම් කොටස් 413ක තක්සේරු වටිනාකම රු.මිලියන 13.48ක් වූ අතර මෙම මුදල් අයකරගෙන ප්‍රතිලාභීන්ට පවරාදීමට කටයුතු කර නොතිබුණි. තවද, එම | අධිකාරියේ වත්කම් පාලනය විධිමත් කල යුතුය. | පවරා ගෙන ඇති ඉඩම්වල තක්සේරු කටයුතු අවසන් කර තක්සේරු අංකය පදිංචිකරුවන් වෙත ලබාදී ඇත. පවරාගෙන නැති ඉඩම්, තක්සේරු කිරීමට නොහැකිවී ඇත. ආදර්ශ ගම්මාන ඉදිකල ඉඩම්ද පවරා ගැනීමට කාලානුරූපීව ප්‍රමාද වී ඇත | ඡේදයේ දැක්වෙන ඉඩම් සහ නිවාස පවරා ගැනීමට සහ තක්සේරු කිරීමට කටයුතු කල බව තහවුරු කිරීමට තොරතුරු ඉල්ලා ඇති නමුත් ඉදිරිපත් කර නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | දශකයේ වර්ග ප්‍රමාණය හෙක්ටයාර් 7.459ක් වූ ජන උදාන ගම්මාන 03 ක ඉඩම් කොටස් 44 ක වටිනාකම අධිකාරිය විසින් තක්සේරු කිරීමට පියවරගෙන නොතිබුණි. ආදර්ශ ගම්මාන ඉදිකිරීමට 2015 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා යොදා ගන්නා ලද රජයට අයත් ඉඩම් කොටස් 77ක් හා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් කොටස් 08 ක අයිතිය 2020 වර්ෂය අවසානය දක්වා අධිකාරිය වෙත පවරා ගෙන නොතිබුණි. එසේම පවරාගෙන නොමැති ඉඩමක අධිකාරිය විසින් ඉදිකල මහව උදාගම නිල නිවාස 03 කින් කුලී නිවැසියන්ගෙන් ලැබිය යුතු හිඟ කුලිය රු.මිලියන 1.32ක් විය. එසේම අනුරාධපුර ඉපලෝගම පුලියන්කුලම නිවාස ව්‍යාපෘතිය ආරම්භ කිරීමේදී ඒ සඳහා අවශ්‍ය නිර්දේශ හා අනුමැතීන් ලබාගෙන නොතිබුණු අතර අක්කර 10 ක්වූ අදාල ඉඩම පවරා ගැනීමටද කටයුතු කර නොතිබුණි. | | | |
| (ඇ) | ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38(ආ) වගන්තියට අනුව අධිකාරිය විසින් භුක්තිය භාරගෙන තිබුණු ඉඩම් කැබලි 72ක් පවරා ගැනීම වෙනුවෙන් ගෙවිය යුතු වන්දි ලෙස මූල්‍ය | ඉඩම් පවරා ගැනීමේ හා වන්දි ගෙවීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම කල යුතුය. | ප්‍රාදේශීය ලේකම් විසින් වන්දි තක්සේරුව දන්වා එවා නැත. ඒ පිළිබඳ ඉල්ලීම් කර ඇත. | වන්දි හා පොලී ශේෂයන් නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | ප්‍රකාශනවල රු.මිලියන 178.25ක ප්‍රතිපාදන සිදුකර තිබුණි. එම අගය තුළ වසර 39 කට වැඩි පැරණි ශේෂයන් ද ඇතුළත් නමුත් 2020 වර්ෂය අවසානය දක්වා එම වන්දි හා පොලී නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | | | |
| (ඈ) | අධිකාරිය විසින් තම පරිපාලිත සමාගමේ රු.මිලියන 120 ක් ආයෝජනය කර තිබුණු නමුත් 2013 වර්ෂයෙන් පසු අධිකාරිය වෙත කිසිදු ලාභාංශයක් ලැබී නොතිබුණි. 2015 සිට 2019 වර්ෂය දක්වා පරිපාලිත සමාගම විසින් එකතුව රු. මිලියන 615 ක ලාභ උපයාගෙන තිබුණි. | පරිපාලිත සමාගමේ පාලනය හා ලාභාංශ ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් අධිකාරිය ඵලදායී ලෙස මැදිහත් විය යුතුය. | ලැබිය යුතු ලාභාංශ පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩල රුස්වීමේදි සාකච්ඡා වූ අතර එහිදි තීරණය වූ පරිදිගත යුතු පියවර පිළබඳව උපදෙස් ලබා ගැනීම සඳහා අප අමාත්‍යාංශ ලේකම් වෙත 2020.07.17 දින ලිපියක් යොමු කර ඇත. | 2021 වර්ෂයේදීද ලාභාංශ ගෙවා නොතිබුණි. |
| (ඉ) | 2019 දෙසැම්බර් 31 දිනට දැන්වීම් පලකිරීම වෙනුවෙන් සෙවණ මාධ්‍ය අංශය වෙත ලැබිය යුතු රු.මිලියන 67.83 තුල වසර 05 ට වැඩි හිඟ මුදල රු.මිලියන 12.32ක් විය. එසේම එම ලැබිය යුතු හිග මුදල තුළ අධිකාරිය විසින් සෙවණ මාධ්‍යය අංශය හරහා පළකල දැන්වීම් වෙනුවෙන් එම අංශයට ලැබිය යුතු හිග මුදල රු.මිලියන 44.61ක් ඒ තුල ඇතුළත් වූ අතර එයින් රු.මිලියන 42.61ක් 2019 වර්ෂයේ මාධ්‍ය කටයුතු වෙනුවෙන් පමණක් වියදම් වී තිබුණි. | ලැබිය යුතු ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කල යුතුය. | අධිකාරිය විසින් මාධ්‍යය අංශය වෙතට ගෙවිය යුතු ශේෂය 2021 කාර්යාලීය පොත් වලින් ලියා හැරීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත. | ලැබිය යුතු ශේෂ වලින් අධිකාරියෙන් ලැබිය යුතු ශේෂය භාණ්ඩාගාර අනුමැතියකින් තොරව පොත්වලින් ලියා හැරීමට කටයුතු කර ඇති අතර ඉතිරිය අයකරගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඊ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XLVIII හි 13:2 හා 22:1:1 ඡේදයන්හි සංශෝධන හා 2019 සැප්තැම්බර් 30 දිනැති අංක 30/2019 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ I හා III ඡේද | | | |
| (උ) | 2019 වර්ෂය අවසන් වන විට අධිකාරිය විසින් සහාධිපත්‍ය දේපල 145ක නිවාස ඒකක 4,054ක් සඳහා ඔප්පු නිකුත් කර නොතිබුණු අතර ඒ තුල ඇති දේපල 81ක ඒකක 1,913ක ඉඩම් අධිකාරියට පවරා ගෙන නොතිබුණි. අධිකාරිය වෙත දේපල පවරා ගෙන තිබුණු නමුත් සහාධිපත්‍ය පිඹුර සකස් නොකිරීම, සහාධිපත්‍ය ප්‍රකාශන සකස් නොකිරීම හා සහාධිපත්‍ය ප්‍රකාශන ලියාපදිංචිය සිදු නොකිරීම ආදී හේතුන් මත සහාධිපත්‍ය දේපල 63ක් එනම් ඒකක 1,821ක් සඳහා ඔප්පු ලබාදී නොතිබුණි. එසේම දේපළ 02ක ඒකක 272ක් සඳහා සහාධිපත්‍ය ප්‍රකාශන ලියාපදිංචිකර තිබුණද ඔප්පු නිකුත් කර නොතිබුණු අතර කුලී සින්නක්කර ක්‍රමයට නිවාස ලබාදුන් ප්‍රතිලාභීන් 3,000ක් වෙතද ඔප්පු නිකුත් කිරීමට සැලසුම් කලද බදු ඔප්පු 64ක් පමණක් 2019 දෙසැම්බර් 31 | අධිකාරියේ මෙහෙයුම් කටයුතු විධිමත්ව, කාර්යක්ෂමව හා ඵලදායීව සිදුකල යුතුය. | නිවාස 66 ක පිහිටි සහාධිපත්‍ය දේපළ 145 ක් තුල පිහිටි නිවාස 4054 ක් සඳහා සහාධිපත්‍ය පිඹුරු ලියාපදිංචි කර ගත නොහැකිව තිබුණි. | නිවාස ඉදිකල ඉඩම් පවරා නොගැනීම සහ සහාධිපත්‍ය සහතික ලබා නොගැනීම සහ මෙහෙයුම් ආකාර්යක්ෂමතාවය නිසා ඔප්පු නිකුත්කර නොතිබුණි. |

දිනට නිකුත් කර තිබුණි.

| | | | | |
|---|---|---|---|---|
| (ඌ) | 2019 වර්ෂය අවසාන වන විට ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතු ගම්පහ, කොළඹ, ගාල්ල, මාතර, පුත්තලම, මහනුවර හා මාතලේ යන දිස්ත්‍රික්කවල හිස් ඉඩම්වල පදිංචි, අනවසර පදිංචිකරුවන් 121 දෙනෙකුගෙන් අයකර ගැනීමට අපේක්ෂිත මුළු තක්සේරු වටිනාකම රු.මිලියන 43.55 ක් වූ අතර, අඩු ආදායම්ලාභී නොවන අනවසර පදිංචිකරුවන් 25 දෙනෙකුගෙන් අයකර ගැනීමට අපේක්ෂිත තක්සේරු වටිනාකම රු.මිලියන 25.85ක්ද ඒ තුල විය. එසේ වුවද අධිකාරිය විසින් එම අනවසර පදිංචිකරුවන් නියමානුකූල කිරීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | අනවසර පදිංචිකරුවන් නියමානුකූල කිරීමට අවශ්‍ය කටයුතු කල යුතුය. | එම අනවසර පදිංචිකරුවන් නියමානුකූල කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලපත්‍රිකාවක් ඉදිරිපත් කර ඇත. | අවශ්‍ය කටයුතු 2021/ 12/31 දක්වා සිදුකර නොතිබුණි. |
| (එ) | හුවමාරු නොවන ගනුදෙනුවක් යටතේ 1987 හා 1988 වර්ෂවල අත්පත් තරගෙන තිබූ හන්තාන නිවාඩු නිකේතනයට අයත් පර්චස් 170.56ක ඉඩමේ වටිනාකම සමාලෝචිත වර්ෂය අවසානයට රු. 2,520 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ අතර ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 27 හා 47 ඡේදය ප්‍රකාරව සාධාරණ අගය මූල්‍ය | අධිකාරියට අයත් වත්කම් ඒවායේ තක්සේරු වටිනාකමට ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. | ස්ථාවර වත්කම් තක්සේරු කිරීමට අදාලව හන්තාන නිවාඩු නිකේතනය පිහිටි ඉඩමේ තක්සේරුව ලබා ගැනීම 2020/02/06 වන දින තක්සේරු දෙපාර්තමේන්තුවට දන්වා ඇත. තක්සේරුව ලද පසු නිවැරදි අගය පොත්වල සටහන් කිරීමට නියමිතය. | තක්සේරු දෙපාර්තමේන්තුවෙන් එම වාර්තා 2021-12-28 දින දක්වා ලබාගෙන නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි. තවද, අධිකාරියේ ඉඩම්වල පිරිවැය රු.55,319,710ක් ලෙස සඳහන් කර තිබුණද කාර්යාල හා කුලී ගොඩනැගිලි පිහිටි ඉඩම් කෙටස් 8286ක් හා නිවාස යෝජනා ක්‍රම වලින් ඉතිරිවූ ඉඩම් හෙක්ටයාර් 473.15ක් තක්සේරු කර සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි. | | | |
| (ඒ) | 1985 වර්ෂයේ සිට මිලදී ගෙන තිබුණු පිරිවැය රු.269,362,610ක් වූ මෝටර් රථ 135 ක් හා 2015 වර්ෂයට පෙර මිලට ගෙන තිබුණු පිරිවැය රු.200,198,467ක්වූ අනෙකුත් ස්ථාවර වත්කම් රාශියක් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණද දැනටමත් භාවිතා කරමින් පැවතුණි. මෙම වත්කම් පිළිබඳ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණු අතර ප්‍රමිත අංක 03 ප්‍රකාරව මෙකී වත්කම් වල ඵලදායී ජීවිත කාලය නැවත සමාලෝචනය කර ගිණුම්වල ගැලපීමට කටයුතු කර නොතිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව සම්පූර්ණයෙන් ක්ෂය කර ඇති වත්කම් සම්බන්ධව කටයුතු කළ යුතුය. | මේ සඳහා කමිටුවක් පත්කර කාලපරිච්ඡේදය සංශෝධනය කර 2021 අවසන් ගිණුම් සඳහා සංශෝධනය කිරීමට නියමිතව ඇත. | වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරීමට 2021 වර්ෂය අවසානය දක්වාම කටයුතු කර නොතිබුණි. |
| (ඔ) | 1981 සිට 1995 දක්වා කාලය තුළ අධිකාරියට විදේශ ආධාර ලෙස ලැබී තිබුණු | අවශ්‍ය ගැලපීම් සිදු කළ යුතු අතර විදේශාධාර සම්බන්ධ තොරතුරු | 1981- 1995 දක්වා අධිකාරියට විදේශ ආධාර ලෙස ලැබු | 2021 වර්ෂයේදී ගැලපීම් සිදුකිරීමට කටයුතු කර ඇති බව |

| | | | | |
|---|---|---|---|---|
| | රු.131,682,451ක් වටිනා වත්කම් අධිකාරියේ වත්කම් යටතේ ගලපා ක්‍රමක්ෂය කිරීමට කටයුතු නොකර සමාලෝචිත වර්ෂය අවසානයට විදේශ අරමුදල් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. තවද, එහි ඇතුළත් රු.96,707,280ක විදේශාධාර සම්බන්ධ තොරතුරු ද විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | විගණනයට ඉදිරිපත් කළ යුතුය. | රු.131,682,451/- ගිණුම් ගැලපීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇති අතර 2021 වර්ෂයේ අවසන් ගිණුම් සකස්කිරීමේදී ගැළපීමට කටයුතු කරනු ලැබේ. | තහවුරු නොවුණි. |
| (ඔ) | වීරකැටිය කලාප කාර්යාලයට ප්‍රධාන කාර්යාලයෙන් ප්‍රේෂණය කර තිබුණු රු.14,268,868ක මුදලක් නිවැරදිව ගිණුම් ගතකර නොතිබීම හෝ ගිණුම්වලින් අත්හැරීම යන කරුණු මත ප්‍රධාන කාර්යාලයේ ඇති අනුරූපී මුදල් ශේෂය සමග නොගැලපීම නිසා ඉහත මුදල අඩුකර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එමනිසා 2020 වර්ෂයේ මුදල් ශේෂය ඉහත වටිනාකමින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | මුදල් ශේෂය ප්‍රධාන කාර්යාලයේ ශේෂ සමග නොගැලපීමට හේතු ගැඹුරින් පරීක්ෂාකර වාර්තා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. | පරීක්ෂා කරමින් පවතී. | අධිකාරිය 2021 වර්ෂයේදීද පරීක්ෂා කිරීම් සිදු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ක) | මූල්‍ය ප්‍රකාශන අනුව අධිකාරිය විසින් බාහිර පාර්ශවයන් හා කාර්ය මණ්ඩලය වෙත ලබාදුන් අයවිය යුතු අත්තිකාරම් තැන්පතු ශේෂයන් හි එකතුව රු.4,001,854,252ක් වූ අතර එහි ඇතුළත් වසර 3-5 ත් අතර හා 05 ට වැඩි නිරවුල් | අදාල අනුමැතිය ලබාගෙන අවශ්‍ය කටයුතු කඩිනමින් සිදුකළ යුතුය. | පරීක්ෂා කර ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | 2021/12/31 දක්වා අයකර ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | කරගත යුතු ශේෂ පිළිවෙලින් රු.963,293,386ක් හා රු.2,652,095,768ක් වුවද 2020 වර්ෂය අවසාන වනතෙක් එම ශේෂයන් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. මින් වසර 05 ට වැඩි කාලයක සිට ඉදිරියට ලැබිය යුතු ශේෂය සමස්ථ ණයගැති ශේෂයෙන් සියයට 33 ක ප්‍රතිශතයක් ගෙන තිබුණි. | | | |
| (ග) | ව්‍යාපෘති 30 ක් සඳහා කොන්ත්‍රාත්කරුවන්ට ලබාදුන් 2020 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නොපියවූ අත්තිකාරම් මුදල් තුල වසර 05 ට වැඩි නිරවුල් නොකල අත්තිකාරම් වටිනාකම රු.64,001,469ක් විය. | අවශ්‍ය කටයුතු කඩිනමින් සිදුකළ යුතුය. | නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතී. | 2021.12.31 දින දක්වා නිරවුල් කර නොතිබුණි. |
| (ඝ) | ණය හිමියන්ගෙන් අවුරුදු 10 ට වැඩි රු.202,530,915ක් හා අවුරුදු 05 ට වැඩි රු.1,828,306,764ක් 2020 වර්ෂය අවසන් වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණු අතර තවදුරටත් වගකීමක් නොමැති ණය ශේෂ පිළිබඳ සොයා බලා නැවත ආදායමට ලියා හැරීමට කටයුතු කර නොතිබුණි. | අදාළ අනුමැතිය ලබාගෙන කඩිනමින් ලියා හැරීමට කටයුතු කළ යුතුය. | කටයුතු කරමින් පවතී. | 2021.12.31 දින දක්වා නිරවුල් කර නොතිබුණි. |
| (ත) | 1971 අංක 38 දරන මුදල් පනතේ 11 (බී) වගන්තිය ප්‍රකාරව | ආයෝජන සඳහා ලබාගත් අනුමැතිය තහවුරු කෙරෙන ලිපි | දිගුකාලීන ආයෝජනයන් වන HDFC OVDC ආයෝජන නිසි අනුමතිය පරිදි සිදුකර | 2021 වර්ෂයේදීද අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | එකතුව රු.2,271,354,730ක කෙටිකාලීන හා දිගුකාලීන ආයෝජන සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබාගෙන නොතිබුණි. | විගණනයට ඉදිරිපත් කළ යුතුය. | ඇති අතර කෙටිකාලීන ආයෝජන අනුමතිය සඳහා අමාත්‍යංශය හරහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමට ලිපියක් යොමුකර ඇත. | |
| (ද) | 2003 ජූනි 02 දිනැති PED/12 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.2 ඡේදය මගින් හා 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තිය සෙවණ අරමුදලේ ප්‍රධාන අරමුණක් වන නිවාස අපේක්ෂිත ඉතා අසරණ දරුපවුල් වෙත සහන සැලසීම වෙනුවට අරමුදල් නැවත නැවත ආයෝජනය කරමින් පොලී ආදායමක් උපයා ගැනීමට කටයුතු කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ දී රු.328,000,000ක මුදලක් ආයෝජනය කර තිබූ අතර මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | අරමුදල අපේක්ෂිත අරමුණු ඉටු කිරීමට යොදාගත යුතුය. | යෝග්‍ය පවුල් හඳුනාගෙන අනුමැතිය දක්වා ඇති ක්‍රියාවලිය දීර්ඝ කාලයක් ගතවීමත් කොවිඩ් 19 වසංගතය නිසා ප්‍රතිලාභ සැලසීමේ ප්‍රමාදයන් පැවතුණි. පවුල් 22 කට ප්‍රතිලාභ සැලසීමට කටයුතු කර ඇත. | සෙවණ අරමුදලේ අරමුණු අනුව කටයුතු කර නොතිබුණි. |
| (න) | 2020 වර්ෂය අවසානයට අධිකාරිය විසින් සංවර්ධන කටයුතු සඳහා ඉඩම් අත්පත් කරගැනීම වෙනුවෙන් පෞද්ගලික අංශය වෙත ගෙවිය යුතු වන්දි මුදල රු. 101,209,033ක් වූ අතර වන්දි ගෙවීම ප්‍රමාදවීම මත එම පාර්ශවයන් වෙත ගෙවිය යුතු පොලී මුදල රු.33,852,455ක් | පවතින ගැටළු කඩිනමින් නිරවුල් කර වන්දි ගෙවීම සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් කර ගත යුතුය. | අත්පත් කරනු ලබන ඉඩම් බොහොමයක් අත්පත් කිරීමේ මුල් අවදියේදීම භුක්තිය භාර ගෙන නිවාස ඉදිකිරීම් අවසන් කර පුද්ගලයින් පදිංචි කරවා ඇතත්, පනතට අනුව හිමිකම් පරීක්ෂණ සිදු කර දන්වා එවීමට වර්ෂ ගණනාවක් යන බැවින් වාර්ෂිකව 7% බැගින් පොලියක්ද එකතුවී ඇත. | 2020 ගෙවීමට පැවති වන්දි මුදලින් රු.723,690ක් පමණක් 2022 පෙබරවාරි වන විට ගෙවා ඇත. ඒ අනුව ගෙවිය යුතු පොලිය තවත් වැඩිවෙමින් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | විය. අධිකාරිය විසින් මූලික වන්දි මුදල ගෙවීම ප්‍රමාදවීම නිසා ගෙවිය යුතු පොලිය මූලික වන්දි මුදල ඉක්මවූ අවස්ථා 24 ක් විය | | | |
| (ප) | මූල්‍ය අංශය, දේපල අංශය සහ දිස්ත්‍රික් කාර්යාල මගින් වෙන වෙනම දත්තයන් පවත්වා ගෙන ගියද විකිණීමට/කුලියට දීමට/බදු දීමට ඇති නිවාස හා කඩසාප්පුවල ඒකක ප්‍රමාණය හඳුනා ගැනීමට හැකිවන පරිදි සකස් කල මධ්‍යගත ලේඛනයක් අධිකාරිය විසින් නඩත්තු කර නොතිබුණි. | අවශ්‍ය තොරතුරු ලබා ගැනීම සඳහා මධ්‍යගත ලේඛනයක් කඩිනමින් සකස් කිරීමට කටයුතු කළ යුතුය. | විකිණීමට/කුලියට දීමට බදු දීමට ඇති නිවාස හා සම්බන්ධ මධ්‍යගත ලේඛනයක් සකස් කිරීමට අවශ්‍ය තොරතුරු රැස්කිරීමට කටයුතු කරමින් පවතී. | මධ්‍යගත ලේඛනයක් 2022 පෙබරවාරි 28 දින දක්වා ම පිළියෙල කර නොතිබුණි.. |
| (බ) | ආදර්ශ ගම්මාන ක්‍රියාත්මක කිරීමේ මාර්ගෝපදේශය (අත්වැල) 2.1 වගන්තිය ප්‍රකාරව සුදුසු ඉඩම් තෝරා ගැනීමේ දුර්වලතාවයන් හේතුවෙන් දිස්ත්‍රික්ක 25ක පිහිටුවා තිබුණු ආදර්ශ ගම්මාන වලට අදාලව ඇස්තමේන්තු වටිනාකම රු.මිලියන 1,089ක් වූ නිවාස 1,089ක නිවැසියන් පොදු පහසුකම් නොමැතිවීම හා වන සතුන්ගෙන් සිදුවන තර්ජන හේතුවෙන් නිවාස වල පදිංචි නොවීම නිසා එම නිවාස සඳහා වැයකර තිබුණු මුදල නිශ්කාර්ය වියදමක් බව විගණනයේදී නිරීක්ෂණය විය. මේ සඳහා වැය කළ මුදල පිළිබඳව තොරතුරු විගණනයට ඉදිරිපත් | ව්‍යාපෘතියකින් අපේක්ෂිත අරමුණ ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. | අදාළ ගම්මාන සඳහා විදුලිය, ජලය ලබාදී ඇත. මෙම ඉඩම් වන රක්ෂණ හෝ වනජීවී කලාපය තුළවූ ගම්මාන නොවේ. ණය ගම්මානවල පදිංචි අය ගෙන් මාසික වාරික අය කෙරේ. ආධාර නිවාස වල පදිංචි නොමැති අයගෙන් ආධාර මුදල් අයකර ගැනීමට කටයුතු කෙරේ. | 2021 දොසැම්බර් 31 දිනටත් එම නිවාස 1,089 හි නිවැසියන් පදිංචි වී නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | නොකෙරුණි.තවද 2019 වර්ෂයේ දිස්ත්‍රික්ක 12 ක විවෘත කල ආදර්ශ ගම්මාන 133ක නිවැසියන් පදිංචි නොවීමේ ප්‍රතිශතය සියයට 15 සිට සියයට 42 දක්වා පරාසයක විය. | | | |
| (ම) | 2021 වර්ෂය තුල " ඔබට ගෙයක් රටට හෙටක් " වැඩසටහන යටතේ රු.මිලියන 5,271ක වියදමින් නිවාස ඒකක 10,000ක වැඩ ආරම්භ කර නිවාස ඒකක 5,000ක වැඩ නිම කිරීමට සැලසුම් කර තිබුණද වැඩ අවසන් කර තිබුණේ නිවාස ඒකක 3,949ක පමණි. ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් සියයට 90 ක ප්‍රතිපාදන ලැබී තිබුණද නිවාස ඒකක 6,051ක් තවදුරටත් ඉදිකිරීමට පැවතුණි. | නිවාස ඉදිකිරීම් කටයුතු සැලසුම් කළ පරිදි ඉටු කිරීමට කටයුතු කළ යුතු අතර අදාල සැළසුම් ක්‍රියාත්මක කිරීමට ප්‍රමාදවීම් වලට හේතු සොයා බලා නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගත යුතුය. | "ඔබට ගෙයක් - රටට හෙටක් " ආධාර වැඩසටහන යටතේ ඉදිකිරීමට සැලසුම් කළ නිවාස 10,000 හා වැඩ සම්පූර්ණ කිරීමට රු.මිලියන 6,000ක් අවශ්‍ය වේ. මෙම වැඩසටහන සඳහා භාණ්ඩාගාරය මගින් ලැබුණු මුදල රු.මිලියන 4,761.33ක මුදලින් රු.මිලියන 1,871ක් ලැබුණේ 2020-12-31 දිනදීය. මේ වන විට නිවාස 972ක වැඩ නිමකර ඇත. | 2021 දෙසැම්බර් 31 දිනට එම නිවාස 10,000ක් නිවාස 4,921ක් පමණක් නිමකර ඇත. |
| (ය) | අනෙකුත් අරමුදල් වැඩසටහන් යටතේ 2020 වර්ෂයේ සෙවණ නිවාස ආධාර යටතේ නිවාස 300 ක් ඉදිකිරීමට සැලසුම් කලද පවුල් 22 ක් සඳහා පමණක් ප්‍රතිලාභ ලබාදී තිබුණි. ඉන්දියානු ආධාර යටතේ නිවාස 1,860ක් ඉදිකිරීමට සැලසුම් කළද නිවාස 520 ක් පමණක් ඉදිකර තිබූ අතර මේ යටතේ සැලසුම් කරන ලද ව්‍යාපෘති 08 ක් ක්‍රියාත්මක කර නොතිබුණි. | ව්‍යාපෘති සැලසුම් කිරීමේදී පවතින තත්ත්වයන් සලකා බලා ක්‍රියාත්මක කල හැකි කාල රාමුවකට සැලසුම් සකස් කළ යුතුවේ. | පවුල් හදුනාගත් පසු ගරු අමාත්‍යතුමාගේ අමාත්‍යාංශ ලේකම්ගේ හා සෙවණ පාලක මණ්ඩලයේ ද අනුමැතිය ලබා ගැනීම දක්වා ඇති ක්‍රියාවලිය සඳහා දීර්ග කාලයක් ගතවීම නිසා වැඩසටහන් යටතේ ප්‍රතිලාභ සැලසීමේ ප්‍රමාදයක් පැවතුණි. | 2021 දෙසැම්බර් 31 දිනට ඉන්දියානු ආධාර නිවාස 1,820න් තවත් නිවාස 154ක් පමණක් ඉදිකර තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ර) | සැමට සෙවණ නිවාස වැඩසටහන යටතේ 2016 වර්ෂයේ ආරම්භ කරන ලද 2018 අප්‍රේල් 11, 2018 දෙසැම්බර් 07, 2019 නොවැම්බර් 22 හා 2020 ජුනි 12 යන දිනයන්හි නිමකල යුතු ව්‍යාපෘති 05 ක නිවාස ඒකක 2,503කින් නිවාස ඒකක 262 ක පමණක් 2020 දෙසැම්බර් 31 දින වන විට වැඩ නිමකර තිබූ අතර නිවාස ඒකක 1,815ක් ඉදිකිරීමට කටයුතු කර නොතිබුණි. | අවසන් කිරීමට නොහැකිවූ ව්‍යාපෘති සම්පූර්ණ කිරීම සඳහා ප්‍රතිපාදන වෙන්කර ගැනීමට කටයුතු කළ යුතුය. | 2020 වසරේදී නිවාස ඒකක 262 ක වැඩ නිමකර ඇතත් වර්ෂය තුළ මෙම නිවාස වැඩසටහන සඳහා රාජ්‍ය අයවැය මඟින් ප්‍රතිපාදන වෙන් නොවූ අතර ඒහෙයින් මෙම අවිච්ඡේද වැඩසටහන්වල සැලකිය යුතු ප්‍රගතියක් නොවීය. | අවිච්ඡේද වැඩසටහන සඳහා ප්‍රතිපාදන වෙන් කර නොතිබුණි. ඒ අනුව ඉතිරි නිවාස 1,815 ප්‍රමාණය 2021 දෙසැම්බර් 31 දක්වා ඉදිකර නොතිබුණි. |
| (ල) | 2019 වර්ෂයේ රු.මිලියන 200 ක වියදමකින් සැලසුම් කරන ලද නිවාස සංකීර්ණ 33 ක් අළුත්වැඩියා කිරීමේ සහ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ නිවාස ඉදිකිරීමේ ප්‍රගතිය ශුන්‍ය මට්ටමක පැවතුණි. | අවසන් කිරීමට නොහැකි වූ ව්‍යාපෘති ඉදිරි වර්ෂවල ඇස්තමේන්තුවලට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය. | 2019 වර්ෂයේ නගමු පුරවර ප්‍රතිපාදන යටතේ නිවාස සංකීර්ණ 33 ක් අළුත්වැඩියා කිරීමට නියමිතව පැවතියද ටෙන්ඩර් ඉදිරිපත් නොවීම හේතුවෙන් ව්‍යාපෘති 18 දක්වා අඩුවී ඇත. එසේම 2019 අවසාන වන විටත් සමහර ව්‍යාපෘතීන් ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළ පැවතීම හේතුවෙන් ආරම්භ වී නොතිබුණි. | ව්‍යාපෘති 18 දක්වා අඩුකළ බව දක්වා ඇති නමුත් එම ව්‍යාපෘති 18 ද 2021 දෙසැම්බර් 31 දිනට ආරම්භ වී නොතිබුණි. |

## 25. ජාතික ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 - තතත්ත්වාගණනය නොකළ මතය

2019 - තතත්ත්වාගණනය නොකළ මතය

2020 - තතත්ත්වාගණනය නොකළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2003 ජූනි මස 02 දිනැති අංක PED 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.2 (බී) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව සෑම ආයතනයක්ම අනුමත කාර්යය මණ්ඩලයක් පවත්වාගත යුතු වුව ද , ආයතනය සඳහා කාර්යමණ්ඩලය අනුමත කරගෙන නොතිබුණි. | පර්යේෂණ කටයුතු වෙනස්වන ආකාරය අනුව නිලධාරීන් පත්කරගත හැකිවන පරිදි සකස් කරන ලද ස්ථාවර කාර්යය මණ්ඩලයක් අනුමත කර ගැනීම කල යුතුය. | මූලිකව ව්‍යාපෘති ආදායම් ලැබීම් ප්‍රතිපත්තිමය කරුණු හා ප්‍රදාන ලබාදෙන ආයතනයේ කැමැත්ත මත තීරණය වීම හා රජයේ ප්‍රතිපත්තිමය ප්‍රමුඛතා අනුව සිදුකරනු ලබන පර්යේෂණයන් වෙනස්වීම හේතුවෙන් ආයතනය සඳහා අනුමත කාර්යයමණ්ඩලයක් පවත්වාගැනීම සිදුකළ නොහැකි බව දන්වා තිබුණි. | 2021 වර්ෂය අවසානය දක්වාම කාර්යමණ්ඩලය අනුමත කර ගැනීම කෙරෙහි අවධානය යොමු වී නොතිබුණි. |
| (ආ) | ඉහත චක්‍රලේඛයේ 9.3.1.(i) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ආයතනය සඳහා බඳවාගැනීම් හා උසස් කිරීමේ පටිපාටියක් සකස් කර ඒ සඳහා අනුමැතිය ලබාගත යුතු වුවත් ආයතනය විසින් එසේ කටයුතු කර නොතිබුණි. | රජ්‍ය ව්‍යවසායන් වශයෙන් චක්‍රලේඛ විධිවිධාන පරිදි කටයුතු කලයුතු වීම. | පාලක මණ්ඩලය විසින් ආයතනයේ මෙහෙයුම් අත්පොත (MOO) තුල කාර්යය මණ්ඩලය බඳවාගැනීම් හා උසස් කිරීම් සම්බන්ධයෙන් දක්වා ඇති බව දන්වා තිබුණි. | 2021 වර්ෂයේදීද බඳවාගැනීම් හා උසස් කිරීම් පටිපාටිය පිළියෙල කිරීමට හා අනුමැතිය ලබාගැනීමට අවධානය යොමු කර නොතිබුණි. |

## 26. ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 - තතත්ත්වාගණනය නොකළ මතය

2019 - තතත්ත්වාගණනය නොකළ මතය

2020 - තතත්ත්වාගණනය නොකළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වෙනි වගන්තිය හා 2003 ජුනි 02 දිනැති පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.2 වගන්තිය ප්‍රකාර ආයතනය මුදල් ආයෝජනය කිරීමේ දී මුදල් අමාත්‍යවරයාගේ එකගතාවය හා අදාළ අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවත්, ඊට පටහැනිව සභාපතිතුමාගේ අනුමැතිය මත ආයතනය විසින් ස්ථාවර තැන්පතු, භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජනය කර තිබුණු අතර 2019 දෙසැම්බර් 31 දිනට රු.1,109,734,160 ක ශේෂයක් විය. | මුදල් පනත යටතේ ක්‍රියාත්මකවන ආයතනවල ආයෝජන සඳහා අදාළ අමාත්‍යවරයාගේ හා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගත යුතු වේ. | ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 2021 වර්ෂය අවසානය දක්වාම දක්වා අදාළ අනුමැතීන් ලබා ගෙන නොතිබුණි. |
| (ආ) | 2000 ජනවාරි 11 දිනැති අංක පීඑෆ්/පීඊ 5 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය පරිදි මහා භාණ්ඩාගාරයේ නිසි අවසරයකින් තොරව අතිරේක දීමනා, දිරි දීමනා හා වෙනත් වර්ගවල මූල්‍යමය ප්‍රතිලාභ සේවකයන්ට ලබා නොදිය යුතු වුවත්, ආයතනයේ සේවකයන් | අදාල චක්‍රලේඛ ප්‍රකාරව, මහාභාණ්ඩාගාර අනුමැතියෙන් තොරව අතිරේක දීමනා, දිරි දීමනා හා වෙනත් වර්ගවල මූල්‍යමය ප්‍රතිලාභ සේවකයන් හට ලබා දිය නොහැකි බැවින් දීමනා ගෙවීම් | ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 2021 වර්ෂය අවසානය දක්වාම අදාළ භාණ්ඩාගාර අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | සඳහා එසේ අනුමැතියකින් තොරව රු.45,099,700ක් පැමිණීමේ දීමනා වශයෙන් ගෙවා තිබුණි. තවද මෙම චක්‍රලේඛයට පටහැනිව සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ අංක එම්ජ්/එම්එස්/එම්/11/2018 හා 2018 ජනවාරි 01 දිනැති චක්‍රලේඛය පදනම් කරගෙන වෛද්‍ය නිලධාරීන් සඳහා රු.4,296,193 අමතර රාජකාරී දීමනා වශයෙන් ලබා දී තිබුණි. තවද භාණ්ඩාගාර අනුමැතියෙන් තොරව අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මත හම්බන්තොට ශාඛාවේ කොන්ත්‍රාත් පදනම මත සේවය කරන වෛද්‍යවරයා වෙත පමණක් රු.15,000 ක මාසික දුෂ්කර දීමනාවක් ගෙවීම සඳහා අනුමැතිය ලබා දී තිබුණි. | සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගත යුතුය. | | |
| (ඇ) | 2020 දෙසැම්බර් 31 දින වන විට කළුතර රියදුරු පුහුණු පාසලින් රු.10,921,893ක මුදලක් වසරකට වැඩි කාලයක සිට අයවිය යුතුව පැවතිය ද එම මුදල් අය කර ගැනීමට වෛද්‍ය ආයතනයේ අවධානය යොමු වී නොතිබුණි. | ලැබිය යුතු මුදල් කඩිනමින් අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය වෙත යොමු කළ ලිපි මගින් සිහිකැඳවීම් කර ඇත. | 2021 වර්ෂය අවසාන වන විටත් අය කර ගෙන නොතිබුණි. |
| (ඈ) | 2003 ජුනි 02 දිනැති පීඊඩී/12 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.12 වගන්තිය ප්‍රකාරව මහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමෙන් තොරව 2019 | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | සෞඛ්‍ය ආරක්ෂණ ක්‍රමය සඳහා භාණ්ඩාගාර අනුමැතිය 2021 වර්ෂයේදීද ලබා ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | වර්ෂයේදී රු.5,628,005ක මුදලක් සෞඛ්‍ය රක්ෂණ ආවරණයක් ලබා ගැනීම සඳහා ගෙවා තිබුණි. | | | |
| (ඉ) | 2019 දෙසැම්බර් 31 දින වන විට කළුතර රියදුරු පුහුණු පාසලින් රු.10,921,893 ක මුදලක් ආරක්ෂක සේවා ගාස්තු හා කුලී මුදල් වශයෙන් ලැබිය යුතු අතර, ඉන් රු.1,726,979ක් අවුරුදු 5 කට වැඩි වන අතර, රු.7,395,721ක් අවුරුදු 1 – 5 ත් අතර ශේෂයන් වුවත් එම මුදල් අයකර ගැනීමට වෛද්‍ය ආයතනයේ අවධානය යොමු වී නොතිබුණි. එමෙන්ම දෙපාර්ශවයට විසින් ගිවිසුමකට එළඹී නොතිබුණු අතර එබැවින් මෙම මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් ගැටළු සහගත තත්වයක් පවතින බව නිරීක්ෂණය විය. | අදාල කුලී හෝ ගාස්තු නිසි පරිදි ගිවිසුම් ගත වී අයවිය යුතු මුදල් නිසි කලට අයකර ගත යුතුය. මෙසේ අය නොවූ මුදල් පිළිබඳව අදාල ක්‍රියාමාර්ග අනුගමනය කර ගිණුම්ගත කළ යුතු වේ. | මේ පිළිබඳව කළුතර රියදුරු පුහුණු පාසල දැනුවත් කළද ඔවුන්ගෙන් නිසි පිළිතුරක් අප වෙත ලැබී නොතිබුණි. මේ පිළිබඳව සිහිකැඳවීමේ ලිපි නිරන්තරයෙන් යවා ඇත.නමුත් යහපත් ප්‍රතිචාර ලැබී නොමැත අධිකරණ ක්‍රියාමාර්ග හෝ ඉදිරි පියවර පිළිබඳ සාකච්ඡා කිරීමට අධ්‍යක්ෂක මණ්ඩලය වෙත අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කිරීමට නියමිතව ඇත. | 2021 වර්ෂයේදීද අයකර ගැනීම්වලට අදාළ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ඊ) | 1997 අංක 25 දරන ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතන පනතේ 3 (අ) වගන්තිය 8.2.2 වගන්තිය ප්‍රකාර බර වාහන ඇතුළු සියලු වර්ගවල මෝටර් වාහන පදවන හෝ ධාවනය කරන රියදුරන්ට සහ ධාවකයින්ට වෛද්‍ය සේවා සැපයීම සහ ආධාර සැලසීම ආයතනයේ කර්තව්‍යයන් ලෙස දක්වා තිබුණි. ආයතනය පිහිටුවීමේ පනත අනුව වෙනත් රජයේ හෝ පෞද්ගලික | ණය පදනම මත භාහිර ආයතන හා සේවකයන් හට ඖෂධ ලබාදීම සිදුකල යුතු නොවේ. ඒ සඳහා ආයතන දෙකෙහිම පනත්වල ප්‍රතිපාදන නොමැති හෙයින් නිසි ක්‍රමවේද වලින් බැහැරව ඖෂධ පහසුකම් සැපයීම සිදු කල යුතු නැත. | 2021 සිට ණය පදනම සේවක මණ්ඩලය වෙත ඖෂධ පහසුකම් සැපයීම නැවැත්වීම පිළිබඳ තීරණය කිරීමට අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වේ. | අදාළ වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | ආයතන වල සේවකයින් සඳහා වෛද්‍ය පහසුකම් සැපයීම හෝ ඖෂධ ලබාදීමේ කටයුතු ඉටුකිරීමේ නීතිමය තත්වයක් ඇති කර නොතිබුණි. එසේ වුවද වෛද්‍ය ආයතනය පනතට පටහැනිව 2019 වර්ෂයේදී ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ හා ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ සේවකයින් සඳහා පිළිවෙලින් රු.1,635,041 ක හා රු.213,778 ක වෛද්‍ය පහසුකම් හා ඖෂධ සපයා තිබුණි. | | | |
| (උ) | 2003 ජුනි 02 දිනැති පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාර ආයතනය සේවකයින්ගේ සුබසාධනය සඳහා මගී සේවා අවසර පත්‍ර ලබාදීමට කටයුතු කර තිබුණු අතර වර්ෂය තුළදී ඒ සඳහා රු.9,489,320 ක වියදම් දරා තිබුණු අතර ඒ සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ හා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාල සුභසාධන ව්‍යාපෘති සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගත යුතු වේ. | දීර්ඝ කාලයක සිට ආයතනයේ සේවකයන් සඳහා ලබා දෙන සුභසාධන පහසුකමකි. | මේ සඳහා භාණ්ඩාගාර අනුමැතිය 2021 වර්ෂයේදීද ලබා ගෙන නොතිබුණි. |

## 27. ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - තතත්ත්වාගණනය කළ මතය

2019 - තතත්ත්වාගණනය කළ මතය

2020 - තතත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායි ජීවිතකාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. 12,285,304ක්වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබූ නමුත් තවදුරටත් භාවිතයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය 2020 වර්ෂයේදී ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | ගිණුම්කරණ ප්‍රමිත අනුව කටයුතු කළ යුතු බව. | වත්කම් ප්‍රත්‍යාගණනය කර දෙන මෙන් රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව වෙත දන්වා යවා ඇත. | 2021 වර්ෂයේදී හෝ වත්කම් ප්‍රත්‍යාගණනය කර නොමැත. |
| (ආ) | අහෝසි වී ගිය ජාතික ඒකාබද්ධතා, රාජ්‍ය භාෂා, සමාජ ප්‍රගති හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයෙන් ලැබිය යුතු රු. 2,290,285ක මුදල වර්ෂ 2කට වැඩි කාලයක් තිස්සේ නිරවුල් කර ගැනීමට කටයුතු නොකර 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු ශේෂයක් ලෙස පෙන්නුම් කර තිබුණි. | ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු බව. | මේ පිළිබඳව රේඛීය අමාත්‍යාංශය දැනුවත් කොට ඇත. මෙම ශේෂය ආයතනයට ලැබිය යුතු අතර එමගින් ගෙවිය යුතු බිල්පත් ආයතනය සතුව ඇත. | ශේෂ නිරවුල් කිරීම සම්බන්ධයෙන් අමාත්‍යාංශය මෙතෙක් තීරණයක් ගෙන නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ඇතුළත් වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු ශේෂ රු.13,524,317ක් වන අතර මෙයින් රු.11,335,467ක් වර්ෂ 02කට වැඩි කාලයක සිට පවතින අතර එම ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු බව. | බිල් පියවීමට අවශ්‍ය මුදල් නොලැබීම හා අදාල කාර්යන් නිසි ලෙස අවසන් නොකිරීම මත මෙම වටිනාකම ගෙවිය යුතු ශේෂ ලෙස දැක්වේ. | වර්ෂ 02 ට වැඩි ශේෂයේ 2021 වර්ෂය අවසානයට රු.9,122,977ක් නිරවුල් කිරීමට ඇත. |
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ 21.1 වගන්තිය හා 23.2 වගන්තිය ප්‍රකාරව විධිමත් විනය පරීක්ෂණයක් අප්‍රමාදව හෝ විනය බලධාරියා නියම කරනු ලබන කාල සීමාවක් තුළ පවත්වා එකී වාර්තාවෙන් චූදිත නිලධාරියා සියළුම චෝදනාවලින් නිදහස් වී ඇති බව තිරණය කරන්නේ නම්, නැවත සේවයේ පිහිටුවීමේ නියෝගයක්ද, වැඩ තහනම් කළ කාලයේ නොගෙවා සිටි වැටුප් කිසිවක් වේ නම්, ඒවා ගෙවන ලෙසට නියෝග කළ යුතු වුවද එකී කාර්යයන් ඉටු නොකර වැඩ තහනමකට ලක් වූ අධ්‍යක්ෂක ජනරාල්වරයා සහ පරිපාලන නිලධාරිනිය නැවත සේවයේ පිහිටුවා තිබූ අතර, වැඩ තහනමට ලක් වූ කාලයට අදාලව වැටුප් හා දීමනා ලෙස රු.666,026ක් ගෙවා තිබුණි. | ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතු බව. | පැහැදිලි කිරීම් ඉදිරිපත් කර තිබුණි. | ආයතන සංග්‍රහය ප්‍රකාරව විධිමත් විනය පරීක්ෂණයක් පවත්වා නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | මෝටර් රථයක් හා ත්‍රිරෝද රථයක් වසර කිහිපයක් තිස්සේ ධාවනයේ නොයොදවා ආයතන පරිශ්‍රය තුල ගාල්කර පැවති අතර අපහරණය කළ යුතු පාවිච්චි කළ නොහැකි වාහන සම්බන්ධයෙන් 2020 අගෝස්තු 28 දිනැති අංක 01/ 2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය 13.2 ඡේදය මගින් ඇතුළත් කළ මුදල් රෙගුලාසි 770(4) චක්‍රලේඛ විධිවිධාන පරිදි කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු බව. | ත්‍රිරෝද රථය සම්බන්ධයෙන් චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කරන අතර මෝටර් රථය අළුත්වැඩියා කර ආයතනයේ පාවිච්චිය සඳහා ගැනීමට කටයුතු කරන බව. | චක්‍රලේඛය ප්‍රකාරව 2021 වර්ෂයේදීද අපහරණය කිරීමට හෝ අළුත්වැඩියා කිරීමට කටයුතු කර නොමැත. |
| (ඊ) | 2018 ජූලි 18 දිනැති අංක 03/2018 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ II ඡේදය ප්‍රකාරව කලමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය ලබා ගැනීමකින් තොරව 2020 වර්ෂය තුලදී නිලධාරීන් 11 දෙනෙකු බඳවාගෙන රු.1,726,853ක මුදලක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු බව. | බඳවා ගැනීම් කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා යොමු කර ඇත. | 2021 වර්ෂයේදීද කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා දී නොමැත. |
| (උ) | 2019 වර්ෂයේදී බහුකාර්ය මුද්‍රණ යන්ත්‍රයක් රු.2,024,000කට මිලදී ගෙන තිබුණි. මෙම මුද්‍රණ යන්ත්‍රය මිලදී ගැනීමේ මූලික අරමුණ සහතිකපත් 50,000 – 100,000 දක්වා වූ ප්‍රමාණයක් මුද්‍රණය කිරීම වුවද, ආයතනයේ අවශ්‍යතාවයට ගැලපෙන පරිදි තාක්ෂණික | අවශ්‍යතාවය නිසි පරිදි හඳුනාගැනීමෙන් පසුව මිලදී ගැනීම් කටයුතු සිදුකල යුතු බව. | මෙම මුද්‍රණ යන්ත්‍රය ආයතනයේ බොහෝ මුද්‍රණ අවශ්‍යතා සඳහා භාවිතා කරනු ලැබුවද, සියළුම මුද්‍රණ කටයුතු මෙම මුද්‍රණ යන්ත්‍රයෙන් පමණක් සිදු කල නොහැක. | මුද්‍රණ යන්ත්‍රය මිලදී ගැනීමේ මූලික අරමුණ සහතිකපත් මුද්‍රණය කිරීම වුවද, එම අරමුණ ළඟා කරගෙන නොතිබුණි. |

පිරිවිතර සකස් නොකර මිලදීගැනීමට කටයුතු කිරීම හේතුවෙන් 2020 වර්ෂයේදි සහතිකපත් 38000ක් මුද්‍රණය කිරීම වෙනුවෙන් රු.1,026,000ක් බාහිර ආයතනයක් වෙත ගෙවා තිබුණි.

## 28. ජාතික මෝස්තර මධ්‍යස්ථානය

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 - තතත්ත්වාගණනය කළ මතය

2019 - තතත්ත්වාගණනය කළ මතය

2020 - තතත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | ජාතික මෝස්තර මධ්‍යස්ථානය හා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන එක්ව 2014 දෙසැම්බර් 08 දිනැති ගිවිසුම ප්‍රකාරව මඩකලපුව, මන්නාරම, වවුනියාව, අනුරාධපුර, මොණරාගල, පුත්තලම හා අම්පාර යන දිස්ත්‍රික්ක වල හස්ත කර්මාන්ත ශිල්පීන් හා ශිල්පීය කණ්ඩායම් සඳහා ශිල්පීය තාක්ෂණික හැකියා සංවර්ධනය සහ උපදේශක සහය ලබාදීම සඳහා 2020 දෙසැම්බර් 31 දින වන විට රු.51,313,305ක ප්‍රතිපාදන ලබාදී තිබුණි.UNDP ආයතනය විසින් 2018 ජනවාරි 15 දිනැතිව නිකුත් කරනලද ලිපිය මගින් දැනුම්දී ඇති පරිදි 2018 පෙබරවාරි 28 දින වනවිට අවසන් ව්‍යාපෘති වාර්තාව ඉදිරිපත් කළයුතුව තිබුණද, ව්‍යාපෘතිය අවසන් කොට නොතිබුණු අතර ඉතිරිවූ රු.2,312,228 ක මුදල ඌන උපයෝජිතව පැවතුණි. | ලද ප්‍රතිපාදනයෙන් උපරිම ප්‍රයෝජන ලබාගෙන ව්‍යාපෘතියේ අරමුණු ඉටුවන ආකාරයට කටයුතු කලයුතුයි | කොවිඩ් තත්වය හේතුවෙන් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. | 2021 වර්ෂය අවසානය දක්වාම ව්‍යාපෘති නිමකර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | මධ්‍යස්ථානය විසින් පවත්වාගෙන යනු ලබන ගෘහ අභ්‍යන්තර පිරිනිර්මාණකරණ ජාතික ඩිප්ලෝමාව සහ ගෘහ අභ්‍යන්තර පිරිනිර්මාණකරණ උසස් ජාතික ඩිප්ලෝමාව යන පාඨමාලා සඳහා එක් සිසුවෙකුගෙන් රු.90,000ක් බැගින් ගාස්තු අයකර ගැනීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. පාඨමාලාවන් තෘතියික අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචිය 2014 පෙබරවාරි 24 දින සිදුකර තිබුණද, ලියා පදිංචි කොට වසර 07 ක් ගතවී ඇතත් NVQ මට්ටමට උසස් කිරීමට 2020 වර්ෂයේදීද නොහැකිවී තිබුණි. මේ හේතුවෙන් ශිෂ්‍යයන් සඳහා නිකුත්කරනු ලබන සහතිකපත්‍රය ක්ෂේත්‍රය තුළ පිළිගත් සහ වටිනාකමකින් යුක්ත සහතිකපත්‍රයක් නොවන අතර, හුදෙක් පාඨමාලාව සම්පූර්ණ කළබවට අධ්‍යක්ෂවරයාගේ සහ සභාපතිවරයාගේ අත්සනින් නිකුත්කළ සහතික පත්‍රයක් පමණක් වී තිබුණි. | පාඨමාලා ගාස්තු අයකිරීම් පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගතයුතු අතරම පාඨමාලාවේ ගුණාත්මක භාවය සඳහා පිළිගත් සහතිකයක් නිකුත් කල යුතුයි | මෙම පාඨමාලාව NVQ මට්ටමට සැකසීම සඳහා මූලික කටයුතු තෘතීය හා වෘත්තීය පුහුණු අධිකාරිය සමඟ එකට කටයුතු කරමින් දැනට විෂය නිර්දේශයේ මූලික කටයුතු අවසන් කර ඇති බව. | 2021 වර්ෂයේදීද පාඨමාලා උසස් කිරීම් කටයුතු සිදුකර නොතිබුණි. |

**29.** **ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව**

මූලා‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - තතත්ත්වාගණනය නොකළ මතය

2019 - තතත්ත්වාගණනය නොකළ මතය

2020 - තතත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | වැඩ තහනමට ලක්කළ කොමිෂන් සභාවේ අධ්‍යක්ෂකවරයෙකු 2018 පෙබරවාරි 20 දින සිට වහාම ක්‍රියාත්මක වන පරිදි විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාතයාංශය වෙත ස්ථාන මාරු කර යවා පසුව අනිවාර්ය නිවාඩු ලබාදී පවා තිබියදී අතිරික්ත ලෙස නිලධාරියා වෙත 2018 මාර්තු 01 දින සිට 2019 දෙසැම්බර් 31 දින දක්වා වැටුප් හා දීමනා ලෙස රු.3,036,619ක් ගෙවා තිබුණි. | අනිවාර්ය නිවාඩු යවා ඇති නිලධාරියෙකුට ගෙවීම් කල හැක්කේ විනය පරීක්ෂණ අවසන් වී එහි නිර්දේශ මත පමණක් වන අතර ඒ මත ක්‍රියාකලයුතු බව. | 2020 ජූලි මස 01 දින සිට හිටපු අධ්‍යක්ෂකතුමාගේ සේවය වැටුප් රහිතව අත්හිටුවීමට සහ චෝදනා පත්‍රයක් නිකුත් කිරීමට තීරණ ක්‍රියාත්මක කරන ලදී. මූලික විමර්ශන නිලධාරි විසින් සකස් කල එම චෝදනා පත්‍රය කොමිෂන් සභාවේ අනුමැතියෙන් අධ්‍යක්ෂකතුමා වෙත යොමු කරන ලදී. මේ හා අදාළ ඉදිරි විමර්ශන ඉක්මනින් අවසන් කිරීමට කටයුතු කරනු ලැබේ. | අදාල ගෙවීම් කළ නිලධාරීන්ගෙන් හෝ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව ආයතනික සමාලෝචනය සඳහා ආයතන 06 ක් සැලසුම් කර ඇතත් ආයතන 03 ක පමණක් සමාලෝචනය නිම කර තිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව වර්ෂය තුල ඉටු කිරීමට සැලසුම් කරන ලද කටයුතු සිදු කල යුතු බව. | ආයතන වලින් දත්ත එක්රැස් කිරීම කාර්යක්ෂම කිරීමේ අරමුණින් ජාතික විද්‍යා හා තාක්ෂණ දියුණු කිරීමේ පනතින් ලබා දී ඇති බලතල අනුව ගැසට් පත්‍රයක් නිකුත් කිරීමට නව කොමිසම කටයුතු කරමින් සිටී. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කරන ලද කටයුතු නිසි ලෙස ඉටු කිරීමට පියවර ගැනීමට කටයුතු කරමින් පවතී. |
| (ඇ) | විද්‍යා හා තාක්ෂණ අධ්‍යයනය හා සම්පාදන ව්‍යාපෘති හරහා නිමකළ යුතු ජාතික විද්‍යා හා | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව වර්ෂය තුල ඉටු කිරීමට සැලසුම් | 2018 වර්ෂයේ සිදු කිරීමට සැලසුම් කර තිබූ ප්‍රතිපත්ති වාර්තා 03 ක් කෙටුම්පත් | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කරන ලද කටයුතු |

| | | | |
|---|---|---|---|
| තාක්ෂණ ප්‍රතිපත්ති 03 ම වර්ෂය තුළ නිම කළ යුතු වුවත් ඒවා නිම කර නොතිබුණි. | කරන ලද කටයුතු සිදු කල යුතු බව. | මට්ටම (Draft Level) දක්වා නිම කර ඇත. නව වන ද්වි වාර්ෂික විද්‍යා හා තාක්ෂණ සමුච්චට සමගාමීව ජාතික විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති තුනක් සැකසීමට සැලසුම් කර අදාළ විද්වත් මණ්ඩල සැසි පැවැත්වූ නමුත් අදාළ සමුළුව 2018 වර්ෂයේ නොපැවැත් වීම හේතුවෙන් එම ප්‍රතිපත්ති එම වර්ෂය තුළ නිම කිරීමට නොහැකි විය. | නිසි ලෙස ඉටු කිරීමට පියවර ගැනීමට කටයුතු කරමින් පවතී. |

## 30. ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 - මතය වියාචනය

2019 - තතත්ත්වාගණනය කළ මතය

2020 - තතත්ත්වාගණනය නොකළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2019 දෙසැම්බර් 31 දින වන විට ශ්‍රම අධ්‍යයන ආයතනයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 09 න් 06 ක් ම පුරප්පාඩුව පැවති අතර මෙම ආයතනය පිහිටුවීමේ ප්‍රධාන කාර්යයන් වන පර්යේෂණ හා සමීක්ෂණ පැවැත්වීම සහ ශ්‍රම අධ්‍යනයට අදාල පාඨමාලා සඳහා විධිවිධාන යෙදීම, සඟරා, වාර ප්‍රකාශන සහ වෙනත් පල කිරීම් ආදී කටයුතු කාර්යක්ෂමව ඉටු නොවීමටද මෙම කාර්ය මණ්ඩලයේ ඌනතාවයද බලපා ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය. තවද, පුහුණු වැඩසටහන් පැවැත්වීම ආයතනයේ ප්‍රධාන කාර්යයක් ලෙසට සිදුකලද, ආයතනයේ කාර්ය මණ්ඩලයට අනුමත කර තිබෙන අධ්‍යක්ෂ (පුහුණු හා සංවර්ධන) තනතුර ආයතනය ආරම්භකල වර්ෂයේ සිටම පුරප්පාඩුව පැවතුණි. | ආයතනික අරමුණු සපුරා ගත හැකි වන ලෙස භාණ්ඩාගාරයෙන් ඉල්ලීම්කර අවශ්‍ය පුරප්පාඩු පුරවා ගැනීමටත් මානව සම්පත උපරිම කාර්යක්ෂමතාවයෙන් උපයෝජනය කිරීමටත් කටයුතු කළයුතු බව. | ක්‍රමිකව ආයතනයේ කාර්යය මණ්ඩලය සම්පූර්ණ කර ගනිමින් ආයතනයට නියමිත සියලු කාර්යයන් ක්‍රියාත්මක කිරීමට ඉදිරියේදී අපේක්ෂා කෙරේ. | ක්‍රමිකව අනෙකුත් කාර්යය මණ්ඩලය බඳවා ගැනීමට කටයුතු යොදා ඇත. |
| (ආ) | එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මගින් 2001 වර්ෂයේදී කම්කරු දෙපාර්තමේන්තුවේ සේවක | මෙම විමර්ශන කඩිනම් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | කොළඹ වංචා විමර්ශන අංශයට වාර්තා කිරීමෙන් පසු එහි මුල් ගොනුව හා පැවරීම් ගොනුව ලබාදෙන ලෙස | මේ සම්බන්ධයෙන් මුල් ගොනුව ලබාගැනීමට අධිකරණ නියෝගය |

අධ්‍යාපන අංශය වෙත පරිත්‍යාග කර තිබූ වෑන් රථයක් 2008 වර්ෂයේදී සේවක අධ්‍යාපන අංශය කම්කරු දෙපාර්තමේන්තුවෙන් වෙන්ව ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය ලෙස ස්ථාපිත කරන විට ආයතනයට භාරදී තිබුණද මෙම වාහනය ආයතනය වෙත විධිමත්ව පවරාගෙන නොතිබුණි. වාහනයේ කාර්මික දෝෂයක් හේතුවෙන් ධාවනයෙන් ඉවත්කර තිබූ නමුත් මෙම වාහනයේ ලියාපදිංචි අංකයට සමාන ලියාපදිංචි අංකයක් සහිතව පෞද්ගලික හිමිකරුවෙකු සතුව වෑන් රථයක් පවතින බව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් තහවුරු කර තිබූ අතර ආයතනය විසින් කොළඹ වංචා විමර්ශන කාර්යාංශය වෙත 2020 ජනවාරි 05 දින පැමිණිලි කිරීමෙන් පසු එම කාර්යාංශය විසින් අධිකරණ නියෝගයක් මගින් එම වාහනයට අදාල මුල් ගොනුව හා පැවරුම් ගොනුව කාර්යාංශය වෙත ඉදිරිපත් කරන ලෙස මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්ට දන්වා තිබුණද 2020 දෙසැම්බර් 31 දිනටත් එම ගොනු ලබා නොදීම හේතුවෙන් පරීක්ෂණ කටයුතු නැවතී තිබුණි.

මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් වෙත දන්වා නැවතත් ඉල්ලීමක් කලද තවම ලබාදී නොමැත.

මෝටර් රථ දෙපාර්තමේන්තුව වෙත භාරදී ඇත.

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | රාජ්‍ය අංශයේ සංස්ථා, ව්‍යවස්ථාපිත ආයතන සහ පෞද්ගලික අංශයේ ආයතනික අවශ්‍යතා මත කාර්යමණ්ඩල බඳවා ගැනීමේ, කාර්යක්ෂමතා කඩඉම් සහ ඇගයීම් හා සේවා උසස් කිරීම සඳහා වූ විභාග, විභාග අංශය විසින් පවත්වනු ලැබේ. නමුත් ප්‍රශ්නපත්‍ර සැකසීම, පිළිතුරු පත්‍ර ඇගයීම මණ්ඩලයක් විසින් නොව එකම පුද්ගලයෙකු විසින් සිදුකරනු ලබන අතර මෙමගින් විභාග විෂමතාවයන් ඇතිවීමේ අවධානමක් පවතින බව නිරීක්ෂණය විය. | පිළිගත් ආරක්ෂණ ක්‍රමවේද අනුගමනය කිරීම, රහස්‍යභාවය ආරක්ෂා කිරීම සඳහා සලසා ඇති පාලන ක්‍රම ආදියේ තොරතුරු විගණනය වෙත ලබාදිය යුතුය. විගණනය රහස්‍යභාවය රැකීමට බැඳී සිටී. | විභාග අංශයට අදාල සම්පත්දායක සංචිතය තෝරා ගැනීම, ගෙවීම් කටයුතු විධිමත් කිරීම සඳහා ක්‍රමවේද හඳුන්වා දෙමින් 2021 පෙබරවාරි 02 දින පැවති පාලක මණ්ඩල රැස්වීමේදී පත්‍රිකා 02 ක් ඉදිරිපත් කර අනුමැතිය ලබාගන්නා ලදී. විභාග විෂමතාවය වළක්වා ගැනීම, පිළිගත් ආරක්ෂණ ක්‍රමවේද අනුගමනය කිරීම හා රහස්‍යභාවය ආරක්ෂා කිරීම සඳහා කළ හැකි සෑම ක්‍රියාමාර්ගයන්ම ගැනීමේ අවශ්‍යතාවය අප ආයතනය විසින් හඳුනාගෙන ඇති අතර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සෘජු අධීක්ෂණය යටතේ මෙම කටයුතු විධිමත් අයුරින් ඉටු කරනු ලැබේ. | විභාග විෂමතාවය වළක්වා ගැනීම, පිළිගත් ආරක්ෂණ ක්‍රමවේද අනුගමනය කිරීම හා රහස්‍යභාවය ආරක්ෂා කිරීම සඳහා වන ක්‍රියාමාර්ගයන් ගනිමින් විභාග අංශයේ නටයුතු වඩාත් ඵලදායී අයුරින් සිදුකිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පැවතියද නිශ්චිතව නිමකර නැත. |

## 31. ජාතික සමාජ සංවර්ධන ආයතනය

| මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය | |
|---|---|
| | 2018 - තත්ත්වාගණනය කළ මතය |
| | 2019 - තත්ත්වාගණනය කළ මතය |
| | 2020 - තත්ත්වාගණනය කළ මතය |

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | ආයතනයේ බැංකු ගිණුමේ බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව 2020 දෙසැම්බර් 31 දිනට හඳුනානොගත් ආදායම් තැන්පතු රු.3,308,461ක් විය. එය පිළිවෙලින් 2019 හා 2020 වර්ෂවලට අදාලව රු.1,374,832ක් හා රු.1,933,629ක් වූ අතර මෙම තැන්පතු හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | වර්ෂයේ ආදායම් නිසි ලෙස හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කඩිනමින් කටයුතු කළ යුතුය. | හඳුනානොගත් තැන්පතු හඳුනාගෙන ගිණුම්ගත කෙරෙමින් පවතී. | හඳුනානොගත් තැන්පතු හඳුනාගෙන ගිණුම්ගත කිරීමේ කටයුතු ක්‍රියාත්මක කෙරෙමින් පැවතියද, කටයුතු කඩිනමින් කිරීම කෙරෙහි ප්‍රමාණවත් ලෙස අවධානය යොමුකර නොතිබුණි. |
| (ආ) | අභ්‍යන්තර පරීක්ෂාවකට ලක්වන පරිදි නිසි වැඩ බෙදීම් යටතේ රාජකාරී පැවරීම් සිදුකර මුදල් පිළිබඳ කටයුතු ඉටුකරනු වෙනුවට ආයතනයේ බැංකු ගිණුම් 02හි මුදල් පොත් පැවැත්වීම ,චෙක්පත් ලිවීම සහ නිකුත් කිරීම , මාසික ගිණුම් සාරාංශ සකස් කිරීම සහ චෙක්පත් දින දීරඝ කිරීම යනාදි මුදල් පිළිබඳ සියලුම කාර්යයන් එක් නිලධාරියෙකු විසින් ක්‍රියාත්මක කර තිබුණි. | ආයතනයේ අභ්‍යන්තර පාලන පද්ධතිය නිසි පරිදි ක්‍රියාත්මක කළ යුතුය. | ආයතනයේ පුරප්පාඩු තනතුරු සඳහා බඳවාගැනීම් සිදුකර විධිමත් පරිදි වැඩ පැවරීම් සිදුකිරීමට පියවර ගැනීමට කටයුතු කෙරෙමින් පවතී. | පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම් සිදුකර විධිමත් පරිදි වැඩ පැවරීම් කටයුතු සිදුකිරීමේ ප්‍රමාදයක් පැවතිණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඈ) | ආයතනය විසින් පවත්වන උපාධි, ශාස්ත්‍රපති , ඩිප්ලෝමා යනාදි පාඨමාලා පිළිබඳ ප්‍රමාණවත් හා විධිමත් දැනුවත් කිරීමේ වැඩසටහන් මඟින් දැනුවත් කිරීම් සිදු නොකිරීම හේතුවෙන් නිසා ප්‍රමාණවත් පාඨමාලාලාභීන් සංඛ්‍යාවක් බඳවාගෙන පාඨමාලා පැවැත්වීම පිළිබඳ ආයතනයේ අරමුණු ඵලදායී ලෙස සාක්ෂාත් කරගැනීමට නොහැකි වී තිබුණි. | මධ්‍යස්ථානවල පවත්වන පුහුණු පාඨමාලා සම්බන්ධයෙන් දැනුවත් කිරීම් කාර්යක්ෂමව කිරීමට කටයුතු කළ යුතුය. | විධිමත් දැනුවත් කිරීමේ වැඩ සැලැස්මක් මත පාඨමාලා ලාභීන්ගේ සංඛ්‍යාව වර්ධනය කරගැනීමට ගෙන ඇති පියවර ප්‍රමාණාත්මක නොවීය. | දැනුවත් කිරීමේ වැඩසටහන් කාර්යක්ෂමව ක්‍රියාත්මක කර නොතිබුණි. ඒ සඳහා කටයුතු සූදානම් කෙරෙමින් පවතී. |
| (ඇ) | ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 102ක් වූ අතර ඉන් පුරප්පාඩු 36ක් පැවතිණි. ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර 2018 වර්ෂයේ සිට පුරප්පාඩුව පවතින අතර අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (අධ්‍යයන) එම තනතුරේ වැඩ බැලීම සිදුකර තිබුණි. | කඩිනමින් පුරප්පාඩු සඳහා බඳවාගැනීම් සිදුකිරීමට කටයුතු කළ යුතුය. | අධ්‍යක්ෂ ජනරාල් තනතුරේ බඳවාගැනීමේ පටිපාටිය සංශෝධනය කිරීමට කලමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමුකර 2020 වර්ෂයේදී ආයතනයේ බඳවාගැනීම් පටිපාටිය නැවත සංශෝධනය කර අනුමත කරගෙන තිබුණි. 2021 මැයි 28 දින තනතුරු වලට බඳවා ගැනීම සඳහා අයදුම්පත් නැවත කැඳවන ලදී. | පුරප්පාඩු තනතුරු සඳහා බඳවාගැනීමේ කටයුතු 2021 වර්ෂය තුළදීද සම්පූර්ණකර නොතිබුණි. |

## 32. ජාතික සමූපකාර සංවර්ධන ආයතනය

මූලා‍‍‍‍‍‍ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය | 2018 - තතත්ත්වාගණනය කළ මතය
--- | ---
 | 2019 - තතත්ත්වාගණනය කළ මතය
 | 2020 - තතත්ත්වාගණනය නොකළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2005 වර්ෂයේ සිට අඛණ්ඩව ඉදිරියට ගෙන එමින් පැවති දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු වැට් බදු ශේෂය රු.33,933,319ක් නිරවුල් කරගෙන නොතිබුණි. | ශේෂ නිරවුල් කර ගත යුතුය. | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් අයවිය යුතු වැට් බදු ශේෂය ලබාගැනීම සඳහා 2021 වර්ෂයේ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාට ලිඛිතව ඉල්ලීමක් කර ඇති අතර, ඒ සම්බන්ධ ලිපිගොනුවෙහි කටයුතු සිදුවෙමින් පවතී. | 2021 වර්ෂයේදී ලැබිය යුතු ශේෂ නිරවුල් කරගෙන නොතිබුණි. |
| (ආ) | බාහිර පාර්ශවයන් වෙත කුළියට දී ආදායම් ඉපයීමේ අරමුණින් 2014 වර්ෂයේදී රු.මිලියන 257 ක් වැය කර නරඹන්නන් 1127 ක ප්‍රමාණයක් සඳහා ඉඩ පහසුකම් ඇතිව හා ලොබි දෙකකින් සමන්විත ශ්‍රවනාගාරය 2018 වර්ෂයේදී ප්‍රයෝජනයට ගෙන තිබුණේ අවස්ථා 29 කදී පමණක් වන අතර, මෙම ශ්‍රවනාගාරය තුළ ආනයනික පුටු 160 කින් සමන්විත ජාත්‍යන්තර මට්ටමේ වැඩමුළු පැවැත්වීමට හැකි සම්මන්ත්‍රණ ශාලා දෙක 2014 වර්ෂයේ සිට නිෂ්ක්‍රීයව පැවතුණි. | ආදායම වර්ධනය කර ගැනීමට කටයුතු කළයුතුය. | ශ්‍රවණාගාරය සඳහා දැනට අයකරන ගාස්තු සංශෝධනය කර පවතින ඉල්ලුම වැඩිකර ගැනීම සම්බන්ධයෙන් යෝජනා ලබාගැනීමට පත්කල කමිටුව විසින් 2020 ජුනි 14 දින ලබාදුන් වාර්තාව අනුව එහි උපයෝජන මට්ටම වැඩි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | 2021 වර්ෂය අවසානය දක්වාම ආදායම් වර්ධනය කර ගැනීමට කටයුතු කර නැත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | ආයතනයේ වාණිජ වටිනාකමින් යුක්ත ඉඩම් කොටසක පිහිටි පැරණි කාර්යාල ගොඩනැගිල්ල නිෂ්කාර්යව පවතින අතර මෙය අලුත්වැඩියා හෝ නව ඉදිකිරීමක් සිදුකර ප්‍රයෝජනයට ගැනීමට කළමනාකරණයේ අවධානය යොමුවී නොතිබුණු අතර, මහවැලි ගොඩනැගිලි පරිශ්‍රය ලෙස හඳුන්වා ඇති ගොඩනැගිල්ලක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිෂ්ක්‍රීයව පැවතුණි. | ආයතනය සතු වත්කම් උපයෝජනය කළ යුතුය. | 2022 වර්ෂයේ ප්‍රතිපාදන මත පැරණි කාර්යාල ගොඩනැගිල්ල අළුත්වැඩියා කර ප්‍රායෝජනයට ගැනීමට සැලසුම් කර ඇත. මහවැලි ගොඩනැගිල්ල ලෙස හඳුන්වා ඇති ගොඩනැගිල්ල කළමනාකරණ මණ්ඩලය හා අමාත්‍යාංශ ලේකම්තුමාගේ අදහස් විමසා තීරණය කිරීමට නියමිතයි. | 2021 වර්ෂයේදීද ගොඩනැගිල්ල උපයෝජනය කිරීමට කටයුතු කර නැත. |
| (ඈ) | 2014 වර්ෂයේදී ආයතනයේ පුහුණු පාඨමාලාවල ප්‍රමිතිය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් ලැබී තිබුණු රු.6,000,000කින් රු.844,921ක මුදලක්ද, ශ්‍රවනාගාරය ඉදිකිරීම වෙනුවෙන් 2014 හා 2015 වර්ෂවලදී ලැබුණු රු.68,445,000 ක මුදලින් වැය නොකළ රු.24,844,722ක මුදලක් ද, 2017 වර්ෂයේදී බහුකාර්යය ගොඩනැගිල්ලට ප්‍රතිපාදිත මුදලින් රු.305,589ක් 2020 වර්ෂය අවසානය දක්වා බැංකු ජංගම ගිණුම තුළ නිෂ්කාර්යව රඳවාගෙන තිබුණි. | අරමුදල් ඵලදායී ලෙස උපයෝජනය කළ යුතුය. | ප්‍රමාදවීම් වලක්වා ගනිමින් අදාල ව්‍යාපෘති සඳහා ලැබෙන මුදල් එම කාල පරිච්ඡේදය තුල උපයෝජනය කරගැනිමට හැකිවන පරිදි අදාල ව්‍යාපෘති වල කාර්යයන් අවසන් කිරීමට සැලසුම් කර ඇත. | උපයෝජනය නොකළ අරමුදල් ලැබීම් නැවත භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 6 ක එකතු වටිනාකම රු.4,647,242ක් වූ අතර, ඒ තුළ වසර 1 ත් වසර 5 ත් අතර කාලයක පැවති ශේෂ එකතුව රු.2,160,384ක් හා වසර 5 ට වඩා වැඩි කාලයක් තිස්සේ නිරවුල් නොකල ශේෂවල වටිනාකම රු.1,129,054ක් විය. | නොපමාව අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | 2021 ජනවාරි 01 දින වන විට හිඟ ශේෂයෙන් රු.2,442,067 ක් අයකර ගෙන ඇත. | 2022 ජනවාරි 31 දිනට රු.2,205,174ක් අයවීමට පවතී. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 7 ක එකතු වටිනාකම රු.47,584,416ක් වූ අතර,ඒ තුළ වසර 1 ත් වසර 5 ත් අතර කාලයක නිරවුල් නොකළ ශේෂ එකතුව රු.46,636,251ක් විය. | නොපමාව පියවීමට කටයුතු කළ යුතු වීම. | 2022 ජනවාරි 31 දිනට රු.145,421ක් නිරවුල් කර ඇත. | 2022 ජනවාරි 31 දිනට රු.46,132,994ක් නිරවුල් කිරීමට ඇත. |
| (උ) | ජාතික සමූපකාර සංවර්ධන ආයතනයට අයත් පොල්ගොල්ල උයන්වත්ත මංසන්ධියේ පිහිටි පොත් අගය රු.1,200,000ක් වටිනා භාවිතයට නොගන්නා ආයතනික ගොඩනැගිල්ල, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධව හෙළ බොජුන්හලක් ස්ථාපිත කිරීමට, 2017 අගෝස්තු 03 කළමනාකරණ අනුමැතිය ලබාදී තිබුණු අතර 2019 මැයි 30 දිනැති කළමනාකරණ තීරණයෙන් ඉහත සඳහන් හෙළ බොජුන්හලට අමතරව | කළමනාකරණ තීරණ කඩිනමින් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වීම. | මෙම ව්‍යාපෘති යෝජනාව සම්බන්ධයෙන් කළමනාකරණ මණ්ඩලයේ තීරණය හා අමාත්‍යාංශ ලේකම්තුමා දරණ අදහස අතර, පරස්පරතාවයක් පවතින බැවින් සාකච්ජා කර සුදුසු තීරණයක් ගැනීමට නියමිතයි. | වත්කම් කාර්යක්ෂමව උපයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | සමූපකාර නිෂ්පාදන අලෙවිසැලක් පිහිටුවීමට තීරණය කර ව්‍යාපෘති යෝජනාවක් සකස් කර තිබුණද එම කළමනාකරණ තීරණ ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබූ අතර 2021 මැයි මාසය වන විටත් එම ගොඩනැගිල්ල ප්‍රයෝජනවත් කාර්යයක් සඳහා යොදාගෙන නොතිබුණි. | | | |
| (ඌ) | ජාතික සමූපකාර සංවර්ධන ආයතනය තුළ ඉදිකර ඇති බහුකාර්ය ගොඩනැගිල්ලේ වර්ග අඩි 2979 ක් පමණ වූ බිම් මහලේ පවත්වාගෙන ගිය සමූපකාර කෝප්සිටි වෙළඳසැල 2017 අගෝස්තු 25 දිනෙන් පසු වසාදමා නිෂ්කාර්යව පැවතුණි. | ආයතනය සතු සම්පත් උපරිම ප්‍රතිලාභයක් ලබාගත හැකි පරිදි උපයෝජනය කිරීමට සැලැසුම් සකස් කර ක්‍රියාත්මක කළ යුතු වීම. | මේ සම්බන්ධව කාර්යමණ්ඩලයේ යෝජනා ලබාගැනීමට කටයුතු කර ඇති අතර, එම යෝජනා හා අදහස් සලකා බලා වඩාත් සුදුසු හා ඵලදායී යෝජනාව ක්‍රියාත්මක කිරීමට සටහන් කර ඇත. | 2021 වර්ෂයේදීද විකල්ප ක්‍රියාමාර්ග පිළිබඳ සලකා බලා නොතිබුණි. |

**33. ජාතික ළමා ආරක්ෂක අධිකාරිය**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 - තතත්ත්වාගණනය කළ මතය

2019 - තතත්ත්වාගණනය කළ මතය

2020 - තතත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | අධිකාරියේ 1929 දුරකතන අංකයට ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීම සඳහා සුදුසු යාන්ත්‍රණයක් සකස් කිරිම සහ අදාළ ක්‍රමවේදය වැඩිදියුණු කිරීමට නිර්දේශ ලබාගැනීම වෙනුවෙන් උපදේශිකාවක් වෙත 2016/2017 වර්ෂවලදී රු.900,000ක් ද, පරිගණක පද්ධතියක් සකස් කිරීම සඳහා රජයේ ආයතනයකට රු.1,200,000ක් ද ගෙවා තිබුණි. උපදේශිකාවගේ වාර්තාව ලබා දී වර්ෂ 3 ක කාලයක් ගත වී තිබුණ ද, එහි ඇතුළත් නිර්දේශ හා ක්‍රමවේද අනුගමනය කිරීම කෙරෙහි කළමනාකරණයෙහි අවධානය යොමු වී නොතිබූ අතර, දත්ත පද්ධතියද ක්‍රියාත්මක කර නොතිබුණි. | උපදේශක වාර්තාව මඟින් ලබා දී ඇති නිර්දේශ ක්‍රියාත්මක කර දත්ත පද්ධති ක්‍රියාත්මක කිරීම කෙරෙහි කඩිනමින් අවධානය යොමු කළ යුතු බව. | අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නැත. | අමාත්‍යාංශයෙන් මේ පිළිබඳව පරීක්ෂා කිරීමට කමිටුවක් පත් කර වාර්තාවක් ලබා දී තිබුණද ඒ පිළිබඳ කිසිදු පියවරක් 2021 දෙසැම්බර් 31 දක්වාම ගෙන නොතිබුණි. |
| (ආ) | ළමා අපචාර වැළැක්වීමේ කාර්යය සඳහා සහ එවැනි අපචාරවලට ගොදුරු වූවන් ආරක්ෂා කිරීම, ඔවුන්ගේ අයිතීන් රැක ගැනීම සහ ගතයුතු සියළු ක්‍රියාමාර්ග ගැනීම වෙනුවෙන් 2010 | පනතේ අරමුණුවලට අනුකූලව කටයුතු කළ යුතුය. | මෙම අරමුදලෙහි ශේෂය පරීක්ෂා කර බලා නියමිත පරිදි වියදම් කළයුතු බැවින් පරීක්ෂා කිරීම් සිදුකර ප්‍රතිපාදන නිකුත් කිරීමට නියමිතව ඇත. | අරමුදලෙහි අරමුණු ඉටුකර ගැනීම වෙනුවෙන් කිසිදු මුදලක් 2021 දෙසැම්බර් 31 දක්වාම වැය කර නොතිබුණු අතර අදාල මුදල් |

| | | | | |
|---|---|---|---|---|
| | වර්ෂයේ දී ජාතික ළමා ආරක්ෂක අරමුදල පිහිටුවන ලද අතර, 2021 මාර්තු අවසානය වන විට අරමුදලෙහි රු.2,378,477ක ශේෂයක් පැවතියද 2018 වර්ෂයේ සිට අරමුදලෙහි අරමුණු ඉටුකර ගැනීම වෙනුවෙන් කිසිදු මුදලක් වැය කර නොතිබුණි. | | | ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. |
| (ඈ) | 2016 වර්ෂයේ රු.18,317,757ක ටිනාකමකට කල්බදු පදනම යටතේ ලබා ගත් ඉඩම 2021 අගෝස්තු 31 දින වන විටත් නිශ්කාර්යව පැවතුණි. | සම්පත් උපරිම කාර්යක්ෂමතාවයෙන් යුතුව භාවිතා කල යුතුය. | භාණ්ඩාගාර ප්‍රතිපාදන සැලසුම් කර ඉල්ලීම් කල ද, මූල්‍ය ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් ඉදිකිරීම් කටයුතු සිදු කිරීමට නොහැකි වී ඇත. | 2021 දෙසැම්බර් 31 දින වන විටද කිසිදු කාර්යයකට යොදවා ගැනීමකින් තොරව නිෂ්කාර්යව පැවතුණි. |
| (ඇ) | 2011 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා අධිකාරිය වෙත වාර්තා වී ඇති පැමිණිලි සංඛ්‍යාව 89,405 කින් පැමිණිලි 40,668 ක් විසඳීම සඳහා කඩිනම් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි. | 2011 වර්ෂයේ සිට පවතින නොවිසඳී ඇති පැමිණිලි කඩිනමින් විසඳීමට පියවර ගත යුතුය. | 2021 වර්ෂයේ සිට පැමිණිලි කඩිනමින් විසඳීම සඳහා වැඩපිළිවෙලක් සකස් කර ඇත. | මෙම විසදා නොමැති පැමිණිලි පිළිබඳ පරීක්ෂා කිරීමට නීති ශිෂ්‍යයන් හට භාර දී ඇත. ඔවුන්ගේ නිර්දේශ නීතිය ක්‍රියාත්මක කිරීමේ අධ්‍යක්ෂ වෙත යොමු කර අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරමින් පවතී. |
| (ඉ) | අධිකාරිය පිහිටුවා වසර 21 ක් ගත වී ඇතත් පනත ප්‍රකාරව ජාතික දත්ත පදනමක් සකස් කර නොතිබුණි. | ජාතික දත්ත පද්ධතිය කඩිනමින් සකස් කල යුතුය. | 2021 වර්ෂය අවසානයේදී දත්ත පද්ධතියක් සකස් කිරීමට කටයුතු කර ඇත. | 2021 දෙසැම්බර් 31 වන විටත් ජාතික දත්ත පද්ධතියක් සකස් කිරීමට කටයුතු කර නොතිබුණි. |

**34. ජේ.ආර්.ජයවර්ධන මධ්‍යස්ථානය**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 - තත්ත්වාගණනය කළ මතය

2019 - තත්ත්වාගණනය කළ මතය

2020 - තත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2015 මැයි 25 දිනැති PED 01/2015 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.5 හා 3.8 වගන්ති අනුව නිල වාහනයක් හිමි නිලධාරියෙකු විසින් 2019 වර්ෂයේදී සංචිත වාහනයක් පුද්ගලික ගමන් සඳහා කි.මී.6229ක් ධාවනය කර ඒ සඳහා රු.136,203ක් ඉන්ධන වෙනුවෙන් හා රු.202,473ක් රියදුරුගේ අතිකාල හා අනෙකුත් දීමනා වෙනුවෙන් මධ්‍යස්ථානය විසින් ගෙවා තිබුණි. | චක්‍රලේඛ නියමයන්ට හා සීමාවන්ට යටත්ව කටයුතු කල යුතු බව | 2021වර්ෂයේ ජනවාරි මස සිට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 05/2016 අනුව නිල වාහනය ආයතනයේ කටයුතු සඳහා යොදවා ඉහත සඳහන් චක්‍රලේඛයේ පහත සඳහන් කොන්දේසිවලට යටත්ව රු. 50,000 ක මාසික දීමනාවක් ලබා ගනු ලැබේ. | නැවත සිදු වීම වැළැක්වීම සඳහා සුදුසු පියවර ගෙන තිබුණද, මධ්‍යස්ථානය විසින් දැරූ පිරිවැය වගකිව යුතු නිලධාරියාගෙන් අයකර ගෙන නොමැත. |
| (ආ) | 2002 වර්ෂයේදී පෞද්ගලික බැංකුවක රු.9,725,000ක මුදලක් ස්ථාවර තැන්පතු ලෙස ආයෝජනය කර තිබුණු අතර එම බැංකුව බුන්වත් වීම හේතුවෙන්, සියයට 5ක වාර්ෂික පොලියක් මත, 2017 වසරේ ආපසු ලබාගත හැකි පරිදි අදාල මුදල්වල වගකීම ණයකර ලෙස ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුවට පවරා දී තිබුණි. 2017 දෙසැම්බර් 03 දින මෙම ණයකර කල් පිරී තිබුණද මුල් මුදල හා වසර 09 | කල් පිරීඇති ණයකර හා වසර 09 ක පොලී ආපසු ලබාගැනීමට කටයුතු කල යුතුයි. | 2022 වර්ෂයේ දී පාලක මණ්ඩල රැස්වීමක් සංවිධානය කර ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුවේ ණයකර තුල ආයෝජනය කර ඇති මෙම මුදල ආපසු ලබාගැනීමට සහ නැවත වෙනත් රාජ්‍ය බැංකුවක් තුල එම මුදල ආයෝජනය කිරීමට අපේක්ෂිතය. | 2021 වර්ෂයේදීද අදාළ කරුණ නිවැරදි කරගෙන නොමැති බැවින් තවදුරටත් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | ක පොලී මුදල වූ රු.14,101,250 ආපසු ලබාගැනීමට කටයුතු කර නොතිබූ අතර ණයකර තැන්පතු වලට අදාල සෘජු ශේෂ සනාථන විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | | | |
| (ඇ) | 1998 වර්ෂයේ ජේ.ආර්.ජයවර්ධන තොරතුරු මධ්‍යස්ථානය නැමැති අනුබද්ධිත පෞද්ගලික සමාගමක රු.5,000,000ක් ආයෝජනය කර තිබූ අතර එම සමාගම 2008 වර්ෂයේදී වසාදැමීම හේතුවෙන් ආයෝජනයෙන් රු.700,000ක් පමණක් ආපසු ලැබී තිබුණි. වසර 12 ක කාලයක් ගත වී ඇතත් උපලබ්ධි කරගත නොහැකි වූ ඉතිරි රු.4,300,000ක ශේෂය අඛණ්ඩව මූල්‍ය ප්‍රකාශනයන්හි දිගුකාලීන ආයෝජනයක් ලෙස දක්වා තිබුණි. උපලබ්ධි නොවන මෙම ආයෝජන ශේෂය සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය හෙළිදරව් කිරීම් කර නොතිබුණි. | ආයෝජන ශේෂය අලාභයක් ලෙස ගිණුම්වලට ගැලපීම සඳහා අවශ්‍යය හෙලිදරව් කිරීම් කල යුතුය. අලාභය වගකිව යුතු පාර්ශවයන්ගෙන් අය කර ගැනීමට අවශ්‍ය පියවරගත යුතුය. | 2022 වර්ෂයේ දී පැවැත්වීමට නියමිත පාලක මණ්ඩල රැස්වීම සඳහා මේ සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කර මෙම ආයෝජන මුදල ගිණුම් තුලින් ලියා හැරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු සම්පාදනය කොට ඇත. | 2021 වර්ෂයේදී හෝ අදාළ කරුණු නිවැරදි කරගෙන නොමැති බැවින් තවදුරටත් පවතී. |
| (ඇ) | 2013 - 2019 කාල පරිච්ඡේදයට අදාලව ලැබිය යුතු කුලී ආදායම රු.5,664,347ක් අයකර ගැනීමට ප්‍රමාණවත් පියවර ගෙන නොතිබූ අතර ඒ තුල මේ වන විට කුලී පදනමෙන් | අදාල මුදල් අයකර ගැනීමට කටයුතු කල යුතුයි. | වර්ථමානයේ දී ගොඩනැගිලි කුලියට ලබා දී තිබෙන ආයතන වෙත සෑම මසකම කුලිය ඊලග මස 10 වන දිනට පෙර ගෙවන ලෙස දැනුවත් කොට ඇත. | 2021 වර්ෂයේදී හෝ ලැබිය යුතු මුදල් අයකරගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | ඉවත්වූ ආයතන 05ක් වෙතින් අයවිය යුතු රු.4,093,380ක් ද විය. | | | |
| (ඉ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි, 08 වන වගන්තිය ප්‍රකාරව මධ්‍යස්ථාන කෞතුකාගාරයේ ඇති පෞරාණික වටිනාකමකින් යුත් ප්‍රවේණිගත වත්කම් පිළිබඳ හෙළිදරව් කර නොතිබුණි. | ප්‍රමිතයේ නියමයන්ට අනුව ප්‍රවේණිගත වත්කම් පිළිබඳ හෙළිදරව් කිරීම් කල යුතුය. | 2021 වර්ෂයේ සිට මධ්‍යස්ථාන කෞතුකාගාරයේ ඇති පෞරාණික වටිනාකමකින් යුත් ප්‍රවේණිගත වත්කම් පිළිබඳ හෙළිදරව් කිරීමට අපේක්ෂිතය. | 2021 වර්ෂය අවසන් වන විටත් අදාල හෙළිදරව් කිරීම්වලට අදාල විස්තර හෝ ගොනුකර නොමැත. |
| (ඊ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි, 50 වන වගන්තිය ප්‍රකාරව ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම වෙන වෙනම ගිණුම්ගත නොකර ඉඩම් ද ඇතුලත් ගොඩනැගිලි වෙනුවෙන් සියයට 5ක එනම් රු.1,731,644ක ක්ෂය වෙන් කිරීම් කර තිබුණි. | ප්‍රමිතයේ නියමයන්ට අනුව කටයුතු කළ යුතුය | 2015 වර්ෂයේ දී ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම තක්සේරු දෙපාර්තමේන්තුව හරහා තක්සේරු කර ඇති අතර 2022 වර්ෂයේ දී තක්සේරු ගාස්තු ගෙවීම සඳහා අවශ්‍ය පාලක මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව අදාල තක්සේරු වාර්තාව ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. | 2021 වර්ෂයේදීද අදාළ කරුණ නිවැරදි කරගෙන නොමැති බැවින් තවදුරටත් පවතී. |
| (උ) | ගොඩනැගිලි කුලියට ලබාදීමේදී, වර්ග අඩියක් රු.115 සිට රු.165ක් වූ වැනි ඉතා අඩු මිල ගණන් යටතේ කුලියට ලබාදී තිබුණි. | වෙළඳ වටිනාකම මත ගොඩනැගිලි කුලියට ලබාදීමට කටයුතු කල යුතුයි. | ඉදිරියේ දී තක්සේරු දෙපාර්තමේන්තුව හරහා ගොඩනැගිලි කුලිය සඳහා තක්සේරු වාර්තාවක් ලබා ගැනීමට අපේක්ෂිතය. | නියමිත වෙළඳපල මිල මත ගොඩනැගිලි කුලියට ලබාදීමට කටයුතු කර නැත. |
| (ඌ) | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ ආයෝජනය කර තිබූ රු.26,625,494ක් වූ මාස 12ක ස්ථාවර තැන්පතුවක පොළී මුදල සෑම වර්ෂයකදීම මුල් මුදලට එකතු කර නැවත | පාලක මණ්ඩල අනුමැතිය මත ආයෝජන ආපසු ලබාගැනීමට කටයුතු කල යුතුයි. | 2022 වර්ෂයේ දී පැවැත්වීමට යෝජිත පාලක මණ්ඩල රැස්වීමේ දී මේ සඳහා අවශ්‍යය ආවරන අනුමැතිය ලබා ගැනීමට පාලක මණ්ඩල පත්‍රිකාවක් යොමු කිරීමට | මුදල් ලබා ගැනීම සඳහා පාලක මණ්ඩලයේ ආවරණ අනුමැතිය හෝ ලබාගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | ආයෝජනය කිරීමට මධ්‍යස්ථානය එකඟතාවය ලබාදී තිබියදී, 2020අප්‍රේල් 01 දක්වා වසරක කාලයක් සඳහා පොළී මුදල වූ රු2,928,804ක් පාලක මණ්ඩල අනුමැතියකින් තොරව ආපසු ලබාගෙන තිබුණි. | | නියමිතය. | |
| (එ) | රු.117,839,906ක් පිරිවැය වූ ස්ථාවර වත්කම් පංති 17කට අදාළ විස්තරාත්මක උපලේඛන සම්බන්ධ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | විගණනයට අවශ්‍ය තොරතුරු, ලේඛන හා උපලේඛන ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. | මේ වන විට ස්ථාවර වත්කම් ලේඛනයේ කොටසක් සකස් කර ඇත. | 2021 වර්ෂයේදී හෝ අදාළ කරුණ නිවැරදි කරගෙන නොමැති බැවින් තවදුරටත් පවතී. |
| (ඒ) | රු.1,009,707ක් වටිනා ගෙවීම් වවුචර් 12 ක් අනුමැතියකින් තොරවද, රු.1,965,250ක් වටිනා ගෙවීම් වවුචර් 21 ක් සහතික කිරීමකින් තොරවද, රු.694,156ක් වටිනා වවුචර් 15ක් අනුමත කිරීමෙන් හා සහතික කිරීමකින් තොරවද ගෙවා තිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කල යුතුයි. | 2020 වර්ෂය තුලදී රට තුල පැවති කෝවිඩ් වසංගත තත්ත්වය නිසා විගණනය විසින් සඳහන් කර ඇති පරිදි ගෙවීම් වවුචර් සඳහා අවශ්‍ය සහතික කිරීම් සහ අනුමත කිරීම් ලබා ගැනීමට නොහැකි වී ඇත. | 2021 වර්ෂයේදී හෝ අදාළ කරුණ නිවැරදි කරගෙන නොමැති බැවින් තවදුරටත් පවතී. |
| (ඔ) | 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 12 දරන රාජ්‍ය ව්‍යවසායන්හි යහපාලනය සඳහා වන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.5 ඡේදයේ විධිවිධානයන් පිළිපැද නොතිබියදී, 2019 හා 2020 වර්ෂවල ප්‍රසාද දීමනා ලෙස රු.781,750ක් අවස්ථා 2කදී ගෙවා තිබූ අතර ඒ සඳහා පාලක මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි. | චක්‍රලේඛ නියමයන් අනුව ප්‍රසාද දීමනා ගෙවීමට කටයුතු කල යුතුයි. | 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 12 දරන රාජ්‍ය ව්‍යවසායන්හි යහපාලනය සඳහා වන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.5 ඡේදයේ විධිවිධානයන්ට අනුකූලව ප්‍රසාද දීමනා ගෙවීමේ ක්‍රමවේදයක් සකසා ඇත | 2021 වර්ෂයේදී හෝ අදාළ කරුණ නිවැරදි කරගෙන නොමැති බැවින් තවදුරටත් පවතී. |

## 35. තල් සංවර්ධන මණ්ඩලය

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - තතත්ත්වාගණනය කළ මතය

2019 - තතත්ත්වාගණනය කළ මතය

2020 - තතත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | තිකම් ස්කාගාරය ප්‍රතිසංස්කරණය සඳහා 2016 සිට 2018 වර්ෂය දක්වා ලද රු. මිලියන 512ක ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම නිසා රැකියා අවස්ථා 23ක් හා රු. මිලියන 119ක වාර්ෂික බදු ආදායමක් රජයට අහිමි වී තිබුණි. එමෙන්ම, තල් නිෂ්පාදනයේ යෙදෙන පවුල් 15000කගේ පමණ ජීවනෝපායට ද අහිතකර ලෙස බල පා තිබුණි. | අලුත්වැඩියා කර නැවත භාවිතයට ගත යුතුය. | රේඛීය අමාත්‍යාංශය විසින් මේ සඳහා පියවර ගනු ලබයි. | ඉදිකිරීම් කටයුතු 2021 වර්ෂය අවසානය දක්වාම සම්පූර්ණ කර නොතිබුණි. |
| (ආ) | මණ්ඩලයේ අභ්‍යන්තර විගණක කිසිදු අනුමැතියකින් තොරව ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක ලෙස සේවය කර තිබුණි. මණ්ඩලයෙන් ලබන වැටුපට අමතරව රු. 60,000ක් එම විශ්ව විද්‍යාලයෙන් ලබා ගෙන තිබුණි. එමෙන්ම, කූට ලේඛන ඉදිරිපත් කර ගමන් වියදම් ලෙස රු. 72,000ක් ද මණ්ඩලයෙන් ලබා ගෙන තිබුණි. | ගැටළුව අවසන් කිරීමට වහාම පියවර ගත යුතුය. | ස්වාධීන පරීක්ෂණයක් සඳහා අවශ්‍ය අනුමැතිය රේඛීය අමාත්‍යාංශය විසින් ලබා දී තිබුණු අතර යාපනය දිස්ත්‍රික් ලේකම්වරයා විසින් මූලික විමර්ශන නිලධාරියෙකු පත්කර තිබුණි. | 2021 වර්ෂය අවසානය දක්වාම විනය කටයුතු අවසන්ව නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | බඳවා ගැනීමේ පරිපාටියට පටහැනිව, 2020 වර්ෂය තුළ එක් නිලධාරියෙකු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තනතුරටත්, කනිෂ්ඨ කළමනාකරුවන් දෙදෙනෙකු නිෂ්පාදන කළමනාකරු හා අභ්‍යන්තර විගණක ලෙසත් උසස් වීම් ලබා දී තිබුණි. | උසස් කිරීම් බඳවා ගැනීමේ පරිපාටියට අනුකූල විය යුතුය. | රේඛීය අමාත්‍යාංශයෙන් උපදෙස් බලාපොරොත්තු වේ. | 2021 වර්ෂය අවසානය දක්වාම මෙම ගැටළුව විසඳී නොතිබුණි. |
| (ඈ) | 2015 මැයි 25 දිනැති අංක පීඊඩී 2/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය පරිදි දුරකථන බිල්පත් ප්‍රතිපූරණය කිරීම වෙනුවට 2015 සිට 2019 දක්වා කාලය තුළ රු.7,001,632ක උපරිම සන්නිවේදන දීමනා මණ්ඩලයේ නිලධාරීන්ට ගෙවා තිබුණි. | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ උපදෙස්වලට අනුගත විය යුතුය. | වැටුප සමඟ දුරකථන දීමනා ගෙවීම නවතා 2020 ඔක්තෝබර් සිට ඔවුන්ගේ බිල්පත් මත ගෙවීම් කරනු ලැබේ. | 2021 වර්ෂයේදීද වැඩිපුර ගෙවූ මුදල් අයකර නොතිබුණි. |
| (ඉ) | බඳවා ගැනීමේ පරිපාටියට පටහැනිව, කාර්යක්ෂමතා කඩඉම් සම්පූර්ණ නොකළ කළමනාකරුවන් 08 දෙනෙකු තනතුරුවල ස්ථිර කර තිබුණි. | බඳවා ගැනීමේ පරිපාටියට අනුකූල විය යුතුය. | සුදුසු ක්‍රියාමාර්ගගෙන නැත. | 2021 අවසානය දක්වාම මෙම ගැටළුව විසඳී නොතිබුණි. |
| (ඊ) | කයිතඩි හි තල් සංවර්ධන පාසල සඳහා දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීමට 2018 වර්ෂයේදී රජයේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට රු. මිලියන 25 ක් ලබා දී තිබුණ ද, 2020 ඔක්තෝබර් දක්වා එම මුදලින් රු. මිලියන 11.24ක් හෙවත් සියයට 45ක් පමණක් | ඉදිකිරීම් කටයුතු නියමිත කාල සීමාව තුළ අවසන් කළ යුතුය. | ඉදිකිරීම් කඩිනම් කිරීමට ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට දැඩිව දැනුම් දී ඇත. | 2021 වර්ෂය අවසානය දක්වාම ඉදිකිරීම් සම්පූර්ණ කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | වැයකර තිබුණු නමුත් ඉදි කිරීම් නිමකර නොතිබුණි. | | | |
| (උ) | වසර 06කට වැඩි කාලයක සිට හිඟහිටිව පවතින රු. 9,737,265ක ණයගැති ශේෂ අයකර ගැනීමට මණ්ඩලය විසින් නිසි පියවර ගෙන නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කඩිනමින් පියවරගත යුතුය. | කළමනාකාරිත්වය විසින් ඉදිරියේදී නීති උපදේශකවරයෙකුගේ සහාය ඇතිව වරින්වර නෛතික ඉල්ලීම් සිදු කිරීම හා රේඛීය අමාත්‍යාංශයේ නීති උපදේශකගේ උපදෙස් මත ඉදිරි පියවර ගැනීම. | හිඟ මුදල් අයකර ගැනීමට 2021 වර්ෂයේදීද පියවර ගෙන නොතිබුණි. |
| (ඌ) | එකතුව රු. මිලියන 20.85ක් වූ 2018 වර්ෂයේදී මිල දී ගත් තල් ආශ්‍රිත නිෂ්පාදන යන්ත්‍ර 03ක් අදාළ නිෂ්පාදන කාර්යයන් සඳහා කිසිදු උපයෝජනයකින් තොරව වර්ෂ 03කට වැඩි කාලයක සිට අභාවිතව පවතී. | මෙම යන්ත්‍ර ඵලදායී ලෙස උපයෝජනය කිරීම සඳහා සුදුසු පියවර ගත යුතුය. | පාලක මණ්ඩලයේ අනුමැතිය මත එක් යන්ත්‍රයක් කරවෙට්ටි සමුපාකාර සමිතිය වෙත භාර දී ඇති අතර වර්තමානයේදී ඉන් උසස් රසකැවිලි නිෂ්පාදයක් සිදු කෙරේ. ඉතිරි යන්ත්‍ර 02ක ද ඵලදායි ලෙස උපයෝජනය කිරීම සඳහා කටයුතු කරනු ලැබේ. | යන්ත්‍ර 02ක් 2021 අවසානය දක්වාම අභාවිතව පවතී. |
| (එ) | මණ්ඩලයේ කළමනාකරුවන් 08 දෙනෙකු වෙත 2018 වර්ෂයට පෙර දී වැටුප් වර්ධක ලෙස රු. 4,280,600ක් වැඩිපුර ගෙවා තිබුණ ද, 2021 වර්ෂය අවසානය දක්වා එම ගෙවීම් ආපසු අයකර නොතිබුණි. | වැඩිපුර ගෙවූ මුදල් අයකර ගැනීමට කඩිනම් පියවර ගත යුතුය. | මෙම ගැටළුව පැහැදිලි කර ගැනිම සඳහා රේඛීය අමාත්‍යාංශ ලේකම්වරයා විසින් ස්වාධීන විමර්ශන කමිටුවක් පත්කර තිබුණි. එම විමර්ශන කමිටුවේ තීරණය අනුව කළමනාකාරීත්වය විසින් පියවර ගනු ලැබේ. | 2021 වර්ෂයේදීද අයකරගෙන නොතිබුණි. |

## 36. තෘතියීක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 - තතත්ත්වාගණනය කළ මතය

2019 - තතත්ත්වාගණනය කළ මතය

2020 - තතත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 47 ඡේදය ප්‍රකාරව දේපල පිරියත හා උපකරණවල සාධාරණ අගය වෙනස්වීම මත ප්‍රත්‍යාගණනයන් සිදුකල යුතු වුවත්, මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ශුද්ධ අගය රු.19,472,941ක් වූ වත්කම් සම්බන්ධයෙන් 2008 වර්ෂයෙන් පසුව ප්‍රත්‍යාගණනයක් සිදුකර නොතිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත පරිදි ජංගම නොවන වත්කම් ප්‍රත්‍යාගණනයන් සිදුකල යුතුය. | වත්කම් ප්‍රත්‍යාගණනය සඳහා අවශ්‍ය සහය ලබා ගැනීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ලිපියක් පමණක් යොමු යොමු කර ඇත. | වත්කම් කාණ්ඩ අනුව ප්‍රත්‍යාගණන කාර්යය ඉටු කිරීම සඳහා පියවර ගෙන නැත. |
| (ආ) | මූල්‍ය අංශයේ ගිණුම් කටයුතු සඳහා භාවිතා කල ටැලි පරිගනකගත ගිණුම්කරණ පැකේජය 2017 මැයි 09 දින සිට ක්‍රියාවිරහිත වීම හේතුවෙන් පද්ධතියට ඇතුලත් කර තිබූ සියළු දත්ත විනාශවී තිබුණි. තවද පරිගණකයෙන් පිටත දත්ත ගබඩා කර තබා ගැනීමේ පිළිගත් ආරක්ෂිත ක්‍රමවේද අනුගමනය කර නොතිබූ බැවින් දත්ත නැවත ලබා ගැනීමටද නොහැකි වී තිබුණි. මේ සම්බන්ධයෙන් | කඩිනමින් පරීක්ෂණයක් පවත්වා වගකිවයුතු නිලධාරීන් හඳුනාගෙන වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් යුතුය. | අධ්‍යක්ෂ ජනරාල් විසින් විමර්ශනයක් පැවැත්වීමට අවශ්‍ය කමිටුවක් පත් කරමින් මෙහි දක්වා ඇති පරිදි ක්‍රියා කිරීමට මේ වන විට සැලසුම්කර ඇත. | මේ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් 2021 දෙසැම්බර් 31 දක්වාම ගෙන නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | කිසිදු පරීක්ෂණයක් 2021 දෙසැම්බර් 31 දින දක්වා සිදුකර නොතිබුණි. | | | |
| (ඈ) | 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා අලෙවි කිරීම සඳහා පුස්තකාලය වෙත ලැබී තිබුණු වර්ග 13කට අදාල වටිනාකම රු.2,119,675ක්වූ පොත් 6769 ක් මුදල් ලබා ගැනීමකින් තොරව සභාපතිවරයාගේ වාචික උපදෙස් මත බාහිර පුද්ගලයන් වෙත නිකුත් කර තිබුණි. | ලිඛිත අනුමැතියකින් තොරව බාහිර පුද්ගලයන් වෙත නොමිලේ පොත් නිකුත් කිරීමෙන් ආයතනයට සිදු වූ අලාභයට වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කල යුතුය. | එවකට සිටි සභාපතිතුමාගේ වාචික උපදෙස් මත මෙම පොත් නොමිලේ නිකුත් කර ඇත. මෙවැනි තත්වයන් ඉදිරියේදී වළක්වා ගැනීම සඳහා අදාළ සියළුම පියවර ගෙන ඇත. | අවශ්‍ය නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගෙන නැත. |
| (ඇ) | වෘත්තීය පුහුණුව හදාරන ආධුනිකයන්ට ලබාදීම සඳහා භාණ්ඩාගාර අරමුදල් යටතේ පෞද්ගලික ආයතනයක් වෙතින් මුද්‍රණය කර පුස්තකාලය වෙත 2016 වර්ෂයේදී ලබාදී තිබූ වටිනාකම රු.1,300,645ක් වූ වර්ග 15 කට අයත් පොත් 7,354ක් නිකුත් කිරීමකින් තොරව පුස්තකාලයේ රඳවාගෙන තිබුණි. | ආයතනයට සිදු වූ පාඩුව අවම කර ගැනීමට හැකි වන පරිදි විධිමත් අනුමැතියක් සහිතව පොත් බෙදාහැරීම් සිදු කල යුතුය. | පරිශීලනය සඳහා සැලකිය යුතු පිටපත් ප්‍රමාණයක් පුස්තකාලයේ තබා ඇති අතර වටිනාකම රු.554,845ක් වූ පොත් 554ක් පාර්ශවකරුවන් අතර බෙදා හැර ඇත. | - එම - |
| (ඉ) | 2018 පෙබරවාරි 15 දිනැති අංක 01/2018 දරන චක්‍රලේඛය හා 2020 ජනවාරි 27 දිනැති අංක TIP/SS/01/27 දරන වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛය අනුව රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත ආයතනයන්හි ජ්‍යෙෂ්ඨ විධායක මට්ටමේ වසර 12 ක | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. | ඉදිරියේදී මෙවැනි දෝෂයන් සිදු නොවනසේ කටයුතු කරන ලෙස අදාල නිලධාරින්ට උපදෙස් දී ඇත. | වගකිව යුතු නිලධාරීන්ට විරුද්ධව 2021 වර්ෂය අවසානය දක්වාම කටයුතු කර නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | සක්‍රිය සේවා කාලයක් ඇති නිලධාරියෙකුට සහනදායී පදනම මත මෝටර්රථ බලපත්‍රයක් ලබාදිය හැකි වුවත් ඊට පටහැනි ලෙස අදාල විධායක මට්ටමේ වසර 08 මාස 04 දින 18ක සේවා කාලය සහිත නිලධාරියෙකුට සහනදායී මෝටර්රථ බලපත්‍රයක් ලබාදී තිබුණි. | | | |
| (ඊ) | 1990 අංක 20 දරන තෘතියීක හා වෘත්තීය අධ්‍යාපන පනත හා 1990 අංක 50 දරන (සංශෝධන) පනත කොමිෂන් සභාවේ බලතල යටතේ වෘත්තීය අධ්‍යාපනය හා පුහුණුව පිළිබඳව කරන පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම් භාරගැනීමට පමණක් බලතල පවරා තිබිය දී සභාවේ අරමුදල් භාවිතා කරමින් පර්යේෂණ සිදු කරමින් පැවතුණි. | පනතෙන් පවරා ඇති බලතල අනුව කටයුතු කළ යුතුය. | මහා භාණ්ඩාගාරයෙන් පර්යේෂණ සඳහා සලසා තිබූ ප්‍රතිපාදන සීමිත බැවින් SSDP ව්‍යාපෘතිය මගින් පර්යේෂණ සඳහා වෙනම වැය විෂයයක් ස්ථාපනය වී තිබූ හෙයින් , පර්යේෂණ සඳහා මුදල් උපයෝගි කරගන්නා ලදි. | අදාල ආයතනය පිහිටුවීමේ පනත අනුව පර්යේෂණ පැවැත්වීම කොමිෂන් සභාවට අදාල කාර්යයක් නොවුවද වර්තමානයේදීත් එම කාර්යයන් සිදු කරමින් ඇත. |
| (උ) | කොමිෂන් සභාවේ 2012 ජූලි 17 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කර තිබුණු බඳවාගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය අවස්ථා රාශියකදී සංශෝධනය කර තිබීම හේතුවෙන් එම සංශෝධන සියල්ල ඇතුලත් බඳවාගැනීමේ හා උසස්කිරීමේ පරිපාටියක් සකස් කර අනුමත කරවා ගන්නා ලෙස කළමනාකරණ සේවා | කඩිනමින් සංශෝධන සියල්ල ඇතුලත් බඳවාගැනීමේ හා උසස්කිරීමේ පරිපාටියක් සකස් කර අනුමත කරවා ගත යුතුය. | අභ්‍යන්තර කමිටුවක් මගින් සංශෝධනයන් කර ඇති අතර කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගැනීමෙන් අනතුරුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට නියමිතය. | 2021 දෙසැම්බර් 31 දින දක්වා අදාල කාර්යය නිම කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | දෙපාර්තමේන්තුවෙන් 2016 අගෝස්තු 15 දින කොමිෂන් සභාව වෙත දන්වා තිබුණද 2020 නොවැම්බර් 10 දින දක්වාම ඒ අනුව කටයුතු කර නොතිබුණි. | | | |
| (ඌ) | 1990 අංක 20 දරන තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනතේ 15 (1) හා 16 (1) වගන්ති අනුව තෘතියීක අධ්‍යාපන පාඨමාලාවන් හෝ වෘත්තීය අධ්‍යාපන පාඨමාලාවන් ලියාපදිංචි කරනු නොලැබ නොපැවැත්විය යුතු වුවද. කොමිෂන් සභාවේ ලියාපදිංචි නොකර ක්‍රියාත්මක කරනු ලබන තෘතියීක අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන ආයතන හඳුනාගෙන හා ඒවා යාවත්කාලීන කරමින් තොරතුරු පද්ධතියක් පවත්වා ගැනිමට කොමිෂන් සභා විසින් කටයුතු කර නොතිබුණි. | තෘතියීක හා වෘත්තීය අධ්‍යාපන පනතේ අදාල වගන්ති පරිදි TVEC අයතනයේ ලියාපදිංචි නොකර රට තුල ක්‍රියාත්මක කරනු ලබන තෘතියීය හා වෘත්තීය අධ්‍යාපන ආයතන හඳුනා ගැනීමට ක්‍රමවේදයක් හඳුනාගත යුතුය. | ලියාපදිංචි කර ඇති පුහුණු මධ්‍යස්ථානය පිළිබඳව තොරතුරු ඇතුලත් දත්ත පද්ධතියක් මෙම කොමිෂන් සභාව මගින් පවත්වා ගෙන යනු ලබන අතර මහජනතාවගේ දැන ගැනීම සඳහා තොරතුරු ප්‍රදර්ශනය කර ඇත. | ලියාපදිංචි කිරීමකින් තොරව පවත්වන ආයතන සම්බන්ධව නීතිමය කටයුතු කිරීම සඳහා 1990 අංක 20 දරන පනත සංශෝධනය කිරීමට අමාත්‍යාංශය සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කර තිබුණි. |

## 37. තේ පර්යේෂණ මණ්ඩලය

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - තත්ත්වාගණනය කළ මතය

2019 - තත්ත්වාගණනය කළ මතය

2020 - තත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා තේ මණ්ඩලයට අයත් වාහන 08 ක් රු.8,913,550කට ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද එම වාහනවල අයිතිය තේ පර්යේෂණ මණ්ඩලය වෙත පවරාගෙන නොතිබුණි. එසේම මේ පිළිබඳව සටහන් මගින් හෝ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | කඩිනමින් වාහනවල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය. | වාහන පවරාගැනීමට කටයුතු කරනු ලබන බවත් ඉදිරියේදී අයිතිය පවරාගෙන නොමැති වාහන පිළිබඳව ගිණුම් සටහන් තුළින් හෙළිදරව් කිරීමට කටයුතු කරනු ලබන බවත් දන්වා තිබුණි. | වාහන 07 ක අයිතිය 2021 වර්ෂයේදී හෝ පවරාගෙන නොමැත. |
| (ආ) | 2020 වර්ෂයේ රු.6,749,688ක්වූ පොලී ආදායම මත ගෙවිය යුතු රු.1,619,925ක ආදායම් බදු මුදල ගිණුම්ගත කර නොතිබුණු අතර ශාන්ත කූම්බ්ස් වතුයායේ 2020 වර්ෂය අවසානයේදී නොවිකිණී ඉතිරිව තිබුණු කසළ තේ කිලෝ ග්‍රෑම් 8,504 ක වටිනාකම අගය කර ගිණුම්ගතකර නොතිබුණි. එසේම 2019 වර්ෂයේදී නිම කරන ලද ඉහත වතුයායට අයත් "Save the Children Project" ව්‍යාපෘතියේ ඉදිකිරීම් වටිනාකම වූ රු.1,583,508 ක මුදල ප්‍රාග්ධනිත කිරීම වෙනුවට | වත්කම් සහ වගකීම් නිශ්චිතව හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවලට ගැනීම හෝ හෙළිදරව් කිරීම් කළ යුතුය | ලද පොළී ආදායම මත ආදායම් බදු ගෙවීමට අවශ්‍යද යන්න පිළිබඳ කරුණු විමසා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ අර්ථ නිරූපන කමිටුවේ ලේකම් අංශය වෙත 2021 අප්‍රේල් 05 දින තේ පර්යේෂණ ආයතනය විසින් ලිපියක් යොමු කර ඇතත් මේ වන තෙක් පිළිතුරු ලැබී නොමැත. 2021 වර්ෂයේ ගිණුම් පිළියෙළ කිරීමේදී කසළ තේ තොග ගිණුම් සටහන් තුළින් හෙළිදරව් කිරීමට සහ Save the Children ව්‍යාපෘතියට අදාළ නොනිම් වැඩ ගිණුමේ ශේෂය ප්‍රාග්ධනිත කිරීමට කටයුතු | 2021 වර්ෂයේදීද ක්‍රියාත්මක කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | නොනිමි වැඩ යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | | කරනු ලබන බව දන්වා තිබුණි. | |
| (ඇ) | 2017 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා තේ පර්යේෂණ ආයතනයට වතු වලින් ලැබිය යුතු විශ්ලේෂණ ආදායම (Analytical Charges) රු.1,033,905ක් අය කර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | ලැබිය යුතු මුදල් ප්‍රමාදයකින් තොරව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | 2017,2018,2019 හා 2020 වර්ෂවල විශ්ලේෂණ කටයුතු සඳහා ලැබිය යුතු ආදායම් 2021 සහ 2022 ගිණුම් වර්ෂවලදී නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. | 2021 වර්ෂය අවසානය දක්වා අයකරගෙන නොමැත. |
| (ඈ) | අංක පීඊඩී/12 හා 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.14 වගන්තිය ප්‍රකාරව මානව සම්පත් කලමනාකරණය සඳහා නීති රීති සම්පාදනය කිරීමට අදාළ කාර්ය පරිපාටි අත්පොතක් සකස්කර භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතු වුවද සමාගම විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව මානව සම්පත් කළමනාකරණය සඳහා කාර්ය පටිපාටි අත්පොතක් සකස් කිරීමට කටයුතු කළ යුතුය. | ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කරමින් කාර්යාලීය අත්පොත සැකසීම සඳහා වන යෝජනා හා මිල ගණන් කැඳවීමට කටයුතු කර ඇති අතර 2022 මාර්තු 01 දිනට අදාළ මිල ගණන් හා යෝජනා ලැබීමට නියමිතව ඇත. | මානව සම්පත් කළමනාකරණ පටිපාටිය අත්පොත සකස් කර නොමැත. |
| (ඉ) | 2017 නොවැම්බර් 24 දින රු.14,030,854ක් වැය කර ඉන්දියාවෙන් මිලදීගත් විශේෂ ව්‍යාපෘති සඳහා වූ උපකරණයක් (Walk in Type Environmental Controlled Facility) වසර තුනක් ගත වී තිබුණද එම උපකරණය ස්ථාපනය හා සවිකිරීම නිසි පරිදි සිදුකිරීමට නොහැකිවීම හේතුවෙන් ක්‍රියාකාරීත්වය අපේක්ෂිත මට්ටමට | නීතිමය ක්‍රියාමාර්ග කඩිනම් කර අලාභ අයකර ගත යුතුය. | නීතිපතිවරයා විසින් පත්කල රජයේ අධිනීතිඥවරයාගේ උපදෙස් පරිදි ඉහත උපකරණය මිළදී ගත් දේශීය සමාගම සමඟ සේවා ගිවිසුමට අනුව 2022 ජනවාරි 23 දින සාකච්ඡාවක් පවත්වා ඇත. ඉදිරි සති දෙකක කාලය තුළ එකඟතාවය පැමිණීමට එම සමාගම අපොහොසත් වන්නේ නම් කාර්මික අධිකරණයේ නඩු පැවරීමට | අදාළ සමාගමට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගෙන අලාභය අයකර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | නොපැවතීම නිසා පර්යේෂණ සඳහා භාවිතා කළ නොහැකිව පැවතුණි. | | නීතිපතිගේ උපදෙස් ලැබී ඇත. | |
| (ඊ) | මණ්ඩලයේ 2019 වර්ෂයේ රු.13,453,726ක් ව තිබූ බැංකු අයිරා ශේෂය වෙනුවෙන් 2020 වර්ෂයේදී මණ්ඩලයට ගෙවීමට සිදුවී තිබුණු පොලී වියදම රු.1,459,726ක් විය. | ආයතනයට වාසිදායක වන ලෙස මූල්‍ය කළමනාකරණය කළ යුතුය. | කිසිදු වැළැක්වීමේ ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | 2021 වර්ෂයේදීද මෙම බැංකු අයිරාව නිරවුල් කර නොතිබුණු අතර පොලියද ගෙවනු ලැබේ. |
| (උ) | වලහන්දූව, දෙණියාය සහ කොට්ටව ප්‍රාදේශීය කාර්යාලවල 2010 වර්ෂයට පෙර රු.72,031,804 ක් වැය කර ගොඩනැගිලි ඉදිකර තිබුණද එම ඉඩම්වල අයිතිය මණ්ඩලය වෙත පවරාගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාළ ඉඩම්වල අයිතිය මණ්ඩලයට පවරා ගැනීමට කටයුතු කළ යුතුය. | මෙකී ඉඩම් පවරා ගැනීමට කටයුතු කරමින් පවතී. | ඉඩම්හි අයිතිය පවරා ගැනීමේ කටයුතු මන්දගාමීව සිදුවෙමින් පවතින බව නිරීක්ෂණය වේ. |
| (ඌ) | සම්පූර්ණ වැටුප් සහිත විදේශ අධ්‍යාන නිවාඩු ලබා විදේශගතව නැවත සේවයට නොපැමිණි නිලධාරීන් 04 දෙනෙකු 2005 සහ 2009 වර්ෂවලදී මණ්ඩලය සමඟ එළඹ තිබූ ගිවිසුම් කඩකිරීම හේතුවෙන් අදාළ බැඳුම්කර වටිනාකම වූ රු.15,054,891ක් 2020 වර්ෂය අවසානය දක්වා ආපසු අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | නෛතික කටයුතු ප්‍රමාද කිරීම හිතා මතා සිදුකර තිබේද යන්න පරීක්ෂාවකින් තහවුරු කරගෙන සුදුසු පියවර ගැනීම, නිලධාරීන් පිළිබඳ තොරතුරු සොයා ගැනීම සඳහා ගතහැකි විකල්ප ක්‍රම ක්‍රියාත්මක කිරීම. | බැඳුම්කර ගිවිසුම් උල්ලංඝනය කරමින් නැවත සේවයට නොපැමිණි නිළධාරින් 04 දෙනාට විරුද්ධව නඩු පවරා ඇත. විත්තිකරුවන් විදේශගත වී ඇති අවස්ථාවල ඇපකරුවන්ට විරුද්ධව නඩු පවරා ඇත. | පවරන ලද නඩු 02 ක් විභාගවෙමින් පවතින අතර අනිකුත් නඩු දෙක, විත්තිකරුගේ තොරතුරු නොමැති වීම නිසා බහා තබා තිබුණි. |
| (එ) | ශාන්ත කුම්බස් වතුයායේ අභ්‍යන්තර පාලන දුර්වලතා නිසා 2017 වර්ෂයේදි සිදුව තිබුණු මූල්‍ය වංචාවක් නිසා | මූල්‍ය වංචාව සම්බන්ධ විධිමත් පරීක්ෂණ සහ විනය පරීක්ෂණ ප්‍රමාදයකින් තොරව | අක්‍රමිකතා පිළිබඳ මු.රෙ 104(1) 105(1) පරීක්ෂණ මත අයකර ගැනීම් සිදුකිරීමද වැවිලි අමාත්‍යාංශය හරහා | මූලික හා විධිමත් විනය පරීක්ෂණ බොහෝ දුරට අවසන්කර ඇතත් |

| | | | | |
|---|---|---|---|---|
| | අහිමි වූ මුදල රු.12,281,003ක් ණයගැති ශේෂය තුළ පවතින නමුත් 2020 වර්ෂය අවසානය දක්වා පරීක්ෂණ කටයුතු අවසන් කර අලාභ අය කර ගැනීමට හෝ විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීමට අපොහොසත්ව තිබුණි. | අවසන් කිරීමට කටයුතු කළ යුතුය. | වාර්තාවක් ලබාගැනීමටද නියමිතය. | මූ.රෙ ප්‍රකාර අලාභ අයකර ගැනීමට 2021 වර්ෂය අවසානය දක්වාම අපොහොසත් වී ඇත. |
| (ඒ) | තේ පර්යේෂණ මණ්ඩලයට අයත් වාහන 02 ක් සඳහා වාහන ලියාපදිංචි මුල් පිටපත් මණ්ඩලය සතුව නොමැති බව නිරීක්ෂණය වූ අතර හන්තාන උපකාර්යාලයේ අත් ට්‍රැක්ටරයක් ලියාපදිංචි කර නොතිබුණු බව 2020 වර්ෂයට අදාළව සිදු කර තිබූ භෞතික වත්කම් පරීක්ෂාවේදී හඳුනාගෙන තිබුණි. | මණ්ඩලයට අයත් වාහනවල ලියාපදිංචි සහතික මුල් පිටපත් ලබා ගැනීමට කඩිනමින් ක්‍රියා කළ යුතුය. | හන්තාන උප මධ්‍යස්ථානයට අයත් මෙම අත් ට්‍රැක්ටරය වසර 25 ට පමණ පෙර ප්‍රදානයක් ලෙස තේ පර්යේෂණ ආයතනයට ලැබී ඇති බැවින් නිසි තොරතුරු ලබා ගැනීමේ ප්‍රභවයක් නොමැති වීම මත ඊට අදාළ ලිපි ලේඛන කිසිවක් සොයාගැනීමට නොහැකි වී ඇති බව දන්වන ලදි. | මෙතෙක් වාහන වල ලියාපදිංචි මුල් පිටපත් ලබාගෙන නොතිබුණි. |
| (ඔ) | ශාන්ත ජෝකිම් වතුයායේ 2015 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා ප්‍රාග්ධන වියදම් වශයෙන් නැවත වගාවට වියදම් කරන ලද මුදල පිළිවෙලින් රු.9,242,229, රු.1,822,004, රු.1,325,706, රු.655,369, රු. 21,000 ක් සහ රු.283,187ක් වශයෙන් අඩුවීමක් දක්නට ලැබෙන බැවින් නැවත වගාව සඳහා යොමුවීමේ අඩු ප්‍රවණතාවයක් නිරීක්ෂණය වන අතර මෙම තත්ත්වය සෘජුවම වගාවේ ඵලදාව අඩුවීම කෙරෙහිද බලපා ඇති බව නිරීක්ෂණය | නැවත වගාවට සහ පාළු වගාවට අවශ්‍ය ප්‍රාග්ධන ප්‍රතිපාදන වැඩි කර ගැනීමට ක්‍රියා කළ යුතුය. | ප්‍රාග්ධන ප්‍රතිපාදන නොමැති වීම හේතුවෙන් නැවත වගා කටයුතු වසර ගණනාවකින් සිදු කිරීමට නොහැකි වී ඇත. ශාන්ත ජෝකිම් වත්ත සංවර්ධනය කිරීම සඳහා මේ වන විට වැවිලි අමාත්‍යාංශයෙන් 2021 වර්ෂය සඳහා රු.මිලියන 50ක ප්‍රතිපාදන අනුමත කර ඇත. | නැවත වගාව සඳහා යොමුවීම කාරක ප්‍රාග්ධන හිඟකම මත පහළ මට්ටමක පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | කෙරේ. ඒ අනුව වාර්ෂිකව නිමි තේ කිලෝ ග්‍රෑම් 1,020,000ක ධාරිතාවයකින් යුත් සමස්ත කර්මාන්තශාලාව 2019 හා 2020 වර්ෂයේදී එම ධාරිතාවයෙන් සියයට 72 සිට සියයට 85 ක් දක්වා ඌන ධාරිතාවයකින් යුතුව ක්‍රියාත්මක වීමට මෙම තත්ත්වය හේතු වී ඇති බවද නිරීක්ෂණය විය. | | | |
| (ඕ) | 2020 වර්ෂයේ මණ්ඩලයේ ක්‍රියාකාරී සැලැස්මේ දැක්වෙන දැනට ක්‍රියාත්මක වන පර්යේෂණ ව්‍යාපෘති 103 ක් අතරින් ව්‍යාපෘති 34 ක් පමණක් සමාලෝචිත වර්ෂයේදී සම්පූර්ණ කර තිබූ අතර ඉතිරි ව්‍යාපෘති 69 හි ප්‍රගතිය සියයට 2 සිට 95 දක්වා පරාසයන් තුළ පවතින බව නිරීක්ෂණය විය. විගණනය වෙත ඉදිරිපත් කර තිබුණු තොරතුරුවලට අනුව 2013 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා ආරම්භ කර තිබුණු පර්යේෂණ ව්‍යාපෘති අතරින් තේ ක්ෂේත්‍රයේ නිපුණත්වය සහිත මානව සම්පත් හිඟතාවය නිසා 2019 වර්ෂය වන විට පර්යේෂණ ව්‍යාපෘති 10 ක් ද විවිධ හේතූන් මත රු.40,891,685ක් වැය කළ පර්යේෂණ ව්‍යාපෘති 28 ක්ද කල් දමා හෝ අතහැර දමා තිබුණු බව නිරීක්ෂණය විය. | ක්‍රියාකාරී සැලැස්මේ දැක්වෙන දැනට ක්‍රියාත්මක වන පර්යේෂණ ව්‍යාපෘති සාර්ථකව අවසන් කර ඵලදායී ලෙස උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. | පර්යේෂණ ව්‍යාපෘති සියල්ල දීර්ඝ කාලීන පර්යේෂණ ගණයට අයත්ය. එබැවින් ව්‍යාපෘතීන්ට අදාළ පර්යේෂණ ක්‍රියාකාරකම් වසර කිහිපයක් පුරා ක්‍රියාත්මක කෙරේ. 2013 - 2017 ආයතනික සැලැස්ම අනුව තේ කර්මාන්තයේ පාර්ශවකරුවන්ගේ දායකත්වයෙන් ඉදිරිපත් කළ පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති 38 ක් කල් දැමීම, කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු කාලීන අවශ්‍යතා සහ ප්‍රමුඛතාවය සලකා බලා සිදු කළ බව දක්වා ඇත. | ආරම්භ කරන ලද පර්යේෂණ ව්‍යාපෘතිය අවසන් කර එහි අවසාන නිගමනය ක්‍රියාත්මක කිරීම සමස්තයක් ලෙස මන්දගාමී තත්ත්වයක පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| (ක) | තේ පර්යේෂණ ආයතනයේ දෙනියාය, හන්තාන, කොට්ටව හා පස්සර යන ප්‍රාදේශීය කාර්යාලවල පවත්වාගෙන යනු ලබන තේ තවාන්වල 2020 වර්ෂයේ පැවති මුළු පැළ සංඛ්‍යාවෙන් එනම් 175,286 කින්, රු.2,899,177ක් වටිනා පැළ 111,608ක් වර්ෂය අවසානයට නොවිකිණී ඉතිරිව පැවති බව නිරීක්ෂණය වූ අතර එය මුළු පැළ සංඛ්‍යාවෙන් සියයට 64 ක් විය. පැළයක් සඳහා දරන ලද වියදමද රු. 17.15 සිට රු. 29.54 ක් දක්වා විචලා වී තිබුණි. | තේ තවාන්වල පැළ විකිණීමේ වර්ධනයක් ඇති කර ගැනීම සඳහා උපායමාර්ගික පියවර හඳුන්වා දියයුතුය. | සාමාන්‍යයෙන් ගුණාත්මක තේ පැළයක් ලබා ගැනීමට මාස 9ත් 12ත් අතර කාලයක් ගත වන අතර එබැවින් සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේදීම තේ තවාන් තුළ සැලකිය යුතු තේ පැළ සංඛ්‍යාවක් සාමාන්‍යයෙන් පවතින බවත් තව ද මව් ශාක ව්‍යාපෘති සහ පර්යේෂණ අවශ්‍යතා වෙනුවෙන් තේ පැළ රඳවා ගන්නා බැවින් වර්ෂය අවසානයේ තේ තවාන තුළ තේ පැළ පැවතිය හැකි බවද පැවසේ. තේ පැළ තවාන්වල සිටුවන පැළ සංඛ්‍යාව වැයවන වියදම්, කම්කරු ශ්‍රමය සඳහා වැය කිරීම් වෙනස් වන බැවින් වසරින් වසර ඒකක පිරිවැය විචලනය වන බව දක්වා තිබුණි. | පැළ සිටුවීමේ වියදම් ක්‍රමිකව වැඩි වීමක් දක්නට ලැබූ අතර පැළ විකිණීමද සාපේක්ෂව අඩුවීම තුලින් තවාන්වල අලාභ තත්ත්වයක් නිරීක්ෂණය වී ඇත. |
| (ඡ) | එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධනය පිළිබඳ “ 2030 න්‍යාය පත්‍රය ” අනුව තේ පර්යේෂණ මණ්ඩලය විසින් තම විෂයපථය යටතට ගැනෙන කාර්යයන් සඳහා තිරසාර ඉලක්ක සහ ඒවායේ ප්‍රගතිය මැනීමේ දර්ශක හා වාර්ෂික සංධිස්ථාන හඳුනාගෙන එම කාර්යයන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කළ යුතු වුවත්, එසේ කර නොතිබුණි. | 2017 අංක 19 දරන තිරසර සංවර්ධන පනතට අනුකූලව ක්‍රියා කළ යුතුය | 2021 වසර පටන් තේ පර්යේෂණ ආයතන ක්‍රියාකාරී සැලැස්මට තිරසාර සංවර්ධන ඉලක්ක අදාළ අංක ඇතුළත් කර ඇත. | මණ්ඩලය තම විෂය පථයට ගැනෙන තිරසාර සංවර්ධන අරමුණු , ඉලක්ක සහ දර්ශක නිවැරදිව හඳුනාගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ප) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 18 හි 16 ඡේදය ප්‍රකාරව ජෛව විද්‍යාත්මක වත්කම්වල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කළ යුතු වූවද, තලවකැලේ , රත්නපුර, හන්තාන, පස්සර සහ කොට්ටව යන ප්‍රාදේශීය කාර්යාලවල පැවති වටිනා ගස් 5,654ක් එසේ තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි . | ජෛව විද්‍යාත්මක වත්කම්වල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. | දැවමය වටිනාකමක් ඇති ශාකවල වානිජමය අගය තක්සේරු කිරීම සඳහා අදාළ ආයතන සමඟ සාකච්ඡා කර අවශ්‍ය කටයුතු සිදු කිරීමෙන් පසු ගිණුම් ගත කිරීමට කටයුතු කරනු ලැබේ. | 2021 වර්ෂය අවසානය දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි. |

## 38. දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 - තත්ත්වාගණනය කළ මතය

2019 - තත්ත්වාගණනය කළ මතය

2020 - තත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2006 අංක 27 දරන දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික පනතේ 14 වගන්තිය දක්වා ඇති කර්තව්‍යවලට අනුකූල නොවූ ක්‍රියාකාරකමක් වූ සෞඛ්‍ය, පෝෂණ හා දේශීය අමාත්‍යාවරයා වෙත උපහාර පිරිනැමීමේ උත්සවයක් වෙනුවෙන් අධිකාරිය විසින් 2018 වර්ෂයේදී රු.මිලියන 1 ක් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත යවා තිබුණි. | අධිකාරියේ කර්තව්‍යවලට අනුකූල නොවූ ක්‍රියාකාරකම් සඳහා මුදල් වැය කිරීම සඳහා බලය දුන්, වියදම අනුමත කළ, වියදම සහතික කළ හා ගෙවීම් කළ වගකිව යුතු නිලධාරීන්ගෙන් මෙම මුදල අයකර ගත යුතුය. | දුම්කොළ හා මද්‍යසාර නිවාරනය සඳහා දේශපාලන නායකයින් බලගැන්වීමේ ක්‍රියාකාරකම් යන අනු ක්‍රියාකාරම යටතේ වැයකර ඇති බව හා අධිකාරියේ ක්‍රියාකාරි සැලස්මට අනුගත වන බව. | 2022 ජනවාරි 31 දින වන විටත්, වගකිව යුතු නිලධාරීන්ගෙන් මෙම මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 2018 දෙසැම්බර් 31 දින වන විට Smokeless Tobacco Bloomberg (STB) ව්‍යාපෘතියෙන් ලැබී තිබුණු මුළු මුදල රු.මිලියන18.32ක් වූ අතර ක්‍රියාත්මක කිරීම සඳහා අරමුණු 3 ක් හඳුනාගෙන තිබුණි. එම අරමුණු 3 වෙනුවෙන් 2019 වර්ෂයේදී වැය කර තිබුණු මුදල රු.357,717ක් පමණක් විය. නමුත් එම අරමුණුවලින් බැහැරව හා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව විවිධ රාජ්‍ය මෙන්ම පෞද්ගලික ආයතන හා සංවිධාන විසින් පවත්වා තිබුණු වැඩසටහන් | අධිකාරියේ අරමුණු යටතට ගැනෙන හා අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ව අනුමැතිය සහිත වැඩසටහන් පමණක් ක්‍රියාත්මක කළ යුතුය. | රාජ්‍ය මෙන්ම පෞද්ගලික ආයතන වලින් අධිකාරිය මඟින් සහයෝගය ලබාගැනීම වෙනුවෙන් කරන ඉල්ලීම්වලදී අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානයට යොමු කිරීමටත් ඔවුන්ගේ අනුමැතිය ලබා ගැනීමටත් කටයුතු කරන බව. | 2022 ජනවාරි 31 දින වන විටත්, මේ සම්බන්ධයෙන් විමර්ෂණයක් සිදුකර වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | වෙනුවෙන් රු.572,260ක් වැය කර තිබුණි. තවද ව්‍යාපෘතියෙන් ලැබී තිබුණු මුළු මුදලින් සියයට 17 ක් පමණක් කාර්යය මණ්ඩල වැටුප් හා දීමනා වශයෙන් ගෙවිය හැකි වුවද, ඉන් සියයට 38 කට සමාන රු.මිලියන 7.03ක් ඒ වෙනුවෙන් වැය කර තිබුණි. | | | |
| (ඇ) | දුම්කොළ හා මද්‍යසාර පාදක කොටගත් උපද්‍රවයන්ගෙන් සමාජය නිදහස් කර ගැනීම සඳහා සියලු සමාජීය අංශ ඒකරාශී කිරීම යන අධිකාරියේ මෙහෙවර ඉටුකිරීමට හැකි වන අයුරින් වාර්ෂිකව ප්‍රමාණවත් වූ දේශීය හෝ විදේශීය අරමුදල් සම්පාදනය කර ගැනීමට අධිකාරිය අපොහොසත්වී තිබුණි. ඒ හේතුවෙන් 2017 වර්ෂයේදී වැඩසටහන් වෙනුවෙන් දරන ලද රු.මිලියන 23.11ක් වූ වියදම 2020 වර්ෂය වන විට රු.මිලියන 4.35 ක් දක්වා සියයට 81 කින් අඩුවී තිබුණි. එසේම 2017 වර්ෂයේදී පනතේ සඳහන් කාර්යයන් ඉටුකිරීම වෙනුවෙන් දරන ලද වියදම, අධිකාරිය දෛනිකව පවත්වාගෙන යාම වෙනුවෙන් දරන ලද වියදමට සාපේක්ෂව සියයට 132 ක් වූ නමුත් 2020 වර්ෂය වන විට එය සියයට 20 | අධිකාරියේ කාර්යය සාධනය ඉහළ නැංවීමට කඩිනමින් කටයුතු කළ යුතුය. | කාර්යසාධනය ඉහළ දැමීමට කටයුතු කරන බව. | 2022 ජනවාරි 31 දින වන විටත්, ඉදිරි වර්ෂවල අධිකාරියේ කාර්යසාධනය ඉහළ නංවන්නේ කෙසේදැයි යන්න විග්‍රහ කෙරෙන සංයුක්ත සැලැස්මක් හෝ උපක්‍රමික සැලසුම් (Strategic Plans) පිළියෙල කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | දක්වා පහත වැටී තිබුණි. ඒ අනුව 2020 වර්ෂය අවසානය වන විට අධිකාරියේ කාර්යය සාධනය සියයට 112 කින් පිරිහී තිබුණු බව නිරීක්ෂණය විය. | | | |
| (ඇ) | ලෝක සෞඛ්‍ය සංවිධානයේ ප්‍රදාන මත 2019 වර්ෂයේදී ආරම්භකර තිබුණු ගෝලීය වැඩිහිටි දුම්කොළ සමීක්ෂණයේ පළමු අදියර සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී නොතිබුණු අතර මෙම ව්‍යාපෘතියට අදාළ සේවාවන් ලබාගැනීම වෙනුවෙන් 2020 වර්ෂය තුළදී රජයේ අනුමත ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමකින් තොරව සැපයුම්කරුවන් 03 දෙනෙකු වෙත රු.2,904,185ක් ගෙවා තිබුණි. | රජයේ අනුමත ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කළ යුතුය. | ඉදිරියේදී මෙවැනි අවශ්‍යතාවයන් තහවුරු කර ගනිමින් ගෙවීම් සිදුකිරීම පිළිබඳව අධිකාරියේ විශේෂ අවධානය යොමු කළ බව. | 2022 ජනවාරි 31 දින වන විටත්, මේ සම්බන්ධයෙන් විමර්ශණයක් සිදුකර වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ඉ) | 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව, 2020 වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්ම තුළ අපේක්ෂිත භෞතික ප්‍රගතිය සඳහා වූ ඉලක්ක හඳුනාගෙන නොතිබුණු අතර එම හේතුවෙන් එකිනෙක ක්‍රියාකාරකම්වල භෞතික කාර්යය සාධනය මැනීම සඳහා නිශ්චිත මිනුම් නිර්නායකයන් නොතිබුණි. එසේම ක්‍රියාකාරී | චක්‍රලේඛය ප්‍රකාරව භෞතික කාර්යය සාධනය මැනීම සඳහා නිශ්චිත මිනුම් නිර්නායකයන් අන්තර්ගත වන පරිදි ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතුය. | මේ පිළිබඳව අධිකාරියේ අවධානය යොමු කළ බව හා ඉදිරියේදී මෙම තත්ත්වයන් වලක්වා ගනිමින් කටයුතු කරන බව. | 2022 වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මද, චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල වන ලෙස පිළියෙල කර නොතිබුණි. |

සැලැස්ම තුළ ඇතුළත් අපේක්ෂිත මූල්‍ය ප්‍රගතිය හා පිළියෙල කර තිබුණු ප්‍රගති වාර්තාවල ඇතුළත් කර තිබුණු අපේක්ෂිත මූල්‍ය ප්‍රගතිය එකිනෙකට වෙනස් වූ බැවින් සහ බැංකු ගිණුමට සෘජුවම ලැබී තිබුණු විදේශ ප්‍රදානවලට අදාළ ක්‍රියාකාරකම් ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රගති වාර්තාවල ඇතුළත් කර නොතිබුණු බැවින් අධිකාරියේ මූල්‍ය කාර්යසාධනය නිවැරදිව හඳුනාගැනීමට නොහැකි විය.

## 39. නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 - තතත්ත්වාගණනය කළ මතය

2019 - තතත්ත්වාගණනය කළ මතය

2020 - තතත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2008 අංක 36 දරන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනතේ 16(3) උප වගන්තියේ දැක්වෙන විධිවිධාන ප්‍රකාරව, අධිකාරියේ ආරම්භක ප්‍රාග්ධනය රු.මිලියන 5,000ක් විය යුතු අතර එය කොටස් වශයෙන් රජයේ ඒකාබද්ධ අරමුදලින් ලැබිය යුතු වුවද 2020 වර්ෂය නිම වන විටත් අධිකාරියට කිසිදු ප්‍රාග්ධනයක් ලබාදී නොතිබුණි. එසේම 2008 අංක 36 දරන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනතේ 16 (ඉ) උප වගන්තියේ දැක්වෙන විධිවිධාන ප්‍රකාරව අඩු වියදම් නිවාස වැඩසටහන්වලට මුදල් සැපයීම සඳහා දේපල සංවර්ධනය කරන්නන්ගෙන් සේවා ගාස්තු වශයෙන් නාගරික සංවර්ධන අධිකාරිය විසින් එකතු කරගනු ලබන සියලු මුදල් නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ අරමුදලට බැර කළ යුතුව තිබුණි. එසේ වුවත් 2010 දෙසැම්බර් 14 දිනැති අංක 10/2951/504/012 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව | පනතේ විධි විධාන අනුව මහා භාණ්ඩාගාරය සමග සාකච්ඡා කර ආරම්භක ප්‍රාග්ධනය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. අධිකාරියේ මුළු ආදායමින් සියයට 90 ක් රාජ්‍ය ප්‍රධාන වලින් ලැබෙන අතර මෙහෙයුම් ක්‍රියාකාරකම් මත උපයාගැනීම් සියයට 10 ක් පමණ වේ. මෙම තත්ත්වය වැඩි දියුණු කර ගැනීමට අමාත්‍යාංශය සහ මහා භාණ්ඩාගාරය සමග සාකච්ඡා කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | ඉල්ලීම් ලිපි භාණ්ඩාගාරය වෙත යවා ඇත. | භාණ්ඩාගාරයෙන් ඒ සඳහා නිශ්චිත පිළිතුරක් ලබා දී නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | නාගරික සංවර්ධන අධිකාරිය විසින් මෙම සේවා ගාස්තු අයකිරීම නවතා තිබුණු බැවින් නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියට සිය ප්‍රධාන ආදායම් මාර්ගය අහිමි වී තිබුණි.' | | | |
| (ආ) | 2008 අංක 36 දරන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනත අනුව නාගරික ජනාවාස සංවර්ධනයට අදාල ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා සහ එම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන බවට සහතික වීම සඳහා අධිකාරිය ස්ථාපනය කර තිබුණද, අධිකාරිය පිහිටුවා වර්ෂ 12 ක් ගතවුවද මෙකී ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමට හා ක්‍රියාත්මක කිරීමට අධිකාරිය අපොහොසත්වී තිබුණි. | සංස්ථාපනතේ අරමුණුවලට අනුගත වී එම අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය. | උපදේශක කමිටුව විසින් කෙටුම්පත් කරන ලද ජනාවාස සංවර්ධනයට අදාලව ජාතික ප්‍රතිපත්තිය සඳහා කළමනාකරණය සෑහීමට පත් නොවීම මත අමාත්‍යාංශයේ ද මැදිහත් වීම ඇතිව අදාළ ප්‍රතිපත්තිය කෙටුම්පත් කිරීම සඳහා නව විද්වත් මණ්ඩලයක් පත් කිරීමට තීරණය කර ඇත. | විද්වත් මණ්ඩලය විසින් ඒ සඳහා රාමුවක් (Framework) සකස් කර ලබා දී තිබෙන අතර එය උපදේශන කමිටුවේ සාකච්ඡා කෙරෙමින් පවතී. |
| (ඇ) | කොන්ත්‍රාත් වටිනාකම රු. මිලියන 14.19 ක් වූ අඟුලාන සයුරපුර මහල් නිවාස සංකිර්ණයේ සුහසාධක ගොඩනැගිල්ල ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවේ කළ වැඩ වටිනාකම රු. මිලියන 5.85 ක්ව පැවතියේදි ව්‍යාපෘතිය ඉකුත් වර්ෂයේදි අත්හැර දමා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ගෙවන ලද රු. මිලියන 2.26 ක වැඩ පූර්ව අත්තිකාරම් නැවත අයකර ගැනීමට අධිකාරියට නොහැකිවී තිබුණි. කොන්ත්‍රාත්කරු ඉදිකිරීම් වැඩ | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර අධිකාරියට සිදු වී ඇති අලාභ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | ආපසු අයකර ගැනීම සඳහා ලිපි මඟින් දැනුම් දී ඇත. | අධිකාරිය සතුව පැවති රඳවා ගැනීම් මුදල, ලැබිය යුතු අත්තිකාරම් මුදලින් අඩුකර තිබෙන අතර එවිට රු.මිලියන 1.6 ක මුදලක් තවදුරටත් ලැබිය යුතුව පවතී. ඒ සඳහා නීතිමය ක්‍රියාමාර්ගයක් 2021 වර්ෂයේදී ගෙන නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | අතර මහ නතර කිරීම මෙම තත්ත්වයට සෘජුව බලපා තිබුණි. | | | |
| (ඈ) | අධිකාරියේ අරමුණු ඉටුකර ගැනීම සඳහා 2008 අංක 36 දරන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරි පනතට අනුව ඉටු කළ යුතු කාර්යයන් වන නාගරික පදිංචිකරුවන්ගේ ආර්ථික හා සමාජීය තත්ත්වය හඳුනාගැනීමට අදාල වන සමීක්ෂණ හා අධ්‍යානය කටයුතු පැවැත්වීම, ජාතික වශයෙන් අදාලවන නාගරික නිවාස ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම යන කාර්යයන් සංයුක්ත සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. | පනතේ සඳහන් ඉටුකර ගැනීමට අපේක්ෂිත කාර්යයන් සංයුක්ත සැලැස්මට ඇතුළත් කළ යුතුය | අධිකාරියේ සැලසුම් අංශය විසින් සමස්ථ දිවයිනටම අදාල කරගෙන පර්යේෂණයක් (Research) සිදු කර ඊට අදාල පර්යේෂණ වාර්තාව කළමණාකරණ හා විගණන කමිටුවට හා උපදේශන කමිටුවට ලබා දී ඇත. | උපදේශන කමිටු රැස්වීම්වල සාකච්ඡා කෙරෙමින් පවතී. |
| (ඉ) | සයුරුපුර, තුරුඉතුරුගම, තලවාකැලේ හා රජගම නිවාස ව්‍යාපෘති වලට අදාළ නිවාස 45ක සහ වෙළඳසැල් 03ක ප්‍රතිලාභීන් නොවන බාහිර පුද්ගලයන් සිටින බව විගණනයේදි අනාවරණය වු අතර මෙම පුද්ගලයින් ඉවත් කිරීමට අධිකාරිය සාධනීය පියවර ගෙන නොතිබුණි. | අධිකාරියේ අරමුණුවලට අනුව තෝරා ගත් ප්‍රතිලාභීන්ට පමණක් අදාළ දේපළ භාවිතා කිරීමට ඉඩදිය යුතු අතර බාහිර පුද්ගලයන් දේපළ පරිහරණය කිරීම සම්බන්ධව අවශ්‍ය ක්‍රියා මාර්ග ගත යුතුය. | කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | බාහිර පුද්ගලයින් ඉවත් කර පෙර තෝරාගත් ප්‍රතිලාභීන්ට අදාළ දේපළ පැවරීමට කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. |
| (ඊ) | සහස්පුර මහල් නිවාස සංකීර්ණය අළුත්වැඩියා කටයුතු 2017 වර්ෂයේ අවසන්ව තිබුණද, එදිනට පැවැති කොන්ත්‍රාත්තුවේ අඩුපාඩු 2020 වර්ෂය අවසාන වන විටත් කොන්ත්‍රාත්කරු | කොන්ත්‍රාත්තුවේ අඩුපාඩු නිවැරදි කරගෙන කොන්ත්‍රාත්කරු වෙත ගෙවිය යුතු මුදල් නිරවුල් කළ යුතුය. | අදාල කොන්ත්‍රාත්කරු මෙම ඉදිකිරීම අපේක්ෂිත මට්ටමට ඉදි නොකිරීම හේතුවෙන් මෙම බිල්පත් නිරවුල් කිරීමට කටයුතු නොකර ඇති අතර ඉදිරියේදී කොන්ත්‍රාත්කරු වන රාජ්‍ය සංවර්ධන හා | අදාළ කොන්ත්‍රාත්තුවේ අඩුපාඩු 2021 වර්ෂයේදීද නිවැරදි කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | මගින් නිවැරදි කර ගැනීමට (Rectify) අධිකාරිය අපොහොසත්ව තිබුණු අතර කොන්ත්‍රාත්කරුට තවදුරටත් ගෙවිය යුතු රු. මිලියන 8.80 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | | නිර්මාණ නීතිගත සංස්ථාව ලවා අදාල කාර්යයන් නිසි පරිදි ඉටු කර ගැනීමට අදාල අංශ වෙත උපදෙස් ලබා දී ඇත. | |
| (උ) | අඟුලාන නිවාස ව්‍යාපෘතිය ඉදිකිරීම සඳහා රු.මිලියන1,179 ක් වියදම් කර තිබුණද කිසිදු ප්‍රතිපත්තිමය තීරණයකින් තොරව රු.මිලියන700 ක් ලාභයට එරෙහිව කපාහැර එම නිවාසවලට අයකරන වටිනාකම වූ රු.මිලියන 478ක් පමණක් වත්කම්ලෙස දක්වා තිබීම හේතුවෙන් අධිකාරියේ ජංගම නොවන වත්කම් රු.මිලියන 684කින් ඌන ගණනය වී තිබුණි. | මේ සම්බන්ධ පැහැදිලි කිරීම් හා ඇති වී ඇති බලපෑම පිළිබඳ විස්තර කළ යුතුය | ආවරණ අනුමැතියක් ලබා ගැනීම සඳහා භාණ්ඩාගාරයට යොමු කර ඇත. | 2021 වර්ෂයේදීද ආවරණ අනුමැතියක් ලැබී නොමැත. |

## 40. පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 - තතත්ත්වාගණනය කළ මතය

2019 - තතත්ත්වාගණනය කළ මතය

2020 - තතත්ත්වාගණනය නොකළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | විධිමත් විනය පරීක්ෂණයකදී වරදකරු බවට තීරණය වූ රියදුරුගෙන් ආයතනයට අයවිය යුතු සම්පූර්ණ මුදල ඉල්ලා එන්තරාවාසියක් යැවිය යුතු බවට පාලක සභාව විසින් තීරණය කර තිබියදීත් එන්තරවාසියක් නොයැවීම නිසා ආයතනයට රු.539,128ක අලාභයක් සිදුවී තිබුණි. | පාලක සභාව ගන්නා තීරණ ක්‍රියාත්මක කරන බවට තහවුරු කෙරෙන අභ්‍යන්තර පරීක්ෂණ ක්‍රමයක් ක්‍රියාත්මක විය යුතුය. | ආයතනය තුළ නීති නිලධාරී මහතකු නොමැති වීම හා මෙම එන්තරවාසිය නීති නිලධාරී මහතෙකු මඟින් ම යැවීම අත්‍යවශ්‍ය වන්නේ ද යන්න පාලක මණ්ඩලය වෙත ඉදිරිපත් කර විමසීමට සිදුවීම හේතුවෙන් මෙම කටයුත්ත ප්‍රමාද වන ලදී. | වැඩිපුර ගෙවීම් අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ගයක් 2021 වර්ෂය තුළ දී ද ගෙන නැත. |
| (ආ) | කාර්යමණ්ඩල ප්‍රතිව්‍යුහගත කිරීම තුළින් ඇති වූ නව තනතුරු සඳහා කාර්යමණ්ඩලය අන්තර්ග්‍රහණය කර ගැනීමට හා බඳවා ගැනීමට අදාළ වන බඳවා ගැනීමේ පටිපාටිය සංශෝධනය කිරීමේ කටයුතු 2021 අගෝස්තු 31 දින දක්වා සිදු කර නොතිබුණි. | සංශෝධනය කඩිනමින් නිසි පරිදි සිදු කළ යුතුය. | මේ පිළිබඳ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් විමසීමට ලක්කර ඇති අතර එහි තීරණ ලැබෙන තෙක් බඳවා ගැනීමේ පටිපාටිය සංශෝධනය කිරීමට නොහැකි වී ඇත. | බාහිර උපදේශකවරයෙකුගේ මඟ පෙන්වීම යටතේ නව පටිපාටියක් කෙටුම්පත් කරමින් පවතී. |
| (ඇ) | ආයතනය සඳහා මහල් 4කින් යුතු ගොඩනැගිල්ලක් ඉදිකිරීමට 2013 වර්ෂයේදී ලංසු කැඳවා කොන්ත්‍රාත්කරුවෙකු තෝරාගෙන රු.53,196,907ක කොන්ත්‍රාත් ගිවිසුමට එළඹ | ආයතනයේ ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු පරීක්ෂාකර බලා රජයට අලාභයක් නොවන පරිදි ඉදිරි කටයුතු කඩිනම් කළ යුතුය. | නව ගොඩනැගිල්ල ඉදි කිරීම සම්බන්ධයෙන් පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය මඟින් කැබිනට් සංදේශයක් කැබිනට් මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත. ඒ අනුව පසුගිය වියදම් | 2021 වර්ෂයේ අවසානය දක්වාම ප්‍රගතියක් ලබාගෙන නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | තිබුණු අතර ගොඩනැගිල්ලේ පයිල් අත්තිවාරම ඉදිකිරීම ප්‍රධාන කොන්ත්‍රාත්කරු විසින් උපකොන්ත්‍රාත්කරුවෙකු වෙත පවරා තිබුණි. මහල් 4කට ප්‍රමාණවත් පයිල් අත්තිවාරම ඉදිකර එය මහල් 8 දක්වා වැඩි කිරීමට තීරණය කර සැලැස්ම වෙනස් කිරීම හේතුවෙන් අදාළ පයිල් අත්තිවාරම මත ගොඩනැගිල්ල ඉදිකිරීම සුදුසු නොවන බව ආයතනය විසින් පිළිගෙන ඇති බැවින් මේ සඳහා දරන ලද රු. 44,757,072ක වියදම නිශ්කාර්ය වියදමක් වී තිබුණි. | | සම්බන්ධයෙන් සොයා බැලීමට ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව වෙත පැවරුණු අතර, ඉදිරි ඉදිකිරීම් වැඩකටයුතු සම්බන්ධයෙන් මොරටුව විශ්වවිද්‍යාලය හා සමඟ සාකච්ඡා වෙමින් පවතී. | |
| (ඇ) | බාහිර සම්පත්දායකයන් බඳවා ගැනීම සඳහා 2017 දෙසැම්බර් 14 දින පුවත්පත් දැන්වීම මඟින් ඉල්ලුම්පත් කැඳවා තිබූ නමුත් සම්පත් දායකයින් තෝරා ගැනීම සඳහා විධිමත් ක්‍රමයක් අනුගමනය නොකර සහ පාලක සභාවේ අනුමැතිය රහිතව විෂය ක්ෂේත්‍රය අනුව සම්පත්දායකයන් 85 දෙනෙකු ලියාපදිංචි කිරීමට කටයුතු කර තිබුණි. | නියමිත පරිදි කටයුතු නොකිරීම පිළිබඳ සොයා බලා ක්‍රියාමාර්ග ගත යුතුය. | මේ සම්බන්ධ වන කරුණු පාලක සභාවට ඉදිරිපත් කරනු ලැබීමට නියමිතව තිබුණි. | 2021 වර්ෂයේදීද විධිමත් ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර නැත. |
| (ඉ) | අංක 01/2014 හා 2014 පෙබරවාරි 17 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ නියමයන්ට අනුව දිගුකාලීන දැක්මක් සහිතව ආයතනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම ඉලක්ක කරගත් ක්‍රියාකාරී සැලැස්මක් | නියමිත පරිදි සකස් කළ යුතු වේ. | චක්‍රලේඛයේ සඳහන් පරිදි ඉදිරි වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම ඉදිරිපත් කරමි. | 2022 ජනවාරි අවසානය දක්වාම ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නැත. |

වාර්ෂික අයවැය පදනම් කර ගත් ප්‍රමුඛතා අනුව සකස් කර නොතිබූ අතර එම ක්‍රියාකාරකම්වල අපේක්ෂිත නිමැවුම්/ ප්‍රතිඵල ඇතුළත් වන පරිදි ආයතනය විසින් පිළියෙල කර ඇති ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

## 41. ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 - තතත්ත්වාගණනය කළ මතය

2019 - තතත්ත්වාගණනය කළ මතය

2020 - තතත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2020 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ශේෂය තුළ වර්ෂ 05 කට වඩා වැඩි කාලයක සිට ණයගැතියන් 42 දෙනෙකුගෙන් රු.948,156 ක්ද ,වසර 3ත් 5ත් අතර වූ ණයගැතියන් 35 කගෙන් රු.3,757,350ක්ද වූ අතර එම ශේෂ අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ණයගැති ශේෂ අයකර ගැනීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් අවධානයක් යොමු කළ යුතුය. | ණයගැතියන් සඳහා සිහි කැඳවීමේ ලිපි යවා ඇත. | ණයගැතියන්ගේ ණය, කොටස් වශයෙන් අය කර ගැනීම නිසා දීර්ඝ කාලීන ණය ගැතියන්ගේ ශේෂ සඳහා මුදල් ලැබීමේ ප්‍රමාදයක් පවති. |
| (ආ) | ආයතනය පිහිටුවනු ලැබූ පනතේ එක් පරමාර්ථයක් වූයේ ඇඟළුම් කර්මාන්තයේ නියැලෙන්නන්ට පශ්චාත් උපාධි, උපාධි, සහ ඩිප්ලෝමා මට්ටමේ පුහුණු වැඩසටහන් පවත්වා ගෙන යාම වේ. නමුත් 2016 වසරේ සිට 2019 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය සලකා බැලීමේදී පවත්වනු ලැබූ මුළු පාඨමාලා සංඛ්‍යාවෙන් පශ්චාත් උපාධි, උපාධි හා ඩිප්ලෝමා මට්ටමේ පුහුණු පාඨමාලා පවත්වා ගෙනගොස් තිබුණේ සියයට 10 ක් පමණි. | පනතේ පරමාර්ථ අනුව ඇඟළුම් කර්මාන්තයේ නියැලෙන්නන්ට පශ්චාත් උපාධි, උපාධි, සහ ඩිප්ලෝමා මට්ටමේ පුහුණු වැඩසටහන් පවත්වා ගෙන යා යුතුයි. | උපාධි ප්‍රධානය සඳහා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පනත ප්‍රකාරව සහ අධ්‍යක්ෂක මණ්ඩල තීරණය අනුව 2022 වසරේ ආයතනය විසින් උපාධි පාඨමාලා 02 ක් සහ වෘත්තීය තාක්ෂණික විශ්වවිද්‍යාලය හා එක්ව NVQ සහතික ලත් අයවලුන් සඳහා උපාධි පාඨමාලාවක් ආරම්භ කිරීමට කටයුතු සම්පාදනය කර ඇත. | 2022 වසරේ මැයි මාසයේ සිට ආයතනය නව උපාධි 02 ක් පිරිනැමීම සඳහා කටයුතු සැලසුම් කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2015 වර්ෂයේදී ලද කැබිනට් අනුමැතියක් අනුව මහල් 04 ක නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා ලංසු කැඳවීමට පෙර සිදු කළ යුතු වූ විවිධ කටයුතු සඳහා රු.3,762,600ක වියදමක් දරා තිබුණි. එහෙත් , ප්‍රතිපාදන සපයා ගැනීමේ අපහසුතා නිසා එම ඉදිකිරීම නැවැත්වීමට තීරණය වීම හේතුවෙන් දරන ලද සම්පූර්ණ වියදම ඵලදායී වී නොතිබුණි. | ඉදිකිරීම් සඳහා යෝජනාවලදී ප්‍රතිපාදන සපයාගැනීම අනුමත කරගැනීමෙන් පසුව පමණක් ආරම්භක කටයුතු සඳහා වන වියදම් දැරිය යුතුය. | කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර මෙම ගොඩනැගිල්ල ඉදි කිරීමට බලාපොරොත්තු වන අතර එහි දි ඉහත සැලසුම් හා ඇස්තමේන්තු ඒ සඳහා භාවිත කිරීමට අපේක්ෂිතයි. | දැනට මෙම ගොඩනැගිල්ල ඉදිකිරීම් නවතා ඉතිරි මුදල භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීමට පාලක මණ්ඩල තීරණය කර ඇත. |
| (ඈ) | අමාත්‍යාංශයෙන් ලද ප්‍රතිපාදන මත ක්‍රියාත්මකවන Healthy and Safety ව්‍යාපෘතියෙන් ඇහලුම්වල ගුණාත්මකභාවය පරීක්ෂා කිරීමට රු.2,237,112ක් වටිනා යන්ත්‍රයක් මිලදීගෙන තිබුණත් යන්ත්‍රය භාවිතා කර අමුද්‍රව්‍යවල ගුණාත්මකභාවය පිළිබඳව සහතිකයක් ලබාදීමට අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂයේදී අනුමත කර ගෙන නොතිබුණි. | පවත්නා වෙළඳපල තුළ කළ පර්යේෂණවලින් වූ නිගමනයන් පොදු සමාජයට අහිතකර බැවින් එම තත්වය වෙනස් කිරීමට නීති සැකසිය යුතුය. | මූලා ප්‍රතිපාදන ලද පසු අවශ්‍ය නීතිමය සහතිකයක් ලබා ගැනීමේ කටයුතු කිරීමට සැලසුම් කර ඇත. | 2021 වර්ෂයේදිද මූලා ප්‍රතිපාදන ලබා ගැනීමේ කටයුතු ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. |

## 42. පොල් පර්යේෂණ මණ්ඩලය

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - තතත්ත්වාගණනය කළ මතය

2019 - තතත්ත්වාගණනය කළ මතය

2020 - තතත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | වියලි කාලගුණය හේතුවෙන් බීජ නිෂ්පාදනය අඩු වීම සලකා බලා අවශ්‍ය ජලය ලබා දීමට ප්‍රමාණවත් වාරි පද්ධති ස්ථාපිත කිරීම සහ නව පොල් ප්‍රභේද මඟින් අස්වැන්න වැඩි කර ගැනීමට මණ්ඩලය විසින් ක්‍රියා නොකිරීම හේතුවෙන් 2017 වර්ෂයේ 1,107,642ක් වූ බීජ නිෂ්පාදන 2018 වර්ෂයේදී 828,070ක් දක්වා අඩු වී තිබුණි. | ප්‍රමාණවත් පරිදි ජලය නොලැබීම නිසා පොල් ඵලදාව අඩු මට්ටමක පවතින වතු සඳහා වාරි පද්ධති ස්ථාපිත කිරීමට අවශ්‍ය ක්රියාමාර්ග ගත යුතුය. | සම්පූර්ණයෙන් ආවරණය වන පරිදි ජල සම්පාදන පද්ධති ඉදිකිරීමට විශාල මුදලක් වැය වීමත්, භූගත ජලයේ හිඟතාවයත් නිසා වැසි ජල සංරක්ෂණ ක්‍රම යෙදීමට 2022 වර්ෂයේදී සැලසුම් කෙරේ. | වාරි පද්ධති ස්ථාපිත කිරීම හෝ වැසි ජල සංරක්ෂණ ක්‍රම යෙදීම 2021 වර්ෂයේදීද සිදු වී නොතිබුණි. |
| (ආ) | 2018 වර්ෂයේදී නිම කිරීමේ අපේක්ෂාවෙන් රු.11,925,500 ක ප්‍රතිපාදන වෙන් කර තිබූ පර්යේෂණ ව්‍යාපෘති 07 ක භෞතික කාර්යය සාධන මට්ටම සියයට 45 ත් 80 ත් අතර විය. මෙයට ප්‍රධාන වශයෙන් පර්යේෂණ නිලධාරීන්ගේ හිඟය, පර්යේෂණ නිලධාරීන් සේවය අත්හැර යාම, රසායනික ද්‍රව්‍ය නොලැබීම, රසායනික උපකරණ මිලදී ගැනීමට ප්‍රමාද වීම හේතු වී තිබුණත් මේ සඳහා කළමනාකරණය විසින් අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | පර්යේෂණ ව්‍යාපෘතිවල කාර්යය සාධන මට්ටම අඩු වීමට බලපාන කරුණු සොයා බලා ඊට අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය. | පුරප්පාඩු බොහෝ ප්‍රමාණයක් 2021 වසරේදී පුරවා ඇති බැවින් 2022 වසරේ සිට මෙම ගැටළුව බොහෝ දුරට විසඳා ගැනීමට නියමිතය. | 2021 වර්ෂයේදීද පර්යේෂණ ව්‍යාපෘති සැලසුම් කළ ආකාරයට ඉටු වීනොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2018 පෙබරවාරි මස කපා දමන ලද රත්මලාගාර පර්යේෂණ මධ්‍යස්ථානයට අයත් රු.3,428,678ක තක්සේරු වටිනාකමක් සහිත තේක්ක ගස් 112 ක ප්‍රමාණයක් අලෙවිකර ගැනීමට නොහැකිව දිරාපත් වෙමින් පැවතුණි. | අදාළ ඉඩමේ අයිතිය තහවුරු කර ගැනීමට පෙර ගස් කැපීමට තීරණය කළ නිලධාරීන්ට එරෙහිව අදාළ ක්‍රියාමාර්ග ගත යුතුය. | රාජ්‍ය දැව සංස්ථාවෙන් ලබාගත් තක්සේරු වටිනාකමට අලෙවි කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය ලද පසු විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඔස්සේ අලෙවි කිරීමට පියවර ගනිමින් සිටී. | 2021 වර්ෂය අවසානය දක්වාම අලෙවි කිරීමට හෝ නිලධාරීන්ට එරෙහිව විනය පියවර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඈ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 47 ඡේදය ප්‍රකාරව සෑම වර්ෂ තුනකට හෝ පහකට වරක් අවශ්‍ය වන පරිදි දේපළ පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කළ යුතු වුවත්, පිරිවැය රු.1,539,783,874 ක් වූ ඉඩම් සහ පිරිවැය රු.187,578,610ක් වූ ගොඩනැඟිලි 2005 වර්ෂයෙන් පසුව ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ප්‍රමිතිය ප්‍රකාරව වත්කම් ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතුය. | බණ්ඩිරිප්පුව, වල්පිට හා අඹකැලේ ඉඩම් ආයතනය වෙත පවරා ගැනීමේ කටයුතු අවසන් වීමෙන් පසුව ඉඩම් හා ගොඩනැඟිලි ප්‍රත්‍යාගණනය කරන බව වාර්තා කර ඇත. | 2021 වර්ෂයේදීද ඉඩම් සහ ගොඩනැඟිලි ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. |
| (ඉ) | පොල් මයිටා හානිය මර්ධනය කිරීමට අවශ්‍ය පර්යේෂණ සිදුකිරීම සඳහා මණ්ඩලය 2000 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ රු.13,767,434 ක වියදමක් දරා මයිටා උවදුර මර්ධනයට අදාළව 1999 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා මයිටා මර්ධන නිර්දේශ ඉදිරිපත් කර තිබුණ ද, 2014 වර්ෂයෙන් පසුව කිසිදු නිර්දේශයක් | පොල් මයිටා හානිය මර්ධනයට ප්‍රායෝගික විසඳුම් ඉදිරිපත් කළ යුතුය. | සිදුකරමින් පවතින පොල් මයිටා හානියට ඔරොත්තු දෙන පොල් ප්‍රභේද පිළිබඳව පර්යේෂණ මඟින් නිර්දේශ නිකුත් කිරීම සඳහා අවම වශයෙන් තව වසර 2 ක කාලයක් ද, වෙනත් විලෝපික මයිටාවන් සම්බන්ධ පර්යේෂණවල නිර්දේශ නිකුත් කිරීම සඳහා තවත් වසර 5 ක් පමණ ද ගත වන බව වාර්තා කර ඇත. | 2021 වර්ෂයේදීද ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ හැකි නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | ඉදිරිපත් කිරීමට නොහැකි වී තිබුණි. මේ දක්වා මණ්ඩලය විසින් ඉදිරිපත් කර තිබූ නිර්දේශ අතරින් පොල් මයිටා උවදුර සැලකිය යුතු මට්ටමකට අවම කර ගැනීමට නොහැකි වීම කෙරෙහි එම නිර්දේශ ක්‍රියාත්මක කිරීමේදී ක්ෂේත්‍රයේදී ඇති වන ප්‍රායෝගික අපහසුතාවය හේතු වී තිබුණි. | | | |
| (ඊ) | 2019 වර්ෂයේ අවසානයට පොල් පර්යේෂණ මණ්ඩලයේ බීජ පොල් නිෂ්පාදනය පොල් ගෙඩි 1,571,075ක් වූ නමුත් 1998 වර්ෂයෙන් පසුව හඳුන්වා දී තිබූ කප්රුවන, කප්සුවය හා කප්සෙත යන විශේෂ පොල් ප්‍රභේදවල බීජ පොල් නිෂ්පාදනය ගෙඩි 11,930ක් පමණක් විය. එය මුළු බීජ නිෂ්පාදනයෙන් 0.76 ක් පමණ ඉතා අඩු ප්‍රතිශතයක් විය. මෙම නිසා බීජ පොල් උයන් ස්ථාපිත කර බීජ නිෂ්පාදනය වැඩි කිරීමටත් ඉහත පොල් ප්‍රභේදවල බීජ නිෂ්පාදනය වැඩිකර ජනතාව අතර ව්‍යාප්ත කිරීමටත් මණ්ඩලයට නොහැකි වී තිබුණි. | නව බීජ පොල් උයන් ස්ථාපිත කිරීම මගින් කප්රුවන, කප්සුවය හා කප්සෙත යන පොල් ප්‍රභේදවල බීජ නිෂ්පාදනය වැඩිකර ජනතාව අතර ප්‍රචලිත කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. | කිනියම බීජ පොල් උයනේ බීජ නිෂ්පාදන කටයුතු 2022 වසරේ සිට ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු සිදු කෙරේ. කප්සුවය බීජ නිෂ්පාදනය සඳහා නව බීජ පොල් උයනක් කුරුණෑගල වැවිලි සමාගම සමඟ එක්ව 2021 වසරේදී ආරම්භ කෙරුණි. අත්පරාගණය මගින් දෙමුහුම් වර්ග නිෂ්පාදනය කිරීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික වැවිලි සමාගම් සමඟ වැඩසටහනක් ආරම්භ කර ඇත. | බීජ පොල් නිෂ්පාදනය ඉහළ ගොස් තිබේද යන්න පිළිබඳ ඇගයීමක් සිදු කර නැත. |
| (උ) | විදේශ සංචාර සඳහා නිලධාරීන් දෙදෙනෙකුට 2019 වර්ෂයේ දී ලබාදෙන ලද රු.777,856ක මුදල සමාලෝචිත වර්ෂය අවසාන | නොපමාව අත්තිකාරම පියවිය යුතුය. | ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අනුමැතිය බොහෝ අවස්ථාවල එකී සංචාරය නිම වූ පසුව ලැබෙන බැවින් | විදේශ ගමන් අත්තිකාරම පියවාගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | වන විටත් පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | | රේඛීය අමාත්‍යාංශයේ අනුමැතිය මත අත්තිකාරමක් වශයෙන් නිකුත් කළ මෙම මුදල් පියවීම සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අනුමැතිය බලාපොරොත්තුවෙන් සිටී. | |
| (ඐ) | වර්ෂ 1992 – 2014 කාල පරතරය තුළ ශිෂ්‍යත්ව ලබා විදෙස්ගතව නැවත සේවයට නොපැමිණි නිලධාරින් 09 දෙනෙකුගෙන් ගිවිසුම් ප්‍රකාරව මණ්ඩලයට අයවිය යුතු රු.28,588,859ක මුදලක් නිලධාරින්ගෙන් සහ ඇපකරුවන්ගෙන් අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගෙන තිබුණි. | ගිවිසුම් උල්ලංඝනය කළ අයගෙන් මණ්ඩලයට මුදල් අය කරගත යුතුය. | නඩු කටයුතු තව දුරටත් ක්‍රියාත්මක කෙරේ. | 2021 වර්ෂයේදීද මුදල් අය කර ගැනීමට නොහැකි වී තිබුණි. |
| (එ) | වසරකට "කප්රුවන" දෙමුහුන් පොල් පැළ 250,000 ක් ජාතික පොල් රෝපණයට ලබාදීම අරමුණු කරගෙන රු.25,814,945ක රජයේ වියදම් හා රු.40,375,217ක හලාවත වැවිලි සමාගමේ වියදම් මත එම සමාගමට අයත් හලාවත කීනියම වත්තේ 2013 වසරේදී අක්කර 160 ක බීජ පොල් උයනක් ස්ථාපිත කර තිබූ නමුත්, ශක්‍යතා අධ්‍යනයක් සිදුකර දිගුකාලීන සැලැස්මක් සකස් කර නොතිබීම, පැළ 4,818 ක පුරප්පාඩුව පැවතීම, අත් පරාගණන කටයුතු හා වගාව | බීජ උයන පිහිටුවීමෙන් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. | මෙම බීජ පොල් උයනේ පැවති පුරප්පාඩු හා කෘමි හානි මර්ධනය සඳහා අවශය පියවර ගෙන ඇත. අත් පරාගණය මඟින් බීජ නිෂ්පාදනය 2022 වසරේ සිට ආරම්භ කිරීමට නියමිතය. | 2021 වර්ෂයේදීද අපේක්ෂිත අරමුණ කරා ළඟා වී නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | නිසි පරිදි නඩත්තු නොවීම යනාදී කරුණු හේතුවෙන් අපේක්ෂිත අරමුණු ඉටුවන බවට නිරීක්ෂණය නොවීය. | | | |
| (ඒ) | කීනියම බීජ පොල් උයනේ අක්කර 160 ක භූමි ප්‍රමාණයේ සියලුම ශාඛාවලට ජලය සැපයීම සඳහා රු.17,501,925ක් වැයකර නල ජල පද්ධතියක් ස්ථාපිත කර තිබුණ ද, ජලය එක්රැස් කරන ටැංකියක් සකස් කර නොතිබීම නිසා නල ලිඳ අවට ප්‍රදේශයට පමණක් එමඟින් ජලය සැපයෙන අතර ඉතිරි ප්‍රදේශයට බවුසර් මඟින් ජලය සපයන බවට නිරීක්ෂණය වූයෙන්, එම ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් තාක්ෂණික ඇගයීම් කමිටුවේ හා ප්‍රසම්පාදන කමිටුවේ කාර්යභාරය මතභේදාත්මක විය. | නල ජල පද්ධතිය මඟින් අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීම සඳහා නිසි පිළියම් යෙදිය යුතු අතර ව්‍යාපෘතිවලින් අපේක්ෂිත අරමුණු ඉටු කරගත හැකි ආකාරයට නිසි සැලසුම්කරණයක් යටතේ කටයුතු කළ යුතුය. | මෙම ජල සම්පාදන පද්ධතිය වැඩි දියුණු කිරීම සඳහා විශේෂඥ උපදෙස් ලබා ගනිමින් සිටී. | නල ජල පද්ධතිය මඟින් අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ඔ) | කොළ මැලවීමේ රෝගයට ප්‍රතිරෝධිතාවයක් පෙන්නුම් කරන දෙමුහුන් බීජ නිෂ්පාදනය කිරීම සඳහා රු.11,729,698ක වියදමකින් 2016 වර්ෂයේදී මාතර වැලිගම ප්‍රදේශයේ ස්ථාපනය කරනු ලැබූ අක්කර 05 ක පොල් උයන නිසි අධීක්ෂණයකින් තොරව පවත්වාගෙන යාම, බද්දට ගෙන තිබූ පොල් ගස් 50 ක අත් පරාගණන කටයුතු | වැලිගම කොළ මැලවීමේ රෝගය පාලනය කිරීමේ අකාර්යක්ෂමතායවන් හඳුනාගෙන ඒවා කාර්යක්ෂමව කළමනාකරණය කර ගැනීමට කටයුතු කළ යුතුය. | අත් පරාගණ කටයුතු ආරම්භ කිරීම සඳහා කම්කරුවෙකු බඳවා ගෙන පුහුණු කිරීම අරඹා ඇත. 2022 පළමු කාර්තුව අවසන් වීමට පෙර අත්පරාගණ කටයුතු ආරම්භ කිරීමට නියමිතය. | බීජ පොල් උයන නිසි පරිදි පවත්වා නොගැනීම හා රෝගී ගස් ඉවත් කිරීමේ කාර්යය කාර්යක්ෂම නොවීම හේතුවෙන් රෝගය පාලනය වී නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | සිදු නොවීම හා රෝගී ගස් ඉවත් කර පවත්වාගෙන යනු ලබන ආරක්ෂණ කලාපයේ සිව්වන අදියරේදී 294 ක් වූ ග්‍රාම නිලධාරි වසම්වලින් වසම් 249 ක් පරීක්ෂා කර නොතිබීම යනාදී කරුණු අනුව දකුණු පළාතේ පැතිර යන පොල් කොළ මැලවීමේ රෝගය පාලනය කිරීම කාර්යක්ෂමව හා ඵලදායීව සිදුවන බවට නිරීක්ෂණය නොවීය. | | | |
| (ඕ) | මණ්ඩලය සතු ජාන සම්පත් මධ්‍යස්ථාන (වතු) 10 හි සමාලෝචිත වර්ෂයේ ගෙඩි 3,941,973ක් වූ පොල් ඵලදාව 2019 වර්ෂයේ ගෙඩි 5,410,551ක් වූ ඵලදාව සමඟ සැසඳීමේදී සියයට 27 කින් ද, ගෙඩි 5,079,249ක් වූ ඇස්තමේන්තුගත පොල් ඵලදාව සමඟ සැසඳීමේදී සියයට 22 කින් ද අඩුවී තිබුණි. එම අඩුවීම ජාන සම්පත් මධ්‍යස්ථාන අතර සියයට 2 ක සිට 40 ක් දක්වා පරාසයක විය. | පොල් ඵලදාව අඩුවීමට බලපාන සියලුම කරුණු අධ්‍යයනය කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | පොල් ඵලදාව අඩුවීමට බලපාන සියලුම සාධක පිළිබඳව විධිමත් අධ්‍යයනයකින් පසුව, කණාටු පොල් ගස් ඉවත් කර පුරප්පාඩු පිරවීම, තෙතමන සංරක්ෂණ ක්‍රම හා වැසිදිය ආරක්ෂණ ක්‍රම භාවිතය, රෝග හා පළිබෝධ මර්ධනය වෙනුවෙන් අවශ්‍ය තාක්ෂණික ක්‍රියා මාර්ග ගැනීම, නිර්දේශිත ක්‍රමවේදයට අනුව රසායනික හා කාබනික පොහොර යෙදීම යනාදිය මඟින් පොල් ඵලදාව වැඩිකිරීමට බලාපොරොත්තුව සිටී. | ඵලදාව අඩුවීමව බලපාන සාධක හඳුනාගෙන තිබුණ ද, අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |

## 43. පොල් වගා කිරීමේ මණ්ඩලය

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය — 2018 - තතත්ත්වාගණනය කළ මතය

2019 - මතය වියාවනය

2020 - මතය වියාවනය

| විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| (අ) 2013 වර්ෂයේදී දිවිනැගුම වැඩසටහනට ලබාදුන් පොල් පැළ වෙනුවෙන් ලැබිය යුතු රු.4,596,475ක් වසර 8 කට අධික කාලයක් ගත වී ඇතත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | දිගු කාලයක් තිස්සේ පවතින ලැබිය යුතු මුදල් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කළමනාකරණය විසින් ක්‍රියාත්මක කළ යුතුය. | මුදල් අය කර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. | 2021 වර්ෂයේදීද අය වී නොතිබුණි. |
| (ආ) මණ්ඩලයෙහි නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය කලමනාකරණ) නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ව්‍යාප්ති හා සංවර්ධන) යන තනතුරු පිළිවෙලින් 2016 හා 2017 වර්ෂයන්හි සිට පුරප්පාඩු වී තිබුණ ද, ඒ සඳහා සථිර නිලධාරීන් පත්කර ගැනීමට කටයුතු නොකිරීම නිසා අදාළ තනතුරුවල කාර්යභාරයන් කාර්යක්ෂම ලෙස ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි. | මණ්ඩලයේ පවතින ප්‍රධාන තනතුරු සඳහා ස්ථිර නිලධාරින් කඩිනමින් බඳවා ගැනිම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග කළමනාකරණය විසින් ගත යුතුය. | පුරප්පාඩුව පවතින තනතුරු සඳහා බඳවා ගැනීමට මූලික කටයුතු සිදුකර ඇතත් නව බඳවා ගැනීම් සිදු නොකිරීමට රජය තීරණය කර තිබෙන බැවින් රාජ්‍ය අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගැනීම සඳහා 2022.01.25 දින යොමුකර ඇත. | 2022 ජනවාරි දක්වාම තනතුරු සඳහා ස්ථිර නිලධාරීන් පත් කර නොතිබුණි. |
| (ඇ) සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබූ රු.348,563,841ක් වූ දේපළ පිරියත උපකරණ ප්‍රයෝජනයට ගනිමින් පැවතිය ද, එම වත්කම්වල ඵලදායී ජීවිත කාලය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 3 | සම්පූර්ණයෙන් ක්ෂය කර ඇති වත්කම් ප්‍රමිත අංක 03 ප්‍රකාරව නැවත සමාලෝචනය කර මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු අතර ප්‍රමිත අංක 07 (92)(ආ) ඡේදය ප්‍රකාරව | වත්කම් නැවත සමාලෝචනය කර මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමට කටයුතු කරමින් පවතී. | 2021 වර්ෂයේදීද නැවත සමාලෝචනය කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | අනුව නැවත සමාලෝචනය කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණු අතර ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 (92) (ආ) ඡේදය ප්‍රකාරව මෙම වත්කම් පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කිරීමක්ද සිදුකර නොතිබුණි. | මෙම වත්කම් පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කිරීමක්ද කළ යුතුය. | | |
| (ඇ) | ණයගැති පෞද්ගලික සමාගම් දෙකකින් අයකර ගැනීම සඳහා නඩු තීන්දු ලබා දී ඇති පිළිවෙලින් රු.2,631,003ක හා රු.1,176,375ක මුදලක්ද, 2013 වර්ෂයේ සිට පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශයෙන් මණ්ඩලයට ලැබිය යුතු රු.6,573,572 ක මුදලක් ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මණ්ඩලය වෙත අයවීමට නියමිත මුදල් අයකර ගැනීමට කළමනාකරණය කටයුතු කළ යුතුය. | 1997 හා 1999 වර්ෂයන්හි පොල් විකිණීම වෙනුවෙන් පෞද්ගලික සමාගම් දෙකකින් අයවිය යුතුව පවතින රු.3,807,378ක මුදල අය කර ගැනීම සඳහා විත්තිකරුවන්ගේ ලිපිනය සොයා ගැනීමට නොහැකි බව දන්වා ඒ සඳහා වූ නඩුව බහා තබන බව නීතිපති දෙපාර්තමේන්තුව විසින් දන්වා ඇත. වැලිගම කොළ මැළවීමේ හා කුණුවීමේ රෝග පාලනය වෙනුවෙන් පොල් වගාකිරීමේ මණ්ඩලයෙන් දරන ලද රු.6,573,572ක මුදල අමාත්‍යාංශ මාරු වීම නිසා ප්‍රතිපූර්ණය කර ගැනීමට නොහැකි වීමෙන් බොල් ණය ලෙස කපා හැරීමට කටයුතු කරමින් සිටී. | 2021 වර්ෂය අවසානය දක්වාම අය කර ගැනීමට නොහැකි වී තිබුණි. |
| (ඉ) | පොල් සංවර්ධන නිලධාරීන්ගේ රාජකාරී ලැයිස්තුවේ පොල් වගාකරුවන් සඳහා දැනුම හා තොරතුරු ලබා දීම, පුහුණු | පොල් මයිටා හානිය සම්බන්ධයෙන් නිවැරදි වූ දත්ත පද්ධතියක් පවත්වාගෙන යා යුතු අතර එම දත්ත | මේ වන විට පොල් වගාවට හානිකරන පළිබෝධකයින් පිළිබඳව දත්ත රැස් කර මයිටා හානිය වැඩි ප්‍රදේශ සිතියම් ගතකර ඇත. | මයිටා හානිය පාලනය කර ගැනීමට සක්‍රිය ක්‍රියාමාර්ග ගැනීමට අපොහොසත් වී තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, රෝග/පලිබෝධ හානි මර්ධනය සඳහා උපදෙස් ලබා දීම, රෝග හා පලිබෝධ මර්ධනයට අවශ්‍ය කෘෂි රසායනික ද්‍රව්‍ය, පරපෝෂිතයන්, විලෝපිකයින් නිකුත් කිරීම සඳහා සම්බන්ධීකරණය, කොට්ඨාශයේ කෘෂිකාර්මික සේවා හා පොල් වගාව ආශ්‍රිත කර්මාන්ත සම්බන්ධව පූර්ණ දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම හා දත්ත යාවත්කාලීන කිරීම සිදු කළ යුතු බව දක්වා තිබුණ ද, 2019 වර්ෂයේදී එකී නිලධාරීන් විසින් පොල් මයිටා හානිය සම්බන්ධයෙන් දත්ත පවත්වාගෙන යාමක් හා දත්ත යාවත්කාලීන කිරීමක් සිදුකර නොතිබූ අතර ඒ පිළිබඳව අධීක්ෂණ නිලධාරින්ගේ අවධානයද යොමු වී නොතිබුණි. | යාවත්කාලීන කළ යුතුය. | | |
| (ඊ) | 2014 වර්ෂයේ ආරම්භ කර තිබුණු මණ්ඩලයේ ප්‍රධාන කාර්යාල ගොඩනැඟිල්ල සඳහා තවත් අතිරේක කොටසක් ඉදිකිරීම සඳහා අදාළ ආයතනවලින් අනුමැතිය ලබා ගැනීමට කටයුතු නොකර කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුමට එළැඹ තිබුණි. මේ හේතුවෙන් මණ්ඩලය විසින් මෙම ඉදිකිරීම සඳහා රු.14,388,275ක මුදලක් වැය | ඉදිකිරීම් කටයුතු අඩාල වීම සඳහා හේතු සොයා බලා එයට වගකිව යුතු නිලධාරින්ගෙන් පාඩුව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | මේ සඳහා ඉදිකිරීම් සංවර්ධන අධිකාරිය (CIDA) වෙතින් හා ඉදිකිරීම් උපදේශක ආයතනය වන ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය වෙතින් ඉල්ලා ඇති උපදෙස් අනුව ඉදිරි කටයුතු සිදු කරනු ඇත. | වැය කළ මුදල් අය කර ගැනීමට හෝ ගොඩනැඟිල්ල නිම කරවා ගැනීමට අදාළ නිසි ක්‍රියාමාර්ග ගෙන නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | කර තිබියදී කොන්ත්‍රාත්කරුවන් විසින් මෙම ඉදිකිරීම් කටයුතු සිදු නොකර කොන්ත්‍රාත්තුව අතහැර දමා තිබූ අතර අදාළ නිවැරදි කිරීම් සිදු කොට කොන්ත්‍රාත්තුව නිම කරවා ගැනීමට මණ්ඩලය මේ දක්වා අපොහොසත් වී තිබුණි. | | | |
| (උ) | පොල් වගාවේ කළමනාකරණ ක්‍රමවේදය පෙන්නුම් කිරීමට ස්ථාපිත කරන ලද ආදර්ශ පොල් වතු සම්බන්ධයෙන් එක් එක් ආදර්ශනයේ ප්‍රගතිය පිළිබඳ වාර්තාවක් සති 2 කට වරක් ප්‍රධාන කාර්යාලයට එවිය යුතු නමුත් 2019 වර්ෂයේදී එවැනි ප්‍රගති සමාලෝචනයක් සිදු වී නොතිබුණි. වර්තමානය වන විට මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් නිසි අවධානයක් මණ්ඩලය විසින් යොමු නොකරන බව නිරීක්ෂණය විය. | එක් එක් ආදර්ශනය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රගති වාර්තාවක් පිළියෙල කරමින් නිසි අධීක්ෂණයක් යටතේ ව්‍යාපෘතියෙහි කටයුතු ඉටු කළ යුතුය. | ආදර්ශ පොල් වතුවල ප්‍රගතිය අධීක්ෂණය සඳහා පොල් සංවර්ධන නිලධාරීන් හා ගොවිපල සැලසුම් නිලධාරීන් ඉඩම් අඛණ්ඩව පරීක්ෂා කර ලොග් සටහන් තබා ඇත. මෙම ව්‍යාපෘතියේ තොරතුරු හා ප්‍රගතිය කෙටි වීඩියෝ පටි මඟින් ලබාගැනීමට තීරණය කර ඇත. | ආදර්ශ පොල් වතු සම්බන්ධයෙන් ප්‍රගති සමාලෝචනයක් සිදු වී නොතිබුණි. |
| (ඌ) | ගෙවීම් සම්බන්ධ අභ්‍යන්තර පාලනය දුර්වල වීමත්, චෙක්පත් වෙනස් කිරීම හා කපාහැරීම පිළිබඳව අදාළ වගකිවයුතු නිලධාරීන්ගේ අවධානය යොමු නොකර සහතික කරන නිලධාරින් විසින් එම වෙනස්කිරීම, කපාහැරීම, සහතික කර තිබීමත් හේතුවෙන් 2019 වර්ෂයේදී මණ්ඩලයේ සිදු වී තිබූ | අභ්‍යන්තර පාලන පද්ධති ස්ථාපිත කළ යුතුය. පැවති දුර්වලතා පිළිබඳ වගකිව යුත්තන්ට එරෙහිව විනය පියවර ගත යුතුය. | අධීක්ෂණ නිලධාරියාගේ අධීක්ෂණ ක්‍රියාවලියෙන් බැහැරව නිලධාරිණිය විසින් තනිවම වංචනික ක්‍රියාවේ නිරත වී ඇති බව දක්වමින් නිලධාරීන්ට විනය ක්‍රියාමාර්ග ගැනීම වෙනුවට චෙක්පත් නිකුත් කිරීමේ හා වෙනස් කිරීමේ ක්‍රියා පිළිවෙත පිළිබඳව උපදෙස් මාලාවක් යාවත්කාලීන කර ලබා දී | වගකිව යුතු අධීක්ෂණ නිලධාරින්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | රු.595,060ක වැක්පත් වංචාවට අදාළ අලාභය අයකර ගෙන එම නිලධාරිණිය 2020 වර්ෂයේදී සේවයෙන් ඉවත්කර තිබූ නමුත් වගකිව යුතු අධීක්ෂණ නිලධාරින්ට එරෙහිව කිසිදු විනය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | | ඇත. | |
| (එ) | පොල් වගාකිරීමේ මණ්ඩලයට අයත් මඩකලපුව, වැලිපිටිය, කෑගල්ල හා අම්පාර, යන විද්‍යාගාර සේවකයින්ගේ නොසැලකිලිමත්කම සහ රසායනාගාරවල පවතින අයහපත් තත්ත්වය, අවශ්‍ය ජීවානුහරණ උපකරණ නොමැති වීම වැනි හේතුන් මත මෙම විද්‍යාගාර 2018 වර්ෂයේ අග කාර්තුවේදී ආසාදනයට ලක් වී තිබූ අතර වැලිපිටිය මයිටා විද්‍යාගාරය 2019 වර්ෂය වන විට වසා දමා තිබුණි. | මණ්ඩලයට අයත් විද්‍යාගාර නියමිත ප්‍රමිතීන් යටතේ පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය. | විද්‍යාගාර සේවකයින් පුහුණු කර ආසාදනය අවම කර ඇති බව වාර්තා කර තිබේ. එමෙන්ම එහි තත්ත්වය පිළිබඳව පොල් පර්යේෂණ ආයතනයේ හා පොල් වගා කිරීමේ මණ්ඩලයේ නිලධාරියාගේ නිරන්තර අධීක්ෂණයට ලක් වන බවද දැනුම් දී ඇත. | 2020 වර්ෂයේදීද සැලකිය යුතු ප්‍රමාණයක් ආසාදනයට ලක් වී තිබීම හේතුවෙන් තත්ත්වය පාලනය වී නොතිබුණි. |
| (ඒ) | කළමනාකරණ සහකාර III ශ්‍රේණියේ තනතුරට අදාළව පුරප්පාඩු 13 ක් පිරවීම සඳහා වූ බඳවාගැනීමේ සම්මුඛ පරීක්ෂණය 03/2018 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයෙහි විධිවිධානයන්ට පරිබාහිරව සමාලෝචිත වර්ෂයේදී පවත්වා තිබූ අතර සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින අයදුම්කරුවන් හට ලකුණු ලබාදීම අනුමත ලකුණු | අනුමත බඳවාගැනීමේ පටිපාටීන් හා කළමනාකරණ සේවා චක්‍රලේඛයන්ට අනුගතව විනිවිදභාවයකින් යුතුව අනුමත පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු කළ යුතුය. | අනුමත බඳවා ගැනීමේ පරිපාටීන් හා කළමනාකරණ සේවා චක්‍රලේඛයන්ට අනුකූලව විධිමත්ව විනිවිදභාවයෙන් යුතු වන සේ කටයුතු කිරීම සම්බන්ධයෙන් අදාල සියලුම නිලධාරීන් දැනුවත් කර බඳවා ගැනීමේ ක්‍රමවේදය ඇතුළත් Manual of Procedures (MOP) සකස් කර ඒ පිළිබඳව අදාළ කාර්ය මණ්ඩලය දැනුවත් කර ඇත. | සිදු කර ඇති වැරදි සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | ලබා දීමේ ක්‍රමවේදයට පටහැනිව සිදුකර තිබූ බවද නිරීක්ෂණය විය. එමෙන්ම තනතුර සඳහා බඳවාගත් 13 දෙනෙකුගෙන් 5 දෙනෙකු සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම සඳහා නියමිත වූ දිනයේ අදාළ සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත් වී නොතිබූ අයදුම්කරුවන් වන බවද තවදුරටත් නිරීක්ෂණය විය. | | | |
| (ඔ) | පොල් සංවර්ධන නිලධාරින් III ශ්‍රේණියේ තනතුරට අදාළව පුරප්පාඩු 30 ක් පිරවීම සඳහා සමාලෝචිත වර්ෂයේ පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයෙන් බඳවාගෙන තිබූ නිලධාරින් 27 දෙනාගෙන් 20 දෙනෙකුටම බඳවා ගැනීමට අදාළ ලකුණු ලබාදීමේ ක්‍රමවේදයට පටහැනිව වැඩි ලකුණු ලබා දී බඳවාගෙන තිබූ බව නිරීක්ෂණය විය. ඒ අනුව මෙම බඳවාගැනීම විනිවිදභාවයකින් හා අපක්ෂපාතීභාවයකින් තොරව සිදුවී ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය. | අනුමත බඳවාගැනීමේ පටිපාටීන් හා අනුමත ලකුණු ලබාදීමේ ක්‍රමවේදයට අනුගතව විනිවිධභාවයකින් යුතුව අනුමත පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු කළ යුතුය. | අමාත්‍යංශය වෙත යොමු කර ඇති මීට අදාළව සිදුකරන ලද විමර්ෂණ වාර්තාව සඳහා අමාත්‍යංශ නිර්දේශ අනුව ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිත අතර එවකට සිටි සභාපතිවරයාගෙන් නිදහසට කරුණු විමසීම සඳහා ද, ඊට අදාළ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ලිපියක් යොමු කිරීම සඳහා ද කටයුතු කරමින් පවතී. | සිදු කර ඇති වැරදි සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොමැත. |

## 44. පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාව

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 - තතත්ත්වාගණනය කළ මතය

2019 - තතත්ත්වාගණනය කළ මතය

2020 - තතත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2020 දෙසැම්බර් 31 දිනට ශුද්ධ ජංගම වත්කම්වල රු.34,278,827ක ඍන ශේෂයක් පැවති බැවින් නියාමන සභාවේ කෙටිකාලීන බුන්වත්භාවයක් පවතින බව නිරීක්ෂණය විය. එසේම 2017 වර්ෂයේ සිට නියාමන සභාව අඛණ්ඩව අලාභ ලැබීම හේතුවෙන් 2016 දෙසැම්බර් 31 දිනට පැවැති රු.33,719,154ක සමුච්චිත අරමුදල 2020 දෙසැම්බර් 31 දින වන විට රු.15,756,616ක් දක්වා සියයට 53 කින් ක්‍රමයෙන් අඩුවී තිබුණි. | රට තුළ ක්‍රියාත්මක සියලුම පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි කර ආදායම වැඩි කර ගැනීමටත් ආයතනයේ වියදම් අවම කර ගැනීමටත් කටයුතු කරමින් කෙටිකාලීන බුන්වත්භාවයෙන් මිදීමටත් අඛණ්ඩව අලාභ ලැබීම අවම කර ගැනීමටත් කටයුතු කළ යුතුය. | වාර්ෂික ආදායම අඩුවීමට විසඳුමක් ලෙස ලියාපදිංචි අදායම වැඩිකිරීම සඳහා අදාළ සැලසුම් මේ වන විටත් පිළියෙල කර ක්‍රියාත්මක කරමින් පවතින බව. | 2022 ජනවාරි 31 දින වන විටත් ලියාපදිංචි ගාස්තු ආදායම වැඩිකර ගැනීම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ආ) | නියාමන සභාව මඟින් අයකරනු ලබන ලියාපදිංචි ගාස්තු ආදායමෙන් පළාත් සභා වෙත ප්‍රේෂණය කළ යුතු සියයට 50 ක මුදලින් රු.34,990,820ක් 2020 වර්ෂයේදී නිරවුල්කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් පනතේ දැක්වෙන විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. | මේ සම්බන්ධව 2021 පෙබරවාරි මාසික සමුළුවේදී වැඩි දුරටත් සාකච්ඡා කළ බව හා සභාවේ තීරණය පරිදි නීති උපදෙස් ලබාගෙන ඉදිරි කටයුතු සිදුකරන බව. | 2022 ජනවාරි 31 දින වන විටත් මුළු මුදල නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තිය හා 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී | මුදල් පනතේ 11 වන වගන්තිය හා රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | 2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි කිරීමේ පනත | 2022 ජනවාරි 31 දින වන විටත් අමාත්‍යාංශය භාර |

| | | | | |
|---|---|---|---|---|
| | 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යාංශය භාර අමාත්‍යවරයාගේ හා මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව 2018 දෙසැම්බර් 31 සිට 2020 දෙසැම්බර් 31 දක්වා රු.44,770,520ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. | ප්‍රකාරව කටයුතු කළ යුතුය. | මඟින් වෙනම ගිණුමක් පවත්වාගෙන යාමට බලතල සභාවට ලැබී ඇති බැවින් එම බලතල ප්‍රකාරව හා සභාවේ පූර්ණ අනුමැතිය මත ස්ථාවර තැන්පතු ගිණුමක් පවත්වා ගෙන යන බව. | අමාත්‍යවරයාගේ හා මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv වැනි පරිච්ඡේදයේ 3.8 හා 3.14 වගන්තිය ප්‍රකාරව උත්සව අත්තිකාරම් හා බැංකු මගින් ලබාදෙන ණය හැර සෑම ණය මුදලක් වෙනුවෙන්ම සියයට 4.2 බැගින් පොලියක් මාස්පතා අය කළ යුතු වුවද, 2018, 2019 හා 2020 වර්ෂවලදී නිකුත් කර තිබුණු රු.2,446,666ක සේවක ණය වෙනුවෙන් පොලී අයකර නොතිබුණි. තවද ණය මුදල සඳහා ගිවිසුමක් අත්සන් කර නොතිබුණි. | ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. ඊට පරිබාහිරව කටයුතු කරන වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කළ යුතුය. | 2021 වර්ෂයේ සිට සේවක ණය සඳහා සියයට 4.2 ක පොලී අනුපාතයක් අය කිරීමට දීමට තීරණය කර ඇති බව හා විධිමත් ගිවිසුමක් අත්සන් කර ඇති බව. | 2021 වර්ෂයේ සිට පොලී අයකර තිබුණු නමුත් 2018 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා පොලී අයකර නොතිබුණි. |
| (ඉ) | 2019 දෙසැම්බර් 31 දිනට පළාත් 09 හි ස්ථාපිත මුළු පෞද්ගලික වෛද්‍ය ආයතන සංඛ්‍යාව 3,515 ක් වුවද, ඉන් වෛද්‍ය ආයතන 1,888 ක් පමණක් නියාමන සභාවේ ලියාපදිංචිවී තිබුණි. 2020 | දිවයින පුරා ස්ථාපිත සියලුම පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි කිරීමට කටයුතු කළ යුතුය. | ලියාපදිංචිය නොලබා පවත්වාගෙන යන පෞද්ගලික වෛද්‍ය ආයතනවලට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගන්නා මෙන් අදාළ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන් වෙත | 2022 ජනවාරි 31 දින වන විටත් මේ සම්බන්ධයෙන් ප්‍රමාණවත් ක්‍රියාමාර්ග අනුගමනය කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | වර්ෂය තුළදී පළාත් 07 කින් පමණක් ඉදිරිපත් කර තිබුණු තොරතුරුවලට අනුව 2020 දෙසැම්බර් 31 දින වන විට ස්ථාපිත පෞද්ගලික වෛද්‍ය ආයතන සංඛ්‍යාව 2,443 ක් වුවද, එදිනට ලියාපදිංචි පෞද්ගලික වෛද්‍ය ආයතන සංඛ්‍යාව 1,176 ක් පමණක් විය. | | මේ වන විටත් සභාව උපදෙස් ලබාදී ඇති බව. | |
| (ඊ) | 2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි කිරීමේ පනතේ 9 වගන්තිය ප්‍රකාරව, ලියාපදිංචි පෞද්ගලික වෛද්‍ය ආයතන විසින් පවත්වා ගෙන යායුතු ප්‍රමිති සංවර්ධනය කිරීමට හා අධීක්ෂණය කිරීමට, දැනට පවත්වාගෙන යනු ලබන ප්‍රමිති ඇගයීමේ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට, සේවක පිරිස් බඳවා ගැනීම්වලදී අවම සුදුසුකම් අනුගමනය කරන බවට සහතිකවීමට හා සේවක පිරිස් පුහුණු කිරීමේදී අවම ප්‍රමිතීන් අනුගමනය කරන බවට වගබලා ගැනීමට සහ සපයනු ලබන රෝගීන් රැකබලා ගැනීමේ සේවාවල ගුණාත්මකභාවය තහවුරු කිරීමට හා කාර්යයන් ඉටුකිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් පිළියෙල කර ක්‍රියාත්මක කිරීමට අපොහොසත්වී තිබුණි. | පනතේ 9 වගන්තිය ප්‍රකාරව කටයුතු නිමකර ගැනීමට අපොහොසත්වී ඇති බැවින්, ඒ පිළිබඳව විශේෂ අවධානය යොමු කළ යුතුය. | ලියාපදිංචි පෞද්ගලික වෛද්‍ය ආයතන සඳහා මාර්ගෝපදේශ මේ වන විටත් පිළියෙල කර ඇති බව හා එය නුදුරු දිනකදීම ගැසට් කිරීමට බලාපොරොත්තු වන බව. | 2022 ජනවාරි 31 දින වන විටත් ලියාපදිංචි පෞද්ගලික වෛද්‍ය ආයතන සඳහා පිළියෙල කර ඇති මාර්ගෝපදේශ ගැසට් කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (උ) | 2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි කිරීමේ පනතේ 13(1) වගන්තිය ප්‍රකාරව, සභාවේ උපදෙස් මත ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින්, පෞද්ගලික වෛද්‍ය ආයතන සඳහා ප්‍රතීතනය කිරීමේ යෝජනා ක්‍රමයක් 2020 දෙසැම්බර් 31 දින දක්වා ක්‍රමවත්ව ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. | පෞද්ගලික වෛද්‍ය ආයතන ප්‍රතීතනය සඳහා යෝජනා ක්‍රමයක් ක්‍රමවත්ව දක්වා ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. | ප්‍රතීතනය යටතේ පෞද්ගලික රෝහල් ශ්‍රේණි ගත කිරීම මේ වන විටත් ආරම්භ කර ඇති බව හා නියාමන සභාව ස්ථාපිත කිරීමේ අරමුණු ඉටුකර ගැනීම සඳහා විධිමත් ක්‍රමවේදයක් පිළියෙළ කිරීම, පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචිය සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ සැකසීම හා ඒවා රෙගුලාසි බවට පත් කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ නීති අංශය හරහා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට යවා ඇති බව. | 2022 ජනවාරි 31 දින වන විටත් පෞද්ගලික වෛද්‍ය ආයතන සඳහා ප්‍රතීතනය කිරීමේ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඌ) | 2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි කිරීමේ පනතේ 18(2) උප වගන්තියේ (උ) ඡේදය ප්‍රකාරව, සම්බන්ධතාවක් දක්වන හෝ අතෘප්තියට පත් තැනැත්තකු විසින් යම් පෞද්ගලික වෛද්‍ය ආයතනයකට හෝ එයට සම්බන්ධ තැනැත්තෙකුට විරුද්ධව කරනු ලබන යම් පැමිණිල්ලක් භාර ගැනීමේදී හා එම පැමිණිල්ල අවසාන වශයෙන් බැහැර කිරීමේදී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටි හෝ පරිචයන් පිළිබද නියෝග පිළියෙල කිරීමට කටයුතු කර නොතිබුණි. | පැමිණිල්ලක් භාර ගැනීමේදී හා එම පැමිණිල්ල අවසාන වශයෙන් බැහැර කිරීමේදී අනුගමනය කළ යුතු කාර්යපටිපාටි හෝ පරිචයන් පිළිබද නියෝග පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. | පෞද්ගලික වෛද්‍ය ආයතනවලට එරෙහිව මහජනතාවගේ ගැටළු ඉදිරිපත් කිරීමට හැකි අතර ඒ සඳහා කටයුතු කිරීමට නිසි මාර්ගෝපදේශයක් පිළියෙල කර ඇති බව. | 2022 ජනවාරි 31 දින වන විටත් මෙම මාර්ගෝපදේශ අනුමත කර ක්‍රියාත්මක කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (එ) | ලියාපදිංචි විය යුතු නිශ්චිත කාල වකවානුවක් පනතේ හෝ නියමු උපදේශන මගින් සඳහන් කර නොතිබීම හේතුවෙන් වෛද්‍ය ආයතන ලියාපදිංචිය වෙනුවෙන් කවර දිනක හෝ මුදල් ලද පසු අදාළ වර්ෂය සඳහා ලියාපදිංචි සහතික නිකුත් කිරීම සිදු කර තිබුණු අතර දඩ මුදලක් අයකර නොතිබීම හේතුවෙන් වර්ෂය මුලදී සභාවට ලැබිය යුතු ආදායම ප්‍රමාදවී ලැබී තිබුණි. | පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි විය යුතු නිශ්චිත කාලවකවානුවක් තීරණය කර එම කාලවකවානුව තුළ ලියාපදිංචි නොවන ආයතන වලින් දඩ මුදලක් අය කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | ලියාපදිංචි කිරීමේදී සිදුවන ප්‍රායෝගික ගැටළු කිහිපයක් හඳුනාගෙන ඇති බව හා එම ගැටළු නිරාකරණය කර ගැනීමෙන් අනතුරුව, ඉදිරියේදී ප්‍රමාදවී ලියාපදිංචි වන ආයතනවලින් දඩ මුදලක් අයකර ගැනීමට බලාපොරොත්තු වන බව. | 2022 ජනවාරි 31 දින වන විටත් පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි විය යුතු නිශ්චිත කාලවකවානුවක් තීරණය කිරීමට හා ප්‍රමාද ගාස්තු අයකිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඒ) | 2018 වර්ෂයේදී පෞද්ගලික ආයතනයක් වෙත රු.2,070,000ක් ගෙවා, පෞද්ගලික අංශයේ රෝහල් හා ආයතනවල විශේෂඥ සේවා, වෛද්‍ය හා ශල්‍යකර්ම සඳහා නිශ්චිත පිරිවැය ක්‍රමයක් පිළයෙල කරවාගෙන ක්‍රියාත්මක කර තිබුණි. නමුත් ගාස්තු තීරණය කිරීමේදී පෞද්ගලික රෝහල්වල එකිනෙකට වෙනස් වූ ගුණාත්මක සාධක පිළිබඳව සැලකිල්ලට නොගෙන පොදු පදනමකින් උපරිම ගාස්තු පිළියෙල කර තිබුණු බවට චෝදනා කරමින් පෞද්ගලික රෝහල් 03 ක් විසින් 2018 ඔක්තෝබර් මාසයේදී සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යවරයා ඇතුළුව තවත් පාර්ශවයන් 08 කට එරෙහිව නඩු පවරා තිබුණි. | නඩුවෙහි තීරණයද සලකා බලා පෞද්ගලික අංශයේ රෝහල් හා ආයතනවල විශේෂඥ සේවා, වෛද්‍ය හා ශල්‍යකර්ම සඳහා නිශ්චිත පිරිවැය ක්‍රමයක් සාධාරණ පදනමකින් පිළියෙල කර ගැසට් කිරීමට කටයුතු කළ යුතුය. | සභාව විසින් ගන්නා ලද තීරණයකට අනුව, ජාත්‍යන්තර පිළිගැනීමක් ඇති ගිණුම්කරණ උපදේශන ආයතන 05 කින් ලද අයඳුම්පත් ඇගයීමෙන් අනතුරුව සුදුසු ආයතනය තෝරා ව්‍යාපෘතිය ආරම්භ කරන ලද බවත්, ව්‍යාපෘතිය අවසානයේ ලැබුණු දත්ත උපයෝගී කර ගනිමින් අමාත්‍යවරයාගේ අධීක්ෂණය මත පිළියෙල කර රෝහල් ගාස්තු ගැසට් කළ බවත් ඊට එරෙහිව පෞද්ගලික රෝහල් 09 ක් විසින් නඩු පවරා ඇති බවත්ය. | 2022 ජනවාරි 31 දින වන විටත් නඩුව අවසන්වී නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඔ) | පෞද්ගලික වෛද්‍ය ආයතනවල සේවක පිරිස් පුහුණු කිරීමට නියාමන සභාව වෙත පනතින් බලය ලැබී නොතිබුණු නමුත්, පෞද්ගලික රෝහල්වල සේවයේ නිරත හෙද නිලධාරීන් සඳහා Refresher Gap Filling Course නමින් පුහුණු වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට 2014 මැයි 30 දින පෞද්ගලික ආරෝග්‍යශාලා සහ සාත්තු නිවාස සංගමය සහ ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය හා එක්ව වර්ෂ 5 ක කාල සීමාවක් සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන් කර තිබුණු අතර එම පුහුණු වැඩසටහන සඳහා 2018, 2019 හා 2020 වර්ෂ තුන තුළදී වැය කර ඇති මුළු මුදල රු.2,965,182ක් විය. | පනත මගින් බලය ලැබී ඇති කටයුතු සඳහා පමණක් වියදම් කළ යුතුය. | පෞද්ගලික වෛද්‍ය ආයතන (ලියාපදිංචි කිරීමේ) පනතේ අරමුණු ප්‍රකාරව, පෞද්ගලික වෛද්‍ය ආයතන විසින් රෝගීන්ට ලබා දෙන සේවාවන්හි ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීම සිදුකළ යුතු බව සභාව විසින් හඳුනා ගෙන ඇති බව, ඒ අනුව එම ආයතනවල හෙද කාර්ය මණ්ඩල පුහුණුකර ප්‍රශස්ත සේවාවක් ලබාදීම සඳහා සභාවේ පූර්ණ අනුමැතිය සහිතව කටයුතු කර ඇති බව. | 2022 ජනවාරි 31 දින වන විට ගාස්තු අයකරගෙන මෙම පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කර තිබුණි. |
| (ඕ) | 2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි කිරීමේ පනතේ 6(1) වගන්තිය යටතේ පත් කරන ලද පාලක මණ්ඩලයට අමතරව සමාජිකයින් 10 දෙනෙකුගෙන් යුත් කාර්යාල කළමනාකරණ කමිටුවක් පත්කර තිබුණු අතර 2019 වර්ෂයේදී එම කමිටුවේ රැස්වීම් වාර 10 ක් පවත්වා තිබුණි. මෙම රැස්වීම් සඳහා සහභාගී වූ සමාජිකයින්ට විධිමත් | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. විධිමත් අනුමැතියකින් තොරව ගෙවා තිබුණු දීමනා ආපසු අය කළ යුතුය. | නියාමන සභාවේ සාමාජිකයන් රැස්වීම්වලට සහභාගීවීම නිමිත්තෙන් ගෙවනු ලබන පැමිණීමේ දීමනාව වැඩිකිරීම සඳහා 2018 ජූලි 12 දින පැවති කළමනාකරණ කමිටුවේ සහ 2018 අගෝස්තු 10 දින පැවති මාසික සමුළුවේදි අනුමැතිය ලැබී ඇති බව. | 2022 ජනවාරි 31 දින වන විටත් විධිමත් අනුමැතියකින් තොරව ගෙවා තිබුණු දීමනා ආපසු අයකර නොතිබුණු අතර එම දීමනාව තවදුරටත් ගෙවමින් පැවතුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | අනුමැතියකින් තොරව එක් රැස්වීම් වාරයක් සඳහා රු.5,000 බැගින් දීමනා ගෙවා තිබුණි. | | | |
| (ක) | නියාමන සභාව යටතේ ලියාපදිංචි කරන පෞද්ගලික වෛද්‍ය ආයතනවල ලියාපදිංචිය ප්‍රදර්ශනය කරමින් නාම පුවරු ගැසීම නියාමන සභාවේ කාර්යයක් නොවූවද, 2011 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා වූ වර්ෂ 10 කදී, අළුත් නාමපුවරු සකස් කිරීම හා පැරණි නාම පුවරු නැවත සැකසීම (Refill) සඳහා නියාමන සභාව විසින් රු.16,220,719ක් වැය කර තිබුණි. | පනත මගින් බලය ලැබී ඇති කටයුතු සඳහා පමණක් වියදම් කළ යුතුය. | අලුතින් ලියාපදිංචි වන පෞද්ගලික වෛද්‍ය ආයතන සඳහා නාම පුවරු සකස් කිරීම 2007 වර්ෂයේ සිට මේ වන තෙක් සිදුකෙරෙමින් පවතින බව හා එය ප්‍රදර්ශනය කිරීම මගින් ලියාපදිංචි පෞද්ගලික ආයතන මහජනතාවට හඳුනා ගැනීමට ඉඩ සලසා, එමගින් විශ්වාසය සුරක්ෂිත කිරීමට බලාපොරොත්තු වන බව. | 2022 ජනවාරි 31 දින වන විටත් මෙම තත්ත්වය නිවැරදි කර නොතිබුණි. |
| (ග) | නියාමන සභාව ආරම්භ කළ 2007 වර්ෂයේ සිටම සභාව සතු කාර්යභාරය හා එහි ප්‍රමාණය හඳුනාගෙන එයට ගැලපෙන ආකාරයට කාර්යය මණ්ඩලය අනුමත කරවා ගැනීමට හා බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසන් වන විට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව නිලධාරීන් 10 දෙනෙකු බඳවාගෙන තිබුණි. තවද ඉකුත් වර්ෂවලදී බාහිර පාර්ශවයක් වෙත රු.370,300 ක් ගෙවා පිළියෙල කරවා ගෙන තිබුණු | කාර්යය මණ්ඩලය අනුමත කරවා ගැනීමට හා ඒ අනුව බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. බඳවා ගැනීමේ පරිපාටිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමට කටයුතු කළ යුතුය. | ආරම්භයේ සිට නිලධාරීන් දෙදෙනෙකු පමණක් නියුතු ආයතනය විධිමත්ව පවත්වාගෙන යාමට වරින් වර නිසි ක්‍රමවේදයකට අනුව සේවකයින් බඳවා ගත් බව සහ ආයතනයේ කාර්යභාරය හඳුනාගෙන එයට ගැලපෙන ආකාරයට බඳවා ගැනීමේ පරිපාටිය පිළියෙල කරගත් නමුත් සභාව විසින් ගන්නා ලද ප්‍රතිපත්තිමය තීරණයක් මත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා නොගත් බව. | 2022 ජනවාරි 31 දින වන විටත් කාර්යය මණ්ඩලය අනුමත කරවා ගැනීමට හා ඒ අනුව බඳවා ගැනීමට සහ බඳවා ගැනීමේ පරිපාටිය සඳහා අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | බඳවා ගැනීමේ පරිපාටිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමට 2020 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | | | |
| (ච) | ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 133 සහ 2019 ජනවාරි 12 දිනැති අංක ඩීඑම්ජ්/1-2019 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව, නියාමන සභාව සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | විගණන කමිටුව සඳහා සාමාජිකයන් පත්කළ බව. | 2022 ජනවාරි 31 දින වන විටත් අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි. |
| (ඡ) | 2019 ජනවාරි 12 දිනැති අංක ඩීඑම්ජ්/1-2019 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව, කාර්තුවකට 01 බැගින් වර්ෂයකට විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් පැවැත්විය යුතු වුවද, නියාමන සභාව විසින් 2018, 2019 හා 2020 යන වර්ෂ 03 සඳහාම විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් කිසිවක් පවත්වා නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | විගණන කමිටුව සඳහා සාමාජිකයින් පත් කළ බව සහ ඉදිරියේදී විගණන කමිටු රැස්වීම් පැවැත්වීමට කටයුතු කරන බව | 2022 ජනවාරි 31 දින වන විටත් රැස්වීම් කිසිවක් පවත්වා නොතිබුණි. |
| (ට) | 2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද | අදාළ චක්‍රලේඛය හා තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර “2030 න්‍යාය පත්‍රය” පිළිබඳව | අදාළ චක්‍රලේඛය හා තිරසාර සංවර්ධනය පිළිබඳව ඒක්සත් ජාතීන්ගේ “2030 න්‍යාය පත්‍රය” පිළිබඳව නියාමන සභාව දැනුවත් වී නොතිබුණු | 2022 ජනවාරි 31 දින වන විටත් මේ සම්බන්ධයෙන් ක්‍රියාත්මකවී නොතිබුණි. |

| | | |
|---|---|---|
| චක්‍රලේඛය හා තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර "2030 න්‍යාය පත්‍රය" පිළිබඳව නියාමන සභාව විසින් දැනුවත් වී නොතිබීම හේතුවෙන් තම විෂය පථය යටතට වැටෙන කාර්යයන් සම්බන්ධයෙන් තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟාවිය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි. | නියාමන සභාව දැනුවත්වී තම විෂය පථය යටතට වැටෙන කාර්යයන් සම්බන්ධයෙන් තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟාවිය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනාගැනීමට කටයුතු කළ යුතුය. | බව හා ඉදිරියේදී අදාළ දර්ශකයන් හඳුනාගෙන කටයුතු කරන බව. |

## 45. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - තතත්ත්වාගණනය කළ මතය

2019 - අහිතකර මතය

2020 - තතත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතේ II වන කොටසේ 6.2(ඇ) වගන්තිය සහ මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශ ලේකම්ගේ 2018 ජුලි 05 දිනැති අංක 02/09/01/අමප/2018 දරන ලිපිය ප්‍රකාරව මාස ½ ක වැටුප පදනම් කරගෙන පාරිතෝෂික ගෙවිය යුතු වුවත් සම්පූර්ණ මාසයක වැටුප පදනම් කර ගැනීම නිසා 2016 - 2019 කාලය තුල සේවයෙන් ඉවත් වූ සේවකයන් 21 කට රු.8,352,114ක් වැඩිපුර ගෙවා තිබූ අතර පාරිතෝෂික ගෙවීම සඳහා සම්පූර්ණ මාසයක වැටුප මත පදනම්ව රු.159,753,034ක් ප්‍රතිපාදනය කර තිබුණි. වැඩිපුර ගෙවා ඇති පාරිතෝෂික ආපසු අයකර ගන්නා ලෙස රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් 2018 මැයි 10 දින දන්වා තිබුණ ද එම මුදල් ආපසු අයකරගෙනද නොතිබුණි. | පනතෙහි විධිවිධාන ප්‍රකාරව පාරිතෝෂික ගෙවීමට හා වැඩිපුර ගෙවීම් අයකර ගැනීමට කටයුතු කල යුතුය. | ක්‍රියාමාර්ග ගෙන නොමැත. | 2021 වර්ෂය දක්වාම එලෙස කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 1988 අංක 56 දරන පනතින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 V වගන්තිය ප්‍රකාරව පරිසර අමාත්‍යවරයා නිකුත් කල 1993 ජුනි 24 දිනැති අංක 772/22 දරන අති විශේෂ ගැසට් නිවේදනය ප්‍රකාරව පතල් හා ඛනිජ නිස්සාරණයේදී සමුච්චිත ප්‍රදේශය හෙක්ටයාර 10 ඉක්මවා පොළොව මතුපිට පතල් කැණීම් සිදු නොකල යුතු වුවද ඊට පටහැනිව හෙක්ටයාර 18 ක ප්‍රදේශයක ඛනිජ වැලි කැණීම සඳහා කැණීම් බලපත්‍රය නිකුත් කර තිබුණි. | ගැසට් නිවේදනය ප්‍රකාරව කටයුතු කල යුතුය. | ක්‍රියාමාර්ග ගෙන නොමැත. | - එම - |
| (ඇ) | 2002 අප්‍රේල් 19 දිනැති අංක 1232/14 දරන සහ 2017 නොවැම්බර් 17 දිනැති අංක 2045/56 දරන අති විශේෂ ගැසට් පත්‍රවල සඳහන් විදේශ විනිමය නියෝගය ප්‍රකාරව ශ්‍රී ලංකාව තුල පතල් කැණීම් සිදුකරන සමාගමක මුළු කොටස් අයිතියෙන් විදේශිය අයිතිය සියයට 40 ක ප්‍රතිශතයක් දක්වා විය යුතු අතර එම සීමාව ඉක්මවා විදේශීය අයිතිය පවතී නම් ලංකා ආයෝජන මණ්ඩලයේ විශේෂ අනුමැතියක් ලබාගත යුතු විය.<br>නමුත්, ශ්‍රී ලංකාව තුල මිනිරන් කැණීම් සිදුකරන බෝගල ග්‍රැපයිට් සමාගමේ මුළු කොටස් | ආයෝජන මණ්ඩලයේ විශේෂ අනුමැතිය ලබාගත යුතුය. | මේ සඳහා ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | මේ සඳහා ලංකා ආයෝජන මණ්ඩලයේ විශේෂ අනුමැතියක් ගෙන නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | අයිතියෙන් සියයට 89.91 ක්ම විදේශීය සමාගම් 02 කට අයත් වූ අතර මෙම සමාගම ලංකා ආයෝජන මණ්ඩලයෙන් එලෙස අනුමැතියක් ලබාගෙන හෝ එම මණ්ඩලය සමඟ ආයෝජන ගිවිසුමකට එළඹ නොතිබුණි. නමුත්, මේ පිළිබඳ නොසලකා මෙම සමාගමට මිනිරන් කැණීම් සඳහා කාර්යාංශය විසින් කැණීම් බලපත්‍ර 02 ක් නිකුත් කර තිබුණි. | | | |
| (ඈ) | මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ ප්‍රකාශනයක් ලෙස 2018 වර්ෂයේදී නිකුත් කරන ලද "ආර්ථිකය සරිකල හැකි ලාංකීය ඛනිජ සම්පත්" නැමැති ග්‍රන්ථයේ සඳහන් ආකාරයට වර්තමානයේදී ශ්‍රී ලංකාවට නැනෝ තාක්ෂණය හඳුන්වාදී ඇති බවත් මෙම නැනෝ තාක්ෂණය තුලින් මිනිරන් සඳහා අපරිමිත වටිනාකමක් ලබා දිය හැකි බවත් එහි සඳහන් වේ. එහි සඳහන් වන ආකාරයට නැනෝ තාක්ෂණය උපයෝගී කරගෙන සැකසූ ග්‍රැපීන් ග්‍රෑම් 01 ක් රු.150,000ක (කි.ග්‍රෑම්. 1 ක වටිනාකම රු.මි.150) තරම් ඉහල මිලක පවතින අතර බෝගල ග්‍රැපයිට් සමාගම විසින් කැණීම් කරන මිනිරන් නිමි හෝ අර්ධ නිමි | මිනිරන් ඉතා අඩු මුදලට අමුද්‍රව්‍යයක් ලෙස අපනයනය කිරීම වෙනුවට නැනෝ තාක්ෂණය භාවිත කර නිමි හෝ අර්ධ නිමි නිෂ්පාදනයන් ලෙස සකස් කර අපනයනය කිරීමට පියවර ගත යුතුය. | අගය එකතු කිරීමේ ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | මිනිරන් සඳහා අගය එකතු කිරීමක් සිදු නොකර අමුද්‍රව්‍යයක් ලෙස ටොන් 01 ක් ඉතා අඩු මුදලකට අමුද්‍රව්‍යයක් ලෙස අපනයනය කරමින් පැවතුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | නිෂ්පාදනයක් බවට පත් නොකර අමුද්‍රව්‍ය තත්ත්වයෙන් අපනයනය කිරීම හේතුවෙන් ශ්‍රී ලංකාවට ලැබිය යුතු විශාල ආදායමක් අහිමි වෙමින් පැවතුණි. සමාගම මගින් 2017 සිට 2019 අගෝස්තු දක්වා කාලය තුල කැණීම් කරන ලද මිනිරන් මෙ.ටො. 6,460.68 ක් අපනයනය කිරීමෙන් රු.මිලියන 1,747.21ක ආදායමක් ලබා තිබුණි. ඒ අනුව අගය එකතු කිරීමෙන් තොරව අමුද්‍රව්‍ය ලෙස මිනිරන් කිලෝ ග්‍රෑම් 01 ක් රු.270ක් වූ ඉතා අඩු මිලකට අපනයනය කර ඒ මත රාජ්‍යභාග ගෙවා තිබුණි. | | | |
| (ඉ) | මධ්‍යම පරිසර අධිකාරිය විසින් අදාල බෝගල ග්‍රැපයිට් සමාගම වෙත වර්ෂයක කාලයක් සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍රයක් නිකුත් කරන අතර එය වසරින් වසර දීර්ඝ කරනු ලැබේ. ඊට අමතරව පුරා විද්‍යා දෙපාර්තමේන්තුව විසින් ගලිගමුව ප්‍රාදේශීය ලේකම් වෙත අදාළ සමාගමට කැණීම් කිරීම සඳහා වාර්ෂිකව අළුත් කිරීමේ පදනම මත සිය නිර්දේශ ඉදිරිපත් කරන අතර ප්‍රාදේශීය ලේකම් විසින්ද කැණීම් බලපත්‍රය වර්ෂයකින් දීර්ඝ කිරීමට භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය වෙත සිය නිර්දේශ ඉදිරිපත් කරයි. ඒ | විවිධ ආයතනවල ඉල්ලීම් මත කැණීම් බලපත්‍ර වළංගු කාලය එකවර වසර ගණනාවකින් දීර්ඝ කිරීම් නොකල යුතුය. | ක්‍රියාමාර්ග ගෙන නොමැත. | 2022 පෙබරවාරි වන විටත් එම තත්ත්වයේම පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | අනුව කැණීම් බලපත්‍රයද වාර්ෂිකව අළුත් කල යුතු වුවත් සමාගම විසින් කරනු ලැබූ ඉල්ලීමක් මත කැණීම් බලපත්‍රයේ වළංගු කාල සීමාව 2018 නොවැම්බර් 02 සිට 2028 නොවැම්බර් 01 දක්වා වර්ෂ 10 කට දීර්ඝ කිරීම මතභේදයට තුඩු දී තිබුණි. | | | |
| (ඊ) | 2017 මැයි 22 දින අමාත්‍ය මණ්ඩලය සිදුකල දැනුම් දීම ප්‍රකාරව ඛනිජ සම්පත් පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කර අනුමැතිය ලබා ගැනීමට විගණන දින දක්වා කටයුතු කර නොතිබුණි. | අනුමැතියක් ලබාගෙන ප්‍රතිපත්තිය කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුය. | ඛනිජ සම්පත් පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කර පරිසර අමාත්‍යාංශය වෙත යොමුකර ඇත. | අනුමැතිය ලබා ගැනීමට 2021 වර්ෂයේදීද කටයුතු කර නොමැත. |
| (උ) | යාන්ඔය ජලාශ්‍ර ව්‍යාපෘතිය ඉදිකිරීම සඳහා භාවිත කල පස් කියුබ් 1,343,810ක් හා වැලි කියුබ් 3397 ක් සඳහා පිළිවෙලින් ලැබිය යුතු රු.26,876,200ක් සහ රු.543,490ක් වූ එකතුව රු.27,419,690ක් වූ රාජ්‍යභාගය කොන්ත්‍රාත් සමාගමෙන් 2021 වර්ෂය වන විටත් අයකරගෙන නොතිබුණි. | අදාළ රාජ්‍යභාග අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | මේ සම්බන්ධව කාර්යාංශය විසින් අදාළ සමාගම වෙත වාරිමාර්ග දෙපාර්තමේන්තුවටද පිටපතක් සහිතව අදාල හිඟ රාජ්‍ය භාග මුදල් ගෙවන ලෙස ලිපි කිහිපයක් සහ සිහිකැඳවීමේ ලිපි ද මේ වනවිට යවා ඇත. | 2022 ජනවාරි වන විටත් අදාල මුදල් අයකර නැත. |
| (ඌ) | 2009 අංක 66 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය (සංශෝධන) පනතේ 2(ඉ) වගන්තිය ප්‍රකාරව ඛනිජ සඳහා වටිනාකම් එකතු කිරීම සඳහා උපයෝගී කරගත යුතු පියවර කාර්යාංශය විසින් හඳුන්වාදී නොතිබීම හේතුවෙන් කැනීම් | කැණීම් කරන මිනිරන් ඛනිජ වැලි හා තිරුවානා අගය එකතු කර අපයනය කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. | ක්‍රියාමාර්ග ගෙන නොමැත. | 2022 පෙබරවාරි වන විටත් එම තත්ත්වයේම පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | කරන මිනිරන්, ඛනිජ වැලි හා තිරුවානා ඛනිජ සඳහා අගය එකතු කිරීමකින් තොරව අමුද්‍රව්‍ය ලෙස අපනයනය කෙරෙමින් පැවතුණි. | | | |
| (එ) | හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගොඩවැලි කැණීම සඳහා ලබාදුන් බලපත්‍ර 13 ක් පිළිබඳව කාර්යාංශයේ අධ්‍යක්ෂ (පතල් සුරක්ෂිතතා) විසින් සිදුකල පරීක්ෂාවේදී සියලුම බලපත්‍රවල සඳහන් කැණීම් ප්‍රදේශ, ගැඹුරු ඉක්මවා කැණීම් කර ඇති බවත් කාර්යාංශයට රාජ්‍යභාග ආදායම අඩුවෙන් අයව ඇති බවත් බලපත්‍ර සඳහා අයකර ගන්නා බැංකු ඇපකර ප්‍රමාණවත් නොවන බැවින් එය ඉහළ දැමිය යුතු බවටත් නිරීක්ෂණය කර තිබුණද ඒ පිළිබඳව කටයුතු 2021 වර්ෂයේදීද සිදුකර නොතිබුණි. | කැණීම් භූමි පුනරුත්ථාපනය කිරීමට යන වියදමට ආසන්න මුදලක් බැංකු ඇපකර ලෙස අයකර ගත යුතුය. එමෙන්ම කැණීම් භූමි නිරන්තරව පරීක්ෂා කර ඒවා කැණීම්කරු ලවා පුනරුත්ථාපනය කරවීමට කටයුතු කල යුතුය. | බැංකු ඇපකර ඉහළ නැංවීම සම්බන්ධව අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස අදාල අංශ වෙත උපදෙස් දී ඇත. | මේ වනවිට කාර්යාංශය, බැංකු ඇපකර භාවිතා කරමින් අදාල කැනීම් කරනු ලැබූ ස්ථාන පුනරුත්ථාපනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකිරීම සම්බන්ධව අදාල අංශ වෙත උපදෙස් ලබාදී ඇතත් නිරීක්ෂණයේ පෙන්වා දි තිබූ කරුණු සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ඒ) | අනුරාධපුර දිස්ත්‍රික් ලේකම්ට අයත් ඉඩමක් විධිමත්ව පවරා ගැනීමකින් තොරව එහි ප්‍රාදේශීය කාර්යාලය ඉදිකිරීම සඳහා 2014 සහ 2020 වර්ෂවල පිළිවෙලින් රු.3,914,563ක් හා රු.12,225,173ක වියදමක් දරා තිබුණි. | ඉදිරියේදී මෙවැනි ගොඩනැගිලි ඉදි කිරීමේදී ඉඩම විධිමත්ව පවරාගෙන ගොඩනැගිලි ඉදිකිරීමට කටයුතු කල යුතුය. | ක්‍රියාමාර්ග ගෙන නොමැත. | 2022 පෙබරවාරි වන විටත් එම තත්ත්වයේම පවතී. |
| (ඔ) | පිටකෝට්ටේ පිහිටි භූමියේ රු.585,147,480 ක වියදමින් භූ කම්පන සහ සුනාමි නිරීක්ෂණ මධ්‍යස්ථානය සහ විද්‍යාගාර | ඉඩම් නීත්‍යානුකූලව කාර්යාංශය වෙත පවරා ගැනිම ඉක්මනින් කළ යුතුය. කොන්ත්‍රාත්තුවේ | ක්‍රියාමාර්ග ගෙන නොමැත. | 2022 පෙබරවාරි වන විටත් එම තත්ත්වයේම පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | ගොඩනැගිල්ලක් ඉදිකරමින් පැවතුනද ඊට අදාළ ඉඩම පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද, කොන්ත්‍රාත්තුවේ ඉදිකිරීම් සඳහා වැයවන රු.383,193,671ක් සඳහා පමණක් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබූ අතර කොන්ත්‍රාත්තුවේ හදිසි අවශ්‍යතා සහ වෙනත් වැය සඳහා දැරිය යුතු එකතු වටිනාකම වූ රු.201,953,810ක් සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි. | සහ වෙනත් හදිසි අවශ්‍යතා සඳහා දැරිය යුතු රු.201,953,810 ක වියදම් දැරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගත යුතුය. | | |
| (ඕ) | 1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත 52(2) වගන්තිය හා 1997 ජනවාරි 10 දිනැති අංක 958 දරන ගැසට්පත්‍රය මගින් සංශෝධිත 21(අ) වැනි පතල් හා කැණීම් නියෝගය ප්‍රකාරව කැණීම්වලින් අනතුරුව ඉඩම් පුනරුත්ථාපනය කිරීමට කටයුතු කළ යුතුය. එසේ වුවද මාස 2 සිට වර්ෂ 09 ක් දක්වා කාලයක් ගතවී තිබුණු, කාර්මික කැණීම් බලපත්‍රලාභීන් 874 දෙනෙකු ලවා එම කාර්ය ඉටුකර ගැනීමට කටයුතු කර නොතිබුණි. එසේම ඉහත බලපත්‍රලාභීන්ගෙන් ලබාගෙන තිබූ වටිනාකම රු.156,275,430ක් වූ බැංකු ඇපකර මුදල් කරගෙන | විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. | පුනරුත්ථාපනය කරවීමට කටයුතු නොකළ මුදල් කර ගත් බැංකු ඇපකර බලපත්‍රලාභියාගේ කාර්මික කැණීම් පුනරුත්ථාපනය කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | තිබුණද, එම මුදල් භූමි පුනරුත්ථාපන කටයුතු සඳහා භාවිතා නොකර ගෙවිය යුතු ශේෂයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි . | | | |
| (ක) | කාර්යාංශයේ කාර්යභාරය පිළිබඳ මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහනක් සඳහා 2014 වර්ෂයේ සභාපතිවරයා වෙත රු.1,500,000ක අත්තිකාරම් මුදලක් නිකුත් කර තිබූ අතර ඊට අදාල කාර්ය ඉටු කර හෝ අත්තිකාරම් මුදල පියවා හෝ නොතිබුණි. | අත්තිකාරම් පියවීමට කටයුතු කල යුතුය. | ක්‍රියාමාර්ග ගෙන නොමැත. | 2022 පෙබරවාරි වන විටත් අත්තිකාරම් පියවාගෙන නොතිබුණි. |
| (ග) | ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ 31.11 හා 31.15 වගන්ති ප්‍රකාරව සාපරාධී චෝදනා යටතේ 2017 අගෝස්තු 17 දින සිට වැඩ තහනමට ලක් කර තිබූ නිලධාරීන් දෙදෙනෙකුට එරෙහිව විනය පරීක්ෂණ ආරම්භ කර තිබූ අතර වැඩ තහනම් කර තිබූ කාල සීමාවට අදාලව රු.1,386,394ක අඩ වැටුප් හා එක් නිලධාරියෙකුට රු.184,113ක වෘත්තීය දීමනා රු.505,485ක දිරිදීමනා හා ප්‍රසාද දීමනා ද ගෙවා තිබුණි. මෙම නිලධාරීන් විනය පරීක්ෂණ නියෝගයක් රහිතව 2019 අගෝස්තු 15 සිට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් මත නැවත සේවයේ පිහිටුවා තිබුණි. | විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතු අතර නීතිරීති වලට පටහැනි ගෙවීම් අයකර ගැනීමට කටයුතු කල යුතුය. | ක්‍රියාමාර්ග ගෙන නොමැත. | 2022 පෙබරවාරි වන විටත් විනය පරීක්ෂණ තීරණයක් ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඡ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.3 ඡේදයේ ගෙවියයුතු උපරිම දිරිදීමනාව/ ප්‍රසාද දීමනාව මාස 02 ක දළ වැටුප වුවත් ඊට පටහැනිව මාස 08 ක වැටුපට සමාන දිරිදීමනාවක් භාණ්ඩාගාර අනුමැතියකින් තොරව සේවකයන්ට ගෙවා තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ක්‍රියාමාර්ග ගෙන නොමැත. | 2021 වර්ෂයේදීද චක්‍රලේඛයට පටහැනිව ප්‍රසාද දීමනා ගෙවා තිබුණි. |
| (ප) | කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ 2016 දෙසැම්බර් 23 දිනැති අංක ඩීඑම්එස්/1625 – Vol II දරන ලිපියේ ජීඑස්එම්බී තාක්ෂණ සේවා සමාගමෙන් සේවකයන් ලබා ගැනීමේ ගිවිසුමේ අදාල කොන්දේසි ඇතුලත්ව නොතිබියදී එම සේවකයන්ට රු.3,657,843ක දිරිදීමනා ගෙවා තිබුණි. | විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. | ක්‍රියාමාර්ග ගෙන නොමැත. | 2021 වර්ෂයේදීද ගිවිසුම් කොන්දේසි නොමැතිව ගෙවීම් කර තිබුණි. |
| (බ) | 2017, 2018 වර්ෂවල අනුරාධපුර දිස්ත්‍රික්කයේ සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් භාවිතා කර තිබූ බොරළු කියුබ් 210,666 ක් වෙනුවෙන් අයකල යුතු රාජ්‍යභාග රු.4,213,320ක් අයකරගෙන නොතිබුණි. | අදාල රාජ්‍යභාග මුදල් අයකර ගැනීමට කටයුතු කල යුතුය. | ක්‍රියාමාර්ග ගෙන නොමැත. | 2022 පෙබරවාරි වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ත) | වර්ෂ 3 කට පෙර ක්ෂේත්‍ර පරීක්ෂකවරුන්ගේ කාර්ය අධීක්ෂණය කිරීම සඳහා රු.1,176,552ක් වැයකර මිලදීගත් ක්ෂේත්‍ර පරීක්ෂණ අධීක්ෂණ පද්ධතිය ක්‍රියාත්මක | අධීක්ෂණයන් සිදුකර වාර්තා ලබාදීමට කටයුතු කළ යුතුයි. | සමාගම දත්ත යාවත්කාලින කරන ලෙස පද්ධතිය සකස් කල සමාගමට දන්වා තිබුණි. | අධීක්ෂණයක් සිදුකර වාර්තා ලබාදි නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | කිරීමේදී ඇතිව තිබූ තාක්ෂණික දෝෂ නිවැරදි කරගෙන නොතිබූ අතර පද්ධතිය තුලින් අපේක්ෂිත අධීක්ෂණයද නිසි පරිදි සිදුකර නොතිබුණි. | | | |
| (ද) | ප්‍රමාණවත් මූල්‍ය ශක්‍යතාවයක් නොමැති සමාගමකට 1993 අංක 1 දරන පතල් කැණීම් (බලපත්‍ර දීමේ) නියෝගවල අංක 4(1) නියෝගයට පටහැනිව කරස්නාගල මිනිරන් පතල් ව්‍යාපෘතිය සඳහා ගවේෂණ බලපත්‍රය හා කැණීම් බලපත්‍රය ලබාදී තිබුණි. ඉහත කැණීම් බලපත්‍රය ලබාදීමේදී හා ගවේෂණ බලපත්‍රය අලුත් කිරීමේදී 2017 නොවැම්බර් 17 දිනැති අංක 2045/56 දරන විදේශ විනිමය නියෝගය ප්‍රකාර ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ සමාගමේ පවතින ගිවිසුම පරීක්ෂා කර නොතිබුණි. | විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | අදාල සමාගම 2017, 2018, 2019 සහ 2020 වර්ෂ සඳහා ගවේෂණ බලපත්‍රවලට අදාලව වාර්ෂික වාර්තා ඉදිරිපත් කර තිබුණි. බලපත්‍ර නිකුත්කරන ලද අවස්ථාවේ මෙම සමාගම ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අනුමැතිය ලබා තිබූ අතර, ආයෝජන මණ්ඩලයේ වලංගුභාවය තවදුරටත් පවතීද යන්න පරීක්ෂා කිරීම සඳහා ආයෝජන මණ්ඩලය වෙත ලිපියක් යොමුකිරීමට කටයුතු කර ඇත. | 2012 වර්ෂයේ සමාගම සහ ආයෝජන මණ්ඩලය අතර ගිවිසුමකට එළඹ තිබුණත් අදාල කාලසීමාව තුල ව්‍යාපෘති නිම කිරීමට අපොහොසත් විම මත වරින් වර ගිවිසුම් දීර්ඝ කර තිබූ අතර ගිවිසුම අවලංගු කරන බවටද දක්වා තිබුණි. කැණීම් බලපත්‍ර හා ගවේෂණ බලපත්‍ර අළුත් කිරීමේදී ගිවිසුමේ ක්‍රියාත්මකභාවය පිළිබඳව ආයෝජන මණ්ඩලයෙන් තහවුරුවක් ලබා ගැනීමට කාර්යාංශය කටයුතු කර නොතිබුණි. කහටගහ පතල කැණීම් කිරීමේදී පවතින අඩුපාඩු පිළිබඳව වරින් වර වාර්තා මගින් පෙන්වා දී තිබුණද එම අඩුපාඩු සකස් කරගෙන නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| (න) | 1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනතේ 44(ඉ) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකාවේ ඛනිජ ද්‍රව්‍ය සම්පත්වලට අදාල දත්ත එක්රැස් කිරීමේ, සකස් කිරීමේ, විශ්ලේෂණය කිරීමේ හා පල කිරීමේ බලතල කාර්යාංශයට පැවරි තිබුණද ඒ සඳහා වූ විධිමත් ක්‍රමවේදයක් හෝ වගකීම් පැවරීමක් නොවුණි. | පනතෙහි විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. | ක්‍රියාමාර්ග ගෙන නොමැත. | 2015 වර්ෂය දක්වා පමණක් වාර්ෂික ඛනිජ වාර්තා සකස් කර ඇත. |
| (ම) | කළුගල් කැණීම් ප්‍රමාණය හඳුනාගැනීමට විද්‍යාත්මක ක්‍රමවේදයක් අනුගමනය නොකර භාවිත කරන පුපුරණ ද්‍රව්‍ය ප්‍රමාණය මෙන් දෙගුණයක් කැණීම් ප්‍රමාණය ලෙස සලකා රාජ්‍යභාග අයකර තිබීම හේතුවෙන් රාජ්‍යභාග අඩුවෙන් අයවී තිබුණි. 2016, 2017 හා 2018 වර්ෂවල කළුගල් සඳහා කැණීම් බලපත්‍රවල සඳහන් අනුමත ප්‍රමාණයෙන් ද සියයට 65 ක් එනම්, රු.1,427,174,239ක් අඩුවෙන් රාජ්‍යභාග අයවී තිබුණි. | විද්‍යාත්මක ක්‍රමවේදයක් කඩිනමින් සකස් කල යුතුය. | කාර්යාංශය විසින් සත්‍ය වශයෙන් කැණීම් සඳහා යොදාගන්නා ප්‍රමාණයට සාපේක්ෂව භාවිතාකරන පුපුරණ ද්‍රව්‍ය ප්‍රමාණය සම්බන්ධව විශ්ලේෂණය කර ක්‍රමවේදයක් මේ වන විට සකස් කර ඇති අතර, ඒ ආශ්‍රයෙන් රාජ්‍ය භාගය ගණනය කිරීමට මේ වනවිට පියවර ගෙන ඇත. | නවීන තාක්ෂණ ක්‍රමවේද ඔස්සේ කැනීම් කරනු ලබන ප්‍රමාණය ගණනය කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කර නොමැත. |
| (ස) | ඛනිජ වැලි කැණීමට ලංකා ඛනිජ වැලි සමාගම වෙත පුල්මුඩේ, තෙවික්කාලු හා කොඩුවාකට්ටු යන ප්‍රදේශවල වර්ෂ 09 මාස 6 ක කාලයක් සඳහා කැණීම් බලපත්‍ර 03 ක් ද, පුද්ගලික ආයතන 2 ක් වෙත | බලපත්‍ර කොන්දේසි උල්ලංඝනය හා බලපත්‍ර රහිතව කරන ලද කැණීම් සම්බන්ධව නීතිමය පියවර ගත යුතුය. | ඛනිජ වැලි සමාගම විසින් අනුමත ප්‍රදේශයන් ඉක්මවා සිදු කර ඇති කැනීම් සම්බන්ධයෙන් ඔවුන්ට අවවාද සිදු කර ඇති අතර, එම ප්‍රදේශය වෙරළ සංරක්ෂණ කලාපයෙන් පරිභාහිර | බලපත්‍ර කොන්දේසි උල්ලංඝනය හා බලපත්‍ර රහිතව කරන ලද කැණීම් සම්බන්ධයෙන් නීතිමය පියවර ගෙන නොතිබුණි. |

සාම්පූර්, පාලච්චෙනෙයි සහ වෙරුගල් යන ප්‍රදේශවල වර්ෂ 10 ක ක කාලයක් සඳහා බලපත්‍ර 3 ක් ද ලබාදී තිබීම හේතුවෙන් වාර්ෂිකව ලබාගත යුතු වෙරළ සංරක්ෂණ, නාගරික සංවර්ධන හා ප්‍රාදේශීය පරිපාලන ආයතන අනුමැතීන් ලබාගෙන නොතිබු අතර ඒ මගින් සිදුවිය යුතු නියාමනය සිදුවී නොතිබුණි. ලංකා ඛනිජ වැලි සමාගම බලපත්‍ර කොන්දේසි උල්ලංඝණය වන ආකාරයට හා අනුමත භූමි ප්‍රමාණයන්ද ඉක්මවා කැණීම් කර තිබුණද ඒ සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. පෞද්ගලික පාර්ශවයන් 03 ක් වෙනත් ඉඩම්වලින් ඛනිජ වැලි මෙට්‍රික් ටොන් 142,486ක් බලපත්‍ර රහිතව කැණීම් කර ලංකා ඛනිජ වැලි සමාගමට අලෙවි කිරීම සම්බන්ධයෙන් නීතිමය පියවර ගෙන නොතිබුණි. 2017 නොවැම්බර් 17 දිනැති අංක 2045/56 දරන ගැසට් නිවේදනය ප්‍රකාරව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ව්‍යාපෘති ගිවිසුමකට එළඹ නොතිබූ සියයට 75 ක අයිතිය විදේශිකයන්ට අයත්ව තිබූ සමාගමකට ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ සාම්පූර් ප්‍රදේශයේ ඛනිජ වැලි කැණීම සඳහා බලපත්‍රයක් නිකුත් කර තිබුණි.

ප්‍රදේශයක් වන බැවින්, ඒ සඳහා වෙනම බලපත්‍රයක් අයදුම් කරන ලෙසට අයදුම්කරු වෙත උපදෙස් ලබා දී ඇත.

| | | | | |
|---|---|---|---|---|
| (ම) | ඛනිජවැලි අපනයනයේදී 2013 ඔක්තෝම්බර් 23 දිනැති 18/33/11 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් සංශෝධිත පතල් කැණීම් නියෝග 33 ප්‍රකාරව FOB වටිනාකම මත රාජ්‍යභාග අයකර ගැනීම වෙනුවට ඛනිජවැලි දේශීයව අලෙවි කල වටිනාකමට දේශීය ප්‍රවාහන ගාස්තු එකතු කර සකස් කල මිලක් පදනම් කරගෙන තිබීම නිසා අඩු වටිනාකමක් මත රාජ්‍යභාග අයවී තිබුණි. මේ හේතුවෙන් ශ්‍රී ලංකා රේගුවද අපනයන වටිනාකම ලෙස එම සකස් කල මිල පදනම් කරගෙන තිබූ අතර රේගු බදු ද අඩුවෙන් අයකර තිබුණි. | පතල් හා කැණීම් නියෝගය ප්‍රකාරව රාජ්‍යභාග අයකල යුතුය. | ක්‍රියාමාර්ග ගෙන නොමැත. | 2022 පෙබරවාරි වන විටත් එම තත්ත්වයේම පවතී. |
| (ය) | කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාලය පවත්වාගෙන යාම සඳහා අවශ්‍යතාවය පිළිබඳ නොසලකා රු.28,000,000ක් වැයකර ඉඩමක් හා ගොඩනැගිල්ලක් මිලදී ගෙන තිබුණි. මෙකී ගොඩනැගිල්ල අදාල කාර්ය සඳහා භාවිතා කිරීමට සුදුසු නොවීම හේතුවෙන් කාර්යාලය රු.90,000ක මාසික කුලියක් යටතේ පවත්වාගෙන ගොස් රු.1,080,000ක් අතිරේකව වැයකර තිබුණි. | අවශ්‍යතාවය නිසි ලෙස හඳුනා ගැනීමෙන් අනතුරුව ගනුදෙනුවලට එළඹිය යුතුය. | බලපත්‍ර නිකුත් කිරීමේ අංශය පමණක් ස්ථාපිත කර ඇත. | බලපත්‍ර නිකුත් කිරීමේ අංශය හැර ඉතිරි මෙහෙයුම් කටයුතු මෙම ගොඩනැගිල්ලේ සිදු නොවේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ර) | කාර්යාංශයේ අනුමත කාර්ය මණ්ඩලය 510 ක් වූ අතර තථ්‍ය කාර්ය මණ්ඩලය 701 ක් වීමෙන් තනතුරු 14 ක අතිරික්ත කාර්ය මණ්ඩලය 233 ක් වූ අතර තනතුරු 34 ක පුරප්පාඩු 42 ක් විය. අතිරික්ත කාර්ය මණ්ඩලය අවශ්‍යතා ඇගයීමකින් තොරව සේවයේ යොදවා ගෙන තිබුණි. ඉහල කළමනාකරණ මට්ටමේ තනතුරු 17 ක කිසිඳු ස්ථිර සේවකයෙකු නොසිටි අතර පුරප්පාඩු 22 ක් විය. අනුමත නොවූ තනතුරු 8 ක් සඳහා සේවකයින් 09 ක් බඳවාගෙන තිබුණි. | අවශ්‍යතාවය අනුව තනතුරු සඳහා බඳවා ගැනීම් කල යුතුය. | ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 2022 පෙබරවාරි වන විටත් එම තත්ත්වයේම පවතී. |
| (ල) | කළුගල් නිෂ්පාදන ප්‍රවාහනය සඳහා බලපත්‍ර ලබාදීමේ ක්‍රමවේදයක් සකස්කර නොතිබුණි. | කළුගල් නිෂ්පාදන ප්‍රවාහනය සඳහා බලපත්‍ර ලබාදීමේ ක්‍රමවේදයක් සකස් කළ යුතුය. | බලපත්‍ර ලබා දීමේ ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. | ප්‍රවාහන බලපත්‍ර ලබාදීමේ ක්‍රමවේදයක් 2021 වර්ෂයේදීද සකස් කර නොමැත. |
| (ව) | 2018 අප්‍රේල් 05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව තිරුවානා උපරිම වශයෙන් අගය එකතු කිරීමෙන් පසුව අපනයනය කල යුතු වුවත් දිස්ත්‍රික්ක 9 ක පුද්ගලයන් 29 ක් වෙත නිකුත් කර තිබූ කැණීම් බලපත්‍ර මත කැණීම් කරනු ලබන තිරුවානා අගය එකතු කිරීමකින් තොරව අපනයනය කරමින් පැවතුණි. එසේම වැල්ලවාය කොටිකම්බොක්ක ප්‍රදේශයේ තිරුවානා කැණීම් කිරීමට | විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | කොටිකම්බොක්ක ප්‍රදේශයේ ඛනිජ කැණීම් සම්බන්ධව නිකුත් කර ඇති බලපත්‍රය කනිනු ලබන ඛනිජ ප්‍රමාණය හා අදාල කැනීම් භූමිය සම්බන්ධව අධිකරණයේ නඩුවක් විභාග වෙමින් පවතී. | කැණීම් කරන තිරුවානා කැණීම්කරුවන් විසින් විවිධ සමාගම් වලට විකුණන අතර එම සමාගම් මෙම තිරුවානා අපනයනය කරමින් පැවතුණි. කැණීම් කර සමාගම් වලට තිරුවානා විකුණුමේදි විකුණුම් මිල මත සියයට 7 ක රාජ්‍යභාගයක් කැණීම් බලපත්‍ර හිමියන් විසින් |

ලබාදී තිබූ බලපත්‍ර 3 කින් කැණීම් කල හැකි ප්‍රමාණය ඉක්මවා කියුබ් 10,914ක් කැණීම් කර තිබූ අතර වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් භූමිය හා ඊට යාබද පුද්ගලික ඉඩමකින් කැණීම් කරගත් තිරුවානා කියුබ් 22,094 ක් වෙනුවෙන් අයවිය යුතු රාජ්‍යභාග මුදල බලපත්‍රලාභීන්ගෙන් අයකරගෙන නොතිබුණි.

ගෙවිය යුතු වුවත් එය ගෙවා නොතිබුණි. කැණීම්කරුවන් සමාගමට විකුණුම් මිල අපනයන මිලෙන් අඩුකර ඉතිරි ප්‍රමාණයට පමණක් අපනයන සමාගම් සියයට 7 ක රාජ්‍යභාග ගෙවිය යුතු වුවත් මෙහිදි අපනයන වටිනාකමෙන් සියයට 7 ක රාජ්‍යභාගය අපනයන සමාගම පමණක් ගෙවා තිබුණි.

## 46. මධ්‍යම පරිසර අධිකාරිය

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - තතත්ත්වාගණනය කළ මතය

2019 - තතත්ත්වාගණනය කළ මතය

2020 - තතත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | අපද්‍රව්‍ය කළමනාකරණය විධිමත් කිරීම, කසළ, පිළිසකර නොකළ මල හා විෂ රසායනික ද්‍රව්‍ය බැහැර කිරීම වැලැක්වීම අපද්‍රව්‍ය කළමනාකරණ තුළින් ඇතිවන අතුරු ඵලයක් වන කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය තුළින් රසායනික පොහොර භාවිතය අවම කිරීම පිළිබඳව ප්‍රමුඛතාවය ලබාදීම, නාගරික කසල කළමනාකරණ වැඩසටහන් ක්‍රියාවට නැංවීම හා නියාමනය, පොදු ප්‍රවාහන පද්ධතීන් ක්‍රියාත්මක කිරීමේදී ඇති පාරිසරික බලපෑම් නියාමනය කිරීම හා පසුභාවිත ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණ ජාතික ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම යන අරමුණුගත කාර්යයන් ඉටු කිරීමට අධිකාරියේ අවධානය යොමුකර නොතිබුණි. | පනත අනුව අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | අපද්‍රව්‍ය කළමණාකරණය විධිමත් කිරීම, කසළ, පිළිසකර නොකර මල හා විෂ රසායනික ද්‍රව්‍ය බැහැර කිරීම වැලැක්වීම, නාගරික කසල කළමණාකරණ වැඩසටහන් ක්‍රියාවට නැංවීම හා නියාමනය හා පසුභාවිත ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමණාකරණ ජාතික ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා කාර්යයන්ට අදාලව ක්‍රියාමාර්ග ගෙන තිබුණි. | පනතේ බලතල අනුව ඉටුකළ යුතු කාර්යයන් සඳහා ක්‍රියාමාර්ග ගෙන තිබුණද ක්‍රියාත්මක වීම් පිළිබඳ පසු විපරම ප්‍රමාණවත් නොවන බැවින් තවදුරටත් මෙම කාර්යයන් සම්බන්ධ ගැටළු පවතින බව නිරික්ෂණය විය. |
| (ආ) | දිවයින පුරා පවතින විදුලි සංදේශන, ගුවන් විදුලි හා රූපවාහිනි සේවා සඳහා පහසුකම් සපයන සම්ප්‍රේෂණ කුළුණු සංඛ්‍යාව 9291ක් වුවද බලපත්‍ර ලබාගෙන ක්‍රියාත්මක | අවශ්‍ය පියවර කඩිනම් කළ යුතුය. | විගණන වාර්තාවට අනුව දිවයින පුරා විදුලි සංදේශ කුළුණු සංඛ්‍යාව 9291ක් වුවද, විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තොරතුරු අනුව | තොරතුරු නිවැරදිව විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. බලපත්‍ර ලබාගත යුතු කුළුණු සඳහා බලපත්‍ර නිකුත් |

| | | | | |
|---|---|---|---|---|
| | වන කුළුණු සංඛ්‍යාව 3,561ක් විය. ඉන් කුළුණු 5,730ක් සඳහා බලපත්‍ර ලබාගෙන නොතිබූ අතර එය ප්‍රතිශතයක් ලෙස සියයට 62 ක් විය. | | දිවයින පුරා පවතින විදුලි සංදේශ කුළුණු සංඛ්‍යාව 9129ක් වේ. මධ්‍යම පරිසර අධිකාරියේ දත්ත ගොනුවේ ඇතුළත් මුළු කුළුණු සංඛ්‍යාව 4916 සඳහා තොරතුරු විමර්ශණයට මධ්‍යම පරිසර අධිකාරියේ පළාත් සහ දිස්ත්‍රික් කාර්යාල වෙත උපදෙස් ලබා දීම. | කර නොතිබුණි. |
| (ඇ) | වෛද්‍ය රසායනාගාර වාර්තා හා පර්යේෂණ මධ්‍යස්ථානද ඇතුළුව සෞඛ්‍ය සේවා ආයතනවලින් ජනනය වන ජෛව වෛද්‍ය හා සෞඛ්‍ය සේවා අපද්‍රව්‍ය බැහැරලීම සිදුකරන ආයතන අපද්‍රව්‍ය කළමනාකරණ සඳහා වූ බලපත්‍ර ගත යුතු වුවද සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන රෝහල් 613 කින් බලපත්‍ර ලබාගෙන තිබුණේ රෝහල් 60 ක් පමණි. | නීතිමය කටයුතු කඩිනම් කළ යුතුය. | පරිසර අමාත්‍යාංශයේ ලේකම් මගින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත සියළුම රජයේ රෝහල් සඳහා උපලේඛනගත අපද්‍රව්‍ය කළමනාකරණ බලපත්‍ර ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සලසන ලෙසට දන්වා ඇති අතර උපලේඛනගත අපද්‍රව්‍ය කළමනාකරණ බලපත්‍ර ලබා ගන්නා ලෙසට සියළුම රෝහල් වෙත ද, අදාළ අයදුම්පත ද සමග දැනුම් දීම. | 2022 ජනවාරි වනවිටත් රෝහල් විසින් බලපත්‍ර ලබාගැනීම අවම මට්ටමක පැවතුණි. පසුවිපරම තවදුරටත් අධිකාරිය විසින් සිදුකළ යුතු වුවත් එසේ කර නොතිබුණි. |
| (ඇ) | ජේළුම් 12 කාණ්ඩයට අන්තර්ගතව තිබියදී නිලධාරින් 106 දෙනෙකු සඳහා නිවැරදි වැටුප් පියවරයන්හී නොතිබීම හේතුවෙන් හිඟ වැටුප් ලෙස රු.6,376,837ක් ගෙවා තිබුණි. | කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | මේ සම්බන්ධයෙන් වැඩිදුර සාකච්ඡා කිරීම සඳහා ජාතික වැටුප් කොමිෂන් සභාවෙන් දිනයක් හා වේලාවක් ඉල්ලා 2021.03.18 දිනැතිව පරිසර අමාත්‍යාංශය හරහා ලිපියක් යොමු කර ඇත. මෙතෙක් ඒ සඳහා පිළිතුරක් හෝ දිනයක් හා වේලාවක් ලබා දී නොමැත. | 2022 ජනවාරි 26 දින දක්වා වැඩිපුර ගෙවීම් නැවත අයකරගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | අධිකාරියට අයත් නොවන ඉඩමක ඉදිකර ඇති රංදෙනිය සොබාකෙත මධ්‍යස්ථාන ගොඩනැගිල්ල අළුත්වැඩියාව සඳහා රු.2,141,641ක් සමාලෝචිත වර්ෂයේ වැය කර තිබුණද එම ඉඩම පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පවරා ගැනීමේ කටයුතු කඩිනම් කළ යුතුය. | රන්දෙනිය සොබාකෙත මධ්‍යස්ථාන ඉඩමේ අයිතිය මධ්‍යම පරිසර අධිකාරිය වෙත පවරා ගැනීමට කටයුතු සිදු කරමින් පවතී. | 2022 ජනවාරි වන විටත් මෙම ව්‍යාපෘති ස්ථානය පවරාගැනීමට කටයුතුකර නොතිබුණි. |
| (ඊ) | 2017 වර්ෂයේදී ආරම්භ කර තිබුණු ජාතික පාරිසරික පනත සංශෝධනය කිරීමේ කටයුතු 2021 වර්ෂයේදීද අවසන් වී නොතිබුණි. | පනත සංශෝධනය කර සම්මත කර ගැනීම කඩිනම් කල යුතුය. | ජාතික පාරිසරික පනත සංශෝධනය සඳහා 2021 ජුනි මස කැබිනට් අනුමැතිය ලැබුනු අතර, එහිදී කැබිනට් අනුමැතිය නොලද ප්‍රතිපාදන කීපයක් වැඩිදුර පැහැදිලි කිරීම් සහිතව නැවත කැබිනට් අනුමැතිය ලබා ගැනීම සඳහා පරිසර අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. | 2022 පෙබරවාරි වන විටත් සංශෝධනය කර නොතිබුණි. |
| (උ) | වර්ෂ 20 කට වඩා පැරණි මෝටර් රථ 07 ක් අපහරණය කිරීම සඳහා කටයුතු කර නොතිබුණු අතර මුහුදු ජලයට හසු වීම හේතුවෙන් ධාවනයෙන් ඉවත් කර තිබූ මෝටර් රථයක් වර්ෂ 07 ක කාලයක් නිෂ්ක්‍රියව තිබුණි. | කඩිනමින් අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. | අපහරණය කිරීමට නියමිත වුවද අධිකරණයේ නඩුවක් විභාග වෙමින් පවතින බැවින් එය අවසන් වූ වහාම අපහරණය කරනු ඇත. | 2022 පෙබරවාරි වන විටත් අපහරණය කර නොතිබුණි. |
| (ඌ) | 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත අනුව ජාතික පාරිසරික පනතේ ප්‍රතිපාදන යටතේ ස්ථාපිත ජාතික පාරිසරික සභාවේ කර්තව්‍යන් යටතේ වන කටුපොල් කලමනාකරණ සම්බන්ධයෙන් | පාරිසරික කරුණු සම්බන්ධයෙන් අදාල තීරණ කාලීනව ලබාගැනීමට කටයුතු කළ යුතුය. | කටුපොල් වගාකර ඇති ඉඩම් වලින් කටුපොල් ක්‍රමානුකූලව ඉවත් කර රබර් හෝ වෙනත් ජල පෝෂිත තත්වයන් ආරක්ෂා වන වගාවන් ස්ථාපනය කිරීමේ ඉදිරි කටයුතු සැලසුම් කිරීම | 2022 පෙබරවාරි වන විටත් මෙම ගැටළු නොවිසඳී පවතින බව නිරීක්ෂණය විය. |

| | | | | |
|---|---|---|---|---|
| | යෝජිත ඉදිරි සැලසුම් ක්‍රියාත්මක කිරිම, පුපුරන ද්‍රව්‍ය නිෂ්පාදන ආයතනයන් සඳහා පරිසර ආරක්ෂක බලපත්‍රය ලබාදීමේ කොන්දේසි සහ වායු විමෝචන තත්ව පරික්ෂා කරන යන්ත්‍රවල පිරිවැය දේශීයව දැරිය නොහැකිනම් ඒ සඳහා කටයුතු ඉටුකිරිමට අවශ්‍ය පියවර ගැනිම යනාදි කාර්යයන් ඉටුකර නොතිබුණි. | | සම්බන්ධීකරණය උදෙසා අදාල ආයතනවල සහභාගීත්වයෙන් මූලික රැස්වීමක් 2021 මැයි 03 දින මධ්‍යම පරිසර අධිකාරියේදී පවත්වන ලදී.<br>පුපුරන ද්‍රව්‍ය නිෂ්පාදන ආයතන සඳහා පාරිසරික ආරක්ෂක බලපත්‍ර නිකුත් කිරීමේදී ශබ්ද දූෂණය පාලනය කිරීම සඳහා දැනටමත් ඩෙසිබල් ප්‍රමාණය ඇතුලත් කොන්දේසි ඇතුලත් කෙරේ.<br>වායු විමෝචන තත්ව පරීක්ෂා කරන යන්ත්‍ර වල සේවා නඩත්තුව සඳහා අවශ්‍ය මුදල් සපයා ගැනීමට කටයුතු කෙරෙමින් පවතී. | |
| (එ) | 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත අනුව ශබ්ද දූෂණය පාලනය සම්බන්ධයෙන් රෙගුලාසි සංශෝධනය කර නොතිබුණි. | අදාල රෙගුලාසි කඩිනමින් ඉදිරිපත් කළ යුතුය. | දක්වා ඇති කරුණු නිවැරදිය. දැනට මධ්‍යම පරිසර අධිකාරිය ශබ්ද දූෂණ පාලන රෙගුලාසි සංශෝධනය කිරීම සඳහා බාහිර උපදේශකයකු පත්කරගෙන අවශ්‍ය කටයුතු සිදු කරනු ලබයි. | 2022 පෙබරවාරි වන විටත් රෙගුලාසි නිකුත් කර නොතිබුණි. |
| (ඒ) | 2008 ජනවාරි 26 දිනැති අංක 1533/16 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය අනුව ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 18 ක ස්ථාපනය කර තිබූ වායු විමෝචන මධ්‍යස්ථාන 83 ක් 2020 දෙසැම්බර් 31 දිනට වලංගු | වලංගු පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් කාලීන සමාලෝචනයක් සිදුකිරීමට කටයුතු කළ යුතුය. | මධ්‍යම පරිසර අධිකාරියේ දත්ත පද්ධතිය අනුව අලුතින් හඳුනාගන්නා ලද, කර්මාන්ත පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබාගැනීමේ ක්‍රියාවලියට යටත් කර්මාන්ත ලෙස වර්ග කර ඇත. එම කර්මාන්ත NP (New Processing) යටතට අයත් වන අතර 2020 | මේ සම්බන්ධව වර්තමාන තත්ත්වය පැහැදිලි නොකෙරුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | පරිසර ආරක්ෂණ බලපත්‍රයකින් තොරව ක්‍රියාත්මක වෙමින් පැවතුණි. කොළඹ දිස්ත්‍රික්කයේ ස්ථාපිත කර තිබූ වායු විමෝචන මධ්‍යස්ථාන 26 න් 23ක් සඳහාම වලංගු පරිසර ආරක්ෂණ බලපත්‍රයක් නොතිබුණි. | | වර්ෂයේදී එවැනි කර්මාන්ත 1078 ක් පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ක්‍රියවලියට යොමු කර බලපත්‍ර ලබාගැනීම සඳහා ඒ වන විට ක්‍රියාත්මක වී ඇත. | |
| (ඔ) | අපද්‍රව්‍ය කලමනාකරණ අංශය 2004 වර්ෂයේ සිට ආරම්භ වීමත් සමඟ විවිධ පාර්ශවයන් විසින් පරිත්‍යාග කර තිබූ කොම්පෝස්ට් බඳුන් විකිණීම මත ලැබූ මුදල රු.7,887,531ක් කොම්පෝස්ට් බඳුන් සංචිතය ලෙස පවත්වා ගෙන ගොස් තිබුණි. මෙම සංචිතයේ අරමුදල් භාවිතා කරමින් නැවත ජනතාව වෙත කොම්පෝසට් බඳුන් ලබා දීමේ වැඩපිළිවෙලක් අධිකාරිය විසින් ක්‍රියාත්මක කර නොතිබුණි. | අරමුදල් ඌන උපයෝජිතව තබා නොගතයුතු අතර අදාල ව්‍යාපෘති අරමුණු වෙනුවෙන් යෙදවීමට කටයුතු කළ යුතුය. | පසුගිය ගිණුම් පරීක්ෂාවෙන් කොම්පෝස්ට් බඳුන් සංචිතය 2004 වර්ෂයේ සිට අපද්‍රව්‍ය කළමණාකරන අංශය ආරම්භ වීමත් සමඟ විවිධ පාර්ශවයන් විසින් ලැබූ කොම්පෝස්ට් බඳුන් (පරිත්‍යාග) විකිනීම මත ලැබූ මුදලකි. එය පිළිසරු ව්‍යාපෘතිය මත වන අරමුදලක් නොවන අතර තවදුරටත් ගිණුම් පරීක්ෂාවෙන් පසු 2021 වර්ෂයේ මෙම ගිණුමට ගැලපීම් කිරීමට කටයුතු කරමි. | 2022 පෙබරවාරි වන විටත් ක්‍රියාත්මක කිරීමේ ඉදිරි පියවර ගෙන නොතිබුණි. |
| (ඕ) | රු.මිලියන 600 ක් වැයකර ඉදිකර තිබූ දොම්පේ සනීපාරක්ෂක බිම් පිරවුම සම්බන්ධයෙන් ලබාදී තිබූ තාක්ෂණික කරුණු අනුව කටයුතු නොකිරීම හේතුවෙන් කසල රඳවනය ඇතුළත තිබූ Geotextile ආවරණය නැවත ප්‍රතිස්ථාපනය කිරිම සඳහා රු.2,577,081ක වියදමක් දැරීමට සිදු වී තිබුණි. තවද | වත්කම් ඌන උපයෝජිතව නොතිබීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. | ගැටළුව සඳහා ක්‍රියාමාර්ගයන් පැහැදිළි කර නොතිබුණි. | මෙම බිම් පිරවුම ඌන ධාරිතාවන් යටතේ ක්‍රියාත්මක වුවද ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | මෙම බිම් පිරවුමේ දෛනික ධාරිතාවය මෙට්‍රික් ටොන් 90 ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණද 2018, 2019 හා 2020 වර්ෂවල පිළිවෙලින් වර්ෂයකට ටොන් 7,956, 1,437 හා 2,284 ක අවම ධාරිතාවයකින් කසල ලබාගැනීම් සිදුකර තිබුණි. | | | |
| (ක) | 2017 වර්ෂයේ රු.8,028,200කට මිලදී ගන්නා ලද කම්පන විශ්ලේෂණ යන්ත්‍රය වර්ෂයක් වූ වගකීම් කාලය තුළ ක්‍රමාංකනය කළ යුතු වුවත් 2021 ජුනි වන විටත් එසේ සිදුකර නොතිබුණි. එසේ තිබියදී උපකරණය මිලදී ගැනීමෙන් පසුව පරීක්ෂණ වාර 04 ක් පමණක් සම්පූර්ණ කර තිබුණු අතර ක්‍රමාංකනය නොකිරීම නිසා නිශ්කාර්යව පැවතුණි. | වත්කම් භාවිතයට ගැනීම හා නඩත්තු කටයුතු සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලන පද්ධතියක් හඳුන්වා දීම හා ක්‍රියාත්මක කිරිමට කටයුතු කළ යුතුය. | ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ක්‍රමාංකන කටයුතු සිදුකර වඩා ඵලදායි ලෙස භාවිතයට ගැනීමට කටයුතුකර නොතිබුණි. |
| (ග) | කොරියානු ආර්ථික සංවර්ධන සහයෝගිතා අරමුදල ණය ගිවිසුම් අංක SRI – 21 යටතේ ක්‍රියාත්මක වූ ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ පහසුකම් ව්‍යාපෘතිය වෙනුවෙන් දරා තිබුණු වියදම රු.මිලියන 466කි. කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන අවස්ථාවේ තෝරාගත් කොන්ත්‍රාත්කරුගේ ලංසු සුරක්ෂණය පිළිබඳ ඇතිවූ විරෝධතාවයක් හේතුවෙන් ව්‍යාපෘතියේ ඉදි කිරීම් කටයුතු | නව විෂයපථය හඳුනාගනිමින් ව්‍යාපෘති අරමුණු ළඟා කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකළ යුතුය. | 2020 ජුලි 01 දින අමාත්‍ය මණ්ඩලය ලබා දුන් තීරණයට අනුගත වෙමින් ඔක්තෝම්බර් 31 දින මෙම ව්‍යාපෘතිය අවසන් කිරීම හේතුවෙන් ආසන්න වශයෙන් පළාත් පාලන ආයතන 33 කට දෛනික නාගරික කසළ මෙට්‍රික් ටොන් 123 ක් පරිසර හිතකාමී ලෙස බැහැරලීමේ අවස්ථා අහිමි වී ගොස් ඇත. මෙම ව්‍යාපෘතිය දරා ඇති වියදම රු.450,278,338ක් වේ. | 2022 පෙබරවාරි වන විටත් ක්‍රියාමාර්ග කිසිවක් ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | ආරම්භ කර නොතිබීමත්, ඉදිකිරීම් සඳහා තෝරාගත් ස්ථාන වෙනස් කිරීම හා ව්‍යාපෘතියේ විෂය පථය වෙනස්වීම යන හේතු මුල්කර ගනිමින් මෙම ව්‍යාපෘතියේ ණය ගිවිසුම අවසාන කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි. | | | |
| (ච) | අධිකාරිය මගින් ක්‍රියාත්මක කරන පිළිසරු ව්‍යාපෘතියේ 2008 සිට 2018 දෙසැම්බර් 31 දින දක්වා මූල්‍ය ප්‍රගතිය සියයට 47.29 ක් වූ අතර ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 52.71 ක් වී තිබුණි. 2007 දෙසැම්බර් 14 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු 08 ක් අතරින් අරමුණු 03 ක් ක්‍රියාත්මක කර නොතිබුණු අතර ව්‍යාපෘතිය විසින් කොම්පෝස්ට් අංගන 139 ක් ඉදිකිරීමට සැලසුම් කර තිබුණද අංගන 33 ක් නිමකර නොතිබුණි. ඉන් අංගන 14 ක් අක්‍රිය තත්ත්වයේද අංගන 03 ක් අතරමග නවතා දමා ද, නෛතික හේතුන්මත ඉදිකිරීම් කටයුතු ආරම්භ නොකර අංගන 02 ක් ද ඉදිකරමින් පවතින අංගන 12 ක් ද ඉදිකිරීම් කටයුතු සිදු නොවූ අංගන 02 ක් ද විය. | ව්‍යාපෘතිය සැලසුම් කළ පරිදි අරමුණු ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | පවතින නීති රාමුව තුළ ක්‍රියා කිරීමට නොහැකි වීමේ තත්ත්වයක් පැන නැගීම හේතුවෙන් අදාල අරමුණු ඉටුකර ගැනීම සඳහා කටයුතු කළ නොහැකි විය. | 2022 පෙබරවාරි වන විටත් ක්‍රියාමාර්ග කිසිවක් ගෙන නොතිබුණි. |

**47.** **මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභාව**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - තතත්ත්වාගණනය කළ මතය

2019 - තතත්ත්වාගණනය කළ මතය

2020 - තතත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 1997 අංක 18 දරන මානව සම්පත් සංවර්ධනය කිරීමේ, ශ්‍රී ලංකා ජාතික සභා පනතේ ඡේද අංක 16 (2) (1) (ඒ) මගින්, මානව සම්පත් සංවර්ධනයේ විවිධ අංශවල නිපුණ විශේෂඥ සංචිතයක් සංවර්ධනය කිරීම අරමුණු කරගෙන සභාවේ නිළධරයන්ගේ දක්ෂතා වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය වන පියවර ගැනීමේ බලය සභාව වෙත පැවරී තිබුණි. එහෙත් එම කටයුත්ත සිදු නොකර බාහිර විශේෂඥ සේවා ලබාගැනීම වෙනුවෙන් වාර්ෂිකව සැලකිය යුතු මුදලක් වැය කර තිබූ අතර 2018 වර්ෂය තුලදී පමණක් රු.1,262,025ක් වැයකර තිබුණි. | මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව ආරම්භ කිරීමේ අරමුණ ඉටකර ගැනීම සඳහා විවිධ අංශවල නිපුණ විශේෂඥ සංචිතයක් පවත්වා ගැනීම අත්‍යාවශ්‍ය බැවින් ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | ඉතා සුළු කාර්යමණ්ඩලයකින් සියළු කාර්යයන් ඉටුකල නොහැකි බැවින් බාහිර විශේෂඥයන්ගේ සහාය ලබාගෙන ඇත. | විශේෂඥ සංචිතය පිහිටුවීම සඳහා අයදුම්පත් කැඳවා ඇතත් තෝරා ගැනීමේ කටයුතු 2021 දෙසැම්බර් 31 දක්වාම සිදුකර නැත. |
| (ආ) | 1997 අංක 18 දරන මානව සම්පත් සංවර්ධනය කිරීමේ පනත අනුව ජාතික මානව සම්පත් සංවර්ධනය කිරීමේ ප්‍රතිපත්තීන් සකස් කිරීම, කාලීනව සමාලෝචනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ අමාත්‍යවරයාට සහ රජයට උපදෙස් දීම මූලික | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. | 2013 වර්ෂයේදී රැකීරක්ෂා දෙපාර්තමේන්තුව මගින් සකස් කර තිබුණු ප්‍රතිපත්ති සෞභාග්‍යයේ දැක්ම අනුව යාවත්කාලීන කිරීම සඳහා අවශ්‍ය කටයුතු සැලසුම් කොට එම ප්‍රතිපත්තිය සකස් කිරීමට අවශ්‍ය විද්වත් කමිටු පත්කිරීම සඳහා නාම | මේ වනවිට මානව සම්පත් සංවර්ධන ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා උපදේශක කමිටු හා ක්‍රියාකාරී කමිටු සඳහා නාම යෝජනා ලබාගෙන ඇතත් අදාල කාර්යය 2021 |

| | | |
|---|---|---|
| කාර්යය හා කර්තව්‍ය වුවත් මානව සම්පත් සංවර්ධන ප්‍රතිපත්තියක් සකස් කර නොතිබුණි. | යෝජනා ලබා ගෙන ඇත. තවද පවතින කොරෝනා වසංගත තත්වය මත කමිටු රැස්කිරීමේ ප්‍රමාදයක් පවතී. එම තත්වය බැහැර වූ පසු කමිටු රැස්කොට එම ප්‍රතිපත්තිය සකස් කිරීමට පියවර ගැනීමට උපදෙස් දී ඇත. | වර්ෂයේදීද ඉටුකර නැත. |

## 48. මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - තතත්ත්වාගණනය කළ මතය

2019 - තතත්ත්වාගණනය කළ මතය

2020 - තතත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | මැණික් වල අගය වැඩි කිරීම සඳහා නව තාක්ෂණ ක්‍රමවේදයක් පිළිබඳ අධ්‍යයනයක් හඳුන්වා දීම යටතේ ගෙවුඩ තාප පිරියම්කරණය සඳහා භාවිත කරන ලක්මිණි උඳුන අළුත්වැඩියා කිරීම, පද්මරාග ලබා ගැනීම සඳහා රතු ගෙවුඩ සහ කහ සැපයර් හඳුනා ගැනීමේ අඳුරු පර්යේෂණ සිදු කිරීම, ටුවර් මැල ප්‍රකීරණය සහ ඕපල් මත ග්‍රැමා ප්‍රකීරණය පිළිබඳ අධ්‍යයනය සඳහා 2020 වර්ෂයේ ප්‍රතිපාදන වෙන් කර තිබුණද, මෙම පර්යේෂණ සිදුකර නොතිබුණි. | අදාල පර්යේෂණ කඩිනමින් ආරම්භ කල යුතුය. | පර්යේෂණ කටයුතු ආරම්භ කිරීමට සැලසුම් කර ඇත. | 2021 වර්ෂය අවසානය දක්වාම පර්යේෂණ කටයුතු නිම කර නොමැත. |
| (ආ) | ආයතනයේ පර්යේෂණ අංශය විසින් 2017 – 2019 කාලය තුල සිදු කරන ලද නවෝත්පාදන 4 ක් වෙනුවෙන් ආයතනය රු.1,422,306ක් වැයකර තිබුණද එම නවෝත්පාදන වෙළඳපලට හඳුන්වාදී ආදායම් ඉපයීමට හා එම නිෂ්පාදන අවශ්‍ය පාර්ශවයන්ට භාවිතය සඳහා ලබාදීමට වැඩපිළිවෙලක් | පේටන්ට් බලපත්‍ර ලබාගෙන නවෝත්පාදන වෙළඳපලට හඳුන්වාදී ආදායම් ඉපයීමට හැකි වැඩපිළිවෙල කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුය. | පර්යේෂණ හරහා ගොඩනංවන ලද නවෝත්පාදන වෙනුවෙන් පේටන්ට් බලපත්‍ර ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය වෙතින් අයදුම්කර ඇත. | පේටන්ට් බලපත්‍ර අයදුම්කර තිබුණද 2022 ජනවාරි 31 දින වන විටත් ලැබී නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | සැලසුම් කර ක්‍රියාත්මක කර නොතිබුණි. | | | |
| (ඇ) | ශ්‍රී ලංකාව තුල මැණික් නිධි ගවේෂණය හා ඇගයීමේ ව්‍යාපෘතිය (2008 – 2031) සඳහා ආයතනයේ සිටින කාර්ය මණ්ඩලයට අමතරව සේවකයන් 22 ක් හා උපදේශකවරයෙකු කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට 2018 වර්ෂයේ කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා දී තිබුණද 2021 වර්ෂය වන විටත් උපාධිධාරී පුහුණුවන්නන් 5 දෙනෙකු බඳවාගෙන ව්‍යාපෘති ක්‍රියාත්මක කර තිබුණි. පළමු අදියර යටතේ දිස්ත්‍රික්ක 5 ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 50 ක් තුල මැණික් නිධි ගවේෂණය කර සිතියම් නිර්මාණය කර අවසන් වාර්තා නිකුත් කිරීමට සැලසුම් කර තිබුණද 2021 වර්ෂය අවසානයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 08 කට අදාල සිතියම් නිර්මාණය කර අවසන් වාර්තා නිකුත් කර තිබුණි. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 38 කට අදාල ගවේෂණ කටයුතු ආරම්භ කර හෝ නොතිබුණි. ආරම්භ කර තිබූ තණමල්විල, කතරගම, කුරුවිට හා රත්නපුර යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | අමාත්‍ය මණ්ඩල අනුමැතිය සහ ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව අනුමත කළ ව්‍යාපෘති යෝජනාව ප්‍රකාරව කටයුතු කළ යුතුය. | රත්නපුර, ගාල්ල, මාතලේ, පොළොන්නරුව හා ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික් 05 කට දිස්ත්‍රික් සංවර්ධන කමිටු ආධාර යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට අනුයුක්ත සංවර්ධන නිලධාරීන්ගේ හා විශ්ව විද්‍යාල ශිෂ්‍යයන්ගේ දායකත්වය ඇතිව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා එම දිස්ත්‍රික් සංවර්ධන කමිටු වෙත ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම පමණක් සිදුකර ඇත. | සැලසුම් කළ පරිදි කාර්යභාර්යය නිම කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | සඳහා මැණික් විභව සිතියම් සම්පූර්ණ කර නොතිබුණි. ව්‍යාපෘතිය තුලින් හඳුනාගෙන තිබූ මැණික් ඇතැයි සැලකෙන ප්‍රදේශ 05 ක නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය වෙත යොමු කර තිබුණද ක්‍රියාත්මක කර නොතිබුණි. තවද හඳුනාගන්නා ලද ඉඩම් වෙන්දේසි කිරීමෙන් ලැබෙන ආදායමෙන් සියයට 25 ක් ලබා ගැනීමට සහ මැණික් විභව සිතියම් අලෙවි කිරීම මගින් ලැබෙන ආදායමෙන් රු.මිලියන 176.15 ක් යොදවා ව්‍යාපෘතියේ දෙවන සහ තෙවන අදියර ක්‍රියාත්මක කිරීමට නියමිත විය. නමුත් ආයතන 2 අතර වන සම්බන්ධීකරණයක් නොමැති වීම නිසා සිදු කල පර්යේෂණ වලින් මේ දක්වා ඵලදායීතාවක් ලැබී නොතිබුණි. | | | |
| (ඇ) | මැණික් පිළිස්සීම සඳහා 2013 වර්ෂයේදී ආයතනය විසින් රු.10,977,344ක් වැය කර විදුලි උඳුනක් මිලදී ගෙන වර්ෂ 06 ක කාලයක් නිශ්කාර්යව පැවතුණි. 2020 වර්ෂයේදී මෙම උඳුනේ සේවා සැපයීමේ කටයුතු ආරම්භ කිරීම වෙනුවෙන් උත්සව වියදම් රු.221,935ක් හා විදුලි උඳුන ස්ථාපනය කිරීම, අමතර | ආයතනය විසින් මේ සඳහා අධික වියදමක් දරා ඇති නිසා උපරිම ඵලදායිතාවයෙන් යුතුව භාවිතයට ගත යුතුය. | 2020 වසරේ සිට මෙම උඳුන පර්යේෂණ තාප පිරියම් කටයුතු සඳහා යොදවා ඇත. | බාහිර පාර්ශවය සඳහා තාපකරණ සේවය ලබා දීම ආරම්භ කිරීමට සැලසුම් කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | කොටස් සහ විදුලි පරිපථ වැඩිදියුණු කිරීම හා ගොඩනැගිල්ලේ අළුත්වැඩියාව සඳහා තවත් රු.3,149,950 ක් වැයකර තිබුණු අතර විදුලි උඳුන දීර්ඝ කාලයක් පාවිච්චි කර නොතිබීම හේතුවෙන් අධික අළුත්වැඩියා වියදම් දැරීමට සිදුවී තිබුණි. | | | |
| (ඉ) | 2015 වර්ෂයේ සිට ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියෙන් ලබා දුන් රු.25,357,200ක ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කෙරෙන දිළිඳුකම පිටුදැකීමේ ව්‍යාපෘතිය යටතේ මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය සඳහා තාක්ෂණ ශිල්පීන් 1000 ක් පුහුණු කිරීම සඳහා පවත්වා තිබුණු පාඨමාලා සඳහා 2015 – 2018 කාලය තුල 805 දෙනෙකු බඳවාගෙන තිබුණද ඉන් 255 දෙනෙකුම පුහුණුව අවසන් කර නොතිබුණි. පාඨමාලා සඳහා දැරූ වියදම වූ රු.3,577,395ක් ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියෙන් ප්‍රතිපූරණය කරගෙන නොතිබුණි. | ආයතන දෙක අතර ඇතිකරගත් ගිවිසුම ප්‍රකාරව කටයුතු කළ යුතුය. | පාඨමාලා සඳහා ඕනෑම වයස් මට්ටමක සිසුන් බඳවා ගැනීමට කටයුතු කර ඇත. පුහුණුලාභීන්ට කර්මාන්තයේ වාසිදායක තත්ත්වය පිළිබඳ දැනුවත් කිරීම් සහ මාර්ගෝපදේශයන් ලබාදී ඇත.<br>මෙම ව්‍යාපෘතිය හරහා ආයතනයට දැරීමට සිදු වූ සියළු පුහුණු ක්‍රියාකාරකම් වලට අදාළව වූ වියදම් සඳහා වන බිල්පත් සහ සහතික කරන ලද වවුචර පත් මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය වෙත යොමු කර ඇත. | කෙටි කාලීන සහ දුරස්ථ අධ්‍යාපන වැඩසටහන් ඇති කිරීම සහ පුහුණු පාඨමාලා සඳහා බඳවාගැනීමේ ප්‍රචාරණ ක්‍රමවේද සංවර්ධනය කිරීම යනාදිය සිදුකර ඇත. ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියෙන් රු.800,000ක මුදලක් පමණක් ප්‍රතිපූර්ණය කර තිබුණි. |
| (ඊ) | පර්යේෂණ හා පාඨමාලා පැවැත්වීම සඳහා ප්‍රමාණවත් ඉඩකඩ නොමැති සහ නීත්‍යානුකූලව භාවිතයට ගත නොහැකි ගොඩනැඟිල්ලක් මසකට රු.1,000,000 ක බදු | පාඨමාලා සහ පර්යේෂණ පැවැත්වීමට ඉඩකඩ ඇති ස්ථානයක කාර්යාලය පවත්වා ගත යුතු අතර අවදානම් සහිත ස්ථානයෙන් | ක්‍රියාමාර්ග ගෙන නොමැත. | 2022 ජනවාරි වනතෙක් එම තත්ත්වයේම පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | කුලියට ලබාගෙන තිබුණි. | ඉක්මනින් ඉවත් වීමට කටයුතු කල යුතුය. | | |
| (උ) | ආයතනයේ ජ්‍යොෂ්ඨ මට්ටමේ තනතුරු 15 ක්, තෘතියික මට්ටමේ තනතුරු 06 ක්, ද්විතියික මට්ටමේ තනතුරු 34 ක් සහ ප්‍රාථමික මට්ටමේ තනතුරු 06 කද ඇතුළුව මුළු තනතුරු 61 ක්ද පුරප්පාඩුව පැවතුණි. ඉන් අධ්‍යක්ෂ(පර්යේෂණ) තනතුර 2011 වර්ෂයේ සිට පුරප්පාඩුව පවතින අතර ඒ සඳහා බඳවා ගැනීමට සමාලෝචිත වර්ෂයේද පියවරගෙන නොතිබුණි. එමෙන්ම ජ්‍යොෂ්ඨ පර්යේෂණ (වර්ණ වැඩිදියුණු කිරීම), ජ්‍යොෂ්ඨ පර්යේෂණ (නවෝත්පාදන), පර්යේෂණ නිලධාරීන් 08 සහ කථිකාචාර්යවරු 4 දෙනෙකුගේ පුරප්පාඩු පැවතියත් බඳවා ගැනීම් කර නොතිබුණි. පුහුණු අංශය සඳහා ස්ථිර කථිකාචාර්යවරුන් බඳවා ගැනීම වෙනුවට බාහිර කථිකාචාර්යවරුන්ගේ සහ ආයතනයේ නිලධාරීන්ගේ සේවය දිගින් දිගටම ලබාගෙන තිබුණි. | ආයතනයේ දැනට පවතින පුරප්පාඩු සඳහා අවශ්‍යතාවය පරිදි සේවකයන් බඳවා ගත යුතු අතර විශේෂයෙන් පුහුණු අංශය සඳහා ස්ථිර කථිකාචාර්යවරුන් ඉක්මනින් බඳවාගත යුතුය. | බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2022 ජනවාරි දක්වාම පුරප්පාඩු සම්පූර්ණ කර නොමැත. |
| (ඌ) | ලියාපදිංචියේ සිට වසර 10 ක් ඉක්මවා නොමැති වුවත් ධාවන තත්ත්වයේ නොපවතින හා අළුත්වැඩියාව ආර්ථික වශයෙන් ඵලදායී නොවන වාහන අපහරණය කිරීමට අංක | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ පරීක්ෂකවරයෙකු විසින් මෙම වාහනය අළුත්වැඩියා කිරීමෙන් පසු පාවිච්චි කල හැකි | ක්‍රියාමාර්ග ගෙන නොමැත. | අපහරණ තීරණය සම්බන්ධ පරීක්ෂාවක් සිදුකර නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ලියාපදිංචි කල දින සිට වර්ෂ 10 නොඉක්ම වූ රු.975,000ක වටිනාකමට තක්සේරු කරන ලද වාහනයක් තක්සේරු මණ්ඩලය මගින් අළුත්වැඩියා කිරීමෙන් පසු භාවිත කල හැකි බවට නිර්දේශ කර තිබිණි. එසේ තිබියදී 2009-2016 කාලය තුල රු.982,844ක අධික අළුත්වැඩියා වියදම් ඇති බව හේතු දක්වා තක්සේරු වටිනාකමද ඉක්මවා රු.1,612,000කට 2020 දෙසැම්බර් 23 දින එම වාහනය අලෙවි කර තිබුණි. | බවට 2019 අගෝස්තු 08 දින නිර්දේශ කර තිබියදි 2019 ජුලි 17 දින අපහරණය කිරිමේ කමිටු නිර්දේශයක් මත මෙම වාහනය අපහරණය කිරිම සම්බන්ධව නැවත පරික්ෂාවක් කල යුතුය. | | |
| (එ) | 2009 සිට 2014 දක්වා කාලය තුල ආයතනයේ සේවකයින් 18 දෙනෙකුට වැටුප් වර්ධක හා දීමනා ලෙස රු.2,580,281ක් වැඩිපුර ගෙවා තිබුණි. මින් සක්‍රිය සේවයේ නියුතු නිලධාරීන් 11 දෙනෙකුගෙන් අයවිය යුතු මුදල් වහාම අයකර ගැනීමට කටයුතු නොකර මුදල් රෙගුලාසි 119 ට පටහැනිව විශ්‍රාම යන තෙක් රු.50 ත් රු.1,942ත් අතර මාසික වාරිකවලින් අයකර ගැනීමට කටයුතු කර තිබු අතර සමාලෝචිත වර්ෂය අවසානයට එම නිලධාරීන්ගෙන් අයවිය යුතු මුදල රු.1,481,781ක් විය. | වැඩිපුර ගෙවූ වැටුප් එකවර අයකර ගත යුතුය. | ක්‍රියාමාර්ග ගෙන නොමැත. | අදාල අයකරගත යුතු මුදල් අයකරගෙන නැත. |

දැනට සේවයේ නියුතු නොවන නිලධාරීන් 03 දෙනෙකුගෙන් අයවිය යුතු රු.227,652 ක් අයකරගෙන නොතිබුණි.

## 49. යාපනය විශ්ව විද්‍යාල විද්‍යායතනය

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - තතත්ත්වාගණනය නොකළ මතය

2019 - තතත්ත්වාගණනය කළ මතය

2020 - තතත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය නොමැතිව සහකාර ලේඛකාධිකාරීවරයෙකු, සහකාර මූල්‍යාධිකාරීවරයෙකු සහ සහකාර පුස්තකාලයාධිපතිවරයෙකු බඳවා ගෙන ඉකුත් වර්ෂ 3 ක කාලය තුළ වැටුප් හා දීමනා ලෙස රු.12,630,553ක් ගෙවා තිබුණි. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අවශ්‍ය අනුමැතිය ලබා ගත යුතුය. | මෙම තනතුරු වෙනුවෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට අයදුම්පත් ඉදිරිපත් කර ඇත. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අවශ්‍ය අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |
| (ආ) | අංක. DMA/2009(1) හා 2009 ජුනි 09 දිනැති මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි. | අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කළ යුතු වේ. | අභ්‍යන්තර ඒකකයක් පිහිටුවීම සඳහා වූ නිර්දේශය ලැබීමට නියමිතය. | 2021 වර්ෂයේදීද අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි. |
| (ඇ) | 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 7.4.1 වගන්තිය ප්‍රකාරව විගණන කමිටුවක් පිහිටුවා නොතිබුණි. | විගණන කමිටුවක් ස්ථාපිත කළ යුතුය. | විගණන කමිටුවක් පිහිටුවීම සඳහා වූ නිර්දේශය ලැබීමට නියමිතය. | 2021 වර්ෂයේදීද විගණන කමිටු පවත්වා නොතිබුණි. |
| (ඈ) | විද්‍යායතනය විසින් 2015 වර්ෂයේ සිට භාවිතා කරන මෝටර් රථ 02ක හිමිකාරත්වය පවරා ගැනීමට පියවර ගෙන නොතිබුණි. | පවරා ගැනීමට පියවර ගත යුතුය. | මෙම ගැටළුව නිවැරදි කිරීමට පියවර ගෙන තිබුණි. | හිමිකාරත්වය පවරා ගැනීමට පියවර ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | ස්ථාවර වත්කම්වල සඵල ආයු කාලය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති 07 අනුව වාර්ෂිකව සමාලෝචනය කර නොතිබුණි. එනම්, රු.31,034,308ක් වූ දේපල පිරියත සහ උපකරණ සම්පූර්ණයෙන්ම ක්ෂය වී තිබුණ ද, තවමත් භාවිතා වේ. ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති 03 අනුව, මෙම වත්කම්වල ඵලදායී ආයු කාලය නිවැරදිව ගණනය නොකිරීමේ දෝෂය ද නිවැරදි කර නොතිබුණි. | අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල විය යුතුය. | මේ පිළිබඳ අපගේ ප්‍රධාන ආයතනය විමසා ඒ අනුව සුදුසු පියවර ගනිමු. | මෙම අඩුපාඩුව 2021 වර්ෂයේදීද නිවැරදි කර නොතිබුණි. |
| (ඊ) | සමාලෝචිත වර්ෂය සහ ඊට පෙර වර්ෂ 04 සඳහා තාවකාලික කාර්ය මණ්ඩලයේ පාරිතෝෂික වෙනුවෙන් රු.1,679,755ක ප්‍රතිපාදන වෙන්කර තිබුණි. මේ නිසා, සමාලෝචිත වර්ෂය අවසන් දිනට පාරිතෝෂික වෙන්කිරීම රු.1,679,755 කින් වැඩි වී තිබුණි. | අදාළ නීතිවලට අනුකූල විය යුතුය. | ඉදිරියේදී ස්ථිර කාර්ය මණ්ඩලය සඳහා පමණක් ගණනය කිරීමට කටයුතු කරනු ලැබේ. | මෙම 2021 වර්ෂයේදීද නිවැරදි කර නොතිබුණි. |

## 50. රණවිරු සේවා අධිකාරිය

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - තතත්ත්වාගණනය කළ මතය

2019 - තතත්ත්වාගණනය කළ මතය

2020 - තතත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | අධිකාරිය සඳහා වායුසමීකරණ පද්ධතියක අවශ්‍යතාව නිසි පරිදි ඇස්තමේන්තු කර වායු සමීකරණ යන්ත්‍ර මිලදී ගැනීමට කටයුතු නොකර කළමණාකරන මණ්ඩලයේ අනුමැතියක් මත කුලී පදනම මත වායු සමීකරණ යන්ත්‍ර ලබාගැනීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ මාස 09 ක කාලයක් තුල රු.2,057,442ක් වැය කර තිබුණි. කුලී පදනම මත ලබා ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1(ඇ) අනුව සුදුසුකම්ලත් උනන්දුවක් දක්වන පාර්ශවයන්ට ප්‍රසම්පාදනයට සහභාගී වීම සඳහා සාධාරණ සමාන අවස්ථාවන් ලබාදිය යුතු වුවත් මෙම ප්‍රසම්පාදනයට අදාලව එක් සැපයුම්කරුවෙකුගෙන් පමණක් මිල කැඳවීම කර තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූල වෙමින් විධිමත්ව ප්‍රසම්පාදන කටයුතු සිදුකල යුතුය. | අධිකාරිය සඳහා ස්ථිර වායුසමීකරණ පද්ධතියක් මිලදී ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා දීර්ඝ කාලයක් ගතවූ බැවින් කුලී පදනම මත ආයතනයකින් වායුසමීකරණ යන්ත්‍ර සපයා ගැනීමට ටෙන්ඩර් මණ්ඩල අනුමැතිය හිමිවූ අතර ඒ සඳහා මිලියන 2 ක පමණ මුදලක් ගෙවීමට සිදුවී තිබුනි. | ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ආ) | ආබාධිත රණවිරුවන් සඳහා ඉල්ලුම්කල රෝද පුටු, අත්වාරු , කෘතිම පාද , උපැස් යුගල | වෙන් වී ඇති ප්‍රතිපාදන උපරිම වශයෙන් උපයෝජනය කිරීමට | වෙන් කරන ලද මුළු ප්‍රතිපාදනයෙන් සියයට 84.25 ක් වෙන් කරනු ලැබුවේ 2019 | ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | ප්‍රමාණය ඒකක 354 ක් 583ක් 472 ක් හා 165 ක් විය. එසේ වුවද සත්‍ය වශයෙන් ලබා දී තිබුණේ පිළිවෙලින් 25ක් 29ක් 9ක් හා 0ක් පමණි. එසේම මේ සඳහා අපි වෙනුවෙන් අපි අරමුදලින් රු.මිලියන 10 ක මුදලක් ලැබී තිබුණු නමුත් අවශ්‍ය කටයුතු කර නොතිබූ නිසා මෙම මුදල් 2019 දෙසැම්බර් 31 දින නැවත එම අරමුදල වෙත ප්‍රේෂණය කර තිබුණි. | කටයුතු කළ යුතුය. | දෙවන අර්ධ වර්ෂයේ බැවින් නියමිත කාලය තුලදී ප්‍රසම්පාදන කටයුතු අවසන් කර ගැනීමට නොහැකි වූ බව. | |
| (ඇ) | රණවිරු මාපිය රැකවරණ දීමනා ක්‍රමය යටතේ 2016 ජූනි මාසයේ සිට 2017 නොවැම්බර් මස දක්වා මාස 18 ක කාලය තුල ගිණුම්හිමියන් දෙදෙනෙකු වෙත අවිධිමත් ලෙස රු.5,940,000ක මුදලක් ගෙවා තිබුණි. මෙම මුදලින් රු.4,978,580 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකරගෙන නොතිබුණි. | අධිකාරියට අයවිය යුතු මුදල් කඩිනමින් අදාල පාර්ශවයන් වෙතින් අයකර ගැනීමට කඩිනම් පියවර ගැනිමට කටයුතු කල යුතු වීම. | අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත භාර දී ඇති අතර එම දෙපාර්තමේන්තුව විසින් කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ පැමිණිල්ලක් ගොනුකර අදාල විමර්ශන කටයුතු සිදුකරගනු ලබයි. | අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් පරීක්ෂණයක් සිදුකරමින් පවතී. |

## 51. ශ්‍රී ලංකා රබර් පර්යේෂණ මණ්ඩලය

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය
2018 - තතත්ත්වාගණනය කළ මතය
2019 - තතත්ත්වාගණනය කළ මතය
2020 - තතත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | මණ්ඩලයට අයත් ඉඩම් හෙක්ටයාර 431.78ක නාමික වටිනාකම ලෙස රු.4,237,430ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු නමුත් එම ඉඩම් ප්‍රත්‍යාගණනය කර ඒවායේ සාධාරණ අගය 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි. | ඉඩම්වල වටිනාකම ප්‍රත්‍යාගණනය කර ඒවායේ සාධාරණ අගය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වීමට කටයුතු කළ යුතුය. | ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කිරිම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලුම් කර ඇත. | තක්සේරු දෙපාර්තමේන්තුවෙන් මෙම කාර්යය ඉටු නොවන බැවින් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන ලියාපදිංචි තක්සේරුකරුවෙකු වෙත මිල ගණන් කැඳවා අදාළ කාර්යය පැවරීමට පියවර ගෙන ඇත. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xv පරිච්ඡේදයේ 4:7 වගන්තිය අනුව අධ්‍යයන කටයුතු සඳහා වැටුප් සහිත නිවාඩු ලබා විදේශගත වී බැඳුම්කර කොන්දේසි කඩකළ නිලධාරීන් 04 දෙනෙකුගෙන් වර්ෂ 29 සිට වර්ෂ 03 දක්වා කාලය තුළ මණ්ඩලයට අයවිය යුතු ශේෂ එකතුව රු.3,509,706 ක් සම්බන්ධයෙන් එම ශිෂ්‍යත්වලාභීන්ගෙන් අයකර ගෙන නොතිබුණි. | විදේශගතවී බැඳුම්කර කොන්දේසි කඩකළ නිලධාරීන්ගෙන් ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව එම මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | බැඳුම් කර සම්බන්ධයෙන් අය විය යුතු ශේෂ අයකර ගැනිම සඳහා පියවර ගෙන ඇතත් එම ශේෂ අයකර ගැනීමට නොහැකි වී ඇත. | මෙම ශේෂය සම්බන්ධයෙන් ඉදිරියේදී පරිපාලන තින්දුවක් ගැනීමට තීරණය කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | මණ්ඩලය විසින් මොනරාගල කුමාරවත්ත සහ පොල්ගහවෙල නාරම්පොල වත්ත යන උප මධ්‍යස්ථාන 02 හි රු.16,301,964 ක් වැයකර කාර්යාල ගොඩනැගිලි ඉදිකර තිබුණද, එම ඉඩම් නීත්‍යානුකූලව මණ්ඩලයට මෙතෙක් පවරා ගෙන නොතිබුණි. | නොපමාව ඉඩම් පවරා ගත යුතුය. | මොනරාගල කුමාර වත්ත හා අලව්ව නාරම්පොල වත්ත නෛතිකව පවරා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කර අදාළ ලිපි ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය විසින් අදාළ ප්‍රාදේශිය ලේකම්වරුන් වෙත යොමුකර ඇත. | මෙම ඉඩම් පැවරීම සම්බන්ධව 2021 වර්ෂය අවසානය දක්වාම පවරා නොතිබුණි. |
| (ඈ) | අමු රබර් සහ රසායන විශ්ලේෂණ අංශයේ අවුරුදු 15 කට වඩා වැඩි කාලයක සිට නිශ්ක්‍රියව පවතින Two Roll Mill Cal/006, Hydrolic press Cal/010 යන්ත්‍ර දෙක කෞතුක යන්ත්‍ර ලෙස තැබීමට තීරණය කර තිබුණද ඒවා ආවරණයකින් තොරව අනාරක්ෂිතව එළිමහනේ රඳවා තිබුණි. | යෝජිත කෞතුකාගාරයට යැවීමට සුරක්ෂිතව තැබිය යුතුවීම. | අලුත්වැඩියා කිරීම ලාභදායි නොවන බැවින් කෞතුක යන්ත්‍ර ලෙස තැබීමට තීරණය කර ඇති අතර රත්මලාන කාර්යාලයේ නවීකරණ කටයුතු අවසන් වූ පසු මේ සඳහා ද නිශ්චිත ආවරණ සකස් කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | රත්මලාන කාර්යාලයේ දැනට විද්‍යාගාර නවීකරණ සිදු වෙමින් පවති. |

## 52. රාජ්‍ය භාෂා කොමිෂන් සභාව

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 - තතත්ත්වාගණනය කළ මතය

2019 - තතත්ත්වාගණනය කළ මතය

2020 - තතත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායි ජීවිතකාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් 2020 වර්ෂයේදී පිරිවැය රු.3,236,917ක්වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබූ නමුත් තවදුරටත් භාවිතයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරිමට කටයුතු කර නොතිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව කටයුතු කළ යුතු බව. | වත්කම් භෞතිකව හඳුනාගෙන කේත කර ඇත. | ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කර නැත. |
| (ආ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 (ඇ) , 3.4.2 (අ) හා 6.3.6 යන මාර්ගෝපදේශයන්ගෙන් බැහැරව 2013, 2014 හා 2015 යන වර්ෂවල වාර්ෂික වාර්තා හා සීඩී තැටි මුද්‍රණය කිරීම සඳහා 2020 වර්ෂයේදි රු.1,395,197ක වියදමක් දරා තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කළ යුතු බව. | ප්‍රසම්පාදන කටයුතු ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව සිදුකරනු ලබයි. | අදහස් දැක්වීම් කර තිබුණද, 2021 වර්ෂයේදීත් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කර නැත. |

## 53. වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලය

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 - තතත්ත්වාගණනය කළ මතය

2019 - තතත්ත්වාගණනය කළ මතය

2020 - තතත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | වයස අවුරුදු 70 ඉක්ම වූ අඩු ආදායම්ලාභී වැඩිහිටියන් සඳහා මහා භාණ්ඩාගාරය විසින් ලබාදෙන රු.2,000ක් වූ වැඩිහිටි දීමනාවෙන් රු.100ක් අය කර ස්ථාපිත කර තිබුණු වැඩිහිටි ආරක්ෂණ අරමුදලට, 2018 හා 2019 වර්ෂවලදී පිළිවෙලින් රු.5,357,900ක් හා රු.3,724,800ක් දායක මුදල් අඩුවෙන් අයකර ගෙන තිබුණි. එකී හිඟ දායක මුදල් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. 2019 දෙසැම්බර් 31 දිනට අරමුදලට බැර වී තිබුණු රු.1,476,158,823ක් වූ මුදල් අරමුදලේ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා උපයෝජනය නොකර ස්ථාවර තැන්පතු වල ආයෝජනය කර තිබුණි. | අරමුදලක් පිහිටුවීම සඳහා භාණ්ඩාගාරයේ නීත්‍යානුකූල අවසරය ලබාගත යුතු අතර අදාල අරමුදලේ අපේක්ෂිත වූ කාර්යයන් ඉටුකිරීම සඳහා අවධානය යොමුකළ යුතු වීම හා වැඩිහිටි දීමනාවෙන් අයකර ගන්නා දායක මුදල් අරමුදලේ බැරට ලබාගත යුතුය. | වැඩිහිටි දීමනාවෙන් අවකරණය කල රු.100ක් වූ වාරික මුදල අරමුදලේ බැරට ලබාගැනීමට හා හිඟ දායක මුදල් අයකර ගැනීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී. | හිඟ වාරික මුදල් පිළිබඳව සැසඳීම කර අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | වැඩිහිටි තැනැත්තන් පිළිබඳ නිවැරදි හා යාවත්කාලීන කරන ලද සංඛ්‍යා ලේඛන ඇතුලත් දත්ත පද්ධතියක් පැවැත්වීම සභාව විසින් කළ යුතු වුවත්, ඒ සඳහා ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි. 2018 වර්ෂයේදී | වැඩිහිටි තැනැත්තන් පිළිබඳව නිවැරදි හා යාවත්කාලීන කරන ලද දත්ත පද්ධතිය කඩිනමින් සකස්කර ගත යුතුය. | වැඩිහිටි දීමනා ලබාදීම සඳහා වන පුද්ගල ලේඛන මේ වන විට යාවත්කාලීන කරමින් පවතී. | වැඩිහිටි තැනැත්තන් පිළිබඳ තොරතුරු ඇතුලත් ක්‍රමවත් හා යාවත්කාලීන දත්ත පද්ධතියක් පිළියෙල කර කටයුතු සම්පූර්ණ කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | වැඩිහිටි ආරක්ෂණ අරමුදලින් රු.2,000,000ක් ලබාගෙන දත්ත පද්ධතිය සකස් කිරීමට අනුමත කරගෙන තිබුණු නමුත් 2020 දෙසැම්බර් දක්වාම ක්‍රමවත් හා යාවත්කාලීන දත්ත පද්ධතියක් පිළියෙල කර නොතිබුණි. 2016 පෙබරවාරි 11 දින පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේදී ද මේ පිළිබඳව සභාවට උපදෙස් දී තිබුණි. | | | |
| (ඇ) | වැඩිහිටි ආරක්ෂණ අරමුදලේ 2016 වර්ෂයේ සිට ගොඩනැගී තිබුණු 2019 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.1,931,745,249ක් වූ අතර අරමුදලේ මුදල් උපයෝජනය කර වැඩිහිටි ප්‍රජාවගේ සුභසාධන අරමුණු සාක්ෂාත් කර ගැනීම වෙනුවෙන් වූ කාර්යය කටයුතු ඉකුත් වර්ෂ 03 තුලදී ප්‍රමාණාත්මක ලෙස ක්‍රියාත්මක කර නොතිබුණි. මේ හේතුවෙන් අරමුදලේ වූ මුදල් උපයෝජනය නොකර නිශ්කාර්යයව පැවති අතර එම මුදල් දීර්ඝ කාලීනව ස්ථාවර තැන්පතු වල ආයෝජනය කිරීමට පියවර ගෙන තිබුණි. | අරමුදලේ අරමුණු සාක්ෂාත් කර ගැනීම වෙනුවෙන් වූ වැඩිහිටි ප්‍රජාවගේ සුභසාධන කාර්යයන් කාර්යක්ෂමව ඉටුකළ යුතුය. | සුභසාධන වැඩසටහන් ප්‍රමාණාත්මක ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ ප්‍රමාණාත්මක ලෙස අවධානය යොමු වී නොතිබුණි. | අරමුදලේ මුදල් උපයෝජනය කර වැඩිහිටි ප්‍රජාවගේ සුභසාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම කෙරෙහි සභාවේ ප්‍රමාණවත් හා ප්‍රමුඛ අවධානය මෙතෙක් යොමු වී නොතිබුණි. |
| (ඇ) | වයස අවුරුදු 75 දක්වා වූ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ වෛද්‍ය රක්ෂණ ක්‍රමයක් ඇති කිරීම සහ අවුරුදු 65 ඉක්ම වූ වැඩිහිටියන් වෙනුවෙන් වූ | ජාතික ප්‍රතිපත්ති ප්‍රකාශය පිළියෙල කර කඩිනමින් අවසන් කළ යුතුය. | ජාතික ප්‍රතිපත්තිය සඳහා මේ වන විට කැබිනට් අනුමැතිය ලබාගෙන ගැසට් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. | ජාතික ප්‍රතිපත්තිය පිළියෙල කර අවසන් කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | පොදු ප්‍රවාහන පහසුකම් සැපයීම වෙනුවෙන් වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම 2016 වර්ෂයේදී ආරම්භ කර තිබුණි. ඒ සඳහා සලසාගෙන තිබුණු ප්‍රතිපාදනය රු.5,000,000ක් වූ අතර ඉන් රු.3,305,836ක් වැඩිහිටි මහ ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 331ක දැනුවත් කිරීම් වැඩසටහන සඳහා නිදහස් කර තිබුණි. ඉතිරි වූ රු.1,694,164ක් විවිධ තැන්පත් ගිණුම්වල රඳවාගෙන තිබුණි. වර්ෂ 05කට අධික කාලයක් ගත වී තිබුණු නමුත් ජාතික ප්‍රතිපත්ති ප්‍රකාශය සකස් කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. | | | |
| (ඉ) | වැඩිහිටි නිවාස ඉදිකිරීම සඳහා 2011 වර්ෂයේදී තෑගි ඔප්පු මඟින් ආයතනයට පරිත්‍යාග කර තිබුණු තක්සේරු වටිනාකම රු. 13,000,000ක් වූ ගම්පහ හෝලි ක්‍රොස් ඉඩම සහ රු.3,200,000ක් වූ හාරගම රාජිත වත්ත යන ඉඩම් අදාල කාර්යයන් ඉටුකිරීම අපොහොසත් වීම හේතුවෙන් නිශ්කාර්යව පැවතිණි. | මහ ලේකම් කාර්යාලයට පරිත්‍යාග කළ ඉඩම් වැඩිහිටි ප්‍රජාවගේ සුභසාධන කටයුතු සඳහා උපයෝජනය කළයුතු වීම. | ඉඩම් අත්පත් කරගැනීමේ ක්‍රියාදාමයට පිවිසීමට ඉඩම් සැලැස්මක් සකස් කර ගැනීම සඳහා සුදුසකම් ලත් මිනින්දෝරුවන්ගෙන් ලංසු කැඳවා තිබුණි. | වැඩිහිට ප්‍රජාවගේ සුභසාධනය සඳහා එකී ඉඩම් උපයෝජනය කර නොතිබුණු අතර ඉඩම් නීත්‍යානුකූල පරිදි පවරා ගැනීම් කටයුතු ක්‍රියාත්මක කිරීමේ කාල ප්‍රමාදයක් පැවතිණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඊ) | සහකාර අධ්‍යක්ෂ (පාලන) තනතුර සහ නීති නිලධාරී තනතුර මහලේකම් කාර්යාලය ආරම්භක අවස්ථාවේ සිට සහ සහකාර අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) තනතුර අනුමත කළ 2017 ජනවාරි 11 දින සිට පුරප්පාඩු පැවති අතර එම පුරප්පාඩු සඳහා නිලධාරීන් බඳවාගැනීමට කටයුතු කර නොතිබුණි. | ආයතනයේ අරමුණු ඉටුකර ගැනීම සඳහා වූ අනුමත කාර්යය මණ්ඩල අප්‍රමාදව බඳවා ගැනීම් සිදුකළ යුතු වීම. | අදාල තනතුර සඳහා බඳවාගැනීම් පටිපාටිය 2011 ජනවාරි 31 වන දින සහ 2017 ජූලි 06 දින අනුමත කර තිබුණු අතර නැවතත් පූර්ණ කාලීන තනතුරු වශයෙන් සංශෝධනයට අනුමැතිය ඉල්ලා තිබුණි. | පුරප්පාඩු වූ තනතුරු සඳහා 2021 වර්ෂයේදීද බඳවාගැනීම් සිදුකර නොතිබුණි. |

## 54. විජය කුමාරතුංග අනුස්මරණ රෝහල

මූලාා ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 - තතත්ත්වාගණනය කළ මතය

2019 - තතත්ත්වාගණනය කළ මතය

2020 - තතත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජා ව්‍යාපාර චක්‍රලේඛයේ 5 වන පරිච්ඡේදයේ 5.1.2 ඡේදය ප්‍රකාරව, ආයතනයේ සංවිධාන සැලැස්ම, ආයතනයේ ශක්තිය, දූර්වලතා, බාහිර තර්ජන හා අවස්ථාපිළිබඳ විශ්ලේෂණය, අරමුණුවලට ගැලපෙන පරිදි අදාළ කාලසීමාව තුළ ළඟාවීමට අපේක්ෂිත ඉලක්ක හා ඒ සඳහා ක්‍රියාත්මක උපායමාර්ග ඇතුළත්ව සංයුක්ත සැලැස්ම පිළියෙල කල යුතු අතර එය වාර්ෂිකව යාවත්කාලීන කළ යුතු වුවද, රෝහල 2016 - 2020 කාලපරිච්ඡේදය සඳහා පිළියෙලකර තිබුණු සංයුක්ත සැලැස්ම ඒ අයුරින් පිළියෙලකර නොතිබුණු අතර 2018 වර්ෂය සඳහා එය යාවත්කාලීන කරද නොතිබුණි. | අදාළ චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව, චක්‍රලේඛ විධි විධානවලට අනුගත වන පරිදි සංයුක්ත සැලැස්මක් පිළියෙල කර ක්‍රියාත්මක කළ යුතුය. | ආයතනය ගන්නා ක්‍රියාමාර්ග ඉදිරිපත් කර නොතිබුණි. | 2021 ජනවාරි 31 දින වන විටත් චක්‍රලේඛ විධි විධානවලට අනුගත වන පරිදි සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා රාජා අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 65 ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවකාලය වාර්ෂිකව සමාලෝචනය | ප්‍රමිතය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 7 හි 65 ඡේදය ප්‍රකාරව සම්පූර්ණයෙන් ක්ෂය වූ වත්කම් පිළිබඳව වාර්තාවක් පිළියෙල කොට එහි | 2022 ජනවාරි 31 දින වන විටත් සම්පූර්ණයෙන් ක්ෂය වූ වත්කම්වල ඵලදායී ජීවකාලය |

| | | | | |
|---|---|---|---|---|
| | නොකිරීම හේතුවෙන් සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණු නමුත් දැනටත් භාවිතා කරනු ලබන පිරිවැය රු.197,080,968ක් වූ වත්කම්වල ඵලදායී ජීවකාලය පිළිබඳව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 ප්‍රකාරව ප්‍රතිශෝධනය කර නිවැරදි ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි. | | ප්‍රත්‍යාගණන කටයුතු සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත යොමු කොට ඇත. | සමාලෝචනය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 1999 අංක 38 දරන විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලා මණ්ඩලය පනතේ 7 වගන්තිය ප්‍රකාරව, ආරෝග්‍යශාලා මණ්ඩලය පනතේ උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති සීදුවේ පිහිටි ඉඩමේ අයිතිය 2021 අප්‍රේල් 30 දින වන විටත් ආරෝග්‍යශාලා මණ්ඩලය වෙත පවරා ගැනීමට කටයුතුකර නොතිබුණි. | පනතේ නිශ්චිතව දක්වා ඇති පරිදි ඉඩමේ අයිතිය ආරෝග්‍යශාලා මණ්ඩලය වෙත පවරා ගැනීම කඩිනමින් කළ යුතුය. | ඉඩමේ අයිතිය රෝහල් අධ්‍යක්ෂ මණ්ඩලයට පවරා ඇති බව. | 2022 ජනවාරි 31 දින වන විටත් පනත ප්‍රකාරව ඉඩමේ අයිතිය ආරෝග්‍යශාලා මණ්ඩලය වෙත පවරා ගැනීමට කටයුතුකර නොතිබුණි. |

## 55. විශ්වවිද්‍යාල විද්‍යායතනය

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 - තතත්ත්වාගණනය කළ මතය

2019 - තතත්ත්වාගණනය කළ මතය

2020 - තතත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | පාඨමාලා 09 ක් සඳහා සිසුන් 315 දෙනෙකු බඳවා ගැනීමේ හැකියාවක් විද්‍යායතනයට තිබුණද, 2015 සිට 2019 වර්ෂය දක්වා බඳවාගෙන තිබුණේ පිළිවෙලින් සිසුන් 109 ක්, 239ක්, 186ක්, 224ක් හා 230 ක් පමණි. ඒ අනුව පසුගිය වසර 05 ක කාලය තුල විද්‍යායතනයේ උපයෝජනය කර තිබුණේ මුළු ධාරිතාවයෙන් සියයට 34 සිට සියයට 73 දක්වා ප්‍රතිශතයක් පමණි. | පාඨමාලා කාර්යක්ෂමව හා ඵලදායීව පවත්වාගෙන යා හැකි පරිදි පූර්ණ ධාරිතාවයෙන් යුක්තව සිසුන් බඳවා ගැනීමට කටයුතු කල යුතුවේ. | 2015 වර්ෂයේදී විද්‍යායතනය තුල පැවතියේ පාඨමාලා 6 ක් පමණක් වන අතර 2016 වර්ෂයේදී පාඨමාලා 6 ක් පමණක් වන අතර 2016 වර්ෂයේදී පාඨමාලා 8 ක් පැවතුණි. 2017 වර්ෂයේ සිට පාඨමාලා 09 වූ අතර එම පාඨමාලා පිළිබඳ සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් දියත් කර ඇත. | බඳවා ගන්නා සිසුන් ප්‍රමාණය වැඩිකර ගැනීමට කටයුතු කරමින් පවතී. |
| (ආ) | ශීතකරණ සහ වායු සමීකරණ පාඨමාලාව සඳහා 2018 ජූනි 05 දින සිට ප්‍රදර්ශකවරයෙකු නොමැතිවීම හා කෘෂි යන්ත්‍ර තාක්ෂණ පාඨමාලාව සඳහා වසර දෙකක පමණ සිට ප්‍රදර්ශකවරයෙකු, නොමැතිවීම හා අධ්‍යයන හා පුහුණු කටයුතු සඳහා ප්‍රමාණවත් උපකරණ නොමැතිවීම හා මෝටර් රථ තාක්ෂණ පාඨමාලාව සඳහා ප්‍රදර්ශකවරයෙකු නොමැතිවීම සහ පුහුණු කටයුතු සඳහා Automobile Continuing | අදාල තනතුරු සඳහා නොපැමිණීමට හේතු සොයාබලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුයි. | එම තනතුරු සඳහා පුවත්පත් දැන්වීම් සහ වෙබ් අඩවි දැන්වීම් මගින් අයදුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණ පවත්වා ඇත | මෝටර් රථ තාක්ෂණ පාඨමාලාව සඳහා විද්‍යාගාර සහයකයෙකු බඳවා ගත් අතර ඔහු සේවයෙන් ඉවත්ව ගොස් ඇත. මෝටර් රථ තාක්ෂණ පාඨමාලාව සඳහා සුදුසුකම් ඇති අයකු සම්මුඛ පරීක්ෂණ සඳහා සහභාගී වී නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | traine panel එකක් නොමැතිවීම හේතුවෙන් එම අංශවල මෙහෙයුම් කටයුතු කාර්යක්ෂමව පවත්වාගෙන යාමට නොහැකිවී තිබුණි. | | | |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුල ස්ථිර කාර්ය මණ්ඩලයට අයත් දේශකවරුන් 16 දෙනෙකුගෙන් අධ්‍යයන කටයුතු පිළිබඳ ඇගයීම් සිදුකර තිබුණේ දේශකවරැුන් දෙදෙනෙකුගෙන් පමණක් වූ අතර බාහිර දේශකවරුන් 35 දෙනෙකු අතරින් කිසිදු දේශකවරයෙකුගේ දේශන පිළිබඳ ඇගයීමකට පත්කර නොතිබුණි. | හේතු සොයාබලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුයි. | මින් ඉදිරියට ඇගයීම් කටයුතු කිරීමට සැලසුම් කරමි | ඒ සඳහා කටයුතු කරමින් පවතී. |
| (ඈ) | පාලක මණ්ඩලයේ හෝ අමාත්‍යාංශයේ අනුමැතියක් ලබාගැනීමකින් තොරව ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු සඳහා රු.1,566,000ක අත්තිකාරම් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට ගෙවා තිබුණි. | අදාල අනුමැතියන් ලබා ගැනීම කල යුතුවේ. | මෙම කොන්ත්‍රාත්තුව පවරා ඇත්තේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ රජයේ ආයතනයකටය | 2021 වර්ෂය අවසානය දක්වාම අනුමැතිය ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඉ) | ප්‍රමාණවත් හේතු රහිතව ඉන්දියානු නිෂ්පාදන ප්‍රතික්ෂේප කර චීනයේ එකලස් කරන ලද විදුලි ජනක යන්ත්‍රයක් මිලදීගැනීමට තීරණය කිරීම හේතුවෙන් රු.1,276,385 ක මුදලක් වැඩිපුර ගෙවීමට සිදුවී තිබුණි. | ඉදිරියේදී නියමිත ප්‍රසම්පාදන පටිපාටි වලට අනුකූලව වැඩ හා සේවා ලබා ගැනීම් කල යුතුයි. | මේ පිළිබඳව විශ්වවිද්‍යාලයේ ගත් තීරණයක් මත සිදුකර ඇත. ප්‍රසම්පාදන කමිටුව මෙන්ම තාක්ෂණික කමිටුවද මේ තීරණය පිළිගෙන ඇත. | ඉදිරියේදී නියමිත ප්‍රසම්පාදන පටිපාටිය අනුව කටයුතු කරන බව දන්වා ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඊ) | පාලක මණ්ඩලයේ හෝ අමාත්‍යාංශයේ අනුමැතියකින් තොරව, ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව හා ගිවිසුම් අත්සන් කිරීමකින් තොරව රු.6,693,000ක් වූ කොන්ත්‍රාත් 02 ක ඉදිකිරීම් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට ලබාදීමේදී ඒ සඳහා ගිවිසුමක් අත්සන් කර නොතිබුණි. | අදාල අනුමැතිය ලබා ගැනීම හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින් අදාල ගිවිසුම් ගතවීම සිදුකල යුතුවේ. | මෙම කොන්ත්‍රාත්තුව භාරදී ඇත්තේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ රාජ්‍ය ආයතනයකටය | ගිවිසුම් අත්සන් කිරීමට කටයුතු කරමින් පවතී. |
| (උ) | අනුමත කාර්යමණ්ඩල විස්තරය අනුව අධ්‍යයන කාර්යමණ්ඩලයේ තනතුරු 02 ක පුරප්පාඩු 09 ක්ද, තනතුරු දෙකක අතිරික්තයක්ද, අනධ්‍යයන කාර්යමණ්ඩලයේ තනතුරු 03 ක පුරප්පාඩු 11 ක්ද වශයෙන් පුරප්පාඩුව පැවතුණි. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට හා අතිරික්තයන් අනුමත කර ගැනීමට කටයුතු කල යුතුවේ. | එම තනතුර සඳහා පුවත්පත් දැන්වීම් හා වෙබ් අඩවිය මගින් අයදුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණද පවත්වා ඇත. | පුරප්පාඩු තනතුර බඳවා ගැනීමට කටයුතු කරමින් පවතී. |
| (ඌ) | සමාලෝචිත වර්ෂය අවසානයට ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම්වල වටිනාකම නිශ්චය කර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණු අතර විද්‍යායතනය පිහිටුවා වසර 05 කට වැඩි කාලයක් ගතවී ඇතත් එය පිහිටි හෙක්ටයාර් 5.4 ක භූමි ප්‍රමාණය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් විද්‍යායතනය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම් වටිනාකම් නිශ්චය කර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කල යුතු අතර ඉඩම් පවරා ගැනීම සඳහා කඩිනමින් කටයුතු කල යුතුය | විද්‍යායතනයට අදාල භූමිය පවරා ගැනීමට අදාල කටයුතු සිදුකරගෙන යනු ලබයි. | භූමිය පවරා ගැනීමට අදාල කටයුතු සම්පාදනය කරමින් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| (එ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(1) හා (2) හා 2009 ජූනි 09 දිනැති අංක ඩීඑම්ඒ/2009(1) දරන විගණන හා කළමනාකරණ දෙපාර්තමේන්තු මාර්ගෝපදේශ සංග්‍රහයේ 03 ඡේදය ප්‍රකාරව අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි. | අභ්‍යන්තර විගණනයක් සිදුකිරීමට කටයුතු කල යුතුවේ. | අභ්‍යන්තර විගනන ඒකකයක් ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීමට අවශ්‍ය කටයුතු සැලසුම් කරමින් පවතී. | නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරමින් පවතී. |
| (ඒ) | 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 ඡේදය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටුවක් පත්කර නොතිබුණි. | විගණන හා කළමනාකරණ කමිටු ස්ථාපිත කර ක්‍රියාත්මක කල යුතුවේ. | විගණන කමිටුවක් ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීමට අවශ්‍ය කටයුතු සැලසුම් කරමින් පවතී. | නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරමින් පවතී. |

## 56. ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - තතත්ත්වාගණනය කළ මතය

2019 - තතත්ත්වාගණනය කළ මතය

2020 - තතත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | ජාවත්ත පරිශ්‍රයේ පිහිටි බාහිර පාර්ශවයන් විසින් භාවිතා කරනු ලබන ගොඩනැගිලි 13 ක් සඳහා තක්සේරු වාර්තා අනුව අයකර ගතයුතු කුළිය අයකර ගන්නා ලෙස දන්වා තිබුණද, රු.70,224,000ක් 2019 දෙසැම්බර් 31 දක්වා අයකරගෙන නොතිබුණි. අධිකාරිය විසින් එම ගොඩනැගිලි වෙනුවෙන් විදුලි හා ජල බිල්පත් ලෙස ගෙවා තිබුණු රු.27,027,871ක් අදාල පාර්ශව වෙතින් ප්‍රතිපූරණය කරගෙන නොතිබුණි. | අයකර ගතයුතු කුලී අයකර ගැනීමට හා දරන ලද වියදම් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කල යුතුය. | රාජ්‍ය ආයතන අතර නෛතික ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධව අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ජාවත්ත පරිශ්‍රයේ ගොඩනැගිලි වලින් කුලී අය කර ගැනිම සම්බන්ධ ගැටළුව විසදා ගැනිම සඳහා උපදෙස් ඉල්ලා අමාත්‍යංශ ලේකම් වෙත ලිපියක් යොමු කර ඇත. විදුලි හා ජල බිල්පත් වෙනුවෙන් ලැබිය යුතු මුදලින් රු.21,195,379ක මුදලක් ප්‍රතිපූරණය කරගැනීමට කටයුතු කර ඇත. | 2022 පෙබරවාරි වනවිටත් රු.70,224,000 ගොඩනැගිලි කුලී හා රු.5,832.492ක විදුලි හා ජල බිල්පත් අයකර ගෙන නැත. |
| (ආ) | 2017 වර්ෂයේ රු.8,550,788ක් වැයකර අළුත්වැඩියා කර තිබුණු කොත්මලේ කාර්යභාර ඉංජිනේරු කාර්යාලය සතු දොඹකර යන්ත්‍රයක් නිසි පරිදි අළුත්වැඩියා කර නොතිබීම හේතුවෙන් 2017 දෙසැම්බර් 29 දින සිට 2019 මැයි දක්වා නිශ්කාර්යව පැවතුණි. | නිසි පරිදි අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළයුතුය. | 2022 ක්‍රියාකාරි සැලැස්මට ඇතුලත් කොට මෙම අළුත් වැඩියාව නිම කිරිමට සැලසුම් කර ඇත. | 2022 පෙබරවාරි වනවිටත් අලුත්වැඩියා කටයුතු සිදුකර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | කොත්මලේ කාර්යභාර ඉංජිනේරු කාර්යාලයේ පවතින නැරඹුම් මැදිරිය ප්‍රතිසංස්කරණය කිරීම සහ පැරණි වේලි ආදර්ශනය ඉවත්කර නව වේලි ආදර්ශනයක් සැකසීම සඳහා 2017 වර්ෂයේ රු.6,990,000කට කොන්ත්‍රාත්තුවක් පිරිනමා තිබුණු අතර ඉන් රු.2,060,000 ක ඇස්තමේන්තුවක් සහිත වේලි ආදර්ශනය දෝෂ සහිතව සහ අඩු ගුණත්වයෙන් යුතුව සකසා තිබුණි. කොන්ත්‍රාත් පිරිනැමීමේදී කාර්යසාධන ඇපකරයක් ලබා ගෙන නොතිබීම නිසා ගිවිසුම් ප්‍රකාරව කාර්යය නිමනොකිරීම නිසා අධිකාරියට වූ පාඩු අයකර ගත නොහැකි වී තිබුණි. | ඉදිකිරීම් කොන්ත්රාත් ගිවිසුම් ප්‍රකාරව ප්‍රමිතියෙන් යුතුව සිදුකිරීම හා ගිවිසුම් කඩකිරීම් මත සිදුවන පාඩු ආවරණය කරගත හැකි පරිදි කාර්යසාධන සුරක්ෂණ ලබාගැනීමට පියවර ගත යුතුය. | වේලි ආදර්ශනයේ දෝෂ හා අඩු ගුණාත්මකභාවය පිළිබඳ කාර්යභාර ඉංජිනේරු විසින් වාචිකව හා ලිඛිතව අවස්ථා කිහිපයකදීම කොන්ත්‍රාත්කරු දැනුවත් කර ඇත. එම ආදර්ශනය නැරඹුම් මැදිරියට පැමිණෙන නරඹන්නන් සඳහා ප්‍රදර්ශනයට සුදුසු තත්වයක නොමැති බැවින් මෙය නැරඹුම් මැදිරියෙන් ඉවත් කර ගන්නා ලෙස කොන්ත්‍රාත්කරුට දන්වා ඇත. | ගිවිසුම් ප්‍රකාරව කාර්ය නිම නොකිරීම නිසා අධිකාරියට වූ පාඩු අයකර ගෙන නොමැත. |
| (ඇ) | 2013 වර්ෂයේදී එවකට විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය මත වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයක් ඉදිකිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා හිරා පදනම වෙත ලබා දී තිබුණු අක්කර 35 ක ඉඩම පසුව 2016 වර්ෂයේදී ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් විෂයභාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතියකින් තොරව පෞද්ගලික සමාගමක් වූ බැටිකලෝ කැම්පස් ( ප්‍රයිවට් ) ලිමිටඩ් වශයෙන් වෙනස් කර | නිසි අධිකාරී බලයක් රහිතව ඉඩම් බැහැර කිරීමට අනුමැතිය ලබාදීම සම්බන්ධව ක්‍රියාමාර්ග ගත යුතු අතර අනවසරයෙන් අත්පත් කරගෙන ඇති ඉඩම් නැවත අධිකාරිය වෙත පවරාගැනීමට කටයුතු කළ යුතුය. රජයේ ඉඩම් අවසතු කිරීම රාජ්‍ය ප්‍රතිපත්තියට අනුව හා රජයේ ඉඩම් ආඥා පනතට අනුකූලව | මේ පිළිබඳ වාලච්චේන උසාවියේ 35743, 35744, 36394 නඩු අංක මගින් නඩු පවරා ඇත. | නඩු ක්‍රියාත්මක තත්වයේම පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | දීර්ඝකාලීන බදු ඔප්පුව එම සමාගමේ සභාපති නමින් නිකුත් කර තිබුණි. ලබා දී තිබුණු අක්කර 35 ට වඩා අනවසරයෙන් භුක්ති විදින බව ක්ෂේත්‍ර පරීක්ෂාවේදී අනාවරණය වුවත් එම කොටස මේ දක්වා අධිකාරිය වෙත පවරාගෙන නොතිබුණි. 2017 වර්ෂයේ තවත් අක්කර 45 ක් හිරා පදනම නමින් ඉල්ලා තිබුණු අතර ඒ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කිරීම සඳහා අමාත්‍යාංශ ලේකම් විසින් විෂයභාර අමාත්‍යවරයාගෙන් පූර්ව අනුමැතිය ඉල්ලා තිබුණි. අමාත්‍යවරයා විසින් සිය අත්සන පමණක් යොදා තිබුණු අතර ඒ අනුව එම අක්කර 45 ලබාදීමට අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී තිබුණි. | සිදුකළ යුතුය. | | |
| (ඉ) | අධිකාරියට අයත් මහවැලි ආරක්ෂක බළකායේ සේවය කරන ලද සේවකයින් 44 දෙනෙකු 2015 වර්ෂයේ සිට විවිධ රාජ්‍ය ආයතන වෙත නිදහස් කර තිබුණු අතර, ඉන් 12 දෙනෙකු 2018 වර්ෂය තුළදී නැවත ආරක්ෂක බළකායේ සේවයට වාර්තා කර තිබුණි. උක්ත නිලධාරින්ට 2018 දෙසැම්බර් 31 දින වන විට ගෙවූ වැටුප් රු.66,141,532ක්, හා අතිකාල හා ගමන් වියදම් රු.31,448,940ක් අදාල | අදාල ගෙවීම් ප්‍රතිපූරණය කර ගැනීමට කටයුතු කළයුතුය. | මෙම මුදල් ප්‍රතිපූරණය කරන ලෙස අදාල ආයතන දැනුවත් කර ඇත. | 2022 පෙබරවාරි වනවිටත් ප්‍රතිපූරණය කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | ආයතනවලින් ප්‍රතිපූරණය කර ගැනීමට 2019 පෙබරවාරි 13 දින වනවිටත් අධිකාරිය අපොහොසත්වී තිබුණි. | | | |
| (ඊ) | මුදල් හා ජන මාධ්‍ය අමාත්‍යාංශයේ 2018 මාර්තු 19 දිනැති අංක 1/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 2 (ආ) වගන්තිය ප්‍රකාර ධාවනය කළ නොහැකි තත්ත්වයේ පවතින සියළුම වාහන 2018 ජුනි 30 දිනට පෙර අපහරණය කළ යුතු වුවත් අධිකාරිය විසින් එපරිදි කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව අවශ්‍ය කටයුතු කළ යුතුය. | අපහරණය කල යුතු වාහන හදුනාගැනීම සඳහා කමිටුවක් පත්කර එම හදුනාගත් වාහන වල තක්සේරු අගයන් නියම කිරීමට පියවර ගෙන ඇත.<br>වාහන 15 ක් අලුත්වැඩියා කර ධාවනයට එක් කර ඇත. | 2022 පෙබරවාරි වනවිටත් වාහන අපහරණ කටයුතු සිදුකර නොමැත. |
| (උ) | 1947 අංක 8 දරන රජයේ ඉඩම් ආඥා පනතේ 217(2)(vi) වගන්තිය ප්‍රකාර වාණිජ හෝ කාර්මික කටයුතු සඳහා ඉඩම් බදු දීමේදී වෙළඳපළ වටිනාකම තක්සේරු කර බදු මුදල් අයකළ යුතු වුවත් තඹුත්තේගම නේවාසික ව්‍යාපාර කළමනාකරණ බල ප්‍රදේශය තුල ඉඩම් කැබලි 18 ක් කළුගල් කැඩීම සඳහා බදු පදනමට බැහැර කර තිබුණද 2020 පෙබරවාරි 27 වූ විගණිත දිනය දක්වා එම කිසිදු ඉඩමක් මැනීම් කර ඒවායේ රජයේ තක්සේරු අගය මත බදු මුදල් අයකර නොතිබුණි. | 1947 අංක 8 දරන රජයේ ඉඩම් ආඥා පනත ප්‍රකාරව කටයුතු කර අදාල බදු නියමිත පරිදි අය කල යුතුය | කැනීම් භූමි සඳහා රජයේ තක්සේරුව ලබා ගැනිමට තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. | 2022 පෙබරවාරි වනවිටත් තක්සේරුව ලැබී නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඍ) | අධිකාරියට අයත් ගබඩා 43 ක් 2009 වර්ෂයේ සිට වී අලෙවි මණ්ඩලය විසින් භාවිතා කරනු ලැබුවද, එම ගබඩා වෙනුවෙන් කිසිදු කුලී මුදලක් 2020 දෙසැම්බර් 31 දින වනවිටත් අයකර ගෙන නොතිබුණි. එම ගබඩා වී ගබඩා කිරීමට ප්‍රමිතගත පරිදි අලුත්වැඩියා කිරීමේ අවශ්‍යතාවයක් පවතින බැවින්, එම ගබඩාවල අයිතිය වී අලෙවි මණ්ඩලය වෙත පවරා දෙන මෙන් වී අලෙවි මණ්ඩලයේ සභාපති විසින් මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ගෙන් ඉල්ලීමක් කර තිබුණි. කෙසේ වුවද එම ඉඩම් පැවැරීමට හෝ බදු මුදල් අයකර ගැනීමට 2020 දෙසැම්බර් 31 දින වනවිටත් අපොහොසත්වී තිබුණි. | ගබඩා කාර්යක්ෂමව හා ඵලදායීව භාවිතා කිරීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතු අතර අදාල කුලී මුදල් අයකර ගත යුතුය. | මෙම පැවරීම් කටයුතු සිදුකිරීම සඳහා අධිකාරියට අයත් වී අලෙවි මණ්ඩලය විසින් ඉල්ලුම් කර ඇති ගබඩා ගොඩනැගිලිවල තක්සේරු වටිනාකම් ලබා ගැනීමට තක්සේරු දෙපාර්තුමේන්තුව වෙතින් ඉල්ලීම් කර ඇත. | තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරුව ලබා දීමට අවශ්‍ය දේපලවල මිනින්දෝරු සැලැස්ම ඉදිරිපත් කරන ලෙස දන්වා තිබුණු අතර එම තොරතුරු පිලියෙල කරමින් පවතී. |
| (එ) | තඹුත්තේගම නේවාසික ව්‍යාපාර කළමනාකරණ බල ප්‍රදේශය තුල පිහිටි කළුගල් කැනීම් බලපත්‍ර 8 ක නියැදි පරීක්ෂාවේදී භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය වෙත කළුගල් කියුබ් 75,973.8ක් සඳහා රාජ්‍ය භාගය ගෙවා තිබුණද මහවැලි අධිකාරියේ තඹුත්තේගම නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලය විසින් ගාස්තු අයකර තිබුනේ කළුගල් කියුබ් 8,369.5 ක් සඳහා පමණි. ඒ අනුව ඉපයිය හැකිව තිබුණු | කැනීම් බලපත්‍ර සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂාවක් සිදුකර ඉවත්කර ඇති කළුගල් ප්‍රමාණයන් නිශ්චිතව ගණනය කර අදාල ඉඩම් පරිහරණ ගාස්තු අයකල යුතුය. | භූවිද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය වෙත රාජ්‍ය භාගය ගෙවනු ලබන කැනීම් පරිමාව මත පදනම්ව ඉඩම් පරිහරණ ගාස්තු අයකල යුතු බවට 2019 මාර්තු 21 අභ්‍යන්තර චක්‍රලේඛයක් නිකුත් කර ඇත. | එම චක්‍රලේඛය ප්‍රකාරව කැනීම් පරිමාව මත අය කිරීම් සිදු කරයි. අහිමි වූ ආදායම අයකරගෙන නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | රු. 66,127,150 ක ආදායමක් අහිමි වී තිබුණි | | | |
| (ඒ) | රඹකැන්ඔය කලාපයේ පොල්ලේබැද්ද නිල නිවාසය ඉදිකිරීම සඳහා 2017 වර්ෂයේ රු.4,861,105ක කොන්ත්‍රාත් ගිවිසුමටකට එළඹ තිබුණු අතර අත්තිකාරම් ලෙස රු.1,243,051ක් ගෙවා තිබුණි. කොන්ත්‍රාත් කාලය අවස්ථා 2 කදී 2018 දෙසැම්බර් 28 දක්වා දීර්ඝකර තිබුණද එදිනට වැඩ නිමකර නොතිබුණි. 2018 නොවැම්බර් 20 දින කාර්යසාධන ඇපකරයේ වලංගු කාලය අවසන් වී තිබුණද එහි වලංගු කාලය දීර්ඝකරගෙන නොතිබුණි. 2019 මාර්තු 14 දින කොන්ත්‍රාත්තුව අත්හිටුවා තිබුණු අතර ප්‍රමාද ගාස්තු රු.486,110ක් අයකරගෙන නොතිබුණි. කොන්ත්‍රාත්කරුට වැඩියෙන් ගෙවනලද රු.1,402,376ක් 2020 අගෝස්තු 17 දින වන විටත් අයකරගෙන නොතිබුණි. කොන්ත්‍රාත්කරු අසාධු ලේඛණයට ඇතුලත් කිරීමට කටයුතු කර නොතිබුණි. | කළ වැඩ ප්‍රමාණය ඉක්මවා කොන්ත්‍රාත්කරුට සිදුකර ඇති ගෙවීම් හඳුනාගෙන එම ප්‍රමාණයන් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු අතර කොන්ත්‍රාත්කරු අසාධු ලේඛණ ගත කළ යුතුය. | නඩු පැවරීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුවට යොමු කර ඇත. | නීතිපති දෙපාර්තමේන්තුව මඟින් ලබාදුන් උපදෙස් ප්‍රකාරව බේරුම්කරුවෙකු මඟින් නිරවුල් කර ගැනීමට කටයුතු කරමින් පවතී. |
| (ඔ) | රඹකැන්ඔය කලාපයේ මහඔය නිල නිවාසයක ඉදිකිරීමට 2017 වර්ෂයේ රු.4,843,185ක කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ තිබුණු අතර | කළ වැඩ ප්‍රමාණය ඉක්මවා කොන්ත්‍රාත්කරුට සිදුකර ඇති ගෙවීම් හඳුනාගෙන එම | නඩු පැවරීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුවට යොමු කර ඇත. | නීතිපති දෙපාර්තමේන්තුව මඟින් ලබාදුන් උපදෙස් ප්‍රකාරව බේරුම්කරුවෙකු |

| | | | | |
|---|---|---|---|---|
| | අත්තිකාරම් ලෙස රු.1,414,555ක් ගෙවා තිබුණි. ගිවිසුම ප්‍රකාරව කටයුතු නොකිරීම හේතුවෙන් 2019 මාර්තු 14 දින කොන්ත්‍රාත්තුව අත්හිටුවා තිබුණි. කාර්යසාධන ඇපකරයේ හා අත්තිකාරම් ඇපකරයේ කාලය 2018 සැප්තැම්බර් 15 දින අවසන් වී තිබුණද ඒවායේ කාලය දීර්ඝකර ගැනීමට කටයුතු කර නොතිබුණි. කොන්ත්‍රාත්කරුගෙන් අයවිය යුතු රු.1,242,997ක මුදලක් 2020 අගෝස්තු 17 දින වන විටත් අයකරගෙන නොතිබුණු අතර කොන්ත්‍රාත්කරු අසාධු ලේඛණයට ඇතුලත් කිරීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රමාණයන් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු අතර කොන්ත්‍රාත්කරු අසාධු ලේඛණ ගත කළ යුතුය. | | මගින් නිරවුල් කර ගැනීමට කටයුතු කරමින් පවතී. |
| (ඕ) | වලව කලාපයේ මුරවැසිහේන කොට්ඨාස කාර්යාලය ඉදිකිරීම වෙනුවෙන් 2018 වර්ෂයේ රු. 14,757,550 කට ගිවිසුමකට එළඹ තිබුණු අතර අත්තිකාරම් ලෙස රු.4,323,015 ක් ගෙවා තිබුණි. ගිවිසුම ප්‍රකාරව කටයුතු නොකිරීම හේතුවෙන් 2020 ජනවාරි 22 කොන්ත්‍රාත්තුව අත්හිටුවා තිබුණි. නමුත් කොන්ත්‍රාත්කරුගේ ඉල්ලීම මත නැවත සති 6 ක් කල් දී තිබුණි. 2020 අගෝස්තු 17 දින වන විටත් වැඩ අවසන් කර නොතිබුණු අතර කොන්ත්‍රාත්කරුගෙන් රු.3,150,256 ක වැඩ ආරම්භ | කාලය දීර්ඝකිරීම් තුල වැඩ අවසන් කර නොමැතිනම් ගිවිසුම අවසන් කර අදාල සුරක්ෂණ, මුදල් කරවාගත යුතු අතර කළ වැඩ ප්‍රමාණය ඉක්මවා කොන්ත්‍රාත්කරුට සිදුකර ඇති ගෙවීම් හඳුනාගෙන එම ප්‍රමාණයන් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | කොන්ත්‍රාත්තුව 2021 දෙසැම්බර් 07 දින අත්හිටුවීමට කටයුතු කර ඇත. තවදුරටත් අයවිය යුතු රු. 2,367,072 ක මුදල සහ කාර්ය සාධන ඇපකරයේ අයවිය යුතු මුදල් 2021 දෙසැම්බර් 23 දිනැති ලිපි මගින් ඇපකර නිකුත් කර ඇති ඉදිකිරීම් ආරක්ෂණ අරමුදල වෙත දන්වා යවා ඇත. | වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරමෙන් රු. 2,367,072 ක් අයවිය යුතුව පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | කිරීමේ අත්තිකාරම් අයවිය යුතුව පැවතුණි. | | | |
| (ක) | වෙලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතියෙන් 2017 වර්ෂයේදී අධිකාරිය වෙත ලැබී දෙහිඅත්තකණ්ඩිය නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලයට අනුයුක්ත කර තිබුණු වාහනයක් මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයාගේ උපදේශකගේ කටයුතු වෙනුවෙන් මැදිරිගිරිය කලාපයේ රියදුරකු වෙත ලබා දී තිබුණි. 2019 දෙසැම්බර් 22 දින එම වාහනය අනතුරකට ලක් වී තිබුණි. මුදල් රෙගුලාසි 104(4) අනුව අලාභහානිය සිදු වූ දිනයේ සිට මාස 03 ක් ඇතුළතදී හානි සම්බන්ධ පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවත් උක්ත අනතුර සිදු වී මාස 11 කට අධික කාලයක් ගත වී තිබුණද අනතුර සම්බන්ධයෙන් පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. වාහනයට සිදු වූ රු.6,915,484ක අලාභය අදාල වගකිව යුතු නිළධාරීන්ගෙන් අයකර ගෙන නොතිබුණි. මෙම නිළධාරියා විසින් 2010, 2011 කාලසීමාව තුල වාහන දෙකක් අවභාවිතය කිරීම නිසා අධිකාරියට සිදුව තිබුණු රු.575,929ක මූල්‍යමය අලාභය 2020 දෙසැම්බර් 31 | පාඩු හා හානි සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර අදාල වගකිව යුතු පාර්ශව වෙතින් එය අයකර ගැනීමට පියවර ගත යුතුය | අභ්‍යන්තර විගණන අංශය මඟින් විමර්ශණයක් සිදු කර ඇත. අභ්‍යන්තර කමිටුවක් මඟින් වාහනය පරීක්ෂා කර බලා පරිපූර්ණ වාර්තාවක් ඉදිරිපත් කර ඇත. අංකMA/ADM/10/02/1708 හා 2021 ජුනි 25 දිනැති ලිපිය මඟින් 2021 ජූලි මස සිට වාරික 10 කින් ආයතනයට සිදුවූ මූල්‍යමය අලාභය අයකිරිමට හුරුළුවැව කලාපයට දැනුම් දී ඇත. | 2022 පෙබරවාරි වනවිට රු.6,915,484 ක අලාභයෙන් රු.ලක්ෂ 25 ක් රක්ෂණ ආයතනයෙන් ලැබී තිබුණු අතර ඉතිරි මුදල් අයකර ගෙන නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | දින වන විටත් පියවා නොතිබුණි. | | | |
| (ග) | 1947 අංක 08 දරන රජයේ ඉඩම් ආඥා පනතේ 199(3) ඡේදය ප්‍රකාරව රජයේ ඉඩම් පිළිබඳ සෑම වරණීය බද්දකටම රජයේ ඉඩම් ආඥා පනත යටතේ පනවන ලද 21(1) රෙගුලාසිය යටතේ අමාත්‍යවරයාගේ පූර්ව ලිඛිත අනුමැතිය ලබා ගත යුතු වුවත් පූර්ව ලිඛිත අනුමැතියකින් තොරව රඹකැන් ඔය කලාපයේ ඉඩම් අක්කර 3,750 ක භුක්තිය ආයෝජකයින් හත්දෙනෙකු වෙත භාරදීමට අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබා දී තිබුණි. එසේම මෙම ඉඩම්වල භුක්තිය භාරදීමට ප්‍රථම කිසිදු පාරිසරික බලපෑම් ඇගයීමක් සිදුකර නොතිබුණි. තවද මෙම ඉඩම් සඳහා තරඟකාරී හා විනිවිදභාවයකින් යුතුව අයදුම් පත් කැඳවීමකින් තොරව ජාතික ආහාර නිෂ්පාදන කාර්යසාධන කමිටුව වෙත යොමුකර ආයෝජකයින්ගෙන් අයදුම්පත් ලබාගෙන තිබුණි. 1947 අංක 08 දරන රජයේ ඉඩම් ආඥා පනතේ 199(4) ඡේදය ප්‍රකාරව අමාත්‍යවරයා විසින් වෙනත් ආකාරයට නියෝග කර ඇත්නම් මිස වරණීය ප්‍රදාන පත්‍රයක් හෝ බදුකරයක් නිකුත් කිරීමට අදහස් කරන සෑම | වාණිජ කටයුතු සඳහා ඉඩම් බැහැර කිරීමේදී තරඟකාරී හා විනිවිදභාවයකින් අයදුම්කරුවන් තෝරාගත යුතු අතර වරණීය පදනමට ඉඩම් ලබාදීමේදී රජයේ ඉඩම් ආඥා පනතේ 199 හා 206 ඡේද ප්‍රකාරව කටයුතු කළ යුතුය . | ඉඩම් ලබා දීමේ ක්‍රමවේදය විධිමත් කිරීම. අධිකාරිය සතු විශේෂ ප්‍රදේශ වල ඉඩම් බැහැර කිරීම සම්බන්ධයෙන් වාරිමාර්ග අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛ අංක 1/2021 මඟින් රජයේ ඉඩම් බැහැර කිරීමේදී අනුගමනය කල යුතු ක්‍රියාවලිය විධිමත් කිරීම සම්බන්ධයෙන් සියළුම නේවාසික ව්‍යාපාර කළමනාකරුවන් සහ ඉඩම් බැහැර කිරීම සම්බන්ධයෙන් කටයුතු කරන අංශ දැනුවත් කිරීමට කටයුතු කර ඇත. | මේ සම්බන්ධව අධිකරණයේ පවතින නඩුව 2021 වර්ෂය අවසානය දක්වාම ක්‍රියාත්මක වෙමින් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | විටකම ඒ පිළිබඳ නිවේදනයක් 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ ගැසට් පත්‍රයේ පල කල යුතු වුවත් එසේ සිදුකර නොතිබුණි. | | | |
| (ච) | මහවැලි අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන ණය වැඩසටහන් යටතේ අධිකාරිය විසින් නිර්දේශ කරන ජනපදිකයින්ට ණය ලබා දීම සඳහා ප්‍රාදේශීය සංවර්ධන බැංකුව වෙත ලබා දී තිබුණු මුදලින් රු. 150,703,811 ක ණය නිකුත් කර තිබුණද ඊට අදාල එක් එක් ණයගැති ශේෂයන් විස්තර විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | නිකුත් කර ඇති සමස්ත ණය මුදලට අදාල එක් එක් ණයගැති ශේෂ ලැයිස්තුවක් සහ ණයගැති කාල විශ්ලේෂණයක් ඉදිරිපත් කළ යුතුය. | කාල විශ්ලේෂණයන් 2021 මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කිරීමට කටයුතු කරමින් පවතී. | එක් එක් ණයගැති ශේෂයන් පිළිබඳ විස්තර ඉදිරිපත් නොකෙරුණි. |
| (ඡ) | කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලයේ 2018 දෙසැම්බර් 31 දින නිකුත් කර තිබූ මූල්‍ය නොවන වත්කම් තක්සේරුකිරීම් මාර්ගෝපදේශයේ 2.1 ඡේදය ප්‍රකාරව රජයට අයත් සියලුම ඉඩම් තක්සේරු කිරීම අත්‍යාවශ්‍ය වන අතර, එහිදී රජයේ කාර්යාල, නිවාඩු නිකේතන, වැඩපලවල් ආදිය පිහිටා ඇති රජයේ ඉඩම් තක්සේරු කර ගැනීමට ප්‍රමුඛතාවය ලබාදිය යුතු වුවද, අධිකාරියේ කාර්යාල, නිවාඩු නිකේතන හා වැඩපලවල් ආදිය පිහිටි ඉඩම් තක්සේරු කිරීමට කටයුතු කර | චක්‍රලේඛ නියමයන්ට අනුව අධිකාරියේ කටයුතු සඳහා භාවිතා කරන රජයේ ඉඩම් තක්සේරු කිරීමට පියවර ගත යුතුය | ඉඩම් පරිහරණ අයිතිය පමණක් අධිකාරිය සතුවන බැවින් එම ඉඩම් තුල ඉදිකරන ලද ගොඩනැගිලි පමණක් තක්සේරු කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | කාර්යාල, නිවාඩු නිකේතන හා වැඩපලවල් ආදිය පිහිටි ඉඩම් තක්සේරු කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | නොතිබුණි. | | | |
| (ට) | කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලයේ 2018 දෙසැම්බර් 31 දින නිකුත් කර තිබූ මූල්‍ය නොවන වත්කම් තක්සේරුකිරීම් මාර්ගෝපදේශයේ 2.1 ඡේදය ප්‍රකාරව පෞරාණික උරුමයක් ලෙස හඳුනාගත් ගොඩනැගිලි හැර අනෙකුත් සියළුම ගොඩනැගිලි තක්සේරු කොට කොම්ප්ට්‍රොලර් ජනරාල් වෙත ගොඩනැගිලි පිළිබඳ තොරතුරු ඉදිරිපත් කළ යුතු වුවත් 2020 දෙසැම්බර් 31 දින වන විටත් එම තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | චක්‍රලේඛ නියමයන්ට අනුව ගොඩනැගිලි තක්සේරු කොට ඒ සම්බන්ධ විස්තර ඉදිරිපත් කිරීමට පියවර ගත යුතුය. | සියළු කලාප වලින් තොරතුරු කැඳවා ඇති අතර වාර්තාව පිළියෙල කරමින් පවතී. | 2021 වර්ෂය අවසානය දක්වාම කොම්ප්ට්‍රොලර් ජනරාල් වෙත තොරතුරු ඉදිරිපත් කර නැත. |
| (ඩ) | 2009 දෙසැම්බර් 24 දිනැති අංක 2009/12/04/පාලන දරන අධිකාරියේ අභ්‍යන්තර චක්‍රලේඛයේ 3.1 වගන්තිය ප්‍රකාරව වෙනත් ආයතනවල රජයේ සේවකයින්ගෙන් නිල නිවාස කුලී වශයෙන් මාසික වැටුපෙන් සියයට 12.5 ක් මාසික කුලිය ලෙස අයකල යුතු වුවත් ඊට පටහැනිව විගණිත දිනය වූ 2021 පෙබරවාරි 8 වන විට දිගන ප්‍රධාන වේලි හා ජලාශ මෙහෙයුම් අංශය සතු නිල නිවාස 39 ක් සඳහා විවිධ මාසික ගාස්තු අයකර තිබුණි. | චක්‍රලේඛ නියමයන්ට අනුව නිල නිවාස සඳහා ගාස්තු අයකිරීමට පියවර ගත යුතුය. | නිල නිවාස කුලී ගාස්තු සංශෝධනය කිරීම සඳහා රජයේ තක්සේරු අගය ලබාගැනීමට කටයුතු කර ඇත. | චක්‍රලේඛය ප්‍රකාර නිල නිවාස සඳහා ගාස්තු අයකිරීමට කටයුතු කර නැත. |

| | | | | |
|---|---|---|---|---|
| (ත) | 2017 මැයි 09 දිනැති අංක ඩීජී/05/2017 දරන අධිකාරියේ අභ්‍යන්තර චක්‍රලේඛයේ ඒ 1-1 7 වගන්තිය ප්‍රකාරව විධිමත් ලිඛිත භාරදීමේ ලේඛනයක් හා එකඟතා ගිවිසුමකට යටත්ව පමණක් නිල නිවාස බාහිර රජයේ නිලධාරීන් වෙත ලබා දියයුතු වුවත් ඊට පටහැනිව දිගන ප්‍රධාන වේලි හා ජලාශ මෙහෙයුම් අංශයට අයිති නිල නිවාස 24 ක් ගිවිසුම් ගත වීමකින් තොරව ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයන් වෙත ලබා දී තිබුණි. මෙම නිල නිවාස 1985/1986 වර්ෂවල ලබා දී තිබුණු අතර ඒවායේ වර්තමාන පදිංචිකරුවන් හඳුනාගෙන ඔවුන් නිල නිවාස සඳහා හිමිකම් ඇති සේවකයන් නම් ඔවුන් සමඟ ගිවිසුම් ගත වීමට හෝ අනවසර පදිංචිකරුවන් නම් අනවසර පදිංචිය ඉවත්කිරීමට අවශ්‍ය නෛතික ක්‍රියාමාර්ග අනුගමනය කර නොතිබුණි. | චක්‍රලේඛ නියමයන්ට අනුව විධිමත් ලිඛිත භාරදීමේ ලේඛනයක් හා එකඟතා ගිවිසුමකට යටත්ව පමණක් නිල නිවාස බාහිර රජයේ නිලධාරීන් වෙත ලබා දිය යුතුය. | ගිවිසුම්ගතවීමට සභාපති ලංකා විදුලිබල මණ්ඩලය හා ලේකම් විදුලිබල අමාත්‍යාංශය වෙත ලිඛිතව දැනුම් දී ඇත. මෙතෙක් ප්‍රතිචාර නොලැබුණු හෙයින්, නීතිමය පියවර ගැනීමට කටයුතු කරමින් පවතී. | 2021 වර්ෂයේදීද ගිවිසුම් ගතවී නැත. |
| (ද) | දිගන ප්‍රධාන වේලි හා ජලාශ මෙහෙයුම් අංශයට අයත් මධ්‍යම ඉංජිනේරු කාර්යයන් පිළිබඳ උපදේශක කාර්යාංශයේ සේවකයන් හට ලබා දී තිබුණු නිල නිවාස 5 ක සන්තකය අධිකාරිය වෙත ආපසු ලබාගැනීම සඳහා නඩු | නිල නිවාස සඳහා හිමිකම් නොමැති පදිංචිකරුවන් නිවාස වලින් ඉවත්කිරීමට අවශ්‍ය නෛතික ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතු අතර හිඟ කුලී හා නිල නිවාසවලට සිදුව | නිවාස සන්තකය ආපසු ලබාගැනීම සඳහා අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කිරීම | නිල නිවාස 02 ක සන්තකය ආපසු ලබාගැනීමට කටයුතු කර නැත. ගිනිහානියට ලක්වූ නිල නිවාස 02 හි අලාභය අයකරගෙන නැත. |

| | |
|---|---|
| පවරා තිබුණද නිසි පරිදි නිවාස කුලී ගෙවීමට එකඟවූ බව දක්වමින් පසුව අධිකාරිය විසින් එම නඩු ඉල්ලා අස්කරගෙන තිබුණි. එසේ වුවද ඉන් එක් නිවසක ගිවිසගත් පරිදි නිවාස කුලී අයකරගෙන නොතිබුණි. තවත් නිල නිවසක් 2018 සැප්තැම්බර් 25 දින ගින්නකින් විනාශ වී තිබුණු අතර පදිංචිව සිටි අනවසර පදිංචිකරු පදිංචිය අතහැර ගොස් තිබීම හේතුවෙන් කුලී ගෙවීමට එකඟතාවයක් ඇතිකරගෙන නොතිබුණි. එසේම තවත් නිල නිවාස 6 ක සන්තකය ආපසු ලබාගැනීම සඳහා 2020 වර්ෂයේදී නඩු ගොනුකර 2020 පෙබරවාරි 19 දින නෙරපීම් නියෝග ලබාගෙන තිබුණද විගණිත දිනය වූ 2020 දෙසැම්බර් දක්වා නිල නිවස 5ක සන්තකය අධිකාරිය වෙත ලබා ගෙන නොතිබුණි. එලෙස නෙරපීම් නියෝගය ලද එක් නිල නිවාසක් 2020 ඔක්තෝබර් 21 දින ගිනිගැනීමකට ලක්ව තිබුණි. ගිනි හානියේ දළ ඇස්තමේන්තුව රු. 1,225,875 ක් වූ අතර, අයවියයුතු හිඟ කුලිය රු 205,320 ක් විය. විගණිත දිනට මෙම අලාභය අයකර ගැනීම සඳහා ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ඇති පාඩු හා හානි වගකිව යුතු පාර්ශව වෙතින් අයකර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ප) | 2020 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ ඉඩම් ආයෝජන ව්‍යාපෘති සඳහා දිගුකාලීන බදු පදනමට ලබාදීම පිළිබඳ විගණනයේදී කලාප 10 කින් තොරතුරු ඉල්ලා තිබුණද කලාප 5 පමණක් නියමිත ආකෘතිය ප්‍රකාරව තොරතුරු ඉදිරිපත් කර තිබුණි. මේ හේතුවෙන් අධිකාරිය විසින් ආයෝජන ව්‍යාපෘති සඳහා බැහැර කළ ඉඩම්වල සංවර්ධනය පිළිබඳ සමස්ත තත්ත්වය විගණනය කිරීමට නොහැකි විය. තොරතුරු ඉදිරිපත් කරන ලද කලාප 05 හි ආයෝජන ව්‍යාපෘති සඳහා ලබාදුන් ඉඩම් ප්‍රමාණය අක්කර 5,755ක් වූ අතර ඉන් කිසිදු සංවර්ධනයක් නොකළ ඉඩම් ප්‍රමාණය අක්කර 2,121 ක්ද සංවර්ධනය කරමින් ඇති ඉඩම් ප්‍රමාණය අක්කර 496 ක්ද සම්පූර්ණයෙන්ම සංවර්ධිත ඉඩම් ප්‍රමාණය අක්කර 3,138 ක්ද වශයෙන් පැවතුණි. ඒ අනුව ලබාදුන් මුළු ඉඩම් ප්‍රමාණයෙන් සියයට 37 ක් කිසිදු සංවර්ධනයක් කර නොතිබුණි. විගණනය වෙත තොරතුරු ලබාදුන් කලාප 7 ක ඉඩම් ලබාදුන් ආයෝජකයින් 123 දෙනෙකුගෙන් 2020 දෙසැම්බර් 31 දිනට රු.68,598,808ක බදු මුදලක් අය විය යුතුව පැවතුණි. | ඉඩම් ලබාදීමේ පරමාර්ථ ඉටුකරගත හැකි පරිදි ඉඩම් සංවර්ධනය කිරීම පිළිබඳ පසුවිපරම් කල යුතු අතර සංවර්ධනය නොකරන ඉඩම් නැවත පවරාගෙන සුදුසු කාර්යයන් සඳහා භාවිතා කළ යුතුය. හිඟ බදු අයකරගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. | බදු නොගෙවන ආයෝජන ව්‍යාපෘති ඉඩම් අවලංගු කිරීමට පියවර ගනිමින් පවතී. | 2020 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.68,598,808න් මේ වනවිට අයකරගත් ප්‍රමාණය විගණනයට ඉදිරිපත් නොවුණි. |

## 57. ශ්‍රී ලංකා අනුකූලතා තක්සේරු පිළිබඳ ප්‍රතීතන ආයතනය

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 - තතත්ත්වාගණනය කළ මතය

2019 - තතත්ත්වාගණනය කළ මතය

2020 - තතත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2019 වර්ෂයේ සිට පැවත එන ජොෂ්ඨ මට්ටමේ තනතුරු 02 ක් තෘතීයික මට්ටමේ තනතුරු 02 ක් හා ද්වීතියික මට්ටමේ තනතුරු 01ක් වශයෙන් වන තනතුරු 05ක පවතින පුරප්පාඩු සඳහා අවශ්‍ය බඳවා ගැනීම් 2021 අප්‍රේල් 20 දින වන විටත් සිදු කර නොතිබුණි. එසේම මෙම පුරප්පාඩු තුළ පවතින අතිරේක අධ්‍යක්ෂ තනතුර 2012 වර්ෂයේ සිට පුරප්පාඩුව පවතින අතර කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට අනුමැතිය ලැබී තිබියදීත් ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණු අතර නියෝජ්‍ය අධ්‍යක්ෂ(මූල්‍ය) තනතුරද 2019 දෙසැම්බර් සිට පුරප්පාඩුව පැවතුණි. | ආයතනයේ අරමුණු කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට කටයුතු කළ යුතුය | තනතුරු සඳහා සුදුසුකම් සහිත නිලධාරීන් පත් කරමින් පුරප්පාඩු පිරවීමෙන් ඇති අවශ්‍යතාව පිළිබඳව අමාත්‍යාංශය දැනුවත් කරමින් අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම සඳහා කැබිනට් පත්‍රිකාවක් සකස් කොට ඉදිරිපත් කර ඇත. අදාළ පත්වීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙහි අනුමැතියට ඉදිරිපත් කොට ඇත. | 2021 වර්ෂය අවසානය දක්වාම තනතුරු සඳහා බඳවාගෙන නොතිබුණි. |
| (ආ) | 2003 ජුනි 02 දිනැති හා අංක PED 12 දරන පොදු ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 ජේදය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසාන වී දින 150කට පසුව මණ්ඩලයේ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. | 2019 වර්ෂයට අදාල වාර්ෂික වාර්තාව භාෂා පරිවර්තනය අවසන් කොට ඇති අතර එය නිරීක්ෂණය කිරීමෙන් අනතුරුව හැකි විගස මුද්‍රණය සඳහා භාරදීමට අදාල කටයුතු සිදුකරනු ලැබේ. 2020 | 2019 වර්ෂයේ වාර්ෂික වාර්තාව මුද්‍රණය සඳහා ඉදිරිපත් කර ඇත. 2020 වර්ෂයට අදාල වාර්ෂික වාර්තාව භාෂා පරිවර්තන කටයුතු සඳහා යොමු කොට |

| | | | | |
|---|---|---|---|---|
| | යුතු වුවත්, 2019 සහ 2020 යන වර්ෂයන්ට අදාළ වාර්ෂික වාර්තා 2021 අගෝස්තු 01 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | | වාර්ෂිකව වාර්තාව සිංහල හා දෙමළ මාධ්‍යයන් පරිවර්තනයට යැවීමට සූදානම් කොට ඇත. | ඇත. |
| (ඇ) | ශ්‍රී ලංකා මුදල් රෙගුලාසි අංක 507 (2) හා 2003 ජුනි 02 දිනැති පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.5 වගන්තිය ප්‍රකාරව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් සිදු කළ යුතු වුවත් එසේ කිරීමෙන් තොරව මණ්ඩලය විසින් 2019 දෙසැම්බර් 31 දිනට ජංගම නොවන වත්කම්වල අගය රු.41,179,616ක් ලෙස ගිණුම්ගත කොට තිබුණි. | මුදල් රෙගුලාසි අංක 507 (2) හා 2003 ජුනි 02 දිනැති පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.5 වගන්තිය අනුව කටයුතු කළ යුතුය. | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයට අදාළ සියලු කටයුතු සැලසුම් කර තිබුණද හදිසියේ රට තුළ ඇති වූ තත්ත්වයත් සමඟ එය සම්පූර්ණ කිරීමට නොහැකි විය. කෙසේ වෙතත් ඉතිරි කටයුතු සම්පූර්ණ කොට ජුලි මාසය අවසාන වන විට වාර්තාව සැපයීමට කටයුතු යොදා ඇත. | 2019 වර්ෂයට අදාල වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පමණක් අවසන්කොට කමිටුව විසින් අදාල වාර්තාව ඉදිරිපත් කර ඇත. |

## 58. ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 - තතත්ත්වාගණනය කළ මතය

2019 - තතත්ත්වාගණනය කළ මතය

2020 - තතත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 47 දරන ශ්‍රී ලංකා කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සභා පනත 16 වගන්තිය ප්‍රකාරව අරමුදලක් පිහිටුවා ගත යුතු බවත්, එම අරමුදලට සභාවට ලැබෙන සියලු මුදල්, ණය, පරිත්‍යාග හා ප්‍රදාන බැර කළ යුතු බවත්, එම අරමුදලින් සභාවේ කාර්යයන් සඳහා කරනු ලබන සියලු වියදම් දැරිය යුතු බවත් සඳහන් වේ. නමුත් 2015 වර්ෂයෙන් පසුව මෙම අරමුදල ඉහත පරිදි ක්‍රියාත්මක වී නොතිබුණි. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. | පනත ප්‍රකාරව අරමුදලක් ගොඩනගා ගෙන නොමැත. |
| (ආ) | ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභා ගොඩනැගිල්ල පිහිටි ඉඩම නීත්‍යානුකූලව සභාවට පවරා ගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි. | ඉඩම නීත්‍යානුකූලව සභාවට පවරා ගැනීමට කටයුතු කළ යුතු වීම. | ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. | නීත්‍යානුකූලව පවරා ගැනීම සඳහා කටයුතු කරමින් පවතී. |
| (ඇ) | බංගලාදේශ කෘෂිකාර්මික පර්යේෂණ සභාව, මැලේසියානු කෘෂිකාර්මික පර්යේෂණ සභාව සහ කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව අතර 2011 හා 2016 වර්ෂවලදී ඇතිකරගත් අවබෝධතා ගිවිසුම් අනුව | ක්‍රියාකාරි සැලැස්ම ප්‍රකාරව පුහුණුවීම් අවස්ථා හඳුනාගෙන නිලධාරින් යොමුකිරීමට කටයුතු කළ යුතු වීම. | 2020 වර්ෂයේදී පුහුණුවීම් පැවැත්වීමට සැලසුම් කර තිබුණි. | 2020 වර්ෂයේදී ද සැලසුම් ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | කෘෂිකාර්මික ක්ෂෙත්‍රයේ උපදේශකයින් හා විද්‍යාඥයින් හුවමාරු කිරීම යටතේ කෙටිකාලීන විදේශ පුහුණුවීම් සඳහා නිලධාරීන් 10 ක් යොමුකිරීමට 2019 වර්ෂයේ ක්‍රියාකාරී සැලසුමේ දක්වා තිබුණද එවැනි පුහුණුවීම් අවස්ථා හඳුනාගෙන නිලධාරීන් යොමුකිරීමට සභාව කටයුතු කර නොතිබුණි. | | | |
| (ඇ) | විදේශ පශ්චාත් උපාධි සඳහා යොමුකිරීමේ වැඩසටහන යටතේ පුහුණුව ලබන පර්යේෂකයින් ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂෙත්‍රය දැනට මුහුණ දෙන හෝ ඉදිරියේදී මුහුණ දීමට සිදුවිය හැකි ගැටළු හා ප්‍රශ්න පිළිබඳව අවධානය යොමු කරමින් තම පර්යේෂණ මාතෘකාව තෝරා ගත යුතු බව දක්වා තිබුණද ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්ත ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය සඳහා වැඩි දියුණු කළ යුතු යැයි හඳුනාගෙන ඇති කාෂිකාර්මික යාන්ත්‍රීකරණය හා කාබනික කාෂිකාර්මික ක්ෂේත්‍රයන් පශ්චාත් උපාධිය සඳහා තෝරාගෙන තිබූ නිලධාරීන් සංඛ්‍යාව ඉතා පහළ මට්ටමක පැවතුණි. එසේ වුවත් මෙම තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා ආයතනය විසින් සැලසුම් සහගත ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි එවැනි විශේෂිත ක්ෂේත්‍ර මොනවාද යන්න තීරණය කර, ඒ අනුව තම පර්යේෂණ මාතෘකාව තෝරාගත යුතු බවට ලිඛිතව දක්වා නිලධාරීන් යොමුකිරීමටත්, ක්‍රමවේදයේ පවතින ශක්තීන් දුර්වලතා හඳුනාගෙන සුදුසු ක්‍රියාමාර්ග වලට එළඹීමටත් කටයුතු කළ යුතු වීම. | ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. | පර්යේෂණ මාතෘකා තෝරා ගැනීමේදී, නිලධාරීන් විශේෂිත ක්ෂේත්‍රවල යොදවා නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | දැනට පවතින පර්යේෂණ ආයතන 11 හි පර්යේෂණ නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් මල් වගාව, වන වගාව, කෘෂිකාර්මික යාන්ත්‍රීකරණය, ස්වභාවික සම්පත් කළමනාකරණය යන ක්ෂෙත්‍ර හතර පිළිබඳව සිදුකරන ලද පර්යේෂණ සංඛ්‍යාව පසුබෑමකට ලක්ව තිබුණි. | පර්යේෂණ නිලධාරීන් බඳවා ගැනීමට හා ප්‍රතිපාදන වැඩි කිරීමට කටයුතු කර අදාළ පර්යේෂණ සංඛ්‍යාව වැඩි කිරීමට කටයුතු කළ යුතු වීම. | ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. | පර්යේෂණ සිදු කිරීම සඳහා සභාව විසින් පර්යේෂණ ආයතන උනන්දු කර නොතිබුණි. |
| (ඊ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 ප්‍රකාරව ස්ථාවර වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් වත්කම් පන්ති දෙකක පිරිවැය රු.11,045,012ක් වූ වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණද තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තු ගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 ප්‍රකාරව ප්‍රතිශෝධන කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කර නොතිබුණි. | ඵලදායී ජීවිත කාලය සමාලෝචනයට භාජනය කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කළ යුතු වීම. | ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. | 2021 වර්ෂයේදීද මූල්‍ය ප්‍රකාශනවලට ගැලපීම් කර නොමැත. |
| (උ) | කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව දැනට පවත්වාගෙන යන ගොඩනැගිලි පරිශ්‍රයට නව කොටසක් එකතු කිරීම වෙනුවෙන් 2019 වර්ෂයේදී ගොඩනැගිලි | ගිවිසුම් ප්‍රකාරව ඉදිකිරීම් කටයුතු නිමකරවා ගත යුතු වීම. | ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. | 2021 වර්ෂය අවසානය දක්වා ද ඉදිකිරීම් කටයුතු නිමකර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | දෙපාර්තමේන්තුවට රු.2,460,000ක අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණු අතර, 2021 මැයි 7 දින දක්වාත් ගොඩනැගිල්ලෙහි ඉදිකිරීම් කටයුතු නිමකර නොතිබුණි. | | | |
| (ඍ) | සභාව විසින් කාබනික කෘෂිකර්මාන්තය සඳහා අවධානය යොමු කිරීමේ වැදගත්කම හඳුනාගෙන එම ක්ෂේත්‍රයන්හි පර්යේෂණ වැඩි කළ යුතු ප්‍රමුඛතා ක්ෂේත්‍ර 07 ක් ශ්‍රී ලංකාවේ පවතින පර්යේෂණ ආයතන වෙත හඳුන්වාදී තිබුණද, කාබනික කෘෂිකාර්මික ප්‍රතිපත්තිය සහ වර්තමානයේ වෙළඳපලේ පවතින කාබනික ආහාරවල ගුණාත්මක තත්ත්වය සම්බන්ධයෙන් පර්යේෂණ සිදු කිරීම සඳහා 2017 වර්ෂයේ සිට පර්යේෂණ ආයතන උනන්දු කර නොතිබුණි. | පර්යේෂණ ආයතන 24 ට අදාළව මෙම ප්‍රමුඛතා හඳුන්වා දෙනු ලබන බැවින් එම ආයතන මෙම පර්යේෂණ සිදුකිරීමට උනන්දු කළ යුතු වීම. | ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. | පර්යේෂණ සිදු කිරීම සඳහා සභාව විසින් පර්යේෂණ ආයතන උනන්දු කර නොතිබුණි. |
| (එ) | කෘෂිකර්ම පර්යේෂණ ආයතනවලින් කැඳවනු ලැබූ පර්යේෂණ යෝජනා වලින් ව්‍යාපෘති 02 ක් සඳහා අරමුදල් සැපයීමට 2019 වර්ෂයේදී සැලැසුම් කර තිබුණද, සමාලෝචිත වර්ෂයේදී හෝ අරමුදල් සපයා නොතිබූ අතර සමාලෝචිත වර්ෂයට අදාළව නව යෝජනා හඳුනාගෙනද නොතිබුණි. | නව ව්‍යාපෘති ආරම්භ කිරීමටත්, පවතින ව්‍යාපෘති නියමිත කාලයට නිම කිරීමටත්, ව්‍යාපෘති ප්‍රගතිය භෞතිකව පරීක්ෂා කිරීමටත් සුදුසු පියවර ගත යුතු වීම. | 2018 වර්ෂයේ හඳුනාගත් එක් ව්‍යාපෘතියකට 2021 වර්ෂයේදී අරමුදල් සපයා තිබුණි. | 2018 වර්ෂයේදී තෝරාගත් ව්‍යාපෘති 02 ක් සඳහා 2021 වර්ෂයේදීද අරමුදල් සපයා නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඒ) | කෘෂිකාර්මික පර්යේෂණ ආයතනවල සිදුකරන ලද පර්යේෂණ සංඛ්‍යාව, පර්යේෂණ සඳහා මූල්‍ය ප්‍රතිපාදන සැලැසීම, පර්යේෂක (Research officer), විද්‍යාඥ (Scientist) හා අනෙකුත් කාර්ය මණ්ඩල පිළිබඳ තොරතුරු සහ ආයතන සතු භෞතික සම්පත් පිළිබඳවත් තොරතුරු 2019 වර්ෂය දක්වා රැස්කර දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම (Information for Agricultural Research Managers) කර තිබුණද, 2010 වර්ෂයෙන් පසු එම තොරතුරු ඇතුළත් වාර්ෂිකව නිකුත් කළ යුතු ප්‍රකාශන නිකුත් කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව දත්ත පද්ධතිය යාවත්කාලීන කර වාර්ෂික ප්‍රකාශන නිකුත් කළ යුතු වීම. | 2019 වර්ෂය දක්වා දත්ත පද්ධතිය යාවත්කාලීන කර ඇති අතර 2018 වර්ෂය දක්වා වූ ප්‍රකාශනය මුද්‍රණය කර නිකුත් කිරීමට නියමිතව ඇත. | 2020 වර්ෂයට අදාළව දත්ත පද්ධතිය යාවත්කාලීන කර නොමැත. 2018 වර්ෂයෙන් පසු ප්‍රකාශන මුද්‍රණය කර නැත. |

## 59. ශ්‍රී ලංකා ජලජීවී වගා සංවර්ධන අධිකාරිය

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 - අහිතකර මතය

2019 - අහිතකර මතය

2020 - තතත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 47 වගන්තිය පරිදි දේපළ, පිරියත හා උපකරණ වල සාධාරණ වටිනාකම් එහි ධාරණ අගයෙන් ප්‍රමාණාත්මක ලෙස වෙනස් වන විට වසර 03 කට හෝ වසර 05 කට වරක් ප්‍රත්‍යාගණනය සිදුකිරීම කළ යුතු වුවද, 1998 වර්ෂයෙන් පසුව සියළු ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කර නොතිබීම නිසා පිරිවැය රු.1,702,306,274ක දේපළ පිරියත උපකරණ හා පිරිවැය රු.894,757,806ක් වූ අභිජනනාගාර වත්කම් වල සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශන වලට ගලපා නොතිබුණි. තවද අධිකාරියට අයත් දැනට අධිකාරිය විසින් භාවිතා කරන හෙක්ටයාර් 109,7597 යුත් ඉඩම් කට්ටි 14 ක වටිනාකම තක්සේරු කර ගිණුම්වලට ඇතුලත් කිරීමට කටයුතු කර නොතිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 47 වගන්තිය පරිදි දේපල වටිනාකම් හැකිතාක් තක්සේරු කර ගිණුම් වලට ඇතුළත් කළ යුතුයි. | තක්සේරු දෙපාර්තමේන්තුවට මීන් පෙර සිදුකල ප්‍රත්‍යාගණන සම්බන්ධවද නිසි අයුරින් කටයුතු නොකරන ලදි. අධිකාරියේ ඇති වත්කම් ප්‍රමාණය අනුව මෙම කාර්යය ඉතා සංකීර්ණ වන අතර නමුදු මේ සම්බන්ධව කටයුතු කිරීම පිළිබඳව සලකා බලනු ලැබේ. | අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2011 දෙසැම්බර් 13 දිනැති අංක 1736/21 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ උපලේඛන II අනුව, නිකුත් කරන මසුන් වගා කිරීමේ බලපත්‍රයේ මුල් මාස 06 ක කාලසීමාව ඉක්මවීමට පෙර, පරිසර ආරක්ෂක බලපත්‍රය ලබාගත යුතු වේ. මේ සම්බන්ධව විගණනය විසින් පරීක්ෂා කළ ලිපිගොනු 16 අතරින් කිසිදු වගාකරුවෙකු පරිසර ආරක්ෂණ බලපත්‍ර ඉදිරිපත් කර නොතිබූ බව නිරීක්ෂණය වුවද අධිකාරිය විසින් මේ සම්බන්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පනතේ සඳහන් කාලසීමාවන් තුලදී අදාල වගා පරිසර බලපත්‍ර ලබාගත යුතුය. | මේ වන විට අදාල අනුමැතින් ලබා දීම පිළිබඳ කටයුතු සිදුකිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. | බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කර නැත. |
| (ඇ) | මඩකලපුව ෆින් ෆිෂ්(Fin Fish) මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානයේ ඉදිකිරීම් සැලසුම් කිරීමේදී වාර්ෂික නිෂ්පාදනය මත්ස්‍යයන් 5,000,000ක් නිෂ්පාදනය සඳහා සැලසුම් කර තිබූ අතර එම වාර්ෂික නිෂ්පාදන ඉලක්කය 2019හා 2020 වර්ෂ වලදී පිළිවෙළින් 100,000 ක් හා 200,000 ක් වන පරිදි අඩු කර තිබුණි. එම නිෂ්පාදන මධ්‍යස්ථානයේ 2019 හා 2020 යන වර්ෂයන් වල තථ්‍ය වාර්ෂික මත්ස්‍ය නිෂ්පාදනය පිළිවෙළින් 88050 ක් හා 57,700 ක් වූ අතර එය ඉලක්ක ගත මත්ස්‍ය නිෂ්පාදනයෙන් පිළිවෙළින් සියයට 88ක් හා සියයට 29ක් ද විය. තවද 2019 | නිවැරදි ඉලක්ක කරා විධිමත් පරිදි ලඟා වීමට අවශ්‍ය ආකාරයට කටයුතු කළ යුතුය. | මූලික ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට පෙර අභිජනනාගාරය භාරදීම, අභිජනනාගාරය නිෂ්පාදන තත්ත්වයට ගෙන ඒම සඳහා සිදුකල යුතු ඉදිකිරීම් කටයුතු කිරීම සඳහා කාලයක් ගත වීම, නව තාක්ෂණය යටතේ අළුතෙන්ම ආරම්භ කළ මධ්‍යස්ථානයක් බැවින් මුල්කාලයේදී ප්‍රායෝගිකව විධිමත් තාක්ෂණික දැනුමක් අත්පත් කර ගෙන නොතිබීම හේතුවෙන් ඒ සඳහා කාලයක් ගත වීමත් නිසා අභිජනන මධ්‍යස්ථානය වෙත ලබා දී තිබූ නිෂ්පාදන ඉලක්ක ලඟා කර ගැනීමට නොහැකි වී ඇත. | 2021 වර්ෂයේදීද ඉලක්ක ලඟා කර ගැනීමට නිවැරදි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | වර්ෂයට වඩා 2020 වර්ෂයේ සියයට 59 ක අඩුවීමක්ද නිරීක්ෂණය විය. එසේ වුවත් ප්‍රදේශයේ දරිද්‍රතා මට්ටම අඩු කිරීම සඳහා ආරම්භ කර තිබුණු මෙම ව්‍යාපෘතියෙහි නිෂ්පාදන ඉලක්කය ළඟා කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | | | |
| (ඇ) | 2018 ජුලි මස 13 දින රු.42,572,925ක් ව්‍යාජ බැඳුම්කරයක් ලබා ගෙන අත්තිකාරම් මුදලක් ගෙවා තිබීම සම්බන්ධයෙන් කටයුතු කල නිළධාරීන්ට එරෙහිව ආයතන සංග්‍රහයේ II බාණ්ඩය XXVIII පරිච්ඡේදයට අනුව විනය ක්‍රියාමාර්ග ගැනීමට ඉහළ කළමනාකරණය කටයුතු කර නොතිබූ අතර එම සැපයුම්කරුට එරෙහිවද කිසිදු නීතිමය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ව්‍යාජ බැඳුම්කරය මත අත්තිකාරම් මුදල් ගෙවා තිබීම සම්බන්ධවීමට කටයුතු කළ නිළධාරීන්ට එරෙහිව ආයතන සංග්‍රහය II වගන්තියඅනුවවිනයක්‍රි යාමාර්ගගතයුතුය | මෙම සමාගම මේ වන විට අසාදුලේඛන ගත කර ඇත . මීට අමතරව මෙම සමාගම විසින් ලබාදුන් කාර්යසාධක බැඳුම්කරය මුදලින් අපට වැයවූ මුදල් වලට අමතරව අපහට මෙම යන්ත්‍ර මිලදී ගැනීමට නොහැකි වීමෙන් රජයට සිදු අලාභ හානියද ආවස්ථිත පිරිවැය ලෙස ගණන් බලා එම ගණන්ද අඩුකර ඇතිබව දන්වා සිටිමි. | පරීක්ෂා කිරීමකින් තොරව ව්‍යාජ බැඳුම්කරණයක් ලබා ගෙන අත්තිකාරම් මුදල් ගෙවූ නිළධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගෙන නැත. |
| (ඉ) | 2017 මැයි 25 දින ආරම්භ කර තිබූ වැලිකන්ද අභිජනනාගාර ඉදිකිරීමේ ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු 2020 සැප්තැම්බර් 15 සිට අත්හිටුවා තිබීම හේතුවෙන් ඒ වෙනුවෙන් දරා තිබුණු රු.158,487,599ක මුදල නිෂ්කාර්ය වියදමක් බවට පත්වීමේ අවධානමක් පැන නැගී තිබුණි. | කොන්ත්‍රාත් සඳහා දීර්ඝ වශයෙන් කාලය දිගු කිරීම් ලබා දීමෙන් පසු හා සැලකිය යුතු පිරිවැයක් දැරීමෙන් පසු, සිදුවිය හැකි අලාභ අවම කිරීම කිරීම සඳහා,අතරමඟ අත්හිටුවීම් උපරිම ලෙස වලකා ගැනීමට කළමණාකාරීත්වය කටයුතු කළ යුතුය. | මෙම ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව ඇවර කිරීමේදී (Termination Bill) යටතේ ප්‍රමාද ගාස්තු වශයෙන් රු.7,196,563ක මුදලක් රඳවුම් මුදල් වශයෙන් හා රු.7,181,872.77ක මුදලක්ද ඇවර කිරීමේ බිල්පතින් අඩු කරගෙන ඇත. ඒ අනුව දැනට මේ සම්බන්ධ බේරුම්කරණ (arbitration) සහ Bond සම්බන්ධ දිස්ත්‍රික් උසාවියේ නඩුකරයක් | වියහැකි අලාභය මගහරවා ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගෙන නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | | | ක්‍රියාත්මක වන බැවින් එහි තීන්දු තීරණ අනුව සහ සමථකරණයේ නියෝග අනුව උක්ත රු. මිලියන 14 ක මුදලින් අඩු කර ගත යුතු මුදල් අඩුකර ගෙන ඉතිරි මුදලක් වේ නම් කොන්ත්‍රාත්කරු වෙත ගෙවීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | |
| (ඊ) | ඉඟිනියාගල ජලජීවී පොකුණු 05 ක ඉදිකිරීම සඳහා රු.30,112,800 ක කොන්ත්‍රාත් වටිනාකමකට අදාලව රු.4,000,000 අත්තිකාරම් බැඳුම්කර හා රු.1,806,768 ක කාර්යසාධන බැඳුම්කර ඉදිරිපත් කිරීමෙන් මාස 06 කට පසු වංචනික බැඳුම්කර බව අනාවරණය විය. පසුව බැංකුව මඟින් නැවත බැඳුම්කර නිකුත්කර තිබුණද 2021 පෙබරවාරි 18 දින විටත් අධිකාරිය විසින් වංචනික බැඳුම්කර ඉදිරිපත් කළ ආයතනය සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබූ අතර ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (CIDA) වෙත පැමිණිලි කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. | බැඳුම්කර වල නිරවද්‍යතාව හා වලංගුතාවය අධිකාරිය විසින් කොන්ත්‍රාත් ආරම්භයේදී තහවුරු කරගත යුතුය. වංචනික බැඳුම්කර ඉදිරිපත් කිරීම සම්බන්ධ CIDAආයතනය වෙත පැමිණිලි කිරීම හා අදාළ කොන්ත්‍රාත් ආයතනය අසාදු ලේඛනගත කිරීමට කටයුතු කළ යුතුය. | අදාල බැඳුම්කර වල කාලය දිගුකිරීමේදි වංචනික බව සනාථ වීමෙන් පසු බැංකුවට එය දන්වා සිටි අතර වැඩිදුරටත් මෙම අවස්ථාවේදී කටයුතු කළ යුතු ආකාරය සම්බන්ධයෙන් නීතිපතිතුමන්ගේ උපදෙස් ඉල්ලා සිටින ලදී. මෙහිදී අදාළ බැඳුම්කර වල වංචනික බව බැංකුවට දැනුම් දුන් පසු බැංකුව මඟින් නැවත බැඳුම්කර නිකුත් කිරීමක් සිදුකර සිටින ලදී. | 2021 වර්ෂයේදීද CIDA ආයතනය වෙත පැමිණිලි කිරීමට හෝ අසාදුලේඛණ ගත කර නොමැත. |
| (උ) | 2016 මාර්තු 01 දිනැති අංක, 956/13 දරණ අතිවිශේෂ ගැසට්පත්‍ර නිවේදනය මඟින් ප්‍රකාශයට පත්කර තිබුණු වෙඩිතලතිව් අභය භූමියද | යෝජිත ජලජීවී වගා ව්‍යාපෘති සඳහා ඉඩම් වෙන් කරවා ගැනීමේදී හා ව්‍යාපෘති ඉදිකිරීම් කටයුතු වලදී අවශ්‍ය | අමාත්‍ය මණ්ඩල තීරණය අනුව Environmental Assessment Study සිදු කල යුතු වූ බැවින් එම අධ්‍යනය නාරා ආයතනය මඟින් සිදු | අලාභය සම්බන්ධව වගකිව යුතු නිලධාරීන්ට විරුද්ධව විනය ක්‍රියාමාර්ග ගෙන නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | ඇතුලත් හෙක්ටයාර 1491 ක යෝජිත ජලජීවී වගා කර්මාන්තපුර ඉදිකිරීමේ ව්‍යාපෘතිය, නාරා ආයතනයේ පරිසර වාර්තාව අනුව, විශේෂඥ ඇගයීම් කමිටුවක් මඟින් ප්‍රතික්ෂේප කර හෙක්ටයාර 165 ක් පමණක් නිදහස් කිරීමට තීරණය කර තිබුණි. විධිමත් අධීක්ෂණයකින් තොරව ස්වාභාවික රක්ෂිත කලාපයක් තුල හෙක්ටයාර 1491 භූමියක් ආවරණය වන පරිදි සිදුකර ඇති ව්‍යාපෘති සැලසුම්, නිෂ්පාදන සැලසුම්, උපදේශන සේවා හා මිනුම් කටයුතු සඳහා වැයකර තිබුණු රු.19,442,652 ක මුදල නිෂ්කාර්ය වියදමක් බවට පත්ව තිබුණි. | වාර්තාවන් ලබා ගෙන විධිමත්ව කටයුතු කළ යුතුය. | කරගෙන ඇති අතර එම අධ්‍යානය සඳහා අදාල මුදල ජලජීවී වගා සංවර්ධන අධිකාරිය මඟින් ගෙවා ඇත. | |
| (ඌ) | අමාත්‍යාංශ ප්‍රදාන මඟින් රු. මිලියන 190 ක් වැයකර 2017 වර්ෂයේදී රුකව කකුළුවන් වගා කිරීම් ව්‍යාපෘතියක් ආරම්භ කර තිබුණද ප්‍රමාණවත් ලවණතා මට්ටමක් නොමැති වීම මත ව්‍යාපෘතියේ මූලික අරමුණ වූ කකුළු වගා සංකල්පය ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි. ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර විධිමත් ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර නොතිබීම මෙම තත්ත්වයට හේතු වී තිබුණි. එසේම මුදල් රෙගුලාසි 3(ආ) III ප්‍රකාරව මූලික පිරිවැය රු. මිලියන 100 ට වැඩි | ව්‍යාපෘති ආරම්භ කිරීමේදී විධිමත් ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීමට කටයුතු කළ යුතු අතර අදාළ අනුමැතීන් ලබා ගත යුතුය. | ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ ව්‍යාපෘති ඉදිරිපත් කිරීමේ ආකෘති පත්‍රය ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය විසින් ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය ඔස්සේ ඉහත දෙපාර්තමේන්තුවට යොමු කර මුදල් ප්‍රතිපාදන වෙන් කර ඇති අතර ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ද ඉහත ව්‍යාපෘතිය සඳහා ලබා ගෙන ඇත. | අලාභය සම්බන්ධව වගකිව යුතු නිලධාරීන්ට විරුද්ධව විනය ක්‍රියාමාර්ග ගෙන නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | ව්‍යාපෘති සඳහා මූලික අනුමැතිය එනම් ප්‍රතිපත්තිමය වශයෙන් අමාත්‍ය මණ්ඩල අනුමැතියත් ලබාගත යුතු වුවද අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත පමණක් මෙම ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණි. | | | |
| (උ) | ඉහත ව්‍යාපෘතිය අසාර්ථක වීම නිසා ව්‍යාපෘතියේ අරමුණු වෙනස්කර එම ව්‍යාපෘතිය සඳහා ඉඩම් ලබා දුන් පෞද්ගලික ඉඩම් හිමියන් සහ අධිකාරිය අතර ත්‍රිත්ව බදු ගිවිසුමක් 2021 දෙසැම්බර් 02 දින අත්සන් කර කිවුල් දිය ඉස්සන් වගාව සඳහා ගිවිසුමකට එළඹ තිබුණද පෞද්ගලික ආයෝජකයෙක් වෙත සෘජුව බදුදීමේදී අනුගමනය කල යුතු රාජ්‍ය පෞද්ගලික ආයෝජන ව්‍යාපෘති සඳහා වූ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අතිරේක 23 අනුව කටයුතු කර නොතිබුණි. | රාජ්‍ය පෞද්ගලික ආයෝජන ව්‍යාපෘති සඳහා වූ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතුය. | රැකව කකුළුවන් වගා කිරීමේ සංවිධානයේ ඉඩම් හිමියන් සහා අධිකාරිය අතර 2017 මැයි මස 19 වන දින විධිමත් ගිවිසුමකට එළඹ ඇති අතර එහිදී ඔවුන් Crab city ව්‍යාපෘතියේ ඕනෑම ස්ථානයකින් වෙන් කරදෙනු ලබන තමාට අයිතිව තිබූ අක්කර ප්‍රමාණයේ හිමිකාරත්වය ලැබීමට එකඟව ඇත. | අදාල තත්ත්වය මඟහරවා ගැනීමට හා නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු 2021 වර්ෂයේදීද කර නැත. |
| (ඌ) | අධිකාරියට අයත් වන අධිකාරියේ කටයුතු සඳහා දැනට භාවිතා කරන ඉඩම් කැබලි 18 ක වටිනාකම තක්සේරු කර 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි. මෙම නිසා අධිකාරියේ ඉඩම් වල අගය මූල්‍ය ප්‍රකාශන වල අඩුවෙන් දැක්වුණි. | අධිකාරියට අයත් ඉඩම් තක්සේරු කර ගිණුම් ගත කළ යුතු වේ. | අධිකාරියට අයත් සියළු ඉඩම් 2020 මූල්‍ය ප්‍රකාශන වාර්තා වලට ඇතුලත් කිරීමට හැකිවන පරිදි 2020 දෙසැම්බර් 31 දිනට ඉඩම් වලට පමණක් අදාල වන පරිදි තක්සේරු කර ගැනීම සඳහා මේ වන විට කටයුතු කරමින් සිටින අතර මේ වන විට කහඳමෝදර සහ අඟුණවැව මධ්‍යස්ථාන තක්සේරු කිරීම සඳහා යොමු කර ඇත. | අධිකාරියට අයත් ඇතැම් ඉඩම් වල පමණක් තක්සේරු වාර්තා ලැබී ඇතත් ගිණුම්ගත කර නැත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඔ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ **II** වැනි කාණ්ඩයේ **XLVIII** වැනි පරිච්ඡේදයේ 29 වගන්තිය කහඳමෝදර මිරිදිය ඉස්සන් අභිජනන මධ්‍යස්ථානය ඉදිකිරීමේදී වැඩිපුර ගෙවූ රු.947,068 ක මුදල සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව විධිමත් පියවර ගෙන නොතිබුණි. | ආයතන සංග්‍රහයේ විධි විධාන අනුව කටයුතු කළ යුතුය. | කළමනාකරණය නිවැරදි කිරීමට ගන්නා ලද පියවර පිළිබඳ අදහස් දක්වා නොමැත. | වගකිව යුතු නිළධාරීන්ට එරෙහිව විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොමැත. |
| (ඕ) | අංක 01/2018 හා 2018 මාර්තු 19 දිනැති මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ධාවනය කල නොහැකි තත්වයේ පවතින සියළුම වාහන 2018 ජුනි 30 දිනට පෙර අපහරණය කල යුතු වුවද අධිකාරියේ ධාවන තත්වයේ නොපවතින සංචිත වාහන 4 ක් අපහරණය කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. | අදාල යතුරු පැදි අප අධිකාරියේ ව්‍යාප්ති කාර්යාල වල නවතා ඇති අතර එම යතුරු පැදි නැවත සුළු අළුත්වැඩියා කටයුතු සිදුකිරීමෙන් පසු නැවත ව්‍යාප්ති නිලධාරීන්ට ලබාදීමට කටයුතු සිදුකරන අතර ඉදිරියේදී නව යතුරු පැදි අධිකාරිය විසින් මිලදීගැනීමෙන් පසු එම යතුරු පැදිද අපහරණය කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | ධාවන තත්වයේ නොපවතින වාහන චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව අපහරණය කිරීමට 2018 සිට 2020 වන තුරුත් කටයුතු කර නොතිබුණි. |
| (ක) | උඩවලව කාප්, නව කාප් හා තිලාපියා අභිජනන මධ්‍යස්ථාන වල පවතින පොකුණු වර්ග ප්‍රමාණය 1000 $M^2$ ක් වූ ටැංකි 7 ක උපරිම ධාරිතාවයෙන් යුතුව යොදාගෙන නොමැති බව 2019 ජුනි මස කරන ලද භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. තවද මත්ස්‍ය නිෂ්පාදන සඳහා යොදාගෙන | මත්ස්‍ය ටැංකි උපරිම ධාරිතාවයෙන් යොදාගෙන තිබේද යන්න සොයා බැලීම හා වත්කම් නිසි ලෙස කළමනාකරණය කිරීම කළමනාකරණ මණ්ඩලයේ වගකීමක් වන අතර ඒ සඳහා අවශ්‍ය | උඩවලව නව කාප් මධ්‍යස්ථානයේ පොකුණු 05 ක් ප්‍රතිශංස්කරණය කොට දැනට උපරිම ධාරිතාවයෙන් භාවිතා කරනු ලබන බව සඳහන් කරමි. ඉතිරි පොකුණු වල වූ අළුත් වැඩියා කිරීම් කටයුතු සඳහා අවශ්‍ය ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් පොකුණු පිලිසකර | උඩවලව කාප් හා නව කාප් හා තිලාපියා මධ්‍යස්ථාන වල ස්ථාපිත කර ඇති පොකුණු සියල්ල උපරිම ධාරිතාවයෙන් යොදවා ගෙන නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | තිබුණු මත්ස්‍ය ප්‍රමාණයට සාපේක්ෂව ලබාගත් අස්වැන්න පොකුණු 08 කට අදාලව සියයට 3.5 සිට 13 දක්වා වු අවම මට්ටමක පැවතුණි. 2018 මැයි මාසයේදී නව කාප් අභිජනන මධ්‍යස්ථානය ආරම්භ කර තිබුණද එහි පොකුණු 07 ක් භාවිතයට ගැනීම ප්‍රමාද වීම මාස 05 සිට මාස 11 දක්වා කාලයක් ගෙන තිබූ අතර තවත් පොකුණු 17 ක් අළුත්වැඩියා කර නොතිබීම හේතුවෙන්ද නිෂ්කාර්යව පැවතුණි. | කළමනාකරණ සැලසුම් සකස් කර ක්‍රියාත්මක කළ යුතු වේ. | කිරීම් කටයුතු ආරම්භ කිරීමට නොහැකි වී ඇත. තවද එම පොකුණු වල හයිඩ්‍රිල්ලා නැමැති ජලජ පැලෑටිය වර්ධනය වීම නිසා එය පාලනය කිරීම අවශ්‍ය වී ඇත. N1 පොකුණේ ජල කාන්දුව අධික වශයෙන් පැවතුණු අතර ඒවා පාලනය කළ නොහැකි ලෙස පාසි හා හයිඩ්‍රිල්ලා වර්ධනය වි ඇත. මේ නිසා ජල ප්ලවාංග (ස්වාභාවික ආහාර) පවත්වාගෙන යාමට නොහැකි වී ඇත. මේ නිසා අස්වැන්න අඩු වී ඇත. N4 පොකුණේ කැට්ලා වර්ගයට අයත් පසු කීටයන් තැන්පත් කර ඇති අතර මසුන්ට ලර්ණීය නම් පරපෝශිතයා ආසාධනය වීම නිසා මසුන් මිය ගොස් ඇත. | |
| (ග) | උඩවලව නව ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථානයේ ජල සැපයුම් පද්ධතිය සපයා සවි කිරීමේ කර්මාන්තය සඳහා රු.8,628,689ක් වැය කර 2018 පෙබරවාරි 11 දින වැඩ නිමකර තිබුණද විගණිත දිනය වූ 2019 ජුනි 19 දින වන විටත් පොම්පගාරය සඳහා විදුලිය ලබාගෙන නොතිබීම හේතුවෙන් රු.8,628,689ක් වැයකර ඉදිකරන ලද ව්‍යාපෘතිය උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව උපයෝජනය කළ නොහැකි වී තිබුණි. | ඉදිකිරීම් කොන්ත්‍රාත් සැලසුම් සහගතව නිමකළ යුතු අතර ධාරිතාවන් උපරිම අයුරින් උපයෝජනය කිරිමට කළමනාකරණයේ අවධානය යොමුකළ යුතුය. | විදුලි බල මණ්ඩලය විසින් අදාල විදුලි බල සැපයුම ලබා දීමේ කටයුතු වල 95% පමණ භෞතික ප්‍රගතියක් අයත් කර ගෙන ඇති බව ද සඳහන් කරමි. ඒ අනුව නුදුරු දිනයකදි පොම්පාගාරය උපරිම කාර්යක්ෂමතාවයෙන් යුතුව ප්‍රයෝජනයට ගත හැකි වනු ඇත. එසේම විදුලි බල මණ්ඩලය හරහා පිටතින් ස්ථිර විදුලිය ලබා ගැනීමට කටයුතු කරන තෙක් තාවකාලීක සැපයුමක් මඟින් ජලය පොම්ප කිරීමට අවශ්‍ය කටයුතු කිරීමට පියවර | දැනට තාවකාලික විදුලි සැපයුම මත ජල පොම්පාගාරය ක්‍රියාත්මක මට්ටමේ පවතී. ස්ථිර විදුලිය ලබා ගෙන නොමැත. ඒ අනුව ව්‍යාපෘතියේ උපරිම ධාරිතාවය උපයෝජනය වී නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | | | ගෙන ඇති බව ද සඳහන් කරමි. | |
| (ච) | තිලාපියා සඳහා මත්ස්‍ය ආහාර ඒකකයක් උඩවලව කාප් අභිජනන මධ්‍යස්ථානයේ පිහිටුවීමට ව්‍යාපෘති වාර්තාවක් සකස් කර ගුණාත්මක තත්වයෙන් යුත් ආහාර අවම නිෂ්පාදන පිරිවැයක් දරමින් අධිකාරිය විසින් නිෂ්පාදනය කිරීමටත් වසරකදී අවම වශයෙන් මත්ස්‍ය ආහාර සඳහා දරනු ලබන වියදමෙන් රු.මිලියන 05 ක් පමණ ඉතිරිකර ගැනීමටත් සැලසුම්කර තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3.1 අනුව, ප්‍රසම්පාදන කමිටුවක් පත් කරන ලෙස ඉල්ලීමක් කිරීමට පෙර ද ආරම්භක පාරිසරික පරීක්ෂණය, පාරිසරික බලපෑම් පිළිබඳ තක්සේරුව, සමාජ බලපෑම් පිළිබඳ තක්සේරුව සහ ව්‍යාපෘතියට අදාළ වෙනත් සියලු ප්‍රසම්පාදනයට පෙර සූදානම් වීමේ කටයුතු සිදුකර නොතිබියදී රු.10,225,796 ක් 2019 වර්ෂයේදී මත්ස්‍ය ආහාර නිෂ්පාදනය කිරීමේ යන්ත්‍රය සඳහා වැයකර තිබුණි. යන්ත්‍රය සවි කිරීමට අවශ්‍ය ගොඩනැගිල්ල සූදානම් නොකිරීම, විදුලිබලය ලබා නොගැනීම, යටිතල පහසුකම් නොමැති වීම හේතු කොට | ව්‍යාපෘති ආරම්භ කිරීමට පෙර ඒවා මනාලෙස සැලසුම් කර නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග පිළිබඳ ක්‍රියාත්මක කිරීම කළමනාකරණයේ වගකීමක් වේ. නිෂ්කාර්ය වත්කම් පිළිබඳ සොයා බලා එම වත්කම් ඒවා කාර්යක්ෂම ලෙස ප්‍රයෝජනයට ගැනීමේ වැඩ පිළිවෙල සකස් කල යුතුය. | කළමනාකරණය විසින් අදහස් දක්වා නොතිබුණි. | ව්‍යාපෘතිය අවසන් වීම හේතුවෙන් උපරිම ධාරිතාවයට නිෂ්පාදන කටයුතු ඉහළ නංවා නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | ගෙන 2019 අගෝස්තු සිට 2020 අගෝස්තු දක්වාම යන්ත්‍රය ක්‍රියාත්මක තත්වයට පත්කර ගැනීමට නොහැකි වී තිබුණි. ඒ හේතුවෙන් මත්ස්‍ය ආහාර සඳහා 2019 වර්ෂයේදී රු.57,791,585ක් දැරීමට සිදු වී තිබුණි. තවද යන්ත්‍රයේ වගකීම් කාලය තුළ යන්ත්‍රය නිෂ්කාර්ය පැවති අතර රු.10,225,796 ක් වැය කරන ලද ව්‍යාපෘතියේ අරමුණු ඉටු වී නොතිබුණි. | | | |
| (ඡ) | කලපු සංවර්ධන වැඩසටහන යටතේ රු.161,400,000ක වටිනා වල් පැළෑටි සහ සුන්බුන් ඉවත් කිරීමේ යන්ත්‍ර 03 ක් මිලදී ගැනීම සඳහා අත්තිකාරම් ලෙස රු.42,572,925ක් 2018 ජුලි 13 දින ව්‍යාජ බැඳුම්කර ලියවිලි ඉදිරිපත් කරන ලද සැපයුම්කරුට අදාල ලියවිලි වල නිවරද්‍යතාවය තහවුරු කර නොගෙන ගෙවා තිබුණද එම නිළධාරීන්ට එරෙහිව ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLUIII පරිච්ඡේදය අනුව කිසිදු විනය ක්‍රියාමාර්ගයක් මේ දක්වා ගෙන නොතිබුණි. මෙම අවිධිමත් ලෙස ගෙවූ රු.42,572,925ක මුදල මාස 06 ක කාලයක් පෞද්ගලික පරිහරණයට ඉඩ හැර ආපසු අයකර තිබුණි. තවද නිළධාරීන් 04 දෙනෙකු මෙම යන්ත්‍ර පරීක්ෂා කිරීම සඳහා විදේශ ගත වී තිබූ අතර ඒ සඳහා රු. | ව්‍යාජ බැඳුම්කර සකස් කළ නිලධාරීන්ට හා සැපයුම්කරුවන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුයි. | කළමනාකරණය විසින් අදහස් දක්වා නොතිබුණි. | 2021 වර්ෂය අවසානය වන විට අත්තිකාරම් ඇපකරය සහ කාර්ය සාධන ඇපකරය යන දෙකම අදාළ ආයතනයෙන් ආවරණය කර ගෙන ඇත. අදාළ ආයතනය අසාදු ලේඛනගත කර නොමැත. ලියවිලි වල නිරවද්‍යතාවය තහවුරු කර නොගත් නිළධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.අදාළ යන්ත්‍ර 3ද මිලදී ගෙන නොමැත. |

363,504 ක මුදලක් අධිකාරිය විසින් ගෙවා තිබූ අතර මෙම මුදල නිෂ්කාර්ය වියදමක් වී තිබුණි.

## 60. ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 - තතත්ත්වාගණනය නොකළ මතය

2019 - තතත්ත්වාගණනය කළ මතය

2020 - තතත්ත්වාගණනය නොකළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකාව තුල නවෝත්පාදන සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම හා ස්ථාපිත කිරීම සඳහා මාධ්‍ය ප්‍රතිපත්තියක් සකස් කිරීම පිළිබඳව දැනුවත් කිරීමට මාධ්‍ය සාකච්ඡාවක් පැවැත්වීම හා මාධ්‍ය ප්‍රතිපත්තිය සකස් කිරීම සඳහා 2017 වර්ෂයේදී රු.1,680,000ක් වැයකර තිබුණු අතර මෙය ඵලදායී ලෙස භාවිතා කළ නොහැකි බව නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ කොමසාරිස් විසින් දන්වා තිබුණි. මේ නිසා උක්ත අනාර්ථික වියදම වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීම හෝ විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීම කෙරෙහි අවධානයක් යොමු වී නොතිබුණි. | වියදම් දැරීමට පෙර අවශ්‍යතාවය හා ඵලදායිතාවය පිළිබඳ අධ්‍යනයක් සිදුකළ යුතු අතර වගකීමකින් තොරව ක්‍රියා කරන නිලධාරීන්ගෙන් වියදම් කළ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | ශ්‍රී ලංකාව තුල නවෝත්පාදන සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම හා ස්ථාපනය කිරීම සඳහා මාධ්‍ය ප්‍රතිපත්තියක් සකස් කිරීම සම්බන්ධයෙන් 2019 පෙබරවාරි 20 වන දින සහ 2019 මැයි 08 යන දිනයන්හි පැවැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවන්වලදී සාකච්ඡාවට භාජනය කරන ලදි. එසේම මෙම මාධ්‍ය ප්‍රතිපත්තිය සකස් කිරීමේ කටයුතු සිදු කරන ලද්දේ වෙනත් ආයතනයක් මඟිනි. එම ආයතනය විසින් සකස් කරන ලද මාධ්‍ය ප්‍රතිපත්තිය ප්‍රායෝගිකව ඵලදායි ලෙස භාවිතා කළ නොහැක. | අමාත්‍යාංශය මඟින් පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කර ඇත. |
| (ආ) | වසර දහයකට වැඩි කාලයක සිට නව නිපැයුම්කරුවන්ට ලබා දී ඇති ණය නැවත අයකර ගැනිමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබූ අතර 2020 දෙසැම්බර් 31 දිනට පැවති රු.9,802,964ක ණය ශේෂය සඳහා සියයට සියයක අඩමාණ ණය වෙන්කිරීම් කර තිබුණි. | ණය අයකර අයකර ගැනීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. | මෙම ණය කපාහැරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට අමාත්‍යාංශය හරහා මහා භාණ්ඩාගාරය වෙත අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරන අතර කොමිසම විසින් වර්තමානයේ දී ලබාදෙනු ලබන ණය වෙනුවෙන් විධිමත් ක්‍රමවේදයක් සකස් කර තිබේ. | නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඉදිරි කටයුතු සඳහා අවශ්‍ය උපදෙස් ඉල්ලා ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකාවේ නව නිපැයුම්කරුවන්ගේ නවෝත්පාදන වැඩි කිරීමේ හා එම නවෝත්පාදන කඩිනමින් රටේ ආර්ථිකයට හා සමාජයට එක් කිරීමේ අරමුණින් යුතුව නවෝත්පාදකයන්ට ණය ලබාදීම සඳහා 2017 වර්ෂයේ අයවැය ප්‍රතිපාදන යටතේ රු. මිලියන 100ක් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම වෙත ප්‍රතිපාදන වෙන්කර තිබුණි. මෙම අරමුදල ( IAFM) මෙහෙයවීම සඳහා උපදේශන සේවා ලබාගැනීමට අදාල ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කිරීමෙන් තොරව උපදේශක ආයතනයක සේවය ලබාගෙන තිබුණි. අයදුම්පත් 24 කින් 4 ක් එම උපදේශන ආයතනය විසින් තෝරාගෙන තිබූ අතර එකතුව රු.9,127,600 ක් වූ ණය ලබා දී තිබුණි. මේ සඳහා මසකට රු.385,000 බැගින් මාස 12 ක් සඳහා රු.4,620,000 ක් උපදේශන ආයතනයට ගෙවීම් සිදුකර තිබුණි. එසේ වුවද අදාළ උපදේශන ආයතනය හා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම අතර ගිවිසුම් 2017නොවැම්බර් 01 දින අත්සන් කර තිබූ අතර එම අවස්ථාව වන විට අදාල ආයතනය ලියාපදිංචි ආයතනයක් නොවුණි. | රජයේ නීතිරීති හා විධිවිධාන වලට අනුගතව ක්‍රියාකළ යුතු බව හා නීතිරීති රෙගුලාසි වලට අනුකූලව කටයුතු නොකල නිළධාරීන් හඳුනාගෙන විනයානුකූලව කටයුතු කිරීම. | උපදේශකයකුගේ සේවය ලබා ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කළ නමුත් එහිදී සම්පූර්ණ ක්‍රියාවලියේ අඩුපාඩුවක් තිබූ බව පිළිගැනීමට සිදුවන අතර එහි සිදුවී ඇති අඩුපාඩු මීලඟ ගිණුම් වර්ෂයේ වැඩසටහන්වලදී නිවැරදි ආකාරයෙන් සිදු කිරීමට අවශ්‍ය අවධානය යොමුකර ඇත. | වර්ෂයේ සිට 2019 උපදේශන ආයතනයක සේවය ලබා නොගෙන ආයතනික කාර්ය මණ්ඩලය විසින් අරමුදල පවත්වාගෙන යනු ලබයි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2018 වර්ෂයේ නව නිපැයුම් දිරිය වැඩසටහන යටතේ ණය/ ආධාර අනුමත වූ නව නිපැයුම්කරුවන් තිදෙනෙකුට අදාල රු.3,200,000ක ප්‍රසම්පාදන කටයුතු 2020 විගණන දිනය වන විටත් සම්පූර්ණ කර නොතිබුණි. | තාක්ෂණය දිනෙන් දින අළුත් වෙන බැවින් නව නිපැයුම්කරුවන්ට අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු කඩිනමින් සිදු කල යුතුය. | පාලක මණ්ඩලය මගින් අදාල මුදල ණයක් ලෙස ලබා දීමට නවනිපැයුම්කරුවන්ගේ කැමැත්ත ලබා ගැනීමට විමසා ඇත. | එම සඳහන්ව ඇති නව නිපැයුම් 03 ට අදාළව කොමිසම මගින් ඉදිරි කටයුතු කිරීම සඳහා අවශ්‍ය ලියකියවිලි සහ අදාල තොරතුරු ලබාදෙන ලෙස නව නිපැයුම්කරුවන් වෙත දැනුම් දුන්නද ඔවුන් එම තොරතුරු ලබා නොදීම නිසා ඉදිරි කටයුතු කිරීමට කොමිසමට නොහැකිව ඇත. |
| (ඉ) | ශ්‍රී ලංකාවේ නව නිපැයුම්කරුවන්ට ඔවුන්ගේ නිපැයුම් වෙළඳපොලට රැගෙන ඒමටත්, පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම සඳහාත් යාන්ත්‍රනයක් ඇති කිරීම වෙනුවෙන් 2017 වර්ෂයේදී රුපියල් මිලියන 05 ක ප්‍රතිපාදනයක් මත ආරම්භ කර තිබූ නවෝත්පාදන කඩිනම් කරවීමේ යාන්ත්‍රන අරමුදලේ 2019 හා 2020 වර්ෂයන් හිදී කිසිදු කාර්යයක් සිදුකර නොතිබුණු අතර 2018 වර්ෂයේ අවසාන ශේෂය වූ රු.46,472,155ක මුදලින් රු.මිලියන 10 ක් නව නිපැයුම්කරුවන්ගේ අරමුදලට 2020 වර්ෂයේදී මාරුකිරීම හැර වෙනත් කිසිදු කාර්යයක් සිදුකර නොතිබුණි. | විධිමත් සැලැසුම් සකස් කර අදාල අරමුදල් ඒවා ලබාදුන් අරමුණ වෙනුවෙන් යෙදවීම. | මේ වන විට පැවති අඩුපාඩු මගහරවා ගනිමින් COPE කමිටුවෙන් ලද උපදෙස් පරිදි සැකසූ මාර්ගෝපදේශය හා විධිමත් ක්‍රියාවලියකට අනුව 2019 අප්‍රේල් මස 29 දින පැවති පාලක මණ්ඩල රැස්වීමේදී ලද අනුමැතිය පරිදි IAFM SL ව්‍යාපෘති යටතේ ලැබී තිබූ අයදුම් පත් සියල්ල විනිශ්චය කටයුතු සඳහා යොමු කරන ලද අතර එම අයදුම්පත් වලට අදාල ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. | මේ වන විට නව නිපැයුම්කරුවන් දෙදෙනෙකු සඳහා රු.මි. 11.8ක මුදලක් විධිමත් ක්‍රමවේදය අනුව ලබා දී ඇත. |

## 61. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 - තතත්ත්වාගණනය කළ මතය

2019 - තතත්ත්වාගණනය කළ මතය

2020 - තතත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2010 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාර්යංශයේ ප්‍රධාන කාර්යාලය හා තොරතුරු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරී ගොඩනැගිල්ලේ පවත්වාගෙන යාම වෙනුවෙන් ගෙවිය යුතු රු.75,125,536ක ගොඩනැගිලි කුලිය මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ගොඩනැගිලි කුලිය මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු බව. | අවශ්‍ය මූල්‍ය අනුමැතිය මාණ්ඩලික පත්‍රිකාවක් මගින් ලබාගෙන ගෙවීම් සිදුකිරීම සඳහා පියවර ගනු ඇත. | කළමනාකරණය විසින් අදහස් දක්වා නොතිබුණි. |
| (ආ) | 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු මුදලරු.39,274,283 ක් වුවත් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ගිණුම් වලටඅනුව එය රු.108,336,570 ක් ලෙස දක්වා තිබුණි. | ආයතන අතර ලැබිය යුතු/ ගෙවිය යුතු ගිණුම් සැසදිය යුතු බව. | අවශ්‍ය මූල්‍ය අනුමැතිය මාණ්ඩලික පත්‍රිකාවක් මගින් ලබාගෙන ගෙවීම් සිදුකිරීම සඳහා පියවර ගනු ඇත. | 2021 වර්ෂය අවසානය දක්වා නිවැරදි කිරිමට පියවර ගෙන නොතිබුණි. |
| (ඇ) | 2020 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නිරවුල් නොකර පැවතුනු වර්ෂ 01ක සිට වර්ෂ 06ක් දක්වා කාල පරාසයක් තුල උපචිත වියදම් එකතුව රු.4,135,110 ක් විය. | උපචිත වියදම් ප්‍රමාදයකින් තොරව පියවීමට කටයුතු කළ යුතු බව. | මේ වන විට උපචිත වියදම් ශේෂය රු.2,346,113.70ක ප්‍රමාණයක් වන අතර ඉතිරි මුදල ගෙවා ගැනීමට විගණන හා කලමණාකරණ කමිටු නිර්දේශයන් මත මේ සඳහා කමිටුවක් පත් කර ඇති අතර ඉදිරියේදි මෙම ශේෂය නිවැරදි කිරිමට කටයුතු කරනු | 2022 ජනවාරි 31 දින වන විට වර්ෂ 1 සිට 6 දක්වා පැරණි රු.2,346,114 ක උපචිත වියදම් ශේෂයක් විය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | ඇත. | |
| (ඇ) | 2020 වර්ෂය තුල විදේශ ප්‍රවර්ධන මෙහෙයුම් සඳහා ප්‍රේෂණය කරන ලද විදේශ ව්‍යවහාර මුදල් අත්තිකාරම් රු.36,495,001ක් සඳහා අදාළ ශේෂ සනාථ ඉදිරිපත් නොවූ අතර, නොපියවූ අත්තිකාරම්2020 දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.11,369,702 ක් විය.සමාලෝචිත වර්ෂය අවසාන දිනයට ශේෂයේ ප්‍රමාද කාලපරාසය මාස 17 ක සිට මාස 37 ක්දක්වා විය. | කාල ප්‍රමාදයකින් තොරව අත්තිකාරම් පියවා ගැනීමට කටයුතු කළ යුතු බව. | ඉදිරියේදි ශේෂ සනාථ කිරීම් ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත. | 2021 ජනවාරි 31 වන විට තවදුරටත් නොපිය වූ අත්තිකාරම් වටිනාකම රු.3,966,099 ක් විය. |
| (ඉ) | 2010 ජුනි මාසයේදී ලබාදුන් රු.1,575,000ක අත්තිකාරම් මුදල පියවීමට අදාල බදු ඉන්වොයිසිය ලැබී තිබියදීත් පියවීමට කටයුතු නොකර 2020 වර්ෂයේදීත් අත්තිකාරම් ලෙස දක්වා තිබුණි. | සනාථ කිරීම් ලබාගෙන අත්තිකාරම් පියවා දැමීමට කටයුතු කළ යුතු බව. | නිවැරදි කිරිමට කටයුතු කරනු ඇත. | 2021 වර්ෂයේදී හෝ නිවැරදි කිරිමට පියවර ගෙන නොතිබුණි. |
| (ඊ) | 2005 අංක 38 දරන සංචාරක කටයතු පනතේ VII පරිච්ඡේදයේ 40 වගන්තියේ 09 උපවගන්තිය ප්‍රකාරව සෑම ලිත් වර්ෂයක් අවසාන වී මාස තුනක් ඉකුත් වීමට පෙරාතුව එම වර්ෂය තුළ කාර්යංශයේ කටයුතු පිළිබඳව ඉදිරිපත් කළ යුතු වාර්තා, ප්‍රකාශනයන් හා සැළසුම් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. | වාර්තා, ප්‍රකාශනයන් හා සැලසුම් අමාත්‍යවරයා වෙත නිසිකලට ඉදිරිපත් කළ යුතු බව | අවශ්‍ය ක්‍රියාමාර්ග දැනටමත් ගෙන ඇත. | 2021 වර්ෂයේදී හෝ නිවැරදි කිරිමට පියවර ගෙන නොතිබුණි. |
| (උ) | 2018 වර්ෂයේදී වටිනාකම රු.308,700ක් වන ලැප්ටොප් | රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු බව. | නැවත සොයා බැලිමක් කර ගෙන ඇති පියවර පිලිබඳව | 2021 වර්ෂයේදී හෝ නිවැරදි කිරිමට පියවර |

| | | | | |
|---|---|---|---|---|
| | පරිගණක තුනක් අස්ථානගත වීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි අංක102 හා 104 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | | ඉදිරියේදී දැනුවත් කරනු ඇත. | ගෙන නොතිබුණි. |
| (ඉ) | 2019 වර්ෂයේදී කළමනාකාර සහකාරවරියක් වැටුප් රහිත නිවාඩු මත විදේශගත වීමේදී නොපිය වූ ආපදා ණය ශේෂය රු. 172,375ක් හා වැඩ තහනමකට ලක් වූ නිලධාරියෙක්ගෙන් අයවිය යුතුරු. 180,806ක ණය ශේෂ 2020 දෙසැම්බර් 31 දක්වා අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ණය ශේෂ පියවා ගැනීමට කටයුතු කළ යුතු බව | i) විදේශ ගත වී ඇති නිලධාරියෙක්ගෙන්ණය ශේෂ අය කර ගැනීම සමථ මණ්ඩලයට යොමුකර ඇත.<br>ii) වැඩ තහනමට ලක් වූ සහකාර අධ්‍යක්ෂකවරයාට විරුද්ධව පැවැත්වෙන විධිමත් විනය පරීක්ෂණයේතීරණ අනුව මුදල් අයකර ගැනීමට කටයුතු කරනු ඇත. | 2021 වර්ෂයේදීද අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

## 62. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 - තතත්ත්වාගණනය කළ මතය

2019 - තතත්ත්වාගණනය කළ මතය

2020 - මතය වියාචනය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2017 වර්ෂය වන විට රු.173,159,909ක් ගෙවා අක්කර 1732 ක වපසරියකින් යුතු ඉඩම් දෙද්දූව සංචාරක සංවර්ධන ව්‍යාපෘතිය සඳහා අත්පත් කර ගෙන තිබුණ ද, 2021 ඔක්තෝම්බර් 30 දින වන විටත් එහි සංචාරක සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කර නොතිබුණි .තවද , 2020 වර්ෂය වන විට ඉඩම් පැවරීමේ සහතික ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා දී තිබුණද,එම ඉඩම් අධිකාරියේ වත්කම් ලෙස ගිණුම්ගත කිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. එසේම අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන අනුව, අධිකාරිය සතු ඉඩම්වල වටිනාකම රු.මිලියන 1,618 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණ ද, පවරා ගැනීම් ,අත්පත් කර ගැනීම් හෝ රජයේ ප්‍රදාන ආකාරයෙන් අයිතිය හිමිවූ එම සියලු ඉඩම් ඇතුළත් ඉඩම් රෙජිස්ටරයක් අධිකාරිය නඩත්තු කර නොතිබුණි. | පවරාගත් ඉඩම් වත්කම් ලෙස ගිණුම්ගත කළයුතුවීම සහ ඉඩම් රෙජිස්ටරයක් නඩත්තු කළයුතුවීම. | 2021 වසර තුලදී දෙද්දූව දේපලවල මායිම් මැනීම සහ වැටවල් සැකසීම් කටයුතු ආරම්භ කර ඇති අතර සම්පූර්ණ දේපල සඳහා ආයෝජකයෙකුගේ යෝජනාවක් ලැබී ඇත. | සංචාරක සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කර නොතිබුණු අතර, මෙකී ඉඩම් අධිකාරියේ වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යංශය, ශ්‍රී ලංකා සංචාරක හෝටල් කළමනාකරණ ආයතනය ,ශ්‍රී ලංකා සම්මේලන කාර්යංශය සහ සංචාරක සංවර්ධන අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශණවල දක්වා තිබුණු අධිකාරියට ලැබිය යුතු සහ ගෙවිය යුතු ශේෂයන්වල එකතුව එම දිනට අධිකාරියේ මූල්‍ය ප්‍රකාශණ සමඟ සැසඳීමේදී පිළිවෙලින් රු.208,833,634ක් සහ රු.6,745,553ක වෙනසක් නිරීක්ෂණය විය. තවද, ඉඩම්, වෙළඳ ණයගැතියන් සහ වෙනත් ආදායම් ගිණුම්වල ශේෂයන් සැසඳීමේදී රු.1,067,161ක වෙනසක් ද නිරීක්ෂණය විය. එසේවුවත්, මෙම වෙනස්කම් මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කර නොතිබුණි. | ශේෂ සැසඳීමට පියවර ගත යුතු වීම. | අධිකාරිය විසින් එම ආයතන වෙත ශේෂය දැනම් දීම සිදුකර ඇත. | ශේෂ සසදා ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු රු. මිලියන 120.8 ක් වූ කෙරීගෙන යන වැඩ වලට අදාළ වියදම් බිල්පත්‍ර හා උපයෝගී ලියවිලි, රු. මිලියන 214.5 ක් වූ සංවර්ධන පිරිවැයට අදාළ උපයෝගී ලියවිලි හා විස්තරාත්මක උපලේඛන, රු. මිලියන 54.6 ක් වූ ආයෝජන වලට අදාළ ආයෝජන සහතික, කල්පිටිය | අවශ්‍ය ලිපිලේඛණ සහ ගොණු ඉදිරිපත් කළයුතුවීම. | අදාල ලිඛිත ලියවිලි සහිත ලිපිගොනු 2021 වර්ෂයේ විගණනයේදී නිසි අයුරින් ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | 2022 ජනවාරි 31 දින දක්වාම අදාල ලේඛන ඉදිරිපත් නොකෙරුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | හිමිකම් යටතේ දක්වා ඇති රු. මිලියන 46.4 අදාළව නියෝජනය වන වත්කම් වල විස්තර සහ රු. මිලියන 243.7 ක් වූ සෘණ ප්‍රාග්ධන සංචිත ශේෂයට අදාළ විස්තරාත්මක උපලේඛන යනාදී විස්තර විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් මෙකී අයිතමයන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට හෝ නොහැකි විය. | | | |
| (ඇ) | 2020 දෙසැම්බර් 31 දිනට වූ වෙළඳ ණයගැති ශේෂය රු.210,359,144 ක් විය. ඉන් වර්ෂ 4කට වඩා පැරණි ණයගැති ශේෂ වටිනාකම රු.54,918,514 ක් වූ අතර, වර්ෂ 3ක සිට 4 ක් දක්වා පැරණි ණයගැති ශේෂ වටිනාකම රු.24,976,435 ක් වූ නමුත් මෙකී ණය අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | හිඟ ණයගැති ශේෂ අයකර ගැනීමට කටයුතු කළයුතු වීම | එම ශේෂ සම්බන්ධ නිකේතන කළමනාකරණ අංශය සමග සාකච්ඡා කර අවශ්‍ය පියවර ගනිමින් පවතී. | 2021 වර්ෂයේදීද හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඉ) | පාසිකුඩා ජාතික නිවාඩු නිකේතන පරිශ්‍රය තුළ ස්ථාපිත මලද්‍රව්‍ය හා අපවහන ජලය පිරිසිදු කිරීමේ පද්ධතියට අදාළව හෝටල් 14කින් 2013 වර්ෂයේ සිට 2020 වර්ෂය අවසානය දක්වා රු. 246,730,325ක් අයකරගෙන අදාල සමාගමට ගෙවීමට කටයුතු කර නොතිබුණි. | ගෙවිය යුතු මුදල් පියවිය යුතුවීම. | ඉදිරියේදී මේ සම්බන්ධව අවසාන තීරණයට එලඹෙන බව | හෝටල් ආයතනවලින් අය කිරීම් කර අදාළ සමාගමට ගෙවීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඊ) | 2005 අංක 38දරන සංචාරක කටයුතු පනතේ 6.1 (අ) සහ (ආ) වගන්ති ප්‍රකාරව සංචාරක සංවර්ධනය සඳහා යෝජිත දිගුකාලීන ඉලක්ක සහ සිව් අවුරුදු සැලැස්මක් සකස්කර අමාත්‍යයවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. පනතේ විධි විධාන ප්‍රකාරව නියෝග සකස් කළ යුතුවීම. | මේ වන විට සිව් අවුරුදු සැලැස්ම සකස් කරමින් පවතී. | දිගු කාලීන ඉලක්ක සහ සිව් අවුරුදු සැලැස්ම සකස් කර නොතිබුණි. |
| (උ) | 2005 අංක 38දරන සංචාරක කටයුතු පනතේ 26(3) වගන්තිය ප්‍රකාරව ප්‍රකාශිත යම් සංචාරක සංවර්ධන ප්‍රදේශයක් ඇතුළත කරගෙන යාහැකි සංචාරක කටයුතු, වාණිජ්‍ය හා වෙනත් කටයුතු නියම කරමින් නියෝග සකස් කළ යුතු වුව ද, ප්‍රකාශිත සංචාරක ප්‍රදේශ 11කට අදාලව 2021ඔක්තෝම්බර් 30 දින වන විටත් නියෝග සාදා නොතිබුණි. | අවශ්‍ය අනුමැතීන් ලබා ගතයුතු වීම. | අදාළ සංවර්ධන නීති, රෙගුලාසි සහ මාර්ගෝපදේශ සහිත සම්පූර්ණ කරන ලද සියලුම ප්‍රධාන සැලසුම් වාර්තා 2022 පළමු භාගයේ ගැසට් කරනු ඇත. | නියෝග සකස්කර නොතිබුණි. |
| (ඌ) | 1971 අංක 38 දරන මුදල් පනත ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේදී වටිනාකම රු.බිලියන 1 ක් කෙටිකාලීන ආයෝජනවල තැන්පත් කිරීම සඳහා අදාල අමාත්‍යවරයාගේ එකගත්වය සහිතව මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතුවීම. | තැන්පත් කිරීම් වලට අදාල අනුමැතිය ලබාගැනීම සඳහා 2021/12/16 දින භාණ්ඩාගාරය වෙත ලිපියක් මගින් ඉල්ලීමක් කර ඇත. | භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීම 2022 ජනවාරි අවසනාය දක්වා සිදුකර නොතිබුණි. |
| (එ) | කාලපරිච්ඡේදය හඳුනා නොගත් ගෙවීමට ඉදිරිපත් නොකළ රු.3,441,809 වූ චෙක්පත් සම්බන්ධයෙන් කාලපරිච්ඡේදය හඳුනා | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතුවීම. | 2021 වර්ෂයේ ගිණුම්වල නිවැරදි කරනු ඇත. 2021 වර්ෂයේ ගිණුම්වල නිවැරදි කරනු ඇත. | 2022 ජනවාරි 31 දින දක්වා මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | නොගත් ගෙවීමට ඉදිරිපත් නොකළ රු.3,441,809 ක් වූ චෙක්පත් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 396 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | | | |
| (ඒ) | 2013 වර්ෂයේ දී පූර්ව ශක්‍යතා අධ්‍යයනයකින් තොරව ආරම්භ කළ කැලිඩෝ වෙරළ උද්‍යාන ව්‍යාපෘතියේ එතෙක් කළ වැඩ ප්‍රමාණය මුහුද බාදනයට ලක්වීම නිසා විනාශ වී ගොස් තිබූ නමුත්, 2016 වර්ෂය තෙක් කොන්ත්‍රාත්කරුට ගෙවූ අත්තිකාරම් මුදල් රු.19,990,021ක් සහ කෙරීගෙන යන වැඩ වියදම් රු.1,247,206ක් වශයෙන් එකතුව රු.21,237,227ක් 2020 අවසාන දිනට ද මූල්‍ය ප්‍රකාශණවල ඉදිරියට ගෙනවිත් තිබුණි. | ගිණුම්වල අවශ්‍ය ගැලපීම් නිසි අනුමැතීන් සහිතව සිදුකළ යුතුවීම. | මෙම ගැලපීම 2021 වර්ෂයේ ගිණුම්වල සිදුකර ඇති බව කාරුණිකව දැනුම් දෙමු. | මේ සම්බන්ධව අමාත්‍යාංශය හා මහා භාණ්ඩාගාරය දැනුවත් කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඔ) | දුන්හිඳ දිය ඇල්ල මාර්ගයේ වෙළඳකුටි 20ක් ඉදිකිරීම සඳහා 2017 පෙබරවාරි ආරම්භ කළ ව්‍යාපෘතියේ 2021ජූනි 30දින වන විට එකතුව රු.2,864,289ක වියදමකින් කඩකාමර 10ක් පමණක් ඉදිකර තිබුණි. ප්‍රාදේශීය සභාවෙන් වියදම් දැරූ පසු අධිකාරිය විසින් එය ප්‍රතිපූරණය කරන පදනමින් | ව්‍යාපෘතිය ප්‍රමාදවීම් වලින් තොරව සම්පූර්ණ කළයුතුවීම. | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලෙස ඌව පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාට අප දැනටමත් දැනුම් දී ඇත. | ඉදිකිරීම් අතරමග නවතා දමා තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණු අතර අදාල ප්‍රාදේශීය සභාවට මුදල් නොමැතිවීම නිසා ඉදිකිරීම් නැවතී තිබුණි. | | | |
| (ඕ) | මදුරන්කුලියේ සංචාරක තොරතුරු හා පහසුකම් මධ්‍යස්ථානයක් (විවේකාංගනයක්) ඉදිකිරීමට 2016 වර්ෂය දක්වා රු. 6,771,8ක් අධිකාරිය විසින් වයඹ පළාත් සභාවට ගෙවා තිබුණ ද, පසුව ඉදිරිපත් කළ බිල්පත්‍රවල දෝෂ පැවතීම නිසා අධිකාරිය පළාත් සභාවට වියදම් ප්‍රතිපූරණය නොකිරීම හේතුවෙන් 2020 දෙසැම්බර් 31 දින වන විට ව්‍යාපෘතිය අතරමග නවතා දමා තිබුණි. | ව්‍යාපෘතිය ප්‍රමාදවීම් වලින් තොරව සම්පූර්ණ කළයුතුවීම | සංචාරක අධිකාරියේ ඉල්ලීමට අනුව සංචාරක අමාත්‍යාංශය විසින් මෙම ගැටලුව විසදීම සදහා වයඹ සංවර්ධන අධිකාරිය සමග සාකච්ඡා ආරම්භ කර ඇත | ව්‍යාපෘතිය අතරමග නවතා දමා තිබුණි. |
| (ක) | අධිකාරිය සතු ජාතික නිවාඩු නිකේතන 04 හි පසුගිය වර්ෂයේ එකතු අලාභය රු.27,003,697 ක් වූ අතර 2020 වර්ෂය සඳහා වූ එකතු අලාභය රු.46,016,794 ක් විය. ඒ අනුව 2019 සාපේක්ෂව 2020 වර්ෂයේ එකතු අලාභය සියයට 70 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. 2020 වර්ෂය තුළ සංවර්ධන කාර්යයන් 26 ක් සැලසුම් කර තිබුණ ද, ඉන් කාර්යයන් 11 ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණු අතර ඒවායින් කාර්යයන් 8 ක පමණක් භෞතික ප්‍රගතිය සියයට 75 ට වඩා වැඩිවුණි. | ජාතික නිවාඩු නිකේතන ලාභදායී වන අයුරින් මෙහෙයවීම සහ සැලසුම් කළ පරිදි සංවර්ධන කාර්යයන් ඉටුකළ යුතුවීම. | සියලු නිකේතන පාඩු නොලබන මට්ටමෙන් පවත්වාගෙන යාමට අමාත්‍යාංශ ලේකම්වරයා විසින් පත්කරන ලද කමිටුවක් විසින් මේ දිනවලදී සියලු. නිරීක්ෂන කටයුතු ආරම්භ කර ඇත. | සමුච්චිත අලාභයේ වර්ධනයක් දක්නට ලැබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ග) | සංචාරක කටයුතු සඳහා නිදහස් ප්‍රදාන වශයෙන් 2010 සහ 2012වර්ෂයන්වලදී කල්පිටියේ දූපත් 12ක ඉඩම් අක්කර 2055.87ක භූමි ප්‍රමාණයක් අධිකාරියට ලැබී තිබුණි. එම දූපත් 12න් දූපත් 05කට අයත් ඉඩම් අක්කර 206.74ක් පමණක් 2010, 2011 සහ 2020 වර්ෂවලදී සමාගම් 03ට බදු දීමට කටයුතු කර තිබුණු නමුත් එම කිසිදු සමාගමක් 2021 ඔක්තෝම්බර් 30දින වන විටත් මෙහෙයුම් කටයුතු ආරම්භ කර නොතිබුණි .ඉතිරි දූපත් 07හි ඉඩම් අක්කර 1849.13ක් ප්‍රදාන වශයෙන් ලැබුණු දිනයේ සිට 2021 ඔක්තෝම්බර් 30 දක්වාම සංචාරක සංවර්ධන කටයුතු සඳහා යොදවාගෙන නොතිබුණි. | නිදහස් ප්‍රදාන වශයෙන් ලද ඉඩම් සංචාරක සංවර්ධන කටයුතු සඳහා යොදා ගතයුතු වීම. | 2022 වසරේ පළමු කාර්තුව වන විට දූපත් 12න් 11 බදු දී සියලු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අධිකාරිය අදහස් කරන බව. | 2022 ජනවාරි 31 දින වන විටත් කිසිදු සමාගමක් මෙහෙයුම් කටයුතු ආරම්භ කර නොතිබුණි. |
| (ච) | යාල පලටුපාන වනජීවී සංචාරක කලාපයේ සංචාරක සංවර්ධන කටයුතු සඳහා අධිකාරියට අක්කර 1,106ක් 1975 වර්ෂයේ සිට අයිතිව පැවති අතර 2014වර්ෂයේදී සමාගම් 7ක් සහ 2019 වර්ෂයේදී තවත් සමාගමක් වශයෙන් අක්කර 69ක් සමාගම් 08කට බදු දී තිබුණි . එහෙත් 2021 ඔක්තෝම්බර් 30දින වන විට සමාගම් 04ක් පමණක් මෙහෙයුම් කටයුතු ආරම්භ කර තිබුණි. | බදු දුන් සමාගම් මෙහෙයුම් කටයුතු ආරම්භ කරවීමට පෙළඹවීම් කිරීමට කටයුතු කළ යුතු වීම. | 2019 වර්ෂය අවසාන වන විට අධිකාරියේ යෝජිත ප්‍රධාන සැලසුම 7න් 6ක් බදු දී ඇත. මින් 2 ක් වානිජමය කටයුතු සිදුවෙමින් පවතී. එක් ව්‍යාපෘතියක් තවමත් අනුමත කිරීමේ මට්ටමේ පවතින අතර අනෙක බදුදී අවසන්ය. | සමාගම් 4 ක් පමණක් මෙහෙයුම් කටයුතුවල නිරත වී තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඡ) | 2011 සහ 2014 වර්ෂ වලදී අධිකාරිය විසින් කුච්චවෙලි සංචාරක සංවර්ධන ව්‍යාපෘතින් සඳහා පවරා ගත් ඉඩම් අක්කර 510.086ක් වූ භූමි ප්‍රමාණයෙන් ඉඩම් අක්කර 49ක් පමණක් සමාගම් 3කට බදු දී තිබුණි . එසේ බදු දී තිබුණු සමාගම් 3න් ද, එක් සමාගමක් ගිවිසුම් වලට එළඹ තිබුණේ 2021මැයි මාසයේදී වූ අතර 2011දී අක්කර 20ක් බදු ගත් තවත් සමාගමක් විගණන දිනය වූ 2021ඔක්තෝම්බර් 30වන විටත් එහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි .ඒ අනුව කුච්චවේලි ව්‍යාපෘතියේ ඉඩම් අක්කර 461.086ක් 2021 ඔක්තෝම්බර් 30 දින වන විටද, සංචාරක සංවර්ධන කටයුතු සඳහා බදු දී නොතිබුණි. | ඉඩම් සංචාරක සංවර්ධන කටයුතු සඳහා බදු දීමට කටයුතු කළයුතුවීම | 2022 වසරේ පළමු කාර්තුව වන විට බදු ගිවිසුම් අත්සන් කර ව්‍යාපෘති ආරම්භ කිරීමට අධිකාරිය අදහස් කරගෙන සිටින බව | ඉඩම් සියල්ල සංචාරක සංවර්ධන කටයුතු සඳහා බදු දීමට කටයුතු කර නොතිබුණි. |
| (ට) | අධිකාරිය සතු තානායම් 37 න් තානායම් 9 ක් මාස 05 ක සිට මාස 52 ක් දක්වා කාලයක් බදු දී නොතිබීම හේතුවෙන් එකී දේපල ඌන උපයෝජිතව පැවතුණි | තානායම් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු වීම. | 2022 වර්ෂයේ ටෙන්ඩර් කැඳවීමට බලාපොරොත්තු වන බව | 2022 ජනවාරි 31 දක්වාම තානායම් දේපල ඌන උපයෝජිතව පැවතුණි. |

## 63. ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමණාකරණ ආයතනය

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 - තතත්ත්වාගණනය කළ මතය

2019 - තතත්ත්වාගණනය කළ මතය

2020 - තතත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | පැතුරුම් පත් (Excel) භාවිතයෙන් යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනයක් පවතී. | චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනය පිළියෙල කර නොතිබුණි. |
| (ආ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයි.ඒ.අයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව පරිගණක දෘඩාංග සහ මෘදුකාංග සඳහා ලේඛනයක් පවත්වා නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | ස්ථාවර වත්කම් කළමනාකරණ පද්ධතිය හඳුන්වාදීමට නියමිතය. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | හෝටල් පාසල් 9 ක ලියාපදිංචි ගාස්තු, විභාග ගාස්තු සහ පාඨමාලා ගාස්තු මුළු ආදායම රු.22,176,300ක් විය යුතු වුවත් එය රු.15,539,450 ක් ලෙස මුදල් පදනමින් හඳුනාගැනීම හේතුවෙන් 2020 වර්ෂය සඳහා ආදායම හා ලැබිය යුතු ආදායම රු.6,636,850ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | හෝටල් පාසල්වල ආදායම් නිවැරදිව ගණනය කළ යුතුවීම. | හිඟ ලැබිය යුතු ආදායම් 2021 වර්ෂයේ ගිණුම් වලට ගැලපීමට කටයුතු කර ඇත. | 2021 වර්ෂයේදීද නිවැරදි කර නොතිබුණි. |
| (ඈ) | ආයතනයේ 2020 මූල්‍ය ප්‍රකාශන අනුව ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යංශයෙන් සහ ශ්‍රී ලංකා | නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වීම. | 2021 වර්ෂයේදි සැසඳීම් කොට නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | 2021 වර්ෂයේදීද නිවැරදි කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | සංචාරක සංවර්ධන අධිකාරියෙන් ලැබිය යුතු මුදල රු.10,680,241 ක් වුවද එම ආයතනයන්හි මූල්‍ය ප්‍රකාශන අනුව එය රු.241,344ක් වූයෙන් ගිණුම් අතර 10,438,897ක වෙනසක් පෙන්නුම් කෙරුණි. ආයතනයේ මූල්‍ය ප්‍රකාශන අනුව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු මුදලක් නොමැති වුවද අධිකාරියේ ගිණුම් අනුව එම මුදල රු.8,971,374ක් වූයෙන් ගිණුම් අතර රු.8,971,374ක වෙනසක් පෙන්නුම් කෙරුණි. එසේ වුවත්, මෙම වෙනස්කම් අදාල ආයතන සමඟ සාකච්ඡාකර ගිණුම්වල ගැලපීමට කටයුතු කර නොතිබුණි. | | | |
| (ඉ) | 2020 දෙසැම්බර් 31 දිනට වෙළඳ ණයගැතියන්ගේ වටිනාකම රු.25,517,565 ක් වූ අතර 2021 මාර්තු 31 දින වන විට ද එකදු ණයගැතියෙක්ගෙන් හෝ ශේෂ තහවුරු කිරීම් ලැබී නොතිබුණි. තවද එම ණයගැතියන්ගෙන් එකතුව රු.15,987,312 ක් වසර 05 කට වඩා හිඟව පැවති අතර එය, මුළු වෙළඳ ණයගැතියන්ගේ සියයට 63 ක් විය. ඒ අතරින් එක් ණයගැතියෙකුගෙන් ලැබිය යුතු රු.4,068,000 ක් | ණයගැතියන් සඳහා අඩමාන ණය වෙන් කිරීම් ප්‍රතිපත්තියක් හඳුන්වාදීම සහ හිඟ ණයගැති ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවීම. | ණයගැති හා අඩමාන ණය වෙන් කිරීමේ ප්‍රතිපත්තියක් සකස් කොට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමින් පවතී. | 2021 වර්ෂයේදීද නිවැරදි කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | අයකර ගැනීමට නීත්‍යානුකුල කටයුතු සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර තිබුණු අතර, තවත් රු.5,140,571 ක් එවකට පැවති ආර්ථික සංවර්ධන අමාත්‍යාශයෙන් ලැබිය යුතු ශේෂයක් ලෙස දක්වා තිබුණි. කෙසේ වුවද, ණයගැතියන්ගේ හානිකරණ අගය සඳහා වෙන් කිරීම් කිරීමට කටයුතු කර නොතිබුණි. | | | |
| (ඊ) | 2014 දී තොරතුරු පද්ධතියක් සංවර්ධනය කිරීමට රු.3,771,216 ක් වැයකර තිබුණ ද, ආයතනයේ අවශ්‍යතාවයන් සමග නොගැළපීම හේතුවෙන් එම පද්ධතිය භාවිතා කිරීම අත්හැර දමා තිබුණි. | ආයතනයේ අවශ්‍යතාවයන් සමග ගැලපෙන පරිදි තොරතුරු පද්ධති සංවර්ධනය කිරීමට කටයුතු කළ යුතු වීම. | ස්ථාවර වත්කම් කළමනාකරණ පද්ධතිය හා ගබඩා පාලන පද්ධති සංවර්ධනය සඳහා ප්‍රසම්පාදන කටයුතු අවසන් කොට, 2022 වර්ෂයේදි හඳුන්වා දීමට නියමිතව ඇත. | නිශ්කාර්ය වියදමක් බවට පත් වී තිබුණද ඒ පිළිබඳ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (උ) | 2011 දී ආර්ථික කටයුතු අමාත්‍යාංශයෙන් ලැබී තිබුණ මෝටර් රථයක් 2020 වර්ෂය දක්වාම ආයතනය භාවිතා කරන නමුත්, මෙකී මෝටර් රථයේ අයිතිය ආයතනයට පවරා ගැනීමට හෝ එම රථය තක්සේරු කර ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | වාහනයේ අයිතිය පවරා ගැනීමට සහ තක්සේරු කර ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතු වීම. | පැහැදිලි කිරීම් ඉදිරිපත් කර තිබුණි. අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නැත. | 2021 වර්ෂයේදී හෝ මෝටර් රථයේ අයිතිය පවරාගෙන ගිණුම් ගත කර නොතිබුණි. |
| (ඌ) | 2020 වර්ෂය වෙනුවෙන් අමුද්‍රව්‍ය සැපයුම්කරුවන් ලියාපදිංචි නොකර 2019 වර්ෂයේ ලියාපදිංචි වූ | සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමට කටයුතු කිරීම සහ බැහැරවීම් වලට අදාලව | 2019 වර්ෂයේදි සැපයුම් කරුවන් ලියාපදිංචිය ප්‍රමාද වූ බැවින් 2019/4-2020/05 දක්වා කාලච්ඡේදය සඳහා | මිල ගණන් වලින් බැහැරවීම් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන |

| | | | | |
|---|---|---|---|---|
| | සැපයුම්කරුවන්ගෙන් 2019 වර්ෂයේ එකඟවූ මිල ගණන්වලින් බැහැරව වෙළඳපළ වටිනාකම රු.10,406,662 ක අමුද්‍රව්‍යමිලදී ගෙන තිබුණි. මෙකී බැහැරවීම් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ද ලබාගෙන නොතිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගැනීමට කටයුතු කළ යුතු වීම. | සැපයුම් කරුවන් ලියාපදිංචි කරන ලද අතර 2020 ඉතිරි මාස කහිපය සඳහා නැවත සැපයුම්කරුවන් ලියාපදිංචිය ආර්ථික වශයෙන් අවාසිදායක බැවින් සැපයුම්කරුවන්ගේ ලියාපදිංචිය දීර්ඝ කරන ලදී. | නොතිබුණි. |
| (එ) | 2020 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මට අනුව ක්‍රියාකාරකම් 09 ක් සඳහාරු. මිලියන 17.1 ක් වෙන් කර තිබුණද, 2020 වර්ෂය තුළ දී එම ක්‍රියාකාරකම් කිසිවක් ක්‍රියාත්මක කර නොතිබුණු අතර, ඒ තුල ගබඩා කළමනාකරණ පද්ධතියක් ස්ථාපනය කිරීම සහ ස්ථාවර වත්කම් කළමනාකරණ පද්ධතියක් ස්ථාපනය කිරීම සඳහා වෙන් කරන ලද රු.මිලියන 7 ක්ද ඇතුලත්ව තිබුණි. තවද, ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබුණු ක්‍රියාකාරකම් 4 ක් සඳහා වර්ෂය තුළදී සියයට 50කටත් වඩා අඩුවෙන් මුදල් උපයෝජනය කර තිබුණි. | ක්‍රියාකාරී සැලැස්ම වඩා සාර්ථක කළමනාකරණ මෙවලමක් ලෙස යොදාගත යුතු වීම | පැහැදිලි කිරීම් ඉදිරිපත් කර තිබුණි. | ක්‍රියාකාරී සැලැස්මේ ක්‍රියාකාරකම් ඉටුකර ගැනිමට කටයුතු කර නොතිබුණි. |

## 64. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 - තත්ත්වාගණනය කළ මතය

2019 - තත්ත්වාගණනය කළ මතය

2020 - තත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් භාවිතා කරනු ලබන රු.171,405,969 ක ස්ථාවර වත්කම් රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව නැවත තක්සේරු කර නොතිබුණි. | ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 2021 වර්ෂයේදීද වත්කම් නැවත තක්සේරු කර නැත. |
| (ආ) | අත්පත් කර ගැනීම් විස්තර දක්වා නොතිබුණු විදුලි ජනක යන්ත්‍රයේ වටිනාකම තක්සේරු කර 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන වල දැක්විය යුතු වීම. | විදුලි ජනක යන්ත්‍රයේ වටිනාකම ප්‍රත්‍යාගණනය කළ පසු මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කිරීම. | 2021 වර්ෂයේදීද නිවැරදි කර නැත. |
| (ඇ) | පශ්චාත් උපාධි අධ්‍යයන පාඨමාලා ගාස්තු සහ ඉංග්‍රීසි වැඩසටහන් ගාස්තු ලෙස 2020 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව පවතින රු.12,673,661 ක් අය කර ගැනීම අවිනිශ්චිත වී ඇත. | ශේෂ අය කරගැනීම හෝ නිසි අනුමැතියෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතු වීම. | වසර 5 ඉක්මවූ පාඨමාලා ගාස්තු ලියා හැරීම සඳහා වන අනුමැතිය ලබා ගැනීමට ඉදිරියේදී පැවැත්වීමට නියමිත පාලක සභාවට ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම. | අයකර ගැනීමට කටයුතු කර නැත. |
| (ඈ) | 2020 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයෙන් ලැබිය යුතු ලෙස දක්වා ඇති වසර 05 ඉක්මවූ රු.7,610,160ක් ගෙවීමට ඇති බවට අමාත්‍යාංශ මූල්‍ය ප්‍රකාශනවලින් සනාථ නොවුණි. | නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. | හිඟ මුදල් පිළිබඳව සමාලෝචනය කර හඳුනාගන්නා එක් එක් ශේෂයන් අමාත්‍යාංශයේ සහ පාලක සභාවේ අනුමැතිය යටතේ ගැලපීමට කටයුතු කිරීම. | නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ පුහුණු වැඩසටහනක් වෙනුවෙන් ලද මුදලින් 2020 දෙසැම්බර් 31 දිනට ආපසු ගෙවිය යුතු වර්ෂ 05 ඉක්මවූ රු.2,094,163ක් ගෙවා නිදහස් කර නොතිබුණි. | නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. | තොරතුරු ලබා ගැනීමෙන් පසු මෙම මුදල රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයට හෝ මුදල් අමාත්‍යාංශයට ආපසු ගෙවීමට කටයුතු කිරීම. | අදාල කටයුතු 2021 වර්ෂයේදීද සිදු කර නැත. |
| (ඊ) | 2015 මැයි 05 දිනැති අංක 01/2015/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයට අනුකූල නොවන ලෙස විදේශ ගමන් වලදී ආයතනයේ නිලධාරීන් 11 දෙනෙකු සඳහා සහ වෙනත් ආයතනවල නිලධාරීන් 166 ක් සඳහා රු.4,115,324 ක් (ඇ.ඩොලර් 23,788) 2018 වර්ෂයේදී වැඩිපුර ගෙවා තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතු වීම. | 2019 වර්ෂයේ සිට චක්‍රලේඛය පරිදි සංයුක්ත දීමනාවෙන් සියයට 35 න් 1/3 ක් ගෙවීමට කටයුතු කර ඇත. | වැඩිපුර ගෙවූ මුදල ආපසු අය කර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නැත. |
| (උ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයට අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛණය පවත්වා ගෙන යා යුතු වීම. | ස්ථාවර වත්කම් ලේඛනයේ වල පැවති අඩුපාඩු සකස් කිරීමට කටයුතු කර ඇත. | 2021 වර්ෂයේදීද ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීනව පවත්වා නැත. |
| (ඌ) | 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.3 වගන්තියට අනුව දිරිදීමනා පටිපාටිය සකස් කර මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව ආයතනයේ කාර්ය මණ්ඩලය වෙත දිරි දීමනා ලෙස 2018,2019 හා 2020 වර්ෂවලදී පිළිවෙලින් රු.7,469,067, රු.2,380,148ක් හා රු.3,202,850ක් ගෙවා තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | අදාල අනුමැතිය ලබාගැනීමට ක්‍රියාමාර්ග ගෙන නැත. | අනුමත දිරිදීමනා පටිපාටියකින් තොරව දිගින් දිගටම දිරිදීමනා ගෙවනු ලබයි. |

| | | | | |
|---|---|---|---|---|
| (එ) | ආයතනයේ පවත්වා ගෙන යන ජංගම බැංකු ගිණුම් දෙකෙහි දිනකට රු.මිලියනකට ආසන්න සාමාන්‍ය මුදල් ශේෂයක් නිශ්කාර්යව පවත්වා ගොස් තිබුණි. | අතිරික්ත මුදල් ශේෂ කෙටිකාලීන තැන්පත්වල ආයෝජනය කළ යුතු වීම. | මේ සම්බන්ධයෙන් පාලක මණ්ඩලයේ උපදෙස් පරිදි එක් ගිණුමක රු මිලියන 15ක් සහ අනෙක් ගිණුමෙහි රු මිලියන 5ක් ඉතිරි වන පරිදි වැඩිපුර තිබෙන මුදල් ප්‍රමාණය ස්වයංක්‍රීයව ඉතිරි කිරීමේ ගිණුම් 2කට මාරුවන පරිදි ගිණුම් විවෘත කර ඇත. | තවදුරටත් මුදල් නිශ්කාර්යව පවතියි. |
| (ඒ) | උපදේශකවරුන් විසින් මාසිකව ඉටුකල යුතු අවම දේශන පැය ප්‍රමාණය පැය 45 ක සීමාව වෙත ලඟාවිය යුතු බවට පොදු ව්‍යාපාර කාරක සභාව තීරණය කර තිබුණි. එහෙත් එසේ අවම දේශන පැය ගණන ආවරණය නොකරන ලද දේශකවරුන්ගෙන් 2020 දෙසැම්බර් 31 දිනට රු.9,389,325ක් ආපසු අයකර නොතිබුණි. | වැඩියෙන් ගෙවූ දේශන ගාස්තු ආපසු අය කිරීමට කටයුතු කළ යුතු වීම. | ආයතනයේ උපදේශකවරු විසින් සිදු කළ යුතු දේශණ පැය පිළිබඳ තත්ත්වය පරීක්ෂා කර බලා වාර්තාවක් සකස් කිරීමට කමිටුවක් පත් කිරීම. | කමිටු වාර්තාව නිම කර නොමැති අතර අයකරගැනීම් සිදු කර නැත. |
| (ඔ) | 2008-2010 කාලපරිච්ඡේදයට අයත් පශ්චාත් උපාධි පාඨමාලාවේ වාර්තාව 2020 වර්ෂයේදී සකස් කර ඉදිරිපත් කිරීම වෙනුවෙන් රු.1,432,463ක් විධිමත් අනුමැතියකින් තොරව කාර්ය මණ්ඩලය වෙත ගෙවා තිබුණි. | භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කල යුතු වීම. | පැහැදිලි කිරීම් ඉදිරිපත් කර තිබුණි. | භාණ්ඩාගාර අනුමැතියකින් තොරව ගෙවීම් සිදු කරමින් පවතී. |
| (ඕ) | 2013 පෙබරවාරි 07 දින අමාත්‍ය මණ්ඩලය විසින් පනත සංශෝධනය කිරීමට අනුමැතිය ලබා දී තිබුණද එය සිදුකර නොතිබුණි | අමාත්‍ය මණ්ඩල තීරණය අනුව පනත සංශෝධනය කල යුතු වීම. | කෙටුම්පත් කළ පනත නීතිපති දෙපාර්තමේන්තුවේ නිර්දේශ සඳහා යොමු කරන ලද අතර එම දෙපාර්තමේන්තුවේ යෝජනා | 2021 වර්ෂයේදීද පනත සංශෝධනය කර අවසන් නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | | | හා නිර්දේශ පරිදි සකස් කරමින් පවතී. | |
| (ක) | 2020 දෙසැම්බර් 31 වනවිට ආයතනය සතු නිලනිවාස 05ක් භාවිතයට ගැනීමකින් තොරව නිශ්ක්‍රීයව පැවතුණි | නිල නිවාස නිසි පරිදි උපයෝජනය කිරීමට කටයුතු කල යුතු වීම. | ආයතනය වෙත නිල නිවාස හඳුන්වා දීමේදී අනුගමනය කළ ප්‍රතිපත්තිය අනුව සුදුසු පරිදි නිල නිවාස ලබා දීමට කටයුතු කිරීම. | 2021 වර්ෂය අවසානය වන විටත් නිලනිවාස නිශ්ක්‍රීයව පවතී. |
| (ග) | 2020 දෙසැම්බර් 31 දිනට උපයෝජනය නොකළ භාණ්ඩාගාර ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමේ ශේෂය රු.36,068,820 ක් විය. | අතිරික්ත මුදල් උපයෝජනය කිරීමට කටයුතු කල යුතු වීම. | ඉදිරියේදී ආයතනයේ ප්‍රග්ධන වියදම් අවශ්‍යතා සඳහා උපයෝජනය කර ගැනීමට කටයුතු කරනු ලැබේ. | ප්‍රාග්ධන ප්‍රදාන උපයෝජනය නොකර කෙටිකාලීන තැන්පත් වල ආයෝජනය කර ඇත. |

## 65. ශ්‍රී ලංකා සම්මේලන කාර්යංශය

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - තතත්ත්වාගණනය කළ මතය

2019 - තතත්ත්වාගණනය කළ මතය

2020 - තතත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව 2010 අගෝස්තු මස 18 දින අනුමත කරන ලද, අනුමත බඳවා ගැනීමේ පරිපාටියෙන් බැහැරව අවශ්‍ය සේවා පළපුරුද්ද සපුරා නොමැති නිලධාරිනියක් පත්කර 2018 ජූනි මස සිට 2019 දෙසැම්බර් දක්වා වැටුප්, ඉන්ධන හා වාහන දීමනා, දුරකථන දීමනා, රාජකාරී විදේශ සංචාර දීමනා හා සෞඛ්‍ය රක්ෂණ දායක මුදල් ලෙස රු.3,825,643 ක් ගෙවා තිබුණි. | බඳවා ගැනීමේ පටිපාටියට අදාළ සුදුසුකම් සපුරා තිබිය යුතු බව. | පැහැදිලි කිරීම් ඉදිරිපත් කර තිබුණි. | බඳවා ගැනීමේ පටිපාටියට අදාල සුදුසුකම් සපුරා නොතිබුණි. |
| (ආ) | සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු නමුත් 2020 වර්ෂයේදී භාවිතයට ගනු ලබන පිරිවැය රු.6,700,000 ක් වූ මෝටර් රථයක ඵලදායී ජීවිත කාලය නැවත සමාලෝචනය කර ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 03 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල ගැළපීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රමිත ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල ගැළපීමට කටයුතු කළ යුතු බව. | මෙම මෝටර් රථය දැනට භාවිතයට ගත නොහැකි තත්ත්වයේ පවතින අතර අවශ්‍ය අලුත්වැඩියා කටයුතු සඳහා අනුමැතිය ලබා ගෙන ඉදිරියේදී ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කරමු. | අලුත්වැඩියාව සඳහා මිල ගණන් කැඳවා තිබුණි. |
| (ඇ) | 2020 වර්ෂයේදී ජීවන වියදම් දීමනාව නොසලකා හැර ගණනය කිරීම් සිදු කිරීම නිසා | විශ්‍රාම පාරිතෝෂිකයවෙන් කිරීමේදී ජීවන වියදම් | මේ වන විට විශ්‍රාම පාරිතෝෂිකය වෙන් කිරීමේදී ජීවන වියදම් දීමනාව | 2021 වර්ෂයේදීද නිවැරදි කිරීමට කටයුතු කර |

| | | | | |
|---|---|---|---|---|
| | විශ්‍රාම පාරිතෝෂික වෙන් කිරීම් රු.362,700ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | දීමනාව සැලකිල්ලට ගත යුතු බව. | සැළකිල්ලට ගනු ලබයි. | නොතිබුණි. |
| (ඈ) | 2020 වර්ෂයේ කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන අනුව අයවිය යුතු ශේෂයන් නොපෙන්වුවද, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ සහ ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ ගිණුම් අනුව පිළිවෙලින් රු. 263,223 ක සහ රු. 35,308ක ගෙවිය යුතු ශේෂයක් දක්නට ලැබුණි. | සම්බන්ධිත පාර්ශව අතර ගනුදෙනු ගිණුම්වලට ගැලපීමට කටයුතු කළයුතු බව. | මෙම ගැලපීම් නිවැරදි කර අදාල ශේෂ නිරවුල් කිරීම සඳහා 2021 වසරේ කටයුතු කරමු. | 2021 වර්ෂයේදීද නිරවුල් කර නොතිබුණි. |

**66. ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 - තත්ත්වාගණනය කළ මතය

2019 - තත්ත්වාගණනය නොකළ මතය

2020 - තත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 1996 අංක 17 දරන ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ පනතේ 15 (2) වගන්ති හා විධිවිධාන ප්‍රකාරව ප්‍රතිලාභ අහිමි වී ඇති අක්‍රීය ප්‍රතිලාභීන්ට ඒ බව දැන්වීමට කටයුතු කළ යුතු වුවත්, පරිගණක පද්ධතිය ක්‍රියා විරහිත වීම හේතුවෙන් 2015 ජනවාරි 01 දින සිට අක්‍රීය වූ දායකයන් හා ඔවුන් ගෙවූ දායක මුදල් වටිනාකම හඳුනාගැනීමට නොහැකි වී තිබුණි. 2014 දෙසැම්බර් 31 දිනට අක්‍රීය දායකයන්ගේ සංඛ්‍යාව 288,234ක් විය. | මණ්ඩලයේ ප්‍රධාන අරමුණ වූ විශ්‍රාම වැටුප් ක්‍රමය ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් තොරතුරු දත්ත පද්ධතිය යාවත්කාලීන කර ක්‍රියාත්මක තත්ත්වයට පත්කිරීමට කඩිනම් පියවර ගත යුතුය. | දත්ත පද්ධතිය ක්‍රියාකාරී තත්ත්වයට පත්කිරීම සඳහා කටයුතු කෙරෙමින් පවතී. | පැවති දත්ත පද්ධතිය යාවත්කාලීන කර හා වැඩිදියුණු කිරීමට ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීමට පමණක් පියවර ගෙන තිබුණි. |
| (ආ) | ''සුරැකුම'' හා ''ආරක්ෂාව'' විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ යෝජනා ක්‍රම සඳහා බොහෝ දිස්ත්‍රික්ක වල දායකයන් බඳවාගැනීම් සංඛ්‍යාව 500ක්ව පැවතුණි. එකී දුර්වල තත්ත්වයට හේතු වී තිබුණේ දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරීන්ගේ ආකාර්යක්ෂමතාවය බව නිරීක්ෂණය විය. | විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ යෝජනා ක්‍රමය පිළිබඳව ජනතාව දැනුවත් කර බඳවාගැනීම් වර්ධනය කිරීමට සම්බන්ධීකරණ නිලධාරීන්ට උපදෙස් දීම හා ප්‍රමාණවත් පසු විපරම් කටයුතු සිදු කර බඳවා ගැනීම වර්ධනය කළ යුතුය. | ප්‍රගතිය වර්ධනය කිරීම සඳහා අනුයුක්ත කර ඇති සම්බන්ධීකරණ නිලධාරීන් වෙත උපදෙස් ලබාදීමටත් අවවාද කිරීම් ලබාදීමටත් කටයුතු කර තිබුණි. | විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම සඳහා දායකයන් බඳවාගැනීම් කටයුතු වල සුළු වර්ධනයක් පෙන්නුම් කළ ද එය මෙම යෝජනා ක්‍රමයේ වර්ධනයට ප්‍රමාණවත් වී නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) මණ්ඩලයේ පරිගණක තොරතුරු පද්ධතිය නිර්මාණය කිරීම වෙනුවෙන් 2016,2017 හා 2018 වර්ෂවලදී මහා භාණ්ඩාගාරයෙන් ලැබුණු එකතුව රු.12,511,000ක් වූ මූලධන ප්‍රදානයන් , පරිගණක තොරතුරු පද්ධතිය නිර්මාණය කිරීමේ කටයුතු ඉටු නොකිරීම හේතුවෙන් උපයෝජනය කර නොතිබුණි. | ලැබුණු ප්‍රතිපාදන උපයෝජනය කර පරිගණක තොරතුරු පද්ධතිය නිර්මාණය කිරීමේ කටයුතු කඩිනම් කළ යුතුය. | ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීමට පමණක් කටයුතු කර තිබුණි. | කොන්ත්‍රාත් පැවරීම් සිදුකර කටයුතු ක්‍රියාත්මක කෙරෙමින් පවතින අතර කටයුතු ක්‍රියාත්මක කිරීමේදී බොහෝ ප්‍රමාදයන් පැවතිණි. |
| (ඈ) ප්‍රතිපාදන සලසා නොගෙන හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ විධිවිධාන වලට පටහැනිව රු.165,000,000ක් වූ රජයේ තක්සේරු වටිනාකම ඉක්මවා විශ්‍රාම වැටුප් අරමුදලින් රු.195,000,000ක් වැය කර මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය සඳහා 2013 වර්ෂයේදී ගොඩනැගිල්ලක් මිලදී ගෙන තිබුණි. මේ අනුව රු.මිලියන 30ක පාඩුවක් සිදුකර ගොඩනැගිල්ල මිලදී ගැනීමේ අක්‍රමිතතාවය සම්බන්ධයෙන් ඊට වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව කටයුතු කර නොතිබුණි. | රජයේ කත්සේරු වටිනාකම ඉක්මවා ගොඩනැගිල්ල මිලදි ගැනීම සම්බන්ධයෙන් ඊට වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව විනය කටයුතු කිරීම හා වැඩිපුර ගෙවූ මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | කටයුතු ක්‍රියාත්මක කිරීම පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරිණි. | සිදුකර තිබුණු පාඩුව පූර්ණය කර ගැනීම හා ඊට වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව කටයුතු කර නොතිබුණි. |

## 67. සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය

මූලා ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - තතත්ත්වාගණනය කළ මතය

2019 - තතත්ත්වාගණනය කළ මතය

2020 - තතත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | පනතේ ප්‍රධාන කාර්යයන් වලින් බැහැරව එකතු වන අපද්‍රව්‍ය පරීක්ෂා කර තහවුරු කර ගැනීමකින් තොරව සාගරයට බැහැර කර තිබුණි. | පනතේ සඳහන් බලතල ක්‍රියාත්මක කර මෙකී කටයුතු පාලනය කිරීමට ක්‍රියා කළ යුතුය. | අන්තරාකාරී අපද්‍රව්‍ය දිගුනළ මගින් සාගරයට බැහැර කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීම සඳහා අධිකාරියේ රසායනාගාරයක් ස්ථාපිත කිරීමට හා පසුවිපරම් කිරීමට මෙම පරිශ්‍රය තුළ අවශ්‍ය පහසුකම් ලබාගැනීමට සාකච්ඡා වට කිහිපයක් පවත්වා ඇත. | 2022 ජනවාරි වන විටත් එලෙසම පැවතුණි. |
| (ආ) | 2018 ජූනි 06 දිනැති අංක අමප/18/0863/725/028 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව වරායන් ඇතුළු වෙරළ කලාපය තුළ අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම සම්බන්ධ මෙහෙයුම් කටයුතු තිරසාර ලෙස පවත්වා ගැනීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු බවට මුදල් හා ජනමාධ්‍ය ඇමතිගේ නිරීක්ෂණවලින් අවධාරණය කරනු ලැබ ඇති කරුණු කෙරෙහි නිසි සැලකිල්ලක් දක්වමින් ඒ අනුව ක්‍රියාමාර්ග ගන්නා ලෙස පළාත්සභා, පළාත්පාලන සහ ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම්ට නියම කිරීම කළ යුතු බව දක්වා | පෙන්වාදී ඇති කරුණු සම්බන්ධයෙන් පළාත් සභා හා පළාත් පාලන ආයතන වලට නියම කිරීමට අදාල ක්‍රියාමර්ග ගත යුතුය. | වෙරළබඩ දිස්ත්‍රික්ක 14 තුළම අදාල පළාත් පාලන ආයතන සමඟ සාකච්ඡා කර, වෙරළ කළමනාකරණ කමිටු 84 ක් දිවයින වටා වෙරළතීර ආශ්‍රිතව පිහිටුවීට කටයුතු කර ඇත. | වෙරළ කළමනාකරණ කමිටුවල කාර්යසාධනය පසු විපරම් කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | | | |
| (ඇ) | ධීවර කර්මාන්තය ආශ්‍රිතව සිදුවන සමුද්‍රිය පරිසරය දූෂණය වන ක්‍රමවේද හඳුනාගැනීම තුළින් එය අවම කිරීම සඳහා ජාතික උපායමාර්ග හා ක්‍රියාකාරී සැලැස්ම අධිකාරිය විසින් කෙටුම්පත් කර තිබුණද එහි ඉදිරි පියවරයන් මන්දගාමී අයුරින් සිදුවී තිබුණි. | කඩිනමින් අවශ්‍ය පියවරයන් ගත යුතුය. | ධීවර වරායන් 05 ක් සඳහා අපද්‍රව්‍ය කළමනාකරණ සැලසුම් 05 ක් අධිකාරිය යොමුකර ඇත. | ධීවර වරාය අපද්‍රව්‍ය කළමනාකරණ සැලසුම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පසු විපරම් කර නොතිබුණ අතර කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක වී නොතිබුණු බව නිරීක්ෂණය විය. |
| (ඈ) | සමුද්‍රිය පරිසර ආරක්ෂණ අධිකාරියේ ප්‍රදේශීය කාර්යාල මගින් ආවරණය වන ප්‍රදේශවලට අයත් කලාපවල බලපත්‍ර ලබාගත යුතු ආයතන සංඛ්‍යාව හඳුනාගැනීමේ දුර්වලතාවය හේතුවෙන් සමුද්‍රය අවට ප්‍රදේශවල ඇති ආයතන වෙත බලපත්‍ර නිකුත් කිරීම අවම වී තිබුණි. | කඩිනමින් අවශ්‍ය පියවරයන් ගත යුතුය. | සමුද්‍රිය පරිසර ආරක්ෂණ අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාල මගින් අදාළ ප්‍රදේශවල අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා බලපත්‍ර ලබාගත යුතු ආයතන මේ වන විට හඳුනාගැනීම සිදුකර අවසන් කර ඇත. | මෙම තත්ත්වය ප්‍රමාණවත්ව ක්‍රියාත්මක වී නොතිබුණු බව නිරීක්ෂණය විය. |
| (ඉ) | දිවයින වටා අපජලය බැහැර කිරීමේ බලපත්‍ර ලබාගත යුතු තත්ත්වයේ පවතින හෝටල් සංඛ්‍යාව 473 ක් වන අතර ඉන් හෝටල් 257 ක් අදාල බලපත්‍ර ලබාගෙන නොතිබුණි. | අදාල පරීක්ෂාවන් කඩිනමින් සිදුකර බලපත්‍ර ලබාදීම තුළින් කටයුතු නියාමනය කිරීමට කටයුතු කළ යුතුය. | කටයුතු නියාමනය කර නොමැත. | බලපත්‍ර ලබා නොගැනීම හේතුවෙන් අපජලය බැහැර කිරීම මගින් පාරිසරික හානි ඇතිවිය හැකි අතර පසුවිපරම් තත්ත්වය ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය විය. |
| (ඊ) | 2017 මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ කාර්යසාධන වාර්තාව අනුව BSWQI වර්ග කිරීම මගින් | නියමිත පරිදි දුර්වල අවස්ථා හඳුනාගෙන පනතේ ප්‍රතිපාදනවලට අනුව ඊට අදාල | කොළඹ දිස්ත්‍රික්කය තුළ මාදම්පිටිය තුළ හා වැල්ලවත්ත පිහිටි දිගු නළ මාර්ග මගින් සමුද්‍රය වෙත මළ | 2022 ජනවාරි වන විටත් මෙම තත්ත්වය නිවැරදි වී නොමැති බව නිරීක්ෂණය විය. |

| | | | | |
|---|---|---|---|---|
| | කාර්තු වශයෙන් නාන තොටුපලවල ජලයේ ගුණත්වය ශ්‍රේණිගත කර තිබුණි. එහිදී ඉතා දුර්වල අවස්ථා 01 ක් ද, දුර්වල අවස්ථා 06 ක් ද නිරීක්ෂණය විය. මේ අතරින් වැඩි වශයෙන්ම ගල්කිස්ස හා වැල්ලවත්ත මුහුදු තීරයේ ජලයේ ගුණත්වය ඉතා පහළ මට්ටමක පවතින බව අදාළ වාර්තාව අනුව නිරීක්ෂණය විය. | ක්‍රියාමාර්ග ගත යුතුය. | අපජල බැහැර කිරීම හේතුවෙන් වැල්ලවත්ත හා ගල්කිස්ස ප්‍රදේශවල මුහුදු ජලය දූෂණය වී ඇත. මේ සම්බන්ධයෙන් ජනතාව සහ ව්‍යාපාරකයින් දැනුවත් කිරීමේ වැඩසටහන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල එක්ව සිදුකරමින් පවති. | |
| (උ) | වටිනාකම රු.5,700,000 ක්වූ පරමාණුක අවශෝධනය වර්ණාවලී ද්විත්වමානයක් වර්ෂ තුනකට වඩා වැඩි කාලයක් කිසිදු උපයෝජනයකින් තොරව විද්‍යාගාරය තුල නිෂ්ක්‍රීයව පැවතුණි. | වත්කම් උපරිම උපයෝජනයකින් යුක්තව භාවිතා කල යුතුය. | මෙම කටයුතු ඉක්මනින් නිම කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ. | 2022 ජනවාරි වන විටත් නිෂ්කාර්යව තවදුරටත් පැවතුණි. |
| (ඌ) | 2020 ඔක්තෝම්බර් 26 දිනැති අංක 02/2020 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය අනුව අධිකාරියේ සියලුම තනතුරු සඳහා වූ බඳවා ගැනීමේ පටිපාටිය පිළියෙල කොට අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | බඳවාගැනීමේ පරිපාටිය පිළියෙල කර අනුමැතිය ලබාගැනීමට කටයුතු කල යුතුය. | 02/2016 චක්‍රලේඛය අනුව අධිකාරියේ සියලුම තනතුරු සඳහා බඳවා ගැනීමේ සහ උසස් කිරීමේ පරිපාටිය සකස් කිරීම මේ වන විට සිදු කරමින් පවතී. | 2022 ජනවාරි වන විටත් අනුමැතිය ලැබී නොතිබුණි. |
| (එ) | වටිනාකම රු.1,182,000 ක්වූ ඩිංගි බොට්ටුවක් හා බොට්ටු එන්ජිමක් 2016 වර්ෂයේ පෙබරවාරි මාසයේ සිට නිෂ්කාර්යව පවතින අතර විවිධ වැඩසටහන් සඳහා අවශ්‍ය බෝට්ටු කුලී පදනම මත ලබා ගෙන තිබුණි. | වත්කම්වල උපරිම ඵලදායීතාවය ලබා ගැනීමට කටයුතු කල යුතුය. | ඉදිරියේදී අධිකාරියේ වැඩසටහන් සඳහා භාවිතා කිරීමට අවශ්‍ය කටයුතු සැලසුම් කිරීමට කළමනාකාරීත්වයට උපදෙස් ලබාදීම. | 2022 ජනවාරි වන විටත් නිෂ්කාර්යව තවදුරටත් පැවතුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඒ) | සමුද්‍රීය පරිසර ආරක්ෂණ සේවාවන් වාණිජ මට්ටමින් ලබාදීමේ අරමුණින් රුපියල් මිලියන 66.6 ක් වැය කරමින් 2017 වර්ෂයේදී ගාල්ල දඩල්ල වෙරළාසන්න භූමියක ඉදිකර තිබූ රසායනාගාරය සඳහා රු.මිලියන 54.2 ක් වටිනා උපකරණ මිලදී ගෙන තිබුණි. විගණිත දින වන විට මෙම උපකරණ භාවිතා කරමින් සීමිත රසායනාගාර පරීක්ෂාවන් ප්‍රමාණයක් පමණක් සිදු කර තිබුණි. එසේම රසායනාගරයේ මෙහෙයුම් කටයුතු වාණිජ මට්ටමින් පවත්වාගෙන යාම සඳහා ප්‍රමාණවත් කාර්යමණ්ඩලයක් පවත්වාගෙන යාමට කටයුතු කර නොතිබුණි. තවද කල් ඉකුත් වූ රසායන ද්‍රව්‍යයන් පරිසර හිතකාමී ලෙස බැහැර කිරීමට කටයුතු කර නොතිබුණි. | වත්කම්වල උපරිම ඵලදායීතාවය ලබා ගැනීමට කටයුතු කල යුතුය. | පුහුණු නිලධාරීන් බඳවාගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරමින් පවති. වාණිජ මට්ටමේ සේවයක් ලබාදීමට අවශ්‍ය මාර්ගෝපදේශ යාවත්කාලීන කිරීමට කටයුතු කිරීම. | 2022 ජනවාරි වන විටත් රසායනාගාරය වාණිජ මට්ටමින් ක්‍රියාත්මක තත්ත්වයේ නොපවති. |
| (ඔ) | ක්‍රියාකාරි සැලැස්ම අනුව ප්‍රධාන ව්‍යාපෘති 08 ට අදාල උප අංශ 09 ක මුළු ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය රු.8,381,000 ක් වූ අතර ඉන් උපයෝජනය නොකළ ප්‍රමාණය රු.6,935,050 ක් විය. ඒවායේ ප්‍රතිශතය මුළු ප්‍රතිපාදනයෙන් සියයට 68 සිට සියයට 97 දක්වා වූ පරාසයක විහිදී තිබූ බව නිරීක්ෂණය විය. | ක්‍රියාකාරි සැලැස්ම තුළ අඩංගු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. | ක්‍රියාකාරකම් 2021 වර්ෂය දක්වා ඉදිරියට රැගෙන යාමට කටයුතු කර ඇත. | ක්‍රියාකාරි සැලැස්මට අනුව කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඕ) | අධිකාරිය විසින් 2025 වර්ෂය වන විට තිරසර සංවර්ධන අරමුණු අංක 14 යටතේ ප්‍රධාන ඉලක්ක 05 ක් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුළ හඳුනාගෙන තිබුණි. මේ අතරින් දෛනිකව කොරල්පර පවිත්‍ර කිරීම, කොරල් පර ප්‍රතිෂ්ඨාපනය, කඩොලාන ප්‍රතිෂ්ඨාපනය හා කඩොලාන වගා කිරීම යන ප්‍රධාන ඉලක්කවල කාර්යසාධනය පරීක්ෂාවේදී වර්ෂ 2025 වන විට අපේක්ෂිත ඉලක්ක ලඟාකර ගැනීම සඳහා ක්‍රියාත්මක වීමේ කාර්යක්ෂමතාවය ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය විය. | සැලසුම් ක්‍රියාත්මක වීමේ ප්‍රගතිය සමාලෝචනය කළ යුතුය. | කොරල්පර ප්‍රමාණය ප්‍රතිස්ථාපනය කිරීමට වගා භූමි හඳුනාගැනීම පුත්තලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින්, පරිසර අමාත්‍යාංශය සහ පුද්ගලික ආයතනයක් සමග එක්ව මෙම කඩොලාන නැවත වගාවන් සිදුකිරීම. | තිරසර අරමුණුකරා ලඟාවීමේ ප්‍රගතිය ප්‍රමාණාත්මක නොවීය. |

**68. සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 - තතත්ත්වාගණනය කළ මතය

2019 - තතත්ත්වාගණනය කළ මතය

2020 - තතත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | රාජ්‍ය, පෞද්ගලික හා සුනාමි සහාධිපත්‍ය දේපල වලට අදාල කළමනාකරණ සංස්ථා, කමිටු ලියාපදිංචි කිරීම හා අක්‍රීය කමිටු ලියාපදිංචිය අළුත් කිරීම, සක්‍රීය කිරීමට අදාලව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම වෙනුවෙන් 2018 වර්ෂයේදී රු.මිලියන 4.28 ක් වියදම් කර තිබුණු නමුත් සහාධිපත්‍ය දේපලවල පිඹුරු ලියාපදිංචිකර ඔප්පු නිකුත් කිරීම සිදුකර නොතිබූ අතර, 2019 වර්ෂයේදී එම කාර්යයන් තුළින් රු.මි.2.77ක ආදායමක් ඉලක්ක කර තිබුණද රු.මි.1.76 ක පමණක් ආදායම් එකතු කර තිබූ බැවින් ඉලක්ක ලගාකරගෙන නොතිබුණි. | අනුකූලතා සහතික හා ඔප්පු ලබාදීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම කර කළමනාකරණ සංස්ථා පිහිටුවීම හා නියාමනය කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය. | සුනාමි සහාධිපත්‍ය දේපල 95% කට වැඩි ප්‍රමාණයකම සහාධිපත්‍ය පිඹුර ලියාපදිංචි සිදුකර ඔප්පු නිකුත් කිරිම සිදුකර නොමැත. ඒ අනුව කළමනාකරණ සංස්ථා පිහිටුවීමද සිදුකල නොහැක. | කළමනාකරණ සංස්ථා පිහිටුවා නොමැති සහතික ලබාගත් සහාධිපත්‍ය දේපළ 116 පවතී. 2021 වර්ෂය අවසානය දක්වාම කමිටු ලියාපදිංචි කිරීම සිදුකිරීමේ ප්‍රමාදයන් පවතී. |
| (ආ) | 2018 වර්ෂයේ සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්ම අනුව කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා ඉඩමක් මිලදී ගැනීමට හා වාහන 04 ක් මිලදී ගැනීමට රු.මිලියන 110.8 ක මුදල් ඇස්තමේන්තු කර තිබුණද එම ප්‍රසම්පාදන කාර්යයන් සිදුකර නොතිබුණි. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය විධිමත් හා කාර්යක්ෂම විය යුතුය. | ඉඩමක් මිලදී ගැනීමට රු.මිලියන 75 ක් වෙන්කර ඇත. රජයේ ඉඩමක් ලබා ගැනීමේ අපේක්ෂාවෙන් නාගරික සංවර්ධන අධිකාරියට දන්වා ඇත. | 2021 වර්ෂය අවසානය වන විටත් අදාල කටයුතු සිදුකර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | පූර්ණ සහාධිපත්‍ය සහතික සඳහා අයකල යුතු ගාස්තුවෙන් 1/3 ක් මූලික සැලසුම් නිරාකරණ ලිපි නිකුත් කිරීමේදී අයකල යුතු වුවද 2015 වර්ෂයේදී පෞද්ගලික ආයතනයක සිදුකල ව්‍යාපෘතියක වර්ග මීටර් 23,259 ක සංශෝධන සඳහා යථෝක්ත ලිපිය නිකුත් කිරීමේදී අයකල යුතු රු. 2,907,375 ක් අයකර නොතිබුණු අතර එම වටිනාකම ලැබිය යුතු ආදායම් ලෙස ගිණුම් ගතකිරීමද සිදුකර නොතිබුණි. | ආදායම් නිවැරදිව ගණනය කර ගිණුම් ගතකිරීමට කටයුතු කළ යුතුය. | අදාල කරුණු සම්බන්ධව ස්වාධීන පරීක්ෂණයක් සිදුකර වාර්තා කිරීමට කටයුතු කරනු ලැබේ. | පරීක්ෂණයක් සිදුකරමින් පවතින අතර 2021 වර්ෂය අවසානය දක්වාම අයකර ගැනීමට කටයුතු සිදුකර නොතිබුණි. |
| (ඈ) | අධිකාරිය විසින් 2019 වර්ෂය අවසානයට කළමනාකරණ සංස්ථා වෙත ගෙවිය යුතු රු.1,080,532 ක මුදල් ජංගම ගිණුමක තැන්පත් කර බැංකු ශේෂය ලෙස ගිණුම්ගතකර තිබුණු නමුත් එහි වගකීම ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණු අතර එඩ්මන්ටන් රජයේ නිවාස ක්‍රමයේ නිදන්ගත අරමුදල් රු.13,563,311 ක් ණයහිමියන් ලෙස ගිණුම් ගතකර ඇති නමුත් වසර 05 ට වැඩි ශේෂයන්ද ඇතුලත් එම මුදල් නිරවුල් කිරීමට හෝ එහි වගකීම නිවැරදිව හඳුනාගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට අධිකාරිය විසින් කටයුතු කර නොතිබුණි. | වගකීම් නිවැරදිව හඳුනාගෙන කඩිනමින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතු වීම. | 2012 වර්ෂයේ "ස්වයං සවිය" ව්‍යාපෘතියේ ආදායම් මෙම ගිණුමෙහි තැන්පත් කර ඇති අතර එම මුදල් නැවත කළමනාකරණ සංස්ථාවට ලබාදීමට කටයුතු කළයුතුව ඇත. එසේම එඩ්මන්ටන් රජයේ නිවාස ක්‍රමයේ නීත්‍යානුකූල කළමනාකරණ සංස්ථාව පිහිටුවීමෙන් පසු මෙම අරමුදල එම සංස්ථාවට නිදහස් කළයුතුව ඇත. | කළමනාකරණ සංස්ථා වෙත ගෙවීමට ඇති මුදල ගෙවීමට තීරණය කර ඇති අතර එඩ්මන්ටන් නිවාස හිමියන්ට ඔප්පු ලබාදී නොමැති බැවින් නීත්‍යානුකූල කළමනාකරණ සංස්ථා පිහිටුවා නොමැති බැවින් එම මුදල ලබාදීමට නොහැකි වී ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | 2020 දෙසැම්බර් 31 දිනට රු.12,899,599 ක ණයගැති ශේෂය තුල වර්ෂ 05 ට වැඩිකාලයක සිට ඉදිරියට ගෙන එන ලද ණයගැතියන් 12 දෙනෙකුගෙන් ලැබිය යුතු ශේෂය රු.7,370,329 ක් වූ අතර එය මුළු ණයගැතියන්ගෙන් සියයට 57 ක් විය. එම ණයගැති ශේෂය තුළ අධිකාරියේ විෂය පථය තුළ නොමැති ගම්පහ හා මීගමුව රෝහල්වල පොම්පාගාර නඩත්තුව වෙනුවෙන් අයවිය යුතු රු.7,393,054ක ශේෂයක් ද විය. | ලැබිය යුතු ශේෂ කඩිනමින් නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. | රු.2,529,698 ක මුදල පොත්වලින් ලියා හැරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ලිපියක් යවා ඇත. 2010 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා අවසන් සහාධිපත්‍ය සහතිකය වෙනුවෙන් අයවිය යුතු මුදල ද අධ්‍යක්ෂක මණ්ඩලය දැනුවත් කර විධිමත් අනුමැතියක් ලබා ගැනීමෙන් පසු ණයගැති ශේෂයන් ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ. | 2021 වර්ෂය අවසානය දක්වාම නිරවුල් කර ගෙන නොතිබුණි. |
| (ඊ) | ප්‍රසිද්ධ දැන්වීම් පලකිරීම හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ වලින් තොරව 2017 හා 2018 වර්ෂයන්හි සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්), පාරිභෝගික සේවා නිලධාරී හා පරිපාලන නිලධාරී යන තනතුරු තුන සඳහා නිලධාරීන් සහ 2019 වර්ෂයේ තනතුරු 05 ක් සඳහා සේවකයින් 14 දෙනෙකු බඳවා ගෙන තිබුණි. ආයතන සංග්‍රහයේ පරිච්ඡේද 1:10:1 ට අනුකූලව අදාල අනුමැතීන් ලබා නොගෙන අධිකාරියේ සභාපති විසින් 2019 වර්ෂයේදී යථෝක්ත සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්) ගේ තනතුර 2013 වර්ෂය දක්වා පෙරදාතම් කර වැටුප් වර්ධක තිබුණි. | යොමුගත නීතිරීති වලට අනුකූල විය යුතු වීම. | විගණන හා කළමනාකරණ කමිටුවේ නිර්දේශය පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලදී. එහිදී මූලික පරීක්ෂණයක් පැවැත්වීමට තීරණය කළ අතර, අදාල වාර්තාව සභාපතිවරයා වෙත ලබාදී ඇත. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කර ඇත. | විගණන හා කළමනාකරණ කමිටුවේ නිර්දේශය පරිදි 2022 පෙබරවාරි 28 දක්වා කටයුතු සිදු නොකර පෙරදාතම් කර වැටුප් වර්ධක ගෙවා තිබුණි. |

| | | | |
|---|---|---|---|
| (උ) ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 13:1 ඡේදය සහ 13:2 ඡේදය ප්‍රකාරව මූලික විමර්ශණයක් පැවැත්වීමට නියෝග කරන බලධරයෙකු විසින් මූලික විමර්ශනය කොතරම් කාලයක් ඇතුළත නිමකල යුතුද යන්න නියෝගය නිකුත් කළ යුතු වුවද 2020 වර්ෂයේ අධිකාරියේ සේවකයින් 07 දෙනෙකු සඳහා අවස්ථා 10 කදී ගොනුකර තිබුණු විවිධ චෝදනා සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. විෂමාචාරය පිළිබඳව අප්‍රමාදව තම නිරීක්ෂණ හා නිර්දේශ ඉදිරිපත් කිරීම මූලික කාර්යයක් වුවද 2020 වර්ෂයේ සිදුවූ සිද්ධීන් 05 ක් සම්බන්ධයෙන් 2021 අප්‍රේල් 30 දින වන විටත් නිරීක්ෂණ හා නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි. | යොමුගත නීතිරීති වලට අනුකූල විය යුතු වීම. | රාජකාරි බහුලත්වය මත නිලධාරීන්ගේ ප්‍රකාශ ලබාගැනීම් වලින් පසු කඩිනමින් අවසන් වාර්ථා නිකුත් කිරිමට නොහැකි වී ඇත.ඉදිරියේ දී මූලික විමර්ශන පරීක්ෂණ සිදුකිරීමට අදාළ මූලික විමර්ශන යේ ස්වභාවය අනුව වාර්ථාව ලබා දියයුතු කාල සීමාව නිශ්චිතව නියම කර පත්වීම් ලිපි නිකුත් කිරීමට ක්‍රියාකරනු ලබයි. | විනය පරීක්ෂණ සම්බන්ධ පරීක්ෂණ මන්දගාමීව සිදු කෙරෙන අතර අවසන් වාර්තා ඉදිරිපත් කිරීමක් සිදුකර නොමැත. |
| (එ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මු.රෙ.218<br>එකම ගෙවීමක් සම්බන්ධයෙන් දෙවරක් මුදල් ගෙවීම වැලැක්වීම සඳහා විශේෂ පියවර ගතයුතු වුවත් සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ බිල්පත් පියවීම සඳහා රු.2,298,748 ක ගෙවීම් | යොමුගත රෙගුලාසියට අනුකූල විය යුතු වීම. | ගෙවීම් සනාථ කෙරෙන ලේඛණවල මුල් පිටපත අදාළ ගෙවීම් වවුචරයෙහි ඇමිණීමට අදාළ විෂය භාර කළමනාකරණ සහකරුට උපදෙස් ලබා දී ඇත. | 2021 වර්ෂයේදී ද එවැනි අවස්ථා නිරීක්ෂණය විය. |

| | | | | |
|---|---|---|---|---|
| | වවුචර් සමඟ ඡායාස්ථ බිල්පත් අමුණා තිබුණු අතර ඒ පිළිබඳ නොසලකා ගෙවීම් කර තිබුණි. (2020 1.7 (ඇ) (i) ) | | | |
| | (ii) මු.රෙ.231 හැකිතාක් දුරට වෙනත් ලේඛනයක් නොබලා හරිවැරදි බැලීමට හැකිවන පරිදි සම්පූර්ණ විස්තර වවුචර් වල අඩංගු විය යුතු වුවද, 2020 වර්ෂයේ නියැදි පරීක්ෂාවේදී රු.60,101,890 ක ගෙවීම් සඳහා සනාථ කෙරෙන ලේඛන වවුචරය සමග ඉදිරිපත් කර නොතිබුණි. | යොමුගත රෙගුලාසියට අනුකූල විය යුතු වීම. | 2021 වර්ෂයේ සිට බිල්පත්වල මුල් පිටපත් අදාළ ගෙවීම් වවුචරය සමඟ ඇමිණීමටත් ඒ බව වවුචරයේ මුහුණත සඳහන් කරන ලෙසටත් අදාළ විෂය භාර කළමනාකරණ සහකරු වෙත ලිඛිතව දැනුම් දී ඇත. | 2021 වර්ෂයේදී ද ගෙවීම් සනාථ කෙරෙන සාක්ෂි නොමැති අවස්ථා නිරීක්ෂණය විය. |
| (එ) | 8.2.2 ඡේදය හා 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තිය ප්‍රකාරව ආයෝජනය කිරීම සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය නොමැතිව රු.181,171,713ක් විවිධ තැන්පතු 8 ක ආයෝජනය කර තිබුණි. | යොමුගත මුදල් රෙගුලාසි වලට අනුකූල විය යුතු වීම. | සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියට කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා ඉඩමක් මිලදී ගැනීමේ අරමුණින් මෙම අරමුදල් කෙටිකාලීන තැන්පතු ලෙස රඳවා ගෙන ඇත. මේ සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා දනුවත් කර ඒ සඳහා අනුමැතිය ලබා ගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | 2021 වර්ෂය අවසානය දක්වාම අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ඒ) | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක PE/1/CMA/4/11(i) හා 2019 | යොමුගත නීතිරීති වලට අනුකූල විය යුතු වීම. | අධිකාරිය සඳහා ඉඩමක් මිලදී ගෙන කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීමට සභාධිපත්‍ය කළමනාකරණ | 2021 වර්ෂය අවසානය දක්වාම අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | සැප්තැම්බර් 09 දිනැති ලිපිය ප්‍රකාරව 2018 හා 2019 මූල්‍ය වර්ෂවල බදු පසු ලාභයෙන් පිළිවෙළින් රු.මිලියන 47 ක් හා රු. මිලියන 6 ක් (සියයට 33 1/3) ක් අයබදු වශයෙන් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීමට නියම කර ඇතත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. | | අධිකාරිය එදිනෙදා වියදම් සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන නොලබන බැවින් උපයා ගන්නා ලාභය යොදවා ගැනීමට අපේක්ෂිතය. කෙසේ නමුදු මේ සඳහා මුදල් අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගැනීමට අපේක්ෂා කෙරේ. | |
| (ඔ) | රු.3,000,000ක් වූ නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ ආයෝජිත අරමුදල් වෙනුවෙන් ආයෝජන ආදායම් ලැබී නොතිබුණි. | ආයෝජන සඳහා ප්‍රතිලාභ ලබා ගැනීමට කටයුතු කළ යුතුය. | 2021 ජනවාරි 21 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ කොටස් විකිණීම සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී. ඒ සඳහා අනුමැතිය ලබා ගැනීමට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. | 2020 ලාභාංශ ගෙවා නොමැති අතර කොටස් විකිණීමක්ද සිදුකර නොමැත. |
| (ඕ) | අධිකාරී කාර්යාලය පවත්වාගෙන යන ගොඩනැගිලි පරිශ්‍රය සඳහා වාර්ෂිකව රු.4,460,772ක් බැගින් කුලී වියදම් හා වාර්ෂික නඩත්තු වියදම් 2018, 2019 හා 2020 වර්ෂයන්හි පිළිවෙළින් රු. 64,710,000 රු.4,593,220 ක් හා රු.1,434,114 ක් බැගින් වියදම් කර තිබුණද ගොඩනැගිලි හිමිකරු සමඟ විධිමත් ගිවිසුමකට එළඹ නොතිබුණි. | නිවැරදි හා විධිමත් වගන්ති ඇතුළත්ව ගිවිසුම් ගත යුතු විය යුතුය. | ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් මාසික බදු කුලිය රු.404,055 සිට රු.700,000 දක්වා වැඩි කිරීමත් 2020 ජනවාරි සිට එම හිඟ මුදල් ගෙවීමට අධිකාරිය එකඟ වුවද 2020 ජනවාරි සිට රු.මි. 7.7 ක හිඟ මුදලක් එකවර ගෙවීම ගැටළු සහගත වූ බැවින් සහ අවසන් තීරණයක් ගෙන නොමැති බැවින් ගිවිසුම අත්සන් කිරීම ප්‍රමාද වී ඇත. | 2021 වර්ෂයේදීද ගිවිසුම් ගතවී නොතිබුණි. |
| (ක) | පසුගිය වර්ෂ කිහිපයක ඉලක්කගත දිනයන් සහිතව ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබුණු 1973 අංක 10 දරන | සැලසුම්ගත ඉලක්කයන් ළඟා කර ගැනීමට කටයුතු කල යුතු වීම. | කෙටුම්පත සංශෝධනය කර 2019 දෙසැම්බර් 16 වන දින නීති කෙටුම්පත් දෙපාර්තුමේන්තුව විසින් | 2022 වර්ෂය ආරම්භය වන විටත් පනතේ සංශෝධන සිදුකර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | පොදු පහසුකම් මණ්ඩල පනතේ සංශෝධන කටයුතු 2020 ජුනි මාසය දක්වා කාලය දීර්ඝ කර තිබුණි. 2017 ජුනි 30 දින නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමුකර තිබූ මෙම පනත්වල සංශෝධිත කෙටුම්පත් 2020 වර්ෂය අවසානය දක්වා කිසිදු ප්‍රගතියක් ලබාගෙන නොතිබුණි. | | අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කර අනුමැතිය ලබාගන්නා ලෙස දන්වා ඇත. ඒ අනුව අමාත්‍ය මණ්ඩල අනුකමිටුවක් පත්කරනලදි. එකී අනුකමිටුව විසින් 2020 නොවැම්බර් 10 දිනැති නිර්දේශ අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත. | |
| (ග) | අධිකාරිය විසින් 2011 වර්ෂයේදී මිලදීගත් රු.5,890,000 ක් වූ මෝටර් රථයක් සමාලෝචිත වර්ෂයේදී එම වටිනාකමටම රක්ෂණය කර තිබූ අතර මිලදී ගත් වර්ෂයේ සිට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්) වෙත අනුයුක්ත කර තිබුණි. 2012 වර්ෂයේ සිට 2021 වර්ෂයේ ජනවාරි දක්වා අනතුරු 16ක් සිදුව තිබූ අතර අවස්ථා 02 කදී පමණක් මු.රෙ.104 (3) හා 104(4) ප්‍රකාරව කටයුතු කර තිබුණි. අනතුරු 13 ක් සඳහා රු.1,682,160 ක් වූ වන්දි රක්ෂණ ලබාගෙන තිබුණද එම තොරතුරු අදාල ලිපිගොනුවල ඇතුලත් කර නොතිබුණි. අදාල නිලධාරියා විසින් මෙම රථය ධාවනය කර තිබුණද ඒ සඳහා නිසි අනුමැතියක් ලබාගෙන නොතිබුණි. | වාහන පද්ධතිය කළමනාකරණය විධිමත් කළ යුතු වීම. | රථය නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි මුදල් විසින් ධාවනය කිරීම සඳහා අදාල කාල පරිච්ජේදය තුල අනුමැතියක් ලබා නොගෙන තිබූ අතර වර්තමානයේ අධිකාරියේ ජේෂ්ඨ නිළධාරින් සඳහා අනුයුක්ත කර ඇති වාහන සඳහා අදාල නිළධාරින් විසින් ධාවනය කිරීමට අවශ්‍ය අනුමැතිය ලබා ගෙන ඇති බව වැඩි දුරටත් සඳහන් කරමි. | වාහන අනතුරු සම්බන්ධව මු.රෙ.104(3) ප්‍රකාර කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ච) | ඉහත සඳහන් මෝටර් රථය 2019 ඔක්තෝබර් 01 දින අනතුරකට ලක්ව තිබුණද පොලිස් වාර්තා, කාර්මික වාර්තාවක් නොමැතිව අධිකාරියේ අළුත්වැඩියා සම්බන්ධව පවත්නා අභ්‍යන්තර පාලන පද්ධතියෙන් බැහැරව කටයුතු කර තිබුණි. අධිකාරිය වෙත රු.570,295 ක් වූ ඉන්වොයිසියක්ද, රක්ෂණ සංස්ථාවට රු.251,350ක් බිල්පත් ගාස්තු වශයෙන් එකිනෙකට වෙනස් අගයන් සහිත බිල්පත් අළුත්වැඩියා කටයුතු කළ පෞද්ගලික ගරාජයෙන් නිකුත් කර තිබූ අතර රක්ෂණ සංස්ථාවෙන් ලැබුණු වන්දි මුදල රු.144,019ක් පමණක් විය. අළුත්වැඩියා කටයුතු අවසන් කල බවට 2019 දෙසැම්බර් 23 ගරාජය මගින් දන්වා තිබුණද 2020 දෙසැම්බර් 31 දක්වා එම රථය අධිකාරිය වෙත ගෙන ඒමට කටයුතු කර නොතිබුණි. | වාහන පද්ධතිය කළමනාකරණය විධිමත් කළ යුතු වීම. | අනතුර සම්බන්ධ මූලික පරීක්ෂණයෙන් අනතුරුව (මු.රෙ.104) විධිමත් පරීක්ෂණයක් සිදු කරමින් පවතිනඅතර ඊට අනුකූලව ලබා දෙනු ලබන නියෝග අනුව පියවර ගැනීමට කටයුතු කරමි. මෙම රථය ගරාජයෙන් ලබා ගැනීමට ඔවුන් සමඟ සාකච්ඡා කරමින් පවති. | පරීක්ෂණය අවසන් කර ඇත. විනය නියෝග ප්‍රතිශෝධනය කරන ලෙස නිලධාරියා ඉල්ලීම් කර ඇති අතර අලාභයෙන් කිසිදු මුදලක් මේ දක්වා අයකර නැත. වාහනය ගරාජයෙන් 2022 පෙබරවාරි 28 දක්වාම ලබාගෙන නොතිබුණු අතර නිලධාරියාට විරුද්ධව විනය ක්‍රියාමාර්ග ගෙනද නොතිබුණි. |

## 69. ශ්‍රී ලංකා සාගර විශ්ව විද්‍යාලය

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 - තතත්ත්වාගණනය කළ මතය

2019 - තතත්ත්වාගණනය කළ මතය

2020 - තතත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2014 අංක 31 දරන ශ්‍රී ලංකා සාගර විශ්ව විද්‍යාල පනතේ 5(1) (ඒ) වගන්තිය අනුව විශ්ව විද්‍යාලය විසින් පවත්වනු ලබන අධ්‍යයන පාඨමාලා සහ පුහුණු වැඩසටහන් සඳහා ගාස්තු අය කර ගත හැකි වුවත් 2017 වර්ෂයේ සිට පවත්වනු ලබන පාඨමාලා හා පුහුණු වැඩසටහන් වෙනුවෙන් ගාස්තු අය කර නොතිබුණි. අවසන් වරට ගාස්තු අය කර තිබූ 2016 වර්ෂය සඳහා බිල් කර තිබූ ආදායම රු. මිලියන 19.8 ක් පමණ විය. | පනත ප්‍රකාරව ගාස්තු අය කිරීමට ගාස්තු අය කිරීමට කටයුතු කල යුතුය. | ඉදිරියේදී පාඨමාලා ගාස්තු අය කිරීමට කටයුතු කරනු ලැබේ. | 2021 දෙසැම්බර් 31 දින වන විටද පනත ප්‍රකාරව පාඨමාලා සඳහා ගාස්තු අය කිරීම සිදු නොකෙරේ. |
| (ආ) | නව ගොඩනැගිල්ලක් ඉදිකිරීමට ප්‍රමාණවත් ඉඩකඩ තිබියදී ඒ කෙරෙහි අවධානය යොමු නොකර බදු පදනම මත ලබා ගත් ගොඩනැගිල්ලක් සඳහා 2018 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුලදී බදුකුලී සහ අනිකුත් වියදම් වෙනුවෙන් රු.86,792,671 කට වඩා වැඩි මුදලක් වැයකර තිබුණි. | රජයේ මුදල් අරපිරිමැසුම්දායක ලෙස භාවිතා කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය. | 2015 සිට 2020 දක්වා වෘත්තීය පුහුණු සහ උසස් අධ්‍යයන අංශයේ පාඨමාලා සඳහා ශිෂ්‍ය වර්ධනය සිදුවී ඇති අතර මට්ටක්කුලිය ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ ඉඩකඩ පහසුකම් ප්‍රමාණවත් නොවීම සහ ස්ථිර ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා අමාත්‍යාංශයේ මුදල් ප්‍රතිපාදන ලබා නොදීම නිසා ,නිසි ප්‍රසම්පාදන ක්‍රියා මාර්ග අනුගමනය කර බදු පදනම මත ගොඩනැගිල්ල ලබා ගැනීම සිදු කර ඇත. | 2021 වර්ෂය අවසාන වන විට රු. මිලියන 109 කට ආසන්න මුදලක් කුලී ගොඩනැගිල්ල සඳහා වැය කර තිබුණි. |

## 70. ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 - තතත්ත්වාගණනය කළ මතය

2019 - තතත්ත්වාගණනය කළ මතය

2020 - තතත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2017 සහ 2018 වර්ෂවලදී 1973 අංක 15 දරන ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩල පනතේ දක්වා ඇති අරමුණක් නොවූ වැව්වල පස් ඉවත් කර අධිවේගී මාර්ගවලට විකිණීමේ කටයුතු සිදු කර තිබුණි. පස් ඉවත් කිරීම වෙනුවෙන් රු.3,370,595ක වියදමක් දරා තිබුණු අතර අධිවේගී මාර්ගවලට පස් විකිණීමෙන් රු.81,134,631 ක ආදායමක් ලබා තිබුණි. වැව් ව්‍යාපෘති වාර්තාවට අනුව සපයන ලද පස් සඳහා අදාළ ගොවි සංවිධානවලින් මණ්ඩලයට මුදල් ලබාගෙන එම මුදල් රජයේ ප්‍රතිපාදනද සමග යොදා කුඩා වැව් නිසි ප්‍රමිතියට ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු උපදේශකත්වය යටතේ සංවර්ධනය කළ යුතු බව දක්වා තිබුණත් එසේ නොකර රු.77,764,036 ක් ස්ථාවර තැන්පත් ගිණුමක රඳවාගෙන තිබුණි. | මණ්ඩලයේ පනතට අනුව කටයුතු කිරීම සහ රැස්කළ මුදල් අදාළ කාර්යයට යෙදවීමට පියවර ගත යුතුය. | එවකට සිටි කෘෂිකර්ම අමාත්‍යවරයා සමග පවත්වන ලද ප්‍රගති සමාලෝචන රැස්වීමේදී පස් විකිණීමෙන් ලද ආදායම ආයතනයේ මුදල් උත්පාදන ව්‍යාපෘති සඳහා යොදා ගන්නා ලෙස මණ්ඩලයට උපදෙස් ලබා දුන් අතර, එම වැව් ප්‍රතිසංස්කරණය කිරීම ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදන යොදා ගනිමින් සිදු කරන ලෙසත් උපදෙස් දෙන ලදී. | එම මුදල් සුරක්ෂිතව ගිණුම්ගත කර ඇතත් අරමුණුගත කාර්ය ඉටුකර නැත. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2018 වර්ෂයේ අනුරාධපුර උපුල්දෙණිය ගබඩාවේ සිදු වූ රු.4,094,596ක වටිනාකමැති සෝයා බෝංචි කිලෝ ග්‍රෑම් 37,223ක් අස්ථානගත වීම සම්බන්ධ පරීක්ෂණ සිදු කර අලාභයන් වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව අප්‍රමාදව පරීක්ෂණ සිදු කර අලාභ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | 2018 වර්ෂයේ සෝයා බෝංචි තොග අඩුව සම්බන්ධ කෘෂිකර්ම අමාත්‍යාංශ විමර්ශන නිලධාරීන් විසින් මු.රෙ. 104 පරීක්ෂණ සිදු කොට අවසන් වර්තාව ලබා දී ඇත. | මේ සම්බන්ධව මු.රෙ 104 පරීක්ෂණය අමාත්‍යාංශය මඟින් සිදු කර ඇත. 2022 ජනවාරි 31 දින දක්වාම අලාභ අයකරගෙන නැත. |
| (ඇ) | සෝයා ආශ්‍රිත ආහාර නිෂ්පාදන ව්‍යාපෘතිය සඳහා පසුගිය ආසන්නතම වර්ෂ 03 ක් ඇතුළත රු. මිලියන 2.8 ක් වැය කර තිබුණද මණ්ඩලය විසින් එම නිෂ්පාදනයන් 2020 වර්ෂය තුළ පාරිභෝගිකයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මණ්ඩලය අවසන් නිෂ්පාදනය පාරිභෝගිකයා වෙත ඉදිරිපත් කළ යුතුය. | මේ සම්බන්ධයෙන් රාජ්‍ය ලේකම්තුමා,මුල්‍ය උපදේශක සහ මණ්ඩල නිලධාරීන් අතර සාකච්ඡාවක් තිබුණු අතර මෙම ව්‍යාපෘතිය සිදු කළ යුතු ආකාරය ලේකම්තුමා උපදෙස් ලබා දී ඇත. ඒ අනුව කටයුතු කරනු ලැබේ. | මෙම ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු සාකච්ඡා කිරීම සඳහා රාජ්‍ය ලේකම්තුමා සමඟ සාකච්ඡාවක් 2022 පෙබරවාරි 11 දින පැවැත්වීමට කටයුතු කර ඇත. |
| (ඈ) | පර්යේෂණ ඒකකයේ සුවපෝෂ හා මව්පෝෂ නිෂ්පාදන සඳහා භාවිත කළ ස්ටිකර් 14,243 ක්, පෝෂණ මල්ල සඳහා භාවිතා කළ ඇතුළත කවර හා හිස් කවර 26,087 ක් හා සුවපෝෂ ග්‍රෑම් 200 පැකට්වල ඇසුරුම් 14,062 ක් වර්ෂ 05 කට වැඩි කාලයක සිට අභාවිතව පැවතුණි. | අනවශ්‍ය මිලදී ගැනීම් නොකළ යුතුය. මෙම ද්‍රව්‍ය උපයෝජනයට හෝ අපහරණයට පියවර ගත යුතුය. | මෙම ඇසුරුම් පැළ අලෙවිසැලේ කටයුතු සඳහා භාවිතා කිරීමට නිසි අනුමැතිය යටතේ කටයුතු කරනු ලැබේ. | අනුමැතිය ලබා ගෙන එම ඇසුරුම් පැළ අලෙවි සැලෙහි භාවිතයට ගැනීමට කටයුතු කර නැත. |
| (ඉ) | තණමල්විල ගොවිපලේ ක්‍රියාකාරී සැලැස්ම අනුව 2019 වර්ෂයේදී වියළි ගොම මෙට්‍රික් ටොන් 75 ක් හා 2020 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව වියළි ගොම මෙට්‍රික් ටොන් 20 ක් සැකසීමට සැලසුම් කර තිබුණද වර්ෂ 02 තුළ එම නිෂ්පාදනයන් සිදු කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව කාර්යයන් සිදු කළ යුතුය. | ගොම වල හිඟයක් පැවතුන බැවින් නිසිපරිදි ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. ව්‍යවසායකයකු සමඟ සම්බන්ධ වී ඉදිරි කටයුතු සිදු කිරීමට අපේක්ෂිතය. | නිෂ්පාදන කටයුතු ඇරඹීමට කටයුතු කර නැත. |

## 71. ශ්‍රී ලංකා හදබිම අධිකාරිය

මූලා ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 - තතත්ත්වාගණනය කළ මතය

2019 - තතත්ත්වාගණනය කළ මතය

2020 - තතත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | සීමාසහිත හදබිම සමූපකාර සමිතිය විසින් ශ්‍රී ලංකා හදබිම අධිකාරියට අයත් අලෙවි ඒකකයෙහි භාවිත කරමින් තිබුණු වටිනාකම තක්සේරු නොකළ මේස, පුටු, රාක්ක ඇතුළු ගෘහ භාණ්ඩ, පරිගනක හා එකතු කිරිමේ යන්ත්‍ර ඇතුළු විද්‍යුත් උපකරණ හා අලෙවි කටයුතු සඳහා භාවිතා කළ අනෙකුත් උපකරණ ආදී භාණ්ඩ ඒකක 204 ක් 2019 පෙබරවාරි 01 දින සිට අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව සිය භාරයට ගෙන භාවිතා කරනු ලබන නමුත් එසේ භාණ්ඩ පැවරීම සඳහා අධිකාරියේ පාලක මණ්ඩලයේ අනුමැතියක් නොතිබුණි. තවද ගැටඹේ සහ වැලිගම පිහිටි අලෙවි ගොඩනැගිලි පරිශ්‍ර ද සමූපකාර සංගමය විසින් භාවිතයට ගෙන තිබෙන නමුත් ඒ සඳහා ද අධිකාරියේ පාලක මණ්ඩලයේ අනුමැතියක් නොතිබුණි. | අමාත්‍ය මණ්ඩල තීරණය අනුව කටයුතු කළ යුතුය. | අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවේ සඳහන් වන්නේ හදබිම අධිකාරිය සතු දේපළ, වත්කම් හෝ මුදල් යෝජිත සමිතියට ලබා දෙන්නේ නම් ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගත යුතු බවය. එහෙත් මෙම පැවරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් නොතිබුණි. භාණ්ඩ හා සෙසු වත්කම් නීත්‍යානුකූලව නැවත පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. | 2021 වර්ෂය අවසානය දක්වාම නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ විෂය පථය පුළුල් කිරීම හා නවීකරණය මැයෙන් 2017 | අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි කටයුතු කිරීම. | විෂයභාර අමාත්‍යවරයා විසින් 2026/75 දරන 2017 ජූලි 07 දිනැති අතිවිශේෂ | ගැසට් නිවේදනය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර |

| | | | | |
|---|---|---|---|---|
| | මාර්තු 31 දින ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2017 අප්‍රේල් 25 දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරමින් ලබාදී තිබුණු තීරණය අනුව අමාත්‍ය මණ්ඩල සංදේශය සකස් කළ විද්වත් කමිටුවේ නිර්දේශ ගැසට් පත්‍රයක් මඟින් නියෝගයක් ලෙස ප්‍රකාශයට පත්කර, එම ගැසට් නිවේදනය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටද අලෙවි ප්‍රවර්ධන ඒකකය සමූපකාර සංගමයක් ලෙස ලියාපදිංචි කර සේවකයන් එම සමූපකාර සංගමයේ සේවකයන් ලෙස බඳවා ගැනීමටද තීරණය කර තිබුණු නමුත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | | ගැසට් නිවේදනය පළකර ඇති නමුත් එය නීතිපති නිරීක්ෂණවලට යටත්ව ප්‍රකාශ කළ බව එකී ගැසට් පත්‍රයේ සඳහන් නොවේ. සී/ස හදබිම සමූපකාර සමිතිය 2019 පෙබරවාරි 01 දින සිටම ක්‍රියාත්මක වී ඇත්තේ හදබිම අධිකාරියෙන් වෙන් වූ ස්වාධීන ආයතනයක් ලෙසය. එබැවින් එහි වර්තමාන තොරතුරු ලබාගත නොහැකි වීම. | නොතිබුණු අතර සමූපකාර සංගමයක් පිහිටුවා ඇති අතර, සේවකයන් 12 දෙනෙකුගේ සේවය අවසන් කර ඇත. |
| (ඇ) | 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කොත්මලේ හා පල්ලේකැලේ ගොවිපළවල් දෙකෙහි සම්පූර්ණ අලාභය රු.9,933,656 ක් වී තිබූ අතර, 2020 වර්ෂයේ දී පිළිවෙළින් රු.3,496,573 ක් හා රු.4,503,158 ක අලාභ ලබා තිබුණි. 2015 මාර්තු 04 දිනැති අංක 04/04/07 දරන වාරිමාර්ග හා කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය අනුව එම ගොවිපළවල් දෙක සඳහා නිෂ්පාදන සහ ආදායම් නිශ්චිතව | ව්‍යාපාරික සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කිරීම. | ව්‍යාපාරික සැලැස්මක් සකස් කර අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර ඇත. | 2021 වර්ෂයේදීද සැලැස්මකට අනුව කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | හඳුනාගත් මාසික අනු බෙදීම් සහිත ව්‍යාපාරික සැලැස්මක් සකස් කර ගොවිපළවල් ලාභ ලබන තත්ත්වයට පත්කර ගැනීමට කටයුතු කරන ලෙස දක්වා තිබුණ ද, 2020 වර්ෂය අවසන් වන විටත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | | | |
| (ඇ) | කොත්මලේ ගොවිපළ අක්කර 05 ක භූමි ප්‍රමාණයකින් සමන්විත වන අතර වගාවන් ලෙස පැළ තවාන්, එළවළු හා පලා බෝග වගාවන්, ගව පාලනය හා වෙළඳසැලක් පවත්වාගෙන යනු ලැබුවද, අක්කර 03 ක් පමණක් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කර තිබුණි. | අරමුණු ඉටුකර ගැනීම සඳහා වත්කම් උපරිම භාවිතයට ගැනීම. | ජල හිඟය නිසා මේ තත්ත්වය ඇතිවී තිබෙන බැවින් ජලය ලබා ගැනීම සඳහා සැලසුම් කර ඇත. | ජල හිඟයට විසඳුමක් ලබාදී ඉඩම් උපරිමයෙන් භාවිතා කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඉ) | වෙනත් ආයතන සතුව තිබුණු ඉඩම් විධිමත්ව පවරා නොගෙන අධිකාරිය විසින් දීර්ඝකාලීනව භාවිතය සඳහා ගොඩනැගිලි ඉදිකරගෙන තිබුණි. මෙම ඉඩම්වල ඉකුත් වර්ෂයට පෙර වර්ෂවලදී රු.5,724,114 ක් ද, පෙර වර්ෂයේ දී කුණ්ඩසාලේ අලෙවිසැල ඉදිකිරීම සඳහා රු.3,176,631 ක් ද වැය කර ගොඩනැගිලි ඉදිකර තිබුණු නමුත් ඒවායින් ඇතැම් ගොඩනැගිලි නිෂ්කාර්යව පැවතුණි. කොත්මලේ ගොවිපළෙහි පුහුණු මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම සඳහා රු.535,100 ක් | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3.1(ආ) මාර්ගෝපදේශය අනුව ඉදිකිරීම් කිරීමට පෙර ඉඩම් පවරාගත යුතු බැවින් ඒ අනුව කටයුතු කිරීම. | අදාළ ඉඩම් පවරා ගැනීම සඳහා කටයුතු කරමින් පවතින බව. | පල්ලේකැලේ ගොවිපළේ අයිතිය රාජ්‍ය අමාත්‍යාංශයට පවරාගෙන ඇත. අධිකාරියට පවරා ගැනීමේ කටයුතු කරමින් පවතී. |

වැයකර ඉදිකරන ලද ගොඩනැගිල්ල සහ ගොවිපළේ ඇති පැරණි අශ්වගාල කිසිදු කාර්යයක් සඳහා උපයෝජනය කර නොතිබුණි.

**72. හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය**

මූලා ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 - තතත්ත්වාගණනය නොකළ මතය

2019 - තතත්ත්වාගණනය කළ මතය

2020 - තතත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2020 දෙසැම්බර් 31 දිනට ආයතනයේ 2002 වර්ෂයට පෙර සිට පැවත එන විදේශ ශිෂ්‍යත්වලාභී ණයගැතියන් ගෙන් රු.12,874,881ක මුදලක් අයවිය යුතුව පවතින අතර ඒවා අයකර ගැනීමට අපොහොසත්ව තිබුණි. | පරීක්ෂණ සිදුකර සුදුසු පියවර ගැනීම හා මුදල් අයකර ගැනීම | ආයතනය විසින් විදේශ ශිෂ්‍යත්වලාභී ණයගැතියන් වෙනුවෙන් නඩු දමා ඇති අතර ණයගැතියන් වෙත ණය ගෙවන ලෙස ලිඛිතව දැනුම් දී ඇත. | 2021 දෙසැම්බර් 31 දිනට විදේශ ශිෂ්‍යත්වලාභී ණයගැතියන්ගෙන් රු.12,825,129ක මුදලක් අයවිය යුතුව තිබුණි. |
| (ආ) | 2019 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.3,634,110ක මුදලින් කිසිදු මුදලක් 2020 වර්ෂය තුළදීද අයකර ගැනීමට නොහැකි වී තිබුණු අතර ණයගැති ලිපිනය සොයාගැනීම පිළිබඳව ආයතනයේ ප්‍රමාණවත් අවධානය යොමු වී නොතිබුණි. | ලිපිනය සොයාගෙන නීතිමය පියවර ගත යුතුය | වර්තමාන ලිපිනයන් සොයා ගැනීමට නොහැකි ණයගැතියන් 2021 වසරේ වෙනත් උපායමාර්ගික ක්‍රම තුළින් ඔවුන් සමග සන්නිවේදනය කිරීම සඳහා නොයෙකුත් ක්‍රියාමාර්ග ගනිමින් සිටියි. | වර්තමාන ලිපිනයන් නොදැනීම නිසා නීති ක්‍රියාමාර්ග ඉදිරියට පවත්වාගෙන යාමට නොහැකි වී ඇත. |
| (ඇ) | 2012-2015 කාලපරිච්ඡේදය තුළ රු. 1,031,020 ක පිරිවැයක් දරා ප්‍රධාන කාර්යාලයේ ස්ථාපිත කර තිබුණු ජීව වායු ඒකකය 2016 වර්ෂයේ සිට ක්‍රියා විරහිතව පැවති අතර, ඒ වෙනුවෙන් 2018 වර්ෂයේදී රු.22,500ක් අත්තිකාරම් වශයෙන් ගෙවා බැලූනයක් මිලදී ගෙන තිබුණද ඒකකයේ අනෙකුත් ක්‍රියාකාරීත්වයන්ගේ | සුදුසු පරිදි උපයෝජනයට හෝ අපහරණයට පියවර ගත යුතුය | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී නිසි ලෙස වගකීම් පැවරීම වර්තමානයේ සිදු කර ඇත. | මෙම ජීව වායු ඒකකය සම්බන්ධයෙන් පරීක්ෂණ කරමින් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | දෝෂ පැවතීම තුළ එම බැලූනය ස්ථාපිත කර නොතිබුණු අතර 2020 දෙසැම්බර් 31 දින වන විට ඒකකයේ මුළු වියදම රු.1,053,520ක් වී තිබුණි. එය දීර්ඝ කාලයක් අලුත්වැඩියා නොකර තිබීම හේතුවෙන් එහි උපාංග අක්‍රීය වී නැවත භාවිතයට ගත නොහැකි තත්ත්වයට පත්වී තිබුණි. | | | |
| (ඇ) | කෘෂිකර්ම අමාත්‍යවරයාගේ ආරක්ෂක නිලධාරීන් සඳහා නේවාසිකාගාරයේ කාමර කුලියට දීම වෙනුවෙන් 2015 සැප්තැම්බර් සිට 2018 ජූලි මස දක්වා කාලයට අයවිය යුතු රු.8,895,470ක මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කුලී ගාස්තු අය කරගත යුතුය. | මෙලෙස දීර්ඝ කාලීනව නේවාසිකාගාර කාමර ලබා නොදීමට පාලක මණ්ඩල තීරණයක් ලබා ගෙන ඇත. | 2021 වර්ෂයේදී හෝ අයකර ගැනීම් සිදුකර නැත. |

## 73. හෝමියෝපති වෛද්‍ය සභාව

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - තතත්ත්වාගණනය කළ මතය

2019 - තතත්ත්වාගණනය කළ මතය

2020 - තතත්ත්වාගණනය නොකළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2016 අංක 10 දරන හෝමියෝපති පනතේ 30 වගන්තිය ප්‍රකාරව හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන් ලියාපදිංචි කිරීම සඳහා විභාගයක් පැවැත්විය යුතු වුවද, විභාගය පැවැත්වීම සඳහා වූ නීති හා රෙගුලාසි සම්පාදනය කිරීම අවසන් කර නොතිබීම හේතුවෙන් 2018 වර්ෂයේදී අයදුම්පත් කැඳවා තිබුණු විභාගය, 2021 ජුනි 30 දින වනවිටත් පැවැත්වීමට නොහැකි වීමෙන් වෛද්‍ය වෘත්තිකයන් ලියාපදිංචි කිරීම ප්‍රමාද වී තිබුණි. | නීති හා රෙගුලාසි සම්පාදනය කිරීම කඩිනම් කළයුතු අතර ප්‍රමාදයකින් තොරව වෛද්‍ය වෘත්තිකයන් ලියාපදිංචි කිරීමට කටයුතු කළ යුතුය. | නීති සහ රෙගුලාසි සකස් කර අවසන්ව ඇති බව හා රෙගුලාසි ගැසට් කිරීමෙන් අනතුරුව විභාගය පවත්වා ලියාපදිංචිය ලබා දීමට හැකියාව පවතින බව. | 2022 ජනවාරි 31 දින වන විට රෙගුලාසි ගැසට් කිරීමට අමාත්‍යාංශය වෙත භාරදීම පමණක් සිදුකර තිබුණු බැවින් විභාගය පවත්වා නොතිබුණි. |
| (ආ) | 2016 අංක 10 දරන හෝමියෝපති පනතේ 31(1) උපවගන්තිය ප්‍රකාරව, හෝමියෝපති ඖෂධවේදීන් ලියාපදිංචිකිරීම සඳහා හෝමියෝපති ඖෂධවේදී ලේඛනයක් පවත්වාගෙන යාමට කටයුතු කළයුතු වුවද, මෙම විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා වූ රෙගුලාසි පිළියෙලකර නොතිබීම හේතුවෙන් 2020 දෙසැම්බර් 31 දින වනවිටත් එවැනි ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | රෙගුලාසි පිළියෙලකර පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. | කඩිනමින් රෙගුලාසි පිළියෙල කර ඖෂධවේදීන් ලියාපදිංචිය ඉතා ඉක්මනින් සිදු කිරීමට බලාපොරොත්තු වන බව. | 2022 ජනවාරි 31 දින වන විටත් රෙගුලාසි පිළියෙල කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 16.1 වගන්තිය ප්‍රකාරව, කාර්යක්ෂමතා කඩඉම්වලින් උසස් කිරීමේ විභාග නියමිත දිනවල පැවැත්වීමට ආයතන ප්‍රධානී වගබලා ගතයුතු වුවත්, 2012, 2014 හා 2015 වර්ෂවලදී බඳවාගෙන තිබුණු නිලධාරීන් 20 දෙනෙකු වෙනුවෙන් විගණිත දිනය වන 2021 ජුනි 30 දින වනවිටත් කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීමට කටයුතු කර නොතිබුණි. මේ හේතුවෙන් මෙම නිලධාරීන් සේවයෙහි ස්ථිර කළ නොහැකිව තිබුණු අතර ඔවුන්ගේ පරිවාස කාලය දීර්ඝ කිරීමටද කටයුතු කර නොතිබුණි. | මෙම විභාග පැවැත්වීම කඩිනමින් සිදු කළ යුතු අතර එතෙක් නිලධාරීන්ගේ පරිවාස කාලය දීර්ඝ කිරීම සිදු කළ යුතුය | කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය පැවැත්වීමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කරමින් පවතින බව. | 2022 ජනවාරි 31 දින වන විටත් කාර්යක්ෂමතා කඩඉම් විභාග පවත්වා නොතිබුණි. |
| (ඇ) | 2016 අංක 10 දරන හෝමියෝපති පනතේ විධිවිධානවලට අනුව හෝමියෝපති වෛද්‍ය විද්‍යාලයක් ආරම්භ කිරීම සඳහා 2008 වර්ෂයේදී ගොඩනැගිල්ලක් ඉදිකර 2009 වර්ෂයේදී ඒ සඳහා රු.1,199,254 ක් වැයකර ලී බඩු හා වෙනත් අවශ්‍යඋපකරණ සපයාගෙන තිබුණි. එහි අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමට අදාළ නීතිමය රාමුව පිළියෙල කිරීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් 2021 ජූලි 15 දින වන විටත් අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමට | ඉදිකර ඇති ගොඩනැගිල්ල හා මිලදී ගෙන ඇති උපකරණ අදාළ අරමුණ වෙනුවෙන් යොදවා ගැනීමට කඩිනමින් පියවර ගත යුතුය. | ඉදිරියේදී අමාත්‍යාංශය හා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සමඟ එක්ව ඉදිකර ඇති ගොඩනැගිල්ල හා උපකරණ අදාළ අරමුණ වෙනුවෙන් යොදා ගැනීමට අදහස් කර ඇති බව. | 2022 ජනවාරි 31 දින වන විටත් වෛද්‍ය විද්‍යාලයක් ආරම්භ කිරීමේ නීතිමය රාමුව පිළියෙල කර නොතිබුණි. |

නොහැකිවී තිබුණි. ඒ අනුව මිලදීගෙන තිබුණු ස්ථාවර වත්කම් හා ඊට අදාළ ගොඩනැගිල්ල වර්ෂ 12 කට අධික කාලයක් තිස්සේ නිෂ්කාර්යව පැවතුණි.

**74.** **හානි පූර්ණය සඳහා වන කාර්යාලය**

(2018 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත්තේ වර්තමාන තැනැත්තන්, දේපළ හා කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරිය නමින්ය. 2018 මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියේදී හානි පූර්ණය කාර්යාලය සඳහා වන අනුප්‍රාප්තික වශයෙන් සඳහන් වී තිබුණි.)

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - අහිතකර මතය

2019 - අහිතකර මතය

2020 - තත්ත්වාගණනය නොකළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2017 මාර්තු 15 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව 2012 නොවැම්බර් 09 දින වැලිකඩ බන්ධනාගාර පරිශ්‍රය තුළ සිදු වූ සිදු වීම හේතුවෙන් මරණයට පත් සිරකරුවන් 16 දෙනෙක් සඳහා ගෙවිය යුතු වන්දිවලින් දෙදෙනෙක් වෙත එක් අයෙකුට රු.2,000,000 බැගින් රු.4,000,000ක් ද එකී සිදු වීමෙන් තුවාල ලත් පුද්ගලයින් 21 දෙනෙකු සඳහා ගෙවිය යුතු වන්දිවලින් 11 දෙනෙකු වෙත රු.500,000 බැගින් රු.5,500,000ක් ද තවමත් ගෙවා නොතිබුණි. තවද 2018 මාර්තු 16 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව මහනුවර දිගන ප්‍රදේශයෙහි ඇති වූ මහජන කැළඹීම් තත්ත්වය හේතුවෙන් සිදු වූ දේපළ හානි සිදු වීම් අවස්ථා 508 කින් අවස්ථා 38 ක් සඳහා ගෙවිය යුතු වන්දි මුදල රු.31,695,000ක් ගෙවා නොතිබුණි. | අමාත්‍ය මණ්ඩල තීරණ පරිදි වන්දි මුදල් ගෙවා අමාත්‍ය මණ්ඩල තීරණය ක්‍රියාත්මක කළයුතු වේ. | මියගිය දෙදෙනෙකුගේ හා තුවාලකරුවන් 11 දෙනෙකුගේ අයදුම්පත්වල නිවැරදි ලිපිනයන් සඳහන් නොවීම හේතුවෙන් බන්ධනාගාර දෙපාර්තමේන්තුවෙන් විමසීම් කල ද ලිපිනයන් හී කිසිදු වෙනසක් සිදු වී නොමැත.<br><br>මහනුවර දිගන ප්‍රදේශයේ සිදු වූ නොසන්සුන්තාවය වෙනුවෙන් කටයුතු කිරීමේ දී විගණනය සඳහන් කරනු ලබන ලිපිගොනු 38 සම්බන්ධයෙන් කටයුතු කර ඇත. | 2021 ජනවාරි 25 දින වන විට මියගිය දෙදෙනෙකුට හා තුවාලකරුවන් 11 දෙනෙකුට අදාළ වන්දි මුදල් මෙතෙක් ගෙවා නොමැත.<br><br>තවදුරටත් මහනුවර දිගන ප්‍රදේශයේ සිදු වූ නොසන්සුන්තාවය වෙනුවෙන් ලිපිගොනු 38 කට අදාළව රු.31,695,000ක ගෙවිය යුතු වන්දි වලින් ලිපිගොනු 06 කට අදාළව රු.7,536,650 ක වන්දි පමණක් ගෙවා තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ වන්දි ගෙවීම් සඳහා චෙක්පත් නිකුත් කළ ද, වන්දි ලාභීන් හට චෙක්පත් නිකුත් කරන අවස්ථාව වන විට යාවත්කාලීන නොකරන ලද තොරතුරු මත පදනම්ව ලිපිගොනු නිර්දේශ කිරීම හා වන්දි ලබා දීම සිදු කිරීම හේතුවෙන් වන්දි ගෙවීමේ ක්‍රියාවලිය නිසි පරිදි ඉටු වී නොතිබුණි. ඒ අනුව 2020 දෙසැම්බර් 31 දිනට වර්ෂයකට වැඩි කාලයක් ගතවී ඇති ප්‍රතිලාභීන් 34 කට අයත් රු.1,860,758ක වන්දි සඳහා 2021 මාර්තු 31 දින වන විටද ප්‍රතිලාභීන් හිමිකම් ඉදිරිපත් කර නොතිබුණි. | අදාළ ප්‍රතිලාභීන්ගේ යාවත්කාලීන කරන ලද තොරතුරු මත පදනම්ව වන්දි ගෙවීම් නිර්දේශ කිරීම සිදු කළ යුතුය. | හානි පූර්ණ කාර්යාලයේ දිස්ත්‍රික් හානි පූර්ණ නිලධාරීන් මඟින් උතුරු නැගෙනහිර පළාත්වල පදිංචි වන්දි අයදුම්කරුවනගේ තොරතුරු යාවත්කාලීන කර ගනිමින් ඔවුන්ගේ නිවැරදි ගිණුම් තොරතුරු මත පදනම්ව චෙක්පත් නිකුත් කිරීමට කටයුතු කරනු ලබයි. | 2021 ජනවාරි 25 දින දක්වා ප්‍රතිලාභීන් 34 දෙනාගෙන් නිවැරදි තොරතුරු ලබා දී වන්දි ගෙවා ඇත්තේ වන්දිලාභීන් 03 දෙනෙකු සඳහා පමණි. තවදුරටත් එසේ ඉල්ලුම් නොකරන වර්ෂ දෙක සම්පූර්ණ වූ එකී මුදල් භාණ්ඩාගාරය වෙත යැවීමට කටයුතු කරයි. |
| (ඇ) | පාස්කු ප්‍රහාරය හේතුවෙන් වන්දි ප්‍රදානය කිරීමේ දී ප්‍රතිලාභියෙකුට ගෙවන ලද රු.300,000ක අත්තිකාරම අඩු නොකර 2019 මැයි 15 දින ඉතිරි මුදල් ගෙවා තිබීම නිසා අනුමත වන්දි මුදල ඉක්මවා රු.300,000ක් වැඩිපුර ගෙවා තිබුණි. | නිලධාරීන්ගේ/ සේවකයින්ගේ ප්‍රමාදය, නොසැලකිල්ල, වැරදි හෝ වංචා නිසා රජයට සිදුවන පාඩු සම්බන්ධව ගණන්දීමේ නිලධාරියා විසින් මුදල් රෙගුලාසි 128 (1) 'ජ'ප්‍රකාරව කටයුතු කළ යුතුය. | අනාගතයේදී මෙවැනි කටයුතු සිදු නොවීමට නිසි වගකීමෙන් හා වගවීමෙන් සිදු කිරීමට අභ්‍යන්තර පාලන ක්‍රමය තවදුරටත් ශක්තිමත් කිරීම | කමිටු සාමාජික මණ්ඩලය (අධ්‍යක්ෂ) තීරණය අනුව මූලික විමර්ශණයක් කිරීම සඳහා අදාළ විමර්ෂණ නිලධාරීන් පත් කිරීමට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට දන්වා ඇත. |
| (ඈ) | ඵලදායී සේවා මට්ටමක් පවත්වා ගැනීමට හා සේවක සංඛ්‍යාව පිළිබඳ කාලීන සමාලෝචනයක් කිරීමට නොහැකි වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයේ දී ද්විතික මට්ටමේ පුරප්පාඩු 19 ක් ද, ප්‍රාථමික | ඵලදායී සේවා මට්ටමක් පවත්වා ගැනීම සඳහා කාලීන සමාලෝචනයක් සිදු කර ඒ අනුව අවශ්‍ය කටයුතු කළ යුතුය. | පුරප්පාඩුව පැවති අධ්‍යක්ෂ ජනරාල් ධූරය සඳහා පත්කිරීම් සිදු කර ඇති අතර අධ්‍යක්ෂක හා සහකාර අධ්‍යක්ෂ ධූරයන් 02 ක් සඳහා නව බඳවාගැනීම් සිදු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග අනුගමනය කරමින් පවතී. | 2021 වර්ෂය අවසානය වන විට ද්විතීක මට්ටමේ පුරප්පාඩු 19ක් ප්‍රථමික මට්ටමේ පුරප්පාඩු 02ක් අධ්‍යක්ෂක හා සහකාර අධ්‍යක්ෂ |

මට්ටමේ පුරප්පාඩු 02 ක් ද ඇතුලත්ව මණ්ඩලයේ පුරප්පාඩු 21 ක් පැවතුණි. මීට අමතරව අධ්‍යක්ෂ ජනරාල් සහ අධ්‍යක්ෂක තනතුරු 02 ක සඳහා ස්ථිර පදනමින් බඳවා නොගෙන වැඩබලන පත්වීම් සිදු කර තිබුණි.

තවද ද්විතික මට්ටමේ ධූරයන් 02 ක පුරප්පාඩු වන හානි පූර්ණ පුරප්පාඩුව පවතී. සහකාර තනතුරු 19 ක් සඳහා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයද නම්කොට අවසන්ය. අමාත්‍යමණ්ඩල පත්‍රිකාවක් මඟින් සියළු බඳවාගැනීම් තාවකාලිකව කල් තබා ඇත.

## 75. ජර්මාණු කාර්මික අභ්‍යාස ආයතනය

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - මතය වියාචනය

2019 - මතය වියාචනය

2020 - තතත්ත්වාගණනය නොකළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 92 ඡේදය ප්‍රකාරව, සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණද දැනටමත් භාවිතා කරනු ලබන පිරිවැය රු.483,212,984ක් වූ ස්ථාවර වත්කම් පිළිබද මූල්‍ය ප්‍රකාශන වල අනාවරණය කර නොතිබුණු අතර ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව එම වත්කම් වල ඵලදායී ජීවිත කාලය පිළිබද වූ ඇස්තමේන්තුව නැවත සමාලෝචනය කර මූල්‍ය ප්‍රකාශන වල ගැලපීමට කටයුතු කර නොතිබුණි. | ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කළ යුතුය. | කාර්යාල උපකරණ, ලී බඩු උපකරණ හා යන්ත්‍රෝපකරණ වල වටිනාකම ප්‍රත්‍යාගනනය කර, එම වටිනාකම් පොත්වලට ගැනීම සඳහා කටයුතු කර ගෙන යනු ලැබේ. | 2021 වර්ෂයේදීද නිවැරදි කිරීම් සිදුකර නොතිබුණි. |
| (ආ) | එකතුව රු.14,999,141ක් වූ ණයගැති හා ණයහිමි ශේෂ සනාථ කිරීම් විගණනය වෙත ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඒවායේ පැවැත්ම හා නිවැරදිතාවය සත්‍යාපනය කිරීමට නොහැකි විය. | ශේෂ සනාථ කිරීම සඳහා ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. | ණය ගැතියන් සඳහා ශේෂ සනාථ කිරීම් ලිපි යොමු කර ඇත. | ශේෂ සනාථ කිරීම් ලිපි 2021 වර්ෂය සඳහාද ලැබී නොතිබුණි. |
| (ඇ) | 2017 අංක 15 දරන ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතන පනතෙහි 4 (ඌ) වගන්තිය ප්‍රකාරව නියමිත ක්ෂේත්‍රවල තාක්ෂණ හා | පනතේ වගන්ති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | එය ඉටු කිරීමේ දී ආයතනයේ පුහුණු පාඨමාලාවල ගුණාත්මක භාවය ඒ අයුරින්ම පවත්වාගෙන යාමට හැකිවන අයුරින් කටයුතු කල නොහැකි | එක් කලාපීය මධ්‍යස්ථානයක් පමණක් පිහිටුවීමට කටයුතු කර තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | වෘත්තීය පුහුණු කිරීම් පවත්වාගෙන යාමේ සහ අධ්‍යාපනය ලබාදීම සඳහා කලාපීය මධ්‍යස්ථාන පිහිටුවීම. | | නිසා මධ්‍යස්ථාන ආරම්භ කර නැත. | |
| (ඈ) | 201 වර්ෂයේදී රු.3,586,990ක් වැයකර සේවා පරිගණකයක් හා නව පරිගණක ජාලය ස්ථාපිත කිරීමට අදාල අනෙකුත් උපකරණ ප්‍රසම්පාදනය කර තිබූ නමුත් අපේක්ෂිත ප්‍රධාන කාර්යයන් සඳහා පරිගණක ජාල ස්ථාපිත කිරීමකින් තොරව අන්තර්ජාල පහසුකම් සපයාගැනීම පමණක් සිදුකර තිබුණි. | පරිගණක ජාලය ස්ථාපිත කිරීමෙන් ඉටුකර ගැනීමට අපේක්ෂිත ප්‍රධාන කාර්යයන් ඉටුකරගත යුතුය. | අදාල අරමුණු ඉටු කර ගැනීමට ක්‍රියාකර නොතිබුණි. | 2021 වර්ෂයේදීද උපරිම පරිගණක ජාලය ස්ථාපනය කිරීමේ අරමුණ ඉටු කරගෙන නොතිබුණි. |
| (ඉ) | මාර්ග සංවර්ධන අධිකාරිය සතු ඉඩමක ආයතනය වෙනුවෙන් මහල් 06 න් යුත් ශිෂ්‍ය නේවාසිකාගාරය ඉදිකිරීමේ කටයුතු 2018 නොවැම්බර් මාසයේදී ආරම්භ කර තිබුණද ඉඩමෙහි නීත්‍යානුකූල අයිතිය ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය වෙත පවරා ගැනීමටද කටයුතු කර නොතිබුණි. | ඉඩමෙහි නීත්‍යානුකූල අයිතිය ආයතනය වෙත පවරා ගැනීමට කටයුතු කළ යුතුය. | අයිතිය පවරා ගැනීමට ක්‍රියාකර නොතිබුණි. | 2021 වර්ෂයේදීද ඉඩම නීත්‍යානුකූලව පවරාගෙන නොතිබුණි. |
| (ඊ) | දිගු කාලයක සිට ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය පවත්වාගෙන යනු ලබන වටිනාකම රු.1,149,350,000ක් වූ ඉඩම පවරා ගැනීමට කළමනාකරණයේ අවධානය යොමුකර නොතිබුණි. | ආයතනයට අදාල වත්කම් පවරා ගැනීමට කටයුතු කළ යුතුය. | මෙම ආයතනය ශ්‍රී ලංගම ආයතනය යටතේ පැවති ආයතනයක් බැවින් ආයතනය සතු ඉඩම් වල ඔප්පු එම ආයතනය සතුව තිබේ. | 2021 වර්ෂයේදීද පවරාගැනීම් සිදුකර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (උ) | 2018 වර්ෂය සහ පසුගිය වර්ෂ 05තුළ පූර්ණ කාලීන පාඨමාලා සඳහා මූලික සුදුසුකම් සපුරා තිබූ අයදුම්කරුවන්ගෙන් ඇතුළත් කර ගනු ලැබූ ප්‍රතිශතය සියයට 20 ත් සියයට 30 ත් අතර වූ අතර වාර්ෂිකව වැඩිවන ඉල්ලුමට සරිලන පරිදි ආයතනයේ ධාරිතාව වැඩි කර ගැනීම සඳහා නිසි සැලැස්මකින් යුතුව කටයුතු කර නොතිබුණු අතර 2018 වර්ෂයේදී පමණක් අයදුම්කරුවන් 3,075 දෙනෙකුට පාඨමාලා හැදෑරීමේ අවස්ථාව අහිමි වී තිබුණි. | ආයතනයේ ධාරිතාව වැඩිකර ගැනීම සඳහා නිසි සැලැස්මකින් යුතුව කටයුතු කළ යුතුය. | ධාරිතාවය වැඩි කිරීම සඳහා කාර්ය මණ්ඩලයේ සිටින උපදේශකවරුන් ප්‍රමාණවත් නොවන බැවින් පුහුණු ප්‍රදර්ශකවරුන් 20 දෙනෙකු තාවකාලිකව කොන්ත්‍රාත් පදනම මත වසරක කාලයක් සඳහා බඳවා ගෙන ඇත. වැඩිවන ඉල්ලුමට අවශ්‍ය පහසුකම් සැපයීම සඳහා නව වැඩහල්, පන්තිකාමර හා පරීක්ෂණාගාර ඉදිකිරීම් අරමුණින් ආයතනයට යාබද, නාගරික සංවර්ධන අධිකාරිය සතු අක්කර 4ක් පමණ වූ භූමි භාගය ලබා ගැනීම සඳහා අවශ්‍ය නීතිමය කටයුතු සිදු කෙරෙමින් ඇත. | 2021 වර්ෂයේදීද ශිෂ්‍ය සහභාගීත්වය වැඩි කිරීම සඳහා ප්‍රමාණවත් පියවර ගෙන නොමැති අතර නාගරික සංවර්ධන අධිකාරියට අයත් යාබද ඉඩමද පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඌ) | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ 2020 දෙසැම්බර් 31 දිනට රු. 3,603,142 ක් වූ ණය ගැති ශේෂයක් වූ අතර ඒ තුළ වර්ෂ 10 කට වඩා පැරණි ණයගැති ශේෂය රු.1,111,415ක් සහ වර්ෂ 5 ත් 10 ත් අතර ණය ගැති ශේෂය රු.2,109,449ක් විය. | ණයගැති ශේෂ අයකර ගැනීම හෝ මුදල් රෙගුලාසි ප්‍රකාරව හෝ කටයුතු කළ යුතුය. | මෙම ශේෂයන් නිරවුල් කර ගැනිම සඳහා නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශ ලේකම් මගින් ශ්‍රිලංගම ප්‍රධාන විධායක නිළධාරි වෙත ඉදිරිපත් කිරිමට 2021/12/07 දින ලිපියක් යොමු කර තිබේ. ඒ අනුව දෙපාර්ෂවය අතර හැකි ඉක්මනින් සාකච්ජා කර මෙම ශේෂය නිරවුල් කර ගැනිමට පියවර ගනු ලැබේ. | ණය අයකර ගැනීමට හෝ පොත්වලින් ඉවත් කිරීමටද කටයුතු කර නොතිබුණි. |
| (එ) | ආයතනය විසින් ප්‍රායෝගික පුහුණුව ලබාදීමේදී අදාළ අභ්‍යාසලාභීන්ගේ ආරක්ෂාව උදෙසා ශිෂ්‍ය රක්ෂණ ප්‍රතිලාභ | ශිෂ්‍ය රක්ෂණ ප්‍රතිලාභ අරමුදල ශිෂ්‍යයින්ගේ ආරක්ෂාව සැපයීම වෙනුවෙන් යෙදවිය | අදාල ආරක්ෂක උපකරණ නොපමාව සැපයීමට ක්‍රියාමාර්ග ගෙන නැත. ආධුනිකයිනගේ ඇස් සේදීම | 2021 වර්ෂයේදීද සිසු රක්ෂණයෙන් අදාල ආරක්ෂිත කට්ටල සිසුන් වෙත |

| | | | | |
|---|---|---|---|---|
| | අරමුදල මගින් අවශ්‍ය ආරක්ෂිත උපකරණ කට්ටල ලබාදීමට කටයුතු කරන ලෙස අමාත්‍යාංශ ලේකම් උපදෙස් ලබාදී තිබුණද 2020 ජනවාරි 31 දිනවන විටත් එපරිදි කටයුතු කර නොතිබුණි. එසේම එම අභ්‍යාසලාභීන් පැළඳ සිටිය යුතු ආරක්ෂක පැලඳුම් කට්ටල මොනවාද යන්න හඳුනාගෙන නොතිබුණි. | යුතුය. | සඳහා වන උපකරණයක් මිලදී ගැනීම සඳහා තාක්ෂණ ඇගයීම් කමිටුවක් පත්කර ප්‍රසම්පාදන කටයුතු සිදු කරමින් පවතී. | මිලදීගෙන ලබාදී නොතිබුණි. |
| (ඒ) | 2018 ජූලි 17 දිනැති 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ අංක 38 (1) (ඇ) ඡේදය ප්‍රකාරව වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කිරීම. | නියමිත දිනවලදී වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුය. | 2018 සහ 2019 වසර වාර්ෂික වාර්තා හැකි ඉක්මනින් පාර්ලිමෙන්තුව වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකෙරෙමින් පවතී. | 2022 ජනවාරි වන විටත් 2018 හා 2019 වාර්ෂික වාර්තා පාර්ලිමේන්තු ගත කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඔ) | පුරප්පාඩු වී ඇති ප්‍රධාන තනතුරු පහට අදාළව අධ්‍යාපන සුදුසුකම් වලට සම වැටුප් තල සකස් කර ඒ පිළිබඳව භාන්ඩාගාරය සමග සාකච්ඡා කර එම පුරප්පාඩු පිරවීමට කටයුතු නොකිරීම. | බඳවා ගැනීමේ පටිපාටියට අනුව පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. | ආයතනය සඳහා විශේෂ වැටුප් ක්‍රමයක් යෝජනා කරමින් 2020.03.05 දාතමින් රේඛීය අමාත්‍යාංශ ලේකම් මඟින්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සහ සභාපති ජාතික වැටුප් කොමිසමට ලිපියක් යොමු කර ඇත. | 2021 වර්ෂයේදීද පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණු අතර සාවද්‍ය වැටුප් වර්ධක ලබාදීම සම්බන්ධයෙන් වූ ගැටළුකාරී තත්ත්වයද නිවැරදි කරගැනීමට කටයුතු කර නොතිබුණි. |

## 76. ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 - තත්ත්වාගණනය කළ මතය

2019 - තත්ත්වාගණනය කළ මතය

2020 - තත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය හා පුවත්පත් පැමිණිලි කොමිසම පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක් සිදුකර පර්යේෂණ වාර්තාවක් ඉදිරිපත් කිරීම සඳහා ගිවිසුමකට එළඹ, අත්තිකාරම් වශයෙන් රු.200,000ක් කැලණිය විශ්වවිද්‍යාලයේ ජනසන්නිවේදන අංශය වෙත 2015 නොවැම්බර් 24 දින ගෙවා තිබුණු අතර, ගෙවීමෙන් මාසයක් ඇතුළත අදාළ වාර්තාව ඉදිරිපත් කළ යුතුව තිබුණ ද 2021 මාර්තු 10 දින වනවිටත් එම වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | අදාල වාර්තාව ලබාගැනීමට කටයුතු කළ යුතු ය. | මේ පිළිබඳව විගණන කළමණාකරන කමිටු රැස්වීමේදිද සාකච්ඡා කල අතර එහිදි යෝජනා වූයේ මේ වන විට පරියේෂණ අවසන් කර ඇති වාර්තාව ලබාගෙන තවදුරටත් මුදල් නොගෙවන බවට එකඟතාවයක් ලබාගෙන අදාළ පර්යේෂණය අවසන් කරන ලෙසයි. | 2021 වර්ෂයේදිද එම වාර්තාව ඉදිරිපත් කර නොමැත. |
| (ආ) | 2010 මැයි 14 දිනැති අංක සීජ්/1/17/1 දරන ජනාධිපති ලේකම් කාර්යාල ලිපියේ 1 ඡේදය සහ පොදු ව්‍යාපාර කාරක සභාවේ 2012 ජුලි 10 දිනැති අංක 7 වන නියෝගය ප්‍රකාරව මණ්ඩලය රජයේ ගොඩනැගිල්ලක පවත්වාගෙන යායුතු වුවද, මණ්ඩලය ආරම්භයේ සිට වසර 21ක කාලයක් තුළ පෞද්ගලික ගොඩනැගිලි වල පවත්වාගෙන | රජයේ ආයතන සමඟ තවදුරටත් සාකච්ඡා කර සුදුසු ගොඩනැඟිලි පරිශ්‍රයක් තෝරා ගැනීමට කටයුතු කළ යුතුය. | අමාත්‍යාංශයේද මැදිහත්වීම මත රජයේ ගොඩනැගිල්ලක් ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කර ඇත. | ජනමාධ්‍ය අමාත්‍යාංශයට අයත් “විසුම්පාය” පරිශ්‍රයේ සංවර්ධන කටයුතු අවසන් කිරීමෙන් පසුව මණ්ඩලයට අවශ්‍ය ඉඩකඩ පහසුකම් ලබා දීමට ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත දන්වා ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | ගොස් තිබුණ අතර, ඒ සඳහා 2010 සිට 2020 ගොඩනැගිලි කුලී වශයෙන් රු.26,108,800 ක් වැයකර තිබුණි. | | | |
| (ඇ) | 1981 ඔක්තෝබර් 14 දිනැති අංක 162/5 ඒ දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කර තිබෙන පුවත්පත් කලාවේදීන් සඳහා වූ ආචාර ධර්ම සංග්‍රහයට අනුව දිනපතා පළවන පුවත්පත් විමර්ශනය කර බැලීම සඳහා ක්‍රමවේදයක් පැවතියද පළවන පුවත්පත් ප්‍රමාණයට සාපේක්ෂව සීමිත විමර්ශන වාර්තා ප්‍රමාණයක් පමණක් ඉදිරිපත් කර තිබුණි. එකී විමර්ශන වාර්තා සම්බන්ධයෙන් ද ආචාරධර්ම පිළිපැදීම පිළිබඳව අවශ්‍ය ඇගයීම් සිදුකිරීම කෙරෙහි මණ්ඩලයේ ප්‍රමාණවත් අවධානය යොමුවී නොතිබුණි. | විමර්ශණ වාර්තා සම්බන්ධව සහ ආචාරධර්ම පිළිපැදීම පිළිබඳව අවශ්‍ය ඇගයීම් සිදුකිරීම කෙරෙහි අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රමාණවත් අවධානය යොමුවිය යුතුය | මේ පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයේ වැඩි අවධානය යොමු කිරීමට කටයුතු කර ඇත. | මේ සම්බන්ධව සුදුසු ක්‍රියාමාර්ග ගෙන ඇත. |
| (ඈ) | පුවත්පත් මණ්ඩල පනතේ 30 වන වගන්තිය ප්‍රකාරව ලියාපදිංචි නොකර වෙළඳපලට නිකුත් කරන පුවත්පත් සම්බන්ධව අවශ්‍ය රීති හා නියෝග සම්පාදනයට කටයුතු කර නොතිබුණි. | ලියාපදිංචියකින් තොරව අලෙවි කරන පුවත්පත් පිළිබඳව විමර්ශණය කිරීමට මණ්ඩලය කටයුතු කළ යුතු ය. | දිවයින පුරා පැවැත්වෙන සියළු වැඩසටහන් හා සම්මන්ත්‍රණවලදි මේ පිළිබඳව දැනුවත් කිරීමට කටයුතු කර ඇත.තවද අඛණ්ඩව වෙළඳපොල නිරික්ෂණ මගින් ලියාපදිංචි කිරීමට ක්‍රමවේදයක් සකස් කර ඇත. | නීති රීති සම්පාදනය කිරීම 2021 වර්ෂයේදීද සිදුකර නොමැත. |
| (ඉ) | පුවත්පත් මණ්ඩල පනතේ 09 වන වගන්තිය ප්‍රකාරව පුවත්පත් වලට හා කර්තෘවරුන් ආදීන්ට විරුද්ධව මණ්ඩලය විසින් ක්‍රියා කළ යුතු වුවද 2020 වර්ෂයේද | පුවත්පත් පැමිණිලි සඳහා විසඳුම් ලබාදීමේ කටයුතු කඩිනම් කළ යුතුය. | පැමිණිල්ලක් විභාග කිරීම ආරම්භ කර පරික්ෂණ කටයුතු සිදු කිරීමේදි ඇති වන දුෂ්කරතාවයන් අවම කර ගනිමින් කටයුතු කිරීමට | පැමිණිලි 69න් පැමිණිලි 24ක් 2021.12.31 දින වන විටත් විසඳී නොතිබුණි. |

ප්‍රවෘත්ති පත්‍ර වලට විරුද්ධව මහජනතාව සහ විවිධ ආයතනවලින් ලද පැමිණිලි 71 ක් සහ 2019 වර්ෂයේ නොවිසඳී ඉදිරියට ගෙනා පැමිණිලි 62ක් ද ඇතුළුව මුළු පැමිණිලි සංඛ්‍යාව 133 ක් වූ අතර ඉන් පැමිණිලි 69 ක් 2020 වර්ෂය අවසන් වනවිටත් විසඳීමට කටයුතු කර නොතිබුණි.

කටයුතු කර ඇත.

**77. ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය**

මූලා‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - තතත්ත්වාගණනය කළ මතය

2019 - තතත්ත්වාගණනය නොකළ මතය

2020 - තතත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2003 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වූ කාල පාරාසයක සිට පැවත එන එකතුව රු.1,082,708ක් වූ අයවිය යුතු ශේෂ 06 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයවිය යුතු ශේෂ අයකර ගැනිමට කටයුතු කළ යුතුය. | මහවැලි අධිකාරියෙන් ලැබිය යුතු මුදල අයකර ගත නොහැකි ශේෂයක් ලෙස හදුනා ගෙන ඇත. ඒ අනුව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගෙන කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත ගිණුම් වලින් කපා හැරීමට අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කර ඇත. | රු.1,675ක ණය ශේෂයක් පමණක් අයවී ඇත. ඉතිරි හිඟ ණය ශේෂ අයවිය යුතුය. |
| (ආ) | ආයතනයේ ගිණුම් අංශයේ සේවය කරමින් සිටි කළමනාකාර සහකාරවරියක් විසින් ලේඛන වෙනස් කරමින් රු.787,932ක මුදලක් වංචා කිරීමට අදාල මූලික විමර්ශන වාර්තාව සමාලෝචිත 2021 දෙසැම්බර් 31 දින වන විටත් ආයතනයට ලබා දී නොතිබුණි. | ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ ii වන කාණ්ඩයේ 13.2 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | මුදල් වංචාවට සම්බන්ධ මූලික විමර්ෂනය මේ වන විට අවසන් කොට අවසන් වාර්තාව සකස් කරමින් පවතී. | 2021 වර්ෂයේදීද මූලික විමර්ෂණ කටයුතු අවසන් වී නොමැත. |
| (ඇ) | කෘෂි භෝග වල පසු අස්වනු හානිය අවම කිරීම ආයතනයේ ප්‍රධාන අරමුණක් වූ අතර ඒ වෙනුවෙන් 2009 වර්ෂයේ සිදුකර තිබූ මූලික සමීක්ෂණයකට අනුව කල් තබාගත නොහැකි කෘෂි භෝගවල පසු අස්වනු හානිය සියයට 30ත් සියයට 40ත් අතර | පසු අස්වනු හානිය අවම කරගෙන තිබූ ප්‍රමාණය කොපමණද යන්න හදුනාගත හැකිවන පරිදි දත්ත පද්ධතියක් පවත්වාගත යුතුය. | මේ සදහා වන පර්යේෂණයන් 2021 වසරේ ක්‍රියාත්මක කිරීමට යොදා ගෙන ඇත. | දත්ත පද්ධතියක් හඳුනාගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | පැවති බව හඳුනාගෙන තිබුණු නමුත් 2020 වර්ෂය වන විට එම පසුඅස්වනු හානිය අවමකරගෙන තිබූ ප්‍රමාණය ප්‍රතිශතයක් වශයෙන් කොපමණද යන්න හඳුනාගත හැකිවන අන්දමේ දත්ත සමුදායක් ආයතනය සතුව නොතිබුණි. | | | |
| (ඇ) | 2016 වර්ෂයේ සිට 2019 අගෝස්තු මාසය දක්වා කාලය තුළ ක්‍රියාත්මක කර තිබූ පළතුරු ඉදවීමට කාබනික ක්‍රම හඳුන්වා දීමේ පර්යේෂණයේ (Induction of fruit ripening by organic method) සොයා ගැනීම් සඳහා පේටන්ට් අයිතිය ලබා ගැනීම හා පර්යේෂණයේ ප්‍රතිඵල වාණිජ මට්ටමින් ප්‍රචලිත කිරීම සඳහා රු.9,572,715ක් වැය කර තිබුණද, 2020 දෙසැම්බර් 31 දින වන විට මෙම ව්‍යාපෘතිය ක්‍රියාකාරී මට්ටමේ නොතිබුණි. | ව්‍යාපෘති සැලසුම් කිරීමේ දී අපේක්ෂිත අරමුණු ඉටුවන ආකාරයට ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කළ යුතුය. | මෙය නව සොයාගැනීමක් වූ අතර මේ ආශ්‍රිතව පර්යේෂණ ප්‍රකාශන 03ක් සිදු කොට ඇත. | අරමුණු ඉටුවන ආකාරයට ව්‍යාපෘතිය ක්‍රියාත්මක වී නොමැත. |
| (ඉ) | පර්යේෂණ ක්‍රියාවලියකින් පසුව නව උත්පාදන යන්ත්‍ර නිෂ්පාදනය කර සමාජගත කිරීම ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනයේ පර්යේෂණ අංශයේ ප්‍රධාන අරමුණක් වුවත් 2000 වර්ෂයේ සිට 2021 දක්වා නව උත්පාදන යන්ත්‍ර 19 න් යන්ත්‍ර 18 ක් සමාජ ගතකර නොතිබුණි. | ව්‍යාපෘති සැලසුම් කිරීමේ දී අපේක්ෂිත අරමුණු ඉටුවන ආකාරයට ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කළ යුතුය. | නිෂ්පාදන යන්ත්‍ර සමාජගත කිරීමේදී ඒවා ඉක්මනින් නිශ්චිත ආකාරයෙන් ක්‍රියාත්මක විය යුතු අතර ඒ මට්ටමට යන්ත්‍ර ගෙන ඒම සඳහා යම්කිසි කාලයක් ගතවේ. එලෙස වැඩිදියුණු කළයුතු යන්ත්‍ර පිළිබඳ ඉංජිනේරු සේවා අංශය මගින් අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | අපේක්ෂිත අරමුණු ඉටුවන ආකාරයට ව්‍යාපෘතිය ක්‍රියාත්මක වී නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඊ) | ප්‍රතීතන සහතික ලබා ගැනීම සඳහා 2016 වර්ෂයේදී මාස 06ක් ඇතුළත අවසන් කිරීම සඳහා ඉදිරිපත් කර තිබූ ව්‍යාපෘති යෝජනාවට අනුව රු.47,101,187ක් වියදම් කර නව උපකරණ මිලදී ගැනීම හා රසායනාගාරය අළුත්වැඩියාවන් සිදුකර තිබුණ ද 2021 වර්ෂය අවසන් වන විටත් ප්‍රතීතන සහතික ලබා ගැනීමට අපොහොසත් වී තිබුණි. | ව්‍යාපෘති සැලසුම් කිරීමේ දී අපේක්ෂිත අරමුණ ඉටුවන ආකාරයට ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කළ යුතුය. | 2021 වර්ෂය අවසාන වනවිට විශ්ලේෂණ කිහිපයක් සඳහා **Accreditation** ලබා ගැනීමට බලාපොරොත්තු වේ. | ප්‍රතීතන සහතික (**Accreditation**) ලබාගෙන නැති බැවින් ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණ ඉටුවී නොතිබුණි. |
| (උ) | කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍රතිපාදන උපයෝගී කරගෙන ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන යටතේ ආනයන කරනු ලබන ආහාර වර්ග 07 ක, බැරලෝහ වර්ග 04 ක් අන්තර්ගතව තිබේද යන්න පරීක්ෂා කිරීමට ක්‍රියාත්මක කර තිබූ ව්‍යාපෘතිය සඳහා 2017 වර්ෂයේ රු.1,956,120 ක වියදමක් දරා නියැදි 500ක් පරීක්ෂා කර තිබුණි. මේ අනුව උපරිම ආරක්ෂක මට්ටම ඉක්මවා Cadmium,Arsenic and Leaf වැනි බැරලෝහ අන්තර්ගත බව තහවුරුකරගෙන තිබුණද මේ සම්බන්ධව වගකිවයුතු සියළුම පාර්ශව වෙත නිසි ක්‍රියාමාර්ග ගැනීම සඳහා තොරතුරු ලබාදී නොතිබීම හේතුවෙන් පර්යේෂණ සඳහා වැය වූ මුදල නිෂ්කාර්ය වියදමක් බවට පත්වී තිබුණි. | වාර්තාවේ නිගමන හා යෝජනා අනුව බැරලෝහ අන්තර්ගත ආහාර ද්‍රව්‍යයන් ඇති බවට තහවුරු කරගෙන ඇති බැවින් වගකිව යුතු සියළුම පාර්ශව වෙත නිසි ක්‍රියාමාර්ග ගැනීම සඳහා යොමු කළ යුතුය. | නියැදි 500 ක් විශ්ලේෂණය කිරීමෙන් පසුව අවසන් වාර්ථාව අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. | පරීක්ෂණ වාර්තාව වගකිව යුතු සියළුම පාර්ශව වෙත නිසි ක්‍රියාමාර්ග ගැනීම සඳහා 2021 වර්ෂයේදීද යොමුකර නැත. |

| | | | |
|---|---|---|---|
| (ඖ) 2015 වර්ෂයේදී විද්‍යාගාර පර්යේෂණ කටයුතු සඳහා රු.15,216,575 කට මිලදීගෙන තිබූ හා වාර්ෂිකව රු.275,000ක නඩත්තු වියදමක් දරමින් පූර්ණ වායුසමන තත්ත්වයක පවත්වා ගෙන යන Gas chromatograph Mass Spectrometer යන්ත්‍රය 2021 වර්ෂය අවසන් වන විටත් භාවිතයට ගෙන නොතිබුණි. | අදාල වත්කම් උපරිම අකාරයෙන් භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය. | වත්කම් භාවිතය සඳහා ක්‍රියාමාර්ග ගෙන නැත. | වත්කම් උපරිම ආකාරයෙන් භාවිතයට ගැනීමට කටයුතු කර නොමැත. |
| (එ) 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලය තුළ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ ශ්‍රී ලංකාවේ කෘෂි බෝගවල සැපයුම් හා අගයදාම කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා 2018 වර්ෂයේදී මිලට ගෙන තිබුණු උපකරණ ඵලදායී ලෙස භාවිතයට ගෙන නොතිබීම හේතුවෙන් එම ව්‍යාපෘතිය සඳහා වැයකර තිබූ වූ රු.7,292,332 ක මුදල ආර්ථික නොවූ වියදමක් බවට පත්වී තිබුණි. | අපේක්ෂිත අරමුණු ඉටුවන ආකාරයට ව්‍යාපෘතීන් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුය. | මේ වන විට ආයතනයේ ක්‍රියාත්මක පර්යේෂණ ව්‍යාපෘති සඳහාද මෙම උපකරණ භාවිතා කරන බව කාරුණිකව දැනුම් දෙමි. | ව්‍යාපෘතිය ක්‍රියාත්මක වී නොතිබුණි. |

## 78. ශ්‍රී ලංකා පදනම

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - තත්ත්වාගණනය කළ මතය

2019 - තත්ත්වාගණනය කළ මතය

2020 - තත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | වර්ෂ 2006 - 2009 කාලපරිච්ඡේදයට අදාලව දේශීය ආදායම් බදු දෙපාර්තුමේන්තුවෙන් අය විය යුතු රඳවා ගැනීමේ බදු රු.1,375,812 ක් 2020 අවසානය දක්වා නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | දේශීය ආදායම් බදු දෙපාර්තුමේන්තුවෙන් අය විය යුතු බවට සනාථ කල හැකි ලිඛිත ලියවිලි ඉදිරිපත් කර ඉල්ලීම් කර අයවිය යුතු ශේෂය නිරවුල් කරගත යුතුය. | අවස්ථා ගණනාවකදී මෙම මුදල් ආපසු ලබා ගැනීමට කටයුතු කර ඇතත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් එය ලබා දීමට කටයුතු කර නැත. | මෙම ශේෂය 2021 වර්ෂයේදීද නිරවුල් කර නැත. |
| (ආ) | කිසිදු තාක්ෂණික අධ්‍යයනයකින් තොරව මාසික කුලිය රු.87,500ක් වූ අන්තර්ජාල සම්බන්ධතාවය, මාසික කුලිය රු. 175,000 ක්වූ පුළුල් සම්බන්ධතාවයක් වෙත මාරුකර නොතිබුණි. මාස දෙකක කාලයකින් මෙම සම්බන්ධතාවය භාවිතා කිරීම නවතා දැමීම නිසා එම කාලයටද අදාල රු.1,242,250ක බිල්පතක් ගෙවීමට පදනමට සිදුවී තිබුණි. | තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාවක් පදනම් කර ගැනිමකින් පසු මෙවැනි තීරණ ගත යුතුය. | එවකට සිටි සභාපතිවරයා ඒකමතිකව තීරණය කර ගනු ලැබූ තීරණයක් නිසාවෙන් එම මුදල ගෙවීමට ආයතනයට සිදුව ඇත. | මෙම නිශ්කාර්ය වියදම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා පදනම කිසිදු පියවරක් ගෙන නැත. |
| (ඇ) | 2018 වර්ෂයේ යෝජිත චිත්‍රාගාරයක් ඉදිකිරීම වෙනුවෙන් උපදේශක සේවා ලබාගැනීමේ කොන්ත්‍රාත්තුවක් අදාල ප්‍රසම්පාදන | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කල යුතුය. | ශ්‍රී ලංකා පදනමේ කළමනාකාරිත්වය ගත් තීරණයකට අනුව අරමුදල් ගැටළුවක් මත මෙම චිත්‍රාගාර ඉදිකිරීම් ව්‍යාපෘතිය සැලසුම් | 2021 වර්ෂය අවසානය දක්වාම මෙම ඉදිකිරීම නිම කිරීමට කිසිදු පියවරක් ගෙන නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | මාර්ගෝපදේශවලින් තොරව සඳහා රු.1, 049,124 ක් ගෙවා තිබුණු අතර කළමනාකාරිත්වය තිරණයකට අනුව අරමුදල් ගැටළුවක් මත මෙම චිත්‍රාගාරය ඉදිකිරිම නවතා තැබීමෙන් දරන ලද උපදේශක ගාස්තුව නිෂ්ඵල වියදමක් වී තිබුණි. | | වලට පමණක් සීමා කර නවතා දමා ඇත. | |
| (ඇ) | පදනමට අයත් නිදහස් මාවතේ පිහිටි ඉඩමේ වටිනාකමද ඇතුළුව පිරිවැය රු.5,283,015 ක්වූ ගොඩනැගිල්ල ලිඛිත එකඟතාවයකින් හා කුලිඅයකරගැනිමකින් තොරව බාහිර පාර්ශවයක් වෙත ලබා දී තිබුණුඅතරමෙම තත්වය විධිමත් කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග පාලක මණ්ඩලය විසින් ගෙන නොතිබුණි. | අප කිහිපවිටක් ම මෙම දේපල පවරාගැනීමට කටයුතු කලත් එය අත්පත්කර ගැනීමට නොහැකි වී ඇත. | බාහිර පාර්ශවයක් විසින් ප්‍රයෝජනයට ගනු ලබන දේපල පවරා ගැනීමට කටයුතු කල යුතුය. | 2021 වර්ෂයේදීද මේ සම්බන්ධයෙන් කිසිදු පියවරක් ගෙන නැත. |

## 79. මාර්ග සංවර්ධන අධිකාරිය

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 - තතත්ත්වාගණනය කළ මතය

2019 - තතත්ත්වාගණනය කළ මතය

2020 - තතත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | අධිකාරියට අයත් A සහ B ශ්‍රේණිවලට අදාළ මහා මාර්ගයන්ගේ මුළු දුර ප්‍රමාණය කිලෝමීටර් 12,225 ක් වුවත් 2020 දෙසැම්බර් 31 දිනට මාර්ග 105 කට අයත් කිලෝමීටර් 2,237 ක් පමණක් ප්‍රාග්ධනිත කර තිබුණි. ඒ අනුව, මාර්ග සංවර්ධන අධිකාරිය සතු කිලෝමීටර් 9,988 ක දුර ප්‍රමාණය වූ A සහ B ශ්‍රේණිවලට අදාළ මහා මාර්ග වල වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙන් බැහැර වී තිබුණි. | අධිකාරියට අයත් සියලු මහා මාර්ග නියමිත සාධාරණ වටිනාකමට මූල්‍ය ප්‍රකාශණවල නිරූපණය කල යුතුය. | මාර්ග ප්‍රාග්ධනිත කිරීම සම්බන්ධයෙන් පිහිටුවා ඇති විශේෂ කමිටු 02 ක් සහ TCAM ව්‍යාපෘතිය මගින් හඳුන්වා දීමට නියමිත ක්‍රමවේදයක් 2022 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට නියමිතය. 2021 – 2023 වර්ෂ තුළ දී මාර්ග, ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කර ප්‍රාග්ධනිත කිරීම සඳහා සකස් කළ ක්‍රියාකාරි සැලැස්මට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත. | නිරීක්ෂණ තත්ත්වය එලෙසම පවතී. TCAM ව්‍යාපෘතිය මගින් මේ සඳහා ගනු ලැබීමට අපේක්ෂිත ක්‍රියාමාර්ග මූලික අවධියේ පවතී. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 අනුව හා ගිණුම්කරණ ඒකක සංකල්පය අනුව මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මූලස්ථාන ගොඩනැගිල්ලේ මහා මාර්ග අමාත්‍යාංශය සහ රාජ්‍ය අමාත්‍යාංශය භාවිතා කරනු ලබන වර්ග අඩි 72,400ක ප්‍රමාණය සඳහා ආසන්න වශයෙන් ප්‍රාග්ධනිත වී ඇති රු.මිලියන 684.49 ක් හා ඊට අදාළ වාර්ෂික ක්ෂය රු.මිලියන | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 අනුව හා ගිණුම්කරණ ඒකක සංකල්පය අනුව මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මූලස්ථාන ගොඩනැගිල්ලේ මහා මාර්ග අමාත්‍යාංශය සහ රාජ්‍ය අමාත්‍යාංශය භාවිතා කරනු ලබන වර්ග අඩි 72,400 ක ප්‍රමාණය එම | භාවිත ගොඩනැගිලි වෙනුවෙන් කුලී ගෙවීමට භාණ්ඩාගාර ප්‍රතිපාදන ලැබී නොමැත. රේඛීය සහ රාජ්‍ය අමාත්‍යාංශ භාවිතා කරන අනෙකුත් වත්කම් සමඟ මෙම ගොඩනැගිලි කොටස ද භාර දීමට කටයුතු කරමින් පවතී. | මහා මාර්ග අමාත්‍යාංශය සහ රාජ්‍ය අමාත්‍යාංශය භාවිතා කරනු ලබන මෙම ගොඩනැගිලි කොටස ද අමාත්‍යාංශයන්ට බාරදීමට කටයුතු කරමින් පවතී නමුත් ක්‍රියාවලිය අවසානයකට පැමින නැත. අමාත්‍යාංශය විසින් |

| | | | | |
|---|---|---|---|---|
| | 11.87 ක් සඳහා අවශ්‍ය ගැලපීම් කර නොතිබුණි. | ආයතනවලට පැවරීම හා පොදුකාර්ය වියදම් අනුපාතිකව විභජනය කළ යුතුය. | | භාවිතා කරනු ලබන ගොඩනැගිලි කොටස් පවරා ගැනීම සහ එහි නඩත්තු වියදම් දැරීම සම්බන්ධයෙන් මහා මාර්ග අමාත්‍යාංශය විසින් මුදල් අමාත්‍යාංශයෙන් උපදෙස් ඉල්ලා ඇත. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 ප්‍රකාරව මහාමාර්ග වැඩිදියුණු කිරීමේදි , පුළුල් කිරීමේ දී රු.මිලියන 51,262ක් වූ ඉඩම් පිළිබඳ වත්කම් ලේඛණයේ එම ඉඩම්වල වටිනාකම වෙන්ව දක්වා නොතිබුණි. මෙම ඉඩම් වටිනාකම මහාමාර්ග ක්ෂය කරනු ලබන අනුපාතයන් යටතේ ක්ෂය කර තිබුණි. | මහාමාර්ග වැඩිදියුණු කිරීමේදි,පුළුල් කිරීමේදී අත්පත් කරගත් ඉඩම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 ප්‍රකාරව වෙන්ව හඳුනාගත යුතුය. | මේ සම්බන්ධයෙන් කරුණු පරීක්ෂා කරමින් පවතින අතර, ඉදිරියේදී අවශ්‍ය ගැලපුම් සිදු කෙරේ. එමෙන්ම වත්කම් ලේඛනයේ එම ඉඩම්වල වටිනාකම, මාර්ග යටතේ වෙන් වෙන්ව සඳහන් කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | 2021 වර්ෂයේදීද නිරීක්ෂණ තත්ත්වය එලෙසම පවතී. |
| (ඈ) | පිළිවෙලින් අධිකාරියට අයත් පිරිවැය රු. මිලියන 1,723ක් වූ වාහන 426ක් හා පිරිවැය රු.මිලියන 179ක් වූ ගොඩනැගිලි 2020 ජනවාරි 01 දින වන විට සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබූ අතර ඉන් වාහන 258ක් පමණක් ප්‍රත්‍යාගණනය කර තිබුණි. එසේ වුවත් රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ප්‍රකාරව එම වත්කම් පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය අනාවරණයන් කර නොතිබුණු අතර රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව එම | අධිකාරියට අයත් සියලු වාහන, ගොඩනැගිලි ඇතුළු සියලු වත්කම් වර්තමාන සාධාරණ වටිනාකමට මූල්‍ය ප්‍රකාශණවල නිරූපණය කල යුතුය. | වාහන 285 ක් 2021 වර්ෂයේ දී ප්‍රත්‍යාගණය කර ඇති අතර ඉතිරි වාහන ප්‍රත්‍යාගණය ආරම්භ වී ඇත. සියලු ම පළාත් ආවරණය වන පරිදි ගොඩනැගිලි තක්සේරු කිරීම තක්සේරු දෙපාර්තමේන්තුවට යවා ඇති නමුත්, කොවිඩ්-19 තත්ත්වය නිසා ප්‍රමාද වී ඇත. ක්‍රියාකාරි සැලැස්මට අනුව 2023 වන විට සියළුම ගොඩනැගිලි ප්‍රත්‍යාගණය කර ගිණුම්ගත කිරීමට නියමිතය. | වාහන 109 ක ප්‍රත්‍යාගණන කටයුතු අවසන් කර ඇත. ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කටයුතු සිදු කරමින් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | වත්කම්වල ඵලදායී ජීවිත කාලය පිළිබඳව වූ ඇස්තමේන්තුගත දෝෂය නිවැරදි කර නොතිබුණි. | | | |
| (ඉ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ට අනුව, මාර්ග සංවර්ධන අධිකාරියට සෘජු ප්‍රතිලාභ නොලැබෙන තෙලහපාත පොලීසිය වෙනුවෙන් ඉදිකර තිබූ ගොඩනැගිල්ලේ පිරිවැය වූ රු.මිලියන 80.8 ක් හා එකී ගොඩනැගිල්ලේ වාර්ෂික ක්ෂය රු.මිලියන 4.04 ක් අධිකාරියේ ගිණුම්වල දිගින් දිගටම නිරූපණය කරමින් තිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ට අනුව, මාර්ග සංවර්ධන අධිකාරියට සෘජු ප්‍රතිලාභ නොලැබෙන තෙලහපාත පොලිසිය වෙනුවෙන් ඉදිකර තිබූ ගොඩනැගිල්ලේ පිරිවැය හා ක්ෂය මූල්‍ය ප්‍රකාශණ වලින් ඉවත්කල යුතුය. | අධිවේගී මාර්ග පොලිස් කොට්ඨාශය එම මාර්ග වල මෙහෙයුම් සඳහා සෘජුවම සම්බන්ධ වීමෙන් මාර්ගය භාවිතා කරන්නන්ගේ ආරක්ෂාව සහ පහසුව සලසයි. ඔවුන් බාහිර කටයුතු වලට සම්බන්ධ නොවන නිසා සහ රථ වාහන පාලනය තුළින් අධිකාරියට සෘජු ප්‍රතිලාභ ලැබෙන නිසා මෙම ගොඩනැගිල්ල අධිකාරියේ වත්කම් ලෙස සැලකීම ගිණුම්කරණ ප්‍රමිත වලට අදාළය. | 2021 වර්ෂයේදීද නිරීක්ෂණ තත්ත්වය එලෙසම පවතී. |
| (ඊ) | මාර්ග සංවර්ධන අධිකාරියේ නිත්‍ය විෂය පථයට පරිබාහිරව දේශීය බැංකු අරමුදල් හා ග්‍රාමීය මාර්ග ව්‍යාපෘති ඒකකය මඟින් ක්‍රියාත්මක කරන කිලෝමීටර් 100,000 ක විකල්ප මාර්ග පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ 2020 වර්ෂයේ දී අර්ධ වශයෙන් නිමකළ ජාතික මහා මාර්ග වලට අයත් නොවන මාර්ග වෙනුවෙන් රු.මිලියන 11,242 ක් වත්කම් වශයෙන් හඳුනාගෙන තිබූ අතර, ඒවා පූර්ණ වශයෙන් නිමකිරීමෙන් අනතුරුව වියදම් සේ ලියාහරින | අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්තියද ඇතුළු විස්තරාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තියක් සකස් කර මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කිරීමට කටයුතු කල යුතුව තිබුණි. | අදහස් දක්වා නැත. | 2021 වර්ෂයේදීද නිරීක්ෂණ තත්ත්වය එලෙසම පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | බව පමණක් මූලා ප්‍රකාශන සමඟ වූ සටහන් වලින් හෙළිදරව් කර තිබුණි. කෙසේ නමුත් මෙකී මාර්ග අදාළ හිමි ආයතනයකට භාර දීමෙන් අනතුරුව ඊට සමගාමීව සිදු කළ යුතු ගැලපීම්වලට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති සකස් කර නොතිබුණි. | | | |
| (උ) | මාර්ග සංවර්ධන අධිකාරිය වෙත පිටත වටරවුම් පාර අදියර II ව්‍යාපෘතියෙන් පවරා තිබුණු අක්කර 11 ක් වූ ඉඩම් කැබලි 07 ක් තක්සේරු කර මූලා ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි. | අදාළ ඉඩම් තක්සේරුකර කර මූලා ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කල යුතුය. | ඉඩම් කැබිලි 07 න් 03 ක මේ වන විට ප්‍රතිස්ථාපනය කිරීම් කර ඇත. ඉතිරි ඉඩම් පිළිබඳ තොරතුරු ලද පසු අවශ්‍ය ගැලපුම් ඉදිරියේදී සිදු කෙරේ. | 2021 වර්ෂයේදීද නිරීක්ෂණ තත්ත්වය එලෙසම පවතී. |
| (ඌ) | 2020 වර්ෂයේදී වසා දමන ලද පාදෙනිය - අනුරාධපුර මාර්ග ව්‍යාපෘතිය, රාජගිරිය පොල්ගහවෙල සහ ගනේමුල්ල ගුවන් පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය සහ ප්‍රාදේශිය පාලම් ව්‍යාපෘතිය අදියර II යන ව්‍යාපෘති වලින් අධිකාරිය වෙත පවරා තිබූ පිළිවෙලින් රු. මිලියන 9.6 ක් රු.මිලියන 27 ක් සහ රු.මිලියන 9.9 ක් ලෙස එකතුව රු.මිලියන 46.5 ක් වූ වගකීම්, අධිකාරිය විසින් තම ගිණුම් වල ගලපා නොතිබුණි. | අත්හැරීම් දෝෂ අවමකර ගැනීම සඳහා අභ්‍යන්තර පාලනය ශක්තිමත් කළ යුතුය. | අවශ්‍ය ගැලපුම් ඉදිරියේදී සිදු කෙරේ. | පාදෙනිය - අනුරාධපුර මාර්ග ව්‍යාපෘතියට අදාළ රු. මිලියන 9.6 තොරතුරු පරීක්ෂා කරමින් පවතී. |
| (එ) | අධිවේගී මාර්ග ඉදිකිරීම සඳහා 2020 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.මිලියන 606,419 ක් අධිකාරියේ වත්කම් වලට ගෙන | අදාළ වටිනාකම අධිකාරියට ප්‍රදානයක් ලෙස ගැනීම සඳහා අධිකාරිය ලබාදෙන | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී ඇත. | 2021 වර්ෂයේදීද නිරීක්ෂණ තත්ත්වය එලෙසම පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | රාජ්‍ය ප්‍රදාන ගිණුමට බැර කර තිබූ නමුත් එම මුදල් රාජ්‍ය ප්‍රදාන වටිනාකම හා පිරිවැය ගිණුම්ගත කිරීමට පදනම්වූ උපයෝගී ලියවිලි විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණු බැවින් අදාළ ගිණුම්ගත වීමෙන් නිරූපනය වන මාර්ග පිරිවැය හා රාජ්‍ය ප්‍රදානවල නිවැරදිතාවය තීරණය කිරීමට නොහැකි විය. මේ සම්බන්ධයෙන් 2018 සහ 2019 වර්ෂ වල විගණකාධිපති වාර්තා වලින් ද පෙන්වා දී තිබුණි. | ප්‍රමාණවත් ලිඛිත සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් කිරීම හා එම සාක්ෂි මත පිහිටා අදාළ ප්‍රදාන ගිණුගත කිරීම. | | |
| (ඒ) | කොළඹ කටුනායක අධිවේගී මාර්ගයේ සිදු වූ හදිසි අනතුරකින් අධිවේගී මාර්ගයට සිදු වූ අලාභය වූ රු.මිලියන 06 ක් ද ඇතුලුව අධිවේගී මාර්ග මෙහෙයුම් හා නඩත්තු හා කළමනාකරණ අංශයේ හදිසි අනතුරු අලාභ රු.මිලියන 10.3 ක් අය වී නොතිබුණි.තවද හදිසි අනතුරු නිසා අධිවේගි මාර්ග වලට සිදු වූ හානි වෙනුවෙන් අයකර ගත යුතුව තිබුණු රු.මිලියන 4.6 ක් ගිණුම්ගත කිරීමට පියවර ගෙන නොතිබුණි. | අදාළ අයවිය යුතු මුදල් වහාම අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගැනීම සහ අනතුරකින් අධිවේගී මාර්ගයට සිදු වූ අලාභය ඇස්තමේන්තු ක්‍රියාදාමය විධිමත් කිරීමට සම්මතයන් හඳුන්වා දීමට හා අත්හැරීම් දෝෂ අවමකර ගැනීම සඳහා අභ්‍යන්තර පාලනය ශක්තිමත් කළ යුතුය. | සිදු වූ අනතුරු කිහිපයක් සම්බන්ධයෙන් නීතිමය ක්‍රියා මාර්ග ගෙන ඇති අතර අවශ්‍ය ගැලපුම් ඉදිරියේදී සිදු කෙරේ. | තවදුරටත් අයවිය යුතු මුදල රු. මිලියන 10.2 කි. |
| (ඔ) | 2018 සහ 2019 වර්ෂවල වටිනාකම් ද ඇතුළුව 2020 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ණයගැතියන් යටතේ වූ රු.මිලියන 16,128 ක | අදාළ මුදල් අයකර ගැනීමට කටයුතු කල යුතුය. | අය වීමට ඇති ශේෂයන් කිහිපයක් සම්බන්ධයෙන් සැසඳීම් කරමින් පවතින අතර තවත් ශේෂයන් කිහිපයක් පියවීම සඳහා ප්‍රතිපාදන ලැබී ඇත. | රු. මිලියන 502 කට අදාළ ප්‍රතිපාදන හා අක් මුදල් ලැබී ඇත. ආයෝජන මණ්ඩලය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය |

| | | | | |
|---|---|---|---|---|
| | වටිනාකම තුල දකුණු පළාතෙහි සිදුකරන ලද ව්‍යාපෘති වෙනුවෙන් අධිකාරිය වෙත ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය, ආයෝජන මණ්ඩලය, සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය සහ හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙතින් රු.මිලියන 1,073ක් අයවීමට තිබුණි. | | ආයෝජන මණ්ඩලයේ ශේෂය සම්බන්ධයෙන් මේ වන තෙක් මුදල් ලැබී නොමැත. | හම්බන්තොට මහින් ලැබිය යුතු මුදල් තවදුරටත් අය වී නොමැත. |
| (ඕ) | මාර්ග සංවර්ධන අධිකාරියේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනයේ සඳහන් වූ සේවාදායක තැන්පතු ශේෂය රු.මිලියන 3,334.9ක් විය. මෙකී ශේෂය තුළ වූ වසර 2 -4 අතර නිරවුල් නොවී පවතින ශේෂය රු.මිලියන 1,735.26ක් විය. | සේවාදායක තැන්පතු තුළ කෙරීගෙන යන ශේෂ පමණක් ඉතිරිවන ලෙස සෙසු ශේෂයන් ආදායමට ගත යුතුය. | නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු ඉදිරියේ දී සිදු කරනු ලැබේ. | වසර 2-4 අතර තවදුරටත් රු.මිලියන 1,641.74 ක් නිරවුල් නොවී පවතී. |
| (ක) | 2018 වර්ෂයේ අධිකාරියේ ජංගම හා ජංගම නොවන වගකීම් යටතේ දක්වා ඇති රු.මිලියන 1,877 ක් වූ රඳවාගත් මුදල් පිළිවෙලින් වර්ෂ 03 සිට 04, වර්ෂ 04 සිට 05 සහ වර්ෂ 05 ඉක්ම වූ ඒවා වූ අතර ඒවායේ වටිනාකම පිළිවෙලින් රු.මිලියන 405, 224, 406 වශයෙන් විය. කෙසේවුවද, මේ සඳහා කොන්ත්‍රාත්කරු ඉල්ලීම් නොකිරීම, කිසිඳු හේතුවක් දක්වා නොමැතිව තවදුරටත් තබා ගන්නා රඳවා ගැනීමේ මුදල් රු.මිලියන 629 ක් විය. | අදාළ රඳවාගත් මුදල් ශේෂ සමාලෝචනය කර නිරවුල් නොවී පවතින හේතු අනුව සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට. | කළමනාකරණය අදහස් දක්වා නොමැත. | රු.මිලියන 508.51ක් සම්බන්ධව තවදුරටත් ක්‍රියාමාර්ග ගත යුතුව ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| (ග) | මුදල් රෙගුලාසි අංක 570ට අනුව මාර්ග සංවර්ධන අධිකාරියේ වගකීම් කාලය ඉක්මවූ රඳවා ගත් තැන්පතු රු.මිලියන 1,010.17 ක්, කාර්යභාරය නිමවා තිබුණු සේවාදායක තැන්පතු රු. මිලියන 1,190.24 ක් හා වෙනත් තැන්පතු රු.මිලියන 361.22 ක් අධිකාරියේ ආදායමට ගෙන නොතිබූ අතර තවත් රු.මිලියන 291.41 ක් වූ රඳවාගත් තැන්පතු ද ආදායමට ගතහැකි ව තිබුණද එසේ ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වගකීම් කාලය ඉක්මවූ රඳවා ගත් තැන්පතු, කාර්යභාරය නිමවූ සේවාදායක තැන්පතු මු.රෙ .570 ප්‍රකාරව ආදායමට ගැනීමට කටයුතු කිරීම. | කල් ඉකුත්වූ රඳවාගත් මුදල් පිළිබඳ පුළුල් විශ්ලේෂණයකින් පසු එම මුදල් අධිකාරියේ අදායමට ගැනීමට අවශ්‍ය කටයුතු කරමින් පවතින අතර, ඒ පිළිබඳව සියලුම පළාත් අධ්‍යක්ෂවරුන් / ප්‍රධාන ඉංජිනේරුවරුන් දැනුවත් කරන ලදී. | දීර්ඝ කාලීන රැඳවුම් මුදල් රුපියල් මිලියන 104.08 ක්, 2019 සිට 2021 වසර දක්වා කාලය තුලදී ආදායමට බැර කිරීමට කටයුතු කර ඇත.<br>දීර්ඝ කාලීන වෙනත් තැන්පතු මුදල් රුපියල් මිලියන 25.1 ක්, 2019 සිට 2021 වසර දක්වා කාලය තුලදී ආදායමට බැර කිරීමට කටයුතු කර ඇත. |
| (ච) | මුදල් රෙගුලාසි අංක 763ට අනුව විශාල ප්‍රමාණයෙන් තොග තබා ගන්නා විට පවත්වාගෙන යා යුතු ගබඩා ව්‍යවස්ථා හා ක්‍රියාපටිපාටි අධිකාරිය විසින් සකස් කර නොතිබූ අතර ශේෂ පත්‍ර දිනට වූ තොගය රු. මිලියන 760.30ක් විය. | ගබඩා ව්‍යවස්ථා හා ක්‍රියාපටිපාටි අධිකාරිය විසින් සකස් කල යුතුය. | අවශ්‍ය දැනුවත් කිරීම් කිරීමට චක්‍රලේඛයක් නිකුත් කරනු ලැබේ. | 2021 වර්ෂයේදීද නිරීක්ෂණ තත්ත්වය වෙනසක් සිදුව නොමැත. |
| (ඡ) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 01 හා 05වන වගන්ති අනුව අධිකාරිය විසින් මානව සම්පත් සංවර්ධනය කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණ අතර කාර්ය මණ්ඩලය සඳහා වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කිරීමට හෝ කාර්යසාධනය ඇගයීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීමට කටයුතු කර නොතිබුණි. | කාර්ය මණ්ඩලය සඳහා වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කිරීම, කාර්ය සාධනය ඇගයීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීම හා මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කිරීම කල යුතුය. | මේ පිළිබඳව ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | 2021 වර්ෂයේදීද නිරීක්ෂණ තත්ත්වය වෙනසක් සිදුව නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| (ට) | 2003 ජුනි 02 දිනැති අංක PED 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.3.1 වගන්තිය අනුව මාර්ග සංවර්ධන අධිකාරිය විසින් බඳවාගැනීමේ පටිපාටියක් පිළියෙල කර අනුමත කරවා ගෙන නොතිබුණි. | තවදුරටත් කල් ප්‍රමාද නොකර බඳවාගැනීමේ පටිපාටියක් පිළියෙල කර අනුමත කරවා ගැනීමට කටයුතු කල යුතුය. | දැනට පරිපාලන ක්ෂේත්‍රය පිළිබඳ දැනුමක් ඇති උපදේශකවරියක් පත්කර ඇති අතර කාර්යය මණ්ඩල දර්ශකය සම්බන්ධ කෙටුම්පත් වාර්තාව කළමණාකාරීත්වය වෙත මේ වන විට ඉදිරිපත් කර ඇත. එය අනුමත වූ වහාම බඳවා ගැනීමේ පටිපාටිය සකස් කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. | බඳවාගැනීමේ පටිපාටිය කෙටුම්පත්කර අති නමුත් අනුමත කර ගැනීමට කටයුතු කර නැත. |
| (ත) | 2009 ජුනි 01 දිනැති අංක 30(I) දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ හා2006 සැප්තැම්බර් 22 දිනැති අංක 30 දරණ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ නියමයන්ට හා මාර්ගෝපදේශයන්ට අනුව සකස් කරන ලද බඳවා ගැනීමේ හා උසස් කිරීම් පරිපාටියක් සකසා ගැනීමට යටත්ව එම දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර තිබුණු කාර්යමණ්ඩල ප්‍රතිව්‍යුහගතකරණ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබා දී තිබුණි. එසේ වුවත් එකී නියමයන් නොසලකා හැර අධ්‍යක්ෂ මණ්ඩල තීරණමත උසස් වීම් ලබා දී අනුමත නොකරන ලද වැටුප් පරිමාණයන් මත නව | අධිකාරියේ බඳවාගැනීමේ පටිපාටිය කඩිනමින් අනුමත කරවා ගැනීම, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ නියමයන්ට පරිබාහිර ගෙවීම් නිවැරදි කිරීම හා වැඩිපුර ගෙවීම් සම්බන්ධව කටයුතුකල නිලධාරීන්ගෙන් අදාළ මුදල් අයකර ගත යුතුය. | 2005 වසර දක්වා බඳවා ගැනීමේ පරිපාටිය අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ක්‍රියාත්මක කර ඇත. නව බඳවා ගැනීමේ පරිපාටිය මෙතෙක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කර නැත. ඒ අනුව, සියලුම බඳවා ගැනීම් හා උසස් වීම් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත සිදු කර ඇත. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමත වැටුප් කේතයන් වලින් පරිබාහිර උසස් වීම් ලබා දීම අත්හිටුවා ඇත. | පසු කාලීනව සිදුකරන ලද පත්කිරීම් සම්බන්ධව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමත වැටුප් තල ලබා දී ඇත. නමුත්, මෙම නිරීක්ෂණයට අදාළ කරුණු නොවෙනස්ව පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | තනතුරු සඳහා වැටුප් පියවර ලබා දී තිබුණි. මේ අනුව, අනුමත කළ වැටුප්තල ඉක්මවා ඉහළ වැටුප්තල ආදේශ කිරීම හේතුවෙන් 2020 වර්ෂයේ දී පමණක් අධිකාරිය වැඩි පුර ගෙවා තිබූ වැටුප ආසන්න වශයෙන් රු.මිලියන 157 කි. | | | |
| (ද) | 2019 මාර්තු 15 දිනැති අංක 1/2019 දරණ කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 2.3.3(a),(b) වගන්ති අනුව සේවකයන් ව්‍යාපෘති වෙත මුදා හැරිය හැකි කාලය වර්ෂ 05 නොඉක්ම විය යුතු වුවත් එසේ මුදාහැර තිබූ ස්ථිර කාර්ය මණ්ඩලයේ සේවකයින් 477 දෙනෙකුගෙන් 306 ක් ම ව්‍යාපෘති වලට මුදා හැර වර්ෂ 05 ක කාලයක් ඉක්මවා තිබුණි. | සේවකයන් ව්‍යාපෘති වෙත මුදා හැරීමේ දී සැමට සාධාරණ ඉඩ ප්‍රස්ථා සැලසෙන පරිදි කටයුතු කල යුතු අතර චක්‍රලේඛයන්ට අනුගත විය යුතුය. | දැනට වාර්ෂික ස්ථාන මාරුවීම් වලට අමතරව අනිවාර්යය මාරු කිරීම් සිදු කිරීමට කළමණාකාරීත්වය තීරණය කර ඇත. ඒ අනුව පසුගිය කාලය තුලදී සමහර ප්‍රාදේශීය කාර්යාලවල අනිවාර්යය මාරු කිරීම් ක්‍රියාත්මක කිරීම සිදුකර ඇත. ව්‍යාපෘතිවල සේවයේ නියුතු නිලධාරීන්ටද මෙම අනිවාර්යය මාරු කිරීම් ක්‍රියාත්මක කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | 2021 වර්ෂය අවසානය දක්වාම නිරීක්ෂණ තත්ත්වයේ වෙනසක් සිදුව නොමැත. |
| (න) | 2006 ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (අ), (ආ), සහ (ඉ) වගන්තීන් සහ 4.2.2 (අ) වගන්ති අනුව අවම වශයෙන් වර්ෂ 03 ක කාලයක් සඳහා සකස් කර මාස 06 කට වැඩි නොවන කාලයක් තුළ නිතිපතා යාවත්කාලීන කළ යුතු ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් හා ප්‍රසම්පාදන ක්‍රියාවන්හි පියවර ක්‍රමානුකූලව විස්තර කෙරෙන ප්‍රසම්පාදන කාල සටහනක් | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාර ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් හා ප්‍රසම්පාදන කාල සටහනක් සකස්කල යුතුය. | මේ සම්බන්ධව ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | 2021 දෙසැම්බර් 31 දින දක්වා අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත්ව නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සකස් කර නොතිබුණි. | | | |
| (ප) | 2006 ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1 (අ), 5.3.3 සහ 7.8.4 (ඉ) යන වගන්ති අනුව අධිකාරිය විසින් 2020 වර්ෂයේදී සිදුකර තිබූ ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන 463 ක් වූ ටිපර් රථ සේවාව ලබා ගැනීම, කළු ගල් මිලදී ගැනීම, තාප සුවිකාර්ය ද්‍රව්‍ය මිලදී ගැනීම සහ බිටුමින්ස් ඉමල්ෂන් මිලදී ගැනීමට අදාළ ප්‍රසම්පාදනයන් සම්බන්ධයෙන් විධිමත් මුළු පිරිවැය ඇස්තමේන්තු සකස් නොකිරීම, ලංසු ලේඛන වල ප්‍රසම්පාදනයේ අවශ්‍යතාවය පුළුල් ලෙස විස්තර නොකිරීම සහ සාරානුකූලව ප්‍රතිචාර දක්වා නොමැති ලංසු ඇගයීමට ලක් කිරීම යනාදිය සිදුකර තිබුණි. | ප්‍රසම්පාදනයන් සම්බන්ධයෙන් විධිමත් මුළු පිරිවැය ඇස්තමේන්තු සකස් කිරීමට, ලංසු ලේඛන වල ප්‍රසම්පාදනයේ අවශ්‍යතාවය පුළුල් ලෙස විස්තර කිරීමට සහ සාරානුකූලව ප්‍රතිචාර දක්වා නොමැති ලංසු ඇගයීමට ලක් නොකිරීමට කටයුතු කිරීම. | ඇස්තමේන්තු සඳහා මේ වන විට අනුමැතිය ලබා ගෙන ඇත. ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්හි සඳහන් පරිදි ඉදිරියේ දී ලංසු ඇගයීමට ලක් කෙරේ. | 2021 දෙසැම්බර් 31 දක්වාම නිවැරදි කිරීම් සිදු කර ඇති බව වාර්තා කර ඇත. |
| (බ) | 2006 ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.8.1 ආ වගන්තිය අනුව අසාර්ථක වූ ලංසුකරුවන් වෙත එම ලංසු අසාර්ථක වීමට බලපාන හේතු ද සහිතව දැනුම්දිය යුතු වුවත් ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් එවැනි දැනුම් දිමක් සිදුකර නොතිබුණි. | අසාර්ථක වූ ලංසුකරුවන් වෙත එම ලංසු අසාර්ථක වීමට බලපාන හේතු ද සහිතව දැනුම්දිය යුතුය. | වාචිකව පැහැදිලි කිරීම් සිදු කර ඇතත්, ලිඛිතව දැනුම් දීම ඉදිරියේදී සිදු කරනු ලැබේ. | ලිඛිතව දැනුම් දීමට කටයුතු කර නොතිබුණි. |
| (ම) | අධිවේගී මාර්ග මෙහෙයුම් ආරම්භ වූ දින සිට 2020 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට | අධිවේගී මාර්ග අදායම වියදම් කිරීම සම්බන්ධයෙන් | අධිවේගී මාර්ග වලින් එකතුකර ගත් ආදායමෙන් රු. මිලියන 1,500 ක් | 2021 වර්ෂයේදීද නිවැරදි කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | අධිවේගී මාර්ග වලින් එකතු කරගත් රු.මිලියන 52,056ක ආදායමෙන්, 2008 අංක 40 දරන ජාතික මංමාවත් පනතේ 13 හා 14 වැනි වගන්ති සහ 2011 නොවැම්බර් 18 දිනැති අංක 1732/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ 07 ඡේදයේ සඳහන් නියමයන්ට පටහැනිව රු.මිලියන 15,000 කට ආසන්න මුදලක් එනම්, ආදායමෙන් සියයට 30 ක් පමණ ස්ථාවර තැන්පතු හා භාන්ඩාගාරයට ප්‍රේෂණ ලෙස ලබා දී තිබූ අතර ඉතිරි සියයට 70 ක් වූ මුදල අධිවේගී මාර්ග නඩත්තු කටයුතු වලට හා යථෝක්ත ගැසට් පත්‍රයේ නියමයන්ට පරිබාහිර වන අධිකාරියේ පොදු වියදම්,වැටුප් ගෙවීම් හා ව්‍යාපෘති වලට ගෙවීම් සඳහා සහ පොලිස් දෙපාර්තමේන්තුවේ නිළධාරීන්ට පහසුකම් සැපයීම සඳහා වැයකර තිබුණි.එසේම 2018 සහ 2019 වර්ෂ වලදී ද පිළිවෙළින් රු.මිලියන 24,379 ක් සහ රු.මිලියන 15,657ක් මේ අයුරින් දරා තිබුණි. | යථෝක්ත ගැසට් පත්‍රයේ නියමයන් අනුව කටයුතු කල යුතුය.තවද පොලිස් දෙපාර්තමේන්තුව වෙනුවෙන් දරණ වියදම් අත්‍යාවශ්‍ය වර්තන වියදම්වලට සීමාකල යුතුය. | මධ්‍යම අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු සඳහා ලංකා බැංකුවෙන් ලබා ගත් ණය මුදලේ ඇප තැන්පතු ලෙස තබා ඇත. භාණ්ඩාගාරයේ අය බදු ලෙස රු. මිලියන 4,000 ක් ලබා දී ඇත.<br><br>අධිවේගී මාර්ග වලින් ලැබෙන ආදායම මහා භාණ්ඩාගාරයේ අවසරය ඇතිව වැටුප් ගෙවීමේදී ඇති වන අරමුදල් ඌණතාවය සඳහා භාවිතා කරන ලදී. අධිවේගී මාර්ග වල මෙහෙයුම් හා නඩත්තු කටයුතු සඳහා වන වියදම් අධිවේගී මාර්ග ආදායමින් පියවා ගන්නා අතර පොලිස් කොට්ඨාශයේ රාජකාරි කටයුතු ඍජුවම අධිවේගී මාර්ගයේ මෙහෙයුම් කටයුත්තක් වන බැවින් එම වියදම ද අධිවේගී මාර්ග ආදායමින් දරා ඇත. | |
| (ය) | 2008 අංක 40 දරන ජාතික මංමාවත් පනතේ 4(3) වගන්තිය අනුව ‘‘ඒකාබද්ධ මාර්ග පද්ධති සංවර්ධනය සහ නඩත්තුව සඳහා ක්‍රියාකාරී සැලැස්මක්’’ සකස් කර නොතිබුණි. | පනතේ අවශ්‍යතාවය ප්‍රකාරව ‘‘ඒකාබද්ධ මාර්ග පද්ධති සංවර්ධනය සහ නඩත්තුව සඳහා ක්‍රියාකාරී සැලැස්මක්’’ සකස්කල යුතුය. | කොවිඩ්-19 හේතුවෙන් මේ සම්බන්ධව කටයුතු කිරීමට අපහසු වී ඇත. දිස්ත්‍රික්ක සංවර්ධන කමිටු රැස්වීම් වල දී මෙම ක්‍රියාකාරි සැලැස්මෙන් සිදුවන කාර්යන්ට සමාන කාර්යක් ඉටු වේ. | 2021 වර්ෂයේදීද නිවැරදි කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ර) | 2008 අංක 40 දරන ජාතික මංමාවත් පනතේ 7(1) වගන්තිය "දිස්ත්‍රික් මාර්ග පද්ධති සංවර්ධන සම්බන්ධීකරණ කමිටු" පිහිටුවා නොතිබුණි. | පනතේ අවශ්‍යතාවය ප්‍රකාරව "දිස්ත්‍රික් මාර්ග පද්ධති සංවර්ධන සම්බන්ධීකරණ කමිටු" පිහිටු විය යුතුය. | කොවිඩ්-19 හේතුවෙන් මේ සම්බන්ධව කටයුතු කිරීමට අපහසු වී ඇත. දිස්ත්‍රික්ක සම්බන්ධීකරණ කමිටු රැස්වීම් වල දී මාර්ග සංවර්ධනය හා නඩත්තු සම්බන්ධව වන කරුණු මාර්ග සංවර්ධන අධිකාරිය වාර්තා කරනු ලැබේ. | පනත ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ළ) | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4ට අනුකූල නොවන ලෙස ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශයට ලබාදී තිබූ සියයට 50 ක අත්තිකාරම් මුදලින් කොන්ත්‍රාත් වැඩ අවසන් නොවීම නිසා රු. මිලියන 3.86 ක් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | අධිකාරියට අය විය යුතු මුදල් අයකර ගැනීමට හෝ පවරන ලද කාර්යය ඉටුකරවා ගැනීමට අධිකාරියේ අධීක්ෂණ ක්‍රියාවලිය ශක්තිමත් කල යුතුය. | නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අයකර ගත යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ව) | මාර්ග සංවර්ධන අධිකාරිය විසින් පෞද්ගලික සමාගමක් වෙත බදු දී තිබූ පර්චස් 81.8 ක මාර්ග රක්ෂිතයට අදාළව නියමිත පරිදි බදු මුදල් අය කර නොගැනීම සහ හිඟ බදු කපාහැරීම නිසා අධිකාරියට සිදුව තිබූ මූල්‍ය අලාභය රු.මිලියන 8.2 ක් විය. | අධිකාරියට අයත් වත්කම් වලින් උපරිම ආර්ථික වාසි ගෙනදෙන පරිදි වත්කම් කළමණාකරණය කල යුතුය. | වත්කම් කළමනාකරණ හා ආදායම් අංශයේ ගාස්තු කමිටුව විසින් හිඟ බදු මුදල් කපා හැරීම සඳහා කල නිර්දේශයන්ට අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලැබී ඇත. කිසිදු ආදායමක් නොලද ඉඩමක් බදු දීම තුලින් අධිකාරියට මූල්‍ය වාසියක් ලැබී ඇත. | අලාභය පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ස) | අධිකාරිය විසින් මිලදී ගන්නා වත්කම් සම්බන්ධයෙන් ඇණවුම නිකුත් කරන අවස්ථාවේ සිට එම වත්කම් ඉවත්කරන අවස්ථාව දක්වාත්, ගොඩනගන වත්කම් | වත්කම් කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කළ යුතුය. | මේ සම්බන්ධයෙන් ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | 2021 වර්ෂයේදීද වත්කම් කළමනාකරණ පද්ධතියක් ස්ථාපනය කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | සම්බන්ධයෙන් කෙරීගෙන යන වැඩ වල සිට ප්‍රාග්ධනිත කිරීම දක්වාත් අවශ්‍ය කරන නියාමනයන් සිදුකිරීම පිණිස වත්කම් කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි. | | | |
| (හ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ ප්‍රතිපාදන වලට පටහැනිව උතුරු අධිවේගී මාර්ගයේ චීන මෙට්‍රොලොජිකල් සමාගමේ සිදුවී තිබූ වියදම් ප්‍රතිපූර්ණය කිරීම සඳහා මධ්‍යම අධිවේගී මාර්ගයේ පළමු අදියරේ ඉදිකිරීම් කටයුතු රු.මිලියන 158,386කට එම සමාගමට ප්‍රදානය කර තිබුණි. එමෙන්ම මාර්ග සංවර්ධන අධිකාරිය අරමුදල් සපයන ආයතනයක් නොමැතිව 2016 අගෝස්තු 18 දින අදාළ සමාගම සමඟ ඉදිකිරීමේ ගිවිසුමකට එළඹී තිබුණි. තවද ගිවිසුමේ පාර්ශවකරුවන්ගේ අයිතිවාසිකම් හා බැදීම් චීන නීතියට අනුකූලවීම සම්බන්ධයෙන් 2018 ඔක්තෝබර් 02 දින නීතිපතිවරයා විසින් යෝජනා කර තිබූ සංශෝධනද එම ගිවිසුමට එළඹීමේ දී සමාගම විසින් පිළිගෙන නොතිබුණි. තවද කොන්ත්‍රාත්කරු විසින් දැරිය යුතු වෘත්තීය වන්දි රක්ෂණය සඳහා පැකේජ 1 සහ 2 යටතේ පිළිවෙලින් රු.මිලියන | ව්‍යාපෘති මනාව සැලසුම් කිරීම හා අරමුදල් ලැබීම පිළිබඳ නිශ්චිතතාවයක් ඇතිකර ගැනීමෙන් අනතුරුව ව්‍යාපෘති ආරම්භ කල යුතුය.තවද සෑම විටම ව්‍යාපෘති ප්‍රදානයකදීම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ ප්‍රතිපාදනවලට අනුකූලව එය සිදුකිරීමට සහ ප්‍රමාන පත්‍ර සැකසීමේ දී උපරිම ආර්ථික වාසිය ප්‍රසම්පාදන අස්ථිත්වයට හිමිවන පරිදි ප්‍රමාන පත්‍ර සැකසීම. | අදාළ ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව මෙම මධ්‍යම අධිවේගී මාර්ගය 1 කොටස ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව පිරිනමා ඇති බව පිළිගත හැක.<br><br>මෙවැනි වියදමක් ප්‍රතිපූරණය කිරීම සඳහා අදාළ කොන්ත්‍රාත්කරු ලිඛිතව ඉල්ලීමක් සිදුකර නොමැති අතර ඒ සඳහා ගිවිසුමක්ද තිබී නොමැත. ඒ අතරම මෙම ව්‍යාපෘතියේ හෝ වෙනත් මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතියක අදාළ කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු බැරකමක් ගිණුම් ගත වී නොමැත.<br><br>තවද කොන්ත්‍රාත්කරු විසින් දැරිය යුතු වෘත්තීය වන්දි රක්ෂණය සඳහා පැකේජ 1 සහ 2 යටතේ පිළිවෙලින් රු.මිලියන 5 ක් සහ රු.මිලියන 83 ක් වැඩ ප්‍රමාණන පත්‍රයට වෙනම වැඩ අයිතමයක් ලෙස ඇතුළත් කර තිබුණි යන | මෙම ව්‍යාපෘතියට අදාල ණය මුදල එක්සිම් බැංකුව විසින් අනුමත කර තිබුණේ 2019 මාර්තු 22 දින වන අතර දැනට එම ණය මුදල් භාවිතා කර කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරන ලද රු. මිලියන 9,838.82ක අගයකින් යුතු බිල්පත්‍ර 11 ක් ගෙවීම සඳහා ලැබී ඇති අතර ඉන් පරීක්ෂාකර බිල්පත්‍ර 09ක් එම බැංකුව වෙත ඉදිරිපත් කර ඇත. ඒ අනුව මුලු ණය මුදල සමඟ සැසඳීමේදී 2022 ජනවාරි 31 දිනට ඉදිරිපත් වී ඇති බිල්පත්‍ර හා සැසඳීමේදී මූල්‍ය ප්‍රගතිය 6.2% ලෙස ගණනය කල හැක.<br><br>නීතිපතිවරයා විසින් ඉදිරිපත් කර ඇති සංශෝධන චීන ණය ගිවිසුමට ඇතුළත් කර |

| | | | | |
|---|---|---|---|---|
| | 5 ක් සහ රු.මිලියන 83 ක් වැඩ ප්‍රමාණන පත්‍රයට වෙනම වැඩ අයිතමයක් ලෙස ඇතුළත් කර තිබුණි. | | ප්‍රකාශය නිවැරදි වේ. | නොමැත.<br><br>කොන්ත්‍රාත්කරු විසින් දැරිය යුතු වෘත්තීය වන්දි රක්ෂණය වෙනම අයිතමයක් ලෙස ප්‍රමාණ පත්‍ර වලට එකතු කර තිබීම වැඩ ප්‍රමාණ පත්‍ර වලින් ඉවත් කර නොමැත. |
| (ෂ) | මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය සඳහා අරමුදල් ලැබීම පිළිබඳව නිශ්චිතතාවයක් නොතිබීම සහ දුර්වල මූලා සැලසුම්කරණය හේතුවෙන් ව්‍යාපෘතියේ මෙහෙයුම් ඒකකය සඳහා 2019 වර්ෂයේ දී රු.මිලියන 94.39 ක්ද උපෙද්ශන සේවා සඳහා රු.මිලියන 392.64 ක්ද නිශ්කාර්යව වැයකර තිබුණි. එමෙන්ම ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරුගේ භෞතික ප්‍රගතිය උපදේශක විසින් ඇගයීමට ලක් කිරීමකින් තොරව රු. මිලියන 449.02ක් ගෙවා තිබුණි. | ව්‍යාපෘති මනාව සැලසුම් කිරීම හා අරමුදල් ලැබීම පිළිබඳ නිශ්චිත තාවයක් ඇතිකර ගැනීමෙන් අනතුරුව ව්‍යාපෘති ආරම්භ කල යුතුය.තවද සෑම විටම ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරුගේ භෞතික ප්‍රගතිය උපදේශක විසින් ඇගයීමට ලක්කිරීමට පියවර ගැනීම. | අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද ව්‍යාපෘතියක් නම්, අරමුදල් ගිවිසුම අත්සන් කිරීමට පෙර ව්‍යාපෘති කළමනාකරණ ඒකකය ස්ථාපිත කළ හැකිය. මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘති කළමනාකරණ ඒකකය පිහිටුවන ලද්දේ කැබිනට් අනුමැතියෙන් මෙන්ම ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ අනුමැතියෙන් පසුවය.ව්‍යාපෘතිය සඳහා අරමුදල් වෙන් කිරීම සහතික කිරීම මහාභාණ්ඩාගාරයේ බාහිර සම්පත් දෙපාර්තමේන්තුවේ වගකීම වේ. | පදනමකින් තොරව සිදුකර ඇති ගෙවීම් නැවත ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (අ.අ) | මධ්‍යම අධිවේගී මාර්ගයේ ii කොටස සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා රු. මිලියන 30 ක දිරි දීමනා ගෙවා තිබුණද 2021 අගෝස්තු 10 දින වන විටත් එම | ප්‍රමාන පත්‍ර සැකසීමේ දී උපරිම ආර්ථික වාසිය අස්ථිත්වයට හිමිවන පරිදි ප්‍රමාන පත්‍ර සැකසීමට සහ ඉඩම් අත්පත් කර ගැනීමේ | ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා රු. මිලියන 30 ක දිරි දීමනා ගෙවා තිබුණද 2021 අගෝස්තු 10 දින වන විටත් එම කටයුතු අවසන් කර | 2021 දෙසැම්බර් 31 දින දක්වාම ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු නිමකර නොතිබුණි. ව්‍යාපෘතිය සඳහා අරමුදල් |

| | | | | |
|---|---|---|---|---|
| | කටයුතු අවසන් කර නොතිබුණි. 2016 මාර්තු 24 දිනැති අංක 1/2016 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛයට අනුව, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන අවස්ථාවේදී ව්‍යාපෘතිය සඳහා අරමුදල් ප්‍රදානය කරන ආයතනය සමඟ ගිවිසුමක් තිබිය යුතු නමුත්, එවැනි ගිවිසුමක් නොමැතිව වසර 05 කට ආසන්න කාලයක් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරමින් පැවතුණි. | ක්‍රියාවලිය කඩිනම් කොට වැඩබිම හැකි ඉක්මනින් නිශ්කාශනය කර දීම. | නැත. | ප්‍රධානය කරන ආයනය සමග ගිවිසුමක් අත්පත් කර නැත. |
| (අ.ආ) | ජාතික, ප්‍රාදේශීය හා ග්‍රාමීය වශයෙන් කිලෝ මීටර් 100,000 ක විකල්ප මාර්ග පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ සමාලෝචිත වර්ෂයේ දී කුරුණෑගල දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කර තිබුණු ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 2,743 ක් වූ ව්‍යාපෘති 61 ක ඇස්තමේන්තු වල සඳහන් වැඩ අයිතම 34 ක් මහා මාර්ග සඳහා වූ සම්මත අනුපාතයන්හි සඳහන් මිල රේටයන්ට වඩා වැඩියෙන් ඇස්තමේන්තු කිරීම, අසාමාන්‍ය ප්‍රමාණයකින් අපතයන් ඇස්තමේන්තු කිරීම, ද්‍රව්‍ය ප්‍රවාහන වියදම් අධි ඇස්තමේන්තු කිරීම සහ අවශ්‍යතාවය ඉක්මවා වියදම් ඇස්තමේන්තු කිරීම යන හේතූන් නිසා පරීක්ෂා කරන ලද මාර්ග ව්‍යාපෘතිවල ඇස්තමේන්තු ගත පිරිවැය රු.මිලියන 212.2 | මහාමාර්ග නොවන මාර්ග සඳහා සුදුසු පිරිවිතරයක් සකස් කිරීමට හා ඉදිකිරීම් සම්බන්ධ අධිකාරියේ අධීක්ෂණය විධිමත් කිරීම. | 2019 HSR මිල ගනන් අනුව සැකසූ ඇස්තමේන්තු පසුව සංශෝධනය කර ඇත. නැවත ප්‍රවාහනය භූවිශමතා කාලගුණ තත්ත්වය සැලකිල්ලට ගෙන අපතය සියයට10 ලෙස ඇස්තමේන්තු කළද පසුව තත්ත්වය පරීක්ෂා කර සියයට 5 දක්වා අඩු කර ඇස්තමේන්තු සංශෝධනය කර ඇත. අධිකාරියේ බලපත්‍ර සහිත අමුද්‍රව්‍ය සැපයුම් ස්ථාන මත පදනම්ව ඇස්තමේන්තු සකසා තිබුණද පසුව ඊට වඩා ලාභදායී ගුණාත්මක අමුද්‍රව්‍ය ලබා ගත හැකි නව ස්ථාන සැලකිල්ලට ගන්නා ලෙස උපදෙස් දී ඇත. | 2021 මාර්තු 29 දින රජයේ විගණන නිලධාරීන් ද හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම්ගේ ද සහභාගීත්වයෙන් සිදු කරන ලද සාකච්ඡාවෙහි ප්‍රතිඵලයක් ලෙස අධි ඇස්තමේන්තු සමාලෝචනය කර සංශෝධනය කළද මාර්ග දුර කි.මී. 16.27 ඇස්තමේන්තුව වූ රු.මිලියන 278.29 ක් සම්බන්ධ නිරීක්ෂණය එලෙසම පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | කින් අධිගණනය වී තිබුණි. එසේම, මාර්ග වල මුළු දුර කිලෝ මීටර් 16.27 ක් සහ ඇස්තමේන්තු වටිනාකම රු.මිලියන 278.29 ක් වූ මාර්ග 9 ක ABC ඇතිරීම නියමිත ප්‍රමිතියට සිදු කර නොතිබුණි. මෙකී තත්ත්වය මාර්ගයේ කල් පැවැත්මට සෘජුවම බලපාන අතර නිසි ප්‍රමිතියෙන් තොර ඉදිකිරීම් සඳහා කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීම් ද සිදු කර තිබුණි. | | | |
| (අ.ඇ) | මැතකදී සංවර්ධනය කර භාවිතයට ප්‍රමාණාත්මක සුදුසු තත්ත්වයෙන් තිබූ කිලෝ මීටර් 50.58 ක් නැවත සංවර්ධනය කිරීම සඳහා රු.මිලියන 923.91 ක් කිලෝ මීටර් 100,000 ක විකල්ප මාර්ග පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ නැවත ඇස්තමේන්තු කර පුනරුත්ථාපනය කර තිබුණි. | සංවර්ධනය සඳහා මාර්ග තෝරා ගැනීමේදී වඩාත් ප්‍රමුඛතාවය දිය යුතු මාර්ගම ඒ සඳහා තෝරාගෙන හිඟ සම්පත් කළමණාකරණය කරගත යුතුය. | අදාළ පලාත් පාලන ආයතන සම්බන්ධීකරණය කර ගැනීම තුලින් සංවර්ධනය කළ යුතු මාර්ග හඳුනාගන්නා අතර සංවර්ධනය කළ යුතු ආකාරය අධිකාරියේ ඉංජිනේරුවන් විසින් තීරණය කරණු ලැබේ. මෙම මාර්ග සංවර්ධනය කිරීමෙන් පසු අදාළ ආයතන වෙත භාරදෙන අතර ඒවා නඩත්තුවට අධිකාරියේ සහය ලබා දිය හැක. | හිඟ සම්පත් ප්‍රමුඛතාවය අනුව කළමනාකරණය කර ගැනීමේ වැඩපිළිවෙලක් සකස් කර නැත. |
| (අ.ඇ) | පෞද්ගලික කොන්ත්‍රාත් සමාගම් කිහිපයක් වෙත වර්ෂ 2013 දී ප්‍රදානය කර තිබූ රු.මිලියන 103.49 ක මාර්ග සහ පාලම් ඉදිකරීමේ කොන්ත්‍රාත් වැඩවල දුර්වල ප්‍රගතිය මත එම කොන්ත්‍රාත්තුව අත්හිටුවා තිබූ අතර, මෙයින් මාර්ග ඉදිකිරීම් | කොන්ත්‍රාත් ප්‍රදානයට පෙර කොන්ත්‍රාත්කරුවන්ගේ කාර්යය නිමකිරීමට ඇති හැකියාව මනාව හඳුනාගත යුතු අතර අපේක්ෂිත කාලය තුල කොන්ත්‍රාත්කරුගෙන් | මේ සඳහා වූ බේරුම්කරණ ක්‍රියාවලිය අතරමඟ නවතා ඇති අතර කොන්ත්‍රාත්කරුවන් සමඟ 2019, 2020 වර්ෂ තුළ ගිවිසුම් වලට එළඹ නැත. කාලය ඉක්මයාම මත නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට | 2022 වර්ෂය අවසානය දක්වාම මේ සම්බන්ධව ඵලදායි ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | අධිකාරියේ ඍජු ශ්‍රමය මත ඉදිකිරීම් වැඩ නිමකර තිබුණි. තවද, මෙම කොන්ත්‍රාත් සඳහා ලබා දී තිබූ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදලින් රු.මිලියන 7.58 ක් තවදුරටත් කොන්ත්‍රාත්කරුවන් අත රැඳී තිබුණි.<br>එසේම, තවත් පෞද්ගලික කොන්ත්‍රාත් සමාගමක් වෙත 2012 වර්ෂයේ ප්‍රදානය කර තිබූ රු.මිලියන 25.7 ක කොන්ත්‍රාත් 03 ක් සඳහා කොන්ත්‍රාත්කරු සමඟ ලිඛිත ගිවිසුමකට එළඹ නොතිබීම හා ලබා දී තිබූ කොන්ත්‍රාත් කාලපරිච්ඡේදය තුළ කොන්ත්‍රාත් වැඩ සම්පූර්ණ නොකර අතරමඟ නතර කර තිබීම හේතුවෙන් අයවිය යුතු වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ශේෂය රු.මිලියන 2.1 ක් විය. | කාර්යය නිම කරගත යුතු වේ.එමෙන්ම අපේක්ෂිත ප්‍රගතියක් නොමැති කොන්ත්‍රාත්කරුවන්ට නැවත කොන්ත්‍රාත් ප්‍රදානය නොකල යුතු අතර පවතින නීති ඒ සඳහා ප්‍රමාණවත් නොවේ නම් ඒ සඳහා නොපමාව කටයුතු කල යුතුය. | ඇති නොහැකියාව නිසා ඒ සඳහා වෙන් කිරීමක් සිදු කර ඇත. මේ සම්බන්ධව වැඩි දුර උපදෙස් ලබා ගැනීමට නීතිපති වෙත යොමු කිරීමට තීරණය කර ඇත. | |
| (අ.ඉ) | 2020 දෙසැම්බර් 31 දිනට මාර්ග සංවර්ධන අධිකාරියේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරු 28 ක පුරප්පාඩු පැවති අතර, මෙකී තනතුරු වල පුරප්පාඩු පැවතීම කළමනාකරණ කටයුතු වලට මෙන්ම අධිකාරියේ කාර්යසාධනය කෙරෙහි ද ඍජුවම බලපා තිබුණි. තවද, එදිනට නිලධාරීන් 958 දෙනෙකුගේ අතිරික්තයක් ද පැවති අතර 2020 සහ 2019 වර්ෂයේ සේවක වැටුප් වෙනුවෙන් දරන ලද සමස්ථ වියදම පිළිවෙළින් රු.මිලියන | අධිකාරියේ කටයුතු පුළුල් වීමට සාපේක්ෂව කාර්ය මණ්ඩලය ඒ අනුව අනුමත කරවා ගැනීම හා තාක්ෂණය භාවිතය සුලබ කිරීමට හා<br><br>අධිකාරියේ ප්‍රධාන මෙහෙයුම් කටයුත්ත වන මාර්ග ඉදිකිරීම් සහ නඩත්තු ක්ෂේත්‍රයට ඍජුව බලපෑමක් ඇති කරන ඉංජිනේරු සේවයේ සහ තාක්ෂණික සේවයේ | මාර්ග ඉදිකිරීම් හා නඩත්තු කටයුතු ප්‍රසාරණය වීම නිසා අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා සේවකයින් බඳවාගෙන ඇත. සමාලෝචිත වර්ෂය වන විට අතිරික්ත සේවක සංඛ්‍යාව අඩු වී ඇත. වාර්ෂික ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා වැටුප් ගෙවීම සඳහා අධිකාරියේ අරමුදල් භාවිත කර ඇත.<br><br>අධිකාරියට අවශ්‍ය ප්‍රශස්ත කාර්යය මණ්ඩලය ගණනය කිරීම සඳහා පරිපාලන | අතිරේක අධ්‍යක්ෂ තනතුරු 11 සහ පළාත් භාර අධ්‍යක්ෂ තනතුරේ පවතින පුරප්පාඩු සම්පූර්ණකර නැත. 2020.12.31 දිනට අතිරික්ත සේවක සංඛ්‍යාව 844 වේ. |

| | | | | |
|---|---|---|---|---|
| | 10,287ක් සහ රු.මිලියන 11,866.2 ක් වී තිබුණි. ඒ සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලබාගෙන තිබූ ප්‍රදාන වල වටිනාකම පිළිවෙළින් රු.මිලියන 7,399.5ක් සහ රු.මිලියන 6,500ක් විය. අතිරික්ත සේවක සංඛ්‍යාව වූ සේවකයන් ද ඇතුළුව සමස්ථ සේවක මණ්ඩලය වෙනුවෙන් වැටුප් ගෙවීම වෙනුවෙන් 2020 වර්ෂයේ දී අමතර රු.මිලියන 2,887.5 ක් අධිකාරියේ අරමුදල් වලින් ගෙවා තිබුණි. | පුරප්පාඩු පිරවීමට සහ අනුමත සේවක සංඛ්‍යාව තුල සියලු බඳවා ගැනීම් සිදුකිරීමට. | ක්ෂේත්‍රය පිළිබඳ දැනුමක් ඇති උපදේශකවරියක් පත්කර ඇති අතර කාර්යය මණ්ඩල දර්ශකය සම්බන්ධ කෙටුම්පත් වාර්තාව කළමණාකාරීත්වය වෙත මේ වන විට ඉදිරිපත් කර ඇත. එමගින් ප්‍රශස්ථ සේවක සංඛ්‍යාවක් තීරණය කර එය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. | |
| (අ.ඊ) | තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම වෙනුවෙන් කිසියම් කාර්යයක නිවැරදි කාර්ය සාධනය මැනීම සඳහා නිවැරදි දත්ත පදනමක් පැවතීම අත්‍යාවශ්‍ය වුවත් අධිකාරිය විසින් තිරසර, සංවර්ධන ඉලක්ක්යන්හි ළගාවීම මැන බැලීම දත්ත පදනමක් බිහිකර ගැනීම සඳහා නිවැරදි කටයුතු කර නොතිබුණි. මේ සඳහා මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම සහ පුහුණු සේවකයන්ද නොවූ අතර තිරසාර ඉලක්ක කරා ළගා වීම සඳහා අධිකාරිය විසින් හඳුනාගත් කාර්යයන් වාර්ෂික සැලැස්මට ඇතුළත් කර නොතිබූ අතර එම කාර්යයන් ඉටු කිරීමට අවශ්‍ය වන මූල්‍ය ප්‍රතිපාදනයන් වාර්ෂික අයවැයට ඇතුළත් කර නොතිබුණි. | අධිකාරියේ සියළු ශ්‍රිතිය අංශයන් සම්බන්ධයෙන් කාර්යසාධන මිණුම් හඳුනාගත යුතු වන අතර ඒවා මැනීම හා ඇගයීමේදී ඊට අවශ්‍ය දත්ත පදනමක් බිහිකර ගත යුතුය.<br><br>තිරසාර සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනීමට හඳුනාගත් කාර්යයන් වාර්ෂික සැලැස්මට ඇතුලත් කළ යුතු අතර ප්‍රතිපාදන වාර්ෂික අයවැයට ඇතුලත් කළ යුතුය. | තිරසාර සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනීමට හඳුනාගත් කාර්යයන් වාර්ෂික සැලැස්මට ඇතුලත් කළ යුතු අතර ප්‍රතිපාදන වාර්ෂික අයවැයට ඇතුලත් කළ යුතුය. දැනට හඳුනාගෙන ඇති කාර්යයන් ඉදිරි වාර්ෂික සැලැස්මට ඇතුළත් කිරීමට හා ප්‍රතිපාදනයන් ඉදිරි වාර්ෂික අයවැයට ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු කරගෙන යනු ලබන බව දන්වමි. | 2021 වර්ෂයේදීද මේ සම්බන්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |

## 80. ජාතික වැවිලි කළමනාකරණ ආයතනය

මූලා ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය
2018 - තතත්ත්වාගණනය කළ මතය
2019 - තතත්ත්වාගණනය කළ මතය
2020 - තතත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | උක් හා කුරුඳු සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීමට ප්‍රමාණවත් භෞතික හා මානව සම්පත් ආයතනය සතුව තිබියදී සහ මේ පිළිබඳ වාර්ෂික ක්‍රියාකාරී සැලසුම්වලට ද ඇතුළත් කර තිබියදී සැලසුම් කළ පරිදි පුහුණුලාභීන් බඳවාගෙන වැඩසටහන් පැවැත්වීමට 2018 හා 2019 වර්ෂයන්හිදී කටයුතු කර නොතිබුණි. තවද, උක් සඳහා 2015 හා 2016 වසරවලදී ද, කුරුඳු සඳහා 2015 හා 2017 වසරවලදී ද කිසිදු වැඩසටහනක් පවත්වා නොතිබුණි. | ආයතනය විසින් අදාළ පාඨමාලා සඳහා විෂය නිර්දේශ සහ පුහුණු පාඨමාලා ගාස්තු සංශෝධනය කිරීම ආදී විකල්ප ක්‍රම මඟින් සහභාගි වන්නන් වැඩිකර ගැනීමට කටයුතු කළ යුතුය. | වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 2021 දෙසැම්බර් 31 දක්වාම පාඨමාලා පැවැත්වීමට අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණි. |
| (ආ) | කෘෂි විද්‍යා දැනුම, පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම් හුවමාරු කර ගැනීම, කෘෂි කාර්මික පර්යේෂණ ව්‍යාපෘති සැලසුම් කිරීම, වැඩමුළු, සම්මන්ත්‍රණ, පුහුණු පාඨමාලා ඒකාබද්ධව සංවර්ධනය කිරීම, තාක්ෂණ කාර්ය මණ්ඩලය සඳහා සීමාවාසික (Internship) පුහුණුව ලබා දීම ආදිය ඉටුකර ගැනීමේ අරමුණින් වයඹ විශ්ව විද්‍යාලය සමග 2016 ජූනි 22 දින අවබෝධතා ගිවිසුමක් | අවබෝධතා ගිවිසුමේ සඳහන් අරමුණු ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය පාඨමාලා පැවැත්වීමට ආයතනය කටයුතු කළ යුතුය. | පාඨමාලා පවත්වා නොමැත. | 2021 දෙසැම්බර් 31 දක්වාම පාඨමාලා පැවැත්වීමට අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | අත්සන් කර තිබුණ ද, එවැනි පාඨමාලා පවත්වා නොතිබුණි. | | | |
| (ඇ) | ආයතනය විසින් පවත්වන ලද වැවිලි කළමනාකරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව, වැවිලි කළමනාකරණය සහ පොත් තැබීමේ සහතික පත්‍ර පාඨමාලාව,ඇතුලු පාඨමාලා 06 ක අවසන් වූ ආසන්න පාඨමාලා 02 ක් සඳහා ලියාපදිංචි වූ සිසුන් 259 ක් වූ අතර එයින් සිසුන් 103 දෙනෙකු හෙවත් සියයට 40 ක් පාඨමාලාව හැරගොස් තිබුණි. එසේ වුවද, ඊට හේතු වූ කරුණු පිළිබඳව සොයාබලා එම පාඨමාලාවන්හි ගුණාත්මකභාවය වැඩිදියුණු කර ඵලදායීතාවය නන්වා ගැනීම කෙරෙහි අවධානය යොමු වී නොතිබුණි. | පාඨමාලාවන් සාර්ථක ලෙස අවසන් කිරීමට නොහැකි වන කරුණු හඳුනාගෙන ඒ සඳහා නිසි පිළියම් යෙදිය යුතුය. | දේශනවලට නැවත සවන් දීමට හැකි ආකාරයට නවීන තාක්ෂණය යටතේ ඉගෙනුම් කළමනාකරණ පද්ධතියක් (LMS) හඳුන්වා දී ඇති බැවින් පාඨමාලාව අත්හැර දැමීම අවම කෙරෙනු ඇති බව වාර්තා කර තිබේ. | 2021 දෙසැම්බර් මස නව පද්ධතිය හඳුන්වා දී ඇත. |
| (ඈ) | ආයතනය විසින් 2020 වර්ෂයේදී සිසුන් 157 දෙනෙකුගේ සහභාගීත්වයෙන් ශාස්ත්‍රීය සහ වෘත්තීමය පුහුණු වැඩසටහන් 08 ක් පවත්වන්නට සැලසුම් කර සිසුන් 47 දෙනෙකුගේ සහභාගීත්වයෙන් වැඩසටහන් 02 ක් පමණක් පවත්වා තිබූ අතර පසුගිය වර්ෂ 04 ක තත්ත්වය සලකා බැලීමේදී සිසුන් 760 කගේ සහභාගත්වයෙන් වැඩසටහන් 50 ක් පවත්වන්නට සැලසුම් කර සිසුන් 609 දෙනෙකුගේ | විෂය නිර්දේශ සංශෝධනය කර අවශ්‍ය පහසුකම් වැඩිදියුණු කළ යුතු අතර COVID වසංගත තත්ත්වය හමුවේ සුදුසු ආකාරයට වැඩසටහන් පවත්වාගෙන යාම කෙරෙහි අවධානය යොමු කළ යුතුය. | අධ්‍යයනගත වෘත්තීය පාඨමාලාවන් සඳහා සහභාගීවන්නන් ප්‍රමාණය වර්ධනය කිරීම සඳහා ජාතික නිපුනතා සහතික පාඨමාලා (NVQ) හඳුන්වා දී ඇත. ක්ෂේත්‍රයේ නම අනුගත වන පරිදි පාඨමාලාවන් යාවත්කාලීන කිරීම නිරන්තරව සිදුවේ. නව උපාධි පාඨමාලා 02 ක් හඳුන්වා දීම සඳහා අවශ්‍ය පියවරයන් ගෙන ඇත. | පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය ගොඩනැඟිලි ඉදි කෙරෙමින් පවතී. නව උපාධි පාඨමාලා ආරම්භ කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | සහභාගීත්වයෙන් වැඩසටහන් 38 ක් පවත්වා තිබුණි. තවද, 2019 හා 2020 වර්ෂයන්හිදී 74 දෙනෙකුගේ සහභාගත්වයෙන් කුසලතා සංවර්ධන වැඩසටහන් 5 ක් පවත්වන්නට සැලසුම් කර සිසුන් 38 දෙනෙකුගේ සහභාගීත්වයෙන් වැඩසටහන් 3 ක් පමණක් පැවැත්වා තිබුණි. කාලීන අවශ්‍යතාවය මත මෙම පාඨමාලාවන්හි විෂය නිර්දේශය සංශෝධනය කර අවශ්‍ය පහසුකම් වැඩිදියුණු නොකිරීම මෙම තත්ත්වයට හේතු වී ඇති බවට නිරීක්ෂණය විය. | | | |
| (ඉ) | ආයතනයේ 71 ක් වූ අනුමත කාර්ය මණ්ඩලයෙන් පුහුණු කිරීමේ විශේෂඥ (වැවිලි කළමනාකරණය), සහකාර අධ්‍යක්ෂ (අලෙවිකරණ, ව්‍යාපාර ප්‍රවර්ධන හා සැලසුම්), පුහුණු නිලධාරී (වැවිලි ඉංජිනේරු) ඇතුළුව තනතුරු 16 ක් පුරප්පාඩුව පැවතීම ආයතනය පිහිටුවීමෙන් බලාපොරොත්තු වූ අරමුණු ඉටුකර ගැනීම කෙරෙහි බලපානු ලබන බවට නිරීක්ෂණය විය. තවද, 2019 හා 2020 වර්ෂයන්හි තනතුරු නාම 06 ක් යටතේ තනතුරු 08 ක් අනුමත කර තිබුණ ද, ඊට අදාළ බඳවාගැනීමේ පටිපාටි අනුමත කර නොගැනීමෙන් බඳවා ගැනීම් සිදු කිරීමට නොහැකි වී තිබුණි. | බඳවාගැනීමේ පටිපාටි අනුමත කර ගැනීමටත්, රෙගුලාසීන්ට අනුගතව පුරප්පාඩු පුරවා ගැනීමටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | බඳවා ගැනීම සඳහා අනුමැතිය ලද සැනින් ඒ සඳහා ක්‍රියා කිරීමට අපේක්ෂාවෙන් සිටින බව වාර්තා කර ඇත. | 2021 වර්ෂය දක්වාම පුරප්පාඩු පිරවීමට නොහැකි වී ඇත. |

## 81. ලක්ෂ්මන් කදිර්ගාමර් ජාත්‍යන්තර සම්බන්ධතා හා ක්‍රමෝපාය අධ්‍යයන ආයතනය

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 - තතත්ත්වාගණනය නොකළ මතය

2019 - තතත්ත්වාගණනය නොකළ මතය

2020 - තතත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2006 අංක 32 දරන උපාය මාර්ග අධ්‍යයනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය (සංශෝධන) පනතෙහි 10 (අ) වගන්තිය ප්‍රකාරව ආයතනයේ කළමනාකරණ මණ්ඩලය විසින් පුද්ගලයින් පස්දෙනෙකුගෙන් සමන්විත ජාත්‍යන්තර උපදේශක සභාවක් පත්කළ යුතු වුවත් එවැනි උපදේශක සභාවක් පත්කර නොතිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව ජාත්‍යන්තර උපදේශක සභාවක් පත්කළ යුතු බව. | කළමණාකරණ අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කර, ඒ අනුව ඉදිරියේදී කටයුතු කරන බව. | ජාත්‍යන්තර උපදේශක සභාවක් පත් කිරීමට කටයුතු කර නොතිබුණි |
| (ආ) | සංශෝධන පනතෙහි 10 ඉ (2) (i) වගන්තිය ප්‍රකාරව පනත ක්‍රියාත්මක වන දිනයට පෙර බණ්ඩාරනායක ජාත්‍යන්තර තානාපති පුහුණු ආයතනය විසින් පවත්වාගෙන යන යම් ගිණුමක බැරට තිබූ සියලු මුදල් ආයතනයේ අරමුදලට මාරු කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු බව. | කළමණාකරණ අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කර, ඒ අනුව ඉදිරියේදී කටයුතු කරන බව. | 2021 වර්ෂයේදීද ආයතනයේ අරමුදලට මුදල් බැර කර නොතිබුණි. |
| (ඇ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව වටිනාකම රු.26,362,668ක් වූ ස්ථාවර වත්කම් සම්බන්ධව ස්ථාවර වත්කම් ලේඛනයක් | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු බව. | 2021 වසරේ සිට එය නිසි පරිදි සම්පූර්ණ කර ඉදිරියට ගෙන යාමට අවශ්‍ය කටයුතු සම්පාදනය කර ඇති බව. | 2021 වර්ෂයේදීද ස්ථාවර වත්කම් ලේඛනය සම්පූර්ණ කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | පවත්වාගෙන ගොස් නොතිබුණි. | | | |
| (ඈ) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව ආයතනය ඇඟිලි සලකුණු සටහන් යන්ත්‍රයක් සවිකිරීමට කටයුතු කර නොතිබුණ අතර, චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ඇඟිලි සලකුණු යන්ත්‍රය මගින් සනාථ නොකළ කාලයන් පදනම්ව අතිකාල දීමනා ගෙවා තිබුණි. | අතිකාල දීමනා ගෙවීමේදී ඇඟිලි සලකුණු යන්ත්‍රය මගින් සනාථ කිරීම් ලබා ගැනීමට කටයුතු කළ යුතු බව. | ඇඟිලි සළකුණු යන්ත්‍රයක් සවි කිරීම සම්බන්ධයෙන් නැවත කළමණාකරණ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කර ඒ අනුව කටයුතු කරන බව | ඇඟිලි සළකුණු යන්ත්‍රයක් සවි සවි කර නොතිබුණි. |
| (ඉ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 1.6.5.3 වගන්තිය ප්‍රකාරව යම් වර්ෂයකට අදාළ වාර්ෂික වාර්තා ඊලඟ වර්ෂයේ මැයි 31 දිනට පෙර පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු නමුත් ආයතනය 2007 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා වාර්ෂික වාර්තා 2021 ජුනි 30 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු බව. | වාර්ෂික වාර්තා සභාගත කිරීම සඳහා විදේශ අමාත්‍යාංශය හා කලාපීය සහයෝගිතා රාජ්‍ය අමාත්‍යාංශය වෙත ලබා දීමට කටයුතු කරන බව | වාර්ෂික වාර්තා සභාගත කර නොතිබුණි. |
| (ඊ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 11.9.3.1 වගන්තිය ප්‍රකාරව එක් එක් තනතුර සඳහා බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටි සකස් කර තිබිය යුතු නමුත් ආයතනය සඳහා බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියක් සකස් කර අනුමත කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු බව. | අදාළ අනුමැතිය ලබා ගැනීම සඳහා විදේශ අමාත්‍යාංශය හා කලාපීය සහයෝගිතා රාජ්‍ය අමාත්‍යාංශය සමඟ එක්ව කටයුතු කරන බව. | බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටි සකස් කර අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඌ) | 2020 ඔක්තෝබර් 26 දිනැති අංක 02/2020 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 02 (v) ඡේදය ප්‍රකාරව සියලුම බඳවා ගැනීම්/ පුරප්පාඩු පිරවීම් සිදුකළ යුත්තේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අදාළ තනතුරට ලබා දී ඇති වැටුප්/වැටුප් කේත යටතේ පමණක් වන අතර, එක් එක් ආයතන විසින් කාර්යය මණ්ඩල වැටුප් හා දීමනා තීරණය කිරීම සිදු නොකළ යුතු බව දක්වා තිබුණද එම අවශ්‍යතා ඉටුවී නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු බව. | අනුමැතිය ලබා ගැනීම සඳහා අමාත්‍යාංශයන් සමඟ එක්ව කටයුතු කරන බව. | වැටුප් හා දීමනා සම්බන්ධයෙන් අදාළ අනුමැතීන් ලබාගෙන නොතිබුණි. |
| (ඍ) | ආයතනය ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් 2006 පෙබරවාරි 23 දිනැති අංක අමප 003/214/0202/06 දරන අමාත්‍ය මණ්ඩල තීරණයේ (අ) වගන්තිය ප්‍රකාරව මහින් කොළඹ 07 , හෝටන් පෙදෙස, අංක 24 දරන ස්ථානයේ තිබෙන දේපලවල හිමිකාරීත්වය ආයතනය වෙත පවරාදීම සඳහා අනුමැතිය ලබාදී තිබුණද, එම දේපල 2021 වර්ෂය දක්වා පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | දේපලවල හිමිකාරීත්වය ආයතනය වෙත පවරා ගැනීමට කළ යුතු බව. | අදාළ ආයතනය සමඟ පවරා ගැනීමට කටයුතු කරන බව. | 2021 වර්ෂයේදීද දේපලවල අයිතිය පවරාගෙන නොතිබුණි. |

## 82. රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය අර්ථ සාධක සංගමය

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 - තතත්ත්වාගණනය නොකළ මතය

2019 - තතත්ත්වාගණනය නොකළ මතය

2020 - තතත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | සාමාජිකයාගේ මූලික වැටුපෙන් සාමාජිකයා එකඟ වූ ප්‍රතිශතයක් සාමාජික දායක මුදල් ලෙස සංගමය විසින් මාසිකව අයකරනු ලබයි. එහෙත් සාමාජිකයාගේ මූලික වැටුප වාර්ෂිකව වැඩි වී තිබුණ ද වැඩි වූ මූලික වැටුපට අනුරූපව සාමාජිකයන්ගෙන් සාමාජික දායක මුදල් අයකරගෙන නොතිබුණ අවස්ථා 35 ක් නියැදි විගණන පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය. | සාමාජික දායක මුදල් අය කිරීම විධිමත් කළ යුතු වීම. | ඉල්ලීම් සිදු කළ ද ආයතන ප්‍රධානීන් විසින් වර්තමාන වැටුප දන්වා නොමැති අවස්ථා පවතින අතර ණය ඉල්ලුම් කිරීමේ දී වැටුප් පත් ඉදිරිපත් කරන අතර ඒ අනුව යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව. | 2022 පෙබරවාරි 28 දින වන විටත් යාවත්කාලීන කිරීමට වැඩපිළිවෙලක් සංගමය විසින් ක්‍රියාත්මක කර නොතිබුණි. |
| (ආ) | ලෙජර ගිණුම් වල ශේෂයන්ට 2020 වර්ෂයට අදාළ ගැලපීම් ජර්නල් සටහන් මඟින් සිදු කිරීමට පරිගණක පද්ධතියේ පහසුකම් සපයා නොතිබුණි. පරිගණක පද්ධතියෙන් ලබාගන්නා ශේෂයන්ට පද්ධතියට පරිබාහිරව ජර්නල් සටහන් මඟින් ගැලපීම් සිදු කර එම ශේෂ පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණි. ඒ අනුව, පරිගණක පද්ධතිය ඇසුරින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරගැනීමේ පහසුකම, පරිගණක ගත ගිණුම්කරණ | මූල්‍ය ප්‍රකාශන සකස් කළ හැකි වන පරිදි පරිගණක පද්ධතිය වැඩිදියුණු කර ගත යුතු බව. | පරිගණක පද්ධතිය තුළ මෙම ගැටළුව පවතින බවත් ඉදිරියේදී අඩුපාඩු සකස් කිරීමට කටයුතු කරන බව. | 2022 පෙබරවාරි 09 වන දින වන විටත් අඩුපාඩු සකස් කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | පද්ධතිය තුළ නොමැති බව නිරීක්ෂණය විය. එම නිසා පරිගණක පද්ධතියට පරිබාහිරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී අඩු පාඩු පැවතීමේ අවදානමක් පවතින බව අවධාරණය කෙරේ. | | | |
| (ඇ) | ණය වාරික 6 කට වඩා හිඟ හිටි සාමාජිකයන් 15 දෙනෙකු වෙනුවෙන් ව්‍යවස්ථානුකූලව ගත යුතු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණ බව නියැදි විගණන පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය. | නීති රීති රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතු වීම. | හිඟ මුදල් ද සමඟ නැවත වාරික මුදල් අයකරගැනීමට හෝ ණය අයකරගැනීමෙන් පසුව සාමාජිකත්වය අහෝසි කිරීමට කටයුතු කරන බව. | 2022 පෙබරවාරි 09 වන දින වන විටත් ව්‍යවස්ථානුකූලව කටයුතු කර නොතිබුණි. |
| (ඈ) | 2018 වර්ෂයේ දී සංගමයේ සාමාජිකත්වය ලබාගත් සාමාජිකයන් 18 දෙනෙකු 2020 වර්යේදී හා ඉකුත් වර්ෂයේදී එකතුව රු.3,010,058ක ණය ලබාගෙන තිබුණ ද, 2020 වර්ෂය අවසානය දක්වාත් ඉන් කිසිදු ණය වාරිකයක් අයකරගෙන නොතිබුණ බව නිරීක්ෂණය විය. | ණය මුදල් අයකිරීමට කඩිනමින් පියවර ගත යුතු වීම. | මේ වන විට තිදෙනෙකුගෙන් මුදල් අයවන බවත් අනෙකුත් මුදල් අය කරගැනීමට කඩිනමින් කටයුතු කරන බව. | විගණිත දිනය වූ 2022 පෙබරවාරි 09 වන දින වන විටත් අයකර ගත යුතු ශේෂ පැවැතුණි. |
| (ඉ) | සංගමය විසින් ලබා දී ඇති දේපළ ණය සම්බන්ධයෙන් පරිගණක පද්ධතිය ඇසුරින් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේ දී 2020 වර්ෂයේ අවසාන දිනට එකතුව රු.10,100,701ක දේපළ ණය ශේෂයක් පැවති සාමාජිකයන් 10 දෙනෙකු විසින් ණය ගෙවීම් පැහැර හැර ඇති බව නිරීක්ෂණය විය. | අය කිරීමේ ක්‍රමවේද කඩිනමින් ක්‍රියාත්මක කර ණය ශේෂ අයකරගැනීමට කටයුතු කළ යුතු වීම. | නීතිමය කටයුතු ආරම්භ කිරිමට නියමිත බව. | 2022 පෙබරවාරි 09 වන දින වන විටත් ඒම ශේෂ අයකර ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඊ) | 2020 දෙසැම්බර් 31 දිනට සංගමය වෙත ලැබී තිබුණු වර්ගීකරණය නොකළ ප්‍රේෂණවල එකතුව රු.7,956,077ක් වූ අතර එය විධිමත් පරිදි හඳුනා ගෙන ගිණුම් ගත කිරීම වෙනුවට ජංගම වගකීම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. 2019 වර්ෂයට සාපේක්ෂව මෙම ශේෂය රු.4,885,020 කින් හෙවත් සියයට 159 කින් වර්ධනය වී තිබුණු බව නිරීක්ෂණය විය. එසේ වුවත්, සෘජුව බැංකුව වෙත කරණු ලබන ප්‍රේෂණ හඳුනා ගැනීමට අවශ්‍ය තොරතුරු බැංකුව මඟින් හෝ ප්‍රේෂණය සිදු කරන ආයතන මඟින් ලබා ගැනීමේ ක්‍රමවේදයක් හඳුන්වාදීමට සංගමය කටයුතු කර නොතිබුණි. | සංගමය වෙත ලැබෙන ප්‍රේෂණ විධිමත්ව හඳුනා ගත හැකි වන පරිදි පද්ධතිය වැඩි දියුණු කිරීම සිදු කළ යුතු බව. | මෙම සෘජු ප්‍රේෂණවලින් රු.1,367,045.48ක මුදලක් නිරවුල් කරන ලද අතර ඉතිරි මුදල හැකි ඉක්මනින් නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. | 2022 පෙබරවාරි 28 දින වන විටත් එසේ නිරවුල් කර නොතිබුණු ශේෂ පැවතුණි. |
| (උ) | 2020 දෙසැම්බර් 31 දිනට සාමාජිකත්වය අහෝසි වී ඇති සාමාජිකයන්ගේ දායක මුදල් ගිණුමේ පැවැති රු.19,279,643ක බැර ශේෂය විධිමත් පරිදි හඳුනා ගෙන නිරවුල් කිරීමට පියවර නොගෙන ණයහිමියන් යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | කඩිනමින් නිරවුල් කිරීමට පියවර ගත යුතු වීම | සාමාජිකයින් තම මුදල් ලබා ගැනීමට ඉදිරිපත් නොවීම සහ ලිපි ලේඛන වල පවතින අඩුපාඩු හේතුවෙන් මෙම ශේෂය ඉතිරි වී ඇත. හිමිකරුවන් මෙම මුදල් ලබා ගැනීමට ඉදිරිපත් වූ විගස නියමිත ක්‍රමවේදය අනුගමනය කරමින් මෙම ගෙවීම් සිදු කරනු ලැබේ. | 2022 පෙබරවාරි 28 දින වන විටත් එසේ නිරවුල් කර නොතිබුණු ශේෂ පැවතුණි. |
| (ඌ) | 2020 වර්ෂයේ ජංගම වගකීම් ලෙස ගෙවිය යුතු මරණ ප්‍රදාන ගිණුමේ රු.5,735,000ක | තොරතුර සොයා බලා කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු | ලිපිගොනු වල පවතින අඩුපාඩු සහ අදාළ උරුමකරුවන් හිමිකම් ලබා ගැනීම සඳහා | යැපෙන්නන් නිසි පරිදි ලේඛණ ඉදිරිපත් නොකළ ගෙවියයුතු |

| | | | | |
|---|---|---|---|---|
| | ශේෂයක් දක්වා තිබුණි. මෙම ශේෂයට අදාළව විගණනය වෙත ඉදිරිපත් කරන ලද ගෙවිය යුතු මරණ ප්‍රදාන සාමාජික ලැයිස්තුව අනුව මිය ගිය වර්ෂ 05 කට පෙර මියගිය සාමාජිකයන් 30 දෙනෙකු වෙනුවෙන් ගෙවිය යුතු මරණ ප්‍රදාන ශේෂය රු. 1,420,000 ක් විය. | වීම. | ඉදිරිපත් නොවීම හේතුවෙන් මෙසේ ගෙවිය යුතු ලේඛනයේ ඇතුළත්ව පවතින අතර හිමිකරුවන් ඉදිරිපත් වූ වහාම මෙම ප්‍රදාන ගෙවීම් සඳහා අපේක්ෂාවෙන් සිටී. | ණය ශේෂ තවදුරටත් පැවැතුණි. |
| (එ) | 2020 වර්ෂයේ ජංගම වගකීම් ලෙස ගෙවිය යුතු මරණ ප්‍රදාන ගිණුමේ රු.5,735,000ක ශේෂයක් දක්වා තිබුණි. මෙම ශේෂයට අදාළව විගණනය වෙත ඉදිරිපත් කරන ලද ගෙවිය යුතු මරණ ප්‍රදාන සාමාජික ලැයිස්තුව අනුව මිය ගිය වර්ෂ 05 කට පෙර මියගිය සාමාජිකයන් 30 දෙනෙකු වෙනුවෙන් ගෙවිය යුතු මරණ ප්‍රදාන ශේෂය රු. 1,420,000 ක් විය. | තොරතුර සොයා බලා කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. | ලිපිගොනු වල පවතින අඩුපාඩු සහ අදාළ උරුමකරුවන් හිමිකම් ලබා ගැනීම සඳහා ඉදිරිපත් නොවීම හේතුවෙන් මෙසේ ගෙවිය යුතු ලේඛනයේ ඇතුළත්ව පවතින අතර හිමිකරුවන් ඉදිරිපත් වූ වහාම මෙම ප්‍රදාන ගෙවීම් සඳහා අපේක්ෂාවෙන් සිටී. | යැපෙන්නන් නිසි පරිදි ලේඛණ ඉදිරිපත් නොකළ ශේෂ පැවැතුණි. |
| (ඒ) | සාමාජිකයෙකුගේ මරණය දැනුම් දී මාස 02 ක් ඇතුළත ඔවුන්ගෙන් යැපෙන්නන්ට එම හිමිකම් ගෙවිය යුතු වුවත්, එලෙස යැපෙන්නන්ට ගෙවිය යුතු එකතුව රු.5,735,000 ක හිමිකම් 2020 දෙසැම්බර් 31 දින වනවිටත් ගෙවා නොතිබුණි. | සංගමයේ ව්‍යවස්ථාවේ අවශ්‍යතා ඉටු කිරීමට අවශ්‍ය විධිවිධාන ක්‍රියාත්මක කළ යුතු වීම. | සාමාජිකයකුගේ මරණය වාර්තා වී මාස 2 ක් ඇතුළත ඔහුට හිමි ප්‍රදාන ගෙවීමට කටයුතු කරන අතර එසේ ගෙවීමට නොහැකි වී ඇති ප්‍රදාන වාර්තා වන්නේ අදාළ දීමනා හිමිකරුවන් විසින් අවශ්‍ය ලේඛන එනම් මරණ සහතිකය, විවාහ සහතිකය, දරුවන්ගේ උප්පැන්න සහතික ආදී සහතික වල මුල් පිටපත් නිසි පරිදි ඉදිරිපත් නොකිරීම | යැපෙන්නන් නිසි පරිදි ලේඛණ ලබා ගැනිමට විධිමත් පරිදි කටයුතු නොකිරීම නිසා යැපෙන්නන්ට ගෙවිය යුතු මුදලක් පැවැතුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | | | සහ මුදල් ලබා ගැනීමට අදාළ රිසිට්පත් නිසි පරිදි ඉදිරිපත් නොකිරීම හේතුවෙනි. දැනට උරුමකරුවන් නම් නොකරන ලද සාමාජිකයින් වෙත උරුමකරුවන් නම් කිරීම් පෝරම නිකුත් කිරීම සිදු කෙරේ. එමගින් මෙම ප්‍රමාදයන් ද බොහෝ දුරට වළක්වා ගත හැකි වෙතැයි අපේක්ෂා කෙරේ. | |
| (ඔ) | සංගමයේ 133,134 සහ 155 මහා සභා රැස්වීම්වලදී අනුමත වූ රීති ගැසට් පත්‍රයේ පලකර නොතිබුණි. | ව්‍යවස්ථාව පරිදි කටයුතු කළ යුතු වීම. | 133, 134, සහ 135 මහා සභා රැස්වීම් වලදී අනුමත වූ රීති කෙටුම්පත් කර අවසන් අතර ගැසට් පත්‍රයේ පළ කිරීමට කඩිනමින් අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | 2022 පෙබරවාරි 09 වන දින වන විටත් ගැසට් පත්‍රයේ පළකර නොතිබුණි. |
| (ඕ) | ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 756 පරිදි 2018 හා 2020 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණය සිදු කර, එම වාර්තාව විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතු වීම. | වර්තමානයේ රටේ පවතින කොරෝනා වාතාවරණය හමුවේ භාණ්ඩ සමීක්ෂණය මේ වන තෙක් සිදු කිරීමට නොහැකි වී ඇති අතර හැකි ඉක්මනින් සිදු කර වාර්තාව ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | විගණිත දිනය වූ 2022 පෙබරවාරි 09 වන දින වන විටත් අදාළ සමීක්ෂණ මණ්ඩල වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ක) | 2003 ජූනි 02 දිනැති PCD 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 05 වන වගන්තිය පරිදි ආයතනය විසින් සංයුක්ත සැලැස්මක් 2018, 2019 හා 2020 වර්ෂවල දී පිළියෙල කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතු වීම | ඉදිරියේදී සංයුක්ත සැලැස්මක් සකස් කිරීමට කටයුතු කරනු ලැබේ. | වර්ෂ 03 සඳහාම සංයුක්ත සැලැස්ම පිළියෙල කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ග) | 2014 පෙබරවාරි 14 දිනැති අංක 2014/1 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය පරිදි ආයතනය විසින් ක්‍රියාකාරී සැලැස්මක් 2018, 2019 හා 2020 වර්ෂ සඳහා පිළියෙල කර නොතිබුණි. | අදාළ නිතිරීතිවලට අනුකූලව කටයුතු කළ යුතු වීම. | ඉදිරියේදී ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට කටයුතු කරනු ලැබේ. | වර්ෂ 03 සඳහාම සංයුක්ත සැලැස්ම පිළියෙල කර නොතිබුණි. |
| (ඝ) | සංගමය විසින් 2020 දෙසැම්බර් 31 දින දක්වා සමාජිකයන් 07 දෙනෙකු වෙත ලබා දී තිබුණු රු.2,020,357 ක දේපළ ණය ගෙවීම පැහැර හැර තිබුණි. | ණය මුදල් අයකර ගැනීමට කඩිනමින් පියවර ගත යුතු වීම. | ගෙවීම් පැහැර හැර ඇති දේපළ ණය මුදල් ලබා ගත් සාමාජිකයින්ගෙන් හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කරමින් පවතින අතර ණය මුදල් ගෙවීම් පැහැර හරින සාමාජිකයින්ගෙන් මුදල් අය කර ගැනීම සඳහා නීතිමය කටයුතු ආරම්භ කිරීමට නියමිතය. | 2022 පෙබරවාරි 09 වන දින වන විටත් ණය ශේෂ අයකර ගෙන නොතිබුණි. |
| (ට) | 2020 වර්ෂය අවසාන වන විට විදේශ වන්දනා ණය අය නොවන සමාජිකයන් සංඛ්‍යාව 15ක් වූ අතර අයවිය යුතු මුළු ණය ප්‍රමාණය රු.1,194,853ක් වී තිබුණි. | කඩිනමින් පියවර ගෙන හිඟ ණය වාරික අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | මුදල් අය නොවන සියළු සාමාජිකයින්ගෙන් මුදල් අය කරවා ගැනීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ඉදිරියේදී ගනු ලබන අතර රටේ පැවති කොරෝනා වසංගත තත්වය හේතුවෙන් වරින් වර රට වසා තැබීම හේතුවෙන් පසුගිය වර්ෂයේ එම කටයුතු වලට යම් බාධාවක් සිදු වූ අතර ඉදිරියේදී කඩිනමින් අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කරමි. | 2022 පෙබරවාරි 09 වන දින වන විටත් එම ණය ශේෂ අයකර ගෙන නොතිබුණි. |
| (ඳ) | 2015 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලය තුළ සංගමයේ සාමාජික සංඛ්‍යාවේ වර්ධනය පිළිවෙලින් 168, 1333, 336, 568 සහ 98 ක් වී තිබුණි. ඒ | නව සාමාජිකයින් බඳවා ගැනීමට කටයුතු කළ යුතු වීම. | බඳවා ගැනීමේ ප්‍රචාරණ කටයුතු සඳහා පසුගිය වර්ෂය තුළ ආයතන වලට යාමට සුදුසු වාතාවරණයක් රටේ නොපැවති බැවින් සාමාජික | සාමාජිකත්වය රාජ්‍ය සේවයේ වැඩිවීමට සාපේක්ෂව සාමාජිකත්වය අඩු මට්ටමක පැවැතිණි. |

අනුව 2019 වර්ෂය හා 2020 වර්ෂය සැසඳීමේ දී 2020 වර්ෂයේ දී සාමාජිකයන් බඳවා ගැනීම සියයට 82 කින් අඩු වී තිබුණි.

බඳවා ගැනීම් වල විශාල අඩුවක් සිදු වූ අතර වෙනත් උපක්‍රමික සැලසුම් සකස් කිරීම මඟින් සාමාජිකයන් බඳවා ගැනීම ප්‍රවර්ධනය කර ඇත.

**83. ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 - තතත්ත්වාගණනය නොකළ මතය

2019 - තතත්ත්වාගණනය නොකළ මතය

2020 - තතත්ත්වාගණනය නොකළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | චක්‍රලේඛ අංක පීඊඩී/12 - යහ පාලනය සඳහා රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශ - ඡේද අංක 9.14 ප්‍රකාරව මණ්ඩලය විසින් විගණිත දිනය තෙක් ක්‍රියාපටිපාටි අත්පොතක් අනුමත කර නොතිබුණි. | මණ්ඩලය විසින් අදාල චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල විය යුතු වීම. | එම කාර්ය පරිපාටි අත්පොත අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීමට පෙර මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරි රැස්වීම් වාරයකට ඉදිරිපත් කරනු ලැබේ. | ක්‍රියාපටිපාටි අත්පොත 2021 වර්ෂය අවසානය දක්වාම අනුමත කර නොතිබුණි. |
| (ආ) | කාර්යාල ගොඩනැගිල්ලේ පළමු මහල කාර්යාල කටයුතු සඳහා භාවිතා කිරීමට මණ්ඩලය විසින් සිලෝන් බයිබල් හවුස් සමඟ 2017 ජූලි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි වර්ෂ 04 ක කුලී ගිවිසුමකට එළඹ තිබුණු අතර 2020 වර්ෂය සඳහා කුලිය ලෙස රු.4,149,492ක් ගෙවා තිබුණි. කෙසේ වුවද, අපේක්ෂිත අරමුණ සඳහා එම මහල යොදා ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණු අතර කාර්යාලයේ අභ්‍යන්තර ඉදිකිරීම් මේ දක්වා ආරම්භ කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | වියදම් ආර්ථිකභාවයකින් හා කාර්යක්ෂමව දැරිය යුතු වීම. | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලවීම් සමීක්ෂණය සඳහා අතිරේක නිලධාරීන් බඳවාගැනීමට මණ්ඩලය විසින් අපේක්ෂා කළ බැවින්, අතිරේක නිලධාරීන් යෙදවීම සඳහා මණ්ඩලය විසින් අතිරේක මහලක් පවතින කාර්යාල පරිශ්‍රයක් සොයමින් පැවතුණි. ආසන්න ඉඩමේ උස් ගොඩනැගිල්ලක සිදුකරන ඉදිකිරීම්වලින් බාධා පැමිණීම හේතුවෙන් පළමු මහලේ අභ්‍යන්තර ඉදිකිරීම් වැඩ 2017 වර්ෂයේ පළමු මාසවල ප්‍රමාද වීම. | මණ්ඩලය විසින් ගොඩනැගිල්ලේ බිම් ප්‍රමාණය උපයෝගී කර නොතිබුණු අතර අභ්‍යන්තර කොටස් කිරීම සඳහා ඉදිකිරීම් කටයුතු 2021 වර්ෂයේදීද ආරම්භ කර නොතිබුණි. |
| (ඇ) | කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියට පරිබාහිරව කොන්ත්‍රාත් | වැටුප් සහ වෙනත් ප්‍රතිලාභ ගෙවීම සඳහා අනුමැතිය ලබා ගත යුතු | මෙම ස්ථිර කාර්ය මණ්ඩලය සඳහා අනුමත වැටුප් පරිමාණය යටතේ අවශ්‍ය | වැටුප් සහ වෙනත් ප්‍රතිලාභ ගෙවීම සඳහා අනුමැතිය 2021 |

| | | | | |
|---|---|---|---|---|
| | පදනමින් බඳවාගන්නා ලද නිලධාරීන් දෙදෙනෙකුට ඉහළ වැටුපක් සහ වෙනත් ප්‍රතිලාභ මණ්ඩලය විසින් ගෙවා තිබුණි. | වීම. | අත්දැකීම් සහිත තාක්ෂණික දැනුමැති ජ්‍යෙෂ්ඨ වරලත් ගණකාධිකාරීවරුන් අධ්‍යක්ෂ ජනරාල් සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් තනතුරු සඳහා බඳවා ගැනීමට නොහැකි බැවින් කොන්ත්‍රාත් පදනමට බඳවා ගෙන තිබුණි. | වර්ෂයේදීද ලබා ගෙන නොතිබුණි. |
| (ඇ) | 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති පනතේ 5 වන වගන්තියට අනුව, පනත යටතේ ආයතනය විසින් අනුගමනය කරන ලද ප්‍රමිති පනතෙහි උපලේඛනයේ දක්වා ඇති සියලුම ව්‍යාපාරික ව්‍යවසාය සඳහා අදාළ වේ. මේ අනුව, උපායමාර්ගික ව්‍යාපාර ව්‍යවසායන් (SBEs) මගින් ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිතිවලට දක්වන අනුකූලතාව අධීක්ෂණය කිරීම මණ්ඩලයේ ප්‍රධාන කාර්යය වේ. කෙසේ වෙතත්, මණ්ඩලය විසින් එහි ප්‍රධාන කාර්යයන් කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා 2007 අංක 7 දරන සමාගම් පනත බලාත්මක කිරීමෙන් පසු, උපායමාර්ගික ව්‍යාපාර ව්‍යවසායන් (SBEs) හඳුනා ගැනීම සඳහා විධිමත් යාන්ත්‍රණයක් හඳුන්වා දී හෝ ක්‍රියාත්මක කර හෝ නොමැත. | උපායමාර්ගික ව්‍යාපාර ව්‍යවසායන් (SBEs) හඳුනා ගැනීම සඳහා විධිමත් යාන්ත්‍රණයක් හඳුන්වා දිය යුතු වේ. | ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය (SLAASMB) විසින් මේ වන විට 1995 අංක 15 දරන පනත සංශෝධනය කරමින් සිටී. ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය විසින් යම් ආයතනයක් උපායමාර්ගික ව්‍යාපාර ව්‍යවසාය (SBEs) ක් ද නැද්ද යන්න නිර්ණය කිරීමට හැකි වනු පිණිස එම ආයතනයේ මූල්‍ය ප්‍රකාශනවල පිටපතක් ලබා දෙන ලෙස ඉල්ලීමක් කර ඇති අවස්ථාවක, එම ආයතනය මගින් මූල්‍ය ප්‍රකාශනවල පිටපතක් ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය වෙත ලබා දිය යුතු බවට වගන්තියක් මෙම සංශෝධනයේ ඇතුළත් වේ. ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය වෙත විගණන මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමෙන් වැළකී සිටීමට නම්, එවැනි ආයතන වෙත මූල්‍ය ප්‍රකාශනවල | 2022 මාර්තු 20 දිනටද විශේෂිත ව්‍යාපාර ව්‍යවසායන් (SBEs) හඳුනා ගැනීම සඳහා විධිමත් යාන්ත්‍රණයක් හඳුන්වාදී නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | | | පිටපතක් ලබා දෙන ලෙස ඉල්ලා සිටි අවස්ථාවක, එම ආයතන මගින් පර්යන්ත නිර්ණායක සපුරන්නේ නැති බව සනාථ කිරීම අවශ්‍ය වන බැවින් හඳුනාගැනීමේ ක්‍රියාවලිය සඳහා මෙමගින් පහසුකම් සැලසේ. | |
| (ඉ) | උපායමාර්ගික ව්‍යාපාර ව්‍යවසාය (SBEs) විගණනයේ නිරතව සිටින විගණන සමාගම් සඳහා තත්ත්ව පාලනය පිළිබඳ අනුකූලතා අවශ්‍යතා අධීක්ෂණය කිරීමට මණ්ඩලය විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ශ්‍රී ලංකා තත්ත්ව පාලන ප්‍රමිති (SLSQC) 1 සමඟ අනුකූල නොවීම් අධීක්ෂණය කිරීම සඳහා ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය. | වර්තමාන පනත මගින් උපායමාර්ගික ව්‍යාපාර ව්‍යවසාය (SBEs) විගණකවරුන් පිළිබඳව ප්‍රබලව සහ පුළුල් ලෙස පරීක්ෂා කිරීම සඳහා බලය පවරා නැත. අනාගතයේදී ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය වෙත බලය පැවරීමේ වගන්තියක් ඇතුළත් කරනු ඇත. | 2022 මාර්තු 20 දිනට එබඳු අධීක්ෂණය බලතල මණ්ඩලය වෙත පවරා නොතිබුණි. |
| (ඊ) | 2015 වර්ෂයේ සිට මණ්ඩලයේ අධීක්ෂණ කටයුතු ඵලදායී අන්දමින් ඉටු කිරීම සඳහා මණ්ඩලය මගින් කළමනාකරණ තොරතුරු පද්ධතියක් (MIS) ක්‍රියාත්මක කිරීමට නියමිතව පැවතුණ ද, 2021 වර්ෂය දක්වාම එම පද්ධතිය ක්‍රියාත්මක කර නොතිබුණි. | සැලසුම්වලට අනුව විධිමත් කළමනාකරණ තොරතුරු පද්ධතියක් ක්‍රියාත්මක කළ යුතුය. | මේ වන විට, අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව (CPCM) විසින් පුවත්පත්වල සහ SLAASMB වෙබ් අඩවියේ ප්‍රචාරය කරන ලද යෝජනා සඳහා වන ඉල්ලීමට (RFP) ප්‍රතිචාර වශයෙන් ලංසුකරුවන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනා තුන ඇගයීමට ලක් කරමින් සිටී. | කළමනාකරණ තොරතුරු පද්ධතිය නිර්මාණය, සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කොන්ත්‍රාත්තුව තෝරාගත් මෘදුකාංග සංවර්ධකයකු වෙත රු. මිලියන 38 කට පිරිනමා තිබුණි. |
| (උ) | 2020 දෙසැම්බර් 31 දිනට හඳුනාගත් මුළු *නිශ්චිත ව්‍යාපාර ව්‍යවසාය* (SBEs) සංඛ්‍යාව 1,657 කි. කෙසේ වුවද, 2020 | මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීමේ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීමට | ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය මගින් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් නොකරන අස්තිත්ව | 2021 වර්ෂය තුළ මූල්‍ය ප්‍රකාශන 1,830 ක් ලැබී තිබූ අතර, 2021 වර්ෂය තුළ |

| | | | | |
|---|---|---|---|---|
| | වර්ෂය තුළ පූර්ව වර්ෂවලට අදාළ මූලා ප්‍රකාශන 394 ක් ද ඇතුළුව මූලා ප්‍රකාශන 1,232 ක් මණ්ඩලය වෙත ලැබී තිබුණි. | කඩිනම් පියවර ගත යුතුය. | සම්බන්ධයෙන් සමීප පසු විපරම් ක්‍රියාවලියක් අනුගමනය කරයි. සිහිකැඳවීම් මාලාවක් එවැනි අස්තිත්ව වෙත යවනු ලබන අතර *නිශ්චිත ව්‍යාපාර ව්‍යවසාය* (SBEs) වෙතින් ප්‍රතිචාරයක් නොලැබුණු අවස්ථා වලදී, ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය විසින් යවන ලද කිසිදු සිහිකැඳවීමක් සඳහා කිසිදු ප්‍රතිචාරයක් නොලැබීමට හේතුව සොයා බැලීම සඳහා *නිශ්චිත ව්‍යාපාර ව්‍යවසාය* (SBEs) වෙත නිලධාරීන් යවා ඇත. | මූලා ප්‍රකාශන 552 ක් සමාලෝචනය කර තිබුණි. |
| (ඖ) | 2020 වර්ෂය තුළ ඉහතින් ලැබුණු මූලා ප්‍රකාශන අතුරින් මණ්ඩලය විසින් සමාලෝචනය කර තිබුණේ මූලා ප්‍රකාශන 732 ක් පමණක් වන අතර එමඟින් ප්‍රගතියෙන් සියයට 59 ක් දැක්වේ. එසේ වුවද, සමාලෝචනය කරන ලද මූලා ප්‍රකාශන අතරින් මූලා ප්‍රකාශන 619 ක් පෙර වර්ෂවලට සම්බන්ධ මූලා ප්‍රකාශන විය. | සමාලෝචනය කිරීමේ ක්‍රියාවලිය යාවත්කාලීන කළ යුතුය. | 2020 වසරේ මුල් මාස කිහිපය තුළ සමාලෝචනය සඳහා ලබා ගත හැකි මූලා ප්‍රකාශන එනම් පූර්ව වර්ෂ සඳහා වන මූලා ප්‍රකාශන සමාලෝචනය කිරීමට කටයුතු කර තිබුණි. | සියයට සියය ප්‍රතිශතයකින් මූලා ප්‍රකාශන සමාලෝචනය කිරීම වෙනුවට 2021 වර්ෂය තුල අවදානම් මූලික ප්‍රවේශයක් තුලින් මූලා ප්‍රකාශන සමාලෝචනය කර ඇත. |
| (ක) | සමාලෝචිත වර්ෂය තුළ හඳුනා ගත් සියලුම *නිශ්චිත ව්‍යාපාර ව්‍යවසාය* (SBEs) ආවරණය වන පරිදි විගණන පරීක්ෂණ 27 ක් පමණක් සිදු කර සියයට 02 ක් ආවරණය කර ඇත. පසුගිය වසරේ සිදු කරන ලද පරීක්‍ෂණ | විගණන පරීක්ෂණ සංඛ්‍යාව වැඩි කළ යුතුයි. | 2020 වර්ෂයේ දී, මූලා ප්‍රකාශන 732 ක් සම්පූර්ණ කර ඇත. ඒ අනුව, 2020 වර්ෂයේ දී, සාමාන්‍ය වශයෙන් මූලා ප්‍රකාශන කට්ටල 74 ක් කාර්ය මණ්ඩලය විසින් සමාලෝචනය කරන ලදී. | මාර්ගගත ක්‍රමය උපයෝගී කරගනිමින් 2021 වර්ෂය තුල විගණන පරීක්ෂණ 34 ක් සිදුකර තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | 45 ට සාපේක්ෂව, පරීක්‍ෂණවල ක්‍රමානුකූල අඩුවීමක් නිරීක්ෂණය කරන ලදී. | | | |
| (ඒ) | 2020 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ පුරප්පාඩු දහ හතක් තිබුණි. මෙම පුරප්පාඩු අතරින් පුරප්පාඩු 13 ක් විධායක මට්ටමේ තනතුරුවලට අදාළ විය. | අවශ්‍යතාවට අනුව තනතුරු ඇබෑර්තු පිරවිය යුතුය. | මූල්‍ය හා පරිපාලන විධායක නිලධාරී තනතුර සඳහා 2021 මැයි 2 වන දින දැන්වීම් පළ කර, සම්මුඛ පරීක්ෂණ අවසන් කර ඇත. ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය මගින් එම තනතුර සඳහා සුදුසු අපේක්ෂකයෙකු තෝරා ගැනීමේ කටයුතු අවසන් කරමින් සිටියි. | 2021 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ සේවක පුරප්පාඩු 16 ක් තිබුණි. ඉන් පුරප්පාඩු 05 ක් විධායක ශ්‍රේණියේ තනතුරු විය. |

## 84. සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලය

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 - තතත්ත්වාගණනය කළ මතය

2019 - තතත්ත්වාගණනය කළ මතය

2020 - තතත්ත්වාගණනය නොකළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | විගණනයට සපයා ඇති ක්‍රියාකාරී සැලැස්මට අනුව, 2020 වසර අවසානය වන විට නිම කිරීමට නියමිත ක්‍රියාකාරකම් වන, සේවාදායක මෙහෙයුම් සඳහා ආපදා ප්‍රතිසාධන කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම, සමාජ ලියාපදිංචි තොරතුරු පද්ධතිය (SRIS) ස්ථාපනය කිරීම සහ සමාජ ලියාපදිංචි තොරතුරු පද්ධතිය (SRIS) මගින් දැනුම හුවමාරු කිරීමේ සැසියක් පැවැත්වීම, සමාජ ලියාපදිංචි තොරතුරු පද්ධතියේ (SRIS) අභ්‍යන්තර පාර්ශවකරුවන් සඳහා තොරතුරු තාක්ෂණ සහ ආරක්ෂක ප්‍රතිපත්තියක් හඳුන්වාදීම, පූර්ණ තත්ත්ව කළමනාකරණ පද්ධතිය සඳහා සමීක්ෂණ පැවැත්වීම, සමාජ ලියාපදිංචි තොරතුරු පද්ධතිය (SRIS) සඳහා තොරතුරු තාක්ෂණ විගණනය සංවිධානය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සිදු වෙමින් පවතී, සමාජ ලියාපදිංචි තොරතුරු පද්ධතිය (SRIS) ට සම්බන්ධ අදාළ බලධාරීන් | සුබසාධන ප්‍රතිලාභ මණ්ඩල පනතේ සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා විශේෂ අවධානයක් යොමු කළ යුතුය. | සමාජ ලියාපදිංචි තොරතුරු පද්ධති (SRIS) නඩත්තු ලේඛනය මුදල් අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කමිටුවට ඉදිරිපත් කර ඇත. සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතිය (SSNP) මගින් දැනටමත් දත්ත සත්‍යාපන යෙදුම සංවර්ධනය කිරීමේ කටයුතු සම්පූර්ණ කර ඇත. එමෙන්ම, පුහුණු ක්‍රියාවලිය ද සිදුවෙමින් පවතී. | 2022 මාර්තු 09 දින වන විටත් සැලසුම් කළ පරිදි අදාළ ක්‍රියාකාරකම් සම්පූර්ණ කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | සමඟ විධිමත් දෘඩාංගයක් සහ වාර්තා බැහැර කිරීමේ ක්‍රියා පටිපාටියක් සංවර්ධනය කිරීම, සමාජ ලියාපදිංචි තොරතුරු පද්ධතියේ (SRIS) සජීවී ක්‍රියාකාරිත්වයට සහාය වීම සඳහා සංවිධාන ව්‍යුහය ප්‍රතිව්‍යුහගත කිරීම සහ විධිමත් සන්නිවේදන පද්ධතියක් ස්ථාපනය කිරීම යනාදි ක්‍රියාකාරකම් සැලැස්මට අනුව සම්පූර්ණ කර නොතිබුණි. | | | |
| (ආ) | අනුමත සේවක සංඛ්‍යාව වූ 18 හා සසඳන විට 2020 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ සත්‍ය සේවක සංඛ්‍යාව 09 ක් විය. එබැවින්, සභාපති තනතුර ඇතුළුව තනතුරු 09 ක් පුරප්පාඩුව පැවති අතර සියලුම සේවකයන් වැඩබලන, ද්විතීයන පදනමින් සහ තාවකාලික පදනමින් බඳවාගෙන තිබුණි. එමෙන්ම, මණ්ඩලය 2016 වර්ෂයේදී ස්ථාපනය කර තිබුණ ද, 2020 දෙසැම්බර් 31 දින දක්වාම නිසි බඳවා ගැනීමේ පටිපාටියක් සකස් කිරීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි. | අදාළ නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. | සේවක සංඛ්‍යාව අනුමත කිරීම් සම්බන්ධයෙන් භාණ්ඩාගාර ලේකම්වරයා සමඟ සාකච්ඡා කිහිපයක් පවත්වා ඇත. මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කිරීමේ හැකියාව පිළිබඳව ඔවුන් විසින් තීරණය කරනු ඇත. | මණ්ඩලයේ සංයුතියේ ව්‍යුහාත්මක වෙනස් කිරීමක් කිරීමට තීරණය කර ඇති බැවින් සභාපති ඇතුලු පුරප්පාඩුව පැවති කාර්ය මණ්ඩලය 2022 මාර්තු 09 දින වන විටත් පත්කර නොතිබුණි. |

## 85. ජාතික විද්‍යා පදනම

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 - තතත්ත්වාගණනය කළ මතය

2019 - තතත්ත්වාගණනය නොකළ මතය

2020 - තතත්ත්වාගණනය නොකළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | පර්යේෂණ ව්‍යාපෘති සඳහා වන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5 ඡේදය ප්‍රකාරව පර්යේෂණ හා මූල්‍ය ප්‍රගතිය සෑම වසරකම ජූනි 15 හා දෙසැම්බර් 15 දිනට ඉදිරිපත් කළ යුතු වුවත් 2020 වර්ෂයේ සිදුකළ නියැදි විගණන පරීක්ෂාවට අනුව එකතුව රු.13,988,789 ක් වූ ව්‍යාපෘති 07 ක් සම්බන්ධයෙන් නියමිත කාලය තුළ වියදම් වාර්තා ලබාගෙන නොතිබුණි. | පර්යේෂණ ව්‍යාපෘති සඳහා වන මාර්ගෝපදේශ සංග්‍රහයේ 05 ඡේදය අනුව පර්යේෂණ හා මූල්‍ය ප්‍රගතිය ජූනි 15 හා දෙසැම්බර් 15 දිනට ඉදිරිපත් කළ යුතුය. | ගිවිසුමේ වැදගත් වගන්ති පිළිබඳව ප්‍රදානය කරන්නන් දැනුවත් කිරීම, නව අයදුම්පත් සඳහා ගිවිසුමේ නියමයන් සහ කොන්දේසිවලට අනුකූල නොවීම සැලකිල්ලට ගන්නා බවට ප්‍රකාශයක් ගිවිසුමේ ඇතුළත් කිරීම හා වත්මන් ක්‍රියා පටිපාටිය අඛණ්ඩව කරගෙන යාම මඟින් නියමිත වේලාවට වාර්තා ලබා ගැනීමේ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීමට කටයුතු කිරීම. | භෞතික හා මූල්‍ය ප්‍රගති වාර්තා නියමිත වේලාවට ලබාදිය යුතු බව ව්‍යාපෘති ගිවිසුමට දැනටමත් ඇතුළත් කර ඇති අතර ඊට අනුකූල නොවන ප්‍රදානලාභීන් සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග 2021 සංශෝධිත සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටියට ඇතුළත් කර ඇත. තවද නව ප්‍රදානලාභීන් පදනමේ මාර්ගෝපදේශයන්ට අනුකූලව ක්‍රියාකිරීම පරීක්ෂා කිරීමට හැකි දත්ත ගබඩාවක් සැකසීමට 2022 වසරේ දී පියවර ගෙන ඇත. |
| (ආ) | පර්යේෂණ ප්‍රදාන යටතේ 2020 වර්ෂයේ නිම කරන ලද රු.46,768,435ක් වූ ව්‍යාපෘති 18 අතුරින් රු.41,980,228 ක් වූ ව්‍යාපෘති 16 ක් 2019 මාර්තු 31 විගණන දිනය වන විටත් | හැකි සෑම අවස්ථාවකදීම පර්යේෂණ නිමැවුම් පිළිබඳ සමාජය දැනුවත් කිරීමටත් තවදුරටත් එම නිමැවුම් සංවර්ධනය කිරීමටත් පර්යේෂකයන් | පුවත්පත් ලිපි පළ කිරීම, ප්‍රදර්ශන පැවැත්වීම, දැනුවත් කිරීමේ වැඩසටහන්, පදනම විසින් උපදෙස් දී ඇති පරිදි ඉදිරි සංවර්ධන හෝ පසු විපරම් ක්‍රියාමාර්ග ගැනීමට | 2016 සිට 2020 දක්වා සම්පූර්ණ වූ ව්‍යාපෘති වාර්තා වල සාරාංශ ඇතුළත් පොත් පිංච 2022 වසරේ දෙවන කාර්තුවේ දී ජාතික |

| | | | | |
|---|---|---|---|---|
| | ආර්ථික හා සමාජීය සංවර්ධන කාර්යයන් සඳහා යොදාගෙන නොතිබුණි. | යොමු කිරීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කළ යුතුය. | ප්‍රදානය කරන්නන් යොමු කිරීම, ප්‍රත්‍යක්ෂ නිමැවුම් සහිත ප්‍රදාන පසු විපරම් කිරීම සඳහා තාක්ෂණ අංශය වෙත යැවීම, හා අදාළ කර්මාන්ත හවුල්කරුවන්ට හෝ ප්‍රතිපත්ති සම්පාදකයින්ට "ප්‍රතිපත්ති සංක්ෂිප්ත" හරහා නිර්දේශ කිරීම ආදිය මඟින් දැනටමත් ආර්ථික හා සමාජීය ප්‍රතිලාභ සඳහා ප්‍රදාන නිමැවුම් බෙදා හැරීමට පියවර ගැනීම. | විද්‍යා පදනමේ නිළ වෙබ් අඩවියට උඩුගත කිරීමට කටයුතු කර ඇත. |
| (ඇ) | තාක්ෂණ පැවරුම් ලබාදීමේ මූලික අරමුණ වන්නේ නූතන තාක්ෂණයක් මූලික කොටගත් නව ව්‍යාපාර බිහිකිරීම සඳහා මූලාධාර සැපයීම වුවත් 2011 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා ලබාදෙන ලද තාක්ෂණික ආධාර වලින් කාර්යය නිම කරන ලද රු.82,700,248 ක් වටිනා ප්‍රදානයන් 40 ක් අතුරින් රු.40,643,471 ක් වටිනා ව්‍යාපෘති 20 ක් වාණිජකරණය වී නොතිබුණි. | හැකි සෑම අවස්ථාවකදී පර්යේෂණ නිමැවුම් පිළිබඳ සමාජය දැනුවත් කිරීමටත් තවදුරටත් එම නිමැවුම් සංවර්ධනය කිරීමටත් පර්යේෂකයන් යොමු කිරීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කළ යුතුය. | ඉහත අයිතමය යටතේ සඳහන් කර ඇති පරිදි දැනටමත් පියවර ගෙන ඇත. ඊට අමතරව, ප්‍රදානය කරන්නන් කර්මාන්තය හෝ ආයෝජකයින් සමඟ සම්බන්ධ කිරීමට කටයුතු කරනු ලැබේ. | වාණිජ්‍යකරණය නොවූ පර්යේෂණ 18 මඟින් තාක්ෂණික දියුණුව සඳහා මගපෙන්වීම ලබා දී ඇත. |
| (ඈ) | 2013 ඔක්තෝබර් 01 දින ආරම්භ කරන ලද TG/2013/TECH/D/03 තාක්ෂණික ප්‍රදාන ව්‍යාපෘතිය සඳහා විද්‍යා පදනමේ දායකත්වය රු.3,642,990ක් වන අතර මෙම ව්‍යාපෘතිය 2016 ජුනි 30 නිම කළ යුතු විය. අවස්ථා 3 කදී මාස 18ක් | පර්යේෂණයේ ඉදිරි සංවර්ධන කටයුතු කඩිනමින් සිදුකිරීමට පර්යේෂකයන් දිරිගැන්විය යුතු අතර පර්යේෂණයේ ප්‍රතිලාභ සමාජගත කිරීමට හැකි ක්‍රමවේදයන් සකස් කළ යුතුය. | ප්‍රදානය කරන්නාගේ ඉල්ලීම පරිදි ව්‍යාපෘතිය දිගටම කරගෙන යාමට දිගු කිරීම් කිහිපයක් දැනටමත් ලබා දී ඇතත් සැලසුම් කළ පරිදි 2019 අප්‍රේල් මාසය වන විට අපේක්ෂිත නිමැවුම ලබා දීමට ප්‍රදානය කරන්නාට නොහැකි වූ බැවින් තවත් මාස හයක | සැලසුම් අනුව ක්‍රියාත්මක නොවීම නිසා මෙම ව්‍යාපෘතියේ වැඩකටයුතු තවදුරටත් ප්‍රමාද වන බව තහවුරු වූ බැවින් 2019 වසරේ මැයි මස සිට බලපැවැත්වෙන |

| | | | | |
|---|---|---|---|---|
| | දක්වා දින දීර්ඝ කිරීම් පාලක මණ්ඩල විසින් අනුමත කර තිබුණ අතර අවසාන නිම කළ යුතු දිනය 2018 ඔක්තෝබර් 02 දින විය. රෝගීන් සඳහා ස්නායු නැවත පන ගැන්වීමේ අතක් සැකසීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වූ අතර එම අත අදාල රෝගීන්ගේ අවශ්‍යතාවයන් සඳහා සුදුසු දැයි පරීක්ෂා කිරීමට 2020 වර්ෂය අවසානය වන විටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | | දීර්ඝ කිරීමක් තාක්ෂණය පිළිබඳ ක්‍රියාකාරී කමිටුව විසින් නිර්දේශ නොකළේය. (දෙවන ඒකකයට අවශ්‍ය මෝටරය මිලදී ගැනීමට තැබූ ටෙන්ඩරය සඳහා මොරටුව විශ්වවිද්‍යාලයට මිල ගණන් ලැබී නොතිබූ බැවින් තවත් මාස හයක කාලයක් දීර්ඝ කළද වැඩ අවසන් කළ නොහැකි බව තාක්ෂණ කෘත්‍යාධිකාරී මණ්ඩලය සඳහන් කිරීම. | පරිදි මෙම ව්‍යාපෘතිය 1වන අදියරෙන් අවසන් කරන ලදී. ඒ අනුව 2 වන අදියර සඳහා ලබා දුන් මුදල් 2020 පෙබරවාරි 06 දින පියවා ඇත. පළමු අදියර මගින් සංවර්ධනය කරන ලද ඒකකය සාර්ථක වීම මත එය වැඩිදියුණු කිරීමට සහ රෝගීන් සඳහා එය පරීක්ෂා කිරීමට ප්‍රදානකරුට දැනුම් දී ඇත. |
| (ඉ) | ඉකුත් වර්ෂයේ මිළදී ගත් වසරක පමණක් වලංගු කාලයක් ඇති OFFICE 365 මෘදුකාංගයේ රු.5,786,158 ක් වූ වටිනාකම, අස්පෘශ්‍ය වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණු අතර 2020 වර්ෂයේදි ද රු.5,789,249ක් වියදම් කර එම මෘදුකාංගයේ බලපත්‍රය අළුත් කරගෙන තිබුණු අතර එම වියදම 2020 වර්ෂයේ පර්යේෂණ හා සංවර්ධන වියදමක් ලෙස ආදායම් හා වියදම් ගිණුමට ගිණුම් ගත කර තිබුණි. මෙවැනි මෘදුකාංගයක අවශ්‍යතාවය කුමක්ද යන්න පිළිබඳව විගණනයට සෑහීමකට පත්විය නොහැකි විය. | පර්යේෂණ හා සංවර්ධන වියදම් සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමේ අරමුණු වෙනුවෙන්ම එම ප්‍රතිපාදන යෙදවිය යුතුය. එමෙන්ම මෙම මෘදුකාංගයෙන් උපරිම ඵලදාවක් ලබා ගැනීමට හෝ සාධාරණ පිරිවැය අඩු වියදම් සහිත පැකේජයක් මිලදී ගැනීමට කටයුතු කළ යුතුය. | Office 365 A1 නම් වූ අධ්‍යාපන ආයතන වෙත නොමිලයේ ලබා දෙන අනුවාදය (version) සඳහා යොමු වී ඇත. කෙසේ වුවද මෙමගින් නොලැබෙන ආයතනයේ වැඩකටයුතු සඳහා අත්‍යාවශ්‍ය පහසුකම්හි අවශ්‍යතාවය සලකා බලා එම අවශ්‍යතාවය ඇති කාර්යය මණ්ඩලයක් සඳහා පමණක් ගෙවීම් කර අදාළ පහසුකම් ලබා දී ඇත. | වාර්ෂිකව දැරීමට සිදු වන බලපත්‍ර අළුත් කිරීමේ ගාස්තු සලකා බලා, Microsoft ආයතනය විසින් අධ්‍යාපන ආයතන සඳහා යම් යම් සීමාවන්ට යටත්ව නොමිලේ ලබාදෙන Office 365 Academic යෝජනා ක්‍රමයේ A1 අනුවාදය ලබා ගැනීම සඳහා ආයතනය අයදුම් කොට තිබූ අතර, 2020 වසරේ සැප්තැම්බර් මස මේ සඳහා අවසර හිමි වීමත් සමග ඒ සඳහා අනුගත විය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | | මෙකී A1 අනුවාදය තුල පරිගණකය තුල ස්ථාපනය කළ හැකි මෘදුකාංග නොලැබෙන බැවින් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාර්ය මණ්ඩලය සඳහා පමණක් සේවා අවශ්‍යතාවය මත ඉතා අඩු පිරිවැය සහිත මෙම යෝජනා ක්‍රමයේම A3 අනුවාදය, ගෙවීම් කර ලබා දී ඇත. |
| (ඊ) | ජාතික විද්‍යාපදනම විසින් 2018 මැයි මාසයේ සිට 2020 දෙසැම්බර් 31 දක්වා වන මාස 32 ක කාලපරාසය තුළ PED 2/2015අංක දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන වලට පටහැනිව දුරකථන දීමනා හිමි නිලධාරීන් 45 දෙනෙකු වෙත එකතු වටිනාකම රු.6,456,170ක් වූ මුදලක් සන්නිවේදන බිල්පත් වටිනාකම් පිළිබඳ අවධානය යොමු කිරීමෙන් තොරව අනුමත මාසික උපරිම සීමාවම ගෙවා තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතුය. | මෙම ක්‍රමවේදය මතභේදයට ලක්ව ඇති බැවින් මේ වන විට අල්ලස් හා දූෂණ සභාව විසින් විමර්ශනයක් පවත්වාගෙන යන අතර එහි තීරණය මත 2018 මැයි සිට 2020 දෙසැම්බර් දක්වා ගෙවීම් පිළිබඳ ඉදිරි පියවර ගනු ලැබේ. | 2018 මැයි මස සිට 2020 දෙසැම්බර් මස දක්වා වන කාලය තුල සන්නිවේදන දීමනාව ගෙවීම සම්බන්ධව අල්ලස් හා දූෂණ සභාවේ තීරණය මෙතෙක් ලැබී නොමැති අතර, එම තීරණයට අනුකූලව ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලැබේ. 2021 පෙබරවාරි මස සිට චක්‍රලේඛයට අනුකූලව සන්නිවේදන බිල්පත් ප්‍රතිපූර්ණය කරන ලද අතර ඒ සඳහා අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලබාගන්නා ලදී. |

| | | | | |
|---|---|---|---|---|
| (උ) | පර්යේෂණ ව්‍යාපෘති පිළිබඳ මාර්ගෝපදේශයේ 5.1 ඡේදය ප්‍රකාරව ප්‍රදානයක අර්ධ වාර්ෂික මූල්‍ය ප්‍රගතිය සෑම වසරකම ජූනි 15 දින හා දෙසැම්බර් 15 දින පදනම වෙත ඉදිරිපත් කිරීමද, නිමකළ පර්යේෂණ ව්‍යාපෘති වල අවසාන මූල්‍ය වාර්තාව සමඟ ඉතිරි මුදල් ව්‍යාපෘතිය නිම වී මාසයක් ඇතුළත පදනම වෙත නැවත පියවීමද සිදුකළ යුතු වුවත් එකතු වටිනාකම රු.8,282,388ක් වූ පර්යේෂණ ව්‍යාපෘති 13ක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. | මාර්ගෝපදේශය ප්‍රකාරව මූල්‍ය ප්‍රගතිය වාර්තා කිරීමෙන් බාහිර පාර්ශවයන් අත ඇති රජයේ ප්‍රදාන වහාම නැවත අයකර ගැනීමට කටයුතු කිරීමත් කළ යුතු වේ. | පියවීමට ඇති ඉතිරි මුදල් පියවන ලෙස ප්‍රතිලාභීන් දැනුවත් කර ඇත. සිහිකැඳවීම් යවා ඇත. | ව්‍යාපෘති වාර්තා නිමකර මාසයක් ඇතුළත අවසන් මූල්‍ය වාර්තාව සහ ඉතිරි මුදල් ලබාදීමට කටයුතු කරන ලෙස දන්වා සිහිකැඳවීම් නියමිත වේලාවට යැවීමත්, අවසන් වසර සඳහා ප්‍රතිපාදන ලබා දීමට අවශ්‍ය අවම මුදල් ප්‍රතිපාදන ප්‍රමාණය පමණක් ලබාදීමටත් කටයුතු කර ඇත. |
| (ඌ) | පදනමේ අනුමත කාර්යය මණ්ඩලය 144 ක් වන අතර පුරප්පාඩු පවතින තනතුරු ගණන 27 ක් විය. එම පුරප්පාඩු තනතුරු වලින් 16ක් වසර 07 ත් මාස 10 ත් අතර කාල පරාසයක සිට පවතින අතර එම පුරප්පාඩු සඳහා බඳවා ගැනිම් සිදු කිරිමට පදනම විසින් 2021 මාර්තු වන විටත් කටයුතු කර නොතිබුණි. | අවශ්‍ය තනතුරු සඳහා බඳවා ගැනීමේ පටිපාටියට අනුකූලව හැකි ඉක්මනින් බඳවා ගැනීම සහ එසේ කිරීමට අපහසුතා තිබේ නම් බඳවා ගැනීමේ පටිපාටිය සංශෝධනය කරවා ගැනීමට කටයුතු කළ යුතුය. | 2020 දෙසැම්බර් 31 දිනට පැවති පුරප්පාඩු වලින් එකක් 2021 බඳවා ගැනීම් සිදුකළ අතර අනෙකුත් සුදුසුකම් සහිත අයදුම්කරුවන් අයදුම් නොකිරීම, ජනාධිපතිවරණය හේතුවෙන් බඳවා ගැනීම් අහෝසි කිරීම, බඳවා ගත් අයදුම්කරුවන් සේවයට නොපැමිණීම, කොවිඩ් 19 වසංගත තත්ත්වය වැනි කරුණු හේතුවෙන් බඳවා ගැනීම් සිදු කිරීමට නොහැකි විය. | 2022 වර්ෂය තුල නව බඳවා ගැනීම් අධෛර්යමත්කර ඇති බැවින්, සේවා අවශ්‍යතාවය සලකා බලා තනතුරු 16 ක් පමණක් පිරවීමට අමාත්‍යාංශයේ අනුමැතිය ඉල්ලා ඇත. |

## 86. ජාතික ශිල්ප සභාව

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 - තතත්ත්වාගණනය කළ මතය

2019 - මතය වියාචනය

2020 - තතත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | හම්බන්තොට දිස්ත්‍රික්කයේ තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් කාවන්තිස්සපුර ග්‍රාමා නිලධාරී වසමේ හෙක්ටයාර් 16187 ක් වූ රජයේ ඉඩමෙහි කාවන්තිස්සපුර කර්මාන්ත ගම්මානය ආරම්භ කර තිබුණි. ඉඩම පවරා ගැනීම සඳහා එකතුව රු.1,656,869 ක් වැය කර තිබුණද, නීත්‍යානුකූල බදු ගිවිසුමක් අත්සන් කර පවරා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර, මෙම ගම්මානය ඵලදායී ආයෝජන කටයුත්තකට භාවිතා කර නොතිබුණි. | නීත්‍යානුකූල බදු ගිවිසුමක් අත්සන් කර ගම්මානය ඵලදායී ආයෝජන කටයුත්තකට භාවිතා කලයුතුය. | 2021 හම්බන්තොට කාවන්තිස්සපුර ගම්මානය නිෂ්පාදන ගම්මානයක් ලෙස ඉදිරියේදී පවත්වාගෙන යාමට සැළසුම් කර ඇති බව | 2021 වර්ෂය අවසානය දක්වා ඵලදායී ආයෝජනයකට යොදාගෙන නොමැත. |
| (ආ) | පුහුණු මධ්‍යස්ථාන සඳහා පහසුකම් සැපයීම වෙනුවෙන් වාර්ෂිකව ප්‍රතිපාදන වෙන් කිරීම අඩුකර තිබුණි. සඳහා සලසා තිබූ මුළු ප්‍රතිපාදනද වැය නොකර ඉතිරි වි තිබුණි. ශිල්ප සභාව සතුව පුහුණු මධ්‍යස්ථාන 112 ක් පැවතියද ඉන් මධ්‍යස්ථාන 41 ක පමණක් පුහුණු පාඨමාලා පවත්වා තිබුණි | ප්‍රතිපාදන උපරිම අයුරින් භාවිතා කිරීමටත් සියළුම මධ්‍යස්ථාන වල පුහුණුවීම් ක්‍රියාත්මක කිරීමටත් කටයුතු කල යුතුය | 2019ට සාපේක්ෂව 2020 වර්ෂයේ ප්‍රතිපාදන අඩු කල බවත් පුහුණු කරුවන් පුහුණු කිරීම සඳහා ප්‍රතිපාදන වෙන් කලද රටෙහි පැවැති තත්වය මත එම පුහුනුකිරීම් සිදු කිරීමට නොහැකි වූ බව. | තත්වය එසේම පවතී 2021 වර්ෂය තුළ සැලසුම් කරන ලද පුහුණු මධ්‍යස්ථාන 85ක් අතුරින් පුහුණු පාඨමාලා ක්‍රියාත්මක කර තිබුණේ පුහුණු මධ්‍යස්ථාන 56ක පමණි. වර්ෂය තුළ පුහුණු පාඨමාලා 70ක් ආරම්භ කර තිබුණි. ආරම්භයේදී ආධුනිකයින් 737 |

| | | | | |
|---|---|---|---|---|
| | | | | දෙනෙකු බඳවාගෙන තිබුණ ද 2021 සැප්තැම්බර් වන විට ආධුනිකයින් සංඛ්‍යාව 350 දක්වා පහත බැස තිබුණි. ඉන් පුහුණු පාඨමාලා 27ක් අවසානයේදී කිසිම පුහුණු ආධුනිකයෙකු බිහි කිරීමට සභාව අපොහොසත් වී තිබුණි. |
| (ඇ) | සීගිරිය හස්ත කර්මාන්ත ගම්මානයේ අලෙවි කුටි 18 ක් පැවති අතර, ඒවායින් අලෙවි කුටි 04 ක පමණක් ශිල්පීන් නිෂ්පාදන කටයුතු වල නිරතවී තිබුණි. අලෙවි කුටි විශාල ප්‍රමාණයක වහලය කැඩී ගොඩනැගිලි වලට හානි සිදු වී තිබූ අතර, ඒවා වල් බිහිවී සතුන් වාසය කරන බව නිරීක්ෂණය විය. සංචාරකයින් ආකරෂණය වන පරිදි ගම්මානය පරිපාලන හා කළමනාකරණය නොකිරීම නිසා ආදායම් නොමැති වීම මත ශිල්පීන් අලෙවි කුටි අතහැර ගොස් තිබූ අතර, මෙම වත්කම් නිසි පරිදි ඵලදායී කාර්යයන්ට යෙදවීමට සහ ඒවා ආරක්ෂා කර ගැනීමට සභාවේ වගකිව යුතු නිලධාරීන්ගේ අවධානය යොමු වී නොතිබුණි. | සංචාරකයින් ආකර්ෂණය වන ආකාරයට ශිල්පීන් සඳහා අලෙවි කුටි ලබාදී එය නඩත්තු කර පවත්වාගෙන යාමට කළමනාකරණ කටයුතු කළ යුතුය. | 2021 මාර්තු මාසය වනවිට Covid වසංගතය හේතුවෙන් සියලු කුටි වසා දමා ඇති බව 2021.02.03 දිනැති ලිපිය මඟින් සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන) විසින් දන්වා ඇත. එසේම 2020.06.30 සිට එවකට සිටි සභාපතිවරයා විසින් සියලු අලෙවි කුටි ලාභීන් ගම්මානයෙන් ඉවත් කර තිබුණි. | රජයේ හා පුද්ගලික හවුල්කාරිත්වය යටතේ සංවර්ධනය කිරීමට අමාත්‍යාංශ මට්ටමින් සැලසුම් කරමින් පවතී |

## 87. වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 - තතත්ත්වාගණනය නොකළ මතය

2019 - තතත්ත්වාගණනය නොකළ මතය

2020 - තතත්ත්වාගණනය නොකළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ජාතික කාර්මික අධ්‍යාපන ආයතනයේ කාර්යමණ්ඩලය 2009 ඔක්තෝබර් 12 දින වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයට අන්තර්ග්‍රහණය කිරීමේදී 2009 ජූලි 27 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක DMS/E4/47/2/280/1 දරන ලිපියට පටහැනිව නිලධාරීන් 10 දෙනෙකු දරන්නාට පුද්ගලික වන සේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II තනතුරේ පිහිටුවා තිබුණු අතර, එම නිලධාරීන්ගෙන් 6 දෙනෙකු මෙතෙක් එම තනතුර සඳහා අවශ්‍ය අවම සුදුසුකම් සම්පූර්ණ කර නොතිබුණි. එහෙත් වැටුප් විෂමතාවය ඉවත් කිරීම සඳහා පාලක මණ්ඩල තීරණයකට අනුව 2016 දෙසැම්බර් 05 දිනැති අංක 17/2016 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛය පදනම් කරගෙන 2016 ජනවාරි සිට 2019 සැප්තැම්බර් දක්වා හිඟ වැටුප්, අතිරේක දීමනා, අධ්‍යයන දීමනා, පර්යේෂණ දීමනා හා සංග්‍රහ දීමනා ලෙස එකතුව රු. 5,638,012 ක් ගෙවා තිබුණි. | තනතුරට අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් පසු නියමිත අනුමැතිය මත වැටුප් ගෙවීම කල යුතුය. | ඔවුන් කරන ලද ඉල්ලීමක් පාදක කර ගනිමින්, ඔවුන්ට අදාල වැටුප් පරිමාණය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ලබා දෙනතුරු 93 වන පාලක මණ්ඩලය මගින් අදාල පරිවර්තනය සිදුකිරීමට අවසර ලබා දී ඇත. | වැටුප් පරිවර්තනය සිදුකිරීමේ හැකියාව පිළිබඳව ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව වෙත යොමු කර ඇති අතර එම සිදුකරන ලද පරිවර්තන ක්‍රියාවලියේ දෝෂයක් හෝ සංශෝධනයක් වෙතොත් ඔවුන්ගේ උපදෙස් පරිදි ක්‍රියාකිරීමට යෝජිත බව සඳහන් කර ඇති අතර 2021 දෙසැම්බර් නියමිත අනුමැතීන් ලබාගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2017 ජනවාරි 03 දින පැවති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව විශ්වවිද්‍යාලය සඳහා වැඩපලක්, නේවාසිකාගාරයක් හා ආපනශාලාවක් ඉදිකිරීම සඳහා 2018 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා අයවැය මඟින් එකතුව රු.මිලියන 281.36 ක් වෙන් කර දී තිබුණද ඉන් උපදේශන ගාස්තු ලෙස රු.මිලියන 22.5 ක් පමණක් වැයකර තිබූ අතර 2020 වර්ෂය අවසාන වන විටත් ව්‍යාපෘතිය ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රතිපාදිත මුදල් උපරිම කාර්යක්ෂමතාවයකින් හා සඵලදායීතාවයකින් යුතුව භාවිතා කල යුතුය. | ඉදිකිරීම් කටයුත්තේ වෙනස්කම් සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර අමාත්‍ය මණ්ඩල සටහන අනුව 2021-2023 මධ්‍යකාලීන අයවැය රාමුව තුලින් සලසා ගන්නා ලෙස යෝජනා කර ඇත. | 2021 වර්ෂයේදී නව ප්‍රසම්පාදන කමිටුවක් පත් කර අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. |
| (ඇ) | විශ්වවිද්‍යාලයේ පීය ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව පෞද්ගලික ආයතනයක් වෙත රු.14,506,548ක මුදලකට 2019 සැප්තැම්බර් 10 දින ප්‍රදානය කර දින 60 ක් තුල වැඩ අවසන් කරන බව දන්වා 2019 සැප්තැම්බර් 12 වන දින අත්තිකාරම් ලෙස රු. 2,901,285 ක් ලබාගෙන තිබුණද 2021 වර්ෂය අවසානය දක්වාම වැඩ නිම කර නොතිබුණි. | ව්‍යාපෘතියේ වැඩ කටයුතු කඩිනමින් නිම කිරීමට කටයුතු කල යුතුය. | මේ වනවිට ඉතිරි වැඩ කටයුතු අදාල කොන්ත්‍රාත් ආයතනය විසින් සිදු කරමින් පවතින අතර මෙම ව්‍යාපෘතිය මෙම වර්ෂයේ දෙවන කාර්තුව අවසන් වීමට ප්‍රථම අවසන් කරන ලෙස දන්වා ඇත. | කොන්ත්‍රාත් ගිවිසුම අනුව ප්‍රමාද ගාස්තු අය කිරීමටත් ඉතිරි වැඩ 2021 දෙසැම්බර් 10 වැනි දිනට පෙර නිම කර ගැනීමට කටයුතු කරන බව දන්වා තිබුණද 2021 දෙසැම්බර් දක්වාම නිම කර නොතිබුණි. |
| (ඈ) | අනුමත කාර්යමණ්ඩලයට ඇතුළත් නොවූ උපදේශක තනතුරු 02 ක් සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව 2019 හා 2020 වර්ෂයන්හිදී කොන්ත්‍රාත් | නව තනතුරු ඇති කිරීමට හා බඳවාගැනීම් සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය ලබාගත යුතුය. | අවශ්‍යතාවය සලකා බලා පුරප්පාඩු කථිකාචාර්ය තනතුරු සඳහා කුසලතා සහිත පුද්ගලයන් බඳවාගන්නා තෙක් කොන්ත්‍රාත් පදනමින් මෙම උපදේශකවරුන්ගේ සේවය ලබාගැනීමට කටයුතු | කළමනාකරන සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව 2021 දෙසැම්බර් 31 වන විටත් එක් උපදේශකවරවයකු සේවයේ යොදවාගෙන |

| | | |
|---|---|---|
| පදනම මත නිලධාරීන් දෙදෙනෙකු බඳවාගෙන 2020 වර්ෂය අවසානය දක්වා රු.6,944,804ක දීමනා ගෙවා තිබුණි. | කරන ලදී. | තිබුණි. |

## 88. මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 - තත්ත්වාගණනය කළ මතය

2019 - තත්ත්වාගණනය නොකළ මතය

2020 - තත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික කොමිෂම ස්ථාපනය කිරීම අරමුණු කොටගෙන ජාතික සභාව පිහිටුවා වසර 15 ක් ගත වී ඇතත් කොමිෂමක් ලෙස ස්ථාපිත නොවීම හේතුවෙන් මෙම සභාවේ කාර්යයන් ඉටුකිරීමට නීතිමය බලතල ලැබී නොතිබුණු අතර විධිමත් කාර්ය මණ්ඩලයක් පත්කර ගැනීමට එය බාධාවක් තිබුණි. | මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික කොමිෂම ස්ථාපිත කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. | අමාත්‍ය මණ්ඩල අනුමැතිය සහිත නිර්දේශ අනුව පෙර පැවති පනත් කෙටුම්පත අමාත්‍යාංශ ලේකම් තුමා ප්‍රධාන විද්වත් මණ්ඩලයක සහභාගීත්වයෙන් 2021.06.15 වන දින සංශෝධනය කළ අතර එසේ සංශෝධනය කරන ලද කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කිරීමට අවශ්‍ය කටයුතු මේ වන විට අමාත්‍යාංශය මඟින් සිදු කරනු ලැබේ. | 2021 වර්ෂයේදීද ජාතික කොමිෂම ස්ථාපිත කර නොතිබුණි. |
| (ආ) | මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ කාර්යයන් ඉටු කිරීම සඳහා ප්‍රමාණවත් පුහුණු කාර්ය මණ්ඩලයක් අනුමත කරවාගෙන බඳවා ගැනීමට කටයුතු කර නොතිබූ අතර ප්‍රවාහන අමාත්‍යාංශයේ නිලධාරීන් 05 දෙනෙකුද, ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 05 දෙනෙකුද හා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ නිලධාරියෙකුද ලෙස නිලධාරීන් 11 දෙනෙකු අනුයුක්ත කර අදාළ රාජකාරි ඉටුකරගෙන යමින් පැවතුණි. | මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ කාර්යයන් ඉටු කිරීම සඳහා ප්‍රමාණවත් පුහුණු කාර්ය මණ්ඩලයක් අනුමත කරවාගෙන බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. | මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව සඳහා කාර්ය මණ්ඩලයක් අනුමත කරවා ගැනීම සම්බන්ධයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් ඉදිරිපත් කර ඇති නිර්දේශ වලට අදාළ වාර්තාව සකස් කරමින් පවතී. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට අනුමැතියට යවා ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඈ) | ශ්‍රී ලංකාව අත්සන්කරුවෙකු වන මාර්ග ආරක්ෂාව පිළිබඳ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ යෝජනා සම්මතයකට අනුව රජය විසින් ඉටුකළ යුතු කාර්යයක් ලෙස මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සම්පාදනය කර ක්‍රියාත්මක කිරීම නිර්දේශ කර තිබුණද මේ වන විටත් එවැනි ප්‍රතිපත්තියක් ස්ථාපිත කර නොතිබුණි. | මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සම්පාදනය කර ක්‍රියාත්මක කළ යුතුය. | ජාතික සභාව කොමිෂමක් බවට පත් කිරීමේ කටයුතු තවමත් නිම වී නැති බැවින් මෙම කාර්යය ඉටුකර ගත නොහැකි වී ඇත. | 2021 වර්ෂයේදීද මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සම්පාදනය කර නොමැත. |
| (ඇ) | හඳුනා නොගත් මෝටර් රථවලින් අනතුරට ලක් වූ පුද්ගලයින් සඳහා වන්දි ගෙවීම් යෝජනා ක්‍රමයේ උපදෙස් පත්‍රිකාව අනුව වන්දි ඉල්ලීම සඳහා ඉදිරිපත් වී තිබූ අයදුම්කරුවන්ට ප්‍රමාදයකින් තොරව වන්දි ලබදිය යුතු වුවද, මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවට 2018 වර්ෂයේ සිට 2019 දෙසැම්බර් දක්වා කාලය තුල ලැබී තිබුණු වන්දි අයදුම්පත් 06 ක් ඉදිරිපත් කළ දින සිට වර්ෂ 02 කුත් මාස 06 ක් ගත වී ඇතත් එම වන්දි ගෙවීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රමාදයකින් තොරව වන්දි ලබාදිය යුතුය. | ඉදිරියේදී වන්දි ගෙවීම සඳහා කාර්යක්ෂම ක්‍රමවේදයක් සැකසීමට කටයුතු කරනු ලබන බව. | දිගින් දිගටම වන්දි ගෙවීම් ප්‍රමාද වීම් නිරීක්ෂණය වේ |
| (ඉ) | 2017 අගෝස්තු 14 දිනැති ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ අංක NP/5P/5dg/17 දරන චක්‍රලේඛය ප්‍රකාරව තිරසර සංවර්ධන සැලැස්මක් සකස් කර | චක්‍රලේඛය ප්‍රකාරව තිරසර සංවර්ධන සැලැස්මක් සකස් කළ යුතුය. | මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව විසින් තිරසර සංවර්ධන ඉලක්කයන්ගෙන් මාර්ග ආරක්ෂණයට අදාලව අරමුණු 03 ක් හඳුනාගෙන ඇති අතර ඊට අදාළ | 2022 වර්ෂය සඳහාද තිරසර සංවර්ධන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | නොතිබුණි. | | ක්‍රියාකාරකම්ද සහිතව සභාවේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කරනු ලැබේ. | |
| (ඊ) | 2018 වර්ෂයේදී ක්‍රියාකාරී සැලැස්ම අනුමත නොවූ අයවැය ලේඛනයක් මත පදනම්ව පිළියෙල කර ඇති අතර ක්‍රියාකාරකම්වල අපේක්ෂිත ප්‍රතිඵලද දක්වා නොතිබූ අතර ව්‍යාපෘති 9 ක කටයුතු ක්‍රියාත්මක කර නොතිබුණි. | | | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කර නොමැතිබව හා ව්‍යාපෘති නිසි පරිදි ඉටු වී නොමැති බව 2018,2019 හා 2020 වර්ෂවලදී සිදුකල විගණනයේදී තහවුරු වූ අතර 2021 වර්ෂයේදීද කාර්යසාධනය ඉතා පහල මට්ටමක පැවතුණි. |
| (උ) | 2018 දෙසැම්බර් මස ජපන් පරිත්‍යාග ලෙස ලැබී තිබූ හා මිළදී ගෙන තිබූ රු.5,875,351 ක් වටිනා රියදුරු පුහුණු උපකරණවලින් රියදුරු පුහුණු කිරීම සාර්ථකව සිදුකර නොතිබූ අතර 2019 ජුනි 21 දිනෙන් පසු 2021 මාර්තු දක්වා පුහුණු කටයුතු නවතා දමා තිබීම හේතුවෙන් එම උපකරණ නිෂ්කාර්යව පැවතුණි. | අවශ්‍යතා හඳුනා ගෙන පවත්නා වත්කම් කාර්යක්ෂමව යෙදවීමට කටයුතු කල යුතුවීම. | මේ සඳහා වන ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට උපදෙස් ඉල්ලා ඇත. එම උපදෙස් ලැබීමෙන් පසුව ඉදිරි කටයුතු කරනු ලැබේ. | තවදුරටත් නිශ්කාර්යව පවතින අතර මෙම උපකරණ භාවිතා කරමින් ප්‍රයෝජනවත් ආයතනයකට ලබාදීමට හෝ කටයුතු කර නොතිබුණි. |

**89.	පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 - තතත්ත්වාගණනය කළ මතය

2019 - තතත්ත්වාගණනය නොකළ මතය

2020 - තතත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | විමර්ශන නිලධාරින් 406 ක් අධිකාරියේ එක් එක්දිස්ත්‍රික්ක කාර්යාල සඳහා අනුයුක්ත කිරීමේදී දිස්ත්‍රික්ක 08 ක නිලධාරින් 60 කගේ අතිරික්තයක්ද දිස්ත්‍රික්ක 16 ක නිලධාරින් 104 ක ඌනතාවයක් පවතින ලෙසට අනුයුක්ත කර තිබුණු අතර ඉන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට අනුයුක්ත කර තිබුණු විමර්ශන නිලධාරින් 9 දෙනෙකුගෙන් අධිකාරියේ කටයුතු ඉටු කර ගැනීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. | විමර්ශන නිලධාරින්ගෙන් අධිකාරියේ කටයුතු ඉටු කර ගැනීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස් කළ යුතුය. | වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 2021 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික්ක 10 ක විමර්ශන නිලධාරීන් 43 ක අතිරික්තයන් හා දිස්ත්‍රික්ක 10 ක විමර්ශන නිලධාරීන් 39 ක ඌනතාවයක් පැවතුණි. |
| (ආ) | 2003 අංක 09 දරන පාරිභෝගික අධිකාරි පනතේ සංශෝධන කටයුතු 2004 වර්ෂයේ ආරම්භ කර තිබුණු අතර 2020 වර්ෂය වන විට වසර 16 ක් ගත වී ඇතත් පනත සංශෝධන කටයුතු අවසන් වී නොතිබුණි. | පනත සංශෝධන කටයුතු නියමිත කාලසීමාව තුල නිම කළ යුතුය. | පනත සංශෝධනයේ අවසාන අදියර නිම කර ගැනීම සඳහා නිතී කෙටුම්පත් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා පවත්වා තිබුණි. | 2021 වර්ෂයේදීද පනත සංශෝධන කටයුතු අවසන් වී නොතිබුණි. |
| (ඇ) | පාරිභෝගිකයින්ට ක්ෂණික වෙළෙඳපොලේ මිලගණන් දැනගැනීමට සහ ක්ෂණික | පාරිභෝගික පැමිණිලි විසදීමේ කටයුතු කඩිනමින් අවසන් කල | ගන්නා ක්‍රියාමාර්ග පිළිබඳව අදහස් දක්වා නොතිබුණි. | 2021 දෙසැම්බර් 31 දින වන විට 2021 වර්ෂය සඳහා ලැබුණු |

| | | | | |
|---|---|---|---|---|
| | පැමිණිලි ඉදිරිපත් කිරීම සඳහා 1977 දුරකථන සේවාව 2013 වර්ෂයේදී ස්ථාපිත කර තිබුණු අතර, ඒ සඳහා රු.9,188,396ක වියදමක් දරා තිබුණි. ක්ෂණික ඇමතුම් සහන සේවාවට 2020 වර්ෂයේ මාර්තු සිට දෙසැම්බර් දක්වා මහජන පැමිණිලි 5,104 ක් ලැබී තිබූ අතර 2020 වර්ෂය අවසන් වන විටත් පැමිණිලි 3790 ක් සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. ඒ අනුව 2020 වර්ෂයේ මාස 10 ක කාලයක් සඳහා ලද පැමිණිලි වලින් සියයට 74 ක් සඳහා අදාල ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. අධිකාරිය විසින් 2020 වර්ෂයේ ජනවාරි, පෙබරවාරි මාස දෙකට අදාලව දත්ත ගබඩාවක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | යුතුය. | | පැමිණිලි 8056 න් පැමිණිලි 2646 ක් සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. |
| (ඇ) | නිවැරදි ප්‍රමිතියෙන් යුතු භාණ්ඩ පාරිභෝගිකයින්ට හඳුනා ගැනීමේ පහසුව සඳහා ක්‍රමවේදයක් සකස් කිරීමේ අරමුණින් 2014 ජනවාරි 24 දින SICPA Security Solutions Switzerland ආයතනය සමඟ ගිවිසුම් ගත වී ඇති අතර, අදාල ආයතනය සමඟ ගිවිසුම පරිදි ක්‍රියාත්මක නොවීම මත 2018 වර්ෂයේ ජාත්‍යන්තර වාණිජ මණ්ඩලය මේ සම්බන්ධයෙන් බේරුම්කරණයට ඉදිරිපත් වී | පනතේ නියමයන් ප්‍රකාරව කටයුතු කළ යුතුය. | වැලැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 2021 දෙසැම්බර් 31 දින වන විට බේරුම්කරණය සම්බන්ධව රු.22,162,690 ක් දරා තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | තිබුණි. මෙම නඩු කටයුත්ත සම්බන්ධව අධිකාරියේ අරමුදලින් රු.මිලියන 55 ක් දක්වා වියදම් පියවීම සඳහා අනුමැතිය ලැබී තිබුණි. 2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 49 (3) වගන්තියේ සඳහන් අරමුදලින් ගෙවිය හැකි වැය කිරීම් පිළිබඳ නියමයන් දක්වා තිබුණ ද එම නියමයන් ඉක්මවා යමින් 2020වර්ෂයේ රු.මිලියන 55 ක වියදම් ප්‍රතිපූරණය සඳහා අනුමැතිය ලබා දී තිබුණු අතර ඒ අනුමැතිය මත ඉහත බේරුම්කරණය සම්බන්ධව රු.22,162,690 ක වියදමක් අරමුදල විසින් 2020 ජූලි සිට දෙසැම්බර් දක්වා දරා තිබුණි. | | | |
| (ඉ) | 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනතේ 61(3) වගන්තිය අනුව 2020 වර්ෂයේ පරීක්ෂා කරන ලද සාම්පල් 299 ක් අතුරින් සාම්පල් 112 ක් නියමිත ප්‍රමිතියෙන් හා පිරිවිතරයන්ගෙන් තොර බව තහවුරු කර තිබියදීත් නියමිත ප්‍රමිතයෙන් හා පිරිවිතරයන්ගෙන් තොර භාණ්ඩ තහනමට ගෙන රඳවා තබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ලිපියක් මඟින් අදාල නිලධාරියාට උපදෙස් ලබා දී තිබුණි. | 2021 වර්ෂය අවසානය දක්වාත් තත්ත්වය විසඳී නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඊ) | පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අනුමත කාර්ය මණ්ඩලය 667 ක් වන අතර තත්‍ය සේවක සංඛ්‍යාව 531ක් වූයෙන් පුරප්පාඩු තනතුරු 136 ක් පැවතුණි. 2020 වර්ෂයේ තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා වරින්වර පුවත්පත් දැන්වීම් පල කිරීම සඳහා රු.831,222ක් වැයකර තිබුණද 2021 පෙබරවාරි 22 වන විටද පුරප්පාඩු තනතුරු 3 ක් පමණක් පිරවීමට කටයුතු කර තිබුණි. එසේම විනය ක්‍රියාමාර්ග මත වැටුප් විලම්භනය කිරීම්, කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් නොවීම වැනි අඩුපාඩු පැවතියදීත් 2019 ඔක්තෝම්බර් 01 දින ජ්‍යෙෂ්ඨ විමර්ශන නිලධාරීන් 04 දෙනෙකු සඳහා පත්වීම් ලබා දී තිබුණු අතර අතිරේක/වෘත්තිය සුදුසුකම් සඳහා ලබාදුන් ලකුණු ප්‍රමාණයන් සම්බන්ධයෙන්ද නිර්ණායකයන් සකස් කර නොතිබුණි. | ජ්‍යෙෂ්ඨ විමර්ශන නිලධාරීන් පත්කිරීම සම්බන්ධව විමර්ශන කටයුතු කඩනමින් නිම කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කල යුතුයි. | පැහැදිලි කිරීම් ඉදිරිපත් කර තිබුණි. | 2021 වර්ෂය අවසානය දක්වාත් තත්ත්වය විසදී නොතිබුණි. |

## 90. ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 - තතත්ත්වාගණනය කළ මතය

2019 - තතත්ත්වාගණනය කළ මතය

2020 - තතත්ත්වාගණනය නොකළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය සහ ආයතනික අංශවල සිසුන් හා අධ්‍යයන කාර්යමණ්ඩලයට ඔවුන්ගේ දේශනවලට අදාළ තොරතුරු ලබාගැනීමට අදාළ අන්තර්ජාල පහසුකම් සපයා ගැනීම වෙනුවෙන් Lanka Education and Research Network (LEARN) ආයතනයට 2018 වර්ෂය තුළ රු.මිලියන 2.7 ක මුදලක් ගෙවා තිබුණද එම ආයතනයෙන් සපයා ගෙන තිබූ අන්තර්ජාල සේවාවේ පැවති මන්දගාමී බව හේතුවෙන් අමතර මුදලක් වැය කොට ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයෙන්ද අන්තර්ජාල පහසුකම් ලබා ගෙන තිබූ අවස්ථා නිරීක්ෂණය විය. මේ අනුව LEARN ආයතනය වෙත වර්ෂය තුළ ගෙවා ඇති මුදල නිශ්කාර්ය වියදමක් වී තිබුණි. | පිරිවැය අවම වන පරිදි කාර්යක්ෂම සේවාවක් සපයා ගත හැකි අන්තර්ජාල පහසුකම් ආයතනයක් තෝරා ගැනීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු කළ යුතුය. | Learn අන්තර්ජාල සේවාවේ වේගය ප්‍රමාණවත් නොවන නිසා සිසුන්ගේ හා කථිකාචාර්යවරුන්ගේ භාවිතයට 20Mbps දක්වා වැඩි කිරීමට දැනටමත් ක්‍රියා මාර්ග යොදා ඇත.<br>මේ වන විට බදුල්ල උසස් තාක්ෂණ ආයතනය වෙත එම පහසුකම් ලබා දී ඇත. | මේ වනවිට ආයතනය අන්තර්ජාල සබඳතා 4ක් ලබාගෙන ඇති බවත් ඒ සම්බන්ධව දැනුම ඇති කමිටුවක් මගින් නිරීක්ෂණ කැඳවා එම වාර්තාවට අනුව අදාල පියවර ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. |
| (ආ) | නීත්‍යානුකූලව අයිතිය පවරා නොගත් ඉඩමක යාපනය උසස් තාක්ෂණ ආයතනයේ සිවිමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා ආයතනය විසින් පෞද්ගලික ඉදිකිරීම් | ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට ප්‍රථම ඉඩමේ නිරවුල් භාවය පිළිබඳ සනාථ කිරීමක් කරගත යුතු අතර ශාඛා කාර්යාල පවත්වා ගෙන යනු | මෙම ඉඩම් පැවරීම තවමත් අවසන් වී නොමැති අතර, ඒ සම්බන්ධයෙන් කටයුතු ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් තවදුරටත් සිදු කරමින් පවතී. | යාපනය උසස් තාක්ෂණ ආයතනය පිහිටුවීමට අදාල ඉඩම සම්බන්ධ නඩුව 2021 දෙසැම්බර් 31 දක්වාම අවසන් වී නොමැති |

| | | | | |
|---|---|---|---|---|
| | කොන්ත්‍රාත්තු සමාගමක් වෙත 2016 නොවැම්බර් 10 වන දින රු.36,988,498 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදලක් ගෙවා තිබූ අතර 2017 ජූලි 24 දින නිම කර තිබූ කාර්යයන්ට අදාළව රු.12,956,179ක් වූ බිල්පතක් පමණක් ඉංජිනේරුවරයා විසින් සහතික කර තිබුණි. එහෙත් ඉඩමෙහි හිමිකරු විසින් ආයතනයට එරෙහිව යාපනය දිස්ත්‍රික් උසාවියේ පවරා තිබූ නඩුවේ තීරණයක් මත 2017 මාර්තු 09 වන දින සිට අදාළ ඉඩමට ඇතුළුවීම ද උසාවිය විසින් තහනම් කර තිබුණි. තවද උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතන පවත්වා ගෙන යනු ලබන ලබුදූව, මහනුවර (අම්පිටිය ඉඩම), අම්පාර, අනුරාධපුරය, මඩකලපුව, වවුනියාව, බදුල්ල (නව ඉඩම), රත්නපුර (නව ඉඩම), නාවලපිටිය හා ත්‍රිකුණාමලය (නව ඉඩම) යන ප්‍රදේශවල ගොඩනැගිලි ඉදිකර තිබුණ ද එම ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය ආයතනයට පවරා ගැනීමට දක්වාම කටයුතු කර නොතිබුණි. | ලබන ඉඩම්වල අයිතිය නියමානුකූල කිරීමේ කටයුතු කඩිනම් කළ යුතුය. | | බවත් එම නඩුව අවසන් වීමත් සමග ඉඩම නීත්‍යානුකූලව පවරා ගැනීම සම්බන්ධ ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට අපේක්ෂා කරන බවත් දන්වා ඇත. එසේම අනෙකුත් ඉඩම් සම්බන්ධවද නියමානුකූල කිරීම සඳහා කඩිනම් පියවර ගනිමින් පවතින බව දන්වා ඇත. |
| (ඇ) | ගම්පහ උසස් තාක්ෂණ ආයතනයේ පවත්වා ගෙන යනු ලබන කෘෂිකර්ම උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව සඳහා පළමු වසර හා දෙවන වසර | සිසුන්ට ප්‍රායෝගික පුහුණුව ආයතනය තුළදීම ලබා ගැනීමට හැකි වන අයුරින් සත්ව පාලන ඒකකය නැවත | දැනට මේ වන විට ගොවිපළ කලමණාකරුවෙකු සේවයේ යෙදෙන අතර, ඉදිරියේදී ගොවිපල සුළු පරිමාණයෙන් ළමුන්ගේ ප්‍රායෝගික | අත්හැර දමා ඇති සත්ත්වපාලන ඒකකය 2021 දෙසැම්බර් 31 දක්වාම විධිමත් පරිදි නැවත සක්‍රියව |

| | | | | |
|---|---|---|---|---|
| | සිසුන් වෙනුවෙන් පිළිවෙළින් පැය 126 ක් ප්‍රායෝගික පුහුණුව ලබා දිය යුතුය. එම ප්‍රායෝගික පුහුණුව ලබාදීම සඳහා 2017 වර්ෂය දක්වා එහි පැවති සත්ව පාලන ඒකකයේ සතුන් විකුණා දමා තිබීම හේතුවෙන් ආයතනයේ සිට කිලෝමීටර් 16 ක් ඇතින් පිහිටි පෞද්ගලික ගොවිපොලක් වෙත සිසුන් රැගෙන යාමට සිදුවී තිබුණි. නව සතුන් මිලට ගෙන එම ඒකකය ක්‍රියාකාරී කිරිමට කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි. | ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුය. | පුහුණුවට අවශ්‍ය ආකාරයෙන් සතුන් නැවත යොදාගෙන සක්‍රීයව පවත්වා ගෙන යාමට ගොවිපල කමිටුවේ නිර්දේශ ලබාගැනීමට කටයුතු කරමි. | පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ස්ථිර සේවයේ යෙදී සිට එම සේවයෙන් නිදහස් කර ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරට පත් කර තිබූ මහාචාර්යවරයෙකු, පවිත්‍රතා සේවා ප්‍රසම්පාදනයට අදාළ ප්‍රසම්පාදන නීතිරීති හා මුදල් රෙගුලාසි උල්ලංඝනය කිරීම සම්බන්ධව 2018 වර්ෂයේදී චෝදනාවට ලක් වීම හේතුවෙන් එම නිලධාරියා තාවකාලිකව එම ධූරයෙන් ඉවත් කිරීමට කටයුතු කර තිබුණ ද ඔහුට එරෙහිව අදාළ විනය ක්‍රියාමාර්ග ගැනීමේ කටයුතු වාර්තාවේ දින දක්වාම අවසන් කර නොතිබුණි. | ප්‍රසම්පාදන නීතිරීති හා මුදල් රෙගුලාසි උල්ලංඝනය කර ඇති මෙම නිලධාරියා සම්බන්ධ අදාළ විනය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම කඩිනම් කළ යුතුය. | කළමනාකරණයේ අදහස් දක්වා නොමැත. | ඔහුගේ විනය බලධාරියා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උපකුලපති වරයා වන බවත් ඔහු සම්බන්ධව විධිමත් විනය පරීක්ෂණයක් පවත්වා මේ වන විට පරීක්ෂණ කටයුතු අවසන් වී තිබුණද ඒ සම්බන්ධ පිළිතුරු ආයතනය වෙත ලබාදී නොතිබූ බව විගණනය වෙත දන්වා එවා තිබුණි. |
| (ඉ) | දෙහිවල උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ වැසිකිළි පද්ධතියකට අදාල | ව්‍යාපෘති අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගැනීමෙන් පසුව | ආයතනයේ අවශ්‍යතාවය මත මෙම වැසිකිළි පද්ධති ව්‍යාපෘතිය ක්‍රියාවට නංවන ලද | අත්තිකාරම් පියවා ගැනීම සම්බන්ධව විකල්ප |

| | | | | |
|---|---|---|---|---|
| | කොන්ත්‍රාත්තුව පෞද්ගලික කොන්ත්‍රාත්කාර ආයතනයක් වෙත රු. මිලියන 9.6 කට 2017 මාර්තු 07 දින ප්‍රදානය කර තිබුණි. එසේ වුවත් එම ආයතනය විසින් අත්තිවාරම් දැමීම පමණක් සිදුකර 2018 වර්ෂයේ දී ඉදිකිරීම් කටයුතු අතහැර දැමීම හේතුවෙන් එම ආයතනයට ගෙවා තිබුණු රු.මිලියන 2.5 ක මුදල ආයතනයට නිශ්කාර්ය වියදමක් වී තිබුණි. | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට පෙර ශක්‍යතා අධ්‍යනයක් කර සැලසුම්වලට අනුකූල වන පරිදි ව්‍යාපෘතිය ආරම්භ කර ක්‍රියාත්මක කළ යුතුය. | අතර ආයතනයේ මායිම් තාප්පය අසල පදිංචි ප්‍රදේශවාසීන්ගේ පැවති දැඩි විරෝධය මත ව්‍යාපෘතිය නතර කිරීමට සිදුවිය. | කියාමාර්ගයනි 2021 වර්ෂයේදීද ගෙන නොතිබුණි. |
| (ඊ) | 21 වන සියවස සඳහා වූ උසස් අධ්‍යාපන ව්‍යාපෘතිය යටතේ රු. මිලියන 113.8 ක් වැයකර මහල් 5 න් මහල් 3 ක් පමණක් නිමකර දෙහිවල උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ නායකත්ව ගුණාංග සංවර්ධන මධ්‍යස්ථාන ගොඩනැගිල්ල 2017 පෙබරවාරි 21 දින ආයතනයට භාරදී තිබුණි. එසේ වුවද ඉතිරි මහල් දෙකේ වැඩ නිම නොකිරීම හේතුවෙන් මෙම ගොඩනැගිල්ල 2021 වර්ෂයේදීද නිෂ්කාර්යව පැවති අතර එම ගොඩනැගිල්ලේ සවිකර ඇති උපකරණවල, වගකීම් කාලයද ඉකුත් වී ගොස් තිබුණි. | මහල් 3 ක ඉදිකිරීම් කටයුතු නිම කොට මේ වනවිට වසර 04 කට ආසන්න කාලයක් ගත වී ඇති බැවින් ගොඩනැගිල්ල ජලය භාවිතයට ගත හැකි තත්ත්වයට නිමකර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කල යුතුය. | යෝජිත ව්‍යාපෘතිය භාවිතයට ගැනීමට නම් ව්‍යාපෘතියේ දෙවන අදියර අවසාන කල යුතුව තිබුණි. මන්ද යත් මෙහි මුල් මහල් තුනට අදාළ ඇතැම් කටයුතු සෙසු මහල් ඉදිකිරීමේදී සිදු කල යුතුව තිබුණි. එසේ කළ යුතු කටයුතු අතර බාහිර බිත්ති තෙත් නිවාරනය කිරීම, භාහිර බිත්ති වල තීන්ත ආලේප කිරීම, විදුලි සෝපාන විවරය ආවරණය කිරීම හා විදුලි සෝපානය සවිකිරීම, අභ්‍යන්තර පිය ගැට පෙළ ඉදිරියට කරගෙන යාම හා ඒ හරහා ගොඩනැගිල්ල අභ්‍යන්තරයට ජලය ගලා ඒම වැලැක්වීම දැක්විය හැක. | |
| (උ) | දෙහිවල උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ විදුලි වියදම අවම කර ගැනීමේ අරමුණින් සූර්ය බලශක්ති | ආයතනවල සූර්යබල ශක්ති පද්ධති ස්ථාපිත කිරීමට අදාළ කටයුතු සිදුකරගෙන යාමේදී ඊට | මේ හා සමාන තවත් ව්‍යාපෘති 04 ක් මීට සමගාමීව ක්‍රියාවට නැංවූ අතර ගාල්ල, මහනුවර, අම්පාර, ගම්පහ හා දෙහිවල | විදුලි සම්බන්ධතාවය ලබා ගැනීමේ කටයුතු මූලික ප්‍රසම්පාදන අවස්ථාවේ පවතින |

| | | | |
|---|---|---|---|
| පද්ධතියක් සවිකිරීමේ මූලික කාර්යය නිම කිරීම වෙනුවෙන් රු.මිලියන 19.8ක් 2019 ජුනි 07 දින කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණ ද තොග විදුලි සම්බන්ධතාවය ලබා ගැනීමට 2021 සැප්තැම්බර් 30 දක්වාම අපොහොසත් වී තිබීම හේතුවෙන් පද්ධතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි. 2019 ජුනි සිට 2020 දෙසැම්බර් දක්වා වූ කාලපරිච්ඡේදය වෙනුවෙන් ආයතනය විදුලි වියදම් වෙනුවෙන් රු.මිලියන 2.5 ක වියදමක් ද දරා තිබුණි. | සමගාමීව තොග විදුලි සබඳතා ලබා ගැනීමේ කටයුතු ද සැලසුම් කල යුතුය. | උසස් තාක්ෂණ ආයතන ආශ්‍රිතව මෙම ව්‍යාපෘති 05 ක්‍රියාත්මක විය. මහනුවර, අම්පාර හා ගාල්ල උසස් තාක්ෂණ ආයතනවල සූර්ය බල ශක්ති පද්ධති මේ වන විට සාර්ථකව ක්‍රියාකාරී තත්ත්වයේ පවතී. | බැවින් සූර්ය බලශක්ති පද්ධතිය 2021 දෙසැම්බර් 31 දක්වාම අක්‍රිය තත්ත්වයේ පැවතුණි. |

## 91. පොල් සංවර්ධන අධිකාරිය

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 - තතත්ත්වාගණනය කළ මතය

2019 - තතත්ත්වාගණනය කළ මතය

2020 - තතත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව වෙතින් අධිකාරිය වෙත වසර ගණනාවක සිට අයවිය යුතු රු.7,060,032 ක මුදල ඉදිරියේදී පැවැත්වීමට නියමිත වැඩසටහන් සඳහා හිලව් කිරීමට රූපවාහිනී සංස්ථාව විසින් 2016 වර්ෂයේදී එකඟ වී තිබියදී එසේ හිලව් කිරීමට කටයුතු නොකර සිංහල අලුත් අවුරුදු උත්සවය වෙනුවෙන් 2018 අප්‍රේල් මස ප්‍රචාරය කරන ලද රූපවාහිනී වැඩසටහන් වෙනුවෙන් රු.1,524,900 ක් මුදලින් ගෙවා තිබුණි. | දිර්ඝ කාලයක සිට අයවිය යුතු මුදලක් බැවින් එය අය කර ගැනීමට හෝ ඒ වෙනුවට වෙනත් වැඩසටහනක් පැවැත්වීමට හෝ කටයුතු කළ යුතුය. | තත්පර 30 බැගින් වූ වෙළඳ දැන්වීම් 02 ක් 2022 මාර්තු මස සිට ප්‍රචාරය කිරීමට රූපවාහිණී සංස්ථාවට දැනුම් දී ඇත. | මු2021 වර්ෂයේදීද මුදල පියවා නොතිබුණි. |
| (ආ) | අධිකාරිය විසින් පොල් ගෙඩි වෙන්දේසිය සඳහා අන්තර්ජාලය මඟින් ලංසු තැබීමට අදාළ කාර්යයන් සම්පූර්ණ කිරීම පිණිස පුද්ගලික සමාගමක් වෙත 2013 සිට 2016 දක්වා රු.1,018,100 ක් ගෙවා තිබුණ ද අන්තර්ජාලය හරහා වෙන්දේසිය ක්‍රියාත්මක නොවීම හේතුවෙන් එය නිෂ්කාර්යය වියදමක් බවට පත්ව තිබුණි. | අන්තර්ජාලය භාවිතා කිරීම සඳහා පවතින ගැටලු නිරාකරණය කර මෙය කඩිනමින් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. | මෙම මෘදුකාංගය අදාළ යාවත්කාලීන කිරීම් සමඟ භාවිතා කිරීමේ හැකියාව අධ්‍යනය කරමින් පවතී. | අන්තර්ජාලය හරහා වෙන්දේසිය ක්‍රියාත්මක නොකිරීමෙන් වියදම නිෂ්කාර්යය වී තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඈ) | ගබඩාවෙන් නිකුත් කර ඇති රු.6,084,957 ක් වටිනා ස්ටිකර් 3,529,795 කින් මෝල් හිමියන් වෙත විකුණා තිබූ ස්ටිකර් ප්‍රමාණය 1,271,834 ක් වීමෙන් 2018 දෙසැම්බර් 31 දිනට ඉතිරි ස්ටිකර් ප්‍රමාණය 2,257,961 ක් විය යුතු වුවද, සැකසුම් අංශයේ ගබඩා කර තිබූ ඉතිරි ස්ටිකර් ප්‍රමාණය 1,069,393 ක් පමණක් වීමෙන් රු.1,402,507 ක් වටිනා ස්ටිකර් 1,188,568 ක ඌනතාවයක් පැවති අතර ඒ පිළිබඳව අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | ස්ටිකර්වල ඌනතාවය පිළිබඳව පරීක්ෂාවක් සිදු කර ඒ පිළිබඳව විගණනයට වාර්තා කළ යුතුය. | ලේබල් තොග සම්බන්ධ දත්ත පද්ධතියක් සකස් කර පසුගිය වසරවල දත්ත ඇතුළත් කරමින් පවතී. එය අවසන් වනවිට ඒ පිළිබඳ සියලුම තොරතුරු වාර්තා කළ හැක. | ඌනතාවය පිළිබඳව අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණි. |
| (ඇ) | අධිකාරියේ ලියාපදිංචි මෝල්හිමියන්ගේ නිෂ්පාදන වෙළඳපොළට ඉදිරිපත් කිරීමේදී ඒවායේ යෙදීම සඳහා 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා අනු අංක සහිත ස්ටිකර් ආකාර ලේබල් මුද්‍රණය කිරීමේදී ලියාපදිංචි මෝල් හිමියන්ගේ නිෂ්පාදන ධාරිතාවය හා ඉදිරි අවශ්‍යතාව සලකා බැලීමකින් තොරව ස්ටිකර් මුද්‍රණය කිරීම නිසා රු.9,262,700 ක් වටිනා ස්ටිකර් 5,017,133 ප්‍රමාණයක් භාවිතයට නොගෙන ප්‍රධාන ගබඩාවේ හා සැකසුම් අංශයේ ගබඩා කර ඇති බව නිරීක්ෂණය විය. | පවතින ස්ටිකර් තොග විධිමත් පරිදි ගබඩා කර තබා නිෂ්පාදකයන් වෙත නිකුත් කිරීම කඩිනම් කළ යුතු අතර එම ස්ටිකර් අවභාවිතා වීම වැළැක්වීමට අවශ්‍ය ආරක්ෂක ක්‍රියාමාර්ග ගත යුතුය. | 2022 පෙබරවාරි වන විට රු.7,872,868 ක් වටිනා ලේබල් 3,936,434 ක් ඉතිරිව ඇති අතර එය ඉදිරි වර්ෂ 04 ඇතුළත නිකුත් කර අවසන් කිරීමට අපේක්ෂිතය. | 2017 – 2021 අතර කාලය තුළ නිකුත් කර ඇති ලේබල් ප්‍රමාණය 1,634,682 ක් වීමෙන් භාවිතය කඩිනම් කළ බවට නිරීක්ෂණය නොවේ. |
| (ඉ) | “දිසිදි” පොල් මෝල් හිමියන්ට සපයන සේවා සඳහා නිසි පරිදි ඉන්වොයිස් නිකුත් කර | “දිසිදි” පොල් මෝල් හිමියන්ට සේවා සැපයීම සම්බන්ධයෙන් පවත්නා | මේ සම්බන්ධව සිදු කරන අභ්‍යන්තර විගණන පරීක්ෂණයේ වාර්තාව අනුව | “දිසිදි” පොල් මෝල් හිමියන්ට සේවා සැපයීම හා ආදායම් |

| | | | | |
|---|---|---|---|---|
| | නොතිබීම, ණයගැති ලෙජරයක් පවත්වා නොතිබීම, මුදල් අයකර ගැනීමේ හා බැංකුවට ඍජුව බැර කරන මුදල් හඳුනා ගැනීමේ නිසි ක්‍රමවේදයන් නොතිබීම යනාදී කරුණු හේතුවෙන් 2020 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු බවට ගිණුම්ගත කර තිබුණු රු.4,199,681 ක ණයගැතියන් හා ඊට අදාළව වර්ෂය තුළ හඳුනාගෙන තිබුණු රු.8,996,305 ක ආදායමෙහි නිවැරදිතාවය තහවුරු කරගත නොහැකි විය. | අභ්‍යන්තර පාලන පද්ධතියේ පවත්නා දෝෂ මගහරවා ගැනීම පිණිස වහා ක්‍රියා කළ යුතුය. | ඉදිරි කටයුතු සිදු කෙරේ. | ඉපැයීම සම්බන්ධයෙන් විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් ස්ථාපිත කර නොතිබුණි. |
| (ඊ) | බ්‍රිටිෂ් සිලෝන් කම්පනි ලංකා සමාගමට (BCC) 1985 වර්ෂයේදී පොල් තෙල් මිල ස්ථායිකරණ අරමුදලෙන් ලබා දී තිබූ පොලී සහිත ණය රු.26,715,037 ක් හා 2002 හා 2004 වර්ෂයන්හිදී ප්‍රාග්ධන සංවර්ධන අරමුදලින් ලබා දී තිබූ පොලී රහිත ණය රු.31,550,000 ක් වශයෙන් එකතුව රු.58,265,037 ක ණය මුදල, රු.52,150,917 ක පොලිය සමඟ අය කර ගැනීමට ඵලදායී ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අයවිය යුතු ණය හා පොලී අයකර ගැනීමට නිසි ක්‍රියාමාර්ග ගත යුතුයි. | අයවිය යුතු ණය හා පොලී අයකර ගැනීමට වසර ගණනාවක සිට විවිධ අමාත්‍යාංශ යටතේ සාකච්ඡා පවත්වා මහා භාණ්ඩාගාරය වෙත ලිඛිතව දන්වා ඇත. BCC සමාගම මෙම මුදල ගෙවීමට කටයුතු කරන බව දන්වා ඇත. . | 2021 වර්ෂයේදීද ණය මුදල අය කර ගෙන නොතිබුණි. |
| (උ) | 2018 හා 2019 වර්ෂවලදී "දිසිදි" පොල් නිෂ්පාදන මෝල් 32 කින් හා පොල් කිරි නිෂ්පාදන ආයතන 14 කින් අයවිය යුතු රු.1,376,631 ක් | අයවිය යුතු මුදල් නොපමාව අය කර ගැනීමටත්, පරීක්ෂණයන් සිදු කිරීමට පෙර අදාළ | යම් ප්‍රමාදයක් තිබුණද අදාළ සියලුම මුදල් අයකර ගැනීම අනිවාර්යෙන්ම සිදු කෙරෙනු ඇති බව වාර්තා කර ඇත. | 2021 වර්ෂයේදීද අයකර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ගාස්තු ලබා ගැනීමටත් ක්‍රියා කළ යුතුය. | | |
| (ඖ) | ජය ඉසුර ණය ලබාදීම සඳහා 2015 හා 2020 වර්ෂ අතර කාලයේදී මොල් සංවර්ධන අරමුදලට පොල් තෙල් මිල ස්ථායිකරණ අරමුදලෙන් රු.76,277,972ක් ද, රජයෙන් රු.123,000,000 ක් ද වශයෙන් ලබාගෙන තිබුණු එකතුව රු.199,277,972 ක ණය මුදල් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ලබාගෙන ඇති ණය මුදල් නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. | නිරවුල් කිරීමේ අවශ්‍යතාවයක් පැන නැගී නොමැති බව වාර්තා කර ඇත. | ගෙවිය යුතු ණය වශයෙන් මොල් සංවර්ධන අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර ඇති අතර මුදල් නිරවුල් කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. |
| (ක) | තැඹිලි ප්‍රවර්ධන කටයුතු සඳහා පොල් වගාකිරීමේ මණ්ඩලයට ගෙවිය යුතු තැඹිලි අපනයන සේවා ගාස්තු ආදායමෙන් සියයට 40 ක් වූ රු.21,802,011 ක මුදලක් වසර දෙකකට වඩා වැඩි කාලයක සිට නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ගෙවිය යුතු මුදල් නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. | තැඹිලි ප්‍රවර්ධනය සඳහා වූ මුදල් පොල් වගාකිරීමේ මණ්ඩලයට ලබාදීම වෙනුවට පොල් හා තැඹිලි වගාකරුවන් සඳහා ලබාදීමට තීරණය කර ඇත. | 2021 වර්ෂයේදීද නිරවුල් කර නොතිබුණි. |
| (ඛ) | කොහු කර්මාන්තය සංවර්ධනය සඳහා අදාළ පාර්ශවයන් පුහුණු කිරීමේ අරමුණින් 2006 වර්ෂයේදී ආරම්භ කර තිබුණු දූන්කන්නාව කොහු සංවර්ධන හා පුහුණු මධ්‍යස්ථානයේ කටයුතු සේවක හිඟය හා යන්ත්‍රෝපකරණ අලුත්වැඩියා නොකිරීම හේතුවෙන් 2020 පෙබරවාරි මස සිට නතර කොට දමා තිබුණි. මේ නිසා 2019 හා 2020 වර්ෂයන්හි රු.1,586,383 ක් වැය කර සිදු කළ | මධ්‍යස්ථානය පිහිටුවීමේ අරමුණ ඉටුකර ගැනීම සඳහා අප්‍රමාදීව කටයුතු කළ යුතුය. | පුහුණු මධ්‍යස්ථානයේ උපකරණ අලුත්වැඩියා කර පුහුණු පාඨමාලා පැවැත්වීමට විධිමත් ක්‍රමවේදයක් සකස් කර ඇත. | 2021 වර්ෂයේදීද කටයුතු ආරම්භ කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | පුණරුත්ථාපනය කිරීම් ඇතුළුව ගොඩනැඟිලි, යන්ත්‍ර සූත්‍ර හා ලී බඩු උපකරණ නිෂ්කාර්යව විනාශවීමේ අවධානමකින් යුතුව පැවතුණි. | | | |
| (ඔ) | 1971 අංක 46 දරන පොල් සංවර්ධන අධිකාරි පනත ප්‍රකාරව ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරනු ලබන හෝ අපනයනය කරනු ලබන පොල් නිෂ්පාදනවල ගුණාත්මකභාවය පවත්වාගෙන යාමේ අධිකාරිය සතු කාර්යභාරය ඉටු කිරීම සඳහා ප්‍රමිතියෙන් යුතු පොල්තෙල් නිෂ්පාදනය හා ප්‍රමිතියෙන් යුතු පොල් තෙල් පාරිභෝගිකයන් වෙත ඉදිරිපත් කිරීම යන උපායමාර්ගික උපක්‍රමය තෝරාගෙන ක්‍රියාත්මක කර තිබුණද, ගුණාත්මක බවින් යුතු තෙල් නිෂ්පාදකයින් සඳහා වන තරු 5 කින් යුත් ලාංඡනය 2019 වර්ෂයේදී ලබාගෙන තිබූ පොල් තෙල් මෝල් සංඛ්‍යාව 7 ක් පමණක් විය. | පොල් නිෂ්පාදනවල ගුණාත්මකභාවය පවත්වාගෙන යාමේ අධිකාරිය සතු වගකීම ඉටු කිරීම සඳහා කාර්යක්ෂමව කටයුතු කළ යුතුය. | 2021 වර්ෂය අවසන් වනවිට කර්මාන්තකරුවන් 14 දෙනෙකු ලාංඡන ලබාගෙන ඇත. නිෂ්පාදනවල හා අමුද්‍රව්‍යවල ප්‍රමිතියට සඳහා උපදෙස් සැපයීමේ වැඩසටහනක් ද, වියලුම් යන්ත්‍ර ලබාදීමේ වැඩසටහනක් ද ක්‍රියාත්මක කර ප්‍රගතියක් ලබා ගැනීමට කටයුතු කරනු ඇත. | ප්‍රමිතියෙන් යුතු පොල් තෙල් පාරිභෝගිකයන් වෙත ලබාදීම සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග සම්පූර්ණ කර නොතිබිණි. |
| (ඕ) | 2016 – 2019 අතර කාලයෙහි සමාන්‍ය වාර්ෂික පොල් තෙල් නිෂ්පාදනය වූ මෙ.ටො. 29,287 කින් මෙ.ටො. 5,516 ක් අපනයනය කිරීමෙන් පසු දේශීය පාරිභෝජනය සඳහා ඉතිරිවන සාමාන්‍ය පොල් තෙල් ප්‍රමාණය මෙ.ටො. 23,771 ක් පමණක් වුවද, දේශීය | දේශීය පොල් තෙල් නිෂ්පාදනය වැඩි කිරීම සඳහා කෙටි කාලීනව හා දිගුකාලීනව අවශ්‍ය පිළියම් යෙදීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය. | පොල් තෙල් කර්මාන්තයේ අමුද්‍රව්‍ය ලෙස වියලන ලද පොල් කැබලි ආනයනය කිරීමට අමාත්‍යාංශ අනුමැතිය හිමි වී ඇත. දේශීය පොල් තෙල් කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා නව කර්මාන්තකරුවන් වෙනුවෙන් මූල්‍ය අනුග්‍රහය | කෙටි කාලීන හා දිගුකාලීන සැලසුම් සහිතව වැඩසටහන් ක්‍රියාත්මක කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | අවශ්‍යතාවය මෙ.ටො. 93,103 ක් වූයෙන් හිඟය වූ මෙ.ටො. 69,332 කින් මෙ.ටො. 5,044 ක් ආනයනික පොල් තෙල් මගින්ද, ඉතිරි සියයට 69 ආනයනික පාම් ඔයිල් මගින්ද සපයා ගනු ලබන අතර පසුගිය වර්ෂ 04 ක කාලය තුළ සාමාන්‍ය පාම් ඔයිල් ආනයනය මෙ.ටො. 199,433 ක් විය. ඒ අනුව ප්‍රමිතියෙන් යුතු පොල් තෙල් නිෂ්පාදනය වැඩි කිරීමට කටයුතු නොකර දේශීය පොල් තෙල් පරිභෝජන අවශ්‍යතාවයෙන් වැඩි කොටසක් පාම් ඔයිල් හා ආනයනික පොල් තෙල්වලින් සපුරා ගැනීම අධිකාරියේ අරමුණුවලට අනුරූප නොවන බව නිරීක්ෂණය විය. | | ලබා දෙන අතර 2020 වර්ෂයේ මෙ.ටො.19,759 ක් වූ දේශීය පොල් තෙල් නිෂ්පාදනය 2021 වර්ෂයේ මෙ.ටො. 43,038 ක් දක්වා සියයට 118 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. | |
| (ක) | 1975 අංක 24 දරන පනතින් සංශෝධිත 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ 51 වගන්තිය යටතේ පලකර තිබුණු 1979 දෙසැම්බර් 31 දිනැති අංක 69/4 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළමු වන උපලේඛනයේ ඇතුළත් 3 වන ඡේදය ප්‍රකාරව ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරනු ලබන හෝ ශ්‍රී ලංකාවෙන් අපනයනය කරනු ලබන පොල් නිෂ්පාදනවල ගුණාත්මක ප්‍රමිති නියම කිරීම හා පවත්වාගෙන යාම අධිකාරිය කළ යුතු වුවත් ශ්‍රී ලංකාවේ සමස්ත පොල් තෙල් | ප්‍රමිති පරීක්ෂාව වැඩි කිරීමට අවශ්‍ය ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව පොල් නිෂ්පාදනවල ගුණාත්මක ප්‍රමිති නියම කිරීම හා පවත්වාගෙන යාම සම්බන්ධයෙන් පවතින ක්‍රමවේදයන් වැඩි දියුණු කළ යුතුයි. | 2021 වර්ෂයේදී පරීක්ෂණ ප්‍රමාණය වැඩි කර ඇත. සමස්ත පොල්තෙල් කර්මාන්තය සම්බන්ධව අනිවාර්යය ප්‍රමිති පරීක්ෂාවන් කිරීමේ හැකියාව මෙන්ම බලතල පොල් සංවර්ධන අධිකාරියට නොමැති හෙයින් මේ සඳහා හැකි පමණ දායක වීමට කටයුතු කරනු ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | පරිභෝජනයෙන් සියයට 72ක් සඳහා ප්‍රමිති පරීක්ෂාවක් සිදු වී නොතිබුණු බවට නිරීක්ෂණය විය. | | | |
| (ග) | 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනත ප්‍රකාරව “දිසිදි” පොල් කර්මාන්තයේ සංවර්ධනය පිණිස 1980 වර්ෂයේදී පිහිටුවා තිබූ මොල් සංවර්ධන අරමුදලේ අරමුණ අපනයනය කරනු ලබන සෑම දිසිදි පොල් කි. ග්‍රෑ 1 ක් වෙනුවෙන් ශත 20 ක් බැගින් සෙස් අරමුදලින් ලැබෙන මුදල් ඒ ඒ මෝල් හිමියන් නමින් ඉතිරි කිරීමේ බැංකු ගිණුම්වල තැන්පත් කොට මොල්වල නවීකරණ කටයුතු හා මෝල් පවත්වාගෙන යාමේ අවශ්‍යතාවයන් සම්පූර්ණ කිරීම විය. එසේ වුවද, 2019 - 2020 වර්ෂවලදී ඒ සම්බන්ධයෙන් කිසිදු කාර්යයක් සිදු කර නොතිබූ අතර 2020 වර්ෂයේදී ලැබුණු සෙස් අරමුදල් රු.5,916,064 ක් ඇතුළුව වර්ෂය අවසානයට සමුච්චිත අරමුදල් ගිණුමේ ශේෂය රු.84,206,686 ක් ද, බැංකු තැන්පතුවල වටිනාකම රු.160,835,956 ක් ද විය.<br>තවද, කර්මාන්තයේ ගැටළු හඳුනාගැනීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමටත්, කටයුතු කාර්යක්ෂම කර ගනිමින් නිශ්චිත ඉලක්කයන්ට ලඟාවීම | නිසි සැලසුම් සහගත වැඩ පිළිවෙලක් ඔස්සේ අරමුදල පිහිටුවනු ලැබූ අරමුණ ඉටු කර ගැනීම කෙරෙහි අවධානය යොමු කළ යුතුයි. | 2021 වසරේදී රු.3,216,952 ක මුදලක් ප්‍රතිපූරණය කර ඇත. කර්මාන්තයේ ගැටලු හඳුනා ගනිමින් මෙම ගිණුම් කළමනාකරණය කිරීම සඳහා ඉදිරියේදී කටයුතු කිරීමට අපේක්ෂිතයි. | සැලසුම්ගත වැඩ පිළිවෙලක් ඔස්සේ කටයුතු ක්‍රියාත්මක කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | සඳහා වාර්ෂික අයවැය ලේඛන, ක්‍රියාකාරී සැලසුම් හා සංයුක්ත සැලසුම් සකස් කිරීමටත් කටයුතු කර නොතිබුණි. | | | |
| (ච) | 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ බලතල අනුව පොල් තෙල් විශාල තොග වශයෙන් මිලදී ගෙන මිල අඩු වැඩි වීම අනුව වෙළඳපොලට නිකුත් කිරීම මඟින් මිල පාලනය කිරීමේ අරමුණින් පොල්තෙල් මිල ස්ථායිකරණ අරමුදල පිහිටුවා තිබුණ ද, 1981 වර්ෂයේ සිට මෙම වැඩ පිළිවෙල අධිකාරිය විසින් අතහැර දමා ඒ සඳහා වරායේ පවත්වා තිබූ තෙල් ටැංකි ද වෙනත් ආයතනවලට ලබා දී තිබුණි. එසේ වුවද, 1985 වර්ෂයේ සිට හිඟහිට ඇති රු.78,865,954 ක ණය මුදලක් ඇතුළුව එකතුව රු.157,943,367 ක අයවිය යුතු ණය ශේෂයක් ද, රු.220,171,884 ක ආයෝජන ශේෂයක් හා රු.324,046,799 ක සමුච්චිත අරමුදල් ශේෂයක් ද සහිතව 2020 වර්ෂය අවසානය දක්වාම අරමුදලේ මූල්‍ය ප්‍රකාශන සකස් කරමින් පැවතුණි. | වසර 29 ක් තිස්සේ අක්‍රියව පවතින මෙම අරමුදල සම්බන්ධයෙන් නිසි සමාලෝචනයක් සිදු කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම කෙරෙහි අවධානය යොමු කළ යුතුයි. 1981 වර්ෂයේ සිට මෙම වැඩ පිළිවෙල අතහැර දමා තිබීමට හේතු පැහැදිලි කළ යුතු වේ. | මෙම ගිණුම කළමනාකරණය සම්බන්ධව වැඩිදුර අධ්‍යයනයක් සිදුකර ඉදිරි කටයුතු සිදු කරනු ඇත. | මේ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. |

## 92. නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - තතත්ත්වාගණනය නොකළ මතය

2019 - තතත්ත්වාගණනය නොකළ මතය

2020 - තතත්ත්වාගණනය නොකළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | කෘෂිකාර්මික නියඟ අධීක්ෂණ හා පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතියක් සකස් කිරීමේ ව්‍යාපෘතිය, වර්ණාවලි හඳුනාගැනීමේ දත්ත බැංකුවේ දත්ත රැස් කිරීමේ කාර්ය හා භූවිද්‍යාත්මක වෙබ් අඩවියක් නිර්මාණය කිරීමේ කාර්ය යන කාර්යන් 03 නිමකර ඇතත් ඒවා රට තුල ප්‍රායෝගිකව භාවිතා කිරීමට සුදුසු වැඩ පිළිවෙලක් ගෙන නොතිබුණි. | ආයතනික අරමුණු කාර්යක්ෂමව ඉටුකිරීම සඳහා ප්‍රමාණවත් පියවර ගතයුතුය. | මෙම ව්‍යාපෘතිය මඟින් ශ්‍රී ලංකා භූමියේ කෘෂිකාර්මික නියග තත්ත්වයන් නිරීක්ෂණය කරන අතර ඒවා සිතියම් ගත කරනු ලැබේ. එම සිතියම් වෙබ් අඩවියක් මඟින් ප්‍රකාශනයට පත් කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරමින් පවතී. | ආතර්සී ක්ලාක් ආයතනය මගින් කෘෂිකාර්මික නියගවලට අදාළ සිතියම් සකස් කර ඇත. 2018න් අනතුරුව ඉන්දියාව විසින් AWIFS චන්ද්‍රිකා දත්ත ලබාදීම නවතා දැමූ බැවින් සහ ඉන්දියාවෙන් එම දත්ත ලබාගැනීම සඳහා අවස්ථා කිහිපයකදී උත්සාහ කළ නමුත් එයද අසාර්ථක වූ බැවින් මෙම ව්‍යාපෘතිය ඉදිරියට ගෙන යාමට නොහැකිවී ඇත. |
| (ආ) | තම ආයතනයට ආදායම් උපයා ගැනීම සඳහා භාවිතා කරන විදුලි සංදේශ කුළුණ නිසි ලෙස නඩත්තු කර පාරිභෝගිකයන්ට ලබා නොදීම හේතුවෙන් ආයතනයට 2019 අගෝස්තු 01 දින සිට කුළුණේ ආදායම අහිමි වී ඇති බව නිරීක්ෂණය විය. 2019 ජූලි සිට අහිමි වූ ආදායම | විදුලි සංදේශ කුළුණ නිසි ලෙස නඩත්තු කර ආදායම් ඉපයීම සහ සේවා ලබාදීමට කටයුතු කළ යුතුය. | සිහි කැඳවීම් සිදු කරඇත. මේ පිළිබඳ විදුලි සංදේශන නියාමන කොමිසම නිලධාරින් සමග සාකච්ඡා කර ඇති අතර ඉන්වොයිසි වලට මුදල් ලබාගැනීමට අපේක්ෂිතය. | විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව මගින් 2017 අගෝස්තු 01 දින සිට 2019 අගෝස්තු 19 දින දක්වා අදාල වසර දෙකක කාලය තුල අදාල සේවාව ලබා ගැනීම වෙනුවෙන්, |

| | | | | |
|---|---|---|---|---|
| | ගිවිසුම ප්‍රකාරව මාසයකට රු.102,763 බැගින් විය. | | | ආයතනය වෙත ලැබිය යුතු හිඟ මුදල රු.2,292,945 ක් අයකරගෙන නොතිබුණි. |
| (ඇ) | 2016 අගෝස්තු 09 දින සිට වසරක කාලයක් සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියමන කොමිෂන් සභාව සමඟ අත්සන් කරන ලද ගිවිසුම 2017 ජූලි 31 වන දිනෙන් අවසන් වී තිබුණි. ආතර් සී ක්ලාක් ආයතනය විසින් 2017 අගෝස්තු 01 සිට 2022 ජූලි 31 දක්වා වසර 05 ක කාලයකට ගිවිසුමක් සකස් කර වසරක් පාසා අළුත් කරන පදනමින් ඉදිරිපත් කර තිබුණ ද 2020 පෙබරවාරි වන විටත් එම ගිවිසුම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් අත්සන් කර නොතිබුණි. එමෙන්ම 2019 ජූලි 31 දිනෙන් පසුව ආතර් සී ක්ලාක් මධ්‍යස්ථානයේ සේවාව ලබා ගැනීම ද නවතා තිබුණි. | ගිවිසුම අත්සන් කර ගැනීම සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගතයුතුය. | විදුලි සංදේශ නියාමන කොමිසම විසින් අදාල ගිවිසුම අත්සන් කිරීම ප්‍රමාද කරන බැවින් වෙනත් විකල්ප ක්‍රියාමාර්ග වෙත අවධානය යොමුකර ඇත. | ගිවිසුම් අත්සන් කිරීමට 2021වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි. |

## 93. උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - තත්ත්වාගණනය කළ මතය

2019 - තත්ත්වාගණනය කළ මතය

2020 - තත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | සම්පූර්ණයෙන් ක්ෂය කර තිබූ නමුත් තවදුරටත් භාවිතයට ගනු ලබන රු.5,006,511ක මෝටර් රථ 03 ක ඵලදායී ජීවිත කාලය පිළිබඳව වූ ඇස්තමේන්තුව ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව නැවත සමාලෝචනය කිරීමට කටයුතු කර නොතිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | එක් වාහනයක් 2021 වර්ෂයේ දී ටෙන්ඩර් පත් කැඳවා විකුණන ලදී. අනෙක් වාහන වල වටිනාකම තක්සේරු කිරීම සඳහා පරිපාලන හා මානව සම්පත් අංශයට ලිඛිතව දැනුම් දෙන ලදී. | ඉතිරි වාහන 2021 අවසානය දක්වා ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කර නැත. |
| (ආ) | ස්ථාවර වත්කම් වර්ගීකරණය කර හඳුනා ගැනීමට අදාල ගිණුම් ප්‍රතිපත්තියක් නොමැති වීම නිසා ඉන්වෙන්ට්‍රි භාණ්ඩ ලෙස සැලකිය යුතුව තිබුණු පිරිවැය පිළිවෙලින් රු.1,324,156ක් හා රු.2,392,394ක් වූ උපකරණ සහ ගෘහ උපකරණ ස්ථාවර වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ස්ථාවර වත්කම් හා ඉන්වෙන්ට්‍රි භාණ්ඩ නිවැරදිව හඳුනා ගෙන මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුවේ. | ආයතනික ගිණුම් ප්‍රතිපත්තියක් සඳහා කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමින් පවතී. | 2021 අවසානය දක්වා ගැලපීම් කිරීමට අවශ්‍ය තොරතුරු ලබාගෙන නොතිබුණි. |

**94.** **ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය — 2018 - මතය වියාචනය

2019 - මතය වියාචනය

2020 - තත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.4,643,333ක් වූ මෝටර් වාහන 05ක් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු නමුත් තවදුරටත් භාවිතා කරමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 අනුව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 ප්‍රකාරව කටයුතු කළ යුතුය. | නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතී. | 2021 අවසානය දක්වාම නිවැරදි කර නොමැත. |
| (ආ) | 1971 අංක 38 දරන මුදල් පනත සහ 2004 ජුලි 24 දිනැති අංක පීඊඩී/25 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේදී මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබා ගැනීමෙන් තොරව ස්ථාවර තැන්පත්වල රු.3,500,000ක් ආයෝජනය කර තිබුණි. | අරමුදල් ආයෝජනය කිරීමේ දී මුදල් පනත සහ අදාල චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | මෙය 2009 වසරේ සිට පවත්වා ගෙන එනු ලබන ගිණුමකි. | මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබා ගෙන නැත. |
| (ඇ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.12 වගන්තිය | චක්‍රලේඛ නියමයන්ට අනුකූලව කටයුතු කළ යුතුය. | MOJ/E08/LAC/Common සහ 2018.03.12 දිනැති අධිකරණ අමාත්‍යාංශයේ | චක්‍රලේඛ නියමයන්ට අනුකූලව කටයුතු කර නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | ප්‍රකාරව අනුමැතියකින් තොරව 2015 වර්ෂයේ දී පෞද්ගලික රක්ෂණ ක්‍රමයක් ආරම්භ කර 2020 වර්ෂයේ දී සේවකයන් 56 දෙනෙකුගේ රක්ෂණ දායකයෙන් සියයට 50 ක් ලෙස රු.1,169,989ක් රක්ෂණ සමාගමකට ගෙවා තිබුණි. | | ලිපිය මගින් උක්ත රක්ෂණ යෝජනා ක්‍රමය ප්‍රසම්පාදන පටිපාටිය අනුගමනය කරමින් සිදු කරන ලෙස දැනුම් දී ඇති අතර ඒ අනුව ක්‍රියාකර ඇත. | |
| (ඇ) | 1987 අංක 27 දරන නීති ආධාර කොමිෂන් සභා පනතේ, 4(එ) ඡේදයේ සඳහන් නීති ආධාර සැපයීමෙහිලා වූ යම් අංශයක් සම්බන්ධයෙන් පර්යේෂණාත්මක වැඩසටහන්, නීති ගැටළු මධ්‍යස්ථාන හා ව්‍යාපෘති පිහිටුවීම පාලනය කිරීම, සංවර්ධනය කිරීම හා ඒවාට සහයෝගය දැක්වීම හා ඒ කාර්ය සඳහා වැඩ සටහන් හා ව්‍යාපෘති ඇති කිරීම සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය සේවයේ නියුක්ත කිරීම යන ප්‍රධාන අරමුණු මෙතෙක් ලඟාකර ගැනීමට අපොහොසත් වී තිබුණි. | පනතේ අරමුණු ක්‍රියාත්මක කිරීමට කටයුතු කල යුතුය. | නව බඳවා ගැනීම් සිදු කර නව නීති ආධාර කාර්යාල ආරම්භ කිරීමට කටයුතු කරමි. | බඳවා ගැනීම් සිදු කිරීම සඳහා අධිකරණ අමාත්‍යාංශයේ අවසරය ඉල්ලා ඇතත් ඒ සඳහා ප්‍රතිචාර ලැබී නොමැත. |
| (ඉ) | රාජ්‍ය නීති ආධාර වැඩපිළිවෙල සිවිල් සමාජය තුළ වඩා විධිමත් ලෙස බලගැන්වීමේ අරමුණින් 2016 මාර්තු 30 දින ශ්‍රී ලංකාව සඳහා යෝජිත නීති ආධාර ජාතික ප්‍රතිපත්තිය අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර තිබුණද එය ක්‍රියාත්මක කර නොතිබුණි. | නීති ආධාර වැඩසටහන් නියමිත පරිදි ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. | යෝජිත නීති ආධාර ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා අධිකරණ අමාත්‍යාංශය සමඟ මේ වන විට සැලසුම් සකස් කරමින් පවතී. | නීති ආධාර ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඊ) | නීති ආධාර සැපයීම සඳහා 2019 හා 2020 වර්ෂවල පැවති 45,033 ක නඩු වලින් 2020 වර්ෂයේ නඩු 8,466ක් නිරවුල් කිරීම සඳහා නීතිඥ සහය/ නීති ආධාර ලබාදී නඩු 36,567ක් ඉතිරි වී තිබුණි. එය මුළු නඩු ප්‍රමාණයෙන් සියයට 81 ක් විය. | කාර්ය සාධනය ඉහළ නංවා ගැනීමට කටයුතු කළ යුතු වේ. | අධිකරණවල පවතින නඩුවල ප්‍රමාණය හා රටේ පැවති කොවිඩ් වසංගතය නිසා 19%ක පමණ සංඛ්‍යාවක් නිරවුල් කිරීමට හැකි වීම පාර්ශවකරුවන් ලැබූ ජයග්‍රහණයකි. ඉදිරියේදී කාර්ය සාධනය වර්ධනය කර ගැනීමට කටයුතු කෙරේ. | කාර්ය සාධනය වර්ධනය කර ගැනීමට කටයුතු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නැත. |
| (උ) | 2018 වර්ෂයේ කොමිෂන් සභාව විසින් රුවන්වැල්ල, ඇල්පිටිය, ගලගෙදර, ආණමඩුව හෙට්ටිපොල යන ස්ථාන වල මධ්‍යස්ථාන 05 ක් ඉදිකිරීම සඳහා රු.15,000,000ක් ඇස්තමේන්තු කර තිබුණද 2020 වර්ෂය අවසන් වන විටත් ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි. | ව්‍යාපෘති වලට අදාල වියදම නිවැරදිව ඇස්තමේන්තු කර එම ව්‍යාපෘති ඉටු කිරීමට ඇති ශක්‍යතාව මත ප්‍රතිපාදන ලබාගත යුතු වේ. | ඇස්තමේන්තු කල පරිදි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන අතර ආනමඩුව මෙම වර්ෂයේ කිරීමට බලාපොරොත්තුවේ. ඇල්පිටිය වෙනුවට බිබිලේ මධ්‍යස්ථානය මෙම වර්ෂයේ ඉදිකිරීමට බලාපොරොත්තු වේ. රුවන්වැල්ල මධ්‍යස්ථානය වෙනුවට වත්තල මධ්‍යස්ථානය ආරම්භ කර ඇත. | ඇස්තමේන්තුගත ඉදිකිරීම් කටයුතු වෙනස් කර තිබුණි. |

**95. ගාලු උරුමය පදනම**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 - අහිතකර මතය

2019 - තතත්ත්වාගණනය කළ මතය

2020 - තතත්ත්වාගණනය නොකළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ දක්වා තිබුණු රු.4,712,294 ක් වූ වත්කම්, සහ රු.3,236,142 ක වගකීම් වැරදි නිවැරදි කිරීම් සහ රු.4,381,075 ක් වූ ලාභයට වැරදි ලෙස ගැලපීම් 2020 වර්ෂයේදීද නිවැරදි කර නොතිබුණි. මේ අනුව 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ආරම්භක ශේෂයන් නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති බවට විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය. | විගණන වාර්තා වලින් පෙන්වා දී ඇති අඩුපාඩු කළ යුතු අතර නිවැරදි සංසන්දනාත්මක ශේෂයන් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කළ යුතුය. | නැවැරදි කිරීමට ගන්නා කියාමාර්ග දක්වා නොතිබුණි. | 2021 වර්ෂයේදී හෝ මෙම අඩුපාඩු නිවැරදි කර නොමැත. |
| (ආ) | 2003 ජුනි 02 දිනැති අංක පී.ඊ.ඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 ඡේදය ප්‍රකාර ත්‍රෛමාසිකව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්විය යුතු වුවත්, විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්විය යුතුය. | 2003/06/02 දිනැති පී.ඊ.ඩී/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ ප්‍රකාරව විගණන හා කළමණාකරන කමිටු රැස්වීම් පැවැත්විය යුතු බව පිළිගන්නා අතර ගාලු උරුමය පදනම විසින් එහි රේඛීය අමාත්‍යංශය විසින් පවත්වන විගණන හා කළමණාකරන කමිටු වෙත සහභාගී වීම නිසි පරිදි සිදුකර ඇත. | 2021 වර්ෂය සඳහා ද ආයතනය විසින් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 1994 අංක 07 දරන ගාලු උරුමය පදනම පනතේ II වන කොටසෙහි 12 (1) ඡේදය ප්‍රකාරව පනතේ විධිවිධාන ප්‍රකාරව, පදනමේ කටයුතු සිදුකරගෙන යාම සඳහා අරමුදලක් ගොඩනගා නොතිබුණි. | පදනමේ අරමුණුගත කාර්යයන් ඉටුකළ යුතුය. | නැවැරදි කිරීමට ගන්නා ක්‍රියාමාර්ග දක්වා නැත. | 2021 වර්ෂයේදීද අරමුදලක් ගොඩනගා නොතිබුණි. |
| (ඈ) | පදනමට වැඩි බලතල හිමිකර ගැනීමට හා පදනම සඳහා ආදායම් උත්පාදන ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම යන අරමුණු සඳහා 1994 අංක 7 දරන ගාලු උරුමය පදනම පනත සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය හඳුනාගෙන ඒ සඳහා 2015 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල සංදේශයක් පිළියෙල කර තිබුණද, 2020 වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් එම පනතේ සංශෝධන කටයුතු කර නොතිබුණි. | පනත සංශෝධනය කිරීමේ කටයුතු හැකි ඉක්මනින් අවසන් කළ යුතුය. | 2019 වර්ෂයේ ගාලු උරුමය පදනම නිවාස, ඉදිකිරීම් හා දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන බැවින්, මෙකී පවත්නා සංශෝධන සඳහා අමාත්‍යාංශයේ උපදෙස් ලබා ගැනීමට කටයුතු කරමින් පවතී. | 2021 වර්ෂය අවසානය දක්වා ඉටුකර නොමැත. |
| (ඉ) | යුනෙස්කෝ සංවිධානය විසින් ගාලු කොටුව ලෝක උරුමයක් ලෙස නම් කර තිබූ අතර, ඒ අනුව ගාලු කොටුව ආරක්ෂා කිරීම සඳහා යුනෙස්කෝ සංවිධානය වෙත ඉදිරිපත් කරන ලද කළමනාකරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීමට සහ යුනෙස්කෝ සංවිධානයේ මගපෙන්වීම් (guideline) වලට අනුකූලව කටයුතු කිරීමට ගාලු උරුමය පදනමේ කළමනාකරණය අපොහොසත් වී තිබුණි. | කළමනාකරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. | කළමනාකරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීමට පැවරී ඇති කාර්ය භාර්ය විධිමත්ව ක්‍රියාවේ යෙදවීමට යුනෙස්කෝ සංවිධානය විසින් නිර්දේශ කළ පරිදි සුදුසුකම් සහිත කර්ය මණ්ඩලයක් ගාලු උරුමය පදනම යටතේ රාජකාරී කටයුතු කළ යුතුය. යෝජිත කාර්ය මණ්ඩලය වර්තමාන අමාත්‍යාංශය යටතේ නැවත ඉදිරිපත් කර ඇත | 2021 වර්ෂය අවසානය දක්වා ඉටුකර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඊ) | නාගරික සංවර්ධන අධිකාරිය මඟින් ගාල්ල - කොටුව තුළ දැනට හඳුනා ගෙන ඇති අනවසර ඉදිකිරීම් 22 ක් සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනීමට කළමනාකරණ මණ්ඩලය අපොහොසත් වී තිබුණි. තවද, අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට ගාලු උරුමය පදනමට නීතිමය ප්‍රතිපාදන නොමැති අතර සෙසු රාජ්‍ය ආයතන ඒ සඳහා කඩිනමින් යොමු කිරීමේ හැකියාවද අවම මට්ටමක පැවතුණි. මෙම තත්ත්වය ගාලු උරුමය පදනම ස්ථාපිත කිරීමේ අරමුණු ඉටු කිරීමේදී බාධාවක්ව පැවතුණි. | අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට අදාළ සියළු ක්‍රියාමාර්ග ගත යුතුය. | දැනටමත් අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම වෙනුවෙන් අධිකරණ ක්‍රියාමාර්ග 36 ක් ගෙන ඇත. | තවදුරටත් අනවසර ඉදිකිරීම් සිදුවේ |
| (උ) | ගාලු කොටුවේ සඳු මුර අට්ටාලයේ පිහිටි පැරණි ලන්දේසි යුධ කාමරය සංරක්ෂණය කර ගාල්ලේ ඓතිහාසික උරුමය පිළිඹිබු කරන ප්‍රදර්ශන ගැලරියක් බවට පත් කිරීම සඳහා 2020 දෙසැම්බර් 31 දින වන විට රු.11,760,121 ක් වියදම් කර තිබුණද, එම සඳු මුර අට්ටාලය ප්‍රදර්ශන ගැලරියක් බවට පත්කර නොතිබුණි. | වැය කරන ලද මුදල නියමිත කාර්යයන්ට යොදවා ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. | නුදුරු අනාගයේදී විවෘත කිරීමට නියමිත බව දන්වා තිබුණි. | 2021 වර්ෂය අවසානය දක්වාම වහාග සංශෝධනය කර නොතිබුණි. විවෘත කර නොමැත |
| (ඌ) | ගාලු උරුමය පදනමට අවශ්‍ය බලතල ලබා ගැනීමට හා පදනම සඳහා ආදායම් උත්පාදනය නංවාලීම යන අරමුණු සඳහා 1994 අංක 07 දරන ගාලු උරුමය පදනම පනත | පනත සංශෝධනය කරවා ගැනීමට කටයුතු කළ යුතුය. | පනත සංශෝධනයේ ඉදිරි කටයුතු කරගෙන යාම සඳහා ගාලු උරුමය පදනම විසින් දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශයෙන් ගෙන්වා ගෙන ඇති අදාළ ලේඛන, | 2021 වර්ෂය අවසානය දක්වාම පනත සංශෝධනය කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය හඳුනාගෙන ඒ සඳහා 2015 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල සංදේශයක් පිළියෙල කර තිබුණද, 2020 වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අදාළ සංශෝධනයක් සිදු කර නොතිබුණි. | | නිවාස, ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය වෙත යවා ඇති බව | |
| (එ) | විථි ලාම්පු සවි කිරීමේ පළමු අධියර වෙනුවෙන් රු.1,784,544ක්ද, දෙවන අධියර වෙනුවෙන් රු.2,395,266 ක්ද ලෙස පදනම විසින් වියදම් දරා නගර සභාව පවරා දී තිබුණද, වැය වූ රු.4,179,810 ක මුදල 2021 දෙසැම්බර් තෙක් විදුලි බල සමාගමෙන් ප්‍රතිපූර්ණය කරවා ගෙන නොතිබුණි. | විදුලිය වෙනුවෙන් නොව විථි පහන් වෙනුවෙන් ප්‍රතිපූර්ණයට විදුලි බල මණ්ඩලයෙන් අනුමැතිය ලබා ගත යුතුය. | කාලයක් තිස්සේ මෙම පැරණි පහන් අක්‍රියව පැවතීම ලෝක උරුම ගාල්ල කොටුවේ ජීවත්වන ප්‍රජාවටත්, ගාල්ල කොටුව නැරඹීමට පැමිණෙන සංචාරකයින් ටත් දැඩි දුෂ්කර තත්ත්වයක් ඇති වීම නිසා ගාලු උරුමය පදනමේ කළමනාකරණ මණ්ඩල අනුමැතියට යටත්ව ගාලු උරුමය පදනමේ ප්‍රාග්ධන ව්‍යාපෘතියක් ලෙස එකී පැරණි විදුලි පහන් අලුත්වැඩියා කර නඩත්තුව සඳහා ගාලු මහා නගර සභාව වෙත භාර දෙන ලදි. | විථි පහන් යෙදීම සඳහා 2021 වර්ෂයේදීද අනුමැතිය ලබාගෙන නැත. |
| (ඒ) | ගාලු උරුමය පදනම භාරයේ ඇති පල්ලිය වීදියේ පොලිස් නිල නිවාස ලෙස භාවිතා කළ ගොඩනැගිල්ලේ පිටුපස පිහිටි වැසිකිළි පද්ධතිය රු.1,966,306 ක් වැය කර අළුත්වැඩියාකර තිබුණද, විගණිත දිනය වූ 2021 අප්‍රේල් 06 දින වන විටත්, එම වැසිකිළි පද්ධතිය අගුළු දමා වසා තිබුණි. | කොටුව තුළ ආදායම් උත්පාදනය කිරීමේ හැකියාව පදනමට ඇති බැවින් ආදායම් උත්පාදනය කිරීම පිළිබඳ අවධානය යොමු කළ යුතුය. | පල්ලිය වීදියේ පැරණි පොලිස් නිළ නිවාසය අසළ ඉදිකර, පොලිස් නිළ නිවාස හිමියන් විසින් භාවිත කළ වැසිකිළි පද්ධතියද අලුත්වැඩියා කිරීමෙන් පසු නඩත්තුව සඳහා ගාල්ල මහා නගර සභාව වෙත භාර දෙන ලදි. | වැසිකිළි පද්ධතිය ඉදිකර නගර සභාවට ලබා දී ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඔ) | ගාල්ල කොටුවේ සඳු මුර අට්ටාලයේ පිහිටි පැරණි ලන්දේසි යුධ කාමරය සංරක්ෂණය කර ගාල්ලේ ඓතිහාසික උරුමය පිළිඹිබු කරන ප්‍රදර්ශන ගැලරියක් බවට පත් කිරීමට 2016 වර්ෂයේදී කැන්වස් සිතුවම් 16 ක් ඇඳීමට රු.1,520,000 ක් වැය කර ලබා ගෙන තිබුණු නමුත්, එම සිතුවම් 2020 වර්ෂය අවසානය දක්වාම වසර 6 කට වැඩි කාලයක් තුළ කාර්ය ඉටුකිරීමකින් තොරව පදනමේ කාර්යාල පරිශ්‍රයේ නිෂ්කාර්යව තබා තිබුණි. | වැය කරන ලද මුදල නියමිත කාර්යයන්ට යොදවා ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. | සඳු යුධ කාමරය, ළමුන් සඳහා වන විශේෂ ගැලරියක් ලෙස සංවර්ධනය කිරීමට තීරණය විය. ඒ අනුව ගැලරියේ ආරම්භක තේමාව සංශෝධනයට ලක්විය. එසේම එම ගැලරියේ ඇතැම් කටයුතු ලෝක බැංකු ව්‍යාපෘති යටතේ සිදු කිරීමට ද නියමිතය. | 2021 වර්ෂය අවසානය දක්වාම ප්‍රදර්ශනය සඳහා භාවිතා කර නොතිබුණි. |

**96. විශ්වවිද්‍යාල විද්‍යායතනය මාතර**

මූලා ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 - තතත්ත්වාගණනය කළ මතය

2019 - තතත්ත්වාගණනය කළ මතය

2020 - තතත්ත්වාගණනය නොකළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | විද්‍යායතනය විසින් පවත්වනු ලබන පාඨමාලා සඳහා සිසුන් බඳවා ගැනීමේ පටිපාටිය අනුව එක් පාඨමාලාවක සම මට්ටමේ සුදුසුකම් සපුරන සිසුන් 35 ක කණ්ඩායමක් වියයුතු වුවත් පසුගිය වර්ෂ 04 හි විලේපන වේදය පාඨමාලාව හදාරන සිසුන් ගණන 2 ත් 19 ත් අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි. | පාඨමාලා සඳහා සිසුන් බඳවා ගැනීම සඳහා ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය. | ආයතනය විසින් පුවත්පත් හා අන්තර්ජාලය හරහා ප්‍රවර්ධන කටයුතු සිදු කළ බවත් තවදුරටත් ඉදිරියේ දී සිසුන් දැනුවත් කිරීම පුළුල් කිරීමට බලාපොරොත්තු වන බව. | 2021 වර්ෂය අවසානය වන විටත් පාඨමාලාව සඳහා සිසුන් අඩු ප්‍රමාණයක් බඳවා ගෙන තිබුණි. |
| (ආ) | 2018 ජනවාරි සිට ජුනි දක්වා අධ්‍යයන පාඨමාලා 07 හි බාහිර දේශකයින් මඟින් සිද්ධාන්ත පැය 2,230 ක් හා ප්‍රායෝගික පුහුණු පැය 1,244 ක් ඉටු කිරීමට සැලසුම් කර තිබුණද, සිද්ධාන්ත පැය 1,134 ක් හා ප්‍රායෝගික පුහුණු පැය 212 ක් පමණක් ඉටු කර තිබුණි. ඒ අනුව සිද්ධාන්ත හා ප්‍රායෝගික පුහුණු පැය ආවරණය සියයට 51 ක් හා සියයට 19 ක් වී තිබුණි. | ස්වයං අධ්‍යයන මඟින් ආවරණය වන්නේ නම් එම විෂය කොටස් කාල සටහන්වලට ඇතුළත් කර එම විෂයයන් සඳහා දේශකවරයෙකු යෙදීම අවශ්‍ය නොවේ. | ඉහත විෂය නිර්දේශයන්හි සිද්ධාන්ත හා ප්‍රායෝගික අධ්‍යයනයන් පැවැත්වීමේදී සම්මුඛ හා ස්වයං අධ්‍යයන මඟින් ආවරණය කරන අතර, ඒ සඳහා ස්වයං ප්‍රායෝගික පරීක්ෂණ ස්වයං පරිශීල ග්‍රන්ථ මඟින් ඉහත සඳහන් ඉටු නොකළ පැය ගණන් ආවරණය කර ඇති බව | විධිමත් සැලසුමකට අනුව සේවාව ලබා ගැනීමට කටයුතු කර නැත. |
| (ඇ) | 2018 ජූලි සිට දෙසැම්බර් දක්වා වූ කාලය තුළ NVQ 5 දෙවන හා NVQ 6 පළමු සමාසිකයට අදාල පාඨමාලා 07 හි බාහිර | යම් පාඨමාලාවක්, විෂය මාලාවක් යම් කාල රාමුවක් තුළ නිම කිරීම කළ යුතුය. | බාහිර කථිකාචාර්යවරයකුගේ පැයක වේතනය නිශ්චිතව සඳහන් නොකිරීම නිසා ඔවුන් සේවයෙන් ඉවත් වූ බවත් | සෑම පාඨමාලාවක්ම අදාළ කාලරාමුව තුළ නිම කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | දේශකයින් ලබා ඉගැන්වීමට සැලසුම් කළ ප්‍රායෝගික පුහුණු කිරීම් කාලයෙන් සියයට 48 ත් සියයට 100 ත් අතර පරාසයක ප්‍රමාණයක් ඉටු කර නොතිබුණි. | | 2019 වර්ෂයේ පළමු හා දෙවන සමාසිකවලදී මගහැරුණු විෂයයන් ආවරණය කිරීමට කටයුතු කරන බව | |
| (ඇ) | 2015 හා 2016 වර්ෂවල ආරම්භ කළ පාඨමාලා 05 කට අදාළව බඳවා ගත් සිසුන්ගෙන් සියයට 26 ත් සියයට 100 ත් අතර පරාසයක ප්‍රමාණයක් පාඨමාලා හැරයාමේ ප්‍රවණතාවයක් තිබුණි. මේ සඳහා බලපෑ හේතූන් සොයා බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කළමනාකරණයේ අවධානය යොමු කර නොතිබුණි. | පාඨමාලා සඳහා බඳවාගත් සිසුන් රඳවා ගැනීමටත්, විභාග අසමත්වීමට හේතූන් සොයා බලා එයට පිළියම් යෙදීමටත් කටයුතු කළ යුතුය. | මෙම පාඨමාලාවල වැදගත්කම පිළිබඳව සිසුන් දැනුවත් කරන ලද බව. | පාඨමාලා හැරයාමේ ගැටළුව 2021 වර්ෂයේදීද තවදුරටත් එසේම පවතී. |
| (ඉ) | විද්‍යායතනය විසින් පවත්වාගෙන යන NVQ පාඨමාලාවන් සම්පූර්ණ කළ පසු පුහුණු කාලයද ඇතුළුව වර්ෂ 03 ක් තුළ එම සිසුන් සඳහා උසස් තාක්ෂණ ඩිප්ලෝමා සහතිකය නිකුත් කිරීම සිදු කළ යුතුය වුවද, 2016 වර්ෂයේ බඳවා ගෙන තිබූ ශිෂ්‍ය කණ්ඩායම 2021 වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 05 ක් ගත වී තිබුණද එම පාඨමාලාව අවසන් කර සහතික පත්‍ර නිකුත් කිරීම සිදුකර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්මට අනුව පාඨමාලා ආරම්භ කර නියමිත පරිදි විභාග පවත්වා නියමිත කාලයේදී වෘත්තිකයෙකු බිහි කිරීමට කළමනාකරණය කළ යුතුය. | පසුගිය කාලය ඇතුලත විටින් විට සිදු වූ ශිෂ්‍ය විරෝධතා හේතුවෙන් දේශනවලට සහභාගී නොවීම, දීර්ඝකාලීන පන්ති වර්ජන සහ ස්වභාවික ආපදා හේතුවෙන් ඔවුන්ගේ පාඨමාලා කාලය දීර්ඝ වුණු බව. | මේ වන විට Academic Calendar නිසි පරිදි සකසා අධ්‍යයන මණ්ඩලවල අනුමැතිය ලබාගෙන ඇත. |
| (ඊ) | සිසුන්ගේ ප්‍රායෝගික ක්‍රියාකාරකම් සඳහා 2014 දෙසැම්බර් මාසයේ රු.1,250,000 ක් වැයකර මිල දී | සිසුන්ගේ ප්‍රායෝගික ක්‍රියාකාරකම් සඳහා යොදා ගන්නා උපකරණ උපරිම කාර්යක්ෂමව | අදාල උපකරණය සවිකිරීම සඳහා ප්‍රමාණවත් බිම් කොටසක් මෙම ආයතනයේ නොමැති බවත්, ආයතනයට | 2021 වර්ෂයේදීද ඉඩම් කැබැල්ලක් සොයාගෙන උපකරණ සවි කිරීමට |

| | | | |
|---|---|---|---|
| ගෙන තිබූ Wheel Alignment Gurage Aligner 680- EL උපකරණය 2021 මාර්තු 29 දින වන විටත් සිසුන්ගේ ප්‍රායෝගික ක්‍රියාකාරකම් වෙනුවෙන් භාවිතා කර නොතිබුණි. | උපයෝජනයට ක්‍රියා කළ යුතුය. | විකල්ප ඉඩමක් ලැබුණු පසුව අදාල උපකරණය නිසි ප්‍රමිතියට අනුව සවිකිරීමට කටයුතු කරන බව. | කටයුතු කර නැත. |

## 97. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 - මතය වියාචනය

2019 - මතය වියාචනය

2020 - මතය වියාචනය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත ප්‍රකාරව, වතු සමාගම් වලින් පවරාගත් ඉඩම් වෙනුවෙන් ගෙවිය යුතු වන්දි අවිනිශ්චිත (අධියර - I හා II) ගිණුම්වල පැවති රු.215,914,519ක් වූ ශේෂ 2020 වර්ෂය අවසන්වන විට නිරවුල් කර නොතිබුණු අතර වගකීමේ ස්වභාවය පිළිබඳ සංක්ෂිප්ත විස්තරයක් ගිණුම් සටහන් මගින් හෙළිදරව් කර නොතිබුණි. | වන්දි ගෙවීම් අවසන්කර ශේෂය නිරවුල් කිරීමට හා වගකීමේ ස්වභාවය ගිණුම් සටහන් මගින් ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. | වැළැක්වීමේ ක්‍රියාමාර්ගයන් ගෙන නොතිබුණි. | ඉල්ලීම් කළ පසුව නිදහස් කිරීමට බලාපොරොත්තුවන බව වාර්තාකර ඇත. |
| (ආ) | 1972 වර්ෂයේ කොමිෂන් සභාව පිහිට වූ දින සිට අත්පත් කරගත් ඉඩම්වලට අදාළ එම ඉඩම්වල අක්කර ගණන එක් එක් ඉඩම් පිහිටි ප්‍රදේශ, අත්පත් කරගනු ලැබුවේ කවරෙකුගෙන්ද, දැනට භුක්තිය පවරාදීම් පිළිබඳ විස්තර හා අදාළ ගැසට් නිවේදන සහ ඉඩම් බැහැර කිරීම්වලට අදාළ සියලුම විස්තර පිළිබඳ වූ සම්පූර්ණ තොරතුරු ඇතුළත් ලේඛනයක් ආයතනය විසින් නඩත්තු කර නොතිබුණු අතර ඒ පිළිබඳ උපයෝගී ලියවිලි මගින් පැහැදිලි කිරීමටද ආයතනය | නොපමාව යාවත්කාලීන කරන ලද ඉඩම් ලේඛනයක් සකස් කළ යුතුය. | ඉඩම් ලේඛනය සැකසීමේ කටයුතු සිදුකරමින් පවතින බව වාර්තාකර ඇත. | ඉඩම් ලේඛනයක් සකස්කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | අපොහොසත් විය. ඒ අනුව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු රු.676,169,345 ක් වූ පවරාගත් ඉඩම්වල පැවැත්ම හා අගය කිරීමේ නිවැරදිතාවය විගණනයේදී තහවුරු කර ගත නොහැකි විය. | | | |
| (ඇ) | 2020 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති එකතුව රු.2,609,227,062 ක් වූ වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ශේෂයෙහි ඇතුළත් රාජ්‍ය ආයතන 08 කින් ලැබිය යුතු වර්ෂ 30 ඉක්මවූ රු.2,127,271,837 ක් සහ වර්ෂ 10 ඉක්ම වූ රු.8,353,409ක් 2020 වර්ෂය අවසන් වන විටත් අය කර ගැනීමට අපොහොසත් වී තිබුණි. | ලැබිය යුතු මුදල් අයකර ගැනීමට හෝ එසේ කළ නොහැකි නම් පිළිගත හැකි ක්‍රමවේදයක් යටතේ ලියා හැරීමට පියවර ගත යුතුය. | කල්ගත වූ මහා පරිමාණ ණයගැතියන් සම්බන්ධයෙන් තීරණයක් ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කිරීමට අදාළ ලිපිලේඛන ඉඩම් අමාත්‍යාංශය වෙත 2021.11.10 වන දින යොමු කර ඇති බව වාර්තාකර ඇත. | ලැබිය යුතු මුදල් අයකරගැනීමට හෝ ලියාහැරීමට කටයුතුකර නොමැත. |
| (ඈ) | 2020 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති එකතුව රු.14,080,850 ක් වූ ඉඩම් බදුකුලී අත්තිකාරම් ගිණුම් ශේෂයේ ඇතුළත් පුද්ගලයින් 269 දෙනෙකුගෙන් ලබාගත් රු.11,215,815 ක අත්තිකාරම් මුදල් වර්ෂ 15 කට වැඩි කාලයක සිට රඳවාගෙන තිබුණ ද, අදාළ ඉඩම් නීත්‍යානුකූලව බදු දීමට හෝ අත්තිකාරම් නැවත පියවීමට කොමිෂන් සභාව කටයුතු කර නොතිබුණි. | රඳවාගෙන ඇති අත්තිකාරම් මුදල් ආපසු පියවීමට හෝ අදාළ ඉඩම් නීත්‍යානුකූලව බදු දීමට කටයුතු කළ යුතුය. | වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොමැත. | බදුකුලී අත්තිකාරම් ලෙස 2021 මූල්‍ය ප්‍රකාශන මගින්ද පෙන්නුම් කෙරේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන චක්‍රලේඛයේ 6.5.3 වගන්ති ප්‍රකාරව ගිණුම් වර්ෂයක් අවසන් වී දින 150 ක් ඇතුළත වාර්ෂික වාර්තාව සභාගත කළ යුතු වුවද 2015, 2016, 2017 හා 2018 වර්ෂවල වාර්ෂික වාර්තා 2020 වර්ෂය අවසන් වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කර නොතිබුණි. | වාර්ෂික වාර්තා කාලීනව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුය. | වාර්ෂික වාර්තාවන් සභාගත කිරීම සඳහා 2021.07.14 දින ඉඩම් අමාත්‍යාංශය වෙත යොමු කර ඇති බව වාර්තාකර ඇත. | වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. |
| (ඊ) | කෑගල්ල දිස්ත්‍රික් කැළණිවැලි සමාගමට භුක්තිය බාර දී ඇති ඉඩමකට ආරවුල් නඩුවක් තිබියදී එය නොසලකා කොමිෂන් සභාවෙන් ව්‍යාජ අඩු ආදායම් ඔප්පුවක් ලබාදීම හේතුවෙන් රු.1,371,750ක මුදලක් සභාව විසින් අධිකරණයට ගෙවීම නිසා සිදු වූ මූල්‍යමය අලාභය 101 සිට 104 දක්වා වූ මු.රෙ. ප්‍රකාරව වගකිවයුතු පුද්ගලයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතු වුවත් එසේ සිදුකර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව පරීක්ෂණ සිදුකර වගකිවයුතු පුද්ගලයන්ගෙන් සිදුව ඇති අලාභය අයකරගත යුතුය. | මූලික විමර්ශන වාර්තාව මගින් අවවාද කිරීම, තදින් අවවාද කිරීම හැර වෙනත් සුළු හෝ බරපතල දඬුවමක් නියම කිරීම සුදුසු නොවන බවට දක්වා තිබීම මත කොමිෂන් සභාව අවවාද කිරීමට තීරණයකර ඇති බව වාර්තාකර ඇත. | නිලධාරීන්ගේ නොසැලකිල්ල මත සිදුව ඇති අලාභය වගකිව යුතු අයගෙන් අයකරගත යුතුව ඇත. |
| (උ) | සභාවට අයත් ඔලබොඩුව, යහල කැලේ හා ඉංගිරිය වතුවලට අයත් අක්කර 22 ක භූමියක පිහිටි කලුගල් 2001, 2004 හා 2005 යන වර්ෂවලදී බදු දී තිබුණු අතර, මිල්ලනිය හොරේකන්ද වතු යායට අයත් අක්කර 10 ක ඉඩමක පිහිටි කළු ගලක් 2003 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වාම අනවසරයෙන් | විධිමත් පරිදි බදු දිම මගින් අනවසර කැණීම් නතර කිරීමට හා හිඟ බදු මුදල් අයකරගැනීමට කටයුතු කළ යුතුය. | භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය වෙත රාජ්‍ය භාගය ලෙස අයකරන මුදල් පිළිබඳ තොරතුරු ලබාගෙන ඒ අනුව කලුගල් බදුකුලී අයකිරීමට සහ මුදල් නොගෙවන බදුකරුවන්ට එරෙහිව නඩු පැවරීමට කටයුතුකර ඇති බව වාර්තාකර ඇත. | අනවසර කැනීම් නතර කිරීම සහ හිඟ බදු මුදල් අයකර ගැනීම සිදුකර නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | කැණීම්කර තිබුණි. බදුකරුවන් විසින් බදු මුදල් නොගෙවීම හා අදාළ ආයතන මගින් අනුමැතිය ලබා නොගැනීම හේතුවෙන් සභාව අදාළ ගිවිසුම් අවලංගු කර තිබුණද, අනවසර කැණීම් නතර කිරීමට කටයුතුකර නොතිබුණි. ඒ අනුව 2018 වර්ෂයේ නොවැම්බර් 30 දිනට අයවිය යුතු හිඟ බදු මුදල රු.47,433,565 ක් වී තිබුණි. | | | |
| (ඌ) | සභාවට අයත් මැද්දේ ගෙදර වත්තෙන් අක්කර 04 රූඩ් 03 පර්චස් 03 ක් වූ ඉඩමක බාහිර පාර්ශවයක් විසින් 2002 වර්ෂයේ සිට අනවසරයෙන් භුක්ති විඳින අතර අදාළ පාර්ශවය විසින් එම ඉඩමෙහි කාමර 04 ක්, කබානා 10 ක් හා ස්වභාවික නාන තටාකයක් සහිත හෝටලයක් ඉදිකර තිබුණු අතර පර්චස් 10 ක් පමණ විශාල නාන තටාකයක්ද 2018 වර්ෂය වන විට ඉදිකරමින් පැවතුණි. එම ඉඩම අත්පත්කර ගැනීමට හෝ බදු පදනම මත ලබා දීමට 2020 වර්ෂය අවසන්වන විටත් සභාව විසින් කටයුතු කර නොතිබුණි. | අනවසර අත්කර ගැනීම හඳුනාගෙන ඒ සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීමට හෝ අනවසරයෙන් භුක්ති විඳින ලද කාලයට අදාළ හිඟ බදු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | 2002 වසරේ සිට 2021.12.31 දක්වා අනවසරයෙන් භුක්ති විඳි කාලයට අදාළව අයවිය යුතු රු.3,267,810 ක කල්බදු මුදල කොමිෂන් සභාව වෙත ගෙවන ලෙසට 2022.01.04 දින හෝටලයේ අයිතිකරු වෙත දැනුම් දී ඇති බව වාර්තාකර ඇත. | කොමිෂන් සභාව වෙත කිසිදු බදු ගෙවීමකින් තොරව සහ අනවසරයෙන් හෝටලය පවත්වාගෙන යමින් සිටි. |
| (එ) | පුත්තලම දිස්ත්‍රික්කයේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉරණවිලවත්ත ඉඩම 2000 වර්ෂයේ සිට අනවසරයෙන් පරිහරණය කරමින් අක්කර 40ක ප්‍රමාණයක් පුද්ගලයින් 10 | ආයතනය අයකර ගත යුතු බදු මුදල් නියමිත පරිදි අයකර ගැනීමට කටයුතු කළ යුතු බව හා ඊට වගකිව යුතු නිලධාරීන් | මෙම ව්‍යාපෘති සඳහා බදු ගිවිසුම් ලබාදීමට කටයුතු කරමින් පවතින බව වාර්තා කර ඇත. | බදු අයකර ගැනීම හෝ වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනීම සිදුකර නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | දෙනෙකු විසින් ඉස්සන් වගා කිරීම සඳහා යොදාගෙන තිබුණු අතර ඉහත ඉඩම නීත්‍යානුකූලව දීර්ඝකාලීන බදු පදනමට ලබාදීමට කටයුතු කරන තෙක්, 2014 වර්ෂයේ සිට අක්කරයකට රු. 10,000 බැගින් අයකිරීමට සභාපති අනුමැතිය මත සහ පනතේ 22 (1) (අ) ප්‍රකාරව 2000 වර්ෂයේ තක්සේරුව මත 2001 ජනවාරි 17 දින සිට බදු පදනම මත ඉඩම ලබාදීමට තීරණය කර තිබුණ ද, 2020 දෙසැම්බර් දක්වාම එම තීරණය ක්‍රියාත්මක කර නොතිබුණි. | සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය. | | |
| (ඒ) | පුත්තලම දිස්ත්‍රික්කයේ පිහිටි කුසල බී වත්ත ඉඩමෙන් අක්කර 59 ක ප්‍රමාණයක් 1994 වර්ෂයේ පෞද්ගලික සමාගමක් වෙත ඉස්සන් වගා කිරීමේ ව්‍යාපෘතියක් සඳහා බදු පදනමට ලබාදී තිබුණ ද, 1999 වසරේ සිට 2002 දක්වා ගෙවීමට ඉතිරිව තිබූ හිඟ බදු මුදල රු.850,000 ක් පමණ වූ අතර සමාගම විසින් 2004 වර්ෂයේ බදු ගිවිසුම උකස් තබා බැංකු ණය මුදලක් ලබාගෙන එම ණය මුදල ආපසු බැංකුවට නොගෙවීම හේතුවෙන් 2011 වර්ෂයේ බදු අයිතිය බැංකුව සතු කර ගෙන තිබුණත් ඒ සම්බන්ධව කොමිෂන් සභාව නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීමටත් 2018 වර්ෂය දක්වා අයවීමට තිබුණු රු. 8,166,687 | ආයතනයේ නියමිත ක්‍රම වේදයට අනුව ඉඩම් බදු දීම, පසු විපරම් කිරීම, බදු නොගෙවන්නන් සම්බන්ධයෙන් නියමිත කාල සීමාව තුළ නීත්‍යානුකූල කටයුතු සිදු කිරීම. | අදාළ ඉඩමෙන් කොටසක් පමණක් බදුකරු භුක්ති විඳින බව පවසා ඇති බැවින් ඉඩම හඳුනාගැනීම සඳහා මැනුමක් සිදුකිරීමට කටයුතු කරන බව වාර්තාකර ඇත. | විගණකාධිපති නිර්දේශ පිළිබඳ අවධානය යොමුකර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | ක් වූ බදු මුදල අයකිරීමටත් කටයුතු කර නොතිබුණි. | | | |
| (ඔ) | පුත්තලම දිස්ත්‍රික්කයේ පිහිටි කුඹුටුකුලිය වත්ත නැමැති ඉඩමෙන් අක්කර 74 රූඩ් 02 පර්චස් 23 ක් ඉස්සන් ගොවිපලක් සඳහා පෞද්ගලික ආයතනයක් වෙත 2009 නොවැම්බර් 10 දින වසර 30 ක කාලයක් සඳහා බදු පදනමට ලබා දී තිබුණි. 2010 වසර වන විට ඉහත ව්‍යාපෘතිය ක්‍රියාත්මක වී නොතිබුණු බැවින් 2014 අගෝස්තු වන විට ඉඩමේ බුක්තිය පමණක් ආපසු කොමිෂන් සභාවට පවරාගෙන තිබුණද, 1998 ජනවාරි සිට 2014 අගෝස්තු දක්වා අයවිය යුතු රු.8,250,000ක හිඟ බදු මුදල 2019 මැයි 30 දක්වාම අයකරගෙන නොතිබුණි. | දිස්ත්‍රික් කාර්යාල මගින් අදාළ දිස්ත්‍රික්කවල ඉඩම් සම්බන්ධයෙන් අධීක්ෂණය හා පසු විපරම් කර ලැබිය යුතු මුදල් කඩිනමින් ලබාගත යුතුය. | අදාළ මුදල් අය කර ගැනීම පුත්තලම දිස්ත්‍රික් කාර්යාලය මගින් සිදු කරමින් පවතින බව සහ අදාළ බදුකරුවන්ට බදු ගිවිසුම් ලබාදීමට කටයුතු කරමින් පවතින බව වාර්තාකර ඇත. | 2021 වර්ෂයේදීද බදු මුදල් අයකර ගෙන නොතිබුණ. |
| (ඕ) | බදුල්ල දිස්ත්‍රික්කයේ හාලිඇළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි ග්ලේන් ඇල්පින් වත්ත නැමැති ඉඩමෙන් අක්කර 04 රූඩ් 02 ක ප්‍රමාණයක් 1978 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා වර්ෂ 31 ක් කෝවිලක් විසින් අනවසරයෙන් භුක්තිවිඳ ඇති බැවින් 2009 වර්ෂයේදී පරිපාලන ගාස්තු අයකිරීමට තීරණය කළ බව කෝවිලේ පරිපාලනය වෙත සභාව විසින් දැනුම් දී තිබුණද, අදාළ ගාස්තු ගණනය කර කෝවිල වෙත දැනුම් දීමට කටයුතු කර | අනවසර ඉඩම් පරිහරණය සම්බන්ධයෙන් පවත්නා නීති රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු අතර බදු දීම් නියමානුකූල කිරීමට හා හිඟ බදු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොමැත. | කෝවිල දැනටත් පවතින අතර 2021.12.31 දිනට අයවිය යුතු මුළු බදු රු.6,819,834 ක් වී තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | නොතිබුණි. තවද, 2009 වර්ෂයේ සිට 2020 වර්ෂය අවසානය දක්වා අයවිය යුතු රු.5,410,964ක බදු මුදල අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. | | | |
| (ක) | කෑගල්ල දිස්ත්‍රික්කයේ මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි කොටගලවත්ත නැමැති ඉඩමෙන් අක්කර 75 ක්, ළමා නිවාසයක් වෙත වර්ෂ 30 ක කාලයක් සඳහා බදු දී තිබුණු අතර, අදාළ බදු කාලය 2009 වර්ෂයේදී අවසන් වී තිබුණි. 2020 වර්ෂය අවසන් වන විට හිඟව පැවති රු.13,265,485 ක බදු මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පවතින ක්‍රමවේදයට අනුව ඉඩම බදු දීමට හා බදු මුදල් අය කිරීමට කටයුතු කළ යුතුය. | වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොමැත. | ළමා නිවාසය අඛණ්ඩව පවත්වාගෙන යමින් පවතින අතර 2021.12.10 දිනය වන හිඟ බදු මුදල රු.10,784,610 ක් වී තිබුණි. |
| (ග) | හෝමාගම ප්‍රදේශයේ පිහිටි ලේලන්ඩ් වත්ත නැමැති ඉඩමෙන් අක්කර 6 ක් වසර 50 ක් සඳහා පෞද්ගලික සමාගමක් වෙත 2005 සැප්තැම්බර් 09 දින බදු දී තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් වලංගු බදු ගිවිසුමට එළඹීමට සභාව කටයුතු කර නොතිබුණු අතර, හිඟව පැවති රු.12,149,260 ක බදු මුදලක්ද අයකර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි. | පවතින ක්‍රමවේදයට අනුව ඉඩම බදු දීමට හා බදු මුදල් අය කිරීමට කටයුතු කළ යුතුය. | වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | හිඟ බදු මුදල් ගෙවන ලෙස අදාළ බදුකරුට දැනුම් දී ඇති අතර හිඟ බදු අයකර ගැනීමෙන් පසු වලංගු බදු ගිවිසුමක් සකස් කිරීමට කටයුතු කරන බව වාර්තා කර ඇත. 2021.12.31 දින වන විට හිඟ බදු මුදල රු.12,149,260 ක් වී තිබුණි. |
| (ච) | ගාල්ල දිස්ත්‍රික්කයේ මහහේන්තැන්න වත්ත ඉඩමේ අක්කර 10 ක ප්‍රමාණයක් එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා ණය | ඉඩම් බැහැර කිරීම පවත්නා නීති රෙගුලාසි අනුව සිදුකළ යුතු අතර, බාහිර පාර්ශවයන්ට | නීතිමය පියවර ගැනීමට කටයුතු කරන බව වාර්තා කර ඇත. | අත්තිකාරම් මුදල සහ පොලිය පියවා නොමැත. නිවාස ව්‍යාපෘතිය ආරම්භ කර |

| | | | | |
|---|---|---|---|---|
| | යෝජනා ක්‍රමය යටතේ නිවාස සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා සමාජ සුභසාධන සමිතියක් වෙත ලබාදීමට අමතරව, ගිවිසුමක් මගින් අදාළ ඉඩමේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා රු.1,000,000 ක අත්තිකාරම් මුදලක් සියයට 10 ක වාර්ෂික පොලියට මාස 6 ක් තුළ ආපසු ගෙවීමේ පදනම මත 2019 වර්ෂයේදී ලබා දී තිබුණි. 2020 වර්ෂය අවසන් වන විටත් අදාළ නිවාස ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබූ අතර, අත්තිකාරම් මුදල හෝ පොලිය අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. | ලබාදී ඇති අත්තිකාරම් නොපමාව පියවා ගත යුතුය. | | නොතිබුණි. |
| (ඡ) | කළුතර දිස්ත්‍රික්කයේ කාලවිලවත්ත ඉඩමෙන් රූඩ් 02 පර්චස් 9.94 ක බිම් ප්‍රමාණය සංචාරක නිවාඩු නිකේතනයක් ඉදිකිරීම සඳහා 2001 සැප්තැම්බර් 19 දින අංක 8502 දරන බදු ගිවිසුම මගින් පුද්ගලික සමාගමක් වෙත බදු දී තිබුණු අතර, එම ඉඩම අනවසරකරුවන් භුක්ති විඳින බව අදාළ සමාගම විසින් 2001 වර්ෂයේ අවස්ථා 02ක දී දැනුම් දී තිබුණ ද, ඒ සම්බන්ධයෙන් සභාව කිසිදු පියවරක් ගෙන නොතිබුණි. අදාළ සමාගම විසින් 2002 වර්ෂයේ සිට බදු මුදල් ගෙවීම පැහැර හැර තිබුණු අතර, 2020 වර්ෂය අවසන් වන විට අයවිය යුතු බදු මුදල රු.23,894,700 ක් වී තිබුණි. | හිඟ බදු මුදල් අයකරගත යුතු අතර බදු ගිවිසුම ප්‍රකාරව කටයුතු කළ යුතුය. | වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොමැත. | නීතිමය පියවර ගැනීමට කටයුතු කර නැත. |

| | | | | |
|---|---|---|---|---|
| (ට) | 2002 වසරේ සිට 2004 වසර දක්වා සභාව ව්‍යාපෘති සඳහා ඉඩම් බදු දීමේ ක්‍රමවේදයට පටහැනිව ඉඩම්වල බුක්තිය පවරා දීමට කටයුතු කර තිබීම නිසා 2004 වර්ෂයේ කැබිනට් පත්‍රිකාවක් මඟින් එවැනි බදු දීම් තහනම් කර තිබුණි. මෙම ඉඩම් වලින් භුක්තියට පවරාදෙන ලද සහ භුක්තියට පවරා නොදෙන ලද ඉඩම් වෙනමම හඳුනාගෙන ලේඛනගත කර නොතිබුණි. භුක්තියට පවරා දෙන ලද ඉඩම් ලෙස විගණනය හඳුනාගත් ඉඩම් අක්කර 760 යි පර්චස් 31 ක් ආපසු කොමිසමට භාරදී නොතිබුණි. භුක්තිය භාර නොදුන් අක්කර 1689 ක් සඳහා ලබාදී තිබූ අත්තිකාරම් මුදල් එම ඉල්ලුම්කරුවන්ට ආපසු ලබාදීමට කටයුතු කර නොතිබුණු අතර මෙම ඉඩම් පිළිබඳ පසු විපරම් කටයුතු ද සිදුකර නොතිබුණි. | බුක්තියට පවරා දෙන ලද හා නොදෙන ලද ඉඩම් පිළිබඳ ලේඛනයක් නඩත්තු කළ යුතු අතර එම ඉඩම් පිළිබඳ පසුවිපරම් කටයුතු සිදු කර එම ඉඩම් වල අයිතිය තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතුය. | වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොමැත. | විමර්ශන නිලධාරීන් ලවා නැවත වාර්තා ලබා ගෙන කැබිනට් මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර නැත. |
| (ඩ) | ඉඩම් ඔප්පු දස ලක්ෂයක් ප්‍රධානය කිරීමේ වැඩසටහන යටතේ ඔප්පු 60,000 ක් වර්ෂ 03 ක කාලයක් තුළ ප්‍රදානය කිරීම සඳහා ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය රු. මි. 219 ක් වූ අතර 2019 අප්‍රේල් 30 දින වන විට සභාව විසින් ඔප්පු 2712 ක් පමණක් ප්‍රදානය කර තිබූ අතර ඒ සඳහා වැය කර තිබූ පිරිවැය රු.90,915,043 ක් විය. ඒ අනුව ඔප්පුවක් ප්‍රදානය කිරීම සඳහා | සැලසුම් හා ඇස්තමේන්තු අනුව අරපිරිමැස්මෙන් වියදම් දැරීම හා ඊට අදාළව කාර්යය සාධනය කාර්යක්ෂමව ඉටු කරගත යුතු වීම. | වර්තමානයේදී ඔප්පු බෙදා දීමේ උත්සව අවස්ථාවන්හිදී අඩුම පිරිවැයක් දරමින් වැඩි ඔප්පු ප්‍රමාණයක් බෙදා දීමට කටයුතු කරන බව වාර්තාකර ඇත | වියදම් අවම කිරීමට වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත පිරිවැය රු. 3650 ක් වුවත් සභාව දරා තිබූ පිරිවැය රු. 33,523 ක් විය. | | | |
| (ත) | සභාවේ ඉඩම් මැනුම් කර නියමානුකූල කරන අවස්ථාවේ ප්‍රතිපූර්ණය කිරීමට යටත්ව ඉඩම් මැනුම් කර තිබුණු බලයලත් මිනින්දෝරුවන් හට රු.33,503,021 ක් ගෙවා තිබුණි. ආයතනයේ කඩිනම් ඔප්පු ලබා දීමේ වැඩසටහනක් ක්‍රියාත්මක වී තිබියදීත් 2020 වර්ෂය අවසානය දක්වා මෙයින් රු. 945,323 ක් පමණක් ප්‍රතිපූර්ණය කරගෙන තිබුණි. | සභාවේ අරමුදල් ආර්ථිකමය ලෙස උපයෝජනය කළ යුතු අතර, ඔප්පු ලබාදීම කඩිනම්කර මැනුම් ගාස්තු අයකරගත යුතුය. | මැනුම් ගාස්තු අයකිරීම මන්දගාමීව සිදුකරනු ලබයි. | 2021 වර්ෂය අවසානය වනවිට රු.6,022,950 ක් වමණකි අයකර තෙන තිබුණි. |
| (ද) | පරිගණක මෘදුකාංග පැකේජයක් මිලදී ගැනීම සඳහා 2002 වර්ෂයේදී පෞද්ගලික සමාගමක් වෙත ගෙවා තිබුණු රු.17,000,000 ක මුදල නැවත ලබා ගැනීමට හෝ අදාළ මෘදුකාංග පැකේජය ලබා ගැනීමට 2020 වර්ෂය අවසන් වන විටත් සභාව කටයුතු කර නොතිබුණි. | මුදල හෝ අදාළ මෘදුකාංගය ලබාගත යුතුය. | වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොමැත. | ගෙවූ මුදල පොත්වලින් ලියා හැරීමට හෝ ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කිරීමට අවශ්‍ය ලේඛන රේඛීය අමාත්‍යාංශයට 2021.11.10 වන දින යොමු කර ඇති බව වාර්තාකර ඇත. |

## 98. ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 - අහිතකර මතය

2019 - අහිතකර මතය

2020 - තතත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | වරායන් 06 ක් සංවර්ධනය කිරීම සඳහා ශක්‍යතා අධ්‍යයන වාර්තාවක් පිළියෙල කිරීම වෙනුවෙන් බාහිර ආයතනයකට රු.1,612,898 ක් වැඩිපුර ගෙවා තිබුණද එය වර්ෂ 07 කට වැඩි කාලයක සිට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර වැඩිපුර ගෙවීමට වගකිව යුතු නිළධාරීන් හඳුනාගෙන එම නිළධාරීන් සම්බන්ධව නීතිමය පියවර ගැනීමටද කටයුතු කර නොතිබුණි. | වගකිව යුතු නිළධාරීන් හඳුනාගෙන එම නිළධාරීන් සම්බන්ධව නීතිමය පියවර ගැනීමට කටයුතු කළ යුතුයි. | මෙම මුදල අයකර ගැනීම සම්බන්ධයෙන් අමාත්‍යංශ මණ්ඩලය මඟින් මුදල කපා ගැනීමට තීරණය කරන ලදි. එමෙන්ම මේ සම්බන්ධයෙන් තව දුරටත් අමාත්‍යංශ විගණන හා කළමනාකරණ රැස්වීමේදී තවදුරටත් සාකච්ඡා පවතී. | මෙය වියදමක් සේ ලියා හැරීමට අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා ලේකම්ට භාර දී ඇත. මුදල් අයකරගෙන නැත. |
| (ආ) | නියෝජිතායතනය වෙත විධිමත් පරිදි පවරා නොගත් ඉඩමක, නියෝජිතායතනයේ අරමුණු වලින් බැහැරව රු.15,245,000 ක් වැයකර 2014 වර්ෂයේදී මත්ස්‍ය අලෙවි සැලක් බේරුවල ඉදිකර තිබූ අතර මේ දක්වා එම අලෙවිසැල නිෂ්කාර්යව පැවතුණි. | අරමුණු වලට අනුව කටයුතු කල යුතු අතර වත්කම් වලින් උපරිම ප්‍රයෝජන ගැනීමට කටයුතු කළ යුතුය. | ප්‍රදේශයේ මත්ස්‍ය ව්‍යාපාරිකයින් මෙම අලෙවි සැල තුල ව්‍යාපාර පවත්වා ගෙන යාමට අකමැති වීම නිසා නිෂ්කාශනව පවතී. | 2021 වර්ෂය අවසානය දක්වාම ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. |
| (ඇ) | බෝට්ටු 02 ක් නිෂ්පාදනය කිරීම සඳහා 2011 වර්ෂයේදී රු.4,493,052 ක් වැය කර අධිබලැති බෝට්ටු එන්ජින් දෙකක් මිලට ගෙන බෝට්ටු 02 | ව්‍යාපෘතිය සඳහා වැයකල මුදල් නිෂ්කාර්ය වියදමක් නොවන ලෙස කටයුතු කල යුතුය. | අමාත්‍යංශ විගණන හා කළමනාකරණ කමිටුවේ සාකච්ඡා වට කිහිපයකින් පසුව තීරණය වූ පරිදි වෙනත් රාජ්‍ය ආයතනයක් වෙත | එන්ජින් දෙක නාවික හමුදාවට හෝ සාගර විශ්ව විද්‍යාලයට පැවරීමට තීරණය කර ඇත. බෝට්ටු 02 |

| | | | | |
|---|---|---|---|---|
| | නිෂ්පාදනය කිරීමේ කටයුතු ආරම්භ කර ඒ වෙනුවෙන් අතිරේක රු.2,902,938 ක්ද දරා තිබුණි. එසේ වුවත් එම එන්ජින් දෙක හා නිෂ්පාදනය අවසන් නොකල බෝට්ටු 02 ක 2021 වර්ෂය අවසනය දක්වාම ගබඩාවේ නිෂ්කාර්යව තබා තිබුණි. | | පැවරීමට ඉදිරි කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතී. | සඳහා ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. |
| (ඈ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අධ්‍යක්ෂ මුදල් තනතුරු සඳහා අනුමත කරන ලද බඳවා ගැනීමේ පටිපාටිය අනුව මූලික සුදුසුකම් සම්පූර්ණ කර නොතිබුණු නිළධාරියෙකු අධ්‍යක්ෂ මූල්‍ය තනතුර සඳහා බඳවා ගෙන 2017 මැයි සිට 2020 දෙසැම්බර් 31 දක්වා වැටුප් හා දීමනා ලෙස එකතුව රු.7,666,842 ක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පෙර වර්ෂ 02 කදී පෙන්වා තිබුණද නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | බඳවා ගැනීමේ පටිපාටිය අනුව නියමිත බඳවා ගැනීම් කළ යුතුය. | බඳවා ගැනීම සම්බන්ධයෙන් අල්ලස් හෝ දූෂණ විමර්ශන ඒකකය මඟින්ද විමර්ෂණයක් සිදුකරමින් පවතින අතර, ඒ ලැබෙන පිළිතුර හා ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 11.9 උප වගන්තිය අනුව ඉදිරියේදී ගත යුතු ක්‍රියාමාර්ග ගැනීමට අදාල කටයුතු කරනු ලබන බව වැඩිදුරටත් දන්වා සිටිමි. | 2021 වර්ෂය අවසානය දක්වා ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. |
| (ඉ) | මහා භාණ්ඩාගාරයට පියවිය යුතු රු.39,930,000 ක ව්‍යවස්ථාපිත ගෙවීමක් වසර 02 ක කාලයක් ඉක්මවා ගියද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ව්‍යවස්ථාපිත ගෙවීමක් බැවින් භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර නිරවුල් කිරීමට කටයුතු කල යුතුයි. | පෙර වර්ෂ වල ප්‍රමාණවත් ඉපයීම් නොතිබීම මත මෙම නිරවුල් කිරීම ප්‍රමාද වී ඇත. | 2021 වර්ෂය අවසානය දක්වා මුදල් ගෙවීමට ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. |
| (ඊ) | ව්‍යාපෘති ණයහිමි ශේෂ ලැයිස්තුවේ ඇතුලත්ව තිබුණු රු.20,420,827ක් වටිනා ව්‍යාපෘති 27 ක් වර්ෂ 7-4 ත් කාලයක සිට අක්‍රීයව පවතින | අක්‍රීයව පවතින ව්‍යාපෘති පිළිබඳ සොයා බලා අදාල වගකීම් නිරවුල් කිරීමට කටයුතු කල යුතුය | අංක 01 ව්‍යාපෘතිය අවසන් වී ඇති අතර උපකරණ මිළදී ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදු වෙමින් පවතී. ශේෂ ලැයිස්තුවේ අංක 08 සහ | 2021 වර්ෂයේදීද නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගෙන නොමැත. |

නමුත් එම ව්‍යාපෘති පිළිබඳ සොයා බලා අදාල වගකීම් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම ව්‍යාපෘති උපලේඛනය එා ටෙන්ඩර් තැන්පතු ලේඛණය අනුව වටිනාකම රු.70,554,695 ක් වූ ව්‍යාපෘති 54 ක් සඳහා ව්‍යාපෘති වාර්තා අදාල සේවාදායකයා වෙත නියමිත පරිදි ඉදිරිපත් කර ඇති බව විගණනයේදී තහවුරු කර ගත නොහැකි විය.

09 යන ව්‍යාපෘති දෙක ක්‍රියාත්මක වන ව්‍යාපෘති වන අතර එම ලේඛණයෙන් ඉවත් විය යුතුය. අංක 12 ව්‍යාපෘතියේ මුදල් අමාතයංශය වෙත නැවත ගෙවා ඇත. අංක 14 සිට 26 දක්වා වූ ව්‍යාපෘති ක්‍රියාකාරී නොවන ව්‍යාපෘති ලෙස හඳුනාගෙන කපා හැරීමේ අනුමැතිය සඳහා පාලක මණ්ඩලය වෙත ඉදිරිපත් කළද සාකච්ඡා නොවීම හේතුවෙන් නැවත ඉදිරිපත් කිරීමට තබා ඇත.

## 99. ජාතික මූලික අධ්‍යයන ආයතනය

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - තතත්ත්වාගණනය කළ මතය

2019 - තතත්ත්වාගණනය කළ මතය

2020 - තතත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 756 රෙගුලාසිය ප්‍රකාරව සෑම වර්ෂයකම වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් සිදු කළයුතු වුවත්, ජාතික මූලික අධ්‍යයන ආයතනයට අයත් පුස්තකාලයේ 2019 වර්ෂයේ සිට වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයන් සිදු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය | පුස්තකාලයේ භාණ්ඩ සමීක්ෂණය සඳහා කමිටුවක් පත්කර භාණ්ඩ සමීක්ෂණය ආරම්භ කර ඇත. | 2021 වර්ෂයේදීද නිවැරදි කිරීමට කටයුතු කර නොමැත. |
| (ආ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව වටිනාකම රු.1,073,884,363 ක් වූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ස්ථාවර වත්කම් ලේඛනය පිළියෙල කිරීම ආරම්භ කර ඇත. | නිවැරදි කිරීමට කටයුතු කර නොමැත. |
| (ඇ) | ජාතික මූලික අධ්‍යයන ආයතනය වෙත අක්කර 14, රූඩ් 02, පර්චස් 17.5 ක වපසරියකින් යුතු හන්තාන වතු යායට අයත් ඉඩම ජාතික වතු සංවර්ධන මණ්ඩලය විසින් 1990 ජූනි 08 දින පවරා දී ඇතත්, එහි නිත්‍යානුකූල අයිතිය | ඉඩමේ අයිතිය නිත්‍යානුකූලව පවරා ගැනීමට කටයුතු කළ යුතුය. | මෙම ඉඩමේ අයිතිය සම්බන්ධයෙන් වෙනත් පුද්ගලයෙකු හා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම අතර නඩුවක් පවතින බැවින් පවරා ගැනීමේ කටයුතු ප්‍රමාද වී ඇත. | ඉඩම් පවරා ගැනීමේ කටයුතු අවසන්කර නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | ලබා ගැනීමට 2020 වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි. | | | |
| (ඈ) | 2018 සිට 2020 වර්ෂ තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිතව තිබූ රු. මිලියන 566.6 ක ඇස්තමේන්තුගත අගයක් වූ පර්යේෂණ ව්‍යාපෘති යෝජනා 05 ක් විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ අනුමැතිය නොලැබීම හේතුවෙන් ක්‍රියාත්මක කර නොතිබුණි. | අදාළ අනුමැතිය ලබා ගෙන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. | 2018-2020 වර්ෂ සඳහා ක්‍රියාත්මක කිරීමට යෝජිතව තිබූ රුපියල් මිලියන 566.6 ඇස්තමේන්තුගත පර්යේෂණ ව්‍යාපෘති 05 සඳහා මේ වන තෙක් අනුමැතිය ලැබී නොමැත. | අනුමැතිය ලබාගෙන ව්‍යාපෘති ආරම්භ කිරීමට පියවර ගෙන නැත. |
| (ඉ) | ජාතික මූලික අධ්‍යයන ආයතනය විසින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති 03 ක් සඳහා 2020 වර්ෂය අවසානය වන විටත් අදාළ පේටන්ට් (Patents) බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පේටන්ට් (Patents) බලපත්‍ර ලබා ගැනීමේ කටයුතු සම්බන්ධයෙන් පසුවිපරම් කළ යුතුය. | පේටන්ට් බලපත්‍ර ලබා ගැනීමේ පසුවිපරම් කටයුතු කඩිනම් කිරීමට පියවර ගෙන ඇත. | බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කර නැත. |
| (ඊ) | ජාතික මූලික අධ්‍යයන ආයතනය සඳහා Integrated Software පද්ධතියක් ස්ථාපිත කිරීමට පුද්ගලික ආයතනයක් සමග 2016 මාර්තු 28 දින ගිවිසුම්ගත වුවත් අදාළ පද්ධතිය ස්ථාපිත නොකිරීම හේතුවෙන් නැවත 2018 මාර්තු 26 දින ගිවිසුමකට එළඹ තිබුණි. ආයතනය විසින් රු.660,000 ක මුදලක් අත්තිකාරම් වශයෙන් හා රු.6,864,960 ක මුදලක් පරිගණක හා උපාංග මිලදී ගැනීම සඳහා වැය කර | ගිවිසුම් ප්‍රකාරව මෙම පද්ධතියේ ඉදිරි කටයුතු කඩිනමින් සිදු කරවා ගැනීමට කටයුතු කළ යුතුය. | ආයතනයේ අවශ්‍යතා නිසි පරිදි ඉටු නොවීම හා තාක්ෂණික වශයෙන් යල්පැන යාම හේතුවෙන් 2021 දෙසැම්බර් 30 දින පැවති පාලක මණ්ඩල රැස්වීමේදී එම පද්ධතිය ඉදිරියට ක්‍රියාත්මක නොකිරීමට තීරණය කර ඇත. | විකල්ප ක්‍රියාමාර්ග ගැනීමට කයටුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | ඇතත්, 2020 වර්ෂය අවසානය වන විටත් එම පද්ධතිය ස්ථාපිත කර නොතිබුණි. | | | |
| (උ) | ප්‍රාග්ධන ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදිත රු.63,862,681 ක මුදලක් අදාළ කාර්ය වෙනුවෙන් උපයෝජනය නොකර ඉන් රු.51,287,288 ක් බැංකුවක ආයෝජනය කර තිබුණි. | අරමුදල් කඩිනමින් උපයෝජනය කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය. | මේ වන විට මෙම මුදල්වලින් කොටසක් පමණක් අදාළ කාර්යයන් වෙනුවෙන් උපයෝජනය කර ඇති අතර ඉතිරි මුදලින් අදාළ කාර්යයන් ආරම්භ කර ඇත. | සැලසුම් කළ කාර්යය 2021 වර්ෂය අවසානය දක්වාම නිමකර නැත. |
| (ඌ) | 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛයේ 9.10 ඡේදය ප්‍රකාරව, කාර්යය මණ්ඩලය කළමනාකරණය කිරීමේදී කෙටිකාලයක් තුළ පවතින පුරප්පාඩු පිරවීමට කටයුතු කළයුතු බව දක්වා තිබුණද 2020 දෙසැම්බර් 31 දිනට ජාතික මූලික අධ්‍යයන ආයතනයේ කාර්යය මණ්ඩලය තුළ තනතුරු 09 ක පුරප්පාඩු 27 ක් පැවතුණි. ඉන් නිලධාරීන් 17 දෙනෙකුම පර්යේෂණ කාර්යය මණ්ඩලය වූයෙන් පර්යේෂණ කටයුතු වෙනුවෙන් පිහිටුවා ඇති ජාතික මූලික අධ්‍යයන ආයතනයේ මූලික අරමුණු ළඟා කර ගැනීමට අපහසු වී තිබුණි. | චක්‍රලේඛ උපදෙස්වලට අනුකූලව කඩිනමින් පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. | පුරප්පාඩු වී ඇති තනතුරු කඩිනමින් පිරවීමට කටයුතු යොදා ඇත. | නියමිත පුරප්පාඩු 2021 වර්ෂය අවසානය දක්වාම පුරවා ගැනීමට කටයුතු කර නැත. |
| (එ) | වර්ෂයකට වැඩි කාල පරිච්ඡේදයක් අභ්‍යන්තර විගණන තනතුර පුරප්පාඩු වී තිබූ නමුත් ඒ සඳහා සුදුසු අයකු | අභ්‍යන්තර විගණකවරයෙකු බඳවා ගෙන අභ්‍යන්තර විගණන කටයුතු | අභ්‍යන්තර විගණන නිලධාරියෙකු බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. | අභ්‍යන්තර විගණන ඒකකයක් ආරම්භ කර නැත. |

බඳවා ගෙන නොතිබූ අතර එකී  පවත්වාගෙන යා යුතුය.
කාල පරිච්ඡේදය තුළ ආයතනයේ කිසිදු අභ්‍යන්තර විගණනයක්ද සිදු කර නොතිබුණි.

**100.** **කාර්මික තාක්ෂණ ආයතනය**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 - තත්ත්වාගණනය කළ මතය

2019 - තත්ත්වාගණනය කළ මතය

2020 - තත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | වටිනාකම රු.6,443,743 ක් වූ බැංකු ගිණුම් 06ක් අක්‍රිය බැංකු ගිණුම් ලෙස වසර 06 කට අධික කාලයක සිට පවත්වාගෙන ගොස් තිබුණි. | අක්‍රිය බැංකු ගිණුම් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | ව්‍යාපෘති කීපයකට අයත් මෙම බැංකු ගිණුම් සක්‍රීය කිරීමට කටයුතු කරනු ලැබේ. | 2021 වර්ෂය අවසානය දක්වාම මෙකී ගිණුම් අක්‍රීයව පවතී. |
| (ආ) | විදේශ ශිෂ්‍යත්ව ගිවිසුම්වල කොන්දේසි කඩ කළ නිලධාරින් 20 දෙනෙකුගෙන් අයවිය යුතු රු.16,799,429 ක් වූ මුදල 2020 දෙසැම්බර් දින 31 වන විටත් අයකර ගෙන නොතිබුණි. | ගිවිසුම් ප්‍රකාරව හා ප්‍රමාදයකින් තොරව ගිවිසුම් කඩ කළ නිලධාරින්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | එක් නිලධාරී මහතෙකු ගිවිසුම් ප්‍රකාරව මෙම මුදල ගෙවීමට කටයුතු කර ඇත. | එක් නිලධාරී මහතෙකු ගිවිසුම් ප්‍රකාරව මෙම මුදල ගෙවීමට කටයුතු කර ඇත. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 අනුව වත්කම්වල ඵලදායී ජීව කාලය නිවැරදි ලෙස හඳුනාගෙන ගිණුම්කරණ ඇස්තමේන්තුවල නිවැරදි කිරීම් සිදු කිරීම කළයුතු වුවත් සම්පූර්ණයෙන් ක්ෂය කළ නමුත් දැනටත් භාවිතා කරනු ලබන පිරිවැය රු.804,936,305 ක් වූ ස්ථාවර වත්කම්වල ඵලදායි ජීවිත කාලය නැවත සමාලෝචනය කර මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 අනුව සම්පූර්ණයෙන් ක්ෂය කරන නමුත් භාවිතා කරන වත්කම් සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය. | සම්පූර්ණයෙන් ක්ෂය කළ, එහෙත් දැනට භාවිතා කරන වත්කම් ප්‍රත්‍යාගණනය කළ යුතු වුවද මෙම වත්කම් ප්‍රත්‍යාගණනය සඳහා පවතින ප්‍රායෝගික අපහසුතා මත හා රට තුළ පැවති වාතාවරණය මත මෙය සිදුකිරීම අපහසු වී ඇත. එනමුත් ඒ සඳහා ප්‍රවීන පළපුරුදු සේවාදායකයෙකුගේ සේවය ලබාගැනීමට කටයුතු කරමින් සිටී. | 2021 වර්ෂයේදීද අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2020 දෙසැම්බර් 31 දින දක්වා පැවති හඳුනා නොගත් සෘජු බැංකු බැර කිරීම් රු.12,756,253ක් හඳුනා ගැනීමට කටයුතු නොකර ගෙවිය යුතු වියදම් ලෙස ජංගම වගකීම් යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | හඳුනා නොගත් සෘජු බැංකු බැර කිරීම් නිසි පරිදි හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය | මෙම තත්ත්වය මගහරවා අදාල සෘජු බැංකු ගත කිරීම් හඳුනා ගැනීමට හා ගිණුම් ගත කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග කිහිපයක් 2021 අග භාගයේ සිට ක්‍රියාවට නගා ඇත. තවද නිසි ඉන්වොයිස් අංකයක් නොමැතිව අපගේ ගිණුමට මුදල් රැස්කිරීමට අවකාශ නොදීමට බැංකුව දනුවත් කර ඇත. | හඳුනානොගත් සම්පූර්ණ බැර කිරීම් හඳුනා ගැනීමට 2021 වර්ෂය අවසානය දක්වාම කටයුතු කර නොතිබුණි. |
| (ඉ) | වසර 1 ත් 7 ත් කාලයක් පැරණි එකතුව රු.14,535,683 ක් වූ ලැබිය යුතු ශේෂ තුළ පවත්නා විවිධ ණයගැති ශේෂ 2020 වර්ෂයේදීද අයකර ගෙන නොතිබුණි. | ණයගැතියන්ගෙන් මුදල් අයකර ගැනීමට ක්‍රියාකළ යුතුය. | විද්‍යා හා තාක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය කුලී පදනම මත කාර්මික තාක්ෂණ ආයතනයේ සිටි කාලයට ආදාලව ලැබිය යුතු කුලිය ලබා දෙන ලෙස කිහිප විටක්ම ඉල්ලීම්කර ඇත.<br>ආපසු ගෙවිය හැකි ගුවන් ටිකට්පත් සඳහා මුදල් ගෙවන ලෙසත් මුදල් නොගෙවන්නේනම් නීතිමය කටයුතු සඳහා යොමුවන බවට අදාල පාර්ශව දැනුවත් කර ඇත. | 2021 වර්ෂය අවසානය දක්වාම ණය අයකරගෙන නොතිබුණි. |
| (ඊ) | ඖෂධ පරීක්ෂණ රසායනාගාර සේවාවන් ලබාගැනීම සඳහා විදේශ රටවලට විශාල ගාස්තුවක් වැය කිරීමට සිදුවීම වැළැක්වීම, රුපියල් මිලියන 99 ක් වැයකර කාර්මික තාක්ෂණ ආයතනය තුල ඖෂධ රසායනාගාරය පිහිටුවීමේ අරමුණක් වුවද විදේශ රටවලින් සිදුකර ගනු ලබන පරීක්ෂණ | විදේශ විනිමය වැයකර සිදු කරන පර්යේෂණ කටයුතු කාර්මික තාක්ෂණ ආයතනයේ ස්ථාපිත ඖෂධ රසායනාගාරයට ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කළ යුතුය. | මෙම ක්‍රියාවලිය මූලික පරමාර්ථය තුළ පවතින අතර එය ජාතික අවශ්‍යතාවයක් බැවින් ඒ සඳහා බලශක්ති අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ පූර්ණ කැපවීම මත අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි හැකි ඉක්මනින් ක්‍රියාවට නැංවීම සඳහා | කාර්යක්ෂම සහ ඵලදායී ක්‍රියාමාර්ගයන් 2021 වර්ෂය අවසානය දක්වාම ගැනීමට අපොහොසත් වී තිබුණි. |

කටයුතු මෙම රසායනාගාරයෙන් සිදුකර ගැනීමට යොමු නොවීම නිසා රසායනාගාරය පිහිටුවීමේ අරමුණු ඉටුනොවන අතර තවදුරටත් පරීක්ෂණ මත විදේශ විනිමය වැයවීම වළක්වා ගැනීමට නොහැකිවී තිබුණි.

කටයුතු සිදුවෙමින් පවතී.

## 101. ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය

මූලා ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - තතත්ත්වාගණනය නොකළ මතය

2019 - තතත්ත්වාගණනය නොකළ මතය

2020 - තතත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2015 ඔක්තෝබර් 15 දිනැතිව කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ඉල්ලීම අනුව 2016 පෙබරවාරි 01 දින උළු වියලන යන්ත්‍රයක් නිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කර තිබූ අතර 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කිරීම සඳහා එකඟතාවයකට පැමිණ තිබුණි. මේ වෙනුවෙන් රු.2,000,000 ක් පමණක් ලැබී තිබුණ ද රු.5,668,011 ක් වියදම් දරා තිබුණි. නමුත් යන්ත්‍රයෙහි ක්‍රියාකරවීමේ කටයුතු 2022 මාර්තු වන විටත් අවසන් කර නොමැති බව නිරීක්ෂණය විය. | වියදම් දැරීමට ප්‍රථම අදාල ආයතන වලින් එකඟත්වය ලබාගැනීමට කටයුතු කළ යුතුය. | උළු කර්මාන්ත ශාලා හිමියන්ට සංගමයේ එකඟත්වය ඇතිව, අදාල කර්මාන්තකරුට මිනිස් ශ්‍රමය යොදවාගෙන යන්ත්‍රය භාවිතයට ගැනීමට අවසර ලබාදෙන ලදී. මෙම ව්‍යාපෘතියෙන් ලබාගත් දැනීම භාවිතා කරගෙන ඉදිරියේදී මැටි ආශ්‍රිත කර්මාන්ත සඳහා උෂ්ණත්ව රටාවන් ආදිය නිවැරදිව යොදාගෙන ඵලදායි ලෙස කර්මාන්තයන් හැසිරවීම සඳහා මැටි සහ පිත්තල අමාත්‍යාංශය සමග සහයෝගීතාවයෙන් ක්‍රියා කිරීමට අපේක්ෂා කෙරේ. | මේ සඳහා අමතර මිලියන 2.7ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරනු ලැබුවද කර්මාන්ත අමාත්‍යාංශය එම මුදල ලබාදීමට අපෝහොසත්වීම නිසා ව්‍යාපෘතිය නතර කර තිබුණි. |
| (ආ) | 2014-2018 කාලයට තුළ මධ්‍යස්ථානය විසින් තාක්ෂණ හා තාක්ෂණ උපකරණ 20 ක් හඳුන්වා දී තිබූ අතර ඒ සඳහා රු.15,400,882 ක පිරිවැයක් දරා තිබුණි. එහෙත් 2020 වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට තාක්ෂණ පැවරීම සිදු කිරීමට හැකි වී තිබුණේ ඉන් පිරිවැය රු.2,589,194 ක් වූ තාක්ෂණ හා තාක්ෂණ උපකරණ 6 ක් පමණි. | හඳුනාගත් තාක්ෂණයන් ප්‍රචලිත කිරීමට කටයුතු කළ යුතු බව. | තාක්ෂණ පැවරීම් සිදු නොකරන ලද තාක්ෂණයන්ගේ විවිධ වැඩි දියුණු කිරීම් සිදු කරන ලද අතර, එම තාක්ෂණයන් පැවරීමක් සිදු නොකලද විවිධ ආයතන සමග සම්බන්ධව ක්ෂේත්‍ර පරීක්ෂණ කටයුතු සිදු කිරීමට හා ව්‍යාප්ත කිරීමට පියවර ගෙන ඇත. | අනිකුත් තාක්ෂණයන් ප්‍රචලිත කිරීම සඳහා කටයුතු කරමින් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | ඇස්තමේන්තුගත වියදම රු.25,845,838ක් වූ Advance of NERDC cremator for Environmental performance ව්‍යාපෘතිය 2017 ඔක්තෝබර් 20 දිනැති ගිවිසුම ප්‍රකාරව මාස 07 කින් වැඩ නිම කිරීමට නියමිතව තිබුණ ද 2019 ජූලි 01 සංශෝධිත ගිවිසුම ප්‍රකාරව 2019 සැප්තැම්බර් 30 දක්වා දින දීර්ඝ කර තිබුණි. එසේ වුවත් එම දිනටද ව්‍යාපෘති කටයුතු සම්පූර්ණයෙන් අවසන් වී නොතිබුණි. | ව්‍යාපෘතිය සඳහා කාලය තීරණය කිරීමේදී ප්‍රායෝගික තත්ත්වයන් සැලකිල්ලට ගෙන තාත්වික කාලයක් ව්‍යාපෘති නිම කිරීම සඳහා ලබාදිය යුතු බව හා ව්‍යාපෘති කඩිනමින් නිම කිරිමට අවශ්‍ය කටයුතු කළ යුතුය. | කුරුණෑගල මහනගර සභාවේ නගරාධිපති තුමා සමඟ සාකච්ඡා කිහිපයක් පැවැත්වුවද ව්‍යාපෘතිය භාර ගැනීම යම් යම් හේතූන් ඉදිරිපත් කරමින් කල් දමමින් පවතී. | 2021 වර්ෂය අවසානය දක්වාම ව්‍යාපෘති වැඩකටයුතු නිමකර නොතිබුණි. |
| (ඈ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව වත්කම්වල ඵලදායී ජීව කාලය නිවැරදි ලෙස හඳුනාගෙන ගිණුම්කරණ ඇස්තමේන්තුවල නිවැරදි කිරීම් සිදු කිරීම කළයුතු වුවත් ඒ අනුව කටයුතු නොකිරීම නිසා සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු දැනටමත් භාවිතා කරනු ලබන පිරිවැය රු.116,014,265 ක් වූ යටිතල පහසුකම්වල ඵලදායී ජීවිත කාලය නැවත සමාලෝචනය කර මූල්‍ය ප්‍රකාශනවල යෙදවීමට කටයුතු කර නොතිබුණි. | සම්පූර්ණ ක්ෂය කර අවසන් එහෙත් දැනටත් භාවිතා කරන වත්කම්වල ඵලදායී ජීවකාලය නැවත සමාලෝචනය කර මූල්‍ය ප්‍රකාශන වල දැක්විය යුතුය. | ඵලදායී ජීවිත කාලය පිළිබඳ යලි සමාලෝචනයක් සිදුකරලීමට කටයුතු සකසමින් පවතී. | ඵලදායී ජීවිත කාලය පිළිබඳ යලි සමාලෝචනයක් සිදුකරලීමට කටයුතු 2021 වර්ෂයේදීද කටයුතු කර නැත. |
| (ඉ) | ව්‍යාපෘති සඳහා කාලය තීරණය කිරීමේදී ඒ සඳහා බලපාන ප්‍රායෝගික ගැටළුකාරී තත්ත්වයන් වන තාක්ෂණික ගැටළු හා අමුද්‍රව්‍ය ලබා ගැනීම | ප්‍රායෝගිකව බලපාන තත්වයන් සැළකිල්ලට ගෙන ව්‍යාපෘති කාලය තීරණය කළ යුතුය. | අදාහනාගාරය භාරදීමට කටයුතු කර ඇත. Smart Pet බෝතල් කැබලි කිරීමේ යන්ත්‍රයේ ව්‍යාපෘතිය 2020 සැප්තැම්බර් මස ව්‍යාපෘතිය | කුරුණෑගල මහනගර සභාව 2021 වර්ෂයේදීද ආදාහනාගාරය භාරගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | වැනි කරුණු පිළිබඳව අධ්‍යයනය නොකර ව්‍යාපෘති කාලය තීරණය කිරීම හේතුවෙන් 2020 වර්ෂයේ නිම කිරීමට සැලසුම් කරන ලද ව්‍යාපෘති 04ක ගිවිසුම්ගත කාලය වසර 01සිට වසර 05 දක්වා කාල පරාසයක් තුළ දීර්ඝ කිරීමට සිදුවී තිබුණි. | | අවසන් කරන ලදී. Implementation of fuelwood feeding system ව්‍යාපෘතිය ගැලපෙන සේ විශාල වෙනස්කම් සිදුකිරීමට සිදුවූ බැවින් ව්‍යාපෘතිය 2021 අප්‍රේල් දක්වා දීර්ඝ කරන ලදී. පොල්කුඩු සම්පිඩනයකර පොල්තෙල් ලබාගැනීමේ යන්ත්‍රයක් සැලසුම් කොට එම යන්ත්‍රය සාර්ථක නොවූ නිසා කොරියානු ඉංජිනේරු කණ්ඩායමක් ලංකාවට පැමිණ රැස් කොට නැවතත් යන්ත්‍රයක් නිපදවා එවනු ලැබීය. | ව්‍යාපෘති 2 ක් නිමකර ඇති අතර පොල්කුඩු නිස්සාරණ යන්ත්‍රය සාර්ථක වී නොතිබුණි. මෙම පර්යේෂණ ව්‍යාපෘතිය හරහා අපේක්ෂා කළ පරිදි නිපදවනු ලැබූ යන්ත්‍රය මගින් ඉවත ලද පොල්කුඩු යොදාගෙන පොල්තෙල් නිස්සාරණය කිරීම සාර්ථක නොවුණි. |
| (ඊ) | පිරිවැය රු.1,731,860ක් වූ 2020 වර්ෂයේ නිම කරන ලද නව තාක්ෂණ සොයා ගැනීම් 04ක් සම්බන්ධයෙන් පේටන්ට් ලබාගැනීමට, බලපත්‍ර ලබාදීමට හෝ භාවිතය සඳහා පැවරීමට කටයුතු කර නොතිබුණි. මෙම තාක්ෂණයන් වර්තමානයේ සමාජයට ඉතා වැදගත් මෙන්ම අත්‍යවශ්‍ය වන ඒවා වන අතර ඒවා ඉතා කඩිනමින් සමාජගත කළ යුතු තාක්ෂණයන් බවද නිරීක්ෂණය විය. | හැකි සෑම විටම පේටන්ට් බලපත්‍ර ලබාගැනීමත් නව සොයා ගැනීම් කඩිනමින් සමාජගත කිරීමටත් පියවර ගත යුතුය. | නිම කරන ලද තාක්ෂණයන් සඳහා තාක්ෂණ පැවරීම් ඉදිරියේදී සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. | වැඩි දියුණු කළ තාක්ෂණයන් කඩිනමින් සමාජ ගත කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන්, ප්‍රදර්ශන, පුහුණු වැඩසටහන් ආදිය පැවැත්වීම සිදු කරයි. |
| (උ) | මධ්‍යස්ථානය විසින් හඳුනාගත් නව තාක්ෂණයන් සමාජගත කිරීමේ අරමුණින් ව්‍යවසායකයන් වෙත බලපත්‍ර | ව්‍යවසායකයින් වෙත බලපත්‍ර නිකුත් කිරීමෙන් පසු අවශ්‍ය පසු විපරම් කර අවශ්‍ය උපදෙස් | ව්‍යවසායකයින් නර්ඩ් ආයතනය සමඟ වඩාත් සමීපව කටයුතු කිරීම සඳහා ආයතනය මගින් ලබා දී ඇති | 2021 වසර වන විට බලපත්‍රලාභීන් 80 දෙනෙකු පමණ බලපත්‍ර අළුත් කිරීමට |

ලබාදෙන අතර එම බලපත්‍ර ලබාදීමෙන් පසුව එම තාක්ෂණයන් පිළිබඳ පසු විපරම් කිරීමක් හෝ ඒවා වැඩිදියුණු කිරීමට උපදෙස් ලබාදීමක් සිදු නොකිරීම ආදී හේතූන් මත ව්‍යවසායකයන් විසින් බලපත්‍ර අළුත් කිරීමට අඩු ප්‍රතිචාරයක් දක්වන බව නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂය ආරම්භයේ බලපත්‍ර ලාභීන් 102ක් සිටි මුත් 63දෙනෙකු පමණක් බලපත්‍ර අළුත් කිරීම් සිදුකර තිබුණි.

ලබාදීම වැනි කරුණු සිදුකර බලපත්‍ර අළුත්කර ගන්නා තත්ත්වයට බලපත්‍රලාභීන් පත්කළ යුතුය.

තාක්ෂණයන් සඳහා ප්‍රචාරණයන් ලබාදී එමගින්ද ලැබෙන ඉල්ලීම් අදාල බලපත්‍රලාභීන් වෙත ලබාදෙමින් ඔවුන් දිරිමත් කර ඇත.

පියවර ගෙන ඇත.

## 102. ජාතික පර්යේෂණ සභාව

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 - තතත්ත්වාගණනය නොකළ මතය

2019 - තතත්ත්වාගණනය කළ මතය

2020 - තතත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | පර්යේෂණ ව්‍යාපෘති කාර්යක්ෂමව හා අපේක්ෂිත කාල පරිච්ඡේදය තුළ අවසන් කිරීම තහවුරු කිරීමට උපකරණ මිලදී ගැනීම් ප්‍රමාදයකින් තොරව සිදු කිරීම සඳහා ප්‍රසම්පාදන සැලැස්මක්/ කාල රාමුවක් පර්යේෂකගෙන් ලබාගත යුතු වුවත් එසේ සිදු කර නොතිබුණි. | පර්යේෂණයක් ආරම්භ කිරීමට පෙර ඒ සඳහා අවශ්‍ය උපකරණ මොනවාද හා ඒවා මිලදී ගැනීම සම්බන්ධව සැලැස්මක් සකස් කළ යුතු බව. | කාල රාමුවක් ලබාගෙන එය අනුව කටයුතු කරන්නේද යන්න පරීක්ෂා කිරීම පර්යේෂණ සියයකට අධික සංඛ්‍යාවක් සඳහා ප්‍රායෝගික නොවන බව සභාවේ මතය විය. එනිසා සියළුම ප්‍රධාන උපකරණ ප්‍රසම්පාදන පර්යේෂණයේ මුල් මාස 09 තුල සිදුකළ යුතු බවට නියම කරන ලදී. | මුල් මාස 09 තුල ප්‍රධාන උපකරණ ප්‍රසම්පාදනය සිදු නොකරන ව්‍යාපෘති වල අදාළ ප්‍රධාන උපකරණ සඳහා වෙන්කර ඇති මුදල් ජාතික පර්යේෂණ සභාව මගින් ප්‍රධාන ගිණුමට ආපසු ලබාගනී. |
| (ආ) | පිරිවැය රු.16,024,000 ක් වූ ව්‍යාපෘති 03ක් වාණිජකරණය කිරීම සඳහා වැඩිදියුණු කිරීමේ හැකියාවක් පවතින බව හඳුනාගෙන ඇතත් ඒ සඳහා කටයුතු කර නොතිබුණි. | වාණිජකරණය කළ හැකි පර්යේෂණ හඳුනාගෙන ඒවා වැඩි දියුණු කිරීමට හැකි ක්‍රමවේදයක් හඳුන්වාදිය යුතු බව. | අදාළ පර්යේෂකයන් තිදෙනා ජාතික පර්යේෂණ සභාව වෙත ගෙන්වා මේ සම්බන්ධයෙන් සම්බන්ධ කරගත යුතු රාජ්‍ය ආයතන (Implementing Agencies) මොනවාද යන්න පැහැදිලි කර ගෙන රේඛීය අමාත්‍යාංශය දැනුවත් කරන ලදී. | වාණිජකරණය කිරීමේ හා වැඩිදියුණු කිරීමේ කටයුතු නිමකර නොතිබුණි. |
| (ඇ) | 2019 හා 2020 වර්ෂවලදී ඇගයීමට ලක් කරන ලද ව්‍යාපෘති අතරින් වටිනාකම රු.189,442,776 ක් වූ ව්‍යාපෘති 50 ක් සඳහා A/A+ grade ලබා දී උපකරණ පවරාදීමෙන් පසු අදාළ ව්‍යාපෘති අවසන් කර | සාර්ථකව අවසන් කරන ලද ව්‍යාපෘති ජාතික ආර්ථික වර්ධනයට දායක වන පරිදි ප්‍රායෝගික භාවිත තත්ත්වයට ගෙන ඒම සඳහා පසු විපරම් | ඉදිරියේදී අවසන් කරනු ලබන ව්‍යාපෘති සඳහා පසු විපරම් කිරීමක් සිදුකරනු ඇත. | ප්‍රායෝගික භාවිතය සම්බන්ධ ක්‍රමවත් පසුවිපරම් ක්‍රියාවලියක් සැලසුම් කර ක්‍රියාත්මක කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | තිබුණු අතර පසුවිපරම් කටයුතු කිසිවක් කර නොතිබුණි. | කටයුතු හා අදාල ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම කෙරේ අවධානය යොමු විය යුතුය. | | |
| (ඇ) | පර්යේෂණ සඳහා වැය කරන ජාතික ධනය අවසානයේ පොදු යහපත උදෙසා යොමු විය යුතු බැවින් අදාළ පර්යේෂණයේ ප්‍රධාන පර්යේෂක විසින් එම පර්යේෂණයට අදාළව ගතයුතු ඉදිරි පියවරයන් හා ඉදිරි සැලසුම් පිළිබඳ අවසාන වාර්තාවෙන් විමසා තිබුණත් ප්‍රධාන පර්යේෂක ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම අවම මට්ටමක තිබූ බව නිරීක්ෂණය වූ අතර ඇතැම් පර්යේෂකයින් එම කොටස සම්පූර්ණ කිරීමට හෝ පියවර ගෙන නොතිබුණි. | ව්‍යාපෘති යෝජනා පත්‍ර අගයන අවස්ථාවේදීම මේ පිළිබඳ අවධානය යොමු කළ යුතුය. | අදාළ කොටස් සම්පූර්ණ කර එවන ලෙස පර්යේෂකයින් දැනුවත් කර ඇත. | ව්‍යාපෘති යෝජනා අගයන අවස්ථාවේදීම මෙම කරුණු විමසෙන පරිදි පර්යේෂණ යෝජනා පත්‍ර ආකෘතිය යාවත්කාලීන කිරීම සිදුකරමින් පවතී. |
| (ඉ) | පර්යේෂණ ව්‍යාපෘති සඳහා අරමුදල් පර්යේෂණකරු වෙත ප්‍රදානය කරන ලිපිය ප්‍රකාරව ව්‍යාපෘතිය සාර්ථකව නිම කළ බවට සලකනු ලබන්නේ එම ව්‍යාපෘතියට අදාළ ප්‍රතිඵලය/ සොයාගැනීම පිළිගත් සඟරාවක විශේෂයෙන් SCI ප්‍රකාශනයක ඉදිරිපත් කළ විටදීය. එහෙත් 2016- 2019 වර්ෂවල ඇගයීමට ලක් කරන ලද රු.321,581,980 ක් වටිනා ව්‍යාපෘති 74 ක් සම්බන්ධයෙන් සිදු කරන ලද විගණන පරීක්ෂාවේ දී රු.114,591,296 ක් වූ ව්‍යාපෘති 27 ක් එසේ SCI ප්‍රකාශන මඟින් | පර්යේෂණ සඳහා යෙදවූ මුදල් වලට උපරිම ආර්ථික ප්‍රතිලාභයන් ලැබෙන පරිදි කටයුතු කළ යුතුය. | පර්යේෂණ ව්‍යාපෘතිවල අවසන් ප්‍රතිඵලය ඇගයීමේදී එහි සාර්ථකත්වය තීරණය කරනු ලබන නිර්ණායකය ලෙස SCI ප්‍රකාශනයක් සිදුකිරීම සැලකිල්ලට ගැනීම ජාතික පර්යේෂණ සභාව ක්‍රමවේදය වුවද ව්‍යාපෘතියක් අවසන් කරන ලද විගස SCI ප්‍රකාශනයක් පළකිරීම බොහෝ පර්යේෂකයන්ට අසීරු කාර්යයක් වී ඇත්තේ ඒ සඳහා යම් කාලසීමාවක් ගතවන බැවිනි. සිදුකළ පර්යේෂණ වල ප්‍රතිලාභ වාර්තා කිරීමට Impact | Impact Assessment ක්‍රියාවලිය වඩාත් ශක්තිමත්ව ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | ප්‍රසිද්ධ කර නොතිබුණි. | | Assessment ක්‍රියාවලිය වඩාත් ශක්තිමත් කර තිබේ. | |
| (ඊ) | පර්යේෂණ තුලින් ළඟා කර ගන්නා ප්‍රතිඵලයන් රටෙහි අවශ්‍යතා සඳහා යොදාගැනීමට සම්බන්ධ විය යුතු ආයතන සමඟ සම්බන්ධීකරණ කාර්යය ප්‍රමාණවත් පරිදි ඉටුවී නොතිබුණු අතර ඒ අනුව පර්යේෂණ ප්‍රතිඵල ප්‍රායෝගිකව භාවිතයට ගැනීමට අවශ්‍ය ක්‍රමවේදය නිර්මාණය වී නොතිබුණි. | පර්යේෂණ මඟින් සොයා ගන්නා ප්‍රතිඵලයන් රටෙහි අවශ්‍යතා සඳහා යොදාගත හැකි පරිදි අවශ්‍ය රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධීකරණය නිසි පරිදි පැවතිය යුතුය. | මෙම සම්බන්ධීකරණ කටයුතු කෙරෙනුයේ වෙනත් විවිධ වැඩසටහන් අතරතුරය. මේ සඳහා වෙනමම නිලධාරීන් නොමැති අතර වත්මන් නිලධාරීන් සංඛ්‍යාව සමග කළ හැකි උපරිමයෙන් ඉටුකරමින් සිටිමු. | පවතින පුරප්පාඩු පුරවා, සිටින සීමිත නිලධාරීන් සංඛ්‍යාව සමග හරවත් ක්‍රමවේදයක් නිර්මාණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (උ) | ඉලක්ක මත පදනම් වූ බහු විෂයානුබද්ධ විශාල ව්‍යාපෘති (TOපර්යේෂණ) ලෙස රටෙහි ආර්ථික සංවර්ධනය ,සමාජ සුභසාධනය සහ පාරිසරික තිරසාරභාවය සඳහා ජාතික වශයෙන් අදාළත්වයක් සහිත ගැටළු විසඳීම අරමුණු කරගෙන 2014වර්ෂයේ ආරම්භ කර වසර 05කින් නිමකළ යුතුව තිබූ වටිනාකම රු.193,086,099 ක් වූ පර්යේෂණ 4කින් රු.49,500,000ක් වූ පර්යේෂණයක් විගණිත දිනය වූ 2021 අප්‍රේල් 08 දක්වාම නිමවී නොතිබුණ අතර පර්යේෂණ කටයුතු නිමකර තිබූ අනෙක් පර්යේෂණවල අවසාන වාර්තා භාරදීම හා පර්යේෂණ ඇගයීම සිදුකර නොතිබුණි. | සැළසුම් කළ නියමිත කාලය තුල පර්යේෂණ නිමකර නිසි පරිදි පර්යේෂණ වාර්තා භාර දීමට කටයුතු කළ යුතුය. | 2021 වසර තුල ප්‍රදාන 03ක අවසන් වාර්තා ලබා ගෙන ඇගයීම් කටයුතු සිදුකර සොයාගැනීම් අදාල අමාත්‍යාංශ සඳහා දැනුම්දීම අප අමාත්‍යාංශය හරහා සිදුකර ඇත. | 2021 වර්ෂය තුළදීද ව්‍යාපෘතිය නිමකර නොතිබුණි. |
| | ඉලක්කගත බහු විෂයානුබද්ධ ප්‍රදාන (TO) සඳහා එක් | පර්යේෂණ සඳහා ලැබෙන මුදල් උපරිම | ඉලක්ක ගත බහුවිෂයික ප්‍රදාන සඳහා එකවර මුදල් | 2021 වර්ෂයේදීද පැවති තත්ත්වය |

පර්යේෂණයකට ආසන්න වශයෙන් රු.මිලියන 50ක මුදලක් ලබාදී තිබූ අතර එම සම්පූර්ණ මුදලම වසර 05ක පමණ කාලයක් සඳහා ජංගම ගිණුමේ තැන්පත් කර තිබුණි . මෙලෙස සමාලෝචිත වර්ෂය අවසානයට ජංගම ගිණුම්වල තැන්පත් කර තිබුණු මුදල රු.463,619,984ක් විය. එසේම සභාව විසින් පර්යේෂණ තෝරා ගැනීමෙන් පසු එහි වියදම් දැරීම සඳහා 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලය තුළ අන්වේෂණ පදනම මත වූ පර්යේෂණ 40 කට ලැබී තිබූ රු.180,464,683ක් වූ ප්‍රදාන ඒ ඒ පර්යේෂණය සඳහා ආරම්භ කරන ලද ජංගම ගිණුම්වල තැන්පත් කිරීමෙන් පසු පර්යේෂණ ආරම්භ කිරීම මාස 03ත් මාස 15ත් අතර කාල පරාසයක් ප්‍රමාදකිරීම නිසා එකී මුදල් ජංගම ගිණුම්වල නිශ්ක්‍රියව පැවතුණි.

කාර්යක්ෂමතාවයෙන් යෙදවිය යුතු අතර ප්‍රදාන මුදල් ලැබුණු පසු හැකි ඉක්මනින් පර්යේෂණ ඇරඹීම සිදු විය යුතුය.

ගිණුම්වලට එකවර දැමීමට මූලික හේතුව වන්නේ එම පර්යේෂණ සඳහා අවශ්‍ය මුදල් වරින්වර සම්පාදනය කිරීමට භාණ්ඩාගාරය මඟින් මුදල් ලබාදීමට අපොහොසත් වන අවස්ථාවන්හී නොකඩවා පර්යේෂණ සිදුකිරීමට අවශ්‍ය මුදල් සම්පාදනයට වේ.

වෙනස් නොවී ප්‍රමාදයන් සිදුවී තිබුණි.

**103**. **ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - මතය වියාචනය කර ඇත.
2019 - මතය වියාචනය කර ඇත.
2020 - මතය වියාචනය කර ඇත.

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය II පරිච්ඡේදයේ 13.3 ඡේදය අනුව වැඩ බැලීමේ පත්වීමක් කල යුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් පමණක් වුවද නිළධාරීන් 06 දෙනෙකු 2016 වර්ෂයේ සිට දිගින් දිගටම වැඩ බැලීම් සඳහා පත්කර තිබුණි. | නිත්‍ය තනතුරු සඳහා පත්වීම් ලබාදීමට කඩිනමින් සංස්ථාව කටයුතු කල යුතුයි. | අදාල පත්කිරීම් නිවැරදි කිරීමට කටයුතු කර නැත. | තත්ත්වය එලෙසම පවතී. |
| (ආ) | අංක 01/2015 හා 2015 මැයි 25 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 01 වන වගන්තිය අනුව ප්‍රවාහන දීමනා ලැබීමට හිමිකම් නොමැති MM 1 -1 සහ JM 1-1 කාණ්ඩයේ නිළධාරීන් 36 දෙනෙකුට අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය මත එකතුව රු.3,133,500 ක ප්‍රවාහන දීමනා සමාලෝචිත වර්ෂය තුලදී ගෙවා තිබුණි. | චක්‍ර ලේඛයේ දැක්වෙන උපදෙස් අනුව ප්‍රවාහන දීමනා ගෙවීමට කටයුතු කල යුතුයි. | වරාය කළමණාකරුවන් සහ නියෝජ්‍ය වරාය කළමණාකරුවන් හට රාජකාරි ගමන් සඳහා දීමනාවන් ගෙවීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියන් ලබා ගෙන ඇති අතර වරායන් හි සිට අනිකුත් රාජ්‍ය ආයතන වෙත ගමන් කිරීමට සැලකිය යුතු දුර ප්‍රමාණයක් නිසා වරායන්හි ප්‍රවාහන දුෂ්කරතා සලකා බලා මෙම දීමනාව ගෙවනු ලබයි. | 2021 වර්ෂයේදී දීමනා ගෙවීම් කර තිබුණි. |
| (ඇ) | අංක 05/2017 හා 2017 ඔක්තෝබර් 25 දිනැති කළමනාකරණ සේවා | චක්‍ර ලේඛය අනුව වෘත්තීය දීමනා ගෙවීමට කටයුතු කල යුතුය. | ඉංජිනේරු දීමනාවට අමතරව සංස්ථාවේ විධායක නිලධාරීන් සඳහා ගෙවිය යුතු වෘත්තීය | 2021 වර්ෂයේදී දීමනා ගෙවීම් කර තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | චක්‍රලේඛය අනුව රාජ්‍ය සංස්ථා වල ජ්‍යේෂ්ඨ මට්ටමේ නිලධාරීන් සඳහා වෘත්තීය දීමනා ගෙවීමේ විධිවිධාන වලට පටහැනිව සංස්ථාව විසින් සේවා කාලය නොසලකා සංස්ථාවෙහි ඉංජිනේරුවන් 07 දෙනෙකුට මාසිකව රු. 15,000 ක් බැගින් සමාලෝචිත වර්ෂය තුළදී එකතුව 1,080,000 ක් වෘත්තීය දීමනා ලෙස ගෙවා තිබුණි. | | දීමනාව චක්‍රලේඛ ප්‍රකාරව මෙම නිලධාරීන් සඳහා නොගෙවන අතර ඔවුන්ට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට යටත්ව ඉංජිනේරු දීමනාව ගෙවීම් කරනු ලබයි. | |
| (ඈ) | අංක පීඊඩී/12 හා 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට පටහැනිව සංස්ථාව විසින් රේඛීය අමාත්‍යාංශය සහ වෙනත් රජයේ ආයතන වලට සංස්ථාවේ සේවකයන් 13 දෙනෙකු නිදහස් කර සමාලෝචිත වර්ෂයේදී වැටුප් හා දීමනා ලෙස රු.7,579,704 ක් ගෙවා තිබුණි. | චක්‍ර ලේඛය අනුව වැටුප් හා දීමනා ගෙවීමට කටයුතු කල යුතුයි. | 2020 අගෝස්තු 24 දින ලිඛිතව මෙම සේවකයන් තාවකාලික පදනමින් රේඛීය අමාත්‍යාංශය වෙත අනුයුක්ත කරන මෙන් ඉල්ලා සිට අතර මෙම සේවයින් සඳහා අමාත්‍යාංශය වෙතින් අදාල වැටුප් හා දීමනා ප්‍රතිපූර්ණය කිරීමට අවශ්‍ය කටයුතු කරනු ලබයි. | වැටුප් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කර නැත. |
| (ඉ) | අංක 2/2017 හා 2017 දෙසැම්බර් 21 දිනැති මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශ චක්‍රලේඛය 2020 දෙසැම්බර් 31 දින වන විට වාහන 08 ක් සංස්ථාව නමට ලියාපදිංචි කර නොතිබුණි. | චක්‍රලේඛය අනුව වාහන ලියාපදිංචිය සංස්ථාව නමට සිදු කිරීමට කටයුතු කල යුතුය. | මෙම වත්කම් වල අයිතිය ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව වෙත පවරා දෙන ලෙස ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය වෙත ලිඛිතව ඉල්ලුම් කරන ලදි. | 2021 වර්ෂය අවසානය දක්වාම වාහන වල ලියාපදිංචිය සිදු වී නොමැත. |
| (ඊ) | සංස්ථාව විසින් මාසික බදුකුලිය තීරණය කිරීමේදී රජයේ තක්සේරුකරුගෙන් තක්සේරු වාර්තා ලබා නොගෙන අම්බලන්ගොඩ ධීවර වරායෙහි | සංස්ථාව විසින් බදුකුලිය තීරණය කිරීමේදී රජයේ වාර්තා ලබා ගෙන ඒ අනුව එම තීරණ ගත යුතුයි. | රජයේ තක්සේරුව සඳහා යොමුකර ඇති අතර, අදාළ තක්සේරු වාර්තා ලැබීමෙන් පසු බදු කුලිය යාවත්කාලීන කිරීමට කටයුතු කරනු ඇත. | 2021 වර්ෂය අවසානය දක්වාම අයකරගතයුතු බදු කුලී යාවත්කාලීන කර නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | පර්චස් 40 ක භූමි ප්‍රමාණයක් මාසික බදුකුලිය රු.100,000 කට අයිස් යන්ත්‍රාගාරයක් ඉදිකර පවත්වාගෙන යාම සඳහාද පර්චස් 04 ක භූමි ප්‍රමාණයක් මාසික බදුකුලිය රු.10,000 කට ලිහිසි තෙල් අලෙවිකිරීමේ වෙළඳසැලක් පවත්වාගෙන යාම සඳහාද 2014 වර්ෂයේදී පෞද්ගලික සමාගමකට බදු දී තිබුණි. | | | |
| (උ) | තාක්ෂණික පිරිවිතරය අනුව ඉන්ධන පොම්පවල ධාරිතාවය මිනිත්තුවට ලීටර් 150 ක් විය යුතු වුවද, සැපයූ ඉන්ධන පොම්පවල ධාරිතාවය මිනිත්තුවට ලීටර් 138 ක් වූ අතර ස්ථාපිත කර තිබූ ඉන්ධන පොම්ප 2019 මාර්තු 11 දින වන විට භාවිතා නොකිරීම හේතුවෙන් සැපයුම්කරුට ගෙවූ රු.3,824,200 ක් නිෂ්කාර්ය වියදමක්ද වී තිබුණි. තවද, එකඟ වූ පරිදි භාණ්ඩ නොසැපයීම හා අවශ්‍යතාවයට නොගැලපෙන ඉන්ධන පොම්ප සැපයීම සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ගද ගෙන නොතිබුණි. | මිලදී ගැනීම් සිදුකිරීමේදී සෑම විටම තාක්ෂණික පිරිවිතර වලට අනුකූලව වන පරිදි සංස්ථාව කටයුතු කල යුතුය. | අදාළ ආයතනය විසින් කොඩ්බේ, දික්ඕවිට, බේරුවල, ගාල්ල, මිරිස්ස, පුරාණවැල්ල, කුඩාවැල්ල, අම්බලන්ගොඩ යන වරායන් වල පොම්ප 08 ක් ස්ථාපිත කර ඇත. ඒ අනුව සංස්ථාව විසින් එම පොම්පයන් ප්‍රයෝජනයට ගෙන ඇති අතර, එම ආයතනය සඳහා අත්තිකාරම් මුදල පමණක් ගෙවා ඇති නමුදු වෙනත් කිසිදු මුදලක් එම ආයතනය වෙත ගෙවීම් කර නොමත. ඒ අනුව අදාළ පොම්පයන්හී වටිනාකම අත්තිකාරම් මුදල ඉක්මවා ඇති බව දන්වා සිටිමි. | 2021 වර්ෂය අවසානය වන විටද තත්ත්වය එලෙසම පැවතුනි. |
| (ඌ) | ධීවර වරායන් 06 කට ඉන්ධන ටැංකි සපයා සවි කිරීමට පෞද්ගලික ආයතනයක් සමඟ 2017 නොවැම්බර් 08 වන දින රු.11,363,000 කට එකඟ වී තිබුණි. නියමිත කාලයට වඩා | ඉන්ධන ටැංකි සවි කිරීමේ ප්‍රමාද කාලය වෙනුවෙන් ප්‍රමාද ගාස්තු වගකිව යුතු අයගෙන් අයකර ගැනීමට කටයුතු කල යුතුයි. | එම සමාගම විසින් නිසි පරිදි ටැංකි වරායන් වෙත සපයා තිබුනි. එහෙත් එම ටැංකි ස්ථාපිත කිරීම සඳහා නියමිත කාලයට වඩා වැඩිකාලයක් ලබාදීමට සිදුවූයේ ටැංකි | ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | දින 506 ක් ප්‍රමාද වී තිබුණද, ඉන්ධන ටැංකි සවිකිරීම එකඟ වූ පරිදි නිමකර නොතිබූ අතර ප්‍රමාද කාලය වන 2018 දෙසැම්බර් 15 දින සිට විගණනය සිදුකරන දින වන 2019 මාර්තු 28 දක්වා කාලපරිච්ඡේදයට අදාලව රු.11,703,809 ක ප්‍රමාද ගාස්තුවක් වගකිව යුතු අයගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | | ස්ථාපිත කලයුතු ස්ථානයන්හි වැඩ නිසිපරිදි නිමකර නොතිබූ බැවිනි. මේ වන විට වරායන් 05 ක ටැංකි ස්ථාපිත කිරීමේ කටයුතු නිමකර ඇත. | |
| (එ) | පානදුර වරායේ වැලි ඉවත්කිරීම සඳහා අනුමැතියකින් තොරව 2014 වර්ෂයේදී පෞද්ගලික සමාගමක් සමඟ ගිවිසුම් ගත වී ඇප සුරක්ෂණයක්ද ලබාගැනීමකින් තොරව රු.20,000,000 ක අත්තිකාරම් එම සමාගමට ලබා දී තිබුණි. 2015 දෙසැම්බර් 10 දිනැති අතිරේක ගිවිසුමෙහි කොන්දේසි අනුව පෞද්ගලික සමාගම විසින් කැණීම් කරන ලද වැලි විකුණා ලැබෙන මුදලින් අත්තිකාරම් මුදල හිලව් කළ යුතු වුවද, 2020 වර්ෂය අවසානය දක්වාම එකී මුදල් අයකර ගෙන නොතිබුණද කිසිදු නීතිමය ක්‍රියාමාර්ගයක් විගණිත දින දක්වා ගෙන නොතිබුණි. | රජයේ නීතිරීති අනුගමනය නොකර සිදුකරනු ලබන අලාභ සම්බන්ධයෙන් වගකිව යුතු නිළධාරීන් හඳුනාගෙන ඉදිරි පියවර ගැනීම කළමනාකරණයේ වගකීම වේ. | රු.20,000,000 ක අත්තිකාරම් මුදලින් තව දුරටත් අයකර ගත යුතුව පවතින රු.16,894,354 මුදල නැවත අයකර ගැනීමට අවශ්‍ය නීතිමය කටයුතු සිදු කිරීම සඳහා අවශ්‍ය ලිපිගොනු නීතිමය දෙපාර්තමේන්තුව වෙත භාර දෙන ලදි. | නීතිමය කටයුතු වලට යොමුකර ඇත. |
| (ඒ) | සංස්ථාවේ වැලි ඉවත් කිරීම සඳහා අවශ්‍ය යාත්‍රා තිබියදී වැලි කියුබ් 20581 ක් ඉවත් කිරීම සඳහා වසර 03 කට | ධීවර වරායට යාත්‍රා පිවිසීමට වැලි ඉවත් නොකිරීම නිසා වරාය බෙසම නඩත්තු කිරීමේ | සංස්ථාව, කොන්ත්‍රාත් කරු සමඟ අදාළ ගිවිසුම අත්සන් කර තිබූ අතර වැලි ඉවත් කිරීමේ කාර්යය ප්‍රදානය | වරාය බේසම නඩත්තු කිරීමට පියවර ගෙන නොතිබුනි. |

| | | | | |
|---|---|---|---|---|
| | පෞද්ගලික සමාගමකට 2018 ඔක්තෝබර් 23 දින කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබුණද කොන්ත්‍රාත්කරු සමඟ කොන්ත්‍රාත් ගිවිසුමක් අත්සන් කර නොතිබුණි. එසේ ඉවත්කල යුතු සම්පූර්ණ වැලි ප්‍රමාණය වැලි කියුබ් 20581 ක් වුවද 2018 ඔක්තෝබර් 23 දින සිට 2020 අගෝස්තු දක්වා වැලි කියුබ් 3426 ක් එනම් සියයට 16 ක් පමණක් ඉවත්කර තිබූ අතර 1997 මාර්තු 06 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට්පත්‍රය අනුව ධීවර වරායට යාත්‍රා පිවිසීමට වැලි ඉවත් නොකිරීම නිසා වරාය බේසම නඩත්තු කිරීමේ සංස්ථාවේ අරමුණද ඉටු වී නොතිබුණි. | සංස්ථාවේ අරමුණද ඉටුකිරීමට කටයුතු කල යුතුයි. | කිරීමේ ලිපය ප්‍රකාරව සිදු නොකල බැවින් අදාළ ගිවිසුම 2021 පෙබරවාරි 10 වන දින අත්හිටුවන ලදී. | |
| (ඔ) | 2014 වර්ෂයට පෙර මුළු මෙහෙයුම් ලාභයෙන් සියයට 73 ක් ඉපැයූ මෝදර ධීවර වරාය, 2014 ඔක්තෝබර් 30 දින සිට වසර 25 ක කාලයක් සඳහා පෞද්ගලික තක්සේරුකරුවකුගේ තක්සේරු වටිනාකම පදනම් කර ගෙන රු. 125,000 ක මාසික කුලියකට පෞද්ගලික ආයතනයකට බදු දී තිබුණි. ඉන්පසු සංස්ථාව සහ කල්බදු ගැනුම්කරු අතර 2015 ජුනි 10 දින ඇති කරගත් අතිරේක ගිවිසුමෙහි කොන්දේසි අංක 03 අනුව රජයේ තක්සේරුකරුගේ | සංස්ථාවේ දේපළ බදු දීමේදී විධිමත් ගිවිසුම් ඇතිකර ගෙන රජයේ තක්සේරු වටිනාකම් අනුව බදුකුලී අයකල යුතු අතර දීර්ඝ වශයෙන් බදුකුලී ගෙවීම් පැහැර හරින විට ගිවිසුම් අවලංගු කිරීම හා නීති ක්‍රියාමාර්ග ගැනීම සිදුකල යුතුය. | 2020 අගෝස්තු මස 28 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී උක්ත බදු ගිවිසුම අවසන් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමැතිය ලබාදී ඇති අතර, බදු ගිවිසුම අවසන් කිරීමේ කෙටුම්පත් ලිපිය සකස්කර නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇති බවද දන්වමි. | 2021 වර්ෂය අවසානය දක්වාම තත්ත්වය එසේම පැවතුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | මාසික බදු කුලිය වන රු. 1,700,000 ක් අයකරන බවට එකඟ වී තිබුණද, එම තක්සේරු වටිනාකමට වරාය බේසම ඇතුළත් කර නොතිබුණි. මේ අනුව රජයේ තක්සේරුකරුගේ මාසික බදු කුලිය අයනොකිරීම හේතුවෙන් 2020 වර්ෂය අවසාන වන විට රු.106,203,391 ක බදු ආදායමක් සංස්ථාවට ලැබිය යුතුව තිබුණද නොලැබූ මුදල් අයකර ගැනීම සඳහා කිසිදු නීතිමය ක්‍රියාමාර්ගයක්ද ගෙන නොතිබුණි. | | | |
| (ඔ) | 2019 දෙසැම්බර් 31 දිනය මුළු පෙර ගෙවීම් ශේෂය රු.36,659,355 ක් වූ අතර පිළිවෙලින් වසර 4 ත් 5 ත් අතර රු. 614,653 ක්ද වසර 5 ට වැඩි රු.11,551,997 ක්ද වසර 10 ට වැඩි රු.24,492,700 ක්ද වූ අතර මේ මගින් සංස්ථාවට අයත් වත්කම් පෞද්ගලික පාර්ශවයට නීතියානුකූල නොවන ලෙස පරිහරණයට ඉඩ සලසා තිබුණද මේ පිළිබඳ වගකිව යුතු නිළධාරින් හඳුනාගෙන නීතිමය ක්‍රියාමාර්ග 2020 වර්ෂය අවසානය දක්වාම ගෙන නොතිබුණි. | රජයේ නීතිරීති අනුගමනය නොකර සිදුකර ඇති අලාභයන් සම්බන්ධයෙන් වගකිව යුතු නිළධාරීන් හඳුනාගෙන නීතිමය පියවර ගැනීම කළමනාකරණයේ වගකීම වේ. | පැරණි ශේෂයන් පිළිබඳ සොයා බලා එම ශේෂයන් නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකිරීම සඳහා කමිටුවක් වෙත යොමුකර ඇත. | ණය අයකර ගැනීමට කටයුතු කඩිනම් කර නොතිබුණි. |
| (ක) | සංස්ථාවට අයත් සයුරි යාත්‍රාව වරාය අධිකාරිය අයත් ඔලුවිල් ධීවර වරායෙහි කැණීම් කටයුතු සඳහා 2016 දෙසැම්බර් 16 දින | සංස්ථාවට අයත් යාත්‍රා වෙනත් ආයතන වල සේවා සඳහා යෙදවීමේදී විධිමත් ලෙස ගිවිසුම් | වරාය අධිකාරියෙන් අදාළ මුදල් අයකර ගැනීමට අවස්ථා කිහිපයකදීම ලිඛිතව ඉල්ලීම් කර ඇත. | 2021 වර්ෂයේදීද ලැබිය යුතු මුදල් අයකරගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | සිට 2017 මාර්තු 09 දින තෙක් යොදවා තිබුණි. එසේ වුවත් මේ සඳහා ගිවිසුමක් අත්සන් කර නොතිබුණු අතර වරාය අධිකාරියෙන් සංස්ථාවට ලැබිය යුතු රු. 24,840,000 ක මුදල 2020 වර්ෂය අවසානයදක්වාම අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | වලට එළඹීම කල යුතුය. | | |
| (ග) | 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 2 වන වගන්තිය හා 1997 මාර්තු 06 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයට අනුව ධීවරයන් වෙත ධීවර යාත්‍රා සඳහා අළුත්වැඩියා සහ නඩත්තු පහසුකම් සැපයීමේ අරමුණ ඉටුකර ගැනීමට සංස්ථාව විසින් කටයුතු කර නොතිබුණි. | පනතේ වගන්ති ප්‍රකාරව අරමුණු ඉටුකර ගැනීමට සංස්ථාව කටයුතු කළ යුතුය. | ගන්නා ලද ක්‍රියාමාර්ග ඉදිරිපත් කර නොතිබුණි. | 2021 වර්ෂය අවසානය දක්වාම තත්ත්වය එලෙසම පැවතුණි. |
| (ජ) | 2000 ජනවාරි 19 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 380 චක්‍රලේඛය ලංකා ධීවර වරාය සංස්ථාවට අදාල කර ගත නොහැකි බව භාණ්ඩාගාරික නියෝජිත විසින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා වලදී පෙන්වා දී තිබියදීත් එකී චක්‍රලේඛ පදනම් කර ගනිමින් සංස්ථාව විසින් මහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගැනීමෙන්ද තොරව මිරිස්ස සහ හලාවත ධීවර වරායන්හි ඉදිකිරීම් කටයුතු සඳහා | සංස්ථාවට අදාළ කරගත නොහැකි චක්‍ර ලේඛ පදනම්ව ගෙවීම් සිදු නොකල යුතු අතර එය ගෙවීම් අනුමත කල නිළධාරීන්ට අදාළව ක්‍රියාමාර්ග ගැනීමට සහ අදාළ නොවන චක්‍ර ලේඛ අනුව සිදු කල ගෙවීම් නැවත අය කිරීමට කටයුතු කල යුතුයි. | මෙම චක්‍රලේඛය අප සංස්ථාවට අදාළ නොවන බව පසුව සොයා ගත් බැවින් මේ සම්බන්ධ ගෙවීම් අත්හිටුවා ඇත. | 2021 වර්ෂයේදීද මෙම ගෙවීම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | උපදේශන සේවා සැපයීම වෙනුවෙන් සංස්ථාවට ලැබුණු රු.9,350,000 උපදේශන සේවා ආදායමින් සංස්ථා නිළධාරීන් 23 දෙනෙකු හට උපදේශන ගාස්තු ලෙස 2019 වර්ෂයේදී එකතුව රු. 7,031,121 ක් ගෙවා තිබුණි. තවද මෙම උපදේශන සේවා සැපයීම සංස්ථාව පිහිටුවීමේ අරමුණු වලට පටහැනි බවද නිරීක්ෂණය විය. | | | |
| (ඡ) | ණයට ඉන්ධන සැපයීම නවතා දැමීමට කමිටු තීරණයක් ගෙන තිබුණද සමාලෝචිත වර්ෂයේ ණය පදනම මත රු.22,868,579 ක ඉන්ධන සපයා තිබූ අතර මෝදර ධීවර වරායේ රු. 5,675,373 ක නැංගුරම් ගාස්තුද හිඟ හිට තිබුණි. | ඉන්ධන ණයට සැපයීම අත්හිටුවීම හා විධිමත් අයකරගැනීම් ක්‍රමවේදයක් මත ක්‍රියා කල යුතුයි. | ධීවරයන් හට ඉන්ධන ණයට සැපයීම සිදු නොකරන අතර සියලුම වරායන්හි ඉන්ධන අලෙවිය ගිණුම්ගත කිරීමේදී ණය පදනම මත සිදු වුවා සේ සලකා ගිණුම්ගත කරනු ලබයි. අයවිය යුතු රු.5,675,373 ක මුදල අයකර ගැනීම සඳහා නඩු අංක CFHC/489/12/MR දරන නඩුව කොළඹ වාණිජ අධිකරණයේ පවරා මේ වනවිට විභාග වෙමින් පවතී. | 2021 වර්ෂයේදීද අයකරගෙන නොතිබුණි. |
| (ද) | නව බඳවා ගැනීමේ පරිපාටිය සකස් කර කැබිනට් මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කිරීමට කමිටුව උපදෙස් දී තිබුණද 2014 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වාම බඳවාගැනීමේ පටිපාටි සකස්කර අනුමැතිය සඳහා ඉදිරිපත් කර නොතිබූ අතර චක්‍රලේඛ වලට පටහැනිව වැටුප් වර්ධක ගෙවීම සම්බන්ධයෙන් කළමනාකරණය විසින් එකී | චක්‍රලේඛ වලට පටහැනිව වැටුප් වර්ධක ගෙවීම සම්බන්ධයෙන් කළමනාකරණය විසින් එකී වැරදි නිවැරදි කිරීමට කටයුතු කල යුතුයි. | නව බඳවා ගැනීමේ පටිපාටිය සකස් කර ඉදිරිපත් කිරීමෙන් අනතුරුව 2018 අප්‍රේල් මස 14 වන දින ඒ සඳහා අනුමැතිය ලැබී ඇත. | වැඩිපුර ගෙවූ වැටුප් නැවත අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | වැරදි නිවැරදි කිරීමට ගෙන නොතිබුණි. | | | |
| (න) | 2014 පෙබරවාරි 18 දින පැවති රාජ්‍ය ව්‍යාපාර පොදු කාරක සභාවේ 74 රැස්වීමේ කමිටු තීරණය අනුව පෙර ගෙවුම් ලෙස ගෙවා තිබුණු රු.36,659,356ක මුදල වර්ෂ කිහිපයක සිටම අයකර නොතිබූ අතර ඒ පිළිබඳ කිසිඳු නීතිමය ක්‍රියාමාර්ගයන්ද ගෙන නොතිබුණි. | වසර 10 කට වඩා පැරණි පෙර ගෙවුම් ශේෂ පිළිබඳ නිවැරදි කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුයි. | වසර 10 කට වඩා පැරණි ශේෂයන් බැවින් ඒ පිළිබඳ සොයා බලා එම ශේෂයන් නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකිරීම සඳහා කමිටුවක් වෙත යොමුකර ඇත. | 2021 වර්ෂයේදීද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ත) | සංස්ථාවෙහි ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුව බදු දුන් දේපල එහි සාධාරණ අගයට මිනුම්කර, මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කරන බව දක්වා තිබුණද, සංස්ථාව විසින් බදු දුන් දේපල 87 ක සාධාරණ අගය තක්සේරුකර මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර නොතිබුණු අතර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ බදු දේපල වල විස්තරයන්හි අවම වශයෙන් පිරිවැය හෝ ඇතුලත් කර නොතිබුණි. | වත්කම් වල සාධාරණ අගය තක්සේරු කර එම අගයන් මූල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතුය. | වත්කම් ප්‍රත්‍යාගණනයෙන් පසු එහි වටිනාකම් ඉදිරිපත් කිරීමට සටහන් කර ගතිමි. | 2021 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන වල බදු දේපළ වල තක්සේරු අගයන් දක්වා නොතිබුණි. |
| (බ) | ධීවර වරාය නීතිගත සංස්ථාව යටතේ වරායන් 21 ක් ක්‍රියාත්මක වන අතර, ඉන් වරායන් 16 ක ඉඩම් 2020වර්ෂය අවසාන වන විටත් විධිමත් පරිදි පවරා ගෙන නොතිබුණි. | වරාය ඉදිකිරීම සඳහා වෙන්කර දුන් ඉඩම් පවරාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. | කළමනාකරණය අදහස් දක්වා නොමැත. | 2020 වර්ෂය වන විටත් පවරා ගැනීම් කටයුතු සිදු වී නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ම) | 2013 දෙසැම්බර් 29 දිනැති ගිවිසුම් ප්‍රකාරව කොඩ්බේ ධීවර වරාය සතු ටොන් 100 ක දියත් මහ, සේවක නේවාසිකාගාරය සහ යාන්ත්‍රික වැඩපල මාස 06 ක් තුළ අලුත්වැඩියා කර භාවිතා කිරීම සඳහා පෞද්ගලික පාර්ශවයකට බදු පදනම මත භාරදී තිබුණි. 2020 දියත් මහ වැඩිදියුණු කිරීමේ වර්ෂය අවසාන වන විට බදු ගැණුම්කරුගෙන් බදු මුදල් අයකර ගැනීමට සංස්ථාව කටයුතු කර නොතිබුණි. | බදු කුලී අයකර ගැනීමට කළමනාකරණයේ වගකීම වේ. | හිඟ බදු ආදායම් අයකර ගැනීම සඳහා ගිවිසුම් ප්‍රකාරව නීතිමය කටයුතු සලසා ඇත. | ගිවිසුම අවලංගු කර ඇත. 2021 වර්ෂය වන හිඟ බදු කුලී රු.6,174,021 ක අත්කර ගැනීම සඳහා නඩු පවරා ඇත. භුක්තිය පවරා ගෙන ඇත. |

## 104 . ටවර් හෝල් රඟහල පදනම

මූලා‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 - තත්වාගණනය කළ මතය.

2019 - තත්වාගණනය කළ මතය.

2020 - තත්වාගණනය කළ මතය.

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2018 වර්ෂය අවසාන දිනට වෙනත් ලැබිය යුතු ගිණුමේ ශේෂය රු.4,049,035 ක් වූ අතර එයින් වසරකට වඩා වැඩි කාලයක සිට හිඟව පැවති ශේෂය රු.1,652,321 ක් විය. මෙකී ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට පදනම විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පදනමට ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කඩිනමින් ක්‍රියා කල යුතුය. | මෙම ශේෂයන්යෙන් 25% පමණ මේ වන විට නිරවුල් කිරිමට කටයුතු කර ඇති අතර ඉතිරි ලැබිය යුතු ශේෂ නිරවුල් කර ගැනීම සඳහා අදාල ආයතන (සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව) වෙත ලිපි මගින් දැනුවත් කර ඇති අතර හැකි ඉක්මනින් නිරවුල් කර ගැනිමට කටයුතු කරන බව කාරුණිකව සඳහන් කරමි. | අදාල ශේෂ තවදුරටත් නිරවුල් වී නැත. |
| (ආ) | පදනම සතු ජංගම ගිණුම් දෙකක් සහ ඉතිරි කිරීමේ ගිණුම් දෙකක් ආරම්භ කිරීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව භාණ්ඩාගාර අනුමැතිය ලබාගැනීමට කටයුතු කළ යුතුයි. | ඉදිරියේදි මෙම ගිණුම් සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගැනිමට කටයුතු කරමි. | අදාල අනුමැතිය ලබා ගෙන නැත. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 49 ඡේදය ප්‍රකාරව දේපළ පිරියත හා උපකරණ පන්තිය මුළුමනින්ම ප්‍රත්‍යාගණනය කළ යුතු වුවද, 2016 වර්ෂයේදී පැවති ඉඩම් හා ගොඩනැගිලි වලින් ප්‍රධාන කාර්යාලීය ඉඩම හා ගොඩනැගිලි පමණක් පිළිවෙලින් රු.614,000,000 | ප්‍රමිතයේ නියමයන් අනුව වත්කමක් අයත්වන දේපළ පිරියත හා උපකරණ පන්තිය මුළුමනින්ම ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කළ යුතුය. | ප්‍රධාන කාර්යාලය අප සතු දේපලක් වුවත් 30 වසරක් බදු පදනම මත දි තිබු බැවින් ප්‍රත්‍යාගණනය කටයුතු සිදු කර නොමැත. මෙම ප්‍රත්‍යාගණනය සඳහා මූලික කටයුතු සිදු කර ඇති අතර රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව වෙත අවශ්‍ය ලිපි යොමු කර ඇත. ඒ | අදාල වරද නිවැරදි කරගෙන නොමැති බැවින් අඩුපාඩුව තවදුරටත් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | කට හා රු.163,000,000 කට ප්‍රත්‍යාගණනය කර තිබූ අතර 2020 දෙසැම්බර් 31 දිනට අගය රු.328,000,000ක් වූ ඉඩම් 2ක් හා රු.400,360,931 ක් වූ ගොඩනැගිලි 4ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. | | අනුව 2022 ජුනි 30 ට පෙර මෙම ප්‍රත්‍යාගණනය කටයුතු අවසන් කිරීමට කටයුතු කර ඇති බව කාරුණිකව සදහන් කරමී. | |
| (ඇ) | 2018 වර්ෂයේ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පරිත්‍යාග කර තිබූ කැබ් රථයක වටිනාකම 2019 ජනවාරි 01 දින ගිණුම්ගත කිරීමේදී ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිත අංක 07 හි 25 හා 43 ඡේද ප්‍රකාරව වත්කම අත්පත් කරගත් දිනට පැවති සාධාරණ වටිනාකම වෙනුවට 2017 වර්ෂයේ රක්ෂණ කටයුතු සඳහා අගය කළ වටිනාකම වූ රු.4,000,000 පිරිවැය ලෙස සලකා ගිණුම්ගත කර තිබුණි. | ප්‍රමිතවල සඳහන් නියමයන් අනුගමනය කරමින් වත්කම් වල සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කළ යුතුය. | එය එම වර්ෂයේදි දැනුම මදි කමින් සිදු වූ දෝෂයක් බව පිලිගනිමි. ඒ සම්බන්ධව අවශ්‍ය නිලධාරින් වෙත ඉදිරියේදි පුහුණුවක් ලබා දිමටද කටයුතු කර ඇති අතර මේ වන විට තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ප්‍රත්‍යාගණන කටයුතු සිදු කරන අතර එය අප්‍රේල් අග වන විට අවසන් කිරිමට හැකි බව කාරුණිකව සදහන් කරමී. | අදාල කරුණ නිවැරදි කරගෙන නොමැති බැවින් අඩුපාඩුව තවදුරටත් පවතී. |
| (ඉ) | වසර ගණනාවක් තිස්සේ ඉදිරියට ගෙන එන එකතුව රු.79,091,701 ක් වූ ගිණුම් ශේෂ 5ක් පිළිබඳ තොරතුරු/ ලිපිගොනු/ ලේඛන විගණනයට ඉදිරිපත් කිරීමට පදනම අපොහොත් විය. | විගණනය සඳහා අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. | එම ශේෂ ටවර් හොල් රඟහල පදනම මුල් කාලවකවානු තුල සිටම ගිණුම් පොත් වල සටහන්ව ඇතත් අදාලව කිසිදු සාක්ෂියක්ද සොයා ගත නොහැකි බව කාරුණිකව සඳහන් කරමී. | අදාල තොරතුරු ඉදිරිපත් කර නොමැති බැවින් අඩුපාඩුව තවදුරටත් පවතී. |
| (ඊ) | 1978 අංක 1 දරන ටවර් හෝල් රඟහල පදනම පනතේ 8 වෙනි වගන්තියට අනුව පදනම පිහිටි ඉඩම හා එහි පිහිටි ගොඩනැගිලි ජාතික නෘත්‍ය කටයුතු දිරිගැන්වීම සහ ප්‍රවර්ධනය | බදු ගිවිසුම අළුත් කිරීමට සහ කඩිනමින් හිඟ බදු මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. | සව්සිරිපාය ගොඩනැගිල්ල සම්බන්ධව පැවති ගැටළුකාරි තත්වය නිරාකරනය කර ගැනීම සඳහා දෙපාර්ශවයේ නිලධාරින් හා අග්‍රාමාත්‍යතුමා තුමා සමග කරන ලද | අදාල කරුණ නිවැරදි කරගෙන නොමැති බැවින් අඩුපාඩුව තවදුරටත් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | කිරීමට අවශ්‍ය කාර්යන් සඳහා මිස වෙනත් කාර්යයන් සඳහා නොයෙදවිය යුතු බවත් එම කාර්යයන් සඳහා නොයෙදවන ලද්දේ නම් එවිට එය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට පෙරලා පැවරෙනු ඇති බවත් සඳහන් වී තිබුණද පදනම සතු සව්සිරිපාය ගොඩනැගිල්ල හා එය පිහිටි භූමිභාගය ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියට බදු දී තිබුණි. ඉකුත් බදු ගිවිසුම 2016 මැයි 15 දින අවසන් වී තිබූ අතර එම අධිකාරිය දිගින් දිගටම ගොඩනැගිල්ලේ රැඳී සිටියද 2016 මැයි 15 සිට 2021 දෙසැම්බර් 31 දක්වා කිසිදු බදු කුලියක් පදනම වෙත අය වී නොතිබුණි. | | සාකච්ඡාවට අනුව බදු ගිවිසුම අලුත් කර ගැනීමට හා බදු මුදල් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම සඳහා ඉදිරි භාරකාර මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව කාරුණිකව සඳහන් කරමි. | |
| (උ) | 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 20 (1) හා 102 වගන්ති අනුව පදනම විසින් 2018/2019 හා 2019/2020 තක්සේරු වර්ෂ සඳහා ආදායම් බදු ගෙවීමට කටයුතු කර නොතිබූ අතර ආදායම් බදු සඳහා ලියාපදිංචි වීමට හෝ බදු නිදහස් කර ගැනීමටද කටයුතු කර නොතිබුණි. | දේශීය ආදායම් පනත ප්‍රකාරව බදු නිදහස් කර ගැනීමට හෝ බදු සඳහා ලියාපදිංචි වීමට කටයුතු කළ යුතුය. | ටවර් හෝල් රඟහල පදනම බදු නිදහස් ආයතනයක් වන අතර ඒ පිලිබඳ පනතෙහි සඳහන්ව ඇත. නමුත් ඉදිරියේදි ඒ පිළිබඳව වැඩිදුරටත් දේශිය ආදායම් දෙපාර්තමේන්තුව මඟින් කරුණු විමසා අවශ්‍ය කටයුතු කරන බව කාරුණිකව සඳහන් කරමි. | අදාල කරුණු නිවැරදි කරගෙන නොමැති බැවින් අඩුපාඩුව තවදුරටත් පවතී. |
| (ඌ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී-12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.3 වගන්තිය ප්‍රකාරව භාරකාර මණ්ඩලයේ අනුමැතිය මත 1997 සිට | අත්පොත සඳහා රේඛීය අමාත්‍යාංශයේ අනුමැතිය හා භාණ්ඩාගාර එකඟතාවය ලබා ගැනීමට කටයුතු කළ | මේ දක්වා අත්පොත ප්‍රකාරව කටයුතු කර ඇත. වර්තමානයේදි භාණ්ඩාගාරය විසින් එවැනි අත්පොත් සඳහා අනුමැතිය ලබා නොදෙන | අදාල අඩුපාඩුව නිවැරදි කරගෙන නොමැති බැවින් තවදුරටත් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | ක්‍රියාත්මක කර තිබුණු පදනමේ අත්පොත සඳහා රේඛීය අමාත්‍යාංශයේ අනුමැතිය හා භාණ්ඩාගාර එකඟතාවය ලබාගෙන නොතිබුණි. | යුතුය. | බැවින් ඉදිරියේදි ආයතන සංග්‍රහය හා වරින් වර නිකුත් කරන චක්‍රලේඛ අනුව සිදු කරන බව කාරුණිකව සදහන් කරමී. | |
| (එ) | 1978 අංක 01 දරන ටවර් හෝල් රඟහල පදනම පනත කාලානුරූපීව සංශෝධනය කර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | පනත කාලානුරූපීව සංශෝධනය කර ගැනීමට කටයුතු කළ යුතුය. | මෙ වන විට පනත සංශෝධන කටයුතු සිදු කිරිම සඳහා කමිටුවක් පත් කර ඇති බව කාරුණිකව සදහන් කරමී. | අඩුපාඩුව නිවැරදි කරගෙන නොමැති බැවින් තවදුරටත් පවතී. |
| (ඒ) | රු.3,000ක්ව පැවති කලාකරු විශ්‍රාම වැටුප් දීමනාව 2019 මාර්තු 15 දිනැති අංක 2019/294/03/01 දරණ භාරකාර මණ්ඩල තීරණය මඟින් රු.7,500 දක්වා වැඩි කර තිබුණද ඒ සඳහා අවශ්‍ය වන අතිරේක මුදල් සපයා ගැනීමට කිසිදු උපාය මාර්ගයක් හඳුන්වා දී නොතිබුණි. මේ හේතුවෙන් ජනාධිපති සුභසාධන අරමුදලේ පොලී ආදායම රු.6,254,181ක්ව තිබියදී කලාකරුවන්ට රු.9,268,500 ක් ගෙවීමට සිදුවීමෙන් රු.3,014,319ක හිඟ මුදල පියවා ගැනීමට වෙනත් ආදායමක් භාවිතා කිරීමට සිදුව තිබුණි. | අරමුදල් පවතීද යන්න තහවුරු කර ගෙන ඉදිරි මූල්‍ය තීරණ ගත යුතුය. | හිග මුදල් සපුරා ගැනීම සඳහා කිසිදු යෝජනාවක් හෝ ක්‍රියාමාර්ගයක් එවක අධ්‍යක්ෂ ජනරාල් විසින් ඉදිරිපත් කර නොමැත. එවක අධ්‍යක්ෂ මණ්ඩලය මෙම යෝජනා අනුමත කර ඇත්තේ දේශපාලන බලපැමක් මත විනා පැහැදිලි වැඩ පිලිවෙලක් මත නොවේ.එවැනි අවිධිමත් වැඩ ඉදිරියේදි සිදු නොකිරිමට වග බලා ගනිමු. | අඩුපාඩුව නිවැරදි කරගෙන නොමැති බැවින් තවදුරටත් පවතී. |
| (ඔ) | නාඩගම් ගී ඇතුලත් සංයුක්ත තැටියක් නිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2018 - 2020 වර්ෂ සඳහා එකතුව රු.1,603,450 ක් ඇස්තමේන්තු කර 2018 සහ 2019 වර්ෂ වල පිළිවෙලින් රු.61,665ක් හා | සැලසුම් ප්‍රකාරව ව්‍යාපෘති කාර්ය නිම කිරීමට කටයුතු කළ යුතුය. | නාඩගම් ගී ඇතුළත් සංයුක්ත තැටියක් එළිදැක්වීම 2022 ජනවාරි මස තුල සිදු කර අවසන් කර ඇති බව කාරුණිකව සඳහන් කරමි. | කාර්ය නිමකර නොමැති බැවින් තවදුරටත් පවතී. |

රු.187,911ක් වශයෙන් එකතුව රු.249,576 ක් වැය කර තිබුණද 2022 ජනවාරි 31 වන විටත් කාර්ය නිමකර සංයුක්ත තැටිය එළිදැක්වීමට කටයුතු කර නොතිබුණි.

## 105. ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 - තත්වාගණනය කළ මතය.

2019 - තත්වාගණනය නොකළ මතය.

2020 - තත්වාගණනය කළ මතය.

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ ) | 2003 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වූ කාල පාරාසයක සිට පැවත එන එකතුව රු.1,082,708 ක් වූ අයවිය යුතු ශේෂ 06 ක් අයකර ගැනීමට 2020 වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි. | අයවිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | මහවැලි අධිකාරියෙන් ලැබිය යුතු මුදල අයකර ගත නොහැකි ශේෂයක් ලෙස හඳුනා ගෙන ඇත. අනෙකුත් ලැබියයුතු ශේෂ අයකර ගැනීමේ හැකියාවක් නොමැති නිසා අයකර ගැනීමට හැකියාව ලැබී නැත. | රු.1,675 ක ණය ශේෂයක් පමණක් අයවී ඇත. ඉතිරි හිඟ ණය ශේෂය අයවිය යුතුය. |
| (ආ) | ආයතනයේ ගිණුම් අංශයේ සේවය කරමින් සිටි කළමනාකාර සහකාරවරියක් විසින් ලේඛන වෙනස් කරමින් රු.787,932ක මුදලක් වංචාකර ඇති බව 2019 වර්ෂයේ දී අනාවරණය වී තිබූ අතර ඒ සම්බන්ධයෙන් සිදු කරනු ලබන මූලික විමර්ශන වාර්තාව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් ආයතනයට ලබා දී නොතිබුණි. | ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ ii වන කාණ්ඩයේ 13.2 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | මුදල් වංචාවට සම්බන්ධ මූලික විමර්ෂනය මේ වන විට අවසන් කොට අවසන් වාර්තාව සකස් කරමින් පවතින බව සඳහන් කර ඇත. | මූලික විමර්ෂණ කටයුතු අවසන් වී නොමැත. |
| (ඇ) | කෘෂි භෝග වල පසු අස්වනු හානිය අවම කිරීම ආයතනයේ ප්‍රධාන අරමුණක් වූ අතර ඒ වෙනුවෙන් 2009 වර්ෂයේ සිදුකර තිබූ මූලික සමීක්ෂණයකට අනුව කල් තබාගත නොහැකි කෘෂි | පසු අස්වනු හානිය අවම කරගෙන තිබූ ප්‍රමාණය කොපමණද යන්න හඳුනාගත හැකිවන පරිදි දත්ත පද්ධතියක් පවත්වාගත යුතුය. | මේ සඳහා වන පර්යේෂණයන් 2021 වසරේ ක්‍රියාත්මක කිරීමට යොදා ගෙන ඇති අතර එමගින් ආර්ථිකව වාසි දායක වන කෘෂි භෝග දහයක් පිළිබඳව සමීක්ෂණය සිදු කරයි.එම භෝග ලෙස | දත්ත පද්ධතියක් හඳුනාගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | භෝගවල පසු අස්වනු හානිය සියයට 30ත් සියයට 40ත් අතර පැවති බව හඳුනාගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන්වන විට එම සමීක්ෂණය සිදුකර වසර 10ක කාලයක් ගතවී තිබූ අතර 2020 වර්ෂය වන විට එම පසුඅස්වනු හානිය අවමකරගෙන තිබූ ප්‍රමාණය ප්‍රතිශතයක් වශයෙන් කොපමණද යන්න හඳුනාගත හැකිවන අන්දමේ දත්ත සමුදායක් ආයතනය සතුව නොතිබුණි. | | කෙසෙල්, පැපොල්, අඹ, පේර, යන පලතුරු ද මාළු මිරිස්, වම්බටු, තක්කාලි, කරවිල, හා ගෝවා යන එළවළු ද තෝරා ගෙන ඇත. | |
| (ඇ) | 2016 වර්ෂයේ සිට 2019 අගෝස්තු මාසය දක්වා කාලය තුළ ක්‍රියා ත්මක කර තිබූ පළතුරු ඉදවීමට කාබනික ක්‍රම හඳුන්වා දීමේ පර්යේෂණයේ (Induction of fruit ripening by organic method) සොයා ගැනීම් සඳහා පේටන්ට් අයිතිය ලබා ගැනීම හා පර්යේෂණයේ ප්‍රතිඵල වාණිජ මට්ටමින් ප්‍රචලිත කිරීම සඳහා රු.9,572,715ක් වැය කර තිබුණද, 2020 දෙසැම්බර් 31 දින වන විට මෙම ව්‍යාපෘතිය ක්‍රියාකාරී මට්ටමේ නොතිබුණි. | ව්‍යාපෘති සැලසුම් කිරීමේ දී අපේක්ෂිත අරමුණ ඉටුවන ආකාරයට ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කළ යුතුය. | මෙය නව සොයාගැනීමක් වූ අතර මේ ආශ්‍රිතව පර්යේෂණ ප්‍රකාශන 03ක් සිදු කොට ඇත. | අරමුණ ඉටුවන ආකාරයට ව්‍යාපෘතිය ක්රියාත්මක වී නොමැත. |
| (ඉ) | පර්යේෂණ ක්‍රියාවලියකින් පසුව නව උත්පාදන යන්ත්‍ර නිෂ්පාදනය කර සමාජගත කිරීම ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනයේ පර්යේෂණ අංශයේ ප්‍රධාන | ව්‍යාපෘති සැලසුම් කිරීමේ දී අපේක්ෂිත අරමුණ ඉටුවන ආකාරයට ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කළ යුතුය. | වැඩිදියුණු කළයුතු යන්ත්‍ර පිළිබඳ ඉංජිනේරු සේවා අංශය මගින් අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | අපේක්ෂිත අරමුණ ඉටුවන ආකාරයට ව්‍යාපෘතිය ක්‍රියාත්මක වී නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | අරමුණක් වුවත් 2000 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා නව උත්පාදන යන්ත්‍ර 19 න් යන්ත්‍ර 18 ක් සමාජ ගතකර නොතිබුණි. | | | |
| (ඊ) | කෘෂිකර්ම අමාත්‍යාශයේ ප්‍රතිපාදන උපයෝගී කරගෙන ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන යටතේ ආනයන කරනු ලබන ආහාර වර්ග 07 ක, බැරලෝහ වර්ග 04 ක් අන්තර්ගතව තිබේද යන්න පරීක්ෂා කිරීමට ක්‍රියාත්මක කර තිබූ ව්‍යාපෘතිය සඳහා 2017 වර්ෂයේ රු.1,956,120 ක වියදමක් දරා නියැදි 500ක් පරීක්ෂා කර තිබුණි. ඊට අදාළ ව්‍යාපෘති වාර්තාව අනුව ඇතැම් ආහාර ද්‍රව්‍ය වල උපරිම ආරක්ෂක මට්ටම ඉක්මවා Cadmium,Arsenic and Leaf වැනි බැරලෝහ අන්තර්ගත බව තහවුරුකරගෙන තිබුණි. එසේ වුවද, එම වාර්තාවේ නිගමන හා යෝජනා අනුව බැරලෝහ අන්තර්ගත ආහාර ද්‍රව්‍යයන් පිළිබඳ වැඩිදුර පරීක්ෂාවක් ආයතනය විසින් සිදුකර ඒ සම්බන්ධව වගකිවයුතු සියළුම පාර්ශව වෙත නිසි ක්‍රියාමාර්ග ගැනීම සඳහා තොරතුරු ලබාදී නොතිබීම හේතුවෙන් පර්යේෂණ සඳහා වැය වූ මුදල නිශ්කාර්ය වියදමක් බවට පත්වී තිබුණ | වාර්තාවේ නිගමන හා යෝජනා අනුව බැරලෝහ අන්තර්ගත ආහාර ද්‍රව්‍යයන් ඇති බවට තහවුරු කරගෙන ඇති බැවින් වගකිව යුතු සියළුම පාර්ශව වෙත නිසි ක්‍රියාමාර්ග ගැනීම සඳහා යොමු කළ යුතුය. | මෙම ව්‍යාපෘතිය සැලසුම් කිරීමේදී වසර දෙකකදී නියැදි 1000 ක් විශ්ලේෂණය කිරීමට සැලසුම් කරතිබුණ ද දෙවන වසර සඳහා කෘෂිකර්ම අමාත්‍යාශය විසින් මුදල් ලබා නොදීම හේතුවෙන් නියැදි 500 ක් විශ්ලේෂණය කිරීමෙන් පසුව අවසන් වාර්ථාව අමාත්‍යාශය වෙත ඉදිරිපත් කර ඇත. | ප්‍රතිතන සහතික ලබාගෙන නැති බැවින් ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණ ඉටුවී නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ද) | 2015 වර්ෂයේදී විද්‍යාගාර පර්යේෂණ කටයුතු සඳහා රු.15,216,575 කට මිලදීගෙන තිබූ හා වාර්ෂිකව රු.275,000ක නඩත්තු වියදමක් දරමින් පූර්ණ වායුසමන තත්ත්වයක පවත්වා ගෙන යන Gas chromatograph Mass Spectrometer යන්ත්‍රය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් භාවිතයට ගෙන නොතිබුණි. | අදාල වත්කම් උපරිම අකාරයෙන් භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය. | දක්වා ඇති දුර්වලතාවය පිළිගනිමි. | වත්කම් උපරිම ආකාරයෙන් භාවිතයට ගැනීමට කටයුතු කර නොමැත. |
| (ධ) | 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලය තුළ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ ශ්‍රී ලංකාවේ කෘෂි බෝගවල සැපයුම් හා අගයදාම කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා 2018 අප්‍රේල් 05 දින රු.1,290,000 ක් වැය කර Gps Trackers unit 100 ක් හා 2018 මාර්තු 22 දින රු.4,680,000 ක් වැයකර tempered data lorggers 130 ක් මිලට ගෙන තිබුණි. 2020 ජනවාරි 25 දින වන විටත් ඉන් Gps Trackers unit 98 ක් හා tempered data lorggers 70 ක් භාවිතයට නොගෙන ගබඩාවේ පැවතුණි. අදාළ උපකරණ ඵලදායී ලෙස භාවිතයට ගෙන නොතිබීම හේතුවෙන් එම ව්‍යාපෘතිය සඳහා වැයකර තිබූ වූ රු.7,292,332 ක මුදල ආර්ථික නොවූ වියදමක් බවට පත්වී තිබුණි. | අපේක්ෂිත අරමුණු ඉටුවන ආකාරයට ව්‍යාපෘතින් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුය. | ව්‍යාපෘතිය ඉදිරියට කරගෙන යාමට 2019 වර්ෂයේදී සැලසුම් කළ අතර 2019 වර්ෂයේදී ඉදිරි කටයුතු කිරීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාශයෙන් ප්‍රතිපාදන ඉල්ලුම් කළද ඒ සඳහා අනුමැතිය නොලැබුණි. කෙසේවුවද ඉදිරියේදී රාජ්‍ය මට්ටමින් ක්‍රමවේදයන් හඳුන්වාදීම් සැසඳුම් කිරීම සිදුකරන බැවින් මෙම උපකරණ අඛණ්ඩව භාවිතා කිරීමේ හැකියාව පවතී. | ව්‍යාපෘතිය ක්‍රියාත්මක වී නොතිබුණි. |